ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

බැංකුකරණයේ නිම්වළලු පුළුල් කරමින්

සමකළ නොහැකි දේශීයත්වයේ අරුත රැගෙන ජාත්‍යන්තරයට



පටුන

දිවයින පුරා විහිදුනු අපගේ පාරිභෝගික ජාලය සහ
නිම්වළලු පුළුල්කරමින් / 02
පාරිභෝගිකයන්, ව්‍යාපාර හවුල්කරුවන්, සමාජයේ වර්ධනය සහ
නිම්වළලු පුළුල් කරමින් / 04
වාර්තාව පිළිබඳව / 06
ජාතියේ මහා පහන් ටැඹ / 09
වැදගත් කාර්යසාධන සහ මූල්‍ය තොරතුරු / 10
අපගේ සය ආකාර ප්‍රාග්ධන කාර්යසාධනය / 13
සම්මාන / 14
ව්‍යාපාරික ආකෘතිය / 16
ශ්‍රී ලංකාව සංවර්ධනයේ මුවවිට / 18
ඉවත්ව යන සභාපතිතුමාගේ පණිවිඩය / 22
වැඩබලන සභාපතිතුමාගේ පණිවිඩය / 26
මහා කළමනාකරුගේ සමාලෝචනය / 30
කොටස්කරුවන් සමඟ කටයුතු කිරීම / 35
සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සලස්වන ක්‍රමෝපායක් / 37
2013 වර්ෂය සඳහා උපාය මාර්ග ක්‍රියාවෙහි යෙදවීම / 38
අධ්‍යක්ෂ මණ්ඩලය / 40
ආයතනික කළමනාකාරිත්වය / 46
විධායක කළමනාකාරිත්වය / 58
මූල්‍ය සමාලෝචනය / 64
සමූහයේ ආකෘතිය / 76
මූලික ව්‍යාපාරික මාර්ග / 78
- ශාඛා බැංකු කටයුතු / 79
- ආයතනික සහ අක්වෙරළ බැංකු කටයුතු / 91
- ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර / 102
තොරතුරු සන්නිවේදන තාක්ෂණය / 110
සේවක වාර්තාව / 114
සමාජයීය වාර්තාව / 126
පාරිසරික වාර්තාව / 130
ස්වාධීන සහතික වාර්තාව / 132
G4 සම්මත හෙළිදරව් කිරීමේ දර්ශකය / 134
ආයතනික යහපාලනය / 144
අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු / 188
අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වාර්තා / 189
අවදානම් කළමනාකරණය / 198

මූල්‍ය වාර්තා
ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව
බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව / 212
ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම / 217
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව / 221
ස්වාධීන සහතිකවීමේ වාර්තාව / 223
අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ ප්‍රකාශය / 224
විගණකාධිපති වාර්තාව / 225
ආදායම් ප්‍රකාශය / 226
විස්තීරණ ආදායම් ප්‍රකාශය / 227
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය / 228
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය / 229
මුදල් ප්‍රවාහ ප්‍රකාශය / 230
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් / 232
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය / 363
ආයෝජකයින් සඳහා තොරතුරු / 369
දස වර්ෂ සංඛ්‍යාන සාරාංශය / 386
නිෂ්පාදිත හා සේවා / 389
පරිපාලිතයන් හා ආශ්‍රිතයන් / 402
රටවල් පදනම මත - විදේශීය රටවල නියෝජිත බැංකු / 408
රටවල් පදනම මත - නියෝජිත විදේශ විනිමය සමාගම් / 416
මූල්‍ය සහ බැංකුකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහය / 418
ලංකා බැංකු ජාලය - දීප ව්‍යාප්ත සේවා ස්ථාන / 424
ආයතනික කාර්යාල / 454
සංස්ථාපිත තොරතුරු / පිටුපස ඇතුල් කවරය

බැංකුකරණයේ නිමිවළලු පුළුල් කරමින්

බැංකු කර්මාන්තය තුල කීර්තිය අන් හැමකකටම වඩා වැදගත්ය.

කීර්තිය බිහිකළ හැක්කේ කාර්යසාධනය මත පමණි. ලංකා බැංකුවේ අපි, වසර 74ක් මුළුල්ලේ අපේ ක්‍රියාවලීන් හා බෙදා හැරීම් තුල දේශීය ගැඹුර මෙන් ම ගෝලීය විහිදුම ද ගොඩනංවමින්, අද බැංකුව පත්ව සිටිනා හැමතින්ම පරිපූර්ණ දැවැන්ත බලාගාරය බවට පත් වන්නට ජවය සපයමින් සිටින්නෙමු.

පසුගිය වසර කිහිපය තුල අප අපේ වෙළඳපල තත්ත්වය චමත්කාරජනක ලෙසින් ඉහළ නංවා ඇත්තෙමු. 2012 දී නිමකළ ඉහළ අගයක් සහිත අරමුදල් රැස්කිරීම් රැසද මේ වසරේ නිකුත්කළ 140 කට අධික යුරෝපීය හා ආසියානු ආයෝජකයන් වෙතින් ඩොලර් බිලියන 2 ක ආකර්ශනයක් ගෙන ආ 5.325% පොළී අනුපාතයක් මතවූ ඇමෙරිකානු ඩොලර් 500 ක වසර 5 ක බැඳුම්කරද ඒ අතර වේ.

මේ ජයග්‍රහණ දැන් බැංකු කර්මාන්තයේ මිනුම් ලකුණ සේ සැලකෙන බව අපි දනිමු. මේ වූ කලී රජය සතු බැංකු ආයතනයක් එහි මුල් ඉම්වලින් බොහෝ දුර - අද අප අත්පත්කරගෙන ඇති දේශීය හා ජාත්‍යන්තර බලපෑම - කරා කැටුව යාමේ විශිෂ්ටත්වයයි.

අපේ ඉදිරි දැක්ම

ජාතියේ මහා පහන් ටැඹ

අපේ මෙහෙවර

ගනුදෙනුකරුවන්

අපගේ සියළුම ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් ඉක්මවා යන පරිදි විශ්වාසවන්තවත් වගකීමෙනුත් යුතු ඵලදායී වූ ගනුදෙනුකාර සම්බන්ධතාවක් ගොඩනැගීම

කාර්ය මණ්ඩලය

අපගේ කාර්ය මණ්ඩලය නිසි පිළිගැනීමට සහ ඇගයුමට ලක් කිරීමෙන් හොඳම ඉලක්ක සපුරා ගන්නා විශිෂ්ට සේවා කණ්ඩායමක් බවට පත් කිරීම

අයිතිකරුවන්

අපගේ අයිතිකරුවන්ගේ අපේක්ෂාවන්ට අනුකූලව ලාභදායිත්වයක් සමඟ ජාතික සංවර්ධනයේ ක්‍රියාකාරකයෙකු වීම

සමාජය

සමස්ත සමාජය වෙතම පුළුල් බැංකු සේවාවක් සපයමින් දේශයට සෙත සලසන පහන් ටැඹක් ලෙස වැජඹීම

දිවයින පුරා විහිදුනු අපගේ පාරිභෝගික ජාලය සහ නිම්වළලු පුළුල්කරමින්

ජයන්ත ධර්මදාස මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී, නවලෝක රෝහල් පීඑල්සී

වසර කීපයක් මුළුල්ලේ මාගේ බැංකු කටයුතු සිදු කෙරුනේ ලංකා බැංකුව සමඟය. බැංකුව මාගේ කුමන මූල්‍ය අවශ්‍යතාවක දී වුවද මා හට සැම විටම පහසු වන පරිදි හා කාලීන වශයෙන් උචිත තරඟකාරී හා ප්‍රායෝගික වශයෙන් විසඳුම් ලබා දුනි.




දොස්තර සමන් වීරසිංහ
සභාපති, එම් ඕ එස් ලංකා හෝල්ඩින්ස් සමූහය

මාගේ රාජකාරීන් නිසා මා හට ශ්‍රී ලංකාවේ සිට රුසියාවටද, එක්සත් රාජධානියට සහ මැද පෙරදිගට ගමන් කිරීමටද විශාල වශයෙන් සිදුවේ. මා කොහේ ගියත්, කොතරම් දුරස් වුවද මා වෙනුවෙන් ලංකා බැංකුව සිටින බවට මම විශ්වාස කරමි.



දොස්තර නෙවිල් ප්‍රනාන්දු
දොස්තර නෙවිල් ප්‍රනාන්දු, ශික්ෂණ රෝහල

දකුණු ආසියානු තාක්ෂණික සහ ඖෂධ ආයතනය ඵලෙසම දොස්තර නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල ලෙස හඳුන්වන අප ආයතනය සම්පූර්ණ කිරීම වෙනුවෙන් රු. මිලියන 2,000ක මුදලක් අනුමත කිරීම වෙනුවෙන් විශේෂයෙන් ලංකා බැංකුවේ මාලබේ ශාඛාවට සහ බැංකුවේ මහා කළමනාකාරතුමා වන ගුණසේකර මහතාට සහ හිටපු සභාපතිතුමාට ද කෘතඥ වෙමි.



නෆීස් අහමඩ් මහතා
රෙදිපිළි ව්‍යාපාරය, නුවර

වසර 35 ක කාලය තුලම මම ලංකා බැංකුව සමඟ වර්ධනය වුනෙමි. ලංකා බැංකුව මාගේ ව්‍යාපාරයන් සඳහා මා හට කුඩා පරිමාණ ව්‍යාපාරණය, කල් බදු පහසුකම් මෙන්ම කෙටිකාලීන ණය පහසුකම් සහ දිගුකාලීන ණය පහසුකම් මඟින් සහය වුනි.



ණය හා කල්බදු පහසුකම් සහ ගිණුම් ඇතුළු මූල්‍ය සේවාවන් තුලින් ගොඩනගා ගත් සබඳතා අපගේ පුළුල් වූ පාරිභෝගික ජාලය සමඟ අප පවත්වා ගනිමු.

අශාන් ද ලිවේරා මහතා
සී/ස ට්‍රොපික් ෆෑට්ස් පුද්ගලික සමාගම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් වූ සී/ස ට්‍රොපික් ෆෑට්ස් පුද්ගලික සමාගම තැඹිලි වතුර බෝතල් කර ලොව පුරා අපනයනය කරනු ලැබේ. අප අද සිටින සවිමත් තත්ත්වය ඇති කර ගැනීම සඳහා ලංකා බැංකුව ව්‍යාපාරය ආරම්භයේ සිටම අපගේ උත්සහයන් සඳහා තරඟකාරී පොළී අනුපාතයන් යටතේ ණය පහසුකම් ලබා දුනි.



දුලිප් සිරිවංශ මහතා සහ පවුල

අනාගතය සඳහා ඉතිරි කිරීම් වලදී ලංකා බැංකුව අප පවුලේ සියළු සාමාජිකයන් වෙත සහය වුනි. ඉන්දු සඳහා කාන්තා රන් ගිණුමක්, දුලිප් සඳහා අනෙකුත් නිෂ්පාදන සහ සේවාවන් වර්ග සහ පුංචි චම්රු සඳහා රන් කැකුළු ගිණුමක් අප සතුව පවතී.



රාජ්කුමාර් නිශාන්ති මහත්මිය
කිරිපට්ටි ගොවියා, චුන්නාකම්

ලංකා බැංකු චුන්නාකම් ශාඛාවෙන් රුපියල් 40,000 ක ණය පහසුකමින්, මම 2008 වර්ෂයේ දී කිරිපට්ටි පාලන ව්‍යාපාරය ආරම්භ කළෙමි. අද වන විට බැංකුව මගේ කිරිපට්ටි ගොවිපල තවදුරටත් එළදෙනුන් 15 - 20 ක් පමණින් පුළුල් කිරීම සඳහා රු. මිලියන 1.5 ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් මඟින් ප්‍රදානය කරන ලදී.



සී/ස දේශිකා පුද්ගලික සමූහ ව්‍යාපාර

දේශිකා සමූහ ව්‍යාපාර ඇඳුම් එම්බ්‍රොයිඩර් වැඩ, තේ අපනයනය, සහ පලය බෝතල් කිරීමේ කටයුතු වල නිරත වෙයි. ලංකා බැංකුවෙන් අපට ලැබුන සහය නිසා 2013 දී 200%ට වඩා වැඩි ප්‍රමානයකින් වර්ධනය වීමට අපට හැකි විය.



පාරිභෝගිකයන්, ව්‍යාපාර හවුල්කරුවන්, සමාජයේ වර්ධනය සහ නිම්වළලු පුළුල් කරමින්

සම්පත් සම්භාරයක් සතු විශාලතම බැංකුව ලෙස, ජාතික සංවර්ධනයට අති විශාල දායකයා වන බව අපි දනිමු.

ලංකා බැංකුව එහි බැංකුකරණයේ නිම්වළලු පුළුල් කරමින්



මාගම්පුර මහින්ද රාජපක්ෂ වරායෙහි ඉන්ධන සැපයුම් පහසුකම

පිහිටීම : හම්බන්තොට ඉන්ධන සැපයුම් පහසුකම

වටිනාකම : රු. මිලියන 2,734



සී/ස නයින්වෙල්ස් මදර් ඇන්ඩ් බේබි පුද්ගලික සමාගම

පිහිටීම : කොළඹ

වටිනාකම : රු. මිලියන 1,700



රොස් හයිඩ්‍රෝ පවර්

පිහිටීම : මාතලේ

වටිනාකම : රු. මිලියන 460




සී/ස සැන්සිටි හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපටීස් පුද්ගලික සමාගම

පිහිටීම : කොළඹ

වටිනාකම : රු. මිලියන 2,700

දශක හතක මෙහෙවර තුළ අප පුළුල් කරන ලද අපගේ ආයෝජන කළඹේ අන්තර්ගතයට වාණිජ බැංකුමය කටයුතු, වෙළඳ මූල්‍යනය, සංවර්ධන මූල්‍යකරණය, උකස් මූල්‍යකරණය, කල්බදු මූල්‍යකරණය, ආයෝජන බැංකු කටයුතු, ආයතනික මූල්‍යකරණය, රාජ්‍ය සුරැකුම්පත්, උකස් තැරැව්කරණය, ණයපත් පහසුකම්, අක්වෙරළ බැංකුමය කටයුතු සහ විදේශීය මුදල් මෙහෙයුම් ඇතුළත් වෙයි.

ඒ සියල්ල බැංකුකරණයේ නිමිවළලු පුළුල් කරමින්



කොළඹ නැව් තටාකාංගනය

පිහිටීම : කොළඹ

වටිනාකම : රු. මිලියන 9,687



දොස්තර නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල

පිහිටීම : මාලබේ

වටිනාකම : රු. මිලියන 2,000



මාලිගාවත්ත නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය

පිහිටීම : මාලිගාවත්ත

වටිනාකම: රු. මිලියන 640



බෝදාගම හම්බෙගමුව කල්තොට පාර

පිහිටීම : රත්නපුරය

වටිනාකම : රු. මිලියන 3,916

වාර්තාව පිළිබඳව

ලංකා බැංකු වාර්ෂික වාර්තාවන්ට නව මුහුණුවරක් ලබා දෙමින් නවතම වාර්තාකරණ ක්‍රමවේදයක් වන "සමෝධානිත වාර්තාකරණ ආකෘතිය" මත පදනම්ව පිළිගැන්වෙන අපගේ ප්‍රථම වාර්ෂික වාර්තාව මෙය වේ. බැංකුවේ මූල්‍ය උපායන්, කාර්යසාධනයන්, ආර්ථික, සමාජීය සහ පාරිසරික තත්ත්ව මත පදනම් වූ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන අනාගත ඉලක්කයන්හි තුලිතවූත්, පෘථුලවූත් සංක්ෂිප්ත වාර්තාකරණය මෙවර අපගේ උත්සාහය වේ. වාර්තාකරණ කාල පරාසය 2013 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දින දක්වා වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වාර්තාව සඳහා අත්සන් තබන දින එනම් 2014 මාර්තු 14 දක්වා වන කාලය තෙක්ම සිදුවූ සුවිශේෂී සිදුවීම් පරිශීලිතයන්ගේ මනා අවබෝධය උදෙසා මෙහි වැඩිමනත් දක්වා ඇත.

ශ්‍රී ලංකාව, ඉන්දියාව, මාලදිවයින සහ එක්සත් රාජධානිය යන රටවල් වල පිහිටි ශාඛාවන් සහ සියළු පරිපාලිත සමාගම් වලින් සැළුම්ලත් සමූහයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව මෙම වාර්තාව මඟින් ආවරණය කෙරේ. මෙම වාර්තාවේ සඳහන් තොරතුරු වලින් සුවිශේෂී ප්‍රමාණයක් අයත් වන්නේ පරිපාලන ආයතනය වන ලංකා බැංකුව සම්බන්ධයෙන් වන අතර 2013 දෙසැම්බර් 31 දින වන විට සමූහයේ ලාභයෙන් 98% ක ද වත්කම් වලින් 97% කද දායකත්වය දරණු ලබන්නේ ලංකා බැංකුව විසිනි. එබැවින් සමූහය හෝ එහි පරිපාලිතයන්ට අදාළ තොරතුරු ලංකා බැංකු කටයුතු වලින් වෙන් කර වාර්තා කරනු ඇති අතර විශේෂයෙන් සඳහන් නොවන විට වාර්තා කර ඇති තොරතුරු අදාළ වනුයේ ලංකා බැංකුවේ කටයුතු සඳහා පමණකි. වාර්තාකරණ කාලපරාසය තුළ අපගේ කාර්යසාධනයන්ට බලපාන ලද හා අනාගතයේදී බලපෑ හැකි ප්‍රමාණාත්මක වර්ධනයන් සහ ගැටළුකාරීත්වයන් හි මූල්‍යමය සහ මූල්‍යමය නොවන තොරතුරු ප්‍රමාණවත් පරිදි ගෙනහැර දැක්වීම මෙම වාර්තාවේ මූලික අරමුණක් වේ. වර්ධනයන් හෝ ගැටළුකාරීත්වයන්හි ප්‍රමාණාත්මකභාවය තීරණය කිරීමේදී ඉන් බැංකුවේ පාර්ශවකරුවන්ට ජනනය කෙරෙන වටිනාකම් කෙරෙහි කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීනව ඇති කෙරෙන බලපෑම සැලකිල්ලට භාජනය කර ඇති අතර, එම වර්ධනයන් සහ ගැටළුකාරීත්වයන් කළමනාකරණය කර ගැනීමේ බැංකුව සතු හැකියාව අපගේ කාර්යසාධනයන් කෙරෙහි බලපාන අතර එමඟින් පැනනගින ප්‍රතිලාභ, වාසිදායී තත්ත්වයන්, අවදානම් අවම කර ගැනීම්, කාර්යසාධනයන්හි වර්ධනයන් ආදියෙහි පාර්ශවකරුවන්ගේ සක්‍රීය දායකත්වය අප අපේක්ෂා කරමු.

මෙම ඒකාබද්ධ වාර්තාව, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත, 1988 අංක 30 දරණ බැංකු පනත හා සංශෝධනයන්, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන්, ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳව මනා පරිචය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය, ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය මඟින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුව (IIR) සහ ගෝලීය වාර්තාකරණ පුරෝගාමිත්වය (GRI) මඟින් නිකුත් කර ඇති G4 මගපෙන්වීම් දර්ශකයන් මත පදනම්ව සකස් කර ඇත. මූල්‍ය වාර්තාවන් පිළියෙල කර ඇත්තේ 2013 ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුව සකස් කර ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) මත පදනම්ව වන අතර වාර්තාකරණ අංශයෙහි දේශීය සහ විදේශීය නව්‍යතාවයන් හා මනා පරිචයන්හි නවතම විකාශනයන් අප වාර්තාව සඳහා අන්තර්ගත කර ගැනීම උදෙසා අබණ්ඩ උපදේශනයන් අප අනුගමනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශයන් සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සම්බන්ධයෙන් ස්වාධීන සහතිකවීමක් වරලත් ගණකාධිකාරී ආයතනයක සහය ඇතිව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබයි. තවදුරටත් මෙම වාර්තාවේ අන්තර්ගත තිරසර පැවැත්මට අදාළ වන කරුණු සම්බන්ධයෙන් ස්වාධීන සහතිකවීමක් ඇර්නස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් සපයා ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශය

ඒකාබද්ධ වාර්තාව මඟින් ඉදිරිපත් කෙරෙන කරුණු මඟින් සියළු ප්‍රමාණාත්මක සාධකයන් සහ ගැටළුකාරීත්වයන් නියමිත පරිදි ආවරණය කෙරෙන බවටත්, සමූහයේ ඒකාබද්ධ කාර්යසාධනයන් සාධාරණීත්වයෙන් ඉදිරිපත් කෙරෙන බවටත් වන වගකීම ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. මෙම සමෝධානිත වාර්තාව අපගේ මෙහෙයුම් කටයුතු පවත්නා නීති රාමුව සහ සමෝධානිත වාර්තාවන්ට අදාළ වන ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුගතව පිළියෙල කර ඇත.

ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශය

මෙම වාර්තාවේ ඇතැම් ප්‍රකාශයන් ඉදිරි දැක්මක් සහිතය. මේවා බැංකුව සහ පරිපාලිතයන්ගේ සැලසුම්, අරමුණු, පරමාර්ථ, උපායන්, අනාගත මෙහෙයුම් සහ කාර්යඵල ඇතුළු සියළු දේ හා සම්බන්ධය. "අපේක්ෂාවන්", "ඇස්තමේන්තු", "බලාපොරොත්තු, "ප්‍රක්ෂේපන", "විශ්වාස කිරීම", "අදහස් කිරීම", "සැලසුම් කිරීම", සහ "අභිප්‍රාය" වැනි වචන සහ ඒ හා සමාන වචන ඉදිරි දැක්මක් සහිත ප්‍රකාශයන් දක්වයි. මෙම ප්‍රකාශයන් බැංකුවේ අනාගත මෙහෙයුම්, මූල්‍ය හෝ වෙනත් ප්‍රතිඵල පිළිබඳ සහතිකයක් නොවන අතර විවිධ අවදානම්, අවිනිශ්චිතතා සහ උපකල්පන මත පදනම් වේ. ඒ අනුව සත්‍ය ප්‍රතිඵල මෙම ප්‍රකාශයන්ගෙන් වෙනස් වීමට හැකි අතර එම ප්‍රකාශයන්හි සඳහන් දෑ එලෙසම සාක්ෂාත් කිරීමේ වගකීමක් බැංකුව නොදක්වයි. තවද, ලංකා බැංකුව ඓතිහාසික තොරතුරු සහ ඉදිරි දැක්මක් ඇති ප්‍රකාශයන් යාවත්කාලීන කිරීමට බැඳී නැත.

ප්‍රමාණාත්මක අංශයන් සහ සීමාවන්

GRI-G4 සම්මතයන් සහ අපගේ පාර්ශවකාර සම්බන්ධතා ක්‍රියාවලිය අනුව බැංකුව ප්‍රමානාත්මක අංශයන් සහ සීමාවන් නිශ්චයකර ඇත. බැංකුවේ කටයුතු වලට ඇති බලපෑම සලකා බලා එක් එක් අංශයන් අගය කර බැංකුවට සහ පාර්ශවකරුවන්ට ඇති වැදගත්කමට අනුව වැඩි, මධ්‍යස්ථ සහ අඩු ලෙස වර්ග කොට ඇත.

අංශයන්	බැංකුවට ඇති වැදගත්කම	අංශ සීමා		ප්‍රමානාත්මකතාවය							වර්ගීකරණ ඇත / නැත
		බැංකුව	බාහිර	බැංකුව	සේවකයන්	ගනුදෙනුකරුවන්	රජය සහ නියාමකයා	ආයෝජකයන්	ප්‍රජාව	සැපයුම්කරුවන්	
ආර්ථික											
ආර්ථික කාර්ය ඵලය	වැඩි	✓		H	H	M	H	H	L	L	ඇත
වෙළඳපළ නියෝජනය	වැඩි	✓		H	M	H	H	M	M	L	ඇත
වක්‍ර ආර්ථික බලපෑම	වැඩි	✓	✓	H	L	M	H	L	H	M	ඇත
සම්පාදන ප්‍රතිපත්තිය	මධ්‍යස්ථ	✓		H	M	L	M	L	M	H	ඇත
පාරිසරික											
ද්‍රව්‍ය	අඩු										
බලශක්ති	අඩු										
ජලය	අඩු										
ජෛව විවිධත්වය	අඩු										
විමෝචනය	අඩු										
අපවාහය සහ අපද්‍රව්‍ය	මධ්‍යස්ථ	✓	✓	M	L	L	L	L	M	M	ඇත
නිෂ්පාදිත සහ සේවා	වැඩි	✓	✓	H	M	H	L	L	L	L	ඇත
අනුකූලතාවය	අඩු										
ප්‍රවාහන	අඩු										
සමස්ථ කරුණු	අඩු										
සැපයුම්කරුගේ පාරිසරික ඇගයුම	අඩු										
පාරිසරික මැසිවිලි යාන්ත්‍රණය	අඩු										
සමාජීය											
කම්කරු සබඳතා පරිචයන් හා උචිත සේවා තත්ත්වයන්	වැඩි	✓		H	H	L	M	L	L	L	ඇත
රුකියාව	වැඩි	✓		H	H	L	M	M	H	L	ඇත
කම්කරු කළමනාකරණ සබඳතා	වැඩි	✓		H	H	M	L	L	L	L	ඇත
රුකියා ආශ්‍රිත සෞඛ්‍ය හා ආරක්ෂණ	මධ්‍යස්ථ	✓		H	H	L	L	L	L	L	ඇත
පුහුණුවීම් සහ අධ්‍යාපනය	වැඩි	✓		H	H	M	M	L	L	L	ඇත
විවිධත්වය සහ සම අවස්ථා	මධ්‍යස්ථ	✓		M	M	L	L	L	L	L	ඇත
ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයටම සමාන පාරිතෝෂික	වැඩි	✓		H	H	L	M	L	M	L	ඇත
සැපයුම්කරුවන්ගේ කම්කරු ප්‍රතිපත්ති පිළිබඳ ඇගයුම	මධ්‍යස්ථ	✓		M	M	M	M	M	M	M	ඇත

අංශයන්	බැංකුවට ඇති වැදගත්කම	අංශ සීමා		ප්‍රමානාත්මකතාවය							වර්තාකර ඇත / නැත
		බැංකුව	බාහිර	බැංකුව	සේවකයන්	ගනුදෙනුකරුවන්	රජය සහ නියාමකයා	ආයෝජකයන්	ප්‍රජාව	සැපයුම්කරුවන්	
කම්කරු ප්‍රතිපත්ති පිළිබඳව මැසිවිලි යාන්ත්‍රණය	වැඩි	✓		H	H	L	L	L	L	L	ඇත
මානව හිමිකම්											
ආයෝජන	අඩු										
සමානාත්මතාව	මධ්‍යස්ථ	✓		M	H	M	M	L	L	L	ඇත
සංවිධානය වීමේ නිදහස භුක්ති විඳීමේ හා සාමූහික කේවල් කිරීම	වැඩි	✓		H	H	L	M	L	L	L	ඇත
ළමා ශ්‍රමය	අඩු										
බලතල හෝ අනිවාර්ය ශ්‍රමය	අඩු										
ආරක්ෂක සේවක ප්‍රතිපත්තිය	මධ්‍යස්ථ	✓		M	M	M	L	L	M	L	ඇත
ආදිවාසීන්ගේ හිමිකම්	අඩු										
ඇගයීම	අඩු										
සැපයුම්කරුගේ මානව හිමිකම් ඇගයීම	අඩු										
මානව හිමිකම් මැසිවිලි යාන්ත්‍රණය	මධ්‍යස්ථ	✓		M	M	L	L	L	L	L	ඇත
සමාජය											
දේශීය ප්‍රජාව	මධ්‍යස්ථ	✓	✓	M	M	H	M	M	H	M	ඇත
දූෂණ මර්ධනය	වැඩි	✓		H	M	H	H	H	H	H	ඇත
පොදු ප්‍රතිපත්ති	වැඩි	✓		H	M	M	H	M	H	M	ඇත
තරඟකාරිත්වය විරෝධී චර්යාවන්	අඩු										
අනුකූලතාවය	මධ්‍යස්ථ	✓		M	L	M	M	L	M	L	ඇත
සමාජීය බලපෑම් සඳහා සැපයුම්කරුවන් ඇගයීම	අඩු										
සමාජීය යාන්ත්‍රණය සඳහා මැසිවිලි යාන්ත්‍රණය	අඩු										
නිමැවුම් පිළිබඳ වගකීම											
ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව	මධ්‍යස්ථ	✓	✓	H	M	H	L	L	L	L	ඇත
නිෂ්පාදන හා සේවා සලකුණු	අඩු										
අලෙවි සන්නිවේදනය	මධ්‍යස්ථ	✓	✓	M	M	L	L	L	L	L	ඇත
ගනුදෙනුකාර රහස්‍යභාවය	වැඩි	✓	✓	H	H	H	H	M	M	L	ඇත
අනුකූලතාවය	වැඩි	✓		H	L	H	H	M	L	L	ඇත


වැදගත් කමින් අඩු සියළුම අංශයන් ප්‍රමාණාත්මක නොවන ලෙස සලකනු ලැබේ.

H - වැඩි

M - මධ්‍යස්ථ

L - අඩු

ජාතියේ මහා පහන් ටැඹ



"ව්‍යාපාර සහ ජාත්‍යන්තර හැකියාවන්, දේශීය ප්‍රවීනතා සමඟ කැටිකර සියළුම ගනුදෙනුකරුවන් සඳහා සබඳතා තුළින් උසස් සේවාවක් ලබාදීම සඳහා බැංකුව ප්‍රවේශ වන බව අපගේ විශ්වාසයයි..."



පළාත	ශාඛා ගණන	වෙනත් සේවා මධ්‍යස්ථාන	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව
මධ්‍යම පළාත	67	4	52
නැගෙනහිර පළාත	55	3	29
උතුරු මැද පළාත	47	1	41
උතුරු පළාත	60	8	32
වයඹ පළාත	56	2	52
සබරගමු පළාත	46	2	37
දකුණු පළාත	62	4	56
ඌව පළාත	39	2	28
බස්නාහිර පළාත - උතුර	61	5	79
බස්නාහිර පළාත - දකුණ	65	5	98
ආයතනික ශාඛා	6	13	16
ප්‍රමුඛ ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන	1	0	1
විදේශීය ශාඛා	2	0	2
	567	49	523

වත්කම්, තැන්පතු, අත්තිකාරම් සහ ඉපැයුම් තුලින් ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව වේ. අත්තිකාරම් සඳහා 22% සහ තැන්පතු සඳහා 20% ක වෙළඳපල කොටසක් සහිතව ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය තුල අපි වෙළඳපල ප්‍රමුඛයා වෙමු. මිලියන දහයකට අධික ගනුදෙනුරුවන්ට පුළුල් පරාසයක් තුල විහිදුනු නිෂ්පාදිත කළඹක් තුළින් ප්‍රාග්ධන, ආයෝජන සහ ගනුදෙනුකාර සේවා අවස්ථාවන් සලසන්නෙමු. ඉන්දියාව සහ මාලදිවයින ඇතුළු ශාඛා 567 ක්, වෙනත් සේවා මධ්‍යස්ථාන 49ක්, ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර 523 ක් සහ ඉන්ටර්නෙට් බැංකුකරණය, මොබයිල් බැංකුකරණය සහ දුරකථන බැංකුකරණය තුලින් අපගේ ගනුදෙනුකරුවන්ට විවිධ සේවාවන් සඳහා ලඟාවීමට අවස්ථාව ඇත. ශ්‍රී ලාංකික සංක්‍රමනිකයන් සඳහා වෙළඳපලක්, රටවල් 115 ක් පුරා විහිදුනු නියෝජිත බැංකු 759 ක් සහිත විශාලත නියෝජිත බැංකු ජාලයක්ද සහ රටවල් 19 ක විනිමය සමාගම් 96 ක විශාලිත විනිමය සමාගම් ජාලයක්ද අප සතුව ඇත.

සමූහය සමන්විත වන්නේ මව් සමාගම වන ලංකා බැංකුව, පරිපාලිත සමාගම් 12 සහ ආශ්‍රිත සමාගම් 5 කින් ය. බැංකුව සමූහයේ ලාභය සඳහා 98% ක හා වත්කම් සඳහා 97% ක දායකත්වයක් දරයි.



උරුමය තුළ වර්ධනය වන වටිනාකම

වැදගත් කාර්යසාධන සහ මූල්‍ය තොරතුරු

රු. බිලියන

11.7

රජයට වටිනාකම

2013 දී බැංකුව රු. බිලියන 11.7 ක් රජයට ලාභාංශ සහ බදු ලෙස දායකත්වය ලබා දෙන ලදී.

විශාලතම දේශීය බැංකුව වශයෙන් පුළුල් ලෙස ළඟා කර ගැනීම් සහ විවිධාංගීකරණය කරන ලද නිෂ්පාදන කළඹ සමඟ, අප අසම සුරක්ෂිත, නිරවද්‍ය සහ වේගවත් පිරිනැමීම තුළින් සාකල්‍ය සුළු සේවාවක් ලබා දීම අපගේ අරමුණ වේ.

රු. බිලියන

127

මුළු ආදායම

රු. බිලියන

15.7

බදු පෙර ලාභය

රු. බිලියන

755

ණය සහ අත්තිකාරම් (දළ)

රු. බිලියන

843

තැන්පතු


රු. බිලියන

1,193

මුළු වත්කම්

1,706


නව රැකියා නිර්මිතය




මුළු ආදායම

(රු. බිලියන)

නිෂ්පාදිත අනුව ණය සහ අත්තිකාරම්





මුළු වත්කම්

(රු. බිලියන)

වැදගත් මූල්‍ය තොරතුරු

	බැංකුව			සමූහය		
	2013	2012	වෙනස %	2013	2012	වෙනස %
මෙහෙයුම් ප්‍රතිඵල (රු. මිලියන)						
මුළු ආදායම	127,464	110,138	15.7	134,230	115,527	16.2
ශුද්ධ පොළී ආදායම	37,143	35,321	5.2	39,342	37,262	5.6
එකතු කළ අගය මත බදු සහ ආදායම් බද්දට පෙර ලාභය	18,420	23,009	(19.9)	18,632	23,482	(20.7)
බදු පෙර ලාභය	15,709	19,794	(20.6)	16,105	20,246	(20.5)
බදු පසු ලාභය	12,087	14,417	(16.2)	12,148	14,608	(16.8)
රජයට දායකත්වය	11,679	13,938	(16.2)	12,059	14,259	(15.4)
මූල්‍ය තත්ත්වය (රු. මිලියන)						
මුළු වත්කම්	1,193,581	1,048,221	13.9	1,225,762	1,079,353	13.6
දළ ණය හා අත්තිකාරම්	755,385	714,847	5.7	777,927	733,706	6.0
දළ ණය සහ අත්තිකාරම් (හානිකරණ ප්‍රතිපාදන වලට පසු)	725,332	691,899	4.8	746,572	709,933	5.2
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	842,070	693,441	21.4	850,768	700,169	21.5
මුළු වගකීම්	1,135,881	997,268	13.9	1,158,850	1,020,710	13.5
මුළු හිමිකම්	57,700	50,953	13.2	66,912	58,643	14.1
කොටසක් සඳහා දත්තයන් (රු.)						
කොටසක ඉපැයුම	2,417	2,883	(16.2)	2,447	2,916	(16.1)
කොටසක ශුද්ධ වත්කම්	11,540	10,191	13.2	13,123	11,445	14.7
ලාභදායීත්ව අනුපාත (%)						
සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය	1.4	2.1	(0.7)	1.4	2.1	(0.7)
සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභය	22.2	31.2	(9.0)	19.4	27.2	(7.8)
පොළී ආන්තිකය	3.3	3.7	(0.4)	3.4	3.8	(0.4)
ආදායමට පිරිවැය	49.1	42.7	6.4	52.0	45.4	6.6
තැන්පතු වලට ණය අනුපාතය	89.6	103.1	(13.4)	91.4	104.9	(13.5)
හානිකරණ ප්‍රතිපාදන,දළ ණය හා අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස	4.0	3.2	0.8	4.0	3.2	0.8
ව්‍යවස්ථාපිත අනුපාත (%)						
ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය) (අවම අවශ්‍යතාවය 20%)	27.7	21.8	6.0	-	-	-
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත (%)						
මූලික ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය 5%)	8.4	8.3	0.1	8.9	8.9	-
මුළු ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය 10%)	12.1	11.4	0.7	12.9	12.4	0.5

අපගේ සය ආකාර ප්‍රාග්ධන කාර්යසාධනය

මෙහිදී ඉලක්කයන්ට එදිරිව විමර්ශනය කරන හා මනිනු ලබන දර්ශකයන් ඉදිරිපත් කෙරේ. කෙසේ වෙතත් බැංකුව මිනුම්කරණයට ලක් නොකරන ලද තවත් බොහෝ ප්‍රමුඛ ශක්තීන් ඇති අතර, අධිකාරි බලය, සමාජීය වගකීමක් සහිත සන්නමක් වශයෙන් පොදු අවබෝධය හා ස්ථාවර මූල්‍ය ආයතනයක් වීම, දැනුම් සම්භාරයක් හා පළපුරුද්දකින් හෙබි දිගු සේවා කාලයක් සහිත සේවා කණ්ඩායම, රජයට අනුබද්ධ ආයතනයක් වශයෙන් රජයෙන් ලැබෙන ප්‍රතිලාභ, අප සමඟම වර්ධනය වුනු කීර්ති නාමයක් සහිත ගනුදෙනුකරුවන් සහ මෙහි සඳහන් නොකළ තවත් බොහෝ දෑ ඊට ඇතුළත් වේ.

	2012	2013	2014	2015	2016
				ඉලක්කගත	
මූල්‍ය ප්‍රාග්ධනය					
• ශුද්ධ පොළී ආදායම (රු. බිලියන)	35.3	37.1	37.8	43.5	51.7
• මුළු මෙහෙයුම් ආදායම (රු. බිලියන)	49.7	49.0	53.1	60.2	68.7
• බදු පෙර ලාභය (රු. බිලියන)	19.8	15.7	20.5	23.8	28.5
• බදු පසු ලාභය (රු. බිලියන)	14.4	12.1	14.9	17.3	20.7
• වත්කම් වර්ධනය %	25	14	12	14	15
• ණය වර්ධනය %	27	6	13	17	19
• තැන්පතු වර්ධනය %	16	21	10	17	17
බුද්ධිමය ප්‍රාග්ධනය					
• සන්නම්නාම වටිනාකම (රු. බිලියන)	15.2	24.1	25.3	26.6	27.9
නිමවුම් ප්‍රාග්ධනය					
• ස්ථාවර වත්කම් (රු. බිලියන)	11.4	12.6	20.5	22.6	24.9
මානව ප්‍රාග්ධනය					
• සේවක සංඛ්‍යාව	7,790	8,883	10,106	10,166	10,224
• රඳවා ගැනීමේ අනුපාතය %	99.7	99.6	99.6	99.6	99.6
• මුළු අස්වීම් වලින් ඉල්ලා අස්වීමේ % ලෙස	96	94	95	95	95
• පුහුණු කිරීම් තුළ ආයෝජනය (රු. මිලියන)	196.0	235.8	288.5	302.4	317.5
• සුභසාධන පිරිවැය (රු. මිලියන)	522.2	540.6	559.6	579.0	599.7
සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය					
• ගනුදෙනුකරුවන් ගණන ('000)	10,576	10,944	11,272	11,610	11,959
• ගනුදෙනුකාර සේවා ස්ථාන					
- ශාඛා	324	567	595	625	656
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිවිසුම් ස්ථාන	451	523	549	577	605
- පාසල් බැංකුකරණ ඒකක	2498	3738	4112	4523	4975
• නියෝජිත බැංකු	762	759	759	759	759
• හුවමාරු නිවාස	97	96	96	96	96
• නිර්මිත සේවා නියුක්තිය	296	1,706		අවශ්‍යතාවය මත පදනම්ව	
• තිරසර සංවර්ධනයට මුළු දායකත්වය (රු. මිලියන)	46.8	165*	75	අවශ්‍යතාවය මත පදනම්ව	
ස්වාභාවික ප්‍රාග්ධනය					
• කඩදාසි ප්‍රතිචක්‍රීකරණය (කිලෝ ග්‍රෑම්)	167,239	49,860		අඩුකිරීම වාර්ෂිකව 7.5%	
• එක් සේවකයකුගේ විදුලිබල පරිභෝජනය (මෙගා වොට් පැය)	1.9	2.0		අඩුකිරීම වාර්ෂිකව 5%	
• එක් සේවකයකුගේ වතුර පරිභෝජනය (ලීටර)	35.5	33.8		අඩුකිරීම වාර්ෂිකව 5%	
• එක් සේවකයකුගේ ඉන්ධන පරිභෝජනය (ලීටර)	78.4	76.7		අඩුකිරීම වාර්ෂිකව 10%	

* (යාපනයේ දුම්රියපොළ සංවර්ධනයට රු. මිලියන 86 ක දායකවීම අඩංගු වේ)

ගෝලීය ශ්‍රේණිගත කිරීම්

ෆිච් ශ්‍රේණිගත කිරීම්

BB-Stable

මූඩීස්

B1 Stable

දේශීය ශ්‍රේණිගත කිරීම්

සී/ස ෆිච් රේටින්ස් ලංකා:
දේශීය දිගුකාලීන ශ්‍රේණිගත කිරීම

‘AA+ (lka) stable outlook’

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් 2013 ජාතික ව්‍යාපාරික විශිෂ්ටත්ව සම්මාන

- බැංකුකරණ හා මූල්‍ය සේවා අංශයේ අනුගාමී වසර 3 ක් පුරා රන් සම්මාන ජයග්‍රාහකයා වීම
- දේශීය වෙළඳපළ ළඟා කර ගත් කාණ්ඩ විශිෂ්ටතා ජයග්‍රාහණය - රන් සම්මාන
- මහා පරිමාණ කාණ්ඩ දෙවන ස්ථානය - ලෝකඩ සම්මාන







ලංකා වාණිජ මණ්ඩලය මඟින් සිදු කරන තිරසර ප්‍රශස්තම ආයතනික සම්මාන ප්‍රදානය

- 2013 ප්‍රශස්තම තිරසර (CSR) සඳහා, "බී ඕ සී මිතුරු"
- බී ඕ සී ශ්‍රී ලංකාවේ අංක එක යන සන්නම්නාම තත්ත්වය අනුගාමී වසර 15 ක් පුරා ළඟා කර ගන්නා ලදී - බ්‍රැන්ඩ් ෆයිනෑන්ස් ලංකා
- 2013 වර්ෂයේ දී, සිවුවන සී එම් ඕ ආසියා සම්මාන ප්‍රදානයේ දී, සන්නම්නාමකරණය සහ අලෙවිකරණය සඳහා ශ්‍රී ලාංකික බැංකුවකට පමණක් ලැබෙන ආසියාවේ ප්‍රශස්තම සන්නම්නාම සම්මානය පිදුම් ලබන ලදී
- ඇමෙරිකානු සන්නිවේදන වෘත්තිකයන්ගේ ලීගය වාර්ෂික වාර්තා තරඟයෙන් ලෝකඩ පදක්කම් ජයග්‍රාහකයා වීම
- ශ්‍රී ලංකා චරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන 2013 වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදානයේ දී බැංකු ක්ෂේත්‍රයේ අනුකූලතා සහතිකය පිදුම් ලබන ලදී



සියළුම ශ්‍රී ලාංකික බැංකු අතරින් ලංකා බැංකුව ඉහළතම ශ්‍රේණිගත කිරීම තුළ

ලොව ප්‍රශස්තම බැංකු 1000 තුළ

(ලෝකයේ 979 වන ස්ථානය)

දේශීය ශ්‍රේණිගත කිරීම් No.1












ව්‍යාපාරික ආකෘතිය

ප්‍රමුඛ ව්‍යාපාරික අංශ	ආදායම් ප්‍රකාශයට බලපෑම	මූල්‍ය තත්ත්වයට අදාලත්වය	ප්‍රමුඛ අවදානම්
ණය හා අත්තිකාරම්			
අප ගණුදෙනුකරුවන්ට ණය සපයන්නේ එකඟ වූ කාල රටා හා කොන්දේසිද එකඟ වූ මිලද මතය. ඒ ආදායම් ජනිත කිරීමට ඇති හැකියාව ඉහළ නැංවීමට, ඔවුන්ගේ පාර්ශ්වකරුවන්ට අගය ජනිත කළ හැකි අනෙකුත් කටයුතු සිදු කරන්නට හා මුදල් ප්‍රවාහ ගැටළු සමහන් කරන්නටය. අපේ ගණුදෙනුකරුවන් අතර මුල් පෙලේ ආයතනික සමාගම්, රජය, රජය සතු ව්‍යවසායයන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හා ශාඛා බැංකු කටයුතු ගණුදෙනුකරුවන්ද වෙති.	මෙම කටයුතුවලින් අපි පොළී ආදායමක් උපයන්නෙමු. මෙය අපේ ආදායම් ප්‍රකාශයේ වැඩිම කොටසට හිමිකම් කියයි. මුළු පොළී ආදායමෙන් 76% ක් මේ අන්දමින් සැපයේ. ගණුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ නොහැකියාව මත පැන නගින අලාභ මත ණය සඳහා වන ප්‍රතිපාදන වෙන් කෙරේ.	ආයතනික හා ශාඛා බැංකු කටයුතු ගණුදෙනුකරුවන්ට සැපයෙන ණය හා අත්තිකාරම් අපේ මුළු ශුද්ධ වත්කම් වටිනාකමෙන් (අපහායනය අඩු කොට) 61% ක් වේ. අක්‍රිය හෝ වියවුලට පත් ණය වල්ලේ අපහායන අලාභය සමස්ත ණය පරිමාවෙන් 4% හා සමස්ත වත්කම් අගයෙන් 2.5% ක් වේ.	ණය අවදානම පොළී අනුපාත අවදානම මෙහෙයුම් අවදානම සමාජයීය හා පාරිසරික අවදානම
තැන්පතු හා ණය ගැනීම්			
අපි එකඟ වූ මිලක් මත හා නිර්ණය කළ කාල සීමාවකට මෙන්ම බැංකු රෙගුලාසි හා ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන්ට අනුරූපව අරමුදල් සපයා ගන්නේ ණය හා අත්තිකාරම් ව්‍යාපාරික කටයුතු සඳහාය. මෙබඳු ආයෝජන මඟින් සිය ධනය ඉහළ නංවා ගැනීමට ගණුදෙනුකරුවන්ට අවස්ථාව ලැබේ. මේ ගණුදෙනුකරුවන් අතර නේවාසික හා අනේවාසික පුද්ගලයන්/ආයතන වෙති. ලංකා රුපියල් සේම විදේශීය මුදල් ද මේ අන්දමින් සපයා ගනු ලැබේ.	මෙම වගකීම් මත අපි පොළී පිරිවැයක් දරන්නෙමු. එමෙන්ම මෙබඳු අරමුදල් සපයා ගැනීමෙහිදීද පිරිවැයක් දරන්නට සිදුවේ.	තැන්පතු හා ණය ගැනීම් අපේ සමස්ත වගකීම් අතුරින් පිළිවෙලින් 74% ක් හා 25% ක් වේ.	ද්‍රවශීලතා අවදානම පොළී අනුපාත අවදානම මෙහෙයුම් අවදානම අනුකූලතා අවදානම
ගනුදෙනු බැංකුකරණය			
අපි ස්වයංක්‍රීය මුදල් හුවමාරු යන්ත්‍ර, ණය හා හර කාඩ්පත්, ජංගම දුරකථන බැංකු පහසුකම් හා අන්තර්ජාල බැංකු පහසුකම් බඳු ගනුදෙනු ස්වභාවයේ බැංකු පහසුකම් සලසන්නෙමු. මෙයට අමතරව ණය පිලියෙදුම්, ආයතනික උපදේශන හා රක්ෂණ නිමැවුම් අලෙවිකරණය බඳු දැනුම මත පදනම් වූ සේවාවන්ද සපයන්නෙමු.	සේවා පිරිවැයක් දරන අතර, මෙම කටයුතු ඔස්සේ ගාස්තු හා කොමිස් ආදායමක් උපයා ගන්නෙමු.	ගනුදෙනු බැංකුකරණය සඳහා අවශ්‍ය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, පරිගණක පද්ධති බඳු යටිතල පහසුකම් සඳහා දරන ලද පිරිවැය, පිරියත හා උපකරණ යටතේ දැක්වේ.	මෙහෙයුම් අවදානම (අනුකූලතා අවදානමද ඇතුළුව) සේවක විශ්වසනීයත්වය සොරකම් කිරීම තාක්ෂණික යල්පැනීම්
ජාත්‍යන්තර මෙහෙයුම් හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු			
අපි ගණුදෙනුකරුවන්ට සිය වාණිජ කටයුතු සඳහා වෙළඳපල ප්‍රවේශය හා අවදානම් සමනය කරන නිමැවුම් සපයන්නෙමු. ඒ අතර, ප්‍රධානතම මුදල් ප්‍රේෂණ රටවල්වල මෙහෙයුම් කරන්නෙමු. ඒ අතර, ලොව පුරා පැතිරුණු නියෝජිත බැංකුකරණ සබඳතාද පවත්වාගෙන යන්නෙමු.	මෙම කටයුතු හරහා අපි ගාස්තු ආදායමක් හා විදේශ විනිමය ලාභයක් ලබාගන්නෙමු.	මෙම මූල්‍ය උපකරණ මුලදී අසම්භාව්‍ය වත්කම් යටතේ දැක්වේ. ගණුදෙනුකරුවන් උපකරණ වල්ලේ ණය පහසුකම් ලබා ගතහොත් පසුව ඒ අගයයන් ණය-අත්තිකාරම් බවට පරිවර්තනය කෙරේ.	වෙළඳපල අවදානම ණය අවදානම මෙහෙයුම් අවදානම බේරුම් කිරීම් අවදානම


ප්‍රමුඛ ව්‍යාපාරික අංශ	ආදායම් ප්‍රකාශයට බලපෑම	මූල්‍ය තත්ත්වයට අදාලත්වය	ප්‍රමුඛ අවදානම්
වෙළඳපල හුවමාරු මෙහෙයුම්			
අපි අවස්ථානුකූල හුවමාරු සඳහා මෙන්ම උපායමාර්ගික ආයෝජන වශයෙන් ණයකර හා ප්‍රාග්ධන උපකරණ මිලදීගෙන රඳවා ගන්නෙමු. මේ මඟින් මෙම උපකරණ නිකුත් කරන ආයතනයන්ට සිය මූල්‍ය කටයුතු උදෙසා අරමුදල් සපයා ගත හැකිවේ.	හුවමාරු විකිණුම් තුළින් ලබන ලාභය	මෙම වත්කම් විකිණීමට ඇති මූල්‍ය ආයෝජන, කල්පිරීම තෙක් රඳවා ගන්නා උපකරණ හා හුවමාරු සඳහා රඳවා ගන්නා ආයෝජන ලෙසින් නිරූපණය වේ.	වෙළඳපල අවදානම (මෙහිදී මිල අවදානම මෙන්ම පොළී අවදානමද ඇතුළත් වේ)
ඉස්ලාමීය බැංකුකරණය			
ඉස්ලාමීය බැංකු පහසුකම් ඉල්ලා සිටින ගනුදෙනුකරුවන්ට ඉස්ලාමීය බැංකුකරණ නිමැවුම් හා සේවා සපයන්නෙමු.			
ශ්‍රමය මත ආයෝජන			
අපේ උපාය මාර්ගික ඉලක්ක සපුරාලනු සඳහා අපේ කණ්ඩායම සංවර්ධන කොට රඳවා ගැනීම වෙනුවෙන් ආයෝජනය කරන්නෙමු.	ශ්‍රම පිරිවැය යටතේ සමස්ත කාර්ය මණ්ඩල දීමනා, නිර්වචනය කළ ප්‍රතිලාභ සැලසුම් වල්ලේ දායකත්වය හා පුහුණු කිරීම් සංවර්ධන පිරිවැය ඇතුළත්ය.	සේවක විශ්‍රාම ප්‍රතිලාභ වෙනත් වගකීම් යටතේ දැක්වේ. මෙයට විශ්‍රාම අරමුදල හා විශ්‍රාම පාරිතෝෂිකයද ඇතුළත්ය.	අනුකූලතා හා සේවක විශ්වසනීයත්ව අවදානම ඇතුළුව මෙහෙයුම් අවදානම ප්‍රශස්ත කුසලතා ලබා ගැනීමට හා රඳවා ගැනීමට නොහැකි වීමේ අවදානම
වෙනත් මෙහෙයුම්			
බැංකුව විවිධ උපකාරක සේවා ලබාගැනීමෙහිද, යටිතල පහසුකම් ගොඩනැංවීමෙහි හා පිටතින් වෘත්තිකයන් සම්පාදනය කරලීමෙහිද නිරත වේ.	අප මෙහෙයුම් සඳහා මෙන්ම නඩත්තු හා ක්ෂය කිරීම් උදෙසා පිරිවැය දරන්නෙමු. ඒ හැර බාහිර විශේෂඥයන්ගේ සේවය ලබා ගන්නා අතර, ශාඛා ජාලයේ දෛනික මෙහෙයුම් සඳහාද පිරිවැය දරන්නෙමු.	ස්ථාවර වත්කම්, අනෙකුත් වත්කම් හා අනෙකුත් අවිනිශ්චිතයන්	අනුකූලතා හා සමාජයීය අවදානම් ඇතුළුව මෙහෙයුම් අවදානම. කීර්තිනාමය පිළිබඳ අවදානම්. සේවක විශ්වසනීයත්ව අවදානම
පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම්			
අප සතු පරිපාලිතයන් කිහිපයක්ම ප්‍රධාන නොවන ව්‍යාපාරික කටයුතුව නිරත වේ.	අප පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් වෙනුවෙන් ආයෝජනය කර ඇත්තේ බැංකුව සතු අරමුදල් වලිනි. මේ අරමුදල් මත ආවස්ථික පිරිවැයත් අදාළ වේ.	පරිපාලිතයන්හි සමස්ත වත්කම බැංකුවේ වත්කම් පදනමෙන් 3% වේ.	ව්‍යාපාරික අවදානම හා කීර්තිනාමය පිළිබඳ අවදානම ඇතුළුව මෙහෙයුම් අවදානම

ශ්‍රී ලංකාව සංවර්ධනයේ මුවවිට


ඇමරිකානු ඩොලර් බිලියන 65ක දළ දේශීය නිෂ්පාදිතයක් සහිත පහල මැදි ආදායම් ආර්ථිකයක් සහිත ශ්‍රී ලංකාව 2016 වසර වන විට ඇමෙරිකානු ඩොලර් 4,000 සහිත ඉහළ මැදි ආදායම් ආර්ථිකයන් කරා ළඟාවන්නට අපේක්ෂා කරයි. 2013 වසරේ ආර්ථික වර්ධන වේගය වන 7.3% පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ වේගයෙන්ම වර්ධනය වන ආර්ථිකය බවය. ලෝක බැංකුව විසින් ප්‍රකාශිත ව්‍යාපාර මෙහෙයවීමේ දර්ශකය අනුව අකුණු ආසියාවේ ඉහළම තැන හිමි කරගෙන ඇත්තේ ශ්‍රී ලංකාවය. ලෝකය තුල සමස්ත ප්‍රතිඵලය ලෙස 85 වන ස්ථානයට පත්ව ඇත්තේ ඉදිකිරීම් බලපත්‍ර, බදු ගෙවීම්, විදුලි බලය කරා ප්‍රවේශය හා දේශසීමා හරහා වාණිජ කටයුතු බඳු අංශ ඔස්සේ මෑතදී ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ නිසාය. 2013 ප්‍රකාශිත World Economic Outlook අත්පොතට අනුව අනාගත වර්ධන ගමන්පථය බෙහෙවින් ජවසම්පන්න වනුයේ 2014 වසර සඳහා වර්ධන පුරෝකථනය වන 6.8% පසුබිමේය. සිවිල් ගැටුම් නිමාවත් සමඟ රට තුල අපර- ව්‍යුහ සංවර්ධනය (මංමාවත්, ගුවන්තොට, වරාය හා බලශක්ති) වේගවත් වූයේ ආර්ථික කටයුතු පුළුල් කරමිනි. නිෂ්පාදන පිරිවැය අඩු කරමිනි: සේවා යොමුව වර්ධනය කරමිනි. ඉහල තලයේ සාක්ෂරතාවය හා විශ්ව විද්‍යාල මට්ටම තෙක් නිදහස් අධ්‍යාපනය, දැනුම මත පදනම් කර්මාන්ත හා අනාගත සේවා යෝජකයන්ට රට තුල කුසලතා සංචිත කෙරේ ප්‍රවේශය සලසයි. මහින්ද චින්තනයේ 5 + 1 කේන්ද්‍ර උපාය මාර්ගය සර්වග්‍රාහී එමෙන්ම තිරසර වර්ධන රාමුවක් ඉදිරිපත් කරන්නේ ශ්‍රී ලංකාව මේ කේන්ද්‍ර ඔස්සේ දකුණු ආසියාවේ කලාපීය කේන්ද්‍රය බවට පත්වන්නට බලාපොරොත්තු වන පසුබිමකය.



දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය (%)




ඒක පුද්ගල ආදායම (ඇ. ඩො.)




උද්ධමනය (%)


ජාතියේ බැංකුකරුවන් වන ලංකා බැංකුව දැනටමත් රටේ ආර්ථික වර්ධනයේ සුවිසල් මෙහෙවරක් ඉටුකරන අතර මේ අවස්ථා ඩැහැගන්නට බලා හිඳිනා ආයෝජකයන්ට කේන්ද්‍රීය වර්ධන අංශ තුල සේවා සලසන්නට මැනවින් සූදානම්ව සිටී. ඒ අප සතුව, මේ ක්ෂේත්‍ර පිළිබඳව පුළුල් අවබෝධයක්, කිසිවකුට අභියෝග කළ නොහැකි පිය සටහනක් හා ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලන්නට ඇවැසි නිමැවුම් සමුදායක් ඇති බැවිනි.



පුද්ගලික අංශයේ ණය වර්ධනය
(රු. බිලියන)



සාක් රටවල ශ්‍රම ඵලදායීතාව



දුගීබව - සමස්ත අනුපාතය (%)



ගුවන් සේවා කේන්ද්‍රය

මේ ක්ෂේත්‍රයට අදාළ ඉදිරි දැක්ම වනුයේ ශ්‍රී ලංකාව සහනදායී ගුවන් සේවා සඳහා මෙන්ම සැපයුම් හා සේවා කේන්ද්‍රයක් ලෙස ඔසවා තැබීමය. වසර තුලදී දිවයිනේ දකුණු හම්බන්තොට දෙවන ගුවන් තොටුපල ස්ථාපිත කරන ලද අතර චීමඟින් දකුණුකරයේ සංචාරක ප්‍රවේශයක් බිහිවේ. ප්‍රධාන ගුවන් තොටුපල නවීකරණය කරන අතර දෙවන ධාවන පථයක් ඒකතු කිරීමට නියමිතය. ඒ අතර, දේශීය ගුවන් තොටුපල තත්ත්වයෙන් ඉහල දමන්නට නියමිත අතර ඒ අතුරින් එකක්වත් පෞද්ගලික ගුවන් යානා මෙහෙයුම් කළ හැකි ලෙසට සංවර්ධනය කරනු ඇත. රජයේ ප්‍රධානතම බැංකුකරුවා ලෙස ලංකා බැංකුව මේ යටිතල ව්‍යාපෘති සඳහා මූල්‍යකරණයෙන් දායකවී ඇති අතර රටේ වර්ධනයෙන් මතුවන ඵල නෙලා ගැනීමට අපේක්ෂා කරයි.

මේ පසුබිම මත, බැංකුව ප්‍රධාන ගුවන් සේවාවට සේම දෙවන ගුවන් සේවාවටද ඔවුන්ගේ ප්‍රතිව්‍යුහගත කිරීම් උදෙසා පහසුකම් සැලසූයේ ප්‍රාග්ධන දායකත්වයෙන් මෙන්ම ප්‍රතිව්‍යුහගත සැලැස්ම සඳහා මූල්‍ය පහසුකම් ද සලසමිනි.



නාවුක කේන්ද්‍රය

ශ්‍රී ලංකාව නැව් බඩු මැදිහත්කරුවකුගේ සිට පරිපූර්ණ සැපයුම් මැදිහත්කරුවකු බවට පරිවර්තනය වන්නට අපේක්ෂා කරන්නේ නාවුක ක්ෂේත්‍රයේ සැලකිය යුතු මට්ටමේ ආයෝජනයක් ද සමඟය. මෙහිලා දෙවන සංවර්ධන රැල්ලට දැනටමත් මුල පුරා ඇත. මේ යටතේ යාත්‍රා අලෙවි කිරීම්, නීති හා මූල්‍ය සේවා මෙන්ම වෙළඳ නැව් කාර්ය මණ්ඩල පුහුණු කිරීම් ද වර්ධනය කෙරේ. රජය මෙම ක්ෂේත්‍රයේ බදු බර උදෙසාද සහන සලසා ඇත්තේ අදාළ වෘත්තිකයන් පුහුණු කිරීම වෙනුවෙන් සානුබල සපයන්නටය. ලංකා බැංකුව රාජ්‍ය මෙන්ම පුද්ගලික අංශයේද ආයෝජන සැපයීමෙන් ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛ පාර්ශවකරුවෙකු වී සිටී. ඒ ඔස්සේ මෙබඳු මහා පරිමාණ මූල්‍ය සැලසුම් සඳහා අවශ්‍ය විශේෂිත ඥානය ද උකහා ගෙන ඇත්තේ රු. බිලියන 13.4 ක ආයෝජනයක් ද සමඟිනි.



සංචාරක කේන්ද්‍රය

ලෝකයේ වඩාත්ම පිළිගැනීමට ලක්වූ සංචාරක අත්පොත වන Lonely Planet ප්‍රකාශනය, 2013 වසරේදී පැවසුවේ ශ්‍රී ලංකාව ලෝකයේ සංචාරය සඳහා ඇති හොඳම ගමනාන්තය බවය. මෙම වසර තුළදී අපට මිලියන 1.1 ක සංචාරකයන් ආකර්ශණය කරගත හැකි වූ අතර ඉන් ලද සමස්ත ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 1.4 කි. 2016 අප ඉලක්කය වන මිලියන 2.5 ක සංචාරක පැමිණීම් කරා ළඟා වන්නට නම් තවත් කාමර 22500 ක අවශ්‍යතාවක් තිබේ. හයාට්, ෂැංග්‍රිලා, අයිටීසී, මැරිනෝ හා මැරියට් බඳු ගෝලීය හෝටල දාම රට තුළ දැනටමත් ඉදි කිරීම් පටන්ගෙන ඇති අතර ඒ සියල්ල 2016 වන විට විවෘත කිරීමට නියමිතය. ලංකා බැංකුව මේ ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සලසා ඇති අතර රටට මුල්වරට පා තබන ආයෝජකයන්ට අවැසි උපදෙස් සපයන්නට පොහොනා විශේෂිත ඥානයෙන්ද සන්නද්ධව සිටී.

ලංකා බැංකුව සංචාරක ක්ෂේත්‍රයට අරමුදල් සපයන්නන් අතුරින් පළමුවැන්නා වී ඇත්තේ 2013 වසර තුළ රු. බිලියන 8.8 ක අරමුදල් වෙන් කිරීමත් සමඟිනි. අපේක්ෂිත කාමර ගණන 1384 කි.



දැනුම් කේන්ද්‍රය

රටේ ඉහළ සාක්ෂරතා මට්ටම, අධ්‍යාපන ආයතන තුළට පිවිසීමේ අනුපාත හා ස්ත්‍රී-පුරුෂ සම අවස්ථා මෙම අංශයේ අපේක්ෂා වෙනුවෙන් කදිම පදනමක් සපයයි. ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ පිළිබඳ නව දැක්මක් මතුවී ඇත්තේ එහි ගුණාත්මක බව සීඝ්‍රයෙන් ඉහළ නංවමිනි. රජයේ වැඩ සටහන් ඔස්සේ නාගරික හා ග්‍රාමීය පාසල් අතර සම්පත් අසමානතා අවම කර ගැනීමට හැකිවී ඇත. මෙම අංශයේ සංවර්ධනය සඳහා පුද්ගලික අංශය ප්‍රධාන පෙලේ භූමිකාවක් නිරූපණය කරනු ඇතැයි අපේක්ෂා කරනු අතර වෘත්තික සංවිධාන මෙන්ම විදේශීය විශ්ව විද්‍යාලද රට තුල ශාඛා ස්ථාපනය කරමින් සිටිති. අපේ අපේක්ෂාව වන්නේ ශ්‍රී ලංකාව විදේශීය ශිෂ්‍යයන් රුචි ගමනාන්තයක් බවට පත් කිරීමයි. අප, ක්ෂේත්‍රයේ ප්‍රධාන පෙලේ ආයතන සමඟ අධ්‍යාපනික පුනරුදය උදෙසා කටයුතු කමින් සිටින්නෙමු. 2013 වසරේ අපේ අරමුදල් සැපයුම රු.බිලියන 11.3 කි.



බලශක්ති කේන්ද්‍රය

බලශක්ති සුරක්ෂිත භාවය තහවුරු කරන්නට මෙන්ම නැගී එන බලශක්ති කේන්ද්‍රයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කරන්නට අවශ්‍යය නොබිඳුණු ආයෝජන ප්‍රවාහයක් දැකිය හැකිය. මේ අතර, පුනර්ජනනය කළ හැකි බලශක්ති ප්‍රභව සංවර්ධනය, හඳුනාගත් සාගර ද්‍රෝණි තුනක බොර තෙල් ගවේශණය, නව බලාගාර ත්‍රිත්වයක් හා ඛනිජ තෙල් හා බැඳුණු උපකාරක සේවා සැපයුම හා අපර-ව්‍යුහ ව්‍යාපෘති ද වේ. ලංකා බැංකුව දැනට මෙම ක්ෂේත්‍රය තුල රු. බිලියන 229.9 ක් ආයෝජනය කර ඇත. මේ ණය කළඹ 2014 වන විට තවදුරටත් වර්ධනය වේ යැයි අප අපේක්ෂා කරන්නේ පුද්ගලික අංශයේ නව ආයෝජන හා රු. බිලියන 235.3 ක් පමණ වන සැලසුම් කළ ණය මුදාහැරීම් මතය.



වාණිජ කේන්ද්‍රය

ඉහත දැක්වුණු පස් වැදෑරුම් කේන්ද්‍ර තුල ක්‍රියාකාරකම් තුලින් ශ්‍රී ලංකාව මෙම කලාපයේ වාණිජ කේන්ද්‍රය ලෙස ඉස්මතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. හම්බන්තොට හා දකුණු කොළඹ වරායන් නිදහස් නැව් තොට ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එමඟින් සැලකිය යුතු තලයේ පුද්ගලික අංශයේ ආයෝජන ග්‍රහණය කරගත හැකි වනු ඇත. ශ්‍රී ලංකාව තුල සිය කාර්යාල විවෘත කරන්නට ඊසි විදේශීය ව්‍යාපාරයන්ට අවශ්‍ය පහසුකම් සැලසීමට රටේ ප්‍රධානතම බැංකුව වශයෙන් අපි මැනවින් ස්ථානගතව සිටින්නෙමු. ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ මධ්‍යගත වාණිජ කේන්ද්‍රය බවට පරිවර්තනය කරනු උදෙසා ලංකා බැංකුව මාර්ග සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් රු. බිලියන 52.3 ක් මෙතෙක් මුදා හැර ඇත.

ශ්‍රී ලාංකිකයන්ට අවැසි දෑ පිරිනමමින්....

ඉවත්ව යන සභාපතිතුමාගේ පණිවිඩය

ලංකා බැංකුවට ගනුදෙනුකාර කේන්ද්‍රණය තුල ඇත්තේ ප්‍රෞඪ උරුමයකි. බොහෝ කොට අපි ග්‍රාමීය ප්‍රදේශ කරා පිවිසි මුල්ම බැංකුකරුවා වූයෙමු. අප සතු ගනුදෙනුකරුවන් සංඛ්‍යාව මිලියන 10 ඉක්මවයි. ඒ ඔස්සේ අපගේ ගනුදෙනුකාර විහිදීම් අනුපාතය 54% වන අතර එය අපේ සිතුවිලි රටාවේ අන්තර්ගත සමාජයීය ඉලක්ක මත ප්‍රගතිය විමසන්නට භාවිතා කරන එක් මිනුම් දණ්ඩකි.

ලංකා බැංකුව 2013 වසර සඳහා රු. මිලියන 15,709 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති බව ඔබ වෙත දන්වන්නේ සතුටිනි. ඒ වසර තුල බැංකු කර්මාන්තය වෙත එල්ලවූ කොතෙකුත් අභියෝග මැද වුව, අපට ආවේණික ශක්තීන් පිලිබිඹු කරමින් හා දිවයිනේ මූල්‍ය පහසුකම් සපයන්නන් අතර නායකත්වය හොබවන්නා ලෙස අපේ ස්ථාවරත්වය තහවුරු කරමිනි. මෙම වසර තුල අපි 15.7% ක ආදායම් වර්ධනයක් ළඟාකර ගත්තෙමු. වඩා ස්ථාවර ශ්‍රී ලංකා රුපියල නිසාවෙන් මෙම වසර තුල විදේශ විනිමය ආදායම සැලකිය යුතු මට්ටමකින් අඩුවූ තත්ත්වය හා කලින් වසරේ ආදායම තුල විදේශීය විනිමය ආදායමේ ඉහළ දායකත්වයක් තිබීම හා සලකා බලන කළ මෙය, පැසසුම් ලැබිය යුතු වර්ධනයකි. මෙයට අමතරව, 2013 වසර බැංකු ක්ෂේත්‍රයේ හීනවන ආන්තිකයන් සහිත එකක් වූ අතර, කෙමෙන් වියැකෙන වත්කම් ගුණාත්මකභාවයේ ප්‍රතිඵලයක් ලෙස ඉහළ තලයක අපහායන පිරිවැයක්ද විඳහා පෑවේය. මේ සියල්ල සාරාංශ කොට දක්වතොත්, ණය පහසුකම් සඳහා පුද්ගලික අංශයේ ඉල්ලූම සාපේක්ෂ වශයෙන් මැදහත් තලයක පැවති වර්ෂයක චංචල මූලාශ්‍ර තුලින් ආදායම් ඉලක්ක නොකරමින්, ඒ හා සමඟ බැංකුවේ මෙහෙයුම් රාමුවට මුහුණපාන්නට සිදුවන හදිසි කම්පනයක බලපෑම අවම කරගනිමින්, සැලකිය යුතු ප්‍රමාණයක තිරසර ලාභ මට්ටමක් ළඟා කර ගැනීමට අපට හැකිවිය. මේ වූ කලී බැංකුවේ ප්‍රත්‍යස්ථිතිය මොනවට විදහා පෙන්වීමක් විය. වසර තුල දියත් කෙරුනු අමෙරිකානු ඩොලර් මිලියන 500 ක්වූ බැඳුම්කර නිකුතුව මෙන්ම රු. බිලියන 8 ක ණයකර නිකුතුව කෙරේ යොමුවූ ආයෝජක රුචිය වඩාත්ම දිරිගන්වන සුළු වූයේ ඒ තුලින් දේශීය වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන්ද බැංකුවට ඇති පිළිගැනීම පිළිබිඹු වූ බැවිනි.



රසීක් සරූක් මහතා
ඉවත්ව යන සභාපති

54%

ගනුදෙනුකාර විහිදීමේ අනුපාතය

368කි.මී.

මාර්ග සංවර්ධනයට දායකත්වය

පුරා දශක තුනක් මුළුල්ලේ මුළු රටම වෙලාගනිමින් පැවති සිවිල් ගැටුම් නිමා කිරීමත් සමඟ උදාවූ උසස් වර්ධන වේගයක් පෙන්වූ කාල පරාසයෙන් පසු ආර්ථිකය ස්වභාවික ගැලපුම් සමයකට සේන්දු වූ පසුගිය වසර තුල වත්කම් හා ණය වර්ධනය මධ්‍යස්ථ තලයක පැවතුණි. අපි, ණය හා අත්තිකාරම්, තැන්පතු, වත්කම් හා ලාභදායකත්වය යන අංශයන්හි වෙළඳපල නායකත්වය තවදුරටත් රඳවා ගෙන හිඳින්නෙමු. තරඟකාරිත්වය බෙහෙවින් තියුණු වුවද අපි විදේශීය ප්‍රේෂණ වෙළඳපොලෙහිද වැඩි පංගුවක හිමිකාරිත්වය තවදුරටත් ආරක්ෂා කර ගනිමින් සිටින්නෙමු. රාජ්‍යය සතු ව්‍යවසායයන් හි වර්ධනය වූ ලාභදායීත්වය මෙන්ම ප්‍රශස්ත මුදල් ප්‍රවාහ, රාජ්‍ය අංශයේ ණය ආපසු ගෙවීම් සඳහා දායකවූ අතර, පුද්ගලික අංශයේ අපේක්ෂිත මට්ටමට වඩා අඩු වූ ණය සඳහා ඉල්ලුම, ණය හා අත්තිකාරම් වර්ධනය අඩාල කළ අතර, එහි ප්‍රතිඵලය වූයේ අතිරික්ත ද්‍රවශීලිතාවයක් නිර්මාණය විමය. අපි, අප ශාඛා බැංකුකරණයේ ණය පිරිනැමීම් උපාය මාර්ග විවරණයට ලක් කළේ පහළ යන රන් මිල හමුවේ, ශාඛා බැංකුකරණයේ ණය කළඹේ සංයුතිය යළි සමහන් කරන අරමුණෙනි. උකස් ණය කළඹ වර්ධනය කෙරේ ක්‍රියාශීලීව යොමු නොවන අතරතුරේ, උකස් ණය සඳහා අතිරේක ආරක්ෂාකාරී පිළිවෙත් හඳුන්වා දෙමින් සෙසු ශාඛා ණය නිමැවුම් ප්‍රවර්ධනය අපගේ මූලික ඉලක්කය විය.

බැංකුවේ අරමුදල් සැපයුම් මූලාශ්‍ර මේ වසර තුල වෙනසකට ලක්විය. දැන් අපගේ සමස්ත ණය ගැනීම් අතරින් 68% කට වඩකියනුයේ විදේශ මුදල් ණය ගැනීම්ය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ කිසිදු පූර්ව ප්‍රචාරණ වැඩ පිලිවෙළකින් තොරව විදේශීය ආයෝජකයන් විසින් සය වතාවක් අධි-දායකත්වයක් සැපයූ 2013 වසරේ දියත් කළ ඇමරිකානු ඩොලර් මිලියන 500ක බැඳුම්කර නිකුතුවය. මේ නයින් බැංකුවේ අරමුදල් ව්‍යුහය ශක්තිමත් කෙරේ. 2013 වසර තුල රු, බිලියන 5.3 ක ලාභාංශ භාණ්ඩාගාරයට ගෙවනු ලැබීය. මේ වූ කලී රජයට මෙතෙක් ගෙවන ලද විශාලතම ලාභාංශ අතරින් එකකි.

ඉදිරි පරම්පරාවන් සඳහා බැංකුව නිසිසේ ස්ථානගත කිරීම මෙන්ම අපේ උන්නතිකාමී වර්ධනය හමුවේ ගෝලීය වෙළඳපලේ තරඟ කරන්නට අවැසි හැකියා මුවහත් කරන්නට නම් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පූර්ණ පරිවර්තනයක් අවශ්‍ය වේය යන්න අධ්‍යක්ෂක මණ්ඩලයේ මතයයි. අපි මේ උපාය මාර්ගය විමර්ශනය කරමින් සිටින්නෙමු. මේ ආයෝජනය බැංකුවේ උපාය මාර්ගික ඉලක්ක හා අනුගතවේද යන්න තහවුරු කරනු වස් ජාත්‍යන්තර උපදේශකත්ව ආයතනයක් විසින් අවශ්‍යතා විශ්ලේෂණයක් සේම අවදානම් විශ්ලේෂණයක් ද ක්‍රියාත්මක කරනු ලැබීය. අධ්‍යක්ෂක මණ්ඩලය මේ අධ්‍යයනයන් හි ප්‍රතිඵල හා උපදේශකයන් විසින් ඉදිරිපත් කරල ලද ඇගයීම් වාර්තාවද සැලකිල්ලට බඳුන් කළේය. මීට පසුගාමීව 2013 වසර තුල නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලද අතර, ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදුව 2014 වසර අවසානය වනවිට ප්‍රධාන බැංකුකරණ පද්ධතියේ තත්ත්වය ඉහළ නැංවීම සම්පූර්ණ කරලීම කරා සේන්දු වෙමින් පවතී. තොරතුරු තාක්ෂණ පද්ධති පරිවර්තනය අධ්‍යක්ෂක මණ්ඩලයේ උපාය මාර්ගික ප්‍රමුඛතාවක් වන අතර, එහි ප්‍රගතිය අපේක්ෂිත ආකාරයෙන් ඉටුවේද යන්න තහවුරු කරනු වස් ප්‍රගති සමාලෝචන වාර්තා නොකඩවා ලබා ගන්නෙමු. මේ පරිවර්තනය කළමනාකරණය සඳහා අවශ්‍ය සේවක ශිල්පීය ඥානය අප විමර්ශනය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය පුහුණු කිරීම් මෙන්ම ශිල්පීය හැකියා හිඩැස් හඳුනාගත් ස්ථාන සඳහා නව සේවකයන් බඳවා ගැනීම් ද ඉටු කරන්නට පියවර ගෙන ඇත. අපගේ සැලකිල්ල යොමුවූ තවත් අංශයක් වූයේ තොරතුරු තාක්ෂණ ආරක්ෂණය ය. සුවිශේෂී වැදගත්කමක් දරන මේ අංශය, ප්‍රශස්ත ජාත්‍යන්තර පරිචයන් අනුව යමින් ශක්තිමත් කිරීමට අවශ්‍ය පූර්ව ආරක්ෂණ පියවර අප විසින් ගෙන ඇත. තොරතුරු තාක්ෂණ පරිවර්තන ව්‍යාපෘතිය බැංකුවේ සමස්ත මෙහෙයුම් අංශ කරා බලපෑමක් කරන බහුවිධ හැඩතල සහිත ව්‍යායාමයක් වන අතර, බැංකුව විසින් මුලපුරන ලද විශාලතම තනි ව්‍යාපෘතිය ද වේ. මේ නිසාම, 2013 වසර තුළ අධ්‍යක්ෂක මණ්ඩලයේ දැක්ම ඒ දෙස යොමු කරන ලද අතර, එය ඉදිරි වසර කිහිපය තුලද නොකඩවා කෙරීගෙන යනු ඇත.

යළි අවධානයට ලක් කෙරුණු තවත් උපාය මාර්ගික ප්‍රමුඛතාවයක් වූයේ බැංකුවේ එතෙර මෙහෙයුම් ය. අරමුණ රටේ දේශසීමා වලින් ඔබ්බේ වර්ධන අවස්ථාවන් හඳුනා ගැනීමය. වර්ධන අවස්ථා සොයා යන මේ ගවේෂණාත්මක ඉදිරිගමනේ කොටසක් ලෙසින් සීෂෙල්ස් දිවයිනේ ශාඛාවක් විවෘත කළෙමු. සක්‍රීය කොටස් වෙළඳපල 29 කින් සමන්විත රටවල් 54 කින් සැදුම්ලත් අප්‍රිකානු මහාද්වීපය තවමත් බොහෝ කොට පවතින්නේ ලෝකයේ සැඟවුණු නිධානයක් ලෙසය. මේ වෙළඳපල ගවේෂණය කරන්නට බැංකුව කිසිසේත් නොපැකිලෙනු ඇත.

මෙම ක්‍රියාදාමය සෙසු රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියාවට නැගෙන උපාය මාර්ගයකි. මෙහිදී ලංකාව ගුවන් සේවා කේන්ද්‍රයක් ලෙස සැලකෙන පසුබිමෙහි නව විකල්ප වෙළඳපල තුල අපේ විස්තාරණය නොකඩවා කරගෙන යන්නේ හුදෙක් සංඛ්‍යාත්මක හරඹයක් ලෙස නොව, බැංකුවට පමණක් නොව රටේ ආයතනික ගනුදෙනුකරුවන් අංශය මෙන්ම ව්‍යවසායකයන්ටද සැලකිය යුතු මට්ටමේ වර්ධන අවශ්‍යතා සම්පාදනයේ අරමුණ සහිතවය. අපේ වර්ධන උපාය මාර්ග තුලින් ඵල නෙලමින් මේ ගමනට එක්වන සේ අපි අපේ ගනුදෙනුකරුවන්ට ඇරයුම් කරන්නෙමු.

ලංකා බැංකුවට ගනුදෙනුකාර කේන්ද්‍රණය තුල ඇත්තේ ප්‍රෞඪ උරුමයකි. බොහෝ කොට අපි ග්‍රාමීය ප්‍රදේශ කරා පිවිසි මුල්ම බැංකුකරුවා වූයෙමු. අප සතු ගනුදෙනුකරුවන් සංඛ්‍යාව මිලියන 10 ඉක්මවයි. ඒ ඔස්සේ අපගේ ගනුදෙනුකාර විහිදීම් අනුපාතය 54% වන අතර එය අපේ සිතුවිලි රටාවේ අන්තර්ගත සමාජයීය ඉලක්ක මත ප්‍රගතිය විමසන්නට භාවිතා කරන එක් මිනුම් දණ්ඩකි. ග්‍රාමීය බිම්පෙත් හරහා ආර්ථික කටයුතු උද්දීපනය කරමින්ද, ගොවීන් ව්‍යවසායකයන් බවට පරිවර්තනය කරන්නට පහසුකම් සපයමින්ද අපි ප්‍රධාන පෙලේ කාර්යභාර්යයක් මෙහිලා ඉටු කරන්නෙමු. මේ ආයාසයන්හි ප්‍රතිලාභ යළි යළිත් 5ස් වැනි වරටත් ලංකාවේ සමස්ත ආයතනික පුරවැසියන් අතර ඉහළම සන්නාම අගය හිමිකර ගැනීම තුලින් පිළිබිඹු වන අපේ සන්නාම ශක්තියෙන් පුනරුපණය වේ. රටේ බොහෝමයක් ආයතනික මට්ටමේ ව්‍යාපාර ආයතන සිය කටයුතු ආරම්භ කළ මුල් අවස්ථාවේ සිටම අප හා ගනුදෙනු කරමින්, මේ කාලය තුල එක්ව වර්ධනය වී ඇති හෙයින්ම මේ අංශයේ ප්‍රමුඛ වෙළඳපල පංගුව යළි අත්පත් කර ගැනීමට අපි මැනවින් ස්ථානගතව සිටින්නෙමු. රටේ ආර්ථික වර්ධනයෙහිලා නියාමක බලවේගයක් වන මේ ගනුදෙනුකාර කොටස සමඟ සබඳතා තීව්‍ර කිරීම අපේ අරමුණ ය.

අපගේ උපාය මාර්ග මහින්ද චින්තන ඉදිරි දැක්මේ අන්තර්ගත රටේ සමස්ත උපාය මාර්ග හා සමීපව අනුගත වේ. මෙහිදී අප බැංකුවට අදාළ වන ආයාසයන් කිහිපයකට අත්වැල් සපයන අතර සමාජ, ආර්ථික සංවර්ධන ඉලක්ක කරා යන මේ ගමනේ ප්‍රමුඛ පහසුකාරකයෙක් වන්නෙමු. ඊට අනුරූපව අප ධීවර ක්ෂේත්‍රයට ණය සැපයීමෙහිලා ප්‍රධානතම ණය දෙන්නා බවට පත්ව ඇත්තේ මේ අංශයේ ණය ප්‍රමාණයෙන් 40% ඉක්මවා වග කියමිනි. අප ධීවර අමාත්‍යාංශය හා එක්ව මෙම ක්ෂේත්‍රයට ණය සම්පාදනය දෙගුණ කළ අතර ඔවුන් ණයකරුවන් හඳුනාගැනීම හා ණයකරුවන්ට අවශ්‍ය අනෙකුත් උපකාරක සේවා සැපයීම භාරගනු ලබන්නේ ඒ අතරතුරේ වත්කම් හි ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කරන අතරවාරයේය.

අපගේ ප්‍රධාන කොටස්හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන දිගු ආපසු ගෙවීම් කාලයක් සහිත අපර-ව්‍යුහ ව්‍යාපෘති සඳහා අපි ණය පහසුකම් සැපයීම නොකඩවා කරගෙන යන්නෙමු. මේ අතර රට පුරා විහිදුණු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍යකරණය අන්තර්ගතය. මෙම අංශයට ණය සම්පාදනයෙහි ලා අප ප්‍රමුඛතම ණය දෙන්නා වනුයේ කිලෝමීටර් 368 ක මාර්ග සංවර්ධනය සඳහා දායක වෙමිනි. මෙපරිදිම අපි විදුලිබල උත්පාදන ව්‍යාපෘති උදෙසා රු. බිලියන 235.4 පිරිනමා ඇත්තෙමු. මේ බලශක්ති ව්‍යාපෘති රටේ කාර්මිකකරණය සඳහා පදනමක් සපයනවා සේම මහින්ද චින්තනයේ ප්‍රකාශිත රටේ සියළුම නිවෙස් ඒකක

සඳහා විදුලි බලය සම්පාදනයට ද ඉවහල්වනු ඇත. බැංකුව පානීය ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ සිය ආයාසය ඔස්සේ, පිරිසිදු පානීය ජල උත්පාදන ව්‍යාපෘති සඳහා රු. බිලියන 30.9 ක් පිරිනමා ඇත. ලංකා බැංකුව විසින් සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපෘති 13 ක් උදෙසා රු.බිලියන 5.2 ණය පිරිනමා ඇත්තේ රටේ සංචාරක හෝටල කාමර සංඛ්‍යාවට 1,384 ක් එක් කරමිනි.

අධ්‍යක්ෂක මණ්ඩලය ලංකා බැංකු සමූහයේ සමානයන් අතර ප්‍රමුඛයාගේ භූමිකාව ඉටු කරමින් සමූහය පරිපාලිතයන් ප්‍රතිව්‍යුහගත කරමින් ඒ හරහා මෙහෙයුම් සංවිධිත කරන්නට මුල පිරිය. මෙහිදී සීමාසහිත සීලිස් හා එම් සී එස් එල් මූල්‍යසේවා සමාගම අතර ඒකාබද්ධනය වසර තුළ නිම කරන ලදී.

මේ පරිපාලිත සමාගම් ඒකාබද්ධ කිරීම තුලින් ආයතන දෙකටම ඉහල මට්ටමේ ප්‍රාග්ධන අවශ්‍යතාවය, මූල්‍ය හා නියාමන වාර්තාකරණය හා සමාගම් කුඩා පරිමාණයේ පවත්නා කළ ළඟා කරගත නොහැකි සෙසු ප්‍රමිතීන් රැසක්ම සහිත මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුල සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය පරිමාණනුකූල පිරිමැසුම් නෙලාගත හැකිවනු ඇත. මෙම ඒකාබද්ධයේ දී ආයතන දෙකේ සේවක රැකියා සුරක්ෂිතතාවය සහතික කරන අතර ප්‍රවිචාරක ස්ථාන මාරුවීම් ද වළක්වා ලනු ලැබීය. ඒ සියල්ල අතරතුර, ආයතන දෙකේ සුළු කොටස් හිමියන්, ඉනික්ස් සමූහනය හා ප්‍රයිම් ලැන්ඩිස් ආයතනයේ බැඳියාවන් ආරක්ෂා කරනු ලැබීය. අධ්‍යක්ෂක මණ්ඩලය මේ අවශ්‍යතාවය හඳුනා ගත්තේ 2011 වසරේදී වන අතර, අනාගතයේදී සමූහනය කළ තව තවත් සහක්‍රියාවන් සාක්ෂාත් කරන්නට බලාපොරොත්තු වන්නෙමු.

අධ්‍යක්ෂක මණ්ඩලය බැංකුවේ කටයුතු තුල විධායක නොවන භූමිකාවක් නිරූපණය කරනුයේ උපායමාර්ග සැලසුම් කිරීමෙහිලා පහළ සිට ඉහළට වන ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරමින් හා ප්‍රතිපත්ති පිළිබඳ පුළුල් මඟපෙන්වීම් හා මෙහෙයවීම් ලබාදෙමිනි. ඒ අනුව, බලය පවරනු ලබන විධායක කණ්ඩායම තම විස්තීර්ණ යෝජනා අධ්‍යක්ෂක මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කරයි. අධ්‍යක්ෂක මණ්ඩලය බැංකුවෙන් බැහැර ස්ථානයක දෙදිනක් මුළුල්ලේ පැවැත්වෙන, ප්‍රමුඛ කළමනාකරණ පිරිස සහභාගීවන හමුවක නායකත්වය දරමින් මෙම උපාය මාර්ග සමාලෝචනය කොට, එකී සැලැස්ම අවශ්‍ය නම් සංශෝධනද සහිතව අනුමත කරයි. අපේ උපාය මාර්ග රජයේ අපේක්ෂාව හා බැංකුවේ අභිප්‍රායයන් අතර සුසංයෝගය හා අනුගත වී ද පවතී. මෙහිදී අධ්‍යක්ෂක මණ්ඩලය මැදිහත් වන්නේ රටේ හා බැංකුවේ සුභසිද්ධිය යන දෙකම තහවුරු කරනු හෝ කටයුතු කරනු සඳහා ය. අපේ මානව සබඳතා උපාය මාර්ග තුළ බැංකුවේ හැකියා සංස්කෘතිය සංවර්ධනය මෙන්ම බැංකුවේ අනුප්‍රාප්තික සැලසුම්කරණය ද ඇතුළු ආයාසයන් රැසක්ම ඇතුළත්ය.

වගකිව යුතු ආයතනික පුරවැසියකු ලෙස තමනට පැවරී ඇති භූමිකාව පිළිබඳව ලංකා බැංකුව මැනවින් හඳුනාගෙන ඇති අතර, පුළුල් ප්‍රජාවට මූල්‍ය පහසුකම් සේවා ලබාදෙන අතර අපේ සංස්කෘතික උරුමය සුරකින ආයාසයන් රැසකට දායකත්වය ලබාදෙනුයේ ඒ අතරවාරයේ ගෝලීය පරිසරය තුල අප මවුබිම ද ප්‍රවර්ධනය කරලමිනි. 2013 නොවැම්බර් මස පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සමගාමීව පවත්වන ලද 'දේශපාලනයට පෙර ආර්ථිකය' යන තේමාව යටතේ වූ ව්‍යාපාරික පීඨිකා හමුවට දායකත්වය සැපයීම දුන් අපේ ආයතනික සමාජ වගකීම් වැඩසටහනේ ප්‍රමුඛතම අංගයක් විය. පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල ගෞරවනීය ව්‍යාපාරික චරිත රැසක්ම සහභාගී වූ මෙම ව්‍යාපාරික හමුවේ අවසන් සැසියේ මුලසුන හෙබවීමේ ගෞරවය මට හිමිවිය. මෙහිදී සහභාගීවූ අපි, හැමටම පුළුල් ආර්ථික වර්ධනයක් උදාකරගත හැකි ඉලක්ක පිලිබඳව විවිධ හැඩතල ඔස්සේ අදහස් හුවමාරු කර ගත්තෙමු, විවාද කළෙමු.

මහා කළමනාකරු විසින් කාර්යක්ෂම ලෙසින් මෙහෙයවන ලද ආයතනික හා විධායක කණ්ඩායම් තිලිණ කළ වෙහෙස නොතැකූ පරිශ්‍රමය, කැපවීම හා දායකත්වය පිලිබඳව මම හද පත්ලෙන්ම ස්තූතිවන්ත වෙමි. අප මුහුණපාන ප්‍රශ්න පිලිබඳ අවබෝධයෙන් යුතුව, සැමටම පිලිගත හැකි විසඳුම් කරා යොමුවනු උදෙසා කළමනාකාරිත්වය සමඟ සහයෝගයෙන් කටයුතු කල වෘත්තීය සමිති නිසා මේ කාලය තුල කාර්මික සාමය පවත්වා ගෙන යන්නට අපට හැකිවිය. ඔවුහු සහයෝගය දැක්වීමට තමන්ට ඇති අභිලාශය ප්‍රකාශ කර සිටියහ.

මුදල් අමාත්‍යවරයා ලෙස තමන්ට ඇති බලතල මත, මෙම ගෞරවනීය ආයතනයේ සභාපති ලෙස මා පත්කිරීම පිලිබඳව මම අතිගරු ජනාධිපතිතුමන්ට මගේ හෘදයාංගම ස්තූතිය පුදකරමි. එහි සේවය කරන්නට ලැබීම ඉමහත් ගෞරවයකි. මහ බැංකුවේ අධිපතිතුමන්ට හා භාණ්ඩාගාරයේ ලේකම්තුමන්ට මගේ ස්තූතිය පුදකරනුයේ ඔවුන් පලකළ සහයෝගය හා විදහා පෑ මඟපෙන්වීම් මිළකල නොහැකි නිසා ය. එපරිද්දෙන්ම මම, බැංකුව හා සමීප සහයෝගයකින් කටයුතු කළ අමාත්‍යංශයනට, මෙම ක්ෂේත්‍රයේ නියාමකයන් සේ සහාය වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ට හා මගේ නිල කාලය තුල සහයෝගය හා අත්වැල සැපයූ අධ්‍යක්ෂ මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩලීය ලේකම්වරියටද ස්තූතිය පළකරමි. අප, බැංකුවේ හා එහි පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන් සුරක්ෂිත කරලන්නට අවශ්‍ය මූලධර්ම පිලිබඳව කළමනාකාරිත්වයට මඟපෙන්වීමට සමත් පිරිපුන් ප්‍රතිපත්ති රාමුවක් අප විසින් ස්ථාපිත කර ඇති බව මම දැඩිව විශ්වාස කරමි.

මගේ අනුප්‍රාප්තිකයාට බැංකුව තවදුරටත් ඉහළ තලයකට ඔසවා තැබීම උදෙසා මම සුභාශිංශනය කරමි.



රසීක් සරූක් - ජනාධිපති නීතීඥ
සභාපති.

2013 දෙසැම්බර් 26
කොළඹ දීය.

සෞභාග්‍යය බෙදාගත් තුලිත කාර්යඵලය

වැඩබලන සභාපතිතුමාගේ පණිවිඩය

"ගෝලීය සංවර්ධනය ආසියානු ඉසව්ව කරා සේන්දු වන වත්මන් විතැන්වීම තුළ මතුවන්නට නියමිත අවස්ථාවන් පිළිබඳව බැංකුවට පැහැදිලි වැටහීමක් ඇත."

හිතවත් පාර්ශවකරුවන් වෙත

ලංකා බැංකුවට මෙරට මූල්‍ය අංශය සුමට කරලීමෙහිලා චේතිහාසික උරුමයක් ඇත. වර්ධනය කරා යොමුවූ අපේ සැලසුම් බැංකුව නව යුගයක් කරා ගෙන යනු ඇත්තේ අප වර්ධනය අරමුණු කරගත් විභවයන් සමාලෝචනය කරමින් අපේ වත්මන් මෙහෙයුම් ක්‍රියාවලිය, මෙහෙයුම් විශිෂ්ටත්වය සාක්ෂාත් කරලන්නට පරිවර්තනය කරන අතරවාරයේය. මෙහිලා බැංකුවේ උපාය මාර්ග, මහින්ද චින්තන ඉදිරි දැක්මේ ප්‍රකාශිත 5 + 1 කේන්ද්‍ර උපාය මාර්ගය හා සමීප ලෙසින් අනුගත වී ඇතුවා මෙන්ම රජයේ ප්‍රමුඛතම බැංකුකරුවා ලෙස අපේ වගකීම හා සමඟ සංගත වේ. මේ නයින් ලංකා බැංකුව එය බෙදා හදාගත් සෞභාග්‍යය හා සමතුලිත කාර්යසාධනය කෙරේ යොමුවූ ඇතුළත්කරණ වර්ධනය මත පදනම් උපාය මාර්ගයක් වන්නේ, ඒ සඳහා තෙවැදෑරුම් යටිපෙළ ප්‍රවේශයක් භාවිතා කරමිනි. ශ්‍රී ලංකාව 2013 වසරෙහිදී දකුණු ආසියාවේ ඉහළම දල දේශීය නිෂ්පාදිත වර්ධන වේගය සහිත රට බැවින් මෙය බැංකුවේ වර්ධනය සඳහා හසුරුවා ගත හැකි සාධනීය අනුගතවීමක් සේ දකින්නෙමු. 2014 වසර තුළ ගෝලීය ආර්ථිකමය වපසරිය වඩා ප්‍රශස්ත වනු ඇතැයි අපේ අපේක්ෂාව වන්නේ, ඉහළ තලයේ ආර්ථිකයන් සිය වර්ධන වේගය ඉහළ නංවන අතර, ඒ හරහා සංවර්ධනය වන ආර්ථිකයන් සහිත රටවලට නව අභියෝග එල්ල වන බැවිනි. ගෝලීය සංවර්ධනය ආසියානු ඉසව්ව කරා සේන්දු වන වත්මන් විතැන්වීම තුළ මතුවන්නට නියමිත අවස්ථාවන් පිළිබඳව බැංකුවට පැහැදිලි වැටහීමක් ඇත.



රාජු සිවරාමන් මහතා
වැඩ බලන සභාපති

"දැනට ජාත්‍යන්තර තලයේ හොඳම බැංකු 1000 අතර සිටින අප, මැදිකාලීන ඉලක්කයක් මත මුල් 500 තුළට ගෙන එන්නටද අපේක්ෂා කරන්නෙමු.

මේ පිළිබඳ අපේ උපායමාර්ග, මේ වෙළඳපළ බණ්ඩයන්හි විභවයන් හා සහසම්බන්ධ ඒ තුළ ලංකා බැංකුවට ඇති උපාය මාර්ගික වාසි සහගත තත්ත්වයන් ද සැලකිල්ලට ගෙන ඇත."

2013 වසරෙහිදී මුලපුරන ලද තාක්ෂණික පරිවර්තනයන් මැදි කාලීන වශයෙන් අබණ්ඩව කරගෙන යන අතර මේ හා සම්බන්ධ වැඩ කටයුතු 2014 වසර තුළ ජවයක් සහිතව ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ. අනාගතයේදී බැංකුවට ජාත්‍යන්තර තලයේ තරඟ කරන්නට හැකිවන ලෙසින්, ඒ සඳහා අවැසි ප්‍රමාණවත් මට්ටමක සම්පත් ලබා ගැනීම සඳහා සුවිසල් මූල්‍ය සැපයුමක් ඒ සඳහා වෙන් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය තොරතුරු තාක්ෂණික පරිවර්තනය වාරානුකූල පදනමකින් සමාලෝචනයට ලක් කරන්නේ මේ ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් සම්පත් යොදවනවා මෙන්ම ඒ හා සමගාමීව කුසලතා සංවර්ධනයද සිදුවන බව තහවුරු කරලන්නටය. මෙහි අරමුණ සාර්ථක පිළිගැනීම හා ප්‍රශස්ත පරිහරණය අර්ථවත් කිරීමය.

ලන්ඩන් නගරයේ පරිපාලිත සමාගම හා ඉන්දියාව, මාලදිවයින හා සීෂෙල්ස්හි ස්ථාපිත ශාඛා කාර්යාලයන්ට අමතරව, තවත් විදේශීය ගමනාන්තයන්හි ශාඛා ආරම්භ කරලමින් අපේ ගෝලීය පියසටහන වර්ධනය කරන්නට අපේක්ෂා කරන්නෙමු. දැනට ජාත්‍යන්තර තලයේ හොඳම බැංකු 1000 අතර සිටින අප, මැදිකාලීන ඉලක්කයක් මත මුල් 500 තුළට ගෙන එන්නටද අපේක්ෂා කරන්නෙමු. මේ පිළිබඳ අපේ උපායමාර්ග, මේ වෙළඳපළ බණ්ඩයන්හි විභවයන් හා සහසම්බන්ධ ඒ තුළ ලංකා බැංකුවට ඇති උපාය මාර්ගික වාසි සහගත තත්ත්වයන් ද සැලකිල්ලට ගෙන ඇත. ඉලක්කගත වෙළඳපළ තෝරා ගැනීම හුදෙක්

"අනාගතයේදී බැංකුවට ජාත්‍යන්තර තලයේ තරඟ කරන්නට හැකිවන ලෙසින්, ඒ සඳහා අවැසි ප්‍රමාණවත් මට්ටමක සම්පත් ලබා ගැනීම සඳහා වූ සුවිසල් මූල්‍ය සැපයුමක් ඒ සඳහා වෙන් කර ඇත."

ලබා ගත හැකි දත්තයන් මත පදනම් වෙතැයි ඒත්තු ගත් විභවයන් මතම නොව අන් රටවල් හා බිහි කරගත හැකි දිගුකාලීන ව්‍යාපාරික සබඳතා පිළිබඳ පරිපූර්ණ චිත්‍රය සැලකිල්ලට ගනු ඇත. සීෂෙල්ස්හි ශාඛාව මෙබඳු එක් උපාය මාර්ගික ප්‍රවේශයකි. එය, අප්‍රිකාවද ඇතුළත් නව වෙළඳපල විභවයන් කරා මුවදොරක් වනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

ලංකා බැංකු සමූහය තුළ ස්ථාපිත ආයතන සංඛ්‍යාව අවම තරමින් මෙහෙයුම් ප්‍රවාහය විධිමත් කිරීම අරමුණු කරගත් සමූහන ප්‍රතිව්‍යුහගත වෑයම නොකඩවා කරගෙන යාමට අප අදහස් කරන්නෙමු. ඒකාබද්ධනයන් ඇතුළුව ලංකා බැංකු සමූහය තුළ යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජනා කර ඇති මූල්‍ය සේවා අංශය ශක්තිමත් කරලීමේ වැඩපිළිවෙල හා අනුගත වේ. යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීම් තුළින් මතු විය හැකි සෙසු අවස්ථාවන් පිළිබඳවද බැංකුව සමාලෝචනය කරනු ඇත.

ව්‍යාපාරික කටයුතු සඳහා පහසුකම් සැපයීම මෙන්ම ව්‍යාපාරික කටයුතුවලට මතු වන බාධක මඟහරවමින් ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා මංපෙත් විවර කිරීම බැංකුවේ ප්‍රමුඛ කාර්යභාරයකි. මෙහිලා නාභිගත කෙරෙන එක් අංශයක් වන්නේ මධ්‍යම පරිමාණ ව්‍යවසායයන්, ආයතනික මට්ටමේ ව්‍යාපාරික ඒකකයන් ලෙස වර්ධනය කරලීමය. මෙමඟින් රට තුළ ආර්ථික කටයුතු පුළුල් වපසරියක ව්‍යාප්ත වනු ඇත. මේ ක්‍රියාදාමය ඔස්සේ 300 තරම වන ව්‍යාපාරික ඒකකයන් වෙත අත හිත දීමට අප බලාපොරොත්තු වන අතර ඔවුන් ආයතනික මට්ටමේ ව්‍යාපාරිකයන් බවට පරිවර්තනය කරලනු සඳහා පුළුල් පරාසයක උපකාරක යාන්ත්‍රණයක් මෙහෙයවනු ඇත. අපගේ ඉලක්කය යොමුවී ඇති තවත් අංශයක් වනුයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (සුමව) ට සමගාමීව සුමව අංශයේ සාර්ථක වර්ධනය උදෙසා අවශ්‍ය ශිල්පීය ඥාණය සැපයුම අරමුණු කරගත් සුමව මධ්‍යස්ථාන පිහිටුවීම කෙරෙහිද අවධානය යොමු කරනු ඇත. මේ, බැංකුවේ සමාජ හා ආර්ථික චිල්ලයන් හා අනුගතවීමක් සේම සුමව සඳහා ප්‍රාග්ධන සම්පාදනයේ සම්ප්‍රදායන් අනුව යෑමකි. අප රට වර්ධනයේ නව යුගයක් කරා කැඳවාගෙන යනු ලබන බහුවිධ ආර්ථික කටයුතු පදනමක් බිහි කිරීමේ අරමුණින් දිවයින පුරා ව්‍යවසායකයන් දිරිගැන්වීමේ හා නිර්මාණය කරලීමේ ක්‍රියාදාමයක්ද දියත් කරන්නට අපේක්ෂා කරන්නෙමු.

අපේ සේවක මණ්ඩලය බැංකුවේ මුඛ්‍ය සම්පත වේ . එබැවින් ඔවුන්ගේ සංවර්ධනය අපගේ වර්ධන අරමුණු සඳහා පහසු කාරකයන් බවට පත් කර ගනිමින් ද ඒ අතරතුරේ අපගේ හරයාත්මක වටිනාකම් රැක ගනිමින් ද නිසඟ හැකියාවන්, ශක්‍යතාවයන් හා උන්නතිකාමය සහිත සේවකයන්ට අවස්ථා විවර කිරීමද තවත් මූලික අරමුණකි.

සේවකයාගේ කෝණයෙන් බලන කල සාධනීය අත්දැකීමක් වන, ඉහළ තලයේ කාර්යඵලයක් උදෙසා පොළඹවන, ඒ හා සමඟ අන්‍යොන්‍ය ගෞරවය හා ආයතනික මෙන්ම පෞද්ගලික අරමුණු අතර එකමිතියක් විද්‍යාමාන වන සේවා පරිසරයක් නිර්මාණය කරන්නට අප කැපවන්නෙමු. බැංකුවේ තිරසර වර්ධන ක්‍රියාදාමයන් තුළ බර තැබූ අංශයක් වනු ඇත්තේ නායකත්වය හා විදේශීය නිරාවරණය ය. බැංකුවේ තාක්ෂණික පරිවර්තනයට අනුරූපව නිසඟ හැකියා සංචිත සංවර්ධනය කරන්නට සේම නිසඟ හැකියා සහිතවූවන් බැංකුව කෙරේ ආකර්ශණය කරගනු සඳහා බැංකුවේ පිළිගැනීම් හා සානුබල ව්‍යුහයන් සමාලෝචනය කරන්නටද අපි අදහස් කරන්නෙමු. මූල්‍ය ක්ෂේත්‍රයේ නව අභියෝග කෙරේ සාර්ථකව මුහුණ දිය හැකිවන පරිදි නීති හා තොරතුරු තාක්ෂණ බඳු විශේෂිත කාර්ය මණ්ඩල තවදුරටත් ශක්තිමත් කරනු ඇත.


තිරසර සංවර්ධනය හා ලාභදායීත්වය රඳා පවත්නා පදනම වන්නේ මනා අවදානම් කළමනාකරණ පරිචයන්ය. අභිශයින් වැදගත් මේ අංශය තුළ තවදුරටත් කටයුතු කරන බව තහවුරු කරනු උදෙසා ඒ හා බැඳි ආරක්ෂණ රේඛා ත්‍රිත්වයම ශක්තිමත් කරන්නෙමු. ඒ සමඟ තොරතුරු තාක්ෂණ පරිවර්තනයන්, බැංකුවේ වර්ධන උන්නතිතාවය හා මෙහෙයුම් පරිසරයේ ගතිකයන් තුළින් මතුවන අවදානම් හරස්කඩෙහි වෙනස්වීම් කළමනාකරණය සඳහා ශිල්පීය දක්ෂතා සංවර්ධනය තවදුරටත් කරගෙන යන්නෙමු.

ආයතනික යහපාලනයෙහිලා මෙතෙක් දුරක් රඳවා ගත් ඉහළ මට්ටම එලෙසින්ම පවත්වාගෙන යන්නට කටයුතු කරනු ඇත. ඒ සමඟම, ශ්‍රී ලංකාව වරලත් ගණකාධිකාරී ආයතනය හා සුරුකුම්පත් හා විනිමය කොමිසම විසින් එක්ව සංශෝධනය කරන ලද ආයතනික යහපාලනයේ ප්‍රශස්ත පරිචයන් සංග්‍රහය හා අනුගත වන්නටද පියවර ගෙන ඇත්තෙමු.

විවිධ ක්ෂේත්‍ර තුළ අත්දැකීම් සහිත පරිමිත වෘත්තිකයන්ගෙන් සමන්විත, අධ්‍යක්ෂ මණ්ඩලයකට නායකත්වය සපයන්නට අවස්ථාව ලැබීම වරප්‍රසාදයක් කොට සලකමි. අධ්‍යක්ෂ මණ්ඩලය හමුවට ආ කරුණු ඵලදායී සාකච්ඡාවන්ට හා විවාදයන්ට බඳුන්වීමට මේ සංයුතියම සාධක විය. ලංකා බැංකුවේ උපාය මාර්ග, හැමවිටම පාහේ රටේ පොදු

අප රට වර්ධනයේ නව යුගයක් කරා කැඳවාගෙන යනු ලබන බහුවිධ ආර්ථික කටයුතු පදනමක් බිහි කිරීමේ අරමුණින් දිවයින පුරා ව්‍යවසායකයන් දිරිගැන්වීමේ හා නිර්මාණය කරලීමේ ක්‍රියාදාමයක්ද දියත් කරන්නට අපේක්ෂා කරන්නෙමු.

උපායමාර්ග හා අනුගත වූයේ ඉහළ ප්‍රතිශතයකිනි. අප මේ අනුගතය එලෙසින්ම පවත්වාගෙන යන්නේ පෙරකී සම්ප්‍රදාය නිසාම නොව, අපගේ ත්‍රිත්ව යටිපෙළ ප්‍රවේශය හා සමඟ මැනවින් අනුගත වන ව්‍යාපාර දැක්මක්ද වන නිසාය. රජය හා අපේ සබඳතා ප්‍රමුඛ ශක්තියක් වූයේ නව වෙළඳපල කෙරේ ප්‍රවේශ වූ මුල්ම බැංකුකරුවන් වෙමින් රටේ ආර්ථික සංවර්ධනයේ දායකයකු ද වෙමිනි. පසුගිය වසරවලදී මෙන්ම ඉදිරියේදීත් මුදල් අමාත්‍යවරයා ලෙස අතිගරු ජනාධිපතිතුමන්ගේ මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා හා භාණ්ඩාගාර ලේකම්තුමන්ගේ සහයෝගය මා අපේක්ෂා කරන අතර ඔවුන්ගේ සහාය පිළිබඳව ස්තූතිය පුද කරමි. තනතුරින් ඉවත්ව යන සභාපති රසීක් සරූක් මහතා ගැනද මා විශේෂයෙන් සඳහන් කරන්නේ ඔහු ලබා දුන් වටිනා නායකත්වය හා ඒ පසුපස තිබි දැනුම් සම්භාරය ද නිසාය. වසර තුළ අප රඳවා ගත් කාර්මික සාමය වෙනුවෙන් වෘත්තීය සමිති කෙරේ තුති පුද කරන අතර, ඉදිරි කාලයේදීත් ඔවුන්ගේ සහාය අපේක්ෂා කරමි. මහා කළමනාකරු හා ලංකා බැංකුවේ කැපවූ මෙන්ම ක්‍රියාශීලී සේවක කණ්ඩායම මගේ හදපිරි ප්‍රණාමයට ලක් වනුයේ, අප මග පෙන්වීම මත උපාය මාර්ග ක්‍රියාවට නැංවූයේ ඔවුන් නිසාය. අපගේ ඉදිරිකාලීන උපාය මාර්ග සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ සහාය නිබඳව අපේක්ෂා කරමි



ආර්. සිවරාමන්
වැඩබලන සභාපති

2014 මාර්තු 13
කොළඹ දීය.

දේශීය ගැඹුර හා ගෝලීය විහිදුම

මහා කළමනාකරුගේ සමාලෝචනය

ලංකා බැංකුවට අසමසම ශක්තිමත් ස්ථාවරයක් හිමිවී ඇත්තේ රටේ ප්‍රධානතම මූල්‍ය පහසුකම් සලසන්නා මෙන්ම ඉහළතම සන්නාම අගය සහිත සංවිධානය බැවිනි. අප සතුව ශක්තිමත් දේශීය පිළිගැනීමක් ඇති අතර එය විවිධ ගනුදෙනුකාර ඛණ්ඩ හරහා වර්ධනයේ කඩඉම් පුළුල් කරලන්නට ගතිකයක් වනවා සේම මේ ශක්තිය පාර්ශ්වකාර සබඳතා ඔස්සේ සූක්ෂ්ම ලෙස පෝෂණය කරන්නට අප ආයාස දරන්නේ එය එතරම් ම අගනා බැවිනි. මෙයට අමතරව අප රටේ සමාජ-ආර්ථික සංවර්ධනයේ කොටස්කරුවෙකුද වන්නෙමු. අප මේ භූමිකාව හඳුනාගෙන උචිත උපායමාර්ග ඔස්සේ ඊට අත්වැල සපයන්නෙමු. සමස්ත මූල්‍ය සේවා අංශයට දැඩි අභියෝග එල්ල වූ වසරක අප පාර්ශ්වකාර අවශ්‍යතා පාලනය කරමින් සර්වග්‍රාහී මෙන්ම තිරසර කාර්යඵලයක් ළඟා කර ගත්තේ රු. බිලියන 15.7 ක ලාභ මට්ටමක් හා 14% ක වත්කම් වර්ධනයක්ද වාර්තා කරමිනි. අපි රුපියල් ට්‍රිලියනක වත්කම් පදනමක් සහිත එකම දේශීය බැංකුව වන්නෙමු.

තුලිත කාර්යඵලය

මූල්‍ය සේවා අංශයට මෙම වසර තුළ අභියෝග ගණනාවකටම මුහුණ පාන්නට සිදුවිය. මේ තත්ත්වය ලාභ මට්ටම් හා වර්ධනය කෙරේ බලපෑමක් ඇති කළේය. තිස් වසරක් මුළුල්ලේ රටම වෙලාගෙන පැවති සිවිල් ගැටුමේ නිමාවත් සමඟ මූල්‍ය සේවා ක්ෂේත්‍රය මෙන්ම රටද වසර කිහිපයක අඛණ්ඩ වර්ධනයක් අත් වින්දේය. මෙහි ප්‍රතිඵලය ලෙස දළ දේශීය නිෂ්පාදිතය 2010 හා 2011 වසර තුළ 8% ඉක්මවා ගියේය. එහෙත් 2012 වන විට රටේ වර්ධන වේගය යම් පමණකින් මැදහත් තලයකට ආයේ හැකිළුණු ගෝලීය ආර්ථික පරිසරය තුළ නැගී එන වෙළඳපල වර්ධනය ද මන්දගාමී වූ නිසා ය. 2012 මූල්‍ය හා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමත් සමඟ මූල්‍ය සේවා අංශයේ වර්ධනය වඩා මධ්‍යස්ථ විය. 2013 වසර තුළ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 7.3% වූයේ 2012 පැවති 6.3% ට සාපේක්ෂවය. මූල්‍ය සේවා අංශය 2012 මූල්‍ය ප්‍රතිපත්තියේ මන්දගාමී ප්‍රතිඵල දිගටම අත්විඳි අතර පුද්ගලික අංශයේ ණය ඉල්ලුම වසරේ හතරවන කාර්තුව තුළ දැඩි සේ ඉහළ යාමට පෙර, අවම මට්ටමක පැවතුණේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වසරින් වසරට පුද්ගලික අංශයට පිරිනැමූ ණය පරිමාවේ වර්ධනය 2013 දී 5% තෙක් පසුබෑ අතර ඊට සාපේක්ෂව 2012 දී එය 20% ක් විය. මේ තත්ත්වය පුද්ගලික අංශයේ සමස්ත වර්ධනයට බලපෑවේය. රාජ්‍ය අංශයේ ණය වර්ධනයද අවම වූයේ විශාල රාජ්‍ය ව්‍යවසායයන්හි වර්ධනය වූ මුදල් ප්‍රවාහ හා සැලකිය යුතු මට්ටමේ ණය ආපසු ගෙවීම් හේතුවෙනි. 2013 වසරේදී සමස්ත ණය වර්ධනය 8.8% ක් වූ අතර වත්කම් වර්ධනය 16.6% ක් සටහන් කළේ වර්ධනය වූ ආයෝජන වත්කම් හේතුකොට ගෙනය. කෙසේවුවද ලංකා බැංකුවට 2013 වසරේදී 6% ක ණය හා අත්තිකාරම් වර්ධනයක්ද 14% ක වත්කම් වර්ධනයක්ද කරා එළඹිය හැකි වූයේ මූලික වශයෙන් එහි සබඳතා ප්‍රාග්ධනය, ශක්තිමත් දේශීය පිලි ගැනීම හා ඉහළ පදනමක් සහිත වත්කම් සඳහා කිසියම් ගැලපුමක් සහිත විචක්ෂණශීලී වත්කම් හා වගකීම් කළමනාකරණය ද නිසාය.



ඩී. එම්. ගුණසේකර මහතා
මහා කළමනාකාරතුමා

ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතම බැංකුකරුවා වන අප, 2016 වනවිට ළඟා කර ගැන්මට අපේක්ෂිත ඇමරිකානු ඩොලර් බිලියන 100 ක ආර්ථිකය හා ඇමරිකානු ඩොලර් 4000ක ඒක පුද්ගල ආදායම කරා යන ගමනේ ක්‍රියාකාරී භූමිකාවක් නිබඳවම නිරූපණය කරන්නෙමු.

අප්‍රේල් මස අත් දුටු රන් මිල තියුණු අන්දමින් පහල යාම මේ ක්ෂේත්‍රයේ උකස් ණය කළඹ කෙරෙහි බලපෑමක් එල්ල කළෙන්, බෙහෙවින් ජනප්‍රිය මෙම ශාඛා බැංකුකරණ ණය නිමැවුමේ වර්ධනය සීමා කරන්නට අභ්‍යන්තර වෙනස්කම් අත්‍යවශ්‍ය විය. මේ තත්ත්වය නිසා බැංකු ක්ෂේත්‍රය පුරාම සැලකිය යුතු මට්ටමේ අපහායන පිරිවැයක් මතු විය. මේ පසුබිම මත බැංකුවද රන් ණය අපහායනය මත සිය උපාය මාර්ග ගැලපුම් කළේය.

20%

බැංකු ක්ෂේත්‍රය සඳහා වත්කම් වල දායකත්වය

උකස් ණය රටේ සමාජ ආර්ථික සංවර්ධනයේ-විශේෂයෙන් මූල්‍ය ඇතුළත්කරණ ප්‍රතිපත්තියේ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කළේ එය බොහෝ දෙනෙකු දැනුවත් නිමැවුමක් නිසාය. එය දශක තුනක ගැටුම්වලින් පසු යළි ගොඩ නැංවෙන ගැමි කෘෂිකාර්මික ප්‍රජාවන් හට පහසු උත්පාදනය කර ගැනීම් මාර්ගයක් විය. එසේ වුවත්, මේ සඳහා ලබාගන්නා සුරැකුමෙහි වටිනාකම පිළිබඳ ඇති අස්ථාවරත්වය මත බැංකුව ඉන් මතුවන අවදානම් සමනය කරනු සඳහා අතිරේක ආරක්ෂණ විධි ස්ථාපිත කළ අතර, සමස්ත ණය පරිමාව තුළ උකස් ණය සඳහා නිරාවරණය 17% කට සීමා කළේය. උකස් ණය සඳහා අපහායන භාරය රු.මිලියන 2,033 ක් වූ අතර එය වසරේ සමස්ත අපහායන භාරයෙන් 29% කට වග දායක විය.

බැංකු ක්ෂේත්‍රයේ ආදායම්ද, මූල්‍ය ප්‍රතිපත්තියේ ලිහිල් කිරීම් මත ප්‍රතිඵලයක් වූ මූලික ණය පොළී අනුපාතය පහළ යාම තුළින් අවම වූ ශුද්ධ පොළී ආන්තිකයේ බලපෑමට ලක් විය. අපේ පොළී පිරිවැයද ඉහළ නැංගේ තැන්පතු මිශ්‍රණයේ ජංගම හා ඉතිරිකිරීමේ තැන්පතු අතර අනුපාතය අවාසිදායක ලෙස පහත වැටීම නිසාය. සමස්ත බැංකු ක්ෂේත්‍රය තුළ විදේශ විනිමය ආදායම ද 2012 ට සාපේක්ෂව 2013 දී 37% කින් පහළ ගියේ එම වසර පුරා විනිමය අනුපාත බොහෝ දුරට ස්ථාවරව තිබී නිසාය. ඉහත දැක්වූ අභියෝග තිබියදී වුව රුපියල් බිලියන 15.7 ක ලාභයක් වාර්තා කරන්නට ලංකා බැංකුව සමත් වූ අතර එය අස්ථාවර ප්‍රභවයන්ගෙන් තොර තිරසර ලාභයක් වූවා සේම උකස් ණය කළඹ වෙනුවෙන් ඉහළ අගයක අපහායන භාරයක් දරමින් වුව ළඟා කර ගත්තකි. විදේශ විනිමය ආදායමේ වෙනස්වීම හා උකස් ණය අපහායන භාරය සඳහා ගැලපුම් කරතොත්, 2013 දී ලබාගත් මේ ලාභය වඩා ස්ථාවර වසරක් වූ 2012 දී ලඟා කරගත් ලාභය ඉක්මවා යන බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

පොදුවේ රට හා මූල්‍ය සේවා සැපයුම් අංශය තුළ අපේ නායකත්වය හා ශක්තීන් තහවුරු කරමින් ලංකා බැංකුවට වසර තුළදී සම්මාන හා බුහුමන් රැසක්ම ලැබුණි. ඒ අතර, ජාතික වාණිජ මණ්ඩලය මඟින් පිරිනැමුණු ජාතික ව්‍යාපාරික විශිෂ්ටත්ව සම්මානය හා බ්‍රෑන්ඩ්ෆිනෑන්ස් ආයතනය විසින් අඛණ්ඩව පස්වන වරට ද අප ලංකාවේ අංක එකේ සන්නාමය ලෙස අභිෂේක කරනු ලැබීමද විය.

පරිවර්තනය

තාක්ෂණික පරිවර්තනය බැංකුවේ ප්‍රධානතම උපාය මාර්ගයක් වන අතර ඒ තුළ කැපී පෙනෙන සන්ධිස්ථාන අත්පත් කර ගත්තෙමු. අප මේ ව්‍යාපෘතියට අත ගැසුවේ තාක්ෂණයට බුහුටි ගනුදෙනුකාර පරම්පරාවක අවශ්‍යතා හඳුනාගනිමින් බැංකුව අනාගතයට ඔබින සේ ස්ථානගත කරන්නට මෙන්ම අපේ වර්ධන උන්නතිකාමයට උර දෙන මෙහෙයුම් කාර්යක්ෂමතා කැටිවූ හැකියාව වර්ධනය කරන්නටය. මේ අනුව ප්‍රමුඛ බැංකුකරණ පද්ධතියේ ධාරිතා ඉහළ නැංවීම 2013 වසරේ ආරම්භ කළ අතර 2014 විද්‍යුත් සේවා සැපයීම් පද්ධති ධාරිතා ඉහළ නැංවීමට අවශ්‍ය මෘදුකාංග හා දෘඩාංග දැනටමත් සපයාගෙන ඇත. වසර තුළ නවක සේවකයන් 1,706 දෙනෙකු බඳවාගත් අතර, බැංකුව තුළ සිදු වන්නට නියමිත ඩිජිටල් තාක්ෂණික පරිවර්තනය තුළ විශිෂ්ටයන් විය හැකි තාක්ෂණයට හුරු කණ්ඩායමක් සඳහා ඇති වර්ධනය වන අවස්ථාවන්ට සරිලන සේ කාර්ය මණ්ඩලය පෙළ ගස්වනු සඳහා පුහුණු කිරීම් වැඩ සටහන් දියත් කළෙමු.

අපි වසර තුළ අපේ ශාඛා ජාලය ව්‍යාප්ත කළෙමු. 227 ක් වූ ව්‍යාප්ති කාර්යාල වසර තුළදී පූර්ණ ශාඛා බවට පත් කරන ලද අතර අපේ වර්ධන උපාය මාර්ගයේ මූලික සේවා සැපයීම් අංශයක් ලෙස නව ශාඛා 16 ක් ද ස්ථාපනය කළෙමු. අපේ වර්ධන පිය සටහන් රටේ සමස්ත උපාය මාර්ගය හා අනුගත වී ඇති අතර ග්‍රාමීය ප්‍රජාවන් අතර ආර්ථික කටයුතු උද්දීපනය කරන්නටද පලාත්බද මූල්‍ය ඇතුලත්කරණයට ද මුලින්ම පිවිසෙන්නේ අපය. ගොවීන් වෙළඳපල කරා සම්බන්ධ කරමින් මාර්ග පද්ධතිය පුළුල් වෙන පසුබිම මත ග්‍රාමීය ප්‍රජාවන් අතර අපේ මේ ආයෝජන සාපේක්ෂ වශයෙන්, කෙටි කාලයක් තුළ ප්‍රතිලාභ අත් කර දෙන බවද එමඟින් අපේ දේශීය පිළිගැනීම තවදුරටත් ශක්තිමත් වන බව ද අපේ විශ්වාසයයි. මේ හැර අපි ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය, මෙහෙයුම් කාර්යක්ෂමතාව හා සන්නාමකරණයේ සංගතතාවය අරමුණු කර ගනිමින් ජපාන එස් 5 සංකල්පය ශාඛා 151 ක් ඔස්සේ දියත් කළෙමු. බැංකුව එහි විද්‍යුත් සේවා පද්ධති මෙන්ම භෞතික ස්ථාන ජාලයද එකසේ වර්ධනය කරනු ඇත්තේ, සම්බන්ධතා පිළිවෙත් ඔස්සේ හඳුනාගත් විවිධාකාර පාර්ශ්වකාර අවශ්‍යතා පසුබිම මතය. අපේ ඇතුළත්කරණ ප්‍රතිපත්ති එහි අවශ්‍යතාවය පෙන්වා දෙයි.

දේශයේ බැංකුකරුවා

ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතම බැංකුකරුවා වන අප, 2016 වනවිට ළඟා කර ගැනීමට අපේක්ෂිත ඇමරිකානු ඩොලර් බිලියන 100 ක ආර්ථිකය හා ඇමරිකානු ඩොලර් 4000 ක ඒක පුද්ගල ආදායම කරා යන ගමනේ ක්‍රියාකාරී භූමිකාවක් නිබඳවම නිරූපණය කරන්නෙමු. ඒ, බැංකුවේ උපායමාර්ග රටේ සමස්ත අපේක්ෂා හා අනුගත කරමිනි. මේ අනුගතවීමේ ක්‍රියාදාමයේ මූලික අංගවන්නේ, දිගු ආපසු ගෙවීමේ කාලයක් සහිත මහාපරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා මූල්‍ය සපයන්නා ලෙස අපේ භූමිකාව, මූල්‍ය ඇතුලත්කරණ ක්‍රියාවලිය සඳහා මැදහත් වීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා අරමුදල් ප්‍රවේශයක් නිර්මාණය කිරීමය. ලංකා බැංකුව මාර්ග පද්ධතියේ කිලෝමීටර් 368 ක් උදෙසා රු.බිලියන 10.3ක් ප්‍රදානය කර ඇති අතර අනාගත මාර්ග සංවර්ධන කටයුතු සඳහා තවත් රු.බිලියන 52.3 කට වඩා වෙන් කර ඇත. මෙයට සමගාමීව, රාජ්‍ය උපායමාර්ග තුල හඳුනාගෙන ඇති 5+1 කේන්ද්‍රයන් පුළුල් කිරීම සඳහා රු. බිලියන 421.2 මුදා හරින්නට එකඟ වී ඇත. මිලියන 10 ඉක්මවන ගනුදෙනුකාර පදනමක් සහිත අප බැංකුවට රටතුල ඉහලම මූල්‍ය ඇතුලත් කරණ ප්‍රතිශතයට හිමිකමක් ඇතුවා සේ ම සියළුම වෙළඳපල කාණ්ඩ ඔස්සේ මූල්‍ය සේවා බෙදාහැරිය හැකි රටේ විශාලතම සේවා ලක්ෂ්‍ය ජාලයද අප සතුය. අපි වසර තුල දී නව සුළු හා මධ්‍ය පරිමාණ ණය ඒකක හතරක් ස්ථාපිත කළෙමු. 2012 අයවැය යෝජනා ඉදිරිපත් කරමින් අතිගරු ජනාධිපතිතුමන් පොරොන්දු වූ පරිදි සුමක ව්‍යවසායකයන්ට සිය ව්‍යවසාය වර්ධනය කරගන්නට ඇවැසි නායකත්ව පුහුණුව හා ගිණුම්කරණය, කළමණාකරනය බඳු නිපුනතා සඳහා මෙමඟින් ප්‍රවේශයක් සැලසේ. මෙම අංශයේ අපේ මෙහෙවර වන්නේ හුදෙක් උකටලී මූල්‍ය පහසුකම් සපයන්නන් බවට පත්වීම නොව අනාගත ශ්‍රී ලංකාවට අවශ්‍ය නව ව්‍යවසායකයන් සමුදායක් නිර්මාණය කොට

"අප ඉතසිතින් අපේක්ෂා කරන ඉලක්කය වන්නේ ලංකා බැංකුව දේශීය ජාත්‍යන්තර බැංකුව ලෙස ඔසවා තබමින් ගෝලීය වෙළඳපල කරා පිය නැගීමය."

ඔවුන් සුමක ඔස්සේ ආයතනික මට්ටමේ දැවැන්ත ව්‍යාපාරිකයන් බවට පත් කිරීමට සක්‍රියව දායකත්වය සැපයීමය.

කුසලතා පූර්ණ අභිප්‍රේරිත කණ්ඩායමක්

8,883 ක සේවක කණ්ඩායමක් සහිත ලංකා බැංකුව මෙරට මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ විශාලතම සේවා යෝජකයන් අතර හිඳී. මේ අතුරින් බොහොමයක් ආරම්භක ශ්‍රේණි හරහා බැංකුවට එක්වී ඇති අතර, සාපේක්ෂ වශයෙන් උපාධිධාරීන් සුළු පිරිසක් කළමණාකරන අභ්‍යාසලාභීන් වශයෙන් එක්වී ඇත. කල් ගතවත්ම අපේ පුහුණු කිරීම් හා සංවර්ධන ක්‍රියාදාම ඔස්සේ ඔවුන් තම තමන්ගේ විශේෂිත අංශයන්හි බහු-විෂයපථ දැනුම සහිත කණ්ඩායමක් බවට පරිවර්තනය වී ඇත. අපි මෙම කණ්ඩායම සංවර්ධනය කිරීමේලා නොකඩවා ආයෝජනය කරමින් සිටින්නෙමු. මේ වසරේ අප අවධානය යොමු කලේ අප අනාගත නායකයන් වෙනුවෙන් නායකත්ව කුසලතා සඳහා වන විදේශීය පුහුණු වැඩසටහන් දෙසය. එමඟින් රට තුල පමණක් නොව එතෙර ද සේවා සපයන්නට හැකි නිපුණතාවන්ගෙන් සන්නද්ධ බවට තහවුරු කර ලන්නටය. 716 ක් සේවක පිරිස සඳහා උසස්වීම් ලබා දෙන ලද්දේ පැවති පුරප්පාඩු හා අපේ සර්වග්‍රාහී කුසලතා සංවර්ධන වැඩසටහන් ඔස්සේ මතුකරන ලද 990 ක් නව තනතුරු සපුරාලන්නට අවශ්‍ය උපමාන ඔවුන් හට සනාථ කළ හැකි වූ බැවිනි.

පෙර සඳහන් කළ පරිදි අපි මේ වසරේ නවක සේවකයන් 1,706 දෙනෙකු බඳවා ගත්තෙමු. මේ පිරිස රටේ හැම පළාතක්ම නියෝජනය වන පරිදිය. ඒ සමඟම විධිමත් හා අවිධිමත් පීඩිකා ඔස්සේ පුහුණුව හා නිපුනතා සංවර්ධනයට අවස්ථා ද සම්පාදනය කළෙමු. අපේ වෘත්තීය සමිති හා සුසංයෝගී සබඳතාවයක් පවත්වා ගෙන ගිය අතර ප්‍රශ්න පිලිබඳව මනා දැනුවත්භාවයක් හා සම්මුතියක් ළඟා කර ගැනීම පිණිස නිතිපතා අදහස් හුවමාරු කරගත්තෙමු. බැංකුවට වර්ධනයේ නව නිම්වළලූ කරා පිය නැගීමට මෙම කණ්ඩායමේ කැපවීම හා උද්‍යෝගය පිලිබඳව විශ්වාසය තබමි.

වර්ධන න්‍යායපත්‍රයක්

වසරේ අගභාගයේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය දිරි ගන්වන සුළු වූයේ ගෝලීය ආර්ථිකය ගම්‍යතාව ගොනු කරගත් බැවිනි. අනතුරු සේයා රැඳී තිබුණද නැගී එන ආර්ථිකයන් හමුවට නව අවදානම් මතුවනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව මේ වසරේ වර්ධන පුරෝකථනය 2013 පැවති වර්ධන අනුපාතය වූ 7.2% ඉක්මවනු ඇත. සැලකිය යුතු මට්ටමක අපර-ව්‍යුහ සංවර්ධනයක් ළඟා කර ගෙන ඇති අතර, 2014 වසරේ දේශීය වාණිජ කටයුතු වැඩිවනු ඇතැයි අපේක්ෂාවයි. 2013 ඔක්තෝබර් මස පළකල "World Economic Outlook" ප්‍රකාශනයට අනුව දකුණු ආසියාවේ ඉහලම දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය හිමිකරගෙන ඇත්තේ ශ්‍රී ලංකාවය. "Doing Business Index" සංග්‍රහයේ අප රට දකුණු ආසියාවේ ඉහළම ස්ථානය හිමි කරගෙන ඇති අතර අපේ සමස්ත මට්ටම 85 වේ. දේශපාලන ස්ථාවරත්වය, උපායමාර්ගික පිහිටීම, ප්‍රසන්න එමෙන්ම සාක්ෂර ජනතාව යන සාධක කලාපීය කේන්ද්‍රයක් සේ රටේ වර්ධන අවස්ථා ඉහළ නංවයි. ඉදිරියේදී විනිමය අනුපාත ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කරන අතර, පොළී අනුපාත කෙමෙන් පහළ බසින උපනතියක් පල කරනු ඇත. උද්ධමනය ද 2014 වසරේදී මධ්‍යම තරමේ තනි අංකයක පවතිනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

හුදෙක් අභ්‍යන්තර සංවර්ධනය පමණක් ප්‍රමාණවත් නොවේ. වර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට නැතිවම බැරි සාධකයක් වන්නේ වර්ධනය වන අපනයන ආදායම ය. මේ නිසා, ලංකා බැංකුව අපනයනය මත යොමුවූ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අත්වැල දැඩි කරනු ඇත. එය එසේ විය යුත්තේ ගෝලීය ඉල්ලූම වැඩිවෙමින් ශ්‍රී ලංකාව සිය නිෂ්පාදන කර්මාන්ත පදනම විවිධාංගීකරණය කරමින් සිටින පසුබිමක් තුලය.

අප ඉතසිතින් අපේක්ෂා කරන ඉලක්කය වන්නේ ලංකා බැංකුව දේශීය ජාත්‍යන්තර බැංකුව ලෙස ඔසවා තබමින් ගෝලීය වෙළඳපල කරා පිය නැගීමය. අප්‍රිකානු මහාද්වීපයේ හා ඉන්දියාවේ ශාඛා පිහිටුවීම ඉලක්ක කොට මූලික අධ්‍යයන හා තක්සේරු නිම කර ඇත. දැනට අප ප්‍රවිශ්ඨ වී ඇති සීෂෙල්ස්, මාලදිවයින හා ඉන්දියාව, ලන්ඩන් නගරයේ පරිපාලිතයද හැරුණුකොට, 2014 දී යටත් පිරිසෙයින් විදේශීය ශාඛා දෙකක් ස්ථාපනය කරන්නට බලාපොරොත්තු වෙමු. මේ සඳහා අපේ කණ්ඩායම් සාමාජිකයන් එතෙර පුහුණු කරනු ලැබ ඇති අතර දැන් අපි එතෙර වෙළඳපල කරා ව්‍යාප්ත වන්නට සැදී පැහැදී සිටින්නෙමු.

අප විශාල සමූහයක් බැවින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජිත මූල්‍ය සේවා ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම අරමුණු කරගත් බැංකු ක්ෂේත්‍රයේ මාර්ග සිතියම පිලිගත්තෙමු. 2014 මාර්ග සිතියමෙහි පෙනෙන පරිදි වඩා විශාල ක්‍රීඩකයනට මෙහෙයුම් කාර්යක්ෂමතා ජවසම්පන්න ලෙසින් මෙහෙයවා ජාත්‍යන්තර වෙළඳපලට පවා විනිවිදයා හැකි ස්ථාවර හා ශක්තිමත් මූල්‍ය සේවා පරිසරයක් බිහිකල හැක. අපි පුළුල් ආර්ථික වපසරියකින් කල්පනා කළහොත් උපාය මාර්ගික වැදගත්කමක් සහිත අත්පත්කර ගැනීම් තුලින් වර්ධනය කරා එලඹීමට ඇති අවස්ථා සමාලෝචනය කරන්නෙමු.

පොළී අනුපාත පහත වැටීමත් සමඟ ණය සඳහා ඉල්ලූම වැඩි වනු ඇත. දැනට පවත්නා වෙළඳපල අධි-ද්‍රවශීලතාවය මේ වැඩිවන ඉල්ලූමත්

සමඟ ස්ථාවර තලයකට එනු ඇත. මේ හැර ණය ගැනීම් චිල්ලේ පොළී අනුපාතද 2014 දී තවත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරමු. මෙය ශ්‍රද්ධ පොළී ආන්තිකය කෙරේ බලපානු ඇත. අක්වෙරළ හා විදේශීය ණය දීම් හා ශාඛා බැංකුකරණ අංශ දෙකෙහිම වර්ධනයක් අපේක්ෂා කරන්නෙමු. ඒ ඔස්සේ හා වැඩි වෙතැයි අපේක්ෂා කරන සේවා ගාස්තු ආදායම තුලින් ලාභදායීතාවය මෙහෙයවා ගත හැකිවනු ඇත. මෙහෙයුම් ක්‍රියාවලිය තුල විශිෂ්ටත්වය ආරෝපණය කිරීම තුලින් පිරිවැය ව්‍යුහයක් විධිමත් කොට වැඩිවන පරිමා කළමණාකරනය කරන්නට සේම පිරිවැය අවම කරන්නට හැකියාව ලබාගනු ඇත. මෙයට අමතරව, වාණිජ මූල්‍යකරණය බඳු අංශ මධ්‍යගත කිරීම ඔස්සේ පිරිවැය විධිමත් කරගත හැකිය. බැංකුව දැනට පවත්නා ගනුදෙනුකාර සබඳතා ගොඩනංවනු ඇත. ඒ, අපේ වර්ධන කඩඉම් කරා ළඟෙන්නට මෙන්ම ප්‍රධානතම මූල්‍ය පහසුකම් සපයන්නා ලෙස අපේ තත්ත්වය රඳවා ගැනීමද සඳහා ය.

ස්තූතිය

අප වෙත විශ්වාසය තැබූ අප ගනුදෙනුකරුවන් අපට උත්තේජනයක් සැපයූහ. ගතවූ කාලය තුල ඔවුන්ගේ සහාය පිළිබඳව මම ඔවුනට තුතිපුදු කරමි. ඔබ අපේ අභිලාෂයන් ඉටුකර ගන්නට උදව් කරනා විට ඔබේ අභිලාෂයන්ද ඒ සමඟ ඉටුකර ගත හැකිය.

මම අප අධ්‍යක්ෂ මණ්ඩලයට විශේෂයෙන් ඉවත්ව යන සභාපති රසික් සරූක් මහතා හා වැඩබලන සභාපති රාජු සිවරාමන් මහතාට-ස්තූතිවන්ත විය යුත්තේ ඔවුන්ගේ ඉදිරි දැක්ම, මඟ පෙන්වීම හා නොසැලෙන නායකත්වය නිසාවෙනි. මේ වසරේදී ලංකා බැංකුවේ කැපවූ මෙන්ම ලෙන්ගතු කණ්ඩායම මෙහෙයවීමට ලැබීම මම වරප්‍රසාදයක් සේ සලකමි. මම ඔවුන්ගේ කැපවීම හා අනලස් සේවයට ස්තූතිවන්ත වෙමි.

භාණ්ඩාගාරයේ ලේකම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, විගණකාධිපති හා නීතිපති තුමන්ලා සහ අපට වසර තුල සහයෝගය දුන් මේ දෙපාර්තමේන්තු හා ආයතනයන්හි නිලධාරීන්ට ද අවංක ස්තූතිය පිරිනමමි.



ඩී එම් ගුණසේකර
මහා කළමනාකරු

2014 මාර්තු 13
කොළඹ දීය.

කොටස්කරුවන් සමඟ කටයුතු කිරීම

පාර්ශවකරුවන් හඳුනා ගැනීම



ඉහත සාධක මත පදනම්ව, සේවකයින්, ගනුදෙනුකරුවන්, ආයෝජකයින්, රජය හා නියාමන ආයතන, ප්‍රජාව සහ සැපයුම්කරුවන් හා සේවා සම්පාදකයින් වශයෙන් කොටස්කරුවන් ප්‍රධාන කණ්ඩායම් හයකට වර්ගීකරණය කළ හැකිය.

පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීම සඳහා වූ රාමුව 2013 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තිරසර ප්‍රතිපත්තිය තුළ නිරූපනය කෙරේ.

පාර්ශවකරුවන්	ප්‍රාථමික කටයුතු කිරීමේ යාන්ත්‍රණය	හඳුනා ගනු ලැබූ අවශ්‍යතා	පාර්ශවකරුවන් කළමනාකරණ රාමුව
සේවකයන්	• සේවක නියැලීම් සමීක්ෂණ • වෘත්තීය සමිති සමඟ උපදේශනීය රැස්වීම් • සේවක යෝජනා ක්‍රම • මැසිවිලි වාර්තාකරණ කාර්යපටිපාටිය • සාමාජීය සංග්‍රහ සහ ක්‍රීඩා උත්සව	• සංවර්ධනය හා වෘත්තීය ප්‍රගමණය • කාර්යසාධනය හැකි කරවන පරිසරය • රැකියා දිවිය සමතුලනය • සෞඛ්‍යය හා ආරක්ෂාව • සාමූහික කේවෙල් කිරීම • සමාන ඉඩ ප්‍රස්ථා • කාන්තාවන් වැනි මුඛ්‍ය කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා	සේවකයින්ට ගරුත්වයෙන් සලකන, ඔවුන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සහතික කරන, විවිධත්වය අගය කරන පරිසරයක් තුළ ඔවුන් සංවර්ධනය කිරීමට අපි ආයෝජනය කරන්නෙමු.
ගනුදෙනුකරුවන්	• ශාඛා කණ්ඩායම් හා සබඳතා කළමනාකරුවන් විසින් අන්තර්ජාලය හරහා සහ ප්‍රාදේශීව සම්බන්ධ වීම • ගනුදෙනුකාර තෘප්තිය පිළිබඳ සමීක්ෂණය • වෙළඳපල පර්යේෂණ • නිපැයුම් ප්‍රවර්ධන ව්‍යාපාර සහ උපහාර වැඩසටහන්	• ගනුදෙනුකාර සේවාව • ගනුදෙනු කිරීමේ පහසුව • ගනුදෙනුකාර ප්‍රඥප්තිය සුරැකීම • මූල්‍යමය සර්වජන ග්‍රාහකත්වය වැඩි දියුණු කිරීම, අධ්‍යාපන උපදේශ හා අනුශාසන • ඔවුන් කැමති භාෂාවකින් සන්නිවේදනය	ගනුදෙනුකරුවන් ලබා ගන්නා සේවාවන්ට අදාළ නියමයන් හා කොන්දේසි ඔවුන්ට අවබෝධ වන බවට වග බලා ගනිමින් අපගේ ගනුදෙනුකාර ප්‍රඥප්තිය අනුව ඔවුන්ගේ අයිතිවාසිකම් අපි සුරකිමු.
ආයෝජකයන්	• මඟ පෙන්වීම් • විශාල ආයෝජකයින් සමඟ පුද්ගලිකවම හමුවීම් • අතරමැදියන් සමඟ සබඳතා • ආයෝජක ඉදිරිපත් කිරීම්	• නියමිත කාලයකට වරක් මෙහෙයුම් හා අනාගත දෘෂ්ටිය පිළිබඳ පූර්ණ එහෙත් සංක්ෂිප්ත තොරතුරු • ගනු ලබන අවදානම්වලට සරිලන ආදායම් • නික්මන් යාන්ත්‍රණ	අපගේ ආයෝජකයින්ගේ ආයෝජන මත තරගකාරී ආදායම්/අවදානම් සහතික කරමින් ඔවුන් සමඟ අපගේ සන්නිවේදනයන් තුළ අපගේ කාර්යසාධනය හා අපේක්ෂණයන් පිළිබඳ සමබර සමාලෝචනයක් ලබා දීමට අපි ඇපකැප වෙමු.

පාර්ශවකරුවන්	ප්‍රාථමික කටයුතු කිරීමේ යාන්ත්‍රණය	හඳුනා ගනු ලැබූ අවශ්‍යතා	පාර්ශවකරුවන් කළමනාකරණ රාමුව
රජය හා නියාමන ආයතන	• රජයේ අමාත්‍යාංශ හා රාජ්‍ය ව්‍යාපාර සමඟ අඛණ්ඩ සංවාද • රැස්වීම්, ප්‍රතිපත්ති ප්‍රවණතා විශ්ලේෂණ සහ කර්මාන්ත මණ්ඩප	• මූල්‍ය අංශයේ ස්ථාවරත්වය හා වර්ධනය • රජයේ ප්‍රාග්ධන වියදමේ විශාල අරමුදල් අවශ්‍යතා • වගකීමෙන් යුතු ව්‍යාපාරික පිළිවෙත් • බැංකුවේ උපායමාර්ගය ජාතික ප්‍රමුඛත්වයන් සමඟ දිශාභිමුඛ කිරීම • මූල්‍යමය සැවොම ඇතුළත් බව • විශාල යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට අරමුදල් සම්පාදනය හා පහසුකම් සැලැස්වීම • නියාමන විධානයන් පිළිපැදීම හා මූල්‍ය අංශ ප්‍රතිසංස්කරණ පිළිබඳව සිදු කෙරෙමින් ඇති සංවාදයට දායක වීම • අගය එක් කිරීම	රටේ උපායමාර්ගය අනුව ආර්ථික, සාමාජීය හා පාරිසරික වගකීම් සපුරාලීමට මෙම බැංකුව ඇපකැප වී සිටී. බැංකුවේ ආයතනික සැලැස්ම තුළ රජයේ සංවර්ධන වැඩසටහන සමඟ තිරසර අන්තර්ග්‍රහණ වැඩසටහනක් අන්තර්ගත කරන ලදී.
ප්‍රජාව	• ප්‍රාදේශීය ශාඛා, ජනමාධ්‍ය, සාමාජීය උත්සව හා අනුග්‍රාහකත්වයන් හරහා කටයුතු කිරීම • ඉහළ මට්ටමේ සහභාගිත්වය	• වගකීමෙන් යුතු ව්‍යාපාරික පිළිවෙත් • ප්‍රජා සංවර්ධනය • ප්‍රජාව බලගැන්වීම • රැකියා සම්පාදනය • මූල්‍ය සුරක්ෂිතතාව හා විශ්වාසවන්තභාවය	ප්‍රදේශීය ප්‍රජාවන්ගේ සමාජ-ආර්ථික යහ-පැවැත්ම සඳහා ඉඩප්‍රස්ථා හා පහසුකම් ලබා දෙමින් ආර්ථික ක්‍රියාකාරකම් ඇති කිරීම සඳහා අපි ඔවුන් සමඟ කටයුතු කරමු.
සැපයුම්කරුවන් හා සේවා සම්පාදකයන්	• නීතිපතා රැස්වීම්, ලිඛිත සන්නිවේදන • විනිවිද ලංසු ක්‍රියාවලිය • සබඳතා ගොඩනැගීම	• ව්‍යාපාර වර්ධනය • වගකීමෙන් යුතු ව්‍යාපාරික පිළිවෙත් • ගනුදෙනු කිරීමේ පහසුව • උපායමාර්ගික හවුල්කාරිත්වයන් • ප්‍රතිසම්පාදන ක්‍රියාවලියේ පරිවර්තනය • විවෘත සන්නිවේදනය	අපි අපගේ සැපයුම්කරුවන්ගේ සේවයේ විශිෂ්ටත්වය හඳුනා ගන්නා අතර, අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභදායක හවුල්කාරිත්වයන් හරහා ඔවුන්ගේ වර්ධනයට උපකාර කිරීමට අපේක්ෂා කරමු.

සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සලස්වන ක්‍රමෝපායක්

ශ්‍රී ලාංකික මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ වෙළඳපල ප්‍රමුඛයා වශයෙන් අපි සැබැවින්ම ජාතියේ බැංකුකරුවෝ ය. අපගේ මෙහෙයුම්වලට සමානුපාතිකව වර්ධනය සඳහා ඉඩප්‍රස්ථා සලසා දීම මඟින් සමාජ-ආර්ථික ප්‍රගමණයට පහසුකම් සලස්වනු පිණිස අපි අප ක්‍රියාත්මක වන ප්‍රදේශයන්හි ජනතාව සංවර්ධනය කිරීමට අපේක්ෂා කරමු. සැවොම ඇතුළත් ආර්ථික වර්ධනය සහ හවුලේ භුක්ති විඳින සෞභාග්‍යය ඉලක්ක කරමින් 2016 වන විට ඉහළ මධ්‍යම ආදායම් සහිත රටක් බවට පත් වනු පිණිස මහින්ද චින්තනය තුළ අන්තර්ගත කර ඇති ජාතික ප්‍රමුඛත්වයන් සමඟ අපගේ ක්‍රමෝපායන් සමීප ලෙස දිශාගත වී ඇත. සියළුම වෙළඳපල ආංශිකයන් සිසාරා ශක්තිමත් ලෙස ස්ථානගත වෙමින් අපි සාමාජීය වශයෙන් අදාළව සිටින අතර එය අප හට රටෙහි අංක එකේ වෙළඳ නාමය බවට පත්වීමට දායක වී ඇත. අපගේ ව්‍යාපාරික නාමය ශක්තිමත් සාරධර්ම මඟින් නිර්වචනය වී ඇත. රට හා එහි චාරිත්‍ර පිළිබඳ අපගේ දැනුමත් අපගේ ජාලයන් හා පියසටහනත් අසමසම වන අතර ඒවා අපට ශක්තිමත් තරඟකාරී වාසියක් හා ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා අංශයේ ප්‍රමුඛයා වශයෙන් අපගේ ස්ථානය පවත්වා ගැනීමට හැකියාව ලබා දී ඇත.

උපායමාර්ගික ප්‍රමුඛතා

විස්තරාත්මක කාර්ය සැලසුම්වල හා කාර්යසාධන මිනුම් න්‍යාසවල උපකාරයෙන් මැදි කාලීන වශයෙන් අවධානය යොමු කෙරෙන ක්ෂේත්‍ර

- සැවොම ඇතුළත් හා පාරිභෝගික කේන්ද්‍රික වර්ධනය
- අප බැංකුව ශ්‍රී ලංකාවේ දේශීය ජාත්‍යන්තර බැංකුව බවට පත්වීමට සූදානම් කරවමින් කොටස්කාර අපේක්ෂණයන් ඉටු කිරීම
- සුපෝෂිත කාර්යක්ෂම හා ප්‍රබෝධමත් කණ්ඩායම
- අනාගත පරපුර සඳහා බැංකුව සූදානම් කරනු පිණිස වූ තාක්ෂණික පරිවර්තනය
- කඩිනම් සේවය හා වේගවත් උපකාරක සේවා සමඟින් මෙහෙයුම්වල විශිෂ්ටත්වය
- සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සැලැස්වීම
- ප්‍රතිඵල දිශාභිමුඛ වීම
- ව්‍යාපාරික වර්ධනය සඳහා ඉඩප්‍රස්ථා හඳුනා ගැනීම
- නව වෙළඳපල වෙත පිවිසීම සඳහා බැංකුව ජාත්‍යන්තරීකරණය කරනු පිණිස බැංකුවේ ශක්තීන් යෙදවීම
- බැංකුවේ අනාගතය වෙත පදනමක් වශයෙන් සංවිධානමය රාමුවක් සංවර්ධනය කිරීම
- දුර්වල අංශ ඉහළ නංවනු පිණිස සම්පත් යෙදවීම
- වත්මන් අනුපාතයන් පවත්වා ගැනීම මඟින් බැංකුව ශ්‍රේණිගත ස්ථානය පවත්වා ගැනීම
- මධ්‍ය පරිමාණ වෙළඳපල වෙත පිවිසීම
- වෙනස්වන වෙළඳපල හා නියාමන තත්ත්වයන්ට ගැලපෙන පරිදි අරමුදල් සම්පාදන උපායමාර්ග යන් දිශාගත කිරීම

මැදුම් කාරණා

රටෙහි සමාජ-ආර්ථික සංවර්ධනයට පහසුකම් සලස්වන අතරම අපගේ දිගු-කාලීන ඉලක්කයන් සාක්ෂාත් කර ගනු පිණිස කළමනාකරණය කර ගත යුතු කාරණා

- අභ්‍යන්තර අරමුදල් ස්ථාවරත්වය ජනනය කිරීම සඳහා ලාභදායකව සිටිනු පිණිස වූ ශක්තිමත් මූල්‍ය කාර්යසාධනය
- සේවක කුසලතා සංවර්ධනය සහ හිතෛෂීතා කළමනාකරණය
- ආචාර ධර්මානුකූල හා වගකීමෙන් යුතු ව්‍යාපාරික පිළිවෙත්
- යහපාලනය, නියාමනය හා කොටස්කාර කළමනාකරණය
- කාගේත් තේරීම වන සේව්‍යයා බවට පත්වීම සහ දක්ෂයින් ආකර්ෂණය කර ගැනීමේ හැකියාව රඳවා ගැනීම
- අපගේ ත්‍රිත්ව පදනම් ප්‍රවේශය ස්ථිරසාරව ස්ථාපිත කිරීම
- මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛත්වය පවත්වා ගෙන යාම
- මතු වන අවදානම කළමනාකරණය කිරීම

අපි අපගේ ක්‍රමෝපායික ප්‍රමුඛත්වයන් සාක්ෂාත් කර ගැනීම හා සංවිධානයේ සියළුම අංශයන් තුළ ත්‍රිත්ව පදනම් ප්‍රවේශය ස්ථිරසාරව ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සුවිශේෂී ප්‍රගතියක් අත් කර ගෙන ඇත. අපගේ දිගු-කාලීන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා දායක වීමට උනන්දුවෙන් සිටින සියළුම සේවකයින් වෙත අපගේ ක්‍රමෝපාය සන්නිවේදනය කෙරෙන අතර, එය වෙළඳපල තුළ මුඛ්‍ය විපර්ය දායකයකි. ශ්‍රී ලංකාව හා එහි ජනතාව අප ඉදිරියේ තබන ඉඩප්‍රස්ථා පිළිබඳව අපගේ විශ්වාසය අපගේ ප්‍රයත්නයන්ට අතිරේක හදිසි බවක් හා ජවයක් ලබා දෙයි.

2013 වර්ෂය සඳහා උපාය මාර්ග ක්‍රියාවෙහි යෙදවීම

ප්‍රධාන උපාය මාර්ග ප්‍රමුඛතා ක්ෂේත්‍ර වල අපගේ ජයග්‍රහණ පහත සාරාංශ කර ඇති අතර මෙම ඒකාබද්ධ වාර්තාවේ චිය දීර්ඝ වශයෙන් සලකා බලා ඇත.

	2013	2014
ඇතුළත්කරණය සහ ගණුදෙනුකරු කේන්ද්‍රීය සංවර්ධනය		
ගණුදෙනුකරුවන් සංඛ්‍යාව (.000)	10,944	3% කට වැඩි වර්ධනයක්
බස්නාහිර පළාතෙන් පිටත පිහිටා ඇති ශාඛා සංඛ්‍යාව	432	445
අපගේ ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර සංඛ්‍යාව	523	549
ජනගහනයෙන් ගණුදෙනුකරුවන්ගේ අනුපාතය (%)	54	55
ප්‍රබෝධමත්, ඵලදායී සහ අභිප්‍රේරණය වූ කණ්ඩායම		
සේවකයින් සංඛ්‍යාව	8,883	10,106
රඳවා ගැනීමේ අනුපාතය(%)	99.6	> 99.6
උසස් වීම්	716	කාර්යසාධනය මත
විදේශීය පුහුණු වැඩමුළු සඳහා දරන ලද ආයෝජනය (රු. මිලියන)	131	165
සේවක සංඛ්‍යාව පුහණු කිරීම සඳහා දරන ලද මුළු ආයෝජනය (රු. මිලියන)	236	288
වර්ෂය තුළදී පවත්වන ලද නායකත්ව පුහණු වැඩමුළු සංඛ්‍යාව	117	125
සේවකයෙක් විසින් උපයන ලද ආදායම (රු. .000)	14,349	13,373
සේවකයෙක් විසින් උපයන ලද ලාභය (බදු පෙර) (රු. මිලියන)	1,768	2,028
මෙහෙයුම් කටයුතු වලදී දක්වන ලද විශිෂ්ඨත්වය		
ආදායමට පිරිවැය අනුපාතය (%)	49.1	49.0
වත්කම්හි ගුණාත්මකභාවය සුරැකීම	අක්‍රීය ණය මට්ටම පහත හෙලීමට උපායමාර්ග ක්‍රියාවෙහි යොදවා ඇත.	
මෙහෙයුම් කටයුතු ඒකාබද්ධ කිරීමේ අරමුණින් අපගේ පරිපාලිත සමාගම් ඒකාබද්ධ කිරීම	සී/ස චිම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විස් සමාගම සහ සී/ස සීලිස් සමාගම ඒකාබද්ධ විය.	සී/ස චිම් බී එස් එල් සමාගම සහ සී/ස චිම් බී එස් එල් සේවින්ස් බෑන්ක් සමාගම ඉදිරියේ දී ඒකාබද්ධ කෙරෙනු ඇත.
"5S"ක්‍රමය ක්‍රියාවෙහි යෙදවීම	ශාඛා 115 ක් සම්පූර්ණ කර ඇත	සියළුම ශාඛා වල සම්පූර්ණ කිරීමට නියමිතය.

	2013	2014
තාක්ෂණික පරිවර්තනය		
අන්තර්ජාල බැංකුකරණ ගනුදෙනු සංඛ්‍යාව (මිලියන)	10	15
ජංගම බැංකු ගනුදෙනු වල වර්ධනය (%)	17	20
ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර පහසුකමට ප්‍රවේශ වීමේ ස්ථාන	2,000 කට වැඩි ප්‍රවේශ ස්ථාන	පොදු ටෙලර් යන්ත්‍ර පුවරුවක් තුළින් තව දුරටත් වර්ධනය කිරීමට නියමිතය
ස්වයංක්‍රීය ආමුඛ ප්‍රේෂණ ක්‍රියාවලිය	සාක්ෂාත් කර ගන්නා ලද	තවදුරටත් වර්ධනය කිරීමට නියමිතය.
සමාජ ආර්ථික වර්ධනයට පහසුකම් සැලසීම		
මාර්ග සංවර්ධනය සඳහා අරමුදල් සැපයීම (කිලෝමීටර්)	368	150
නැවත භාවිතා කළ හැකි බලශක්ති ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම (රු. මිලියන)	1.1	3% කට වැඩි වර්ධනයක්
පෞද්ගලික අංශයට ලබා දුන් ණය (රු. මිලියන)	464,690	10% කට වැඩි වර්ධනයක්
වර්ෂය තුළදී ලබා දුන් සුළු හා මධ්‍ය පරිමාණ ණය (රු..000)	8,200	10,700
කාර්යසාධනය පෙළගැස්ම		
බදු පසු ලාභය (රු. මිලියන)	12,087	14,919
වත්කම් වර්ධනය (%)	14	12
ණය අලාභ අනුපාතය (%) (රන් ඇපයට තබා ලබා දෙන ණය හේතුවෙන් 4.3% ට පිරිහුණු අතර ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන යොදා ඇති බැවින් 2014 වර්ෂයේ දී එය නිවැරදි වනු ඇත)	4.3	2.3
ශ්‍රී ලංකාවේ දේශීය අන්තර් ජාතික බැංකුව බවට පත්වීම		
ගෝලීය ආයෝජක ප්‍රජාව හමුවේ ලංකා බැංකුව වඩා කැමති ආයෝජනයක් බවට පත් කිරීම	උපාය මාර්ග ක්‍රියාවෙහි යෙදවීම ක්‍රියාත්මක කෙරේ	උපාය මාර්ග ක්‍රියාවෙහි යෙදවීම ක්‍රියාත්මක කෙරේ
උපාය මාර්ගික ස්ථාන වල ශාඛා ස්ථාපිත කිරීමට ශක්‍යතා අධ්‍යනය සිදු කෙරේ		
අන්තර්ජාතික වෙළෙඳපොලවල් හරහා අරමුදල් රැස් කිරීම	ඇ. ඩොලර් මිලියන 500 ක් ලබා ගන්නා ලදී	අවශ්‍යතාවය අනුව
විශාලතම නියෝජිත බැංකු ජාලය	759	759

බැංකුකරණයේ නිමිවළලු පුළුල් කරමින්



අධ්‍යක්ෂ මණ්ඩලය

වමේ සිට දකුණ

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

ලලිත් විතාන මහතා

චන්ද්‍රසිරි ද සිල්වා මහතා

රාජු සිවරාමන් මහතා

කේ එම් මහින්ද සිරිවර්ධන මහතා

නලිනි ඩී අබේවර්ධන මෙනෙවිය

ආර් එම් ඒ රත්නායක මහතා





රාජු සිවරාමන් මහතා

වැඩ බලන සභාපති සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා සහ පළපුරුද්ද

රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍රයන්හි සමාගම් රාශියක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස සිවරාමන් මහතා අත්දැකීම් බහුල වූවෙකි. ඔහු සතුව කළමනාකරණය හා වාස්තුවිද්‍යාව පිළිබඳව වසර 30 කට අධික පළපුරුද්දක් වේ.

සිවරාමන් මහතා, මොරටුව විශ්ව විද්‍යාලයෙන් ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව විද්‍යාපති උපාධිය ලබා ඇති වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන අතර, ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම

වසර 2006, ජනවාරි මාසයේදී ප්‍රථමයෙන් ලංකා බැංකුවේ අධ්‍යක්ෂ තනතුරට පත් වූ අතර නැවත එම තනතුර සඳහා 2007 ජූනි, 2010 මැයි හා 2013 මැයි මාසයන්හිදී පත් කරන ලදී.

2013 දෙසැම්බර් මසදී ලංකා බැංකුවේ වැඩබලන සභාපති තනතුරට පත්විය.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල සමාජිකත්වය

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි හා නාමයෝජනා හා ආයතනික යහපාලනය කමිටුවේ සභාපති තනතුර දරණ සිවරාමන් මහතා විගණන හා ඒකාබද්ධ අවධානම් කළමනාකරණ යන කමිටුවල සමාජිකත්වය දරයි.

වර්තමාන ධූරයන්

සිවරාමන් මහතා සී/ස ආක් ට්‍රයැඩ් කන්සල්ටනස් (පුද්ගලික) සමාගමේ සහ සී/ස රාම් ඩිවලොපර්ස් (පුද්ගලික) සමාගමෙහි කළමනාකරණ අධ්‍යක්ෂවරයා ලෙසද, සී/ස ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් සමාගමේ සභාපතිවරයා ලෙසද වර්තමානයේදී කටයුතු කරන අතර සී/ස එම් සී එස් වල් මූල්‍ය සේවා සමාගමේද, සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පුද්ගලික) සමාගමේද, සී/ස මිරේකා හෝම්ස් (පුද්ගලික) සමාගමේද අධ්‍යක්ෂ ධුරයන් හොබවයි.

එසේම, ඔහු සී/ස ට්‍රයැඩ් කන්සල්ටන්ට්ස්, වරලත් වාස්තු විද්‍යා හා ඉංජිනේරු යන සමාගමේ හිමිකාරිත්වයද දරයි.

පූර්ව පත්කිරීම්

වසර 2006 සිට 2009 දක්වා ජාතික පොලිස් කොමිසමේ සාමාජිකත්වද දරන ලද අතර, 2012 වසරේදී එම තනතුර සඳහා නැවත පත්කරන ලදී.

ඔහු මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී, මාර්ග සංවර්ධන අධිකාරිය, සැලසුම් මධ්‍යස්ථානය, සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පුද්ගලික) සමාගම, සී/ස ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී, සී/ස මිල්කෝ (පුද්ගලික) සමාගම සහ සීලීස් සමාග මෙහි අධ්‍යක්ෂ ධූරය හොබවන ලදී. තවද, සිවරාමන් මහතා ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනයේ භාණ්ඩාගාරික හා සභා සාමාජිකත්වය උසුලන ලදී.



කේ එම් මහින්ද සිරිවර්ධන

නිලබලයෙන් පත්වූ විධායක නොවන අධ්‍යක්ෂ (2014 ජනවාරි දක්වා)

කුසලතා හා පළපුරුද්ද

සිරිවර්ධන මහතා සතු මූල්‍ය හා බැංකුකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද බැංකුවේ අරමුණ සමඟ රජයේ අභිමතාර්ථයන් ගලපාලමින් අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු ඉටුකිරීමට ඉවහල් වේ.

ඇමරිකා එක්සත් ජනපදයෙහි වැන්ඩර්බිට් විශ්ව විද්‍යාලයෙහි ආර්ථික විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය ද එම විශ්ව විද්‍යාලයෙහිම ආර්ථික සංවර්ධනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද ලබාගෙන ඇත.

තවද සිරිවර්ධන මහතා කැළණිය විශ්ව විද්‍යාලයෙහි ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ද හිමිකරගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම

2013 අප්‍රේල් මසදී නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ ලෙස ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත්විය.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය

විගණන කමිටුව හා ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටුවල සාමාජිකත්වය දරයි.

වර්තමාන ධූරයන්

මූල්‍ය හා ක්‍රම සම්පාදන ආමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙසද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යනාදියෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය හොබවයි.

පූර්ව ධූරයන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ අයවැය හා මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයුම් සම්බන්ධයෙන් එහි ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි අතිරේක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරඇති සිරිවර්ධන මහතා මූල්‍ය හා ක්‍රම සම්පාදන ආමාත්‍යාංශය, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, යනාදියෙහි අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් වරයකු ලෙස කටයුතු කර ඇත.

තවද ඒ මහතා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණුකිරීම් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයද දරා ඇත.



නලිනි ඩී අබේවර්ධන මෙනෙවිය
විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා පළපුරුද්ද

නීතිවේදිනියක වන නලිනී අබේවර්ධන මෙනෙවිය වාණිජ නීති ක්ෂේත්‍රයෙහි අත්දැකීම් හා පුද්ගලික අංශයෙහි තේ කර්මාන්තයේ වසර 25 කට වැඩි තමා සතු කළමනාකරණ අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සඳහා ලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම

ප්‍රථමයෙන් 2010 මැයි මසදී අධ්‍යක්ෂ තනතුරට පත් වූ ඇය 2013 මැයි මසදී නැවත වම තනතුරට පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වල සාමාජිකත්වය

ඇය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි සාමාජිකත්වය දරයි.

වර්තමාන ධූරයන්

සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ පවතින ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකාවක වන ඇය සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගමේ හා සී/ස බීඕසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරියක ලෙසද කටයුතු කරයි.

පූර්ව ධූරයන්

ඇය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙලේ නීති ආයතනයකට සම්බන්ධව කටයුතු කර ඇත. එසේම 2006 සිට 2009 දක්වා කාලය තුල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරියක ලෙසද කටයුතු කර ඇත.



චන්ද්‍රසිරි ද සිල්වා මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා පළපුරුද්ද

සිල්වා මහතා සිය විශේෂිත වූ නීති අත්දැකීම් මෙන්ම ව්‍යාපාරික හා රක්ෂණ අංශයන්හි අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු වලට ලබා දේ.

ඔහු වෘත්තීමය නීතීඥවරයකු වන අතර චික්සත් රාජධානියේ වේල්ස් සරසවියෙන් අන්තර්ජාතික වාණිජ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබාගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ පත්වීම

2010 මැයි මසදී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන අතර නැවතත් 2013 මැයි මස වම තනතුරට පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව යනාදියෙහි සාමාජිකත්වය හොබවයි.

වර්තමාන ධූරයන්

සී/ස බීඕසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගමෙහි සභාපතිවරයා ලෙසද සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි.

පූර්ව ධූරයන්

මහජන බැංකුව, පීපල්ස් මර්චන්ට් බෑන්ක් පීවිල්සී සහ සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙසද, සී/ස පීපල්ස් ට්‍රැවල්ස් සමාගමෙහි හිටපු සභාපතිවරයකු ලෙසද ඔහු කටයුතු කර ඇත.



ලලිත් විතාන මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා පළපුරුද්ද

බ්‍රැන්ඩික්ස් සමූහ ව්‍යාපාර, අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරීන්, ඇම්රෝ බැංකුව, කාසන්ස් කම්බර්බැච් පීවිල්සී, අයිබීඑම් ලෝක වෙළෙඳ සංස්ථාව සහ යමහා (ඇමරිකා එක්සත් ජනපදය) යන බැංකුකරණ, වෙළෙඳ හා නිෂ්පාදන ආයතනවල වසර 12 කට අධික පළපුරුද්දක් සහිත වසර 20 ක ආයතනික ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරා ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සහ කොළඹ විශ්ව විද්‍යාලයෙහි ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධීන්ද මහා බ්‍රිතාන්‍යයේ මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයේ කලාවේදී ගෞරව උපාධියද හිමිකර ගෙන ඇත.

මහා බ්‍රිතාන්‍යයේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ වෘත්තීය ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ අධි සාමාජිකත්වය ද ලබාගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම්

2004 මැයි 26 සිට 2005 දෙසැම්බර් අතර කාලය තුල අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කටයුතු කර ඇති අතර 2013 ජුනි මසදී නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල සාමාජිකත්වය

විගණන, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව යනාදියෙහි සභාපති තනතුරුද, නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටු සාමාජිකත්වය ද දරයි.

වර්තමාන ධූරයන්

සී/ස ඔරිට් ඇපරල්ස් ලංකා (පුද්ගලික) සමාගමෙහි හා සී/ස ඔරිට් ට්‍රේඩින් ලංකා (පුද්ගලික) සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරී තනතුර හොබවයි.

පූර්ව ධූරයන්

සෙලාන් බැංකු පී එල් සී, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී, දංකොටුව පෝසිලේන් යනාදියෙහි අධ්‍යක්ෂවරයකු ලෙසද, ජනසන්නිවේදන නියාමක කොමිසමෙහි කොමසාරිස්වරයා ලෙසද සේවය කර ඇත.



කේ එම් ඒ නෙළුමනී දවුලගල මහත්මිය
නිල බලයෙන් පත්වූ විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා පළපුරුද්ද

දවුලගල මහත්මිය මහා බ්‍රිතාන්‍යයේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය ද එහි එසෙක්ස් විශ්ව විද්‍යාලයේ මූල්‍ය හා ව්‍යාපාරික ආර්ථික විද්‍යාව පිළිබඳව විද්‍යාපති උපාධියක්ද ලබාගෙන ඇත.

තවද ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධියක් ද හිමි කරගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම

2014 ජනවාරි මසදී (කේ එම් මහින්ද සිරිවර්ධන මහතා වෙනුවට) මූල්‍ය අමාත්‍යාංශය නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල සාමාජිකත්වය

විගණන කමිටුවෙහි සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි සාමාජිකත්වය දරයි.

වර්තමාන ධූරයන්

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජෙනරාල්වරිය ලෙස ඇය කටයුතු කරන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණ ගණකාධිකාරිවරියක ලෙස චීම අමාත්‍යාංශයටම අනුයුක්ත කර ඇත.

දවුලගල මහත්මිය සේවක භාරකාර අරමුදලෙහි සහ රාජ්‍ය ආයතනයන්හි තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙහි භාරකාර මණ්ඩලයෙහි සාමාජිකත්වය ද දරයි.

පූර්ව ධූරයන්

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි වසර 20 කට අධික සේවා කාලයක් සහිත ඇය ප්‍රධාන ගණකාධිකාරී තනතුරුද, බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි අධීක්ෂණ අධ්‍යක්ෂ සහ මූල්‍ය ස්ථාවර අධ්‍යයන පිළිබඳ අධ්‍යක්ෂ ලෙසද කටයුතු කර ඇත.



ආර් එම් ඒ රත්නායක මහතා
විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂට විකල්ප අධ්‍යක්ෂ

කුසලතා හා පළපුරුද්ද

රත්නායක මහතා රාජ්‍ය අංශයන් හි ජ්‍යෙෂ්ඨ තනතුර දරමින් වසර 21 කට අධික කාලයක් තුළ ලබා ඇති පෘථුල අත්දැකීම් සම්භාරයක දායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදේ.

රත්නායක මහතා සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද, නෙදර්ලන්තයේ මස්ට්රිච්ට් ස්කූල් ඔෆ් මැනේජ්මන්ට් වෙතින් කළමනාකරණ පාලනය හා කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද , ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය වෙතින් ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය වෙනුවෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හා කැළණිය විශ්ව විද්‍යාලයෙන් (වාණිජවේදී විශේෂ) උපාධියක් ද ලබාගෙන ඇත.

තවද ඔහු ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකරුවන්ගේ ආයතනයෙහි අධි සාමාජිකත්වය ලබා සිටින අතර ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකත්වයද දරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම

2013 ජනවාරි මසදී නිලබලයෙන් පත්වූ අධ්‍යක්ෂ හට විකල්ප අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය

ඔහුගේ ගිණුම්කරණ පසුබිම හේතුකොටගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂිත අනුමැතිය සහිතව 2013 ජනවාරි සිට ජුනි මස දක්වා විගණන කමිටුවෙහි සභාපති ධූරය හොබවන ලදී.

වර්තමාන ධූරයන්

වර්තමානයේ දී රත්නායක මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් ලෙසද, සී/ස වෙස්ට් කොස්ට් පවර් (පුද්ගලික) සමාගමෙහි හා සී/ස ඩිලාරෑ ලංකා කරන්සි සහ සෙක්‍යුරිටි පින්ට් (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙසද කටයුතු කරයි.

පූර්ව ධූරයන්

රත්නායක මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ආදායම් අංශයෙහි පළමු අධ්‍යක්ෂ ලෙසද, මූල්‍ය හා ණය කළමනාකරණ අධ්‍යක්ෂ ලෙසද උක්ත අමාත්‍යාංශයහිම ඉදිකිරීම්, ගුවන් සේවා හා ප්‍රවාහන අංශ භාර අධ්‍යක්ෂ ලෙසද කටයුතු කර ඇත.

තවද ඔහු රාජ්‍ය ගිණුම්කරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ සහය අධ්‍යක්ෂ ලෙසද, රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක ගිණුම්කරණ නිලධාරී ලෙසද සේවය කර ඇති අතර ශ්‍රී ලංකා පදනම් ආයතනය, සී/ස මිල්කෝ (පුද්ගලික) සමාගම, සී/ස චිලව් ප්ලාන්ටේෂන් කම්පැනි (පුද්ගලික) සමාගම සහ ඇඟළුම් කර්මාන්ත පුහුණු අදියරේ අධ්‍යක්ෂ මණ්ඩලයන් හි ද කටයුතු කර ඇත.



ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ලේකම් ලංකා බැංකුව
නීතිඥ, එල් එල් බී, එම් බී ඒ

ආයතනික කළමනාකාරීත්වය



වමේ සිට දකුණට

පී ඒ ලයනල් මහතා, ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය, ඩී එම් ගුණසේකර මහතා, එච් එම් මුදියන්සේ මහතා

ඉදිරි පිටුව වමේ සිට දකුණට

පී ජේ ජයසිංහ මහතා, සෙනරත් බණ්ඩාර මහතා, ඩී පී කේ ගුණසේකර මහතා, ඩබ් පී රසල් ෆොන්සේකා මහතා





වමේ සිට දකුණට

එස් එච් රණවක මහත්මිය, කේ ඊ ඩී සුමනසිරි මහතා, එස් එම් එස් සී ජයසූරිය මහතා, ජී එච් චන්ද්‍රසිරි මහතා,

ඉදිරි පිටුව වමේ සිට දකුණට

ආචාර්ය ඉඳුනිල් ලියනගේ, ආචාර්ය ඩබ් ජී කරුණාදාස, ඩබ් ඒ අසෝක රූපසිංහ මහතා, ලලිත් ප්‍රනාන්දු මහතා, ලක්ෂ්මන් පෙරේරා මහතා



ඩී එම් ගුණසේකර මහතා

මහා කළමනාකරු

කුසලතා හා අත්දැකීම්

වෘත්තීය බැංකුකරුවෙකු වන ගුණසේකර මහතා විවිධ මානයන් ඔස්සේ පැතිරුණු සාරවත් දේශීය හා ජාත්‍යන්තර බැංකුකරණ අත්දැකීම් වලින් අනූන අතර ණය කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ පුළුල් දැනුමකට හිමිකම් කියයි. ශාඛා බැංකු කටයුතු වලින් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර වසර 31 ක් පුරා ආයතනික හා අක්වෙරළ බැංකුකරණය, විකුණුම් හා හැසිරවීම් සහ ජාත්‍යන්තර බැංකුකරණ මෙහෙයුම් කටයුතුවල ප්‍රධාන තනතුරු දරමින් ශ්‍රී ලංකාවේ විශාලතම වාණිජ බැංකුවෙහි ප්‍රධාන විධායක නිලධාරී තනතුරට පත්විය.

ගුණසේකර මහතා විසින් ඇමෙරිකාවේ පෙන්සිල්වේනියාවෙහි වොර්ටන් විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ආයතන කළමනාකරණය පිළිබඳ පාඨමාලාව [LKCM AOTS] නමැති උසස් කළමනාකරණ වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කර ඇත. 1981 වසරේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය මූල්‍යය සහ බදුකරණය පිළිබඳ විශේෂ උපාධිය ලබා ගත් ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වේ.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

ගුණසේකර මහතා 2013 වසරේ ජනවාරි 8 වන දින ලංකා බැංකුවේ මහා කළමනාකරු / ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරන ලදී. මහා කළමනාකරු / ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්වීමට පූර්ව 2010 වසරේ ඔක්තෝම්බර් මස සිට ශාඛා බැංකු කටයුතු සහ විකුණුම් හා හැසිරවීම් අංශයන්හි නියෝජ්‍ය මහා කළමනාකාර තනතුර දරන ලදී.

වර්තමානයෙහි දරන තනතුරු

සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම, සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම සහ සී/ස ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම යන ආයතන වල විධායක නොවන නාමික අධ්‍යක්ෂ තනතුරු දරයි.

වෘත්තීය මං සලකුණු

1983 වසරේදී තම වෘත්තීමය බැංකු ජීවිතය අරඹා බැංකුකරණය පිළිබඳ, විශේෂයෙන්ම ණය කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ පුළුල් අභ්‍යාසයන් ලබා ගෙන ඇති අතර වර්ෂ 1977 සිට 2000 දක්වා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ සේවය කර ඇත. තවද, ඔහු ලංකා බැංකු මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ සම්පත් දායකයෙකුද වේ. සමස්ථයක් වශයෙන් වසර 30ක කාලයක් බැංකුකරණ අත්දැකීම් සහිත ගුණසේකර මහතා වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙසද සේවය කරයි.

එච් එම් මුදියන්සේ මහතා

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකරු (විකුණුම් හා හැසිරවීම්)

කුසලතා හා අත්දැකීම්

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන මුදියන්සේ මහතා 2001 වසරේදී විධායක බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද එම ආයතනයෙන්ම ලබාගත්තේය.

1973 අගෝස්තු මස බැංකු සේවයට එක්වූ ඔහු ශාඛා බැංකු කටයුතු පිළිබඳව පුළුල් පරාසයක අත්දැකීම් සහිත වන අතර එය ඔහුගේ වර්තමාන ධුරයෙහි කාර්යයක් වන බැංකුවේ ශාඛා පද්ධතිය සංවර්ධනය කිරීමට මහඟු පිටිවහලක් විය.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

2010 ඔක්තෝම්බර් මස නියෝජ්‍ය මහා කළමනාකාර ධූරයට පත් කරන ලද අතර, 2011 අගෝස්තු මස දක්වා නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්) ලෙස කටයුතු කරන ලදී. නියෝජ්‍ය මහා කළමනාකරු (විකුණුම් හා හැසිරවීම්) ලෙස කටයුතු කරන අවස්ථාවේදී ඔහුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාර තත්ත්වයට 2013 ජුනි මස උසස් කරන ලදී.

වර්තමානයෙහි දරන තනතුරු

සී/ස සීබෑන්ක් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම සහ සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම යන ආයතනයන්හි අධ්‍යක්ෂවරයෙකු වේ.

වෘත්තීය මං සලකුණු

1973 අගෝස්තු මස බැංකු සේවයට එක්ව ශාඛා බැංකු කටයුතු පිළිබඳව පුළුල් පරාසයක අත්දැකීම් ලබාගන්නා ලදී. මෙම තනතුරට ප්‍රථම වයඹ පළාතේ සහකාර මහා කළමනාකරු ලෙස ක්‍රියා කළ ඒ මහතා ක්ෂුද්‍ර මූල්‍යනය සහ කෘෂිකාර්මික අංශය පිළිබඳව තමා සතුව ඇති දැනුම යොදා ගනිමින් සිය පළාත සංවර්ධනය කරා මෙහෙයවීය.

පී ඒ ලයනල් මහතා

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකරු (ජාත්‍යන්තර, භාණ්ඩාගාර සහ ආයෝජන)

කුසලතා හා අත්දැකීම්

පී ඒ ලයනල් මහතා 1983 වසරේදී බැංකු සේවයට එක් විය. වෘත්තීය බැංකුකරුවකු වන ඔහු බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 30 කට වැඩි පළපුරුද්දක් ලබා ඇති අතර භාණ්ඩාගාර කටයුතු, ජාත්‍යන්තර මෙහෙයුම් හා ආයෝජන බැංකුකරණයේ විශේෂඥ දැනුම ද ලබමින් වත්කම් හා වගකීම් කළමනාකරණය, අරමුදල් ඉපයීමේ කටයුතු, සුරුකුම්පත් ගනුදෙනු, භාණ්ඩාගාර කටයුතු වලට අදාළ අවදානම් කළමනාකරණය, සහ අන් රටවල් වලින් අරමුදල් ලබාගැනීමේ කාර්යයන්හි නිරත වී ඇත. භාණ්ඩාගාර සේවා වර්ධනය හා අලෙවිකරණයට ඔහුට විශේෂ හැකියාවක් ඇත. ලයනල් මහතා 1980 දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය හිමිකරගෙන ඇත.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

නියෝජ්‍ය මහා කළමනාකරු (ජාත්‍යන්තර, භාණ්ඩාගාර සහ ආයෝජන) ලෙස 2012 මාර්තු පත්විය. මෙම තනතුරට ප්‍රථම නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත් හා ආයෝජන බැංකුකරණ) තනතුරෙහි 2010 ඔක්තෝම්බර් මස සිට 2012 මාර්තු මස දක්වා කටයුතු කරන ලදී.

වර්තමානයෙහි දරන තනතුරු

ලංකා හොස්පිටල්ස් සමාගම, සී/ස ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම, කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම, සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම සහ සී/ස ලංකා සෙකියුරිටීස් (පෞද්ගලික) සමාගම යන ආයතනවල අධ්‍යක්ෂ ධූරය දරයි. එසේම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු සහ කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සම්පාදක කමිටුවේ සාමාජිකයෙකුද වේ. තවද ලයනල් මහතා භාණ්ඩාගාර හා ගනුදෙනු කටයුතුවල අග්‍ර ආයතනය වූ ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ සභාපති ධූරය හොබවයි.

වෘත්තීය මං සලකුණු

බැංකුවේ ප්‍රාථමික සුරැකුම්පත් ඒකකයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කර ඇති ඔහු, භාණ්ඩාගාර හා ආයෝජන බැංකු ඒකකයේ නායකත්වයද දැරීය. බී ඕ සී ලන්ඩන් ශාඛාවේ සේවය කළ 1988 සිට 1989 කාලය තුළ ඔහු භාණ්ඩාගාර කළමනාකරණය හා විදේශ විනිමය වෙළඳාම් කටයුතු පිළිබඳව පුහුණුවක් හා විස්තීර්ණ පළපුරුද්දක් ලබා ඇති අතර, පසුව ලංකා බැංකුව කරච්චි ශාඛාවේ භාණ්ඩාගාර අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළේය.

වසර 25කට අධික කාලයක් භාණ්ඩාගාර, ජාත්‍යන්තර හා ආයෝජන යන අංශයන්හි ක්‍රියා කර ඇති අතර ලංකා බැංකුවේ භාණ්ඩාගාර කටයුතුවල නව්‍යතා සියල්ලම ලයනල් මහතා විසින් සිදු කරන ලදී. ජාත්‍යන්තර වෙළඳපලෙහි ලංකා බැංකුව සහභාගි වූ සියළුම ඒකාබද්ධ ව්‍යාපාරික ණය ඔහුගේ නායකත්වය යටතේ සිදු වූ අතර ඇ. ඩො. බිලියනයක අරමුදල් උත්පාදනය කළ ඇ. ඩො. බැඳුම්කර නිකුතු සඳහාද ලයනල් මහතා නායකත්වය දැරීය.

සෙනරත් බණ්ඩාර මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (නිමැවුම් හා සංවර්ධන බැංකුකරණය)

කුසලතා හා අත්දැකීම්

කැළණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී උපාධිධරයකු වන බණ්ඩාර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධිධරයන්ගේ ආයතනයෙන් පශ්චාත් උපාධිය විශේෂ කුසලතාවයක් සහිතව සමත් ව ඇත. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය දරණ ඔහු 1998 දී එම ආයතනයේම බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවද සම්පූර්ණ කර ඇත්තේ එහි හොඳම ශිෂ්‍යයාට හිමි සම්මානයද හිමිකර ගනිමිනි.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

2012 මාර්තු මස බණ්ඩාර මහතා නියෝජ්‍ය මහා කළමනාකාර ධූරයට පත් කරන ලදී. නිමැවුම් කළමනාකරණය, ඉස්ලාමීය මූල්‍යනය, සංවර්ධන බැංකුකරණය, විද්‍යුත් බැංකුකරණය සහ හරපත්/ණයපත් මෙහෙයුම් යන අංශ වර්තමානයේ ඔහුගේ යටතේ පවතී.

වර්තමානයෙහි දරන තනතුරු

ශ්‍රී ලංකාවේ පුරෝගාමී මර්චන්ට් බැංකුව වන සී/ස මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇතුළුව ලංකා බැංකුවේ පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් කිහිපයක මෙන්ම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නාමික අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරයි.

වෘත්තීය මං සලකුණු

2008 ජනවාරි සිට විධායක කළමනාකාරිත්වයේ සාමාජිකත්වයට පත් බණ්ඩාර මහතා සහකාර මහා කළමනාකරුවකු වශයෙන් විවිධ ව්‍යාපාරික විෂයන් එනම් විදේශීය ශාඛා, ජාත්‍යන්තර මෙහෙයුම්, ආයතනික සම්බන්ධතා හා සී/ස ලංකා බැංකුව යු. කේ. සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරි ආදී විවිධ අංශ එක් එක් කාල පරිච්ඡේදයේදී ඉටු කර ඇත.

1990 ජනවාරි මස කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස බැංකු සේවයට එක් වූ ඔහු තම වෘත්තීය ජීවිතයේදී දේශීය හා විදේශීය වශයෙන් විශේෂයෙන්ම තොරතුරු පද්ධති, ආයෝජන, භාණ්ඩාගාර කළමනාකරණය, ජාත්‍යන්තර බැංකුකරණ මෙහෙයුම් සහ ආයතනික බැංකුකරණය යන අංශයන්ගේ විවිධ අත්දැකීම් සමුදායක් සහිතව ඉහළ තලයකට පැමිණ සිටී. 2010 දී එක්සත් රාජධානියෙහි ශාඛාව පරිපාලිතයක් බවට පත් කිරීමේ ක්‍රියාවලියේදී මූලිකත්වය ගෙන කටයුතු කල අතර බැංකුකරණ රෙගුලාසි සහ අනුකූලතාවය පිළිබඳව හසල දැනුමක් ලබා ගන්නා ලදී. බණ්ඩාර මහතා වර්තමානයේදී තාක්ෂණය පදනම් වූ සංවර්ධන ව්‍යාපෘති කීපයකට නායකත්වය සපයන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ණය හා ආයෝජන කළමනාකරණ අංශයන්ට සම්පත් දායකයකුද වේ.

බැංකුවට සම්බන්ධ වීමට පෙර, කැළණිය විශ්ව විද්‍යාලයේ සහකාර උපදේශකයෙකු ලෙසද, මහවැලි අධිකාරියේ සංඛ්‍යාලේඛනඥයෙකු ලෙසද සේවය කර ඇත.

ඩබ්ලිව් පී රසල් ෆොන්සේකා මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (ශාඛා බැංකු කටයුතු)

කුසලතා හා අත්දැකීම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියකු වන ඔහු එම විශ්ව විද්‍යාලයේම කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවකටද හිමිකම් කියන අතර දකුණු ක්වීන්ස්ලන්ත සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ද ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරයි.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

නියෝජ්‍ය මහා කළමනාකරු (ශාඛා බැංකු කටයුතු) ලෙස 2013 මැයි මස පත්විය. මෙම තනතුරට ප්‍රථම නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්) තනතුරෙහි 2012 මාර්තු මස සිට 2013 මැයි මස දක්වා කටයුතු කරන ලදී.

වර්තමානයෙහි දරන තනතුරු

2012 නොවැම්බර් මස සිට සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති තනතුර ෆොන්සේකා මහතා විසින් හොබවනු ලබයි. 2008 වර්ෂයේ සිට ඔහු මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගමෙහි නාමික අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කරන අතර ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගමෙහි විකල්ප අධ්‍යක්ෂ ධුරයද හොබවයි. තවද ආයෝජන මණ්ඩලයෙහි අනුමත පෞද්ගලික සමාගමක් වන සින්ටෙසි සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කරයි. එසේම ෆොන්සේකා මහතා 2012 නොවැම්බර් මස සිට ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් වන විගණන කමිටුවෙහි සභාපති තනතුර හොබවයි. 2013 අගෝස්තු මස සිට ලංකා බැංකුවේ පරිපාලිතයක් වන සී/ස මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විකල්ප අධ්‍යක්ෂවරයකු ලෙස මෙන්ම විගණන කමිටුවෙහි සභාපති ලෙසද කටයුතු කරයි.

වෘත්තීය මං සලකුණු

1990 ජනවාරි මස ඔහු බැංකු සේවයට බැඳුණි. ශාඛා බැංකුකරණයෙන් බැංකු ජීවිතය ඇරඹූ ඔහු බැංකුවේ මූල්‍ය කළමනාකරණ සහ ක්‍රමෝපාය සැලසුම් හි විශේෂඥ දැනුමකින් යුතු වන අතර වාණිජ බැංකුකරණයෙහි සියළුම අංශයන් පිළිබඳ පුළුල් අත්දැකීම් සමුදායකින් සමන්විත වේ. තවද, ඔහු ලංකා බැංකුව ලන්ඩන් ශාඛාවෙහි සේවය කර ඇති අතර භාණ්ඩාගාර කටයුතු සහ ජාත්‍යාන්තර බැංකුකරණ කටයුතු යන අංශයන්හි විශාල අත්දැකීම් සම්භාරයක් ලබා ඇත.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීමට ප්‍රථම ඔහු සහකාර මහා කළමනාකරු (අයවැය සහ ක්‍රමෝපාය සැලසුම්) තනතුරෙහි 2008 වසරේ සිට 2012 මාර්තු මස දක්වා කටයුතු කරන ලදී.

පී ජේ ජයසිංහ මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්)

කුසලතා හා අත්දැකීම්

ජයසිංහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිධාරියකු වේ. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් වන අතර ජාතික ව්‍යාපාරික කළමනාකරණ ආයතනයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් හදාරා ඇත. පසුගිය වසර 36 තුල ශාඛා බැංකුකරණය, තොග බැංකුකරණය, ජාත්‍යන්තර බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම් සහ මානව සම්පත් කළමනාකරණය යන විවිධ ක්ෂේත්‍රයන්ගේ අත්දැකීම් වලින් පිරිපුන්ය.

ආයතනික කළමනාකරිත්වයට පත්වීම

2012 මාර්තු මස නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්) ලෙස පත් කරන ලදී.

වර්තමානයෙහි දරන තනතුරු

වර්තමානයේ, සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇනඩ් මැනේජ් මන්ට් (පෞද්ගලික) සමාගම සහ සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ ධුරයද හොබවන ඔහු මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුවෙහි සාමාජිකත්වය, ශිෂ්‍යත්ව කමිටුවෙහි සහ තොරතුරු තාක්ෂණ හැසිරවීමේ කමිටුවෙහි සභාපති තනතුරද, ලංකා බැංකු විශ්‍රාම අරමුදලෙහි නිල බලයෙන් පත්වූ භාරකරු ලෙස ද ලංකා බැංකු වැන්දඹු හා අනත්දරු අරමුදලෙහි සහ අර්ථසාදක අරමුදලේ නිල බලයෙන් පත්වූ කළමනාකරු ලෙසද කටයුතු කරයි. තවද ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධිපතීන්ගේ මණ්ඩලයෙහි අතිරේක සාමාජිකයකුද එහි විගණන කමිටු සාමාජිකයකුද වන්නේය.

වෘත්තීය මං සලකුණු

1977 සේවයට බැඳුණු ජයසිංහ මහතා, ශාඛා බැංකුකරණය, තොග බැංකුකරණය, ජාත්‍යන්තර බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, අක්වෙරළ බැංකුකරණය, වෙළඳ මූල්‍ය මෙහෙයුම්, ණය අයකර ගැනීම් සහ මානව සම්පත් කළමනාකරණය යන විවිධ ක්ෂේත්‍රයන් ආවරණය කර ඇත. පසුගිය වසර 15ක කාලය තුල ඔහු බැංකුවේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා දැනුම වැඩි දියුණු කිරීමෙහිලා ණය ඇගයීම සහ පරිපාලනය, ණය ප්‍රතිපත්තිය, ජාත්‍යන්තර හා වෙළඳ මූල්‍ය යන අංශ සඳහා ආරාධිත සම්පත් දායකයකු ලෙස තම දායකත්වය සපයා ඇත.

ඔහු ණය කමිටුවෙහි ලේකම් ලෙසද අක්‍රීය ණය කළමනාකරණ කමිටුව හා මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුවෙහි සාමාජිකයකු ලෙසද තත්ත්ව කව තරඟාවලියේ සහ කර්මාන්ත හා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා ව්‍යවසායකයන්ගේ සම්මාන 2011 තරඟාවලියේ ජූරි සභාවද නියෝජනය කර ඇත.

ඩී. පී. කේ. ගුණසේකර මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු)

කුසලතා හා අත්දැකීම්

ගුණසේකර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණ) උපාධිධරයෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගෙන ඇත. තවද ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුද වේ.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

2013 වසරේ පෙබරවාරි සිට මැයි දක්වා කාලය තුල නියෝජ්‍ය මහ කළමනාකරු (ශාඛා බැංකුකරණය) යන තනතුර හෙබවූ අතර 2013 මැයි මස සිට නියෝජ්‍ය මහා කළමනාකරු (ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු) ලෙස පත් කරන ලදී.

වර්තමානයෙහි දරන තනතුරු

ගුණසේකර මහතා සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම යන ආයතනවල අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි.

වෘත්තීය මං සලකුණු

1980 වසරේදී බැංකුවට බැඳුණු ගුණසේකර මහතා තම වෘත්තීය ජීවිතය ශාඛා බැංකුකරණයෙන් අරඹා ශාඛා ජාලයෙහි පුළුල් අත්දැකීම් සමුදායක් ලබා ගන්නා ලදී. ඔහු මධ්‍යම මුදල් ඒකකයේ සහ ගිණුම් අංශයේ සේවය කර 1992 දී භාණ්ඩාගාර අංශයට බැඳී භාණ්ඩාගාර හා මූල්‍ය වෙළඳපොල මෙහෙයුම් පිළිබඳ මනා දැනුමක් හා අත්දැකීම් දේශීය හා විදේශීය වශයෙන් ලබා ගන්නා ලදී. බී ඕ සී ලන්ඩන් ශාඛාවේද සේවය කර ඇති ගුණසේකර මහතා චෙන්නායි ශාඛාවේ නියෝජ්‍ය කළමනාකරු වශයෙන්ද සේවය කර ඇත. ඔහු භාණ්ඩාගාර අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කර ඇති අතර මධ්‍යම කාර්යාලය පිහිටුවාලීමේ පුරෝගාමී සාමාජිකයෙකු විය. ගුණසේකර මහතා 2010 ඔක්තෝම්බර් මස සිට සහකාර මහා කලමනාකරු (විදේශීය ශාඛා) සහ සහකාර මහා කලමනාකරු (ආයතනික සම්බන්ධතා) යන තනතුරු දරා ඇත.

කේ ඊ ඩී සුමනසිරි මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (අය කර ගැනීම්)

කුසලතා හා අත්දැකීම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණ) ගෞරව උපාධිධරයෙකි. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනය විසින් පවත්වන ව්‍යාපාර නායකයන් සඳහා වූ උසස් කළමනාකරණ සහ පොදු ප්‍රතිපත්තිය පිළිබඳ විශේෂ කළමනාකරණ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇත.

සුමනසිරි මහතා ශාඛා බැංකුකරණය, ක්ෂුද්‍ර මුල්‍යනය, ආයතනික මූල්‍ය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ සාරවත් සහ විවිධාංගිකරණය වූ අත්දැකීම් ලබාගෙන ඇත. ඔහු ලංකා බැංකුව ඉහළ ස්ථානයක ඔසවා තැබීමට අවශ්‍ය නායකත්වය හා මඟපෙන්වීම ලබා දෙයි.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

2013 වසරේ මැයි මාසයේ නියෝජ්‍ය මහා කළමනාකරු (අය කර ගැනීම්) ලෙස පත් කරන ලදී.

වෘත්තීය මං සලකුණු

1990 දී වෘත්තීය බැංකුකරුවෙකු ලෙස බැංකු ජීවිතය අරඹා ශාඛා ජාලය තුල ප්‍රධාන තනතුරු කීපයක් දරමින් සේවය කර ඇත. බැංකුවේ පුහුණු කිරීමේ ආයතනයේ පීඨ සාමාජිකයෙකු වූ සුමනසිරි මහතා කළමනාකරු (පුහුණු) යන තනතුරද දරා ඇත. සේවක මණ්ඩලයේ දැනුම දියුණු කිරීම වෙනුවෙන් කැපවී කටයුතු කරමින් ඔවුන්ගේ වෘත්තීමය සංවර්ධනය සඳහාද විශාල වශයෙන් දායක විය. සුමනසිරි මහතා උතුරු ප්‍රදේශයේ දශක තුනක ගැටුම් අවසන් වූ වහාම සහකාර මහා කළමනාකරු (උතුරු පළාත) තනතුර දරමින් නැවත පදිංචි කල ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ ක්‍රියාවලියේ ප්‍රධාන භූමිකාවක් උසුලන ලදී. ඔහු උතුරු පළාතේ ආර්ථික වර්ධනයට මහත්සේ දායක වී ඇත.

එස් එම් එස් සී ජයසූරිය මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්)

කුසලතා හා අත්දැකීම්

1979 වසරේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබාගත් ජයසූරිය මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) (UK) ආශ්‍රිත සාමාජිකත්වය දරයි. තවද, ඔහු ලෝක වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරයකු (CGMA) (UK) මෙන්ම වරලත් නැවී තැරැව්කරුවන්ගේ සංගමයෙහි (MICS) (UK) හි සාමාජිකයෙකු ද වේ.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

ජයසූරිය මහතා නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්) ලෙස 2013 මැයි මස පත් කරන ලදී. ඔහු වර්තමානයේදී මූල්‍ය ගිණුම්කරණ, අයවැය හා ක්‍රමෝපාය සැළසුම්, කළමනාකරණ තොරතුරු, භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය, බදු සහ මධ්‍යම මුදල් කළමනාකරණ යන අංශ වලට නායකත්වය සපයයි.

වර්තමානයෙහි දරන තනතුරු

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සහ බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගමෙහි විකල්ප අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරන අතර එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගමෙහි අධ්‍යක්ෂවරයෙක් ලෙස ද නම් කොට ඇත.

වෘත්තීය මං සලකුණු

වසර 27කට වැඩි බැංකුකරණ අත්දැකීම් සහිත ජයසූරිය මහතා ඔහුගේ වෘත්තීමය ජීවිතය දේශීය බැංකුකරණ කටයුතු වලින් අරඹා පසුව භාණ්ඩාගාර, ආයෝජන බැංකුකරණ සහ ජාත්‍යන්තර බැංකුකරණය පිළිබඳ විශේෂඥතාවය ලබා ගන්නා ලදී. 1991 වසරේදී ප්‍රාපනිකයකු (dealer) වශයෙන් භාණ්ඩාගාර අංශයට බැඳුණු ඔහු වසර 22 ක් පුරා මුලස්ථානය, ලන්ඩන් ශාඛාව සහ චෙන්නයි ශාඛාව ආශ්‍රයෙන් භාණ්ඩාගාර කළමනාකරණය පිළිබඳ පුළුල් දැනුමක් හා අත්දැකීම් සමූහයක් ලබා ගත්තේය. බැංකුවේ ද්‍රවශීලතාවය මනාව කළමනාකරණය කිරීම සහ විදේශ විනිමය ආදායම වැඩිකිරීම තුළින් ඔහු භාණ්ඩාගාර අංශයට විශාල දායකත්වයක් ලබා දී ඇත.

ඇ. ඩො. මිලියන 500 ජාත්‍යන්තර බැඳුම්කර නිකුතු දෙකෙහිම ක්‍රියාශීලීව කටයුතු කළ ජයසූරිය මහතා ඊට අදාල මඟ පෙන්නුම් කණ්ඩායමේ සාමාජිකයෙක්ද විය. තවද, ලංකා බැංකුවේ ස්ථර II ප්‍රාග්ධන වර්ධනය සඳහා කළ ණයකර නිකුතුවේද විශේෂ වැඩ කොටසක් ඔහු විසින් කරන ලදී. බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණය සඳහා විශාල අරමුදල් ප්‍රමාණයක් ඒකාබද්ධ හා ද්වීපාර්ශ්වික පහසුකම් තුලින් ලබා ගැනීමට ජයසූරිය මහතා ජාත්‍යන්තර බැංකු සමඟ ඇති කරගෙන තිබෙන සම්බන්ධතා පාවිච්චි කර ඇත.

ඔහු 1997 සිට 2000 වසර දක්වා ලංකා බැංකු චෙන්නායි ශාඛාවේ භාණ්ඩාගාර අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කර ඇත. වර්තමානයේදී ජයසූරිය මහතා ආයෝජන කමිටුවෙහි, වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවෙහි (ALCO), ණය කමිටුවෙහි සහ තොරතුරු තාක්ෂණ හැසිරවීමේ

කමිටුවෙහි සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. ඔහු බැංකුවේ විශ්‍රාමික අරමුදලේ, අර්ථසාදක අරමුදලේ සහ වැන්දඹු හා අනත් දරු අරමුදලේ ආයෝජන කමිටුවෙහි සභාපති ලෙස කටයුතු කරන අතර 2009 වසරේ සිට එහි නිල බලයෙන් පත්වූ භාරකරු ලෙසද කටයුතු කරයි. තවද ජයසූරිය මහතා ආපදා තක්සේරු හා ප්‍රතිසංස්කරණ කමිටුවෙහි සභාපති වන අතර වසර කීපයක් පුරා ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ විධායක කමිටු සාමාජිකයෙකුද විය.

2009 නොවැම්බර් මස සිට ජයසූරිය මහතා ලංකා බැංකු විධායක කළමනාකාරීත්ව සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී. ඔහු ආයතනික කළමනාකාරීත්වයට පත්වීමට ප්‍රථම සහකාර මහා කළමනාකරු (භාණ්ඩාගාර) සහ සහකාර මහා කළමනාකරු (ආයෝජන බැංකුකරණ) ලෙස සේවය කර ඇත. ජයසූරිය මහතා ලංකා බැංකුවේ ප්‍රාථමික සුරැකුම් අංශයෙහි ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස කටයුතු කර ඇත.

ලංකා බැංකුවට සේවයට පැමිණීමට පෙර ඔහු සිලෝන් ෂිපින් කෝපරේෂන් ආයතනයේ වසර පහක් සේවය කර සහකාර කළමනාකාර තත්ත්වයට උසස් විය.

ජී එච් චන්ද්‍රසිරි මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (උපකාරක සේවා)

කුසලතා හා අත්දැකීම්

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය දරන චන්ද්‍රසිරි මහතා එම ආයතනයෙන්ම බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාවක්ද ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (වාණිජ) විශේෂ උපාධිධරයෙකු වන අතර ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලයෙන් ගණකාධිකරණ උසස් ජාතික ඩිප්ලෝමාවක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ උසස් ජාතික ඩිප්ලෝමාවක් ලබාගෙන ඇත. තවද චන්ද්‍රසිරි මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ආවසරික සාමාජිකයෙකි.

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම

2013 සැප්තැම්බර් මස චන්ද්‍රසිරි මහතා නියෝජ්‍ය මහා කළමනාකරු (උපකාරක සේවා) ලෙස පත් කරන ලදී.

වර්තමානයෙහි දරන තනතුරු

2013 සැප්තැම්බර් සිට සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂ ධූරයක් දරයි.

වෘත්තීය මං සලකුණු

1986 වසරේ ලංකා බැංකුවට බැඳුණු චන්ද්‍රසිරි මහතා බල්ලකෙටුව ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් තම වෘත්තීය ජීවිතය අරඹන ලදී. දේශීය බැංකුකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් ලබාගන්නා අතර ඔහු 1993-1994 කාලය තුළ ලංකා බැංකු නියෝජිතයෙකු ලෙස ලෙබනනයේ සේවය කර ඇත. ආයතනික කළමනාකාරීත්වයට පත්වීමට පෙර චන්ද්‍රසිරි මහතා සහකාර මහා කළමනාකරු (ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ සහ ප්‍රතිව්‍යුහකරණ ව්‍යාපෘතිය) සහ සහකාර මහා කළමනාකරු (ඌව පළාත) යන තනතුරු හොබවන ලදී.

එස් එච් රණවක මහත්මිය

ප්‍රධාන නීති නිලධාරිනී

කුසලතා හා අත්දැකීම්

වේල්ස් විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳාම් නීතිය පිළිබඳ විද්‍යාපති උපාධිධාරිනියක් වන ඇය ශ්‍රී ලංකා නීති විද්‍යාලය විසින් ප්‍රදානය කරනු ලබන බැංකු හා රක්ෂණ නීති සහ ජාත්‍යන්තර වෙළඳාම් නීති පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක ද වෙයි.

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම

2012 අප්‍රේල් මස ප්‍රධාන නීති නිලධාරිනිය ලෙස පත්විය.

වර්තමානයෙහි දරන තනතුරු

බැංකුවේ පරිපාලිත සමාගමක් වන සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂවරියක ලෙසද සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගමෙහි අතිරේක අධ්‍යක්ෂවරියක ලෙසද ඇය කටයුතු කරයි. ඇය බැංකුවේ මහරගම මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ ආශ්‍රිත පීඨ සාමාජිකත්වයද දරයි.

වෘත්තීය මං සලකුණු

1986 ජූනි මස බැංකු සේවයට බැඳුණු ඇය නීති දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී. රණවක මහත්මිය වෘත්තීමය නීතිඥවරියක වන අතර, 1980 වසරේදී ගාල්ල නීතීඥ මණ්ඩලයෙන් සිය නීතිඥ වෘත්තිය ආරම්භ කරන ලදී. මෙයට ප්‍රථම ඇය, බැංකුවේ නියෝජ්‍ය ප්‍රධාන නීති නිළධාරී (ණය) තනතුර හොබවන ලදී. ඇය ශ්‍රී ලංකා නීතීඥ මණ්ඩලයේ සාමාජිකාවක් වන අතර ආයතනික නීතිඥවරුන්ගේ සංගමයේ සභාපති ධූරය ද දරයි.

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

කුසලතා හා අත්දැකීම්

කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිධාරිනියක වන ඇය එහිම ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියද හිමි කරගෙන ඇත.

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්/ලේකම් - ලංකා බැංකුව ලෙස 2005 දෙසැම්බර් මස පත් කරන ලදී.

වර්තමානයෙහි දරන තනතුරු

සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගමෙහි නාමික අධ්‍යක්ෂවරියක් වන ඇය එහි සමාගම් ලේකම්වරිය ලෙස ද කටයුතු කරයි. මීට අමතරව සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගමේ සමාගම් ලේකම්වරිය ද වේ.

වෘත්තීය මං සලකුණු

වසර 15 කට අධික කාලයක් බැංකුවේ අත්දැකීම් සහිත සිරිවර්ධන මහත්මිය, ආයතනික යහපාලනය සහ සමාගම් ලේඛන කටයුතු සම්බන්ධව සුවිශේෂී දක්ෂතා දක්වා ඇති අතර ඇය බැංකු අධ්‍යක්ෂ

මණ්ඩලයේ සියළුම උප කමිටුවල ලේකම් ධූරය හොබවයි. ආයතනික යහපාලන නීතිරීති වලට අනුකූලව බැංකුව කටයුතු කරන්නේද යන්න ඇය විසින් සහතික කරනු ලබයි. බැංකු සේවයට එක්වන්නට පෙර වෘත්තිය නීතීවේදිනියක වන ඇය පුද්ගලික අංශයේ සමාගම් කිහිපයකම මූලික කොටස් නිකුතූන්, සමාගම් ඒකාබද්ධ කිරීම් යනාදිය, නෛතික හා මානව සම්පත් කටයුතු ඇතුළුව ලේකම් කටයුතු හැසිරවීම සිදු කොට ඇත. ඇය කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජ හා කර්මාන්ත නීතිය සම්බන්ධයෙන් බාහිර කථිකාචාර්යවරියක ලෙසද කටයුතු කළාය.

ඩබ්ලිව් ඒ් අසෝක රූපසිංහ මහතා

ප්‍රධාන මූල්‍ය නිලධාරී

කුසලතා හා අත්දැකීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරන රූපසිංහ මහතා 1991 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී විශේෂ උපාධිය සහ 2007 දී ඔස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබාගත්තේය. ලංකා බැංකුවේ සේවයට එක්වන්නට පෙර ඔහු කටාර් වාණිජ බැංකුවේ ආයතනික මූල්‍ය කටයුතු අංශයේ ප්‍රධානියා වශයෙන්ද, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය හා පරිපාලන ප්‍රධානියා ලෙසද කටයුතු කර ඇත. ශ්‍රී ලංකා ගණකාධිකාරිවරුන්ගේ තාක්ෂණික ආයතනයේ පාලක මණ්ඩල සාමාජිකයෙක් වන ඔහු තම වෘත්තීය පුහුණුවීම් කේ පී එම් ජී ආයතනයෙන් ලබාගන්නා ලදී.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස 2009 ඔක්තෝම්බර් මස පත් කරන ලදී.

වර්තමානයෙහි දරන තනතුරු

රූපසිංහ මහතා සී/ස එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වන අතර එහි අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වන විගණන කමිටුවෙහි සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි සභාපතිත්වය දරයි. ඊට අමතරව ඔහු වත්කම් හා වගකීම් කමිටුව (ALCO), ණය කමිටුව, අක්‍රිය වත්කම් කමිටුව සහ තොරතුරු තාක්ෂණ හැසිරවීමේ කමිටුව වැනි කළමනාකරණ කමිටු කීපයක සාමාජිකත්වය දරන අතර හොරසන් තැබීම පිලිබඳ කමිටුව හා අක්‍රිය වත්කම් කමිටුවෙහි සභාපතිත්වය දරයි. බැංකුවේ පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් සමස්ථ සමායෝජක ලෙස රූපසිංහ මහතා කටයුතු කරයි.

වෘත්තීය මං සලකුණු

බැංකුවේ සහ ඊට ප්‍රථම සේවය කල ආයතනවල ප්‍රධාන මුල් පිරීමේ කටයුතු වලට පුළුල් ලෙස සම්බන්ධ වී ඇත. 2002 වසරේදී කටාර් වාණිජ බැංකුවේ මෙන්ම 2012 දී ලංකා බැංකුවේද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට පරිවර්තනය වීමේ කටයුතු සම්බන්ධයෙන් රූපසිංහ මහතා නායකත්වය දරන ලදී. ඔහු ඒකාබද්ධ කිරීම් හා අත්පත් කර ගැනීම් පිලිබඳ ඉහළ පෙලේ කණ්ඩායම් වල දේශීය හා විදේශීය වශයෙන් කටයුතු කර ඇත. කටාර් වාණිජ බැංකුව විසින් ඕමාන ජාතික බැංකුවෙහි 35% සහ එක්සත් එමීර් රාජ්‍යයෙහි එක්සත් අරාබි බැංකුවෙහි 40% අත්පත් කරගැනීම, විවිධ රටවල් කීපයක තිබෙන කුඩා ප්‍රමාණයේ පරිපාලිත විකිණීම් යනාදිය ඊට නිදසුන් වේ. තවද රූපසිංහ මහතා කටාර් වාණිජ බැංකුව විසින් පළමු වරට නිකුත්කල ලන්ඩන් කොටස් හුවමාරුවේ ලැයිස්තුගත මධ්‍ය කාලීන යුරෝ ණයපත් නිකුතුව ප්‍රථම වරට ලන්ඩන් කොටස් හුවමාරුව මඟින් කල ගෝලීය භාණ්ඩාගාර රසිට්පත් නිකුතුව සහ ලංකා බැංකුව විසින් දෙවරක් කල ඇ. ඩො. බැඳුම්කර නිකුතුව යනාදියට සම්බන්ධ වී ඇත. වර්තමානයේ ඔහු ලංකා බැංකුවේ මූල්‍ය කටයුතු වලට අමතරව ආයතනික ක්‍රමෝපායන් වල වගකීම ද දරයි.

ලලිත් ප්‍රනාන්දු මහතා

ප්‍රධාන අවදානම් නිළධාරී

කුසලතා හා අත්දැකීම්

1986 දී බැංකු සේවයට බැඳුනු ප්‍රනාන්දු මහතා, බැංකු හා මූල්‍ය සේවා පිළිබඳ වසර 27 කට අධික කාලයක් පළපුරුද්දක් සහිත වන අතර ශාඛා බැංකුකරණය, ආයෝජන බැංකුකරණය, ජාත්‍යන්තර බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම් යන ක්ෂේත්‍රයන්ගේ විශේෂිත වූ දැනුම් පරාසයකින් යුක්තය.

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ඔහු සතුය. එසේම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරයි.

පසුගිය වසර 11 ක කාලයක් බැංකුවේ අවදානම් කළමනාකරණය සම්බන්ධ ක්‍රියාකාරකම් වල නියැලී සිටි ඔහු බැංකුවේ වත්මන් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය පිහිටුවීමෙහිලා පුරෝගාමීව කටයුතු කරන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ, අවදානම් වෘත්තිකයන්ගේ ගෝලීය සංගමය මඟින් ඔහුට FRM තනතුර ප්‍රදානය කර ඇත. මෙම තනතුර ප්‍රදානය කිරීම, ගෝලීය වශයෙන් අවදානම් කළමනාකරණය පිළිබඳව ඇති විශිෂ්ඨ දැනුම සනාථ කරයි. අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යාපන මධ්‍යස්ථානයේ ප්‍රසිද්ධ සම්පත් දායකයකු ද වේ. සවුදි මූල්‍ය නියෝජිත ආයතනය මඟින් ඔහුට කළ ආරාධනාවක් මත සවුදි බැංකුකරුවන් සඳහා වන රියාද් බැංකුකරුවන්ගේ ආයතනය මඟින් පැවැත්වූ ණය අවදානම් කළමනාකරණ වැඩසටහන ඉතා සාර්ථක අන්දමින් සිදු කිරීමට ඔහු සමත් විය.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම

2013 වසරේ අප්‍රේල් මස 5 වනදා සිට ප්‍රධාන අවදානම් නිළධාරී ලෙස පත් කරන ලදී.

වෘත්තීය මං සලකුණු

බැංකුවට සම්බන්ධ වීමට පෙර ප්‍රනාන්දු මහතා ගණිතය සහ භෞතික විද්‍යාව පිළිබඳ උපාධිධාරී ගුරුවරයෙකි. ආයතනික කළමනාකාරිත්වයට පත්වීමට ප්‍රථම ඔහු සහකාර මහා කළමනාකරු (අවදානම් කළමනාකරණය/අනුකූලතාව) ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය ඩබ්ලිව්. ජී. කරුණාදාස

ප්‍රධාන අභ්‍යන්තර විගණක

කුසලතා හා අත්දැකීම්

ආචාර්ය කරුණාදාස, 1996 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය හිමිකරගෙන ඇති අතර, 2005 දී අයර්ලන්ත අන්තර්ජාතික සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය හිමි කරගෙන තිබේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මෙන්ම ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ද ආශ්‍රිත සාමාජිකත්වය දරයි.

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම

2009 මාර්තු මස ලංකා බැංකුවේ ප්‍රධාන විගණක ලෙස පත් කරනු ලැබීය.

වෘත්තීය මං සලකුණු

ලංකා බැංකුවට එක්වන්නට පෙර ඔහු විශාල වාණිජ හා මූල්‍ය ආයතනයන්හි අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා විය. ඔහු 1988-2001 දක්වා, ද ෆිනෑන්ස් සමාගම පී එල් සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ආයතනික කළමනාකාරීත්වයේ ද කටයුතු කර ඇත.

ආචාර්ය ඉඳුනිල් ලියනගේ

ප්‍රධාන අලෙවිකරණ නිලධාරී

කුසලතා සහ අත්දැකීම්

ආචාර්ය ඉඳුනිල් ලියනගේ ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධිධාරී අධ්‍යනාංශ පීඨයේ (FGS) ආචාර්ය (PhD) උපාධිධාරියකු වේ. ඔහු ශ්‍රී ලංකාවේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිධරයෙකු ද වේ. තවද ලියනගේ මහතා එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකු ද වේ.

ආචාර්ය ලියනගේ ශ්‍රී ලංකාවේ ප්‍රථම වරලත් අලෙවිකරුවන්ගේ කණ්ඩායමේ සාමාජිකයෙකු වන අතර ඔහු 1997 සිට වරලත් අලෙවිකරුවකු ලෙස කටයුතු කරයි. එමෙන්ම ඔහු වරලත් අලෙවිකරණ ආයතනයේ (FCIM) සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (FSLIM) අධි සාමාජිකත්වය උසුලයි.

ඔහු 1995 වසරේ සිට එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකයකු, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඇලුමිනි සංගමයේ (AAUSJP) සාමාජිකයෙකු සහ කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධිධාරී අධ්‍යනාංශ පීඨයේ (AAUOC - FGS) සාමාජිකයකුද වේ. ඔහු 2009 වසරේදී සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයෙන් (NUS) පවත්වනු ලැබූ උපායමාර්ග කළමනාකරණ විධායක වැඩසටහන ද ඇතුළුව විවිධ ජාත්‍යන්තර පුහුණු කිරීම් සඳහා සහභාගී වී ඇත.

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම

2012 සැප්තැම්බර් මස ලංකා බැංකුවේ ප්‍රධාන අලෙවිකරණ නිළධාරී ලෙස පත් විය.

වෘත්තීය මං සලකුණ

ලංකා බැංකුවේ ප්‍රධාන අලෙවිකරණ නිළධාරී තනතුරට ප්‍රථම ආචාර්ය ලියනගේ ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පී එල් සී හි සහකාර උප සභාපති (ප්‍රධාන අලෙවිකරණ) ලෙස සේවය කර ඇත. එසේම මීට පෙර නොයෙකුත් ආයතන වල අලෙවිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධව ඔහු සිය දායකත්වය ලබා දෙමින් 1989 වසරේ සිට ශ්‍රී ලාංකික මුල්‍ය සේවා කර්මාන්තයේ සහ ඉක්මනින් අලෙවි වන පාරිභෝගික භාණ්ඩ (FMCG) ක්ෂේත්‍රයේ, විද්‍යුත් උපකරණ සහ කෘෂිකාර්මික අංශයේ වසර විසි තුනකට අධික කාලයක අත්දැකීම් සම්භාරයක් ලබා ඇත. ඔහුගේ අලෙවිකරණ වෘත්තීය ජීවිතය මුළුල්ලේ ඔහු දේශීය හා විදේශීය සන්නම්/ රට තුළ නිපැයුම් ගොඩනැංවීමට දායක වී ඇත. ඔහු පෙරාතුව බහුජාතික සහ දේශීය සමාගම් වල නිෂ්පාදනයේ ධාරිතාව/ සන්නම්නාම කළමනාකරු සහ අලෙවිකරණ කළමනාකරු යන ජ්‍යෙෂ්ඨ ධුර දරා ඇත.

ආචාර්ය ලියනගේ මලයාසියාවේ පැවැත්වූ ගෝල්ඩන් ග්ලෝබ් ටයිගර් සම්මාන 2013 උලෙළෙහිදී ''ඉතා දක්ෂ ප්‍රධාන අලෙවිකරණ නිළධාරීන් 50'' යන සම්මානයෙන් පිදුම් ලැබූ අතර ඇමරිකා එක්සත් ජනපදයේ හවායි හිදී ජපාන ඇමරිකා කළමනාකරණ විද්‍යායතනයේ ගෝලීය කළමනාකරුවන් සඳහා වන අන්තර් සංස්කෘතික අධ්‍යාපන වැඩසටහන සඳහා තේරී පත් වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා ලියනගේ මහතාය. ඔහුගේ ශාස්ත්‍රීය විශිෂ්ඨත්වය, ජාත්‍යන්තර අවබෝධය සහ කීර්තිනාමය වෙනුවෙන් ලබාදෙන ලද විභව දායකත්වය ඇගයීම උදෙසා 1996 දී ජපානයේ ෆුජිට්සු පදනම විසින් ඉහත වැඩසටහන නිම කිරීම සඳහා ඔහුට සම්පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී.

ලක්ෂමන් පෙරේරා මහතා

ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී

කුසලතා හා අත්දැකීම්

පෙරේරා මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා උපාධිධරයකු වන අතර ඔහු පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියද කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියද හිමි කර ගෙන ඇත.

තවද ඔහු ශ්‍රී ලංකාවේ පරිගණක සංගමයේ සහ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සාමාජිකත්වයද උසුලයි.

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම

2013, අගෝස්තු මස ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී ලෙස පත් විය.

වෘත්තීය මං සලකුණු

පෙරේරා මහතා 1986 වසරේදී පද්ධති විශ්ලේෂණ නිලධාරියකු ලෙස ලංකා බැංකුවේ සේවයට බැඳුණි. මූලික බැංකුකරණයෙහි යෙදුම් පද්ධති වලට සම්බන්ධ වීමෙන් ඔහුගේ බැංකු වෘත්තිය ආරම්භ කරන ලද අතර බහු කාර්ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වීමෙන් ඔහුගේ පලපුරුද්ද වඩාත් සඵල කර ගන්නා ලදී. වසර 28 කට අධික කාලයක් බැංකුවේ වෘත්තීය අත්දැකීම් සහිතව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පුළුල් පරාසයන්ගේ අත්දැකීම් බහුලය.

වසර 1996- 1997 දක්වා කාල පරාසය තුළ ඔහු දකුණු අප්‍රිකාවේ ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුවෙහි සේවය කර ඇත.

තොරතුරු තාක්ෂණ ප්‍රධානි ලෙස ආයතනික කළමනාකාරිත්වයට පත්වීමට පෙර සහකාර අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ (යෙදුම් සම්පාදක) ලෙස සේවය කර ඇත.

විධායක කළමනාකාරිත්වය



ඩී එන් එල් ප්‍රනාන්දු මහතා
ප්‍රධාන විධායක නිලධාරී
ලංකා බැංකුව (යූ කේ) සමාගම



කේ ටී කරුණාරත්න මහතා
සහකාර මහා කළමනාකරු
උපකාරක සේවා



ඩී එම් එල් සී කුමාර මහතා
සහකාර මහා කළමනාකරු
ගිණුම්කරණ හා බදු



ඩබ් ජී ආරියරත්න මහතා
සහකාර මහා කළමනාකරු
ගනුදෙනුකාර සබඳතා



ජී එල් පී ජිනසෝම මහතා
සහකාර මහා කළමනාකරු
චෙන්නායි



ජී ඩී සිල්වා මහතා
සහකාර මහා කළමනාකරු
පුහුණු කිරීම් හා සංවර්ධනය



ඩබ් එම් එස් වනසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
අලෙවිකරණය



ඩී කේ එන් පියසෝම මහතා
සහකාර මහා කළමනාකරු
දකුණු පළාත



සී කේ ජයරත්න මිය
සහකාර මහා කළමනාකාරිණී
පිටකොටුව ශාඛාව



ටී පී ජී රණවීර මහතා
සාහකාරක මහා කළමනාකරු - මාලේ



ආර් එම් හපුතන්ත්‍රී මහතා
සහකාර මහා කළමනාකරු
විදේශීය ශාඛා



එච් එස් ජයවර්ධන මහතා
සහකාර මහා කළමනාකරු
බස්නාහිර පළාත-දකුණ



පී එම් ප්‍රේමදාස මහතා
සහකාර මහා කළමනාකරු
සබරගමුව පළාත



එම් ඒ සුමනරත්න මහතා
සහකාර මහා කළමනාකරු
වයඹ පළාත



ඩබ් සී කේ වික්‍රමාරච්චි මහතා
සහකාර මහා කළමනාකරු
ශාඛා ණය



ඊ එම් එස් කේ දංගම්පොල මිය
සහකාර මහා කළමනාකාරිණී
මධ්‍යම පළාත



ඩී එම් ජී සී දේවසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
වෙළඳ සේවා



ජේ එම් ඩී බී ජයසුන්දර මහතා
සහකාර මහා කළමනාකරු
විමර්ශන



සී අමරසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
ආයතනික සබඳතා



කේ පී ආනන්දනඩේසන් මහතා
සහකාර මහා කළමනාකරු
නැගෙනහිර පළාත



එච් එම් පී බී හේරත් මහතා
සහකාර මහා කළමනාකරු
උතුරු මැද පළාත



ඩබ් අයි හෙට්ටිහේවා මිය
සහකාර මහා කළමනාකාරිණී
මෙට්‍රොපොලිටන් ශාඛාව



එම් ටී එම් ජලාල්ඩීන් මහතා
සහකාර මහා කළමනාකරු
මානව සම්පත් මෙහෙයුම්



එම් ජේ පී සල්ගාදු මහතා
සහකාර මහා කළමනාකරු
පළාත් විකුණුම් කළමනාකරණය



ඩබ් ඒ් සී තිසේරා මහතා
සහකාර මහා කළමනාකරු
නිෂ්පාදන සහ සංවර්ධන බැංකු කටයුතු



ඩී එම් එල් බී දසනායක මහතා
සහකාර මහා කළමනාකරු
ආයතනික ණය



එස් එම් ඩබ් සමරකෝන් මහතා
සහකාර මහා කළමනාකරු
ජාත්‍යන්තර



ජේ එම් ඒ් ආරියරත්න මහතා
සහකාර මහා කළමනාකරු
ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ ව්‍යාපෘතිය



ආර් එම් ඩී වී ජයබාහු මහතා
සහකාර මහා කළමනාකරු
අයවැය, ක්‍රමෝපාය සැලසුම් සහ
කළමනාකරණ තොරතුරු සේවා



ජී එච් වික්‍රමසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
බීඕසී කාඩ්පත් මධ්‍යස්ථානය



ඒ් එස් දංගල්ල මහතා
සහකාර මහා කළමනාකරු
ණය විගණන



ජී ජී ජී තිසේරා මහතා
සහකාර මහා කළමනාකරු
භාණ්ඩාගාර



ජී ඒ ජයශාන්ත මහතා
සහකාර මහා කළමනාකරු
අවදානම් කළමනාකරණය



ආර් පී ඩී කේ රත්නසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
බස්නාහිර පළාත උතුර



එස් හේවාවිතාරණ මහතා
සහකාර මහා කළමනාකරු
ඌව පළාත



ඒ ද එස් පින්නදූවගේ මහතා
සහකාර මහා කළමනාකරු
අනුකූලතා



ටී එම් ටී තෙන්නනකෝන් මහතා
සහකාර මහා කළමනාකරු
උතුරු පළාත



බී එම් ප්‍රේමරත්න මහතා
සහකාර මහා කළමනාකරු
අක්වෙරළ බැංකුකරණය



ජේ ඒ ඒ ජයසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
තොරතුරු පද්ධති විගණන



ඩබ් එන් පී සුරවිමල මහතා
සහකාර මහා කළමනාකරු
ආපසු අයකර ගැනීම් ආයතනික



ජගත් කුරුඳුකුඹුර මහතා
සහය අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ
මෙහෙයුම්/තාක්ෂණ සහය



එම් ගුණසේකර මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිළධාරිනී
ආපසු අයකර ගැනීම්



ඩී කිතුල්ගොඩ මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිළධාරිනී
ජාත්‍යන්තර හා ආයෝජන බැංකුකරණය



ජී ජයසිංහ මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිළධාරිනී
ණය



අප සේවය සලසන සෑම ගනුදෙනුකරුවකුගේම ධනය වර්ධනය වන අයුරින් අපගේ මෙහෙයුම් හසුරුවමින් .....

මූල්‍ය සමාලෝචනය

රු. ට්‍රිලියන 1.2 ක පමණ මුළු වත්කම් සහ රු. බිලියන 127 ක වාර්ෂික ආදායමක් සහිත ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනයයි. සමූහයේ ලාභ සඳහා 2%ක දායකත්වයක් ලබා දෙන්නා වූ සහ සමූහයේ වත්කම්වලින් 3% ක් සංස්ථාපනය කරන්නා වූ පරිපාලිත සමාගම් 12ක් සහ ආශ්‍රිත සමාගම් පහක් විය සතු වේ. සමූහයේ කාර්යසාධනය පිළිබඳ ප්‍රධානතම නිර්ණායකය වනුයේ බැංකුව බැවින්, අන්‍යාකාරයෙන් සඳහන් කර ඇතොත් මිස, මෙම මූල්‍ය සමාලෝචනයෙහි අන්තර්ගත වනුයේ බැංකුවේ කාර්යසාධනය පිළිබඳවය.

16%

ආදායම් වර්ධනය

සිය ආදායම රු. බිලියන 127 දක්වා ඉහළ නංවාගනිමින් බැංකුව 2013 වසර තුළදී කැපී පෙනෙන ආදායම් වර්ධනයක් අත්කර ගන්නා ලදී.

රු. ට්‍රිලියන 1.2 ක පමණ මුළු වත්කම් සහ රු. බිලියන 127 ක වාර්ෂික ආදායමක් සහිත ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනයයි.

මූල්‍ය කාර්යසාධනයේ වැදගත් තොරතුරු

	2013	2012	වර්ධනය %	අංශයට අදාළතාව (වෙළඳපළ කොටස%)
වර්ධනය (රු. මිලියන)				
මුළු වත්කම්	1,193,581	1,048,221	13.9	20
ණය සහ අත්තිකාරම් (දළ)	755,385	714,847	5.7	22
තැන්පතු	843,236	703,569	19.8	20
ණය ගැනුම්	280,696	280,910	0.0	28
ඉපැයුම් (රු. මිලියන)				
මුළු ආදායම	127,464	110,138	15.7	21
ශුද්ධ පොළී ආදායම	37,143	35,321	5.2	19
මුළු මෙහෙයුම් ආදායම	49,024	49,783	(1.5)	17
ශුද්ධ මෙහෙයුම් ආදායම	42,101	43,879	(4.1)	15
මුළු මෙහෙයුම් වියදම්	23,682	20,870	13.5	17
බදු පෙර ලාභය	15,709	19,794	(20.6)	15
ආදායම් බදුවලින් පසු වර්ෂය සඳහා ලාභය	12,087	14,417	(16.2)	16
කාර්ය සාධන දර්ශක %				
ශුද්ධ පොළී ආන්තිකය	3.3	3.7	(0.4)	
මුළු ආදායමට පොළී නොවන ආදායම	9.9	13.7	(3.8)	
ණය අලාභ අනුපාතය	4.3	2.8	1.5	
පිරිවැයට අදායම් අනුපාතය	49.1	42.7	6.4	
ස්කන්ධ මත ලාභ	22.2	31.2	(9.0)	
වත්කම් මත ලාභ	1.4	2.1	(0.7)	

කාර්යසාධනය කෙරෙහි මෙහෙයුම් පරිසර බලපෑම්

බැංකුවේ ප්‍රධාන කාර්යසාධන දර්ශක කෙරෙහි බලපාන බාහිර ආර්ථික දර්ශක සහ එම හර සාධක 2013 වසරේදී අපගේ කාර්යසාධනය කෙරේ කෙසේ බලපෑවේදැයි පහත වගුවෙන් විස්තර කෙරේ.

ප්‍රධාන කාර්යසාධන දර්ශක	ප්‍රධාන කාර්යසාධන දර්ශක කෙරේ බලපාන ආර්ථික සාධක	2013 ආර්ථික සාධකය	2013 ආර්ථික සාධකයේ බලපෑම	2014 ආර්ථික සාධකය	2014 ආර්ථික සාධකයේ බලපෑම
ණය සහ අත්තිකාරම් වර්ධනය	ද.දේ. නිෂ්පාදිතයේ වර්ධනය	⬇	⬇	⬆	⬆
	පොළී අනුපාත	⬇	⬇	⬇	[1] ⬆
තැන්පතු වර්ධනය	පොළී අනුපාත	⬇	⬇	⬇	⬇
	උද්ධමනය	⬇	⬆	⬇	⬆
ශුද්ධ පොළී ආන්තිකය	පොළී අනුපාත	⬇	⬇	⬇	[2] ⬆
	ජංගම සහ ඉතුරු කිරීමේ ගිණුම් සමානුපාතය	⬇	⬇	⬇	⬇
	ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය	⬇	⬆	▬	▬
ගාස්තු සහ කොටස් ආදායමේ වර්ධනය	ආනයන	⬇	⬇	⬆	⬆
	අපනයන	⬆	⬆	⬆	⬆
	ප්‍රේෂණ	⬆	⬆	⬆	⬆
ණය හානි අනුපාතය	ආයතනික ඉපැයුම්	⬇	⬇	⬆	⬆
	රන් මිල	⬇	⬇	?	?
	අනෙකුත් සමපාර්ශ්වීය වටිනාකම	⬆	⬆	⬆	⬆
	උද්ධමනය (කො.පා.මි.ද.)	⬇	⬆	⬇	⬆
වෙළෙඳ ආදායමේ වර්ධනය	වෙළෙඳ ධාරිතා	⬆	⬆	⬆	⬆
	වෙළෙඳපොළ මිල වෙනස්වීම	⬆	⬆	⬆	⬆
මෙහෙයුම් වියදම්	උද්ධමනය (කො.පා.මි.ද.)	⬇	⬆	⬇	⬆
	විනිමය අනුපාතය (ඇ.ඩො. සාපේක්ෂව රු.)	⬆	⬇	⬆	⬇
ආයතනික බදු	සඵල බදු අනුපාතය	▬	▬	▬	▬
විදේශ මෙහෙයුම් පරිවර්තනය	විනිමය අනුපාතය (ඇ.ඩො. සාපේක්ෂව රු.)	⬆	[3] ⬆	⬆	[3] ⬆

⬆ ආර්ථික සාධකයක ඉහළයාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි/කාර්යසාධනය කෙරෙහි ධනාත්මක බලපෑමකි

⬇ ආර්ථික සාධකයක හීනවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි / කාර්යසාධනය කෙරෙහි අහිතකර බලපෑමකි

? අවිනිශ්චිතතාව පෙන්නුම් කරයි

▬ වෙනස්කමක් අපේක්ෂා නොකරන බව පෙන්නුම් කරයි.

සටහන

[1] පහළ අනුපාත හේතුවෙන් ඉහළ ඉල්ලුමක් අපේක්ෂා කරයි

[2] ශේෂ පත්‍රයේ ව්‍යුහය / සංයුතිය නිසාවෙනි

[3] විනිමය වාසිය

මුළු වත්කම්

අනුගාමී වසර දෙකක් සඳහා ට්‍රිලියනයක ශේෂයක් සහිත එකම දේශීය බැංකුව බවට පත්වෙමින් බැංකුවේ වත්කම් රු. ට්‍රිලියන 1.2 දක්වා 14% කින් වර්ධනය විය. වත්කම්හි වර්ධනය සඳහා මූලිකවම හේතු වූයේ ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කළ ණය සහ අයවිය යුතු දෑ, ණය සහ අයවිය යුතු දේවල්හි මුල්‍ය ආයෝජනය සහ පරිනතිය දක්වා රඳවා ගත යුතු ආයෝජන සහ ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම්හි වැඩිවීමයි.

ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කළ දළ ණය සහ අත්තිකාරම්


මුළු වත්කම්වලින් 63% ක් වන විශාලතම කොටස වනුයේ ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කළ දළ ණය සහ අත්තිකාරම් වේ. එය බැංකුවට එහි ප්‍රධානතම ආදායම් ප්‍රභවය සපයන අතර අප ගාස්තු සහ කොමිස් ආදායම් වුත්පන්න කරන්නා වූ අනෙකුත් නිපැයුම්වලට හරස් විකිණීම සඳහා අවස්ථා උදා කරයි. බැංකු ව්‍යාපාර කර්මාන්තයේ සමස්ත ණය සහ අත්තිකාරම් වලින් 22% ක් සඳහා වගකියමින් පුද්ගලික සහ රාජ්‍ය අංශය යන දෙකම සඳහා විශාලතම ණය සපයන්නා වනුයේ ලංකා බැංකුවයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රකාරව ඕනෑම දැනගතහැකි අලාභ සඳහා ගැලපුම් කිරීමෙන් පසුව සඳහන් කරනු ලැබ ඇති ශුද්ධ ණය සහ අත්තිකාරම් රු. බිලියන 725 ක් විය.

2012 වසරේදී රු. බිලියන 715 ක් වූ සිය දළ ණය කළඹ බැංකුව 2013 දී රු. බිලියන 755.4 දක්වා 6% කින් ඉහළ නංවා ගත් අතර එම වර්ධනය පුද්ගලික අංශය සහ රාජ්‍ය අංශය අතර සමව බෙදී ගොස් තිබිණි. පුද්ගලික අංශය සඳහා ප්‍රදානය කළ මුළු ණය රු. බිලියන 755.4 දක්වා රු. බිලියන 24.1 කින් හෙවත් 5%කින් වර්ධනය වූ අතර රජයට ණය ලබාදීමද රු. බිලියන 290.7 දක්වා රු. බිලියන 16.7 කින් හෙවත් 6% කින් වර්ධනය විය. අඩු වෙළෙඳපොළ ණය ඉල්ලූම සහ උකස් භාණ්ඩ සහ කල්බදු සඳහා අත්තිකාරම් ආදී සීෂ්‍රයෙන් වර්ධනය වන අංශ මත බැංකුව විසින්ම පනවා ගත් සීමාවන් හේතු කොට ගෙන පුද්ගලික අංශයේ ණය වර්ධනය පහළ මට්ටමක පැවතුණි. එසේම රජයට අයත් ව්‍යවසායන්හි වැඩි දියුණු වූ මූල්‍ය කාර්යසාධනය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ණය ආපසු ගෙවීම නිසාවෙන් රාජ්‍ය අංශයේ ණය වර්ධනය ද මධ්‍යස්ථව පැවතුණි. පාදක ආර්ථික තත්ත්වයන් දේශීයව හා ගෝලීයව වඩා යහපත් වෙමින් පවතින බැවින් 4 වන කාර්තුවේ දක්නට ලැබුණු ණය ඉල්ලූමේ ප්‍රවණතාව 2014 දක්වා පවතිනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු.

රු. බිලියන 465

පුද්ගලික අංශයට ණය දීම

පුද්ගලික අංශයේ ව්‍යාපාරයන්ට සහයෝගය දැක්වීමේදී බැංකුව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදී.




ගනුදෙනුකාර තැන්පතු

ධනයේ භාරකරුවා ලෙස, සිය ප්‍රධාන අරමුදල් ප්‍රභවය ලෙස ගනුදෙනුකරුවන්ගෙන් තැන්පතු එක්රැස් කිරීම මඟින් සහ සිය ගනුදෙනුකරුවන්ට ධනය නිර්මාණය කිරීම සඳහා ආයෝජන අවස්ථා සැපයීම මඟින් බැංකුව සිය ණය ලබාදීමේ ක්‍රියාකාරම් සඳහා මුදල් සම්පාදනය කරයි. ජංගම ගිණුම් සමඟින් වියදමේ විශාලතම සංරචකය වන ණය ගැනුම් පිරිවැය හැරුණු විට සියළු ගනුදෙනුකාර තැන්පතු මත බැංකුව පොළී පිරිවැය දරයි. 2012 වසරේ 70% හා සැසඳීමේදී 2013 වසරේ බැංකුවේ වගකීම් වලින් 74% ක් සමන්විත වූයේ තැන්පතු වලිනි. තැන්පතු සඳහා වෙළඳපොළ ප්‍රමුඛයා ලංකා බැංකුව වන අතර එය සතු වෙළඳපල කොටස 20% කි. විදේශ මුදල් තැන්පතු මුළු තැන්පතු වලින් 24% ක් වන ඉතිරි 76% දේශීය මුදල් තැන්පතු වේ.


2012 දී රු. බිලියන 693.4 ක් වූ මුළු ගනුදෙනුකාර තැන්පතු පදනම 2013 දී රු. බිලියන 842 දක්වා වර්ධනය වූ අතර ශක්තිමත් දේශීය වරමක් පිලිබිඹු කරමින්, කර්මාන්තයේ 15% ක් වූ වර්ධන අනුපාතිකය හා සැසඳීමේදී එය සුබදායී 21% වර්ධන අනුපාතිකයක් විය. මෙම වර්ධනය අත් කර ගනු ලැබුයේ තම ආයෝජන කළඹ ඵලදායෙහි මධ්‍ය කාලීන ස්ථාවරත්වය සඳහා ආයතනික තැන්පතුකරුවන් තම තැන්පතු ණය වෙළඳපල සාධනපත්‍ර කරා යොමු කළ පසුබිමක් මධ්‍යයේය.

බැංකුවේ තැන්පතු වර්ධනය කර්මාන්තයේ තැන්පතු වර්ධනයට වඩා ඉහළ නංවමින් 2013 දී තැන්පතු රාශිකරණ වැඩසටහන් ව්‍යාප්තිය ද මූර්ත ප්‍රතිඵල අත් කර දෙන ලදී. ජංගම සහ ඉතුරුකිරීමේ ගිණුම් සඳහා වර්ධන අනුපාතිකය හා සැසඳීමේදී කාලීන තැන්පතුවල වඩා ඉහළ වර්ධන අනුපාතිකයක් අප අඛණ්ඩව නිරීක්ෂණය කළෙමු. කාලීන තැන්පතු සංරචකය ඉතුරුම් සහ ඉල්ලූම් තැන්පතුවලට වඩා ඉහළ නංවමින් තැන්පතු සංයුතියේ කැපී පෙනෙන විස්ථාපනයක් සිදුව තිබේ. බැංකුවේ ලාභදායීත්වය මත අතිරේක තෙරපුමක් ඇති කරමින් මෙමඟින් බැංකුවට වඩා ඉහළ පොළී පිරිවැයක් දැරීමට සිදු ව තිබේ.

බැංකුව තවදුරටත් අනේවාසික විදේශ මුදල් තැන්පතුවල වෙළඳපල ප්‍රමුඛයා වේ.




අපගේ විදේශ මුදල් තැන්පතු ද, රු. බිලියන 205.2 ක් හෙවත් ඇ.ඩො. මිලියන 1,567 ක් දක්වා රු. බිලියන 21.1 කින් (ඇ.ඩො. මිලියන 161 කින්) හෙවත් 11% කින් වැඩි වුණු අතර ඒ සඳහා වැඩිම දායකත්වය සැපයුවේ සංක්‍රමණික සේවකයන්ය. සමස්ත ආයතනික කළමනාකාරිත්වය සහභාගි වූ සමායෝජිත ප්‍රයත්නයන් හරහා ඒ ඒ රටවල පැවැත්වූ ගනුදෙනුකාර රැස්වීම් සහ නියෝජිත රැස්වීම් ඇතුළු විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් වසර තුළදී දියත් කරන ලදී.



ණය ගැනුම් සහ ණය සුරැකුම්පත්

සිය ව්‍යාපාරික කටයුතු සඳහා මූල්‍ය සම්පාදනයටත් එකඟ වූ අනුපාත, ආපසු ගෙවීමේ කාලසීමා සහ අනෙකුත් නියම සහ කොන්දේසි අනුව සිය ප්‍රාග්ධන ව්‍යුහ ශක්තිමත් කිරීමටත් බැංකුව ණය වෙළඳපල සහ ආයතනික ණය දෙන්නන්ගෙන් අරමුදල් රැස් කරයි. ණය ගැනුම් සහ ණය සුරැකුම්පත්වලට අදාළව බැංකුව පොළී වියදම් දරන අතර ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මත දරන පොළී වියදම් සමඟින් ආදායම් ප්‍රකාශයේ එය පෙන්නුම් කරනු ලැබේ. බැංකුවේ මුළු වගකීම්වලින් 25% ක් සඳහා ණය සුරැකුම්පත් සහ බැංකුවේ අනෙකුත් ණයගැනුම් වග කිව යුතු අතර ඒ අතුරින් ණය සුරැකුම්පත් 2% ක්ද යටත් කාල ණය 2% ක් ද අනෙකුත් ණය ගැනුම් 21% ක් ද වේ.




අර්ධ වාර්ෂිකව 5.325% ක පොළී අනුපාතයක් සහිතව සහ වසර පහක පරිනතිය සහිත සිංගප්පූරු කොටස් වෙළඳපලේ ලැයිස්තුගත ජ්‍යෙෂ්ඨ සුරැකුම්පත් ණය මඟින් ලංකා බැංකුව ඇ. ඩො. මිලියන 500 ක් රැස් කර ගන්නා ලදී. UBS ආයතනය විසින් කළමනාකරණය කරන ලද ෆිච් ආයතනය BB ලෙස ශ්‍රේණිගත කළ මෙම නිකුතුව සඳහා බැංකුව මුලින්ම ප්‍රවේශ වූයේ ඇ. ඩො. මිලියන 300 ක් සඳහා වූවකි. එය 6.8 ගුනයකින් අධිදායක වීමෙන් පසුව ඇ. ඩො. මිලියන 500 ක බැඳුම්කර නිකුත් කරනලදී. ජාත්‍යන්තර ආයෝජකයන් සහ පුද්ගලික බැංකු යන දෙපාර්ශ්වයම මේ සඳහා දැක්වූ ශක්තිමත් ප්‍රතිචාරය සහ පුළුල් සහභාගිත්වය මඟින් ද අප දිරිගන්වනු ලැබීය. බැඳුම්කර මඟින් උපයාගත් මුදල් බැංකුවේ පොදු කාර්යය අරමුදල් අවශ්‍යතා සඳහා යොදා ගන්නා ලදී. ණයට ගත් අරමුදල් ඉහළ යාම සඳහා ප්‍රධාන හේතුව වූයේ මෙයයි.


කල් පිරෙන ණයකර ඉවත් කිරීම සඳහා අරමුදල් රැස් කිරීමටත් II වන ස්තරයේ ප්‍රාග්ධනය වැඩි දියුණු කරන අතර දිගුකාලීන යටිතල පහසුකම් මූල්‍යයනයේ අරමුදල් නොසිහුම පියවීම සඳහාත් ලංකා බැංකුව කොළඹ කොටස් වෙළඳපළ හරහා තවත් අළුත් ණයකර නිකුතුවක් ද නිම කරන ලදී. කොටස් නිකුතුව ආයෝජකයන් අතර පෙර නොවූ විරූ උනන්දුවක්

තවත් සාර්ථක බැඳුම්කර නිකුතුවක් බැංකුව විසින් අවසන් කරන ලදී.

ඇ.ඩො. 500 මිලියන



ජනිත කළ අතර ආරම්භක දිනයේම නිකුතුව පියවීමට බැංකුවට සිදු කරමින් එම දිනයේදීම මුළු ලංසු වටිනාකම රු. බිලියන 20 ඉක්මවා ගියේය. නිකුතුවේ මුල් වටිනාකම වූයේ රු. බිලියන 4 ක් වූ අතර අධිදායක වුවහොත් රු. බිලියන 8 දක්වා ප්‍රමාණය වැඩි කිරීමට ඉඩකඩ තබා ගන්නා ලදී. කෙසේ වෙතත්, ලැබුණු ලංසු වටිනාකම මුල් නිකුතුව වූ රු. බිලියන 4 මෙන් පස් ගුණයක් වූ අතර බහුතර ඉල්ලුම්පත් යොමු කොට තිබුණේ පස් අවුරුදු සහ දස අවුරුදු ස්ථාවර අනුපාත කාණ්ඩ සඳහාය. ලංසුවල එකතුව රු. බිලියන 11.6 ක් වූ අතර එය ලැබුණු අයදුම්පත්‍රවල මුළු වටිනාකමින් 50% කටත් වඩා වැඩි වීමකි. පෞද්ගලික



ණයකර පැතුරුම (රු. බිලියන)

ආයෝජකයන් පස් අවුරුදු ස්ථාවර කාණ්ඩය කෙරෙහි උනන්දුවක් දැක්වූ අතර දිගුකාලීන (දස අවුරුදු) ණයකර කෙරෙහි වැඩි උනන්දුවක් දැක්වූවන් අතර පෙරමුණේ සිටියේ රක්ෂණ සමාගම් සහ විශ්‍රාම වැටුප් අරමුදල් ය.

ශුද්ධ පොළී ආදායම

තැන්පතු සහ අනෙකුත් අරමුදල් මූලාශ්‍ර මත දැරෑ පොළී වියදම අඩු කිරීමෙන් පසු ණය සහ අත්තිකාරම් සහ ආයෝජනවලින් ඉපැයූ පොළිය ශුද්ධ පොළී ආදායම වේ. සාමාන්‍ය හරිත මූලික ණයදීමේ අනුපාතිකය (සා. හ. මූ. ණ. අ) බඳු මිනුම් දඬු ණය පොළී අනුපාත සහ සාමාන්‍ය හරිත තැන්පතු අනුපාතය බදු (සා. හ. තැ. ආ.) මිනුම් දඬු තැන්පතු පොළී අනුපාත බැංකුවේ ණය දීමේ අනුපාත සහ තැන්පතු අනුපාත කෙරෙහි ප්‍රධාන ලෙසට බලපායි. මූල්‍ය අංශයේ පවතින තරඟකාරිත්වයේ තීව්‍රතාවය විසින් බලපෑම් කරනු ලබන ගැලපීමෙහි කාලය ඉකුත්වීමක් තිබුණද, රටේ මූල්‍ය ප්‍රතිපත්තිය සා. හ. මූ. ණ. අනුපාතිකය සහ සා. හා. තැ. අනුපාතය කෙරේ බලපෑමක් ඇති කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව 2013 මැයි සහ ඔක්තෝබර් මාස වලදී ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනුම් අනුපාත සහ ප්‍රතිමිලදී ගැනීම් අනුපාත, පදනම් ලකුණු 20 කින් අඩු කළ අතර එය සා. හ. මූ. ණ. අනුපාතික සහ සා. හ. ගෙ. අනුපාතික සංචලනයේ පිලිබිඹු කරනු ලැබූ අතර එහි ප්‍රතිඵලය වූයේ ශුද්ධ පොළී ආදායම සඳහා හීනවන ආන්තිකයි. මහ බැංකුව 2013 ජූලි මාසයේදී වාණිජ බැංකුවල රුපියල් වගකීම් මත ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකයද 2% ත් 6%ත් දක්වා අඩු කළ අතර ඉහළ ඵලදා ක්‍රියාකාරකම් සඳහා මෙම අරමුදල් භාවිතා කිරීමට එමඟින් වාණිජ බැංකුවලට හැකි වූ බැවින් එය ආන්තික කෙරේ ධනාත්මක බලපෑමක් ඇති කරනලදී.


ලංකා බැංකුව සිය ශුද්ධ පොළී ආදායම (ශු. පො. ආ) 2012 පැවති රු. බිලියන 35.3 සිට 2013 දී රු. බිලියන 37.1 ක් දක්වා 5% කින් වර්ධනය කරගන්නා ලදී. මූලිකවම 2012 පැවති 3.7% සිට 2013 දී 3.3% දක්වා අඩු වූ ශුද්ධ පොළී ආන්තිකය හේතුවෙන් ශු. පොළී ආදායමේ වර්ධනය සීමිත විය. තැන්පතු සංයුතියේ ප්‍රධානතම කොටසක් වනුයේ කාලීන තැන්පතු බැවින් සහ එම වේගයෙන්ම ප්‍රතිමිල ගත කළ නොහැකි බැවින් පොළී ආන්තිකයේ තනුකකරණය සඳහා ප්‍රධාන හේතුව වූයේ පිල් ලකුණු පොළී අනුපාතිකයන්හි අඛණ්ඩ අඩුවීම සහ වත්කම් කඩිනමින් යටිකුරු ප්‍රතිමිලගත කිරීමයි. රුපියල් තැන්පතු මත හීන කරන ලද ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය මඟින් බලපෑම යම් දුරකට අඩු කරනු ලැබුවද ණය ධාරිතාවේ මධ්‍යස්ථ වර්ධනය සහ හීනවීමෙන් පැවති තැන්පතු සංකලනයේ ජංගම සහ ඉතුරු ගිණුම් සමානුපාතය සමඟින් තැන්පතු අනුපාතිකයකට අඩු ණය වාතාවරණය මඟින් නිර්මාණය කරන ලද අධි ද්‍රවශීලතාව ආන්තික පීඩනය තවදුරටත් අයහපත් කරන ලදී.

"ගාස්තු ආදායම් පදනම පුළුල් කරනු පිණිස බැංකුව ප්‍රධාන කාර්යාලයට සහ බස්නාහිර පළාතට දැඩිව සංකේන්ද්‍රණය වී තිබූ වෙළඳ මූල්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් අනෙකුත් පළාත් දක්වා ව්‍යාප්ත කරන ලදී."

ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම


ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම බැංකුවේ මුළු මෙහෙයුම් ආදායමින් 12% ක් සංස්ථාපනය කරන අතර රටේ ගනුදෙනුකාර බැංකුකරණ ධාරිතා සහ බැංකුකරණ සේවා සඳහා තරඟකාරී වාතාවරණයෙන් ජනනය කෙරේ. ගනුදෙනුකාර බැංකුකරණ ධාරිතා පැන නගිනුයේ ආදායමෙන් අඩකට වඩකිව යුතු වෙළඳ ආශ්‍රිත ගනුදෙනු සහ ඉතිරිය සඳහා වඩකිව යුතු ශාඛා බැංකු ගෙවීම් / ප්‍රේෂණ නිපැයුම් වලිනි. අපනයන අංශයේ වෙළඳාම ආශ්‍රිත ඉපැයුම් මුළු ප්‍රමාණයෙන් 44%කට ආසන්න බැවින් ආනයන පරිමා හීනවීම සහ අපනයන පරිමාවන්හි අඩු වර්ධනය හේතු කොටගෙන වසර තුළදී ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායමේ වර්ධනය සෘණ 1.4% ක් විය. වෙළඳ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලත් ආදායම ඌනනය වීම සඳහා එක් හේතුවක් වූයේ ලංකා බැංකුවට නිරාවරණය කිරීම අඩු කිරීමේ ක්‍රමයක් ලෙස බැංකුව හරහා බලශක්ති අපනයනය බිල්පත් ඌනනය කිරීමයි. කෙසේ වෙතත්, ආමුඛ ප්‍රේෂණවලින් ලත් ගාස්තු ආදායම වසර තුළදී රු. මිලියන 217.9 දක්වා 19% කින් වැඩි වුණි.

පිරිහී යන ආන්තිකය සඳහා හේතු වූයේ බැංකුවලින් එල්ලවූ තරඟකාරිත්වයේ තීව්‍රතාවය නිසා වන අතර එයද මෙම වැදගත් ආදායම් ප්‍රභවය කෙරේ බලපාන ලදී. බැංකුව විසින් හසුරුවනු ලබන වෙළඳ ධාරිතා කොටස ඉහළ නැංවීමට සහ තොරතුරු තාක්ෂණ පරිණාමනය හරහා ශාඛා බැංකු නිපැයුම් වැඩිදියුණු කිරීම පිණිස ආයතනික සහ ශාඛා බැංකු නිපැයුම් යන දෙඅංශයෙහිම ඉලක්කගත ප්‍රයත්න දරනු



ලැබේ. ගාස්තු ආදායම් පදනම පුළුල් කරනු පිණිස බැංකුව ප්‍රධාන කාර්යාලයට හා බස්නාහිර පළාතට දැඩිව සංකේන්ද්‍රණය වී තිබූ වෙළඳ මූල්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් අනෙකුත් පළාත් දක්වා ව්‍යාප්ත කරන ලදී.


අප අත ගනුදෙනුකාර සබඳතා ශක්තිමත් කරමින් ශාඛා බැංකු කටයුතු සඳහා අතරමැදි වෙළඳපල වෙතට අපගේ ප්‍රවේශය පුළුල් කිරීම පිණිස මෙකී නිෂ්පාදන හරස් විකිණීම කෙරේ අවධානය යොමුකරන බැවින් මෙම මූලාරම්භයන් 2014 වසරේදී ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම වර්ධනය වීමට හේතුකාරක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.



වෙළඳ කටයුතුවලින් ශුද්ධ ලාභ

වෙළඳ කටයුතුවලින් ලත් ශුද්ධ ලාභය විදේශ විනිමය විකිණීමෙන් ලත් ආදායමෙන් සහ රජයේ ණය ආයතනික ණය සහ ස්කන්ධ ඇතුළුව මූල්‍ය සාධනපත්‍ර මිලයට ගැනීමෙන් සහ විකිණීමෙන් ලත් ලාභවලින් සමන්විත වේ. ඉපැයුම් සංයුතිය සැලකිය යුතු ලෙස විචල්‍ය විය හැකි වුවද වඩාත් සුවිශේෂී ඉපැයුම් ව්‍යුත්පන්න වනුයේ වෙළඳ පරිමාණ සහ විනිමය අනුපාතයේ වෙනස් වන සුළු බව මත මූලිකවම රඳා පවතින විදේශ විනිමය මිලදී ගැනීමෙන් සහ විකිණීමෙනි. අඩු වෙළඳ ධාරිතා සහ විදේශ විනිමය අනුපාතිකයේ ඉහළ මට්ටමක ස්ථාවරභාවය වත්කම් තක්සේරු පද්ධතියේ ලාභ සැලකිය යුතු ලෙස හීනකිරීම හේතුවෙන් විදේශ විනිමයෙන් ලත් ආදායම පහත වැටුණද වෙළඳ කටයුතුවලින් 83% ක් සමන්විත වූයේ එම ඉපැයුම්වලිනි.

පොළී අනුපාතයේ පහත වැටීම හා ඵලදා වක්‍රයේ උපයෝජනය හේතුවෙන් සුරැකුම්පත් වෙළඳාමෙන් ලැබූ ලාභය පසුගිය වසරට වඩා රු. මිලියන 764 කින් වැඩි වුණි. ප්‍රාග්ධන වෙළඳපල කාර්යසාධනයේ නිශ්චලනයක් පැවති හෙයින් බැංකුවේ වෙළඳ ස්කන්ධ කළඹෙහි වෙළඳපල වටිනාකම පහත වැටුණි.



විනිමය අනුපාතික
(ඇ. ඩො. 1 කට සමාන රුපියල්)

මේ වසරේ උකස් අත්තිකාරම් වලින් ජනිත සමස්ත හානිකරණයෙන් 29% ක් හටගත්තේ උකස් කළඹ සඳහා ඇපය වූ රන් මිලෙහි පහළ වැටුණු වටිනාකම හේතුවෙනි.


මුළු මෙහෙයුම් ආදායම

මුළු මෙහෙයුම් ආදායම රු. බිලියන 49 ක් වූ අතර එය පසුගිය වසරට වඩා 1% ක සුළු අඩු වීමකි. මේ සඳහා මූලිකවම හේතුවූයේ පසුගිය වසරේ විදේශ විනිමයෙන් වාර්තා කළ අසාමාන්‍ය ඉහළ ලාභ නිසා මෙන්ම ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායමට බලපෑ 2013 වසරේ අඩු වෙළඳ ධාරිතාව හේතු කොටගෙනය. එබැවින්, මෙහෙයුම් ආදායමේ වැඩිවීම මූලිකවම සිදුවූයේ පෙර වසරට වඩා 5%කින් වැඩි වූ ශුද්ධ පොළී ආදායමේ වර්ධනය නිසාවෙනි. මුළු මෙහෙයුම් ආදායමට 76% ක් දායක කරන්නා වූ ශුද්ධ පොළී ආදායම ඒ සඳහා වැදගත්ම භූමිකාව ඉටු කරයි.


හානිකරණ සඳහා වෙන්කිරීම්

හානිකරන වැය පැන නගිනුයේ භාවිතයේ පවතින මිනුම් දඬු සහ අනෙකුත් තක්සේරු කිරීම් ක්‍රම භාවිතා කරමින් මූල්‍ය වත්කම් තක්සේරු කිරීම තුළිණි. ණය සහ අත්තිකාරම් වලට තබා ඇති ඇප තක්සේරු කිරීම සහ වටිනාකම ලාබා ගැනීමට ඇති ආයතනයේ හැකියාව අඟය කිරීම මෙම අනෙකුත් තක්සේරු කිරීමේ ක්‍රමවේද වලට ඇතුළත් වේ. ණය සහ අත්තිකාරම් විශාලතම වත්කම් පන්තිය වන බැවින්, ආපසු ගෙවීමට ගනුදෙනුකරුට ඇති හැකියාවේ වෙනස්කම් නිසාවෙන් පැන නගින හානිකරණ වැය එම පිරිවැයෙහි වඩාත්ම වැදගත් සංරචකය සකසන අතර ඉන්පසු ඒවා, පාදක ඇපයේ තක්සේරු වටිනාකමට හිලව් කෙරේ.

මූලිකවම, බැංකුකරණ අංශය අත්දකිනු ලැබූ, ණය මුදල් වල හීනවෙමින් පැවති වත්කම් ගුණාත්වය හේතු කොට ගෙන 2013 වසරේදී හානිකරණ ගාස්තු පසුගිය වසරට වඩා 17% කින් හෙවත් රු. මිලියන 1,018 කින් වැඩි වුණි. මේ වසරේ උකස් අත්තිකාරම් වලින් ජනිත සමස්ත හානිකරණයෙන් 29% ක් හටගත්තේ උකස් කළඹ සඳහා ඇපය වූ රන් මිලෙහි පහළ වැටුණු වටිනාකම හේතුවෙනි. උකස් අත්තිකාරම් බැංකුවට වැදගත් ශාඛා බැංකුකරණ නිෂ්පාදනයක් වේ. ආදායම් ප්‍රකාශයට වැයබරක් වූ උකස් අත්තිකාරම් සඳහා මුළු හානිකරණය රු. මිලියන 2,033 කි. එය 382% ක හෙවත් රු. මිලියන 1,611 ක වැඩිවීමකි.



මුළු මෙහෙයුම් ආදායම
(රු. බිලියන)




හානිකරණ ගාස්තු සංයුතිය
(රු. බිලියන)

පවතින වෙළඳපොල තත්ත්වයන්, හීනවූ වෙළඳ ධාරිතා සහ කෘෂිකර්මය හා ඒ ආශ්‍රිත වටිනාකම් දාමය කෙරේ බලපෑ අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් සමස්ත අත්තිකාරම්ද වැඩි වුණි. ආර්ථික මූලධර්ම වැඩි දියුණු වීමත් සමඟින් රන් මිල ස්ථාවර වීමට ඉඩ ඇති බැවින් 2013 වසරේ අසාමාන්‍ය හානිකරණය 2014 දී ස්ථාවර වනු ඇතැයි අපි බලාපොරොත්තු වන්නෙමු. කේවල හානිකරණයේ අඩුවීම සඳහා හේතුකාරක වූයේ වැදගත් කේවල ගනුදෙනුකරුවන් ඇගයීමේ සීමාව වෙනස් කිරීමයි.

මෙහෙයුම් වියදම්

පිරිස් වියදම සහ ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, වෘත්තීය ගාස්තු, අධ්‍යක්ෂ ගාස්තු සහ විගණක පාරිශ්‍රමිකය ආදියෙන් මෙහෙයුම් ගාස්තු සමන්විත වේ. බැංකුවේ මෙහෙයුම් වියදම්වලින් 62% ක් අයත්වන පිරිස් වියදම් 2012 පැවති රු. බිලියන 12.9 සිට 2013 දී රු. බිලියන 14.7 දක්වා 13% කින් වැඩි වුණි. සාමූහික නිපුණතා සැලකිය යුතු තරඟකාරී වාසියක් සපයන බැවින් කුසලතා සහ හැකියා සහිත අත්දැකීම් සපිරි සේවකයන් රඳවා ගැනීම සඳහා අවශ්‍ය නව සාමූහික ගිවිසුම, වැටුප් නොවන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ නිගමන, වසර තුළදී නවක සේවකයන් 1706 දෙනෙකු බඳවා ගැනීම, වාර්ෂික වැටුප් වර්ධක සහ උසස්වීම් පිරිස් පිරිවැයේ වැඩිවීමට දායක විය.

අනෙකුත් මෙහෙයුම් වියදම් රු. බිලියන 7.9 සිට රු. බිලියන 9 දක්වා 18% කින් වැඩි වූ අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ තැන්පතු රක්ෂණ වාරිකය වැඩි වීම, ස්ථාවර වත්කම් පවත්වාගෙන යාම "BOC මෙගා වාසි" තැන්පතු රාශිකරණ වැඩසටහනට අදාළ අලෙවිකරණ වියදම් ඉහළයාම සහ නව භෝග රක්ෂණ බද්දක් සංස්ථාපනය කිරීම නිසාවෙනි. 2010 අංක 05 දරණ බැංකු පනතේ නියෝග අනුව 2010 ඔක්තෝබර් 1 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අත්‍යාසන්න පූර්වගාමී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය ප්‍රකාරව යෝග්‍යතා තැන්පතු වගකීම්වලින් 0.1% ක් හෝ 0.125% ක් බැංකුව මඟින් ගෙවීම අවශ්‍ය වන්නා වූ තැන්පතු රක්ෂණය නියාමන



"නිපුණතා සහ දක්ෂතා වලින් සපිරි සේවකයින් විසින් සපයන සාමූහික කුසලතා සැලකිය යුතු තරඟකාරී වාසියක් ලබා දෙයි."

ගෙවීමකි. ශාඛා ජාලය පුළුල් කිරීම සහ නවතම තාක්ෂණික දැනුම් හැකියාව ශාඛාවන්ට ලබාදීම ද මෙහෙයුම් වියදම් ඉහළ යාමට දායක විය.


බදු පෙර මෙහෙයුම් ලාභය

බදු පෙර මෙහෙයුම් ලාභය සියළු වියදම්වලින් තොරව සහ ව්‍යවස්ථාපිත බදු ගාස්තු අඩුකිරීමට පෙර බැංකුවේ ලාභදායිත්වය ගණනය කරයි. 2013 බදු පෙර ලාභය වූ රු. බිලියන 15.7 රන් මිලෙහි අසාමාන්‍ය වෙනස්වනසුළු බව සඳහා ආරක්ෂාවක් වන බැවින් සහ වෙනස්වන සුළු ආදායම් ප්‍රභවයන්ගේ අනපේක්ෂිත වාසි බැහැර කරන බැවින්, වර්ධනය කරගත හැකි තිරසර ලාභයක් වේ. විනිමය අනුපාතිකවල වෙනස්වන සුළු බව හේතු කොට ගෙන 2012 දී රු. බිලියන 5.8 ක් දායක කළ විදේශ විනිමය ලාභ 2013 වසර තුළදී විනිමය අනුපාත ස්ථාවර වූ බැවින් අඩුවීමක් සිදු විය. එය ආදායම් පිරිවැය වැඩිවීමට හේතුවක් වූ අතර නව බඳවා ගැනීම් බැංකුවේ ඵලදායී වත්කම් වැඩිකර ගැනීම උදෙසා යොදා ගැනීම අපගේ අරමුණ වේ. 2013 වසරේදී බැංකුවේ ආයතනික බදු අනුපාතයේ වෙනසක් සිදුනොවූ අතර එය 28% විය.


ශුද්ධ පොළී ආන්තිකය (ශු. පො. ආ.)

ශුද්ධ පොළී ආන්තිකය යනු ණය නිෂ්පාදිත සහ ආයෝජන මත උපයන ලද භරිත සාමාන්‍ය පොළී අනුපාතිකය සහ තැන්පතු සහ අනෙකුත් අරමුදල් මත ගෙවනු ලැබූ භරිත සාමාන්‍ය පොළී අනුපාතිකය අතර ලාභ ආන්තිකය වේ. ස. හ. මු. ණ. අනුපාතිකය සහ සා. හ. තැ. අනුපාතිකය බදු මිනුම් දඬු ණයදීමේ අනුපාතික ශුද්ධ පොළී ආන්තිකයෙහි විචල්‍යතා ඇති කරන වැදගත් සාධක වේ. 2013 දී හීන වූ ආන්තික මත ඇති වූ පීඩනය පහත වැටෙමින් පැවැති පොළී අනුපාත ප්‍රවණතාව මඟින් ඉහළ නංවන ලදී. ඊට අමතරව, තැන්පතුවල ජංගම සහ ඉතිරිකිරීමේ ගිණුම් සමානුපාතය පහත වැටීමද ශු. පො. ආන්තිකය අඩු වීමට දායක විය.


ශු. පො. ආන්තිකය මත පීඩනය 2014 තුළදීත් දිගටම පවතිනු ඇතැයි අප අපේක්ෂා කරන හෙයින්, බැංකුවේ ලාභදායිත්වය ඉහළ නැංවීම පිණිස වර්ධනය සහ අනෙකුත් ආදායම් මූලාශ්‍ර කෙරේ විශේෂ අවධානය යොමු කිරීමට අප දිගින් දිගට ම කටයුතු කරන්නෙමු. ශුද්ධ පොළී ආන්තිකයේ අඩුවීම සඳහා හේතුව _ශුද්ධ පොළී ආදායම_ යන කොටස යටතේ පැහැදිළි කරනු ලැබ ඇත.



බදු පෙර ලාභය
(රු. බිලියන)



ශුද්ධ පොළී
ආන්තිකය
(%)



අනෙකුත් ණය සංයුතියට
සාපේක්ෂව
උකස් ණය (%)

● උකස් කළඹ
● අනෙකුත් ණය

මුළු ආදායමට පොළී නොවන ආදායම


මුළු ආදායමට පොළී නොවන ආදායම ගනුදෙනු බැංකුකරණ ආදායම, ණය සහ ස්කන්ධ සුරැකුම් වාසි සහ විදේශ විනිමය වෙළෙඳාම ආදී ණයදීම් නොවන ක්‍රියාකාරකම් වලින් (එනම් සදාතන නොවන බැංකු මෙහෙයුම්) උපයනු ලබන ආදායමේ සමානුපාතය නියෝජනය කරයි. මෙම වාර්තාවේ සාකච්ඡා කර ඇති හේතු නිසා සිදුව ඇති අනෙකුත් ආදායම ඌනනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම අනුපාතය 2012 දී පැවැති 14% සිට 2013 දී 10% දක්වා පහත වැටී තිබේ. මෙම ඇතැම් ආදායම් මූලාශ්‍ර ණය සහ අත්තිකාරම්හි වර්ධනය මත රඳා පවතින අතර අනෙකුත් මූලාශ්‍ර ස්වභාවයෙන්ම ඉක්මනින් වෙනස්වන සුළු ප්‍රවණතාවක් සහිත විනිමය අනුපාත සහ සුරැකුම්පත් මිල සංචලන සහ බාහිර වෙළඳ ධාරිතා ආදිය මත රඳා පැවැතීමට ඉඩ ඇත.

ණය හානි අනුපාතය

ණය හානි අනුපාතය සාමාන්‍ය ණය සහ අත්තිකාරම් ශේෂයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබන ණය හානිකරණ ගාස්තු නිරූපණය කරන අතර බැංකුවේ ණය ආපසු ගෙවීමට ගනුදෙනුකරුගේ නොහැකියාව නිසා බැංකුවට සිදුවන අලාභය පෙන්නුම් කරයි. රටේ ආර්ථික වර්ධනය සඳහා ණය හානි අනුපාතයට බලපෑමක් ඇති කරනු ලබන අතර සුරැකුම් වල අගය අඩුවීම කෙරෙහිද බලපානු ලබයි. පහත වැටෙමින් පැවැති වත්කම් ගුණත්වයේ ප්‍රතිඵලයක් ලෙස හානිකරණය සඳහා ප්‍රතිපාදනයන්හි වැඩිවීම නිසාවෙන් ණය හානි අනුපාතය සැලකිය යුතු ලෙස ඉහළ නැංවුණි. වාර හෝ හදිසි ප්‍රාග්ධන අවශ්‍යතා පියවීමට රත්‍රන් මත සම්ප්‍රදායිකව විශ්වාසය තබන පුද්ගලයන්ගේ, ව්‍යවසායකයන්ගේ සහ ගොවීන්ගේ මූල්‍ය අන්තර්හරණය සඳහා මග පාදන බැවින් 2012 වසරේදී ණය සහ අත්තිකාරම්වලින් 20% ක් සඳහා වගකිව යුතු බැංකුවේ උකස් කළඹ සඳහා ඇප ලෙස තබනුයේ රන් බැවින් 2013 දී රන් මිල අනපේක්ෂිතව පහත වැටීමද මෙම වැඩිවීම සඳහා දායක විය. බැංකුව මේ වන විට සිය උකස් ණය කළඹ එහි මුළු ණය සහ අත්තිකාරම්වලින් 17% දක්වා අඩු කර ඇති අතර ණය හානි අනුපාතය 2014 දී වඩා යහපත් වනු ඇතැයි අපේක්ෂා කරයි.

සාමාන්‍ය ස්කන්ධ මත ප්‍රතිලාභ

කොටස්කරුවන්ගේ අරමුදල්වලින් ප්‍රතිශතයක් ලෙස බැංකුව විසින් ජනනය කරනු ලැබූ ප්‍රතිලාභ සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභයෙන් ගණනය කරයි. ඉහත සඳහන් කළ හේතු නිසා ලාභදායිත්වය අඩුවීම සහ වර්ෂය තුළදී කොටස්කරුවන්ගේ අරමුදල් වැඩිවීම නිසාවෙන් මෙම වසර සඳහා සාමාන්‍ය ස්කන්ධ මත ප්‍රතිලාභය 22% ක් වූ අතර එය 2012 වසර හා සැසඳීමේදී අවනතියක් පෙන්නුම් කරයි. කර්මාන්තයේ ප්‍රතිමාන හා සැසඳීමේදී වත්මන් සාමාන්‍ය ස්කන්ධ මත ප්‍රතිලාභය තරඟකාරී බව බැංකුව විශ්වාස කරන අතර සිය වත්මන් සාමාන්‍ය ස්කන්ධ මත ප්‍රතිලාභ මට්ටම 2014 දක්වා අඛණ්ඩව පවත්වා ගැනීම බැංකුවේ සැලසුම අවධාරණය කරයි.




සාමාන්‍ය ස්කන්ධය මත
ප්‍රතිලාභය
(%)

ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් මෙන්ම දේශීය ශ්‍රේණිගත කිරීම් යන දෙකම පසුගිය වසර දෙක සඳහා බලපෑමකින් තොරව පවත්වාගත් බැංකුවේ ණය ශ්‍රේණිගත කිරීම මේ සඳහා සාක්ෂි දරයි.

සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ


සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභයෙන් ගණනය කරනුයේ ආදායම් උත්පාදනයේදී බැංකු විසින් වත්කම් කෙතරම් කාර්යක්ෂමව උපයෝජනය කර ඇත්ද යන්නයි. වත්කම් පදනමේ සැලකිය යුතු වර්ධනය සහ මෙහෙයුම් ආදායමේ පහත වැටීම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ 1.4% දක්වා පහත වැටුණි.



සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (%)

ආදායමට පිරිවැය

ආදායමට පිරිවැය අනුපාතයෙන් කාලසීමාව සඳහා මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් පිරිවැය ප්‍රකාශ කෙරේ. පිරිවැය වර්ධනයට වඩා ආදායම් වර්ධනය සමඟින් ඉහළ යන ව්‍යාපාරික ධාරිතාවයට මුහුණ




ආදායමට පිරිවැය අනුපාතය (%)

දීමට බැංකුවේ මෙහෙයුම් ධාරිතාව ව්‍යාප්තිය හේතුවෙන් මෙම අනුපාතය 49.1% දක්වා පෙර වසරට වඩා 6.4% කින් වැඩි විය. මෙම අනුපාතය කර්මාන්තය තුළ තරඟකාරී වන අතර මෙම මට්ටම 2014 දක්වා ද අඛණ්ඩව පවතිනු ඇතැයි බැංකුව අපේක්ෂා කරයි.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව ණය සහ අත්තිකාරම් සහ සුරැකුම්පත්හි ආයෝජන ආදිය අන්තර්ගත සිය අවදානම් හරිත නිරාවරණයන්ට සාපේක්ෂව බැංකුවේ ප්‍රාග්ධනය පිළිබඳ මිනුමකි. බැංකුව විසින් උපකල්පනය කරනු ලබන අවදානම් දරා සිටීමට බැංකුවට ඇති හැකියාවේ මිනුමක් ලෙස මෙම අනුපාතය භාවිතා කරනු ලබයි. 12% ක් වන බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපතය මහ බැංකුවේ අවම අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමක පවතී. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ ඉහළ යමින් පැවැති වත්කම් වර්ධනය නිසාවෙන් මෙම අනුපාතය හීන වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර තිබේ. තම ස්ථර 1 හි ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව බැංකුව අවබෝධයෙන් සිටින අතර තීරණාත්මකව වැදගත් මෙම අනුපාතය වැඩි දියුණු කිරීම පිණිස ගත හැකි විකල්ප ගණනාවක් පිළිබඳව කටයුතු කරමින් සිටී.




මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%)

නුඛුන්වත්කම

බැංකුව අතිශයින්ම නුඛුන්වත් හෙයින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ගෙවීමට සිදුවන කොටිකාලීන සහ දිගුකාලීන බැඳීම් සඳහා මුදල් සම්පාදනයේදී සංරෝධක නොපවතී. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් මෙන්ම දේශීය ශ්‍රේණිගත කිරීම් යන දෙකම පසුගිය වසර දෙක සඳහා බලපෑමකින් තොරව පවත්වා ගත් බැංකුවේ ණය ශ්‍රේණිගත කිරීම මේ සඳහා සාක්ෂි දරයි. කර්මාන්තයට සාපේක්ෂව බැංකුවට සැලකිය යුතු මට්ටමක ඉහළ වත්කම් පදනමක් පවතින අතර සිය වගකීම් කැපී පෙනෙන ලෙස රු. බිලියන 57.7 කින් ඉක්මවා යයි.

ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය

ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතයෙන් අදහස් වනුයේ ඕනෑම මූල්‍ය ආයතනයක් සංචිත ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය කරනු ලබන මුදල් සහ අනෙක් කොටිකාලීන සුරැකුම්පත් ආදී ද්‍රවශීලතා වත්කම් ප්‍රමාණයයි.



ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (%)

"අපගේ කාර්යසාධනය වැඩි දියුණු කරගත හැකි අංශ පිළිබඳව විස්තරාත්මක අගය කිරීමක් සිදු කර ඇති අතර එය ඉතා කෙටි කාල සීමාවක් තුළ ළඟා කරගත හැකි බව අපගේ විශ්වාසයයි."

වර්ෂය සඳහා බැංකුවේ දේශීය ද්‍රවශීල වත්කම් අනුපාතය 27.7% ක් වූ අතර අක්වෙරළ ද්‍රවශීල වත්කම් අනුපාතය 31.4% විය. එම අනුපාතයන් දෙකම මහ බැංකුවෙන් නිර්දේශිත මිනුම් ලකුණු වන 20% ඉක්මවා යාමකි. වර්ෂය තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් බැංකුව පවත්වාගෙන ගොස් තිබේ. තැන්පතු ඉහළයාම සහ 2013 අත් විඳි මන්දගාමී ණය වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ ද්‍රවශීලතා අනුපාතය ඉහළ ගියේය. ද්‍රවශීලතාව හා අදාළව වඩා ඉහළ අනුපාත යහපත් වුවද, එම ඉහළ අනුපාත සාමාන්‍යයෙන් පවත්වාගෙන යනු ලබනුයේ බැංකුවේ ලාභදායිත්වයේ ආවස්ථික පිරිවැයකිනි.

ඉදිරි ගමන් මග

ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික දේශීය බැංකුව වීම පිණිස තම ශක්තිමත් දේශීය වරාය, අද්විතීය ජාල, සවිමත් දැනුම් පදනම සහ ජාත්‍යන්තර ආයෝජනයන් අතර පිළිගැන්ම උපරිම වාසිය සඳහා යොදාගනිමින් ලංකා බැංකුව සිය වර්ධන අභිලාෂයන් නොනැවත ඉදිරියට පවත්වා ගනු ඇත. අපේ ශක්තීන් උපරිම වාසිය සඳහා යොදා ගනිමින් අපගේ කාර්යසාධනය වැඩි දියුණු කළ හැකි ක්ෂේත්‍ර අප විස්තරාත්මකව තක්සේරු කර ඇති අතර සාපේක්ෂව කෙටි කාල රාමුවක් තුළ එය සාක්ෂාත් කර ගැනීමට හැකි වේ යැයි අපි විශ්වාස කරන්නෙමු.


2014 සඳහා උපාය මාර්ගික ප්‍රමුඛතා	2012 %	2013 %	2014 %
ණය සහ අත්තිකාරම් වර්ධනය ඉලක්ක කිරීම : එය අපේක්ෂා සහගත සේ පෙනී යාමට ඉඩ තිබුණද, ප්‍රකාශිත ප්‍රතිඵල සපුරා ගැනීමේ අපේ අතීත වාර්තාව දෙස බැලීමේදී එය සපුරා ගත හැකි බව අපි විශ්වාස කරන්නෙමු. රට තුළ මෙන්ම විදේශයන්හි වර්ධන අවස්ථා ඇති අතර ඇප කැපව සිටින ප්‍රතිඵල අත් කර ගැනීම පිණිස කරුණු ගවේෂණය කිරීමට හා කාලය හා ශ්‍රමය වැය කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු. 4 වන කාර්තුවේදී පෙර පැවති වර්ධන ගමන්පථයට නැවත පිවිසෙන රටේ ආර්ථික දර්ශක හිතකර ආර්ථික වාතාවරණයක් නිර්මාණය කරනු ඇති අතර මෙම පුරෝකථනයේදී එයද සැලකිල්ලට ගනු ලැබ ඇත.	28	6	13
තැන්පතු පදනමෙහි වර්ධනය සපුරා ගැනීම : බැංකුවේ වර්ධනය සඳහා අවශ්‍ය තැන්පතු පදනම ඉහළ නැංවීම කෙරෙහි අපගේ අඛණ්ඩ අවධානය යොමුවනු ඇත. වත්මනෙහි බැංකුව ඉහළ ද්‍රවශීලතාවයක් සහිත බැවින් ණය සහ අත්තිකාරම් සඳහා වැඩිවීමේ අනුපාතය වර්ධන වේගයට වඩා අඩුය.	17	21	10
ගාස්තු සහ කොමිස් පාදක ආදායම : ගනුදෙනු බැංකුකරණ නිෂ්පාදිතවලින් ගාස්තු සහ කොමිස් පාදක ආදායම් වර්ධනය සඳහා බලය ලබා දීමේදී හරස් විකුණුම් අවස්ථා උපරිම කිරීම පිණිස සිය පෘථුල ගනුදෙනුකාර පදනම බැංකුව ප්‍රයෝජනයට ගනු ඇත.	10	(12)	16
මෙහෙයුම් විශිෂ්ඨත්වය මත ඉලක්ගත වීම තුළින් ආදායමට පිරිවැය අනුපාතය අඩු කිරීම : බැංකුවේ තොරතුරු තාක්ෂණ පරිණාමනය එහි ප්‍රසාරිත වැඩ ප්‍රමාණය ඉටුකිරීමට හැකියාව ලබා දේ යැයි අපේක්ෂා කරනු ලබන අතර මධ්‍යකාලීනව ආදායමට පිරිවැය අනුපාතය අඩු කරනු ඇත. ශාඛා 151ක ක්‍රියාත්මක කළ එස් 5 සංකල්පය 2014 වසරෙදී සමස්ත ජාලයම ආවරණය කරන අතර බැංකුවේ ඵලදායිත්වය සැලකිය යුතු ලෙස ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම නවක සේවකයන්ගේ නිපුණතා වැඩි දියුණු කරනු ලැබීමත් සමඟින් ඔවුන්ද ආදායම් උත්පාදනය කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.	43	49	49
බැංකුවේ ප්‍රාග්ධන ව්‍යුහය වැඩි දියුණු කිරීම : බැංකුවේ ප්‍රාග්ධන ව්‍යුහය වැඩි දියුණු කිරීම සඳහා විකල්ප සොයා බැලීම පිණිස මුදල් අමාත්‍යාංශය සමඟ අපගේ සංවාදය අප අඛණ්ඩව පවත්වාගෙන යන්නෙමු. 2015 දී ක්‍රියාත්මක කිරීමට නියමිත බාසල් පදනම 111 ක්‍රියාව නැංවීම මඟින් අවශ්‍ය කරනු ලබන පරිදි බැංකුවේ වර්ධනය සහ වෙනත් කවර හෝ ප්‍රාග්ධන අවශ්‍යතාවක් සපුරාලීම පිණිස අභ්‍යන්තර ප්‍රාග්ධනය උත්පාදනය කිරීම සඳහා බැංකුව ස්වයංපූරිත බවට වඟ බලා ගනු පිණිස ප්‍රාග්ධන ආවර්ධන සැලැස්ම ප්‍රකාරව ප්‍රමාණවත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවක් බැංකුව පවත්වාගෙන යනු ඇත.	11.4	12.1	12

සමූහයේ ආකෘතිය

ලංකා බැංකුව සතුව පරිපාලිත සමාගම් දොළහක් සහ ආශ්‍රිත සමාගම් පහක් ඇති අතර එම සමාගම් විසින් මූල්‍ය සේවා, දේපළ සංවර්ධනය, කළමනාකරණ සහ උපකාරක සේවා, සංචාරක නියෝජිත කාර්යයන්, හෝටල් සේවා සැපයීම, නිවාඩු නිකේතන, රක්ෂණ සේවා පහසුකම්, ජල විදුලි උත්පාදනය සහ වත්කම් කළමනාකරණය යන විවිධ සේවා සමූහයක් සපයනු ලැබේ. බැංකුව විසින් සමූහයේ බදු පෙර ලාභයෙන් 98% කට දායකත්වය සපයනු ලැබේ.මෙම පරිපාලිත සමාගම් ඒ සඳහා වෙන් වූ අධ්‍යක්ෂ මණ්ඩල විසින් කළමනාකරණය කරනු ලබන අතර එම අධ්‍යක්ෂ මණ්ඩල, බැංකුව විසින් නම් කරන ලද සාමාජිකයින්ගෙන් සහ ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

වර්ෂය තුළදී සී/ස එම් සී එස් එල් ෆයිනෑන්ෂියල් සර්විසස් සමාගම සහ සී/ස සීලීස් සමාගම යන පරිපාලිත සමාගම් යුගලය ඒකාබද්ධ කෙරුණු අතර එය 2011 වසරේ දී ක්‍රියාත්මක කෙරුණු බැංකුවේ පරිපාලිත සමාගම් විධිමත් කිරීමේ වැඩසටහනේ එක් කොටසකි. එක හා සමාන වත්කම් ව්‍යාපාර කිහිපයකට භාවිතා කිරීම අවම කිරීම තුළින් සමූහයේ කටයුතු අවම පිරිවැයකින් යුතුව කර ගැනීමට හැකි වේ. 2014 වර්ෂයේ දී බැංකුවේ පරිපාලිත සමාගම් අතර සිදු විය හැකි ඒකාබද්ධ වීම් පිළිබඳව බැංකුව අවධානය යොමු කරන අතර එමඟින් වත්කම් වඩා ඵලදායී ලෙස විභාජනය කිරීම සහ පිරිවැය අවම කිරීම යන අරමුණු ළඟා කර ගැනීම අපේක්ෂා කෙරේ.

ලංකා බැංකුව



වාර්ෂික ප්‍රගතිය- 2013 පරිපාලිතයන් (රු. මිලියන)

	MBSL	PDL	MCSL	PDML	BOC Travels	HCL	HHL	MSS	BOC UK	MBSL Insurance	KHP	MBSL Savings
මුළු ආදායම	2,355	755	1,695	245	99	314	108	1	353	1,461	82	475
ආදායම් බද්දට පෙර ලාභය	176	537	59	118	41	24	1	1	(60)	(111)	43	(103)
කොටස්කරුවන්ගේ වටිනාකම	2,781	3,109	821	1,395	154	217	4	8	3,140	399	283	274
ආයෝජන වටිනාකම	2,123	776	132	1,010	3	101	-	1	2,684	-	-	-
ලාභාංශ ලැබීම්	49	171	5	-	6	15	-	-	-	-	-	-
ආදායම් වර්ධනය*(%)	26	15	34	18	1	(3)	14	29	(7)	38	35	32
ලාභය (බදු අයකිරීමට පෙර) වර්ධනය* (%)	(28)	21	(61)	38	(16)	(55)	405	31	6	(1,059)	32	16
වත්කම් වර්ධනය*(%)	12	9	36	5	18	3	18	7	(19)	21	(1)	23
කොටස්කරුවන්ගේ වටිනාකම වර්ධනය*(%)	3	9	24	6	24	1	15	3	6	(1)	14	171
හිමිකම % **	72.14	94.09	80.09	100.00	100.00	99.99	100.00	100.00	100.00	56.34	94.09	54.25

* 2012 දෙසැම්බර් 31 තුළ වර්ධනය

** සෘජු හා වක්‍ර හිමිකම

වාර්ෂික ප්‍රගතිය - 2013 පරිපාලිතයන් (රු. මිලියන)

	CAML	SDL	LSL	MCL	TLRS
මුළු ආදායම	153	4	73	3,190	57
ආදායම් බද්දට පෙර ලාභය	69	1	(40)	516	34
කොටස්කරුවන්ගේ වටිනාකම	322	10	319	2,868	201
ආයෝජන වටිනාකම	31	25	42	750	20
ලාභාංශ	6	-	-	-	16.3
ආදායම් වර්ධනය *(%)	8	8	(5)	475	(31)
ලාභය වර්ධනය *(%)	13	242	35	3,039	(51)
වත්කම් වර්ධනය *(%)	19	(17)	4	14	(13)
කොටස්කරුවන්ගේ වටිනාකම වර්ධනය *(%)	17	611	(13)	22	(14)
හිමිකම (%)	43.36	41.67	40.92	40.00	24.69

*2012 දෙසැම්බර් 31 තුළ වර්ධනය

මූලික ව්‍යාපාරික මාර්ග

ශාඛා බැංකු කටයුතු

ශාඛා බැංකු කටයුතු අංශය ශ්‍රී ලංකාවේ විශාලතම ශාඛා බැංකු කටයුතු ජාලය හරහා සියළු ඛාණ්ඩයන්ට අයත් ගණුදෙනුකරුවන්ට සේවා සපයන අතර එය ඉහල ශුද්ධ වත්කම් සහිත පුද්ගලයන්ගේ සිට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දක්වා විහිදී යයි. ඉන් සපයන සේවාවන් අතරට කාලීන තැන්පතු සහ ඉතුරුම් ඒකරාශි කිරීම මෙන්ම ජංගම ගිණුම්, විවිධ ණය වර්ග, ඉස්ලාමීය බැංකු නිෂ්පාදන ආශ්‍රිත නිෂ්පාදන ඇතුලත් වේ. බැංකුව විසින් ආරම්භ කරන ලද නිෂ්පාදන සහ සංවර්ධන බැංකුකරණ අංශය ආර්ථික වර්ධනය ඉහල නැංවීම සඳහා ණය ප්‍රවර්ධනය කරනු ලබන අතර ඒ සඳහා ශාඛා බැංකු කටයුතු වර්ධන ණය යෝජනා ක්‍රමය සහ ක්ෂුද්‍ර මුල්‍ය ණය භාවිතා කරයි. මෙම අංශය මුළු ආදායමෙන් 40% දායකත්වයක් ලබා දෙයි. වැඩි විස්තර 79 සිට 90 දක්වා පිටුවල ඇතුලත් වේ.

ආයතනික සහ අක්වෙරළ බැංකු කටයුතු

ආයතනික සහ අක්වෙරළ බැංකු අංශය විශාල සහ මධ්‍යම පරිමාණ ආයතනික සේවාග්‍රාහකයන්, මූල්‍ය ආයතන, රජය සහ රජයට අයත් ව්‍යාපාර ඇතුළුව අක්වෙරළ බැංකු ගනුදෙනුකරුවන් සඳහා නිපැයුම් සහ සේවා සපයයි. මුදල් කළමනාකරණය, ආයතනික ණය පිරිනැමීම, අන්තර්ජාතික වෙළඳ මූල්‍ය හා ණය සම්මේලනය ආදිය මඟින් සපයන සේවාවන් අතර වේ. මධ්‍යගත විදේශීය මුදල් ඒකක බැංකුකරණ ඒකකය හරහා ද මෙම අංශය සේවා සපයයි. මෙම අංශය මඟින් බැංකුවේ මුළු ආදායමේ සැලකිය යුතු ප්‍රමාණයක් වන 50% ක දායකත්වයක් ලබා දෙයි (රජයේ ව්‍යාපාර සහ රජයට අයත් ව්‍යාපාර ද ඇතුලත් වේ). වැඩි වවිස්තර 91 සිට 101 දක්වා පිටුවල ඇතුලත් වේ.

භාණ්ඩාගාර හා ජාත්‍යන්තර බැංකු කටයුතු

වත්කම් හා වගකීම්හි මූල්‍ය තත්වයේ සංරචක මඟින් භාණ්ඩාගාර අංශය බැංකුවේ ද්‍රවශීලතාවය කලමණාකරනය කරයි. මෙම අංශය මඟින් සපයන සේවා අතරට භාණ්ඩාගර බිල්පත් හා බැඳුම්කර වෙළඳාම සහ ව්‍යුත්පන්න නිපැයුම් වන ව්‍යවහාර මුදල් සහ පොළී අනුපාත හුවමාරු,ඉදිරි විනිමය ගිවිසුම් සහ ආයෝජන ක්‍රියාකරකම් අයත් වේ. බැංකුවේ විදේශීය පරිපාලිත සමාගම්,විදේශීය ශාඛා සහ විදේශීය රටවල නියෝජිත බැංකු සබඳතා අධීක්ෂණය මෙම අංශය මඟින් සිදු කරයි. රටවල් 115 ක සිය නියෝජිත බැංකු 759 හරහා ආමුබ ප්‍රේෂණ,දේශීය භාණ්ඩාගාර මෙහෙයුම් සහ ජාත්‍යන්තර මූල්‍යයකරණය යනාදී අංශවල වෙළඳපොල නායකත්වය හිමිකර ගැනීමට මෙම අංශය සමත්ව තිබේ. බැංකුවේ සමස්ථ අදායමෙන් 9% කට මෙම අංශය දායක වෙයි. වැඩි විස්තර 102 සිට 107 දක්වා පිටුවල ඇතුලත් වේ.


ව්‍යාපාරික සහයක කටයුතු


ඉහත සඳහන් ව්‍යාපාරික ඒකකයන්හි ක්‍රියාකාරිත්වය සඳහා සහාය ලබා දෙන අනෙකුත් පසුපෙළ කාර්යාල සේවාවන් වන තොරතුරු තාක්ෂණය, මූල්‍ය, අවදානම, මානව සම්පත්, නෙතික විගණන, අනුකූලතා, අලෙවිකරණ හා සහායක සේවාවන් මෙයට අයත් වේ. වර්ෂය තුල දරන ලද මෙහෙයුම් වියදම රු. මිලියන 23,681 කි.

ශාඛා බැංකු කටයුතු

ශාඛා බැංකු කටයුතු අංශය බැංකුවේ මුළු වත්කම්වලින් 29% කටද බැංකුවේ දළ ණය සැපයුමෙන් 43% කටද දළ ආදායමෙන් 40% කටද දායක වෙයි. මුළු තැන්පතුවලින් 64% කින් සමන්විත බැංකුවේ තැන්පතු සඳහා ප්‍රධාන දායකයා වන්නේ ඒයයි. මිලියන 10කට වැඩි ගනුදෙනුකරුවන් පිරිසකට සේවා සපයන ශාඛා 567 ක්, අනෙක් සේවා ඒකක 49 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 523 ක් සහිත ලංකා බැංකුවට ශ්‍රී ලංකා බැංකු කර්මාන්තයේ විශාලතම ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන ජාලයක් ඇත. ධනය නිර්මාණය කිරීම සඳහා අවස්ථා සහ පුද්ගලයින් හා ව්‍යවසායකයන් සඳහා ප්‍රාග්ධනය වෙත ප්‍රවේශයට පහසුකම් සම්පාදනය කරමින් විවිධත්වයෙන් යුත් ගනුදෙනුකාර පදනමකට පුළුල් පරාසයක නිෂ්පාදන සපයනු ලැබේ. රජයට අයත් බැංකුවක් ලෙස රටේ සමාජීය සහ ආර්ථික යන දෙයාකාර සංවර්ධනය උත්තේජනය කිරීම කෙරෙහි අප සැමවිටම අවධානය යොමු කර ඇති අතර අනෙක් අයට වඩා සාර්ථකව අපට කටයුතු කළ හැකි විභවය හඳුනා ගන්නෙමු. අපගේ දෘෂ්ටිය තුල සෑමවිටම සමාජීය අරමුණු අන්තර්ගත කර තිබුණද අපේ සියළු ශාඛා ලාභදායී වීම විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුය.

	ප්‍රධාන උපාය මාර්ග	2013	2012	වෙනස %
මූල්‍ය	වත්කම් (රු. මිලියන)	343,043	339,991	1
	වගකීම් (රු. මිලියන)	504,191	447,488	13
	පොළී ආදායම (රු. මිලියන)	47,212	36,156	31
	පොළී වියදම (රු. මිලියන)	35,731	26,406	35
	ශුද්ධ පොළී ආදායම (රු. මිලියන)	11,481	9,751	18
	ගාස්තු හා කොමිස් ආදායම (රු. මිලියන)	2,356	2,204	7
	වෙනත් ආදායම (රු. මිලියන)	1,777	1,258	41
	ශුද්ධ මෙහෙයුම් ආදායම (රු. මිලියන)	4,549	8,811	(48)
පාරිසරික	පරිසර හිතකාමී ණය ලබාදීම (රු. මිලියන)	>1,200	>1,000	-
සමාජීය	මුළු ජනගහනයෙන් අපේ ගනුදෙනුකරුවන් (%)	54	54	-
	ශාඛා ගණන	567	324	75
	බස්නාහිර පළාතට පිටතින් ඇති ශාඛා ගණන (2013 දී ශාඛා සංඛ්‍යාව වැඩි වීමට එක් හේතුවක් වූයේ ව්‍යාප්ති කාර්යාල පූර්ණ ශාඛා බවට පරිවර්තනය කිරීම නිසාවෙනි)	432	231	87
	පාසල් ඉතුරුම් ඒකක	3738	2498	50
	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මධ්‍යස්ථාන	14	10	40






යටිතල පහසුකම්

අපේ ශාඛා ජාලය පෙර වසරේ පැවති 324 සිට 567 දක්වා ඉහළ නංවමින් මෙම වසර තුළදී අප ව්‍යාප්ත කාර්යාල 227 ක් සියළු පහසුකම් සහිත ශාඛා බවට හැරවූ අතර නව ශාඛා 16ක් විවෘත කරන ලදී. 2013 දී අපගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය 451 සිට 523 දක්වා වැඩි වූ අතර ලංකා බැංකුවේ ATM ජාලය සහභාගි වන අනෙකුත් බැංකුවල එම ජාල හා සම්බන්ධ කළ ශ්‍රී ලංකාවේ පළමු පොදු ටෙලර් යන්ත්‍ර පුවරුව දියත් කිරීමට ලංකා බැංකුව එක්වීමේදී ගනුදෙනුකාර සේවා ස්ථාන ගණන තවත් 2,000 කින් ඉහළ නැංවුණි. එසේම තම ගනුදෙනුකරුවන්ගේ පහසුව තකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ආගමන සහ විගමන කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක් තුළ පිහිටුවා ඇති චකතු කිරීමේ මධ්‍යස්ථාන 24ක්ද බැංකුව ක්‍රියාත්මක කරයි. පාසල්වල ශිෂ්‍ය නායකයින් විසින් මෙහෙයවනු ලබන පාසල් බැංකුකරණ ඒකක 3,738 ක ජාලයක්ද අප වර්ධනය කර ඇති අතර එය බැංකුවේ තිරසර මූල්‍ය සාක්ෂරතා වැඩසටහනේ කොටසකි. ශාඛාවේ කාර්ය මණ්ඩලය ඉතුරුම් ඒකකය මෙහෙයවීම පිළිබඳව සිසුන්ට උපදෙස් ලබාදෙන අතර කුඩා බැංකු ශාඛාවක මෙහෙයුම් කටයුතු සිදුකිරීම පිළිබඳව ඔවුනට ප්‍රායෝගික අත්දැකීම් ලැබේ. අපගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ධන මූලාරම්භයන්ට සහාය දක්වමින් සු. ම. ව. අංශයේ වර්ධනය සඳහා අවශ්‍ය කළමනාකරණය, ගිණුම්කරණය සහ අලෙවිකරණය ආදී කුසලතා සහ දැනුම වෙත ප්‍රවේශය සපයමින් මුළු සු. ම. ප. ව. මධ්‍යස්ථාන 14 ක්වා ඉහළ නංවමින් සු. ම. ප. ව. මධ්‍යස්ථාන 4 ක් අපි විවෘත කළෙමු.

	මධ්‍යම	නැගෙනහිර	උතුරු මැද	උතුර	වයඹ	සබරගමුව	දකුණ	ඌව	බස්නාහිර	විදේශ	එකතුව
ශාඛා	67	55	47	60	56	46	62	39	133	2	567
අනෙකුත් සේවා ස්ථාන	4	3	1	8	2	2	4	2	23		49
ATM යන්ත්‍ර	52	29	41	32	52	37	56	28	194	2	523
සු.ම.ප.ව. මධ්‍යස්ථාන	2	1	1	1	2	2	3	1	1		14
පාසල් ඉතුරුම් ඒකක	386	406	490	374	328	365	533	295	561		3738




"BOC 3G ලෙස නම් කර ඇති මෙම අද්විතීය ඉතුරුම් ක්‍රමය ගනුදෙනුකරුගේ පවුලේ පරම්පරා තුනක් (3 G සංකල්පය) එනම් ගනුදෙනුකරුගේ දෙමව්පියන්, ළමුන් සහ ඔහු / ඇය සම්බන්ධ කිරීමට සහ ගනුදෙනුකරු භාණ්ඩ මිලදී ගැනීමේදී සහ විය පැහැදම් කිරීමේදී ඉතිරි කිරීමට ගනුදෙනුකරුට ඉඩ ප්‍රස්ථා ලබා දෙයි. ගනුදෙනුකරුගේ ළබැඳියන් රැක බලා ගැනීම පිණිස ඉතිරි කිරීමට මුදල් වෙන් කර තැබීමට මෙය ගනුදෙනුකරුට ඉඩ ලබා දෙයි."

16% ක් වූ ශාඛා තැන්පතු වර්ධනය පෙර වසරට වඩා සතුටුදායක තත්ත්වයක් වූ අතර එම ප්‍රමාණය කර්මාන්තයේ වර්ධන අනුපාතය වූ 15% ට වඩා ඉතා සුළු ප්‍රමාණයකින් වැඩිය. සීමිත ණය ඉල්ලුම නිසාවෙන් ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පැවති හෙයින් තැන්පතු වර්ධනය සඳහා ක්‍රියාකාරකම් වසර තුළදී ප්‍රමිත කරන ලදී. "CASA" ලෙස පොදුවේ හඳුන්වන තැන්පතු සංයුතියේ ජංගම සහ ඉතුරුම් ගිණුම් වසර තුළදී අඛණ්ඩව හීන වෙමින් පැවති අතර එය 2012 පැවති 52% සිට 2013 දී 48% දක්වා පහත වැටුණි. කර්මාන්තය ද මෙම ප්‍රවණතාව අත්දකින ලදී. රුපියල් තැන්පතුවල වර්ධනයට සමාන වූ රටාවක් පෙන්නුම් කරමින්, මුළු ශාඛා තැන්පතුවලින් 14% ක් සම්පාදනය කරන ශාඛාවන්හි විදේශ මුදල් තැන්පතු වසර තුලදී 14% කින් වැඩිවුණි. වසර තුළදී නිරීක්ෂණය කරන ලද චර්යා රටාවන් වෙනස් කිරීමේදී පහත වැටෙමින් පැවති පොළී අනුපාතයන් ප්‍රධාන භූමිකාවක් ඉටු කරන ලදී. 2013 අවසානයේදී, මුළු ශාඛා තැන්පතුවලින් 46% ක් සපයනු ලැබුයේ බස්නාහිර පළාතෙන් පිටත ශාඛා ජාලයයි.

සිය 74 වන සංවත්සරය සමරමින් ලංකා බැංකුව 2013 අගෝස්තු මාසයේදී නව්‍ය අත්දැකීමක් සහ ශ්‍රී ලංකා මූල්‍ය කර්මාන්තයේ තවත් පළමුවැන්නක් වූ 3G ඉතුරුම් ගිණුම දියත් කරන ලදී.


BOC 3G ලෙස නම් කර ඇති මෙම අද්විතීය ඉතුරුම් ක්‍රමය ගනුදෙනුකරුගේ පවුලේ පරම්පරා තුනක් (3 G සංකල්පය) එනම් ගනුදෙනුකරුගේ දෙමව්පියන්, ළමුන් සහ ඔහු / ඇය සම්බන්ධ කිරීමට සහ ගනුදෙනුකරු භාණ්ඩ මිලදී ගැනීමේදී සහ විය පැහැදම් කිරීමේදී ඉතිරි කිරීමට ගනුදෙනුකරුට ඉඩ ප්‍රස්ථා ලබා දෙයි. ගනුදෙනුකරුගේ ළබැඳියන් රැක බලා ගැනීම පිණිස ඉතිරි කිරීමට මුදල් වෙන් කර තැබීමට මෙය ගනුදෙනුකරුට ඉඩ ලබා දෙයි.

ඕනෑම ලංකා බැංකු ශාඛාවක් හරහා මෙම සුවිශේෂී අංගය ගනුදෙනුකරුගේ ගිණුමෙහි සක්‍රිය කළ හැකි අතර ඕනෑම ලංකා බැංකු ගිණුමකට, විශේෂයෙන්ම අනාගත පරම්පරා සඳහා ඉතුරුම් ප්‍රවර්ධනය කරමින් ලංකා බැංකුවේ රන් කැකුළු ළමා ඉතුරුම් ගිණුමකට හෝ දෙමව්පියන් සහ වැඩිහිටියන් රැක බලා ගැනීමේ ශ්‍රී ලාංකික සම්ප්‍රදාය ප්‍රවර්ධනය කරමින් ලංකා බැංකු ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුමකට සිය ජංගම හෝ ඉතුරුම් ගිණුම් මඟින් මුදල් තැන්පත් කිරීමට ගනුදෙනුකරුට හැක.



පෙර වසරේදීද නිරීක්ෂණය කරන ලද පරිදි බැංකු ක්ෂේත්‍රයේ පවතින අධි ද්‍රවශීලතාව තැන්පතු රාශිකරණය සඳහා පවතින දැඩි තරඟකාරීත්වය ලිහිල් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය භරිත තැන්පතු අනුපාතය 2012 දෙසැම්බර් හි පැවති 10.1% සිට වසර අවසානය වන විට 9.4% දක්වා වර්ෂය තුළදී ඌනනය විය. තවද බොහෝ ආයතනික තැන්පත්කරුවන් සහ අන්‍යොන්‍ය අරමුදල් තම කළඹ ප්‍රතිලාභයන්හි වඩා ස්ථාවර බවක් ඇති කරගනු පිණිස තම කළඹෙන් කොටසක් ණය සාධනපත්‍ර වෙත යොමු කළ බැවින් වසර තුළදී සිදුවූ ස්ථාවර ණය වෙළඳපලේ වර්ධනය කාලීන තැන්පතු ඒකරාශී කිරීම සඳහා අභියෝග එල්ල කරන ලදී. තැන්පතු ධාරිතාවයේ වර්ධනය සහ කාලීන තැන්පතු මත වූ බලපෑම් නිසාවෙන් වසර තුළදී පොළී වියදම් ද ඉහළ ගියේය.

මුළු තැන්පතු පදනමෙන් 47% ක් සමන්විත වූයේ රු. 100,000 ට වඩා අඩු තැන්පතු වලින් වන අතර සමාජ ආර්ථික සංවර්ධනයේදී සහ මූල්‍ය අන්තර්කරණයේදී සිය ශාඛා ජාලය හරහා බැංකුව ඉටු කරන භූමිකාව අවධාරණය කරමින් රටේ අඩු සහ මධ්‍ය ආදායම් උපයන පුද්ගලයන් කරා බැංකුව ළඟා වී ඇති බව එමඟින් පෙන්නුම් කරයි.



ණය සහ අත්තිකාරම්

- ලංකා බැංකු නිවාස ණය යෝජනා ක්‍රමය
- ලංකා බැංකුවේ රාජ්‍ය සේවක නිවාස ණය ක්‍රමය
- ලංකා බැංකුවේ සරනි නිවාස ණය - අනේවාසික විදේශ මුදල් ගනුදෙනුකරුවන් සඳහා නිවාස ණය ක්‍රමය

නිවාස ණය 8%

- ලංකා බැංකු පුද්ගලික ණය යෝජනා ක්‍රමය
- පරිගණක මිලදී ගැනීම සඳහා ණය
- වෘත්තික ණය යෝජනා ක්‍රමය
- වෙනත්

පුද්ගලික ණය 8%

- අයිරා
- කාලීන ණය
- රන් සුරැකුම් ණය සේවා

කාලීන ණය 65%

- විදේශ අධ්‍යාපන ණය
- ලංකා බැංකු විස්තීර්ණ අධ්‍යාපනික ණය යෝජනා ක්‍රමය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සිසුන් සඳහා අධ්‍යාපනික ණය යෝජනා ක්‍රමය

අධ්‍යාපනික ණය 1%

පහත දැක්වෙන සේවකයන් සඳහා විශේෂයෙන් සකස් කළ ණය යෝජනා ක්‍රම

- රාජ්‍ය අංශයේ සේවකයන්
- සන්නද්ධ හමුදා
- වෛද්‍ය නිලධාරීන් සහ සෞඛ්‍ය අංශයේ සේවකයන්
- විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය
- අධිකරණ සේවා සංගමයේ සාමාජිකයන්
- ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සාමාජිකයන්
- ගණකාධිකාරී සේවා සංගමයේ සාමාජිකයන්
- පරිපාලන සංගමයේ සාමාජිකයන්
- ගණීය වෘත්තික ණය යෝජනා ක්‍රමය

විශේෂ ණය යෝජනා 9%

- සංවර්ධන ණය
- කෘෂිකාර්මික ණය
- ක්ෂුද්‍ර මූල්‍යනය
- ණය යෝජනා ක්‍රම

සංවර්ධන ණය 5%


- රථ වාහන
- විශාල උපකරණ
- ගුවන් යානා කල්බදු ගැනීම ඇතුළුව විශේෂ කාර්යය වත්කම්

කල්බදු 4%

ඉහත ප්‍රතිශත ශාඛා ණය කළඹේ සංයුතිය පිළිබිඹු කරයි.

තම උසස් අධ්‍යාපනය සඳහා මුදල් සම්පාදනය කිරීමේ සිසුන්ගේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් විශේෂ දිගුකාලීන අධ්‍යාපනික ණය හඳුන්වා දෙන ලදී.

"තව දුරටත් උසස් බැංකු සේවාවක් සඳහා ළඟාවීම සුළු පිරිසකට පමණක් සීමා නොවී ලංකා බැංකුව ඉතා දුර පළාත් වල සිටින ගනුදෙනුකරුවන් හට ලඟා වීම සඳහා සැළසුම් කර ඇති අතර බැංකු ක්‍රමයෙන් එහා ගිය සේවාවක් අප විසින් සපයනු ලබයි"



ශාඛා බැංකු කටයුතු කළඹ බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් වලින් 43% ක් සම්පාදනය කරන අතර මුළු පොළී ආදායම සහ ශුද්ධ පොළී ආදායම සඳහා අනුපිලිවෙලින් 41% ක සහ 31% ක දායකත්වයක් ලබා දේ. වෙළඳ සේවා ඇපවීම්, ප්‍රේෂණ සහ බැංකු රක්ෂණ සහ ණය කාඩ්පත් අලෙවිය මඟින් බැංකුවේ මුළු ගාස්තු පාදක ආදායමෙන් 36% ක් ද එය ජනනය කරන ලදී. පුද්ගලයන්, ව්‍යවසායකයන් සහ තනි හිමිකාරිත්ව, හවුල් ව්‍යාපාර සහ පුද්ගලික සීමාසහිත සමාගම්, ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර ඇතුළුව ස්වයං රැකියා ව්‍යාපාර ඇතුලත් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා අපගේ සේවා මෙම දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් තුලට අන්තර්ගත වේ.

ශාඛා බැංකු වත්කම් කළඹ 2012 පැවති රු. මිලියන 339,991 සිට 2013 දී රු. මිලියන 343,043 දක්වා ඉහළ ගියේය. වත්කම් වර්ධනය සඳහා ඉහළම දායකත්වය සැපයුවේ ණය සහ අත්තිකාරම්ය.

මෙම වර්ධනය සඳහා බස්නාහිර පළාතෙන් පිටත ශාඛා 46% ක දායකත්වයක් ලබා දුනි. අපේ වර්ධනය සඳහා දායක වූ ප්‍රධාන නිපැයුම් වූයේ ණය, අයිරා සහ කල්බදු වේ. 2012 දී බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් වලින් 20% ක් සම්පාදනය කළ සහ දැන් එයින් 17% දක්වා අඩු කර ඇති රන් මිල පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස හීන වෙමින් පැවති වත්කම් ගුණාත්වයට අනුගාමීව 2013 වසරේදී අප උකස් කළඹේ වර්ධනය පාලනය කළෙමු. අනෙකුත් ශාඛා බැංකු නිෂ්පාදිතයන්හි වර්ධනය ප්‍රමුඛතා ගත කිරීමට අපි අපගේ උපාය මාර්ගය නැවත පෙළගැස්වූ අතර උකස් කළඹේ වර්ධනය සීමා කරමින් 2013 සඳහා 10% වර්ධනයක් අත්කර ගනිමින් එම උපාය මාර්ග සාර්ථකව ක්‍රියාවට නැංවූයෙමු.

ප්‍රාග්ධනය වෙත පමණක් නොව ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා වෙත ප්‍රවේශය සපයමින් අපගේ සු. ම. ව. මධ්‍යස්ථාන හරහා සු. ම. ව. වර්ධනය උත්තේජනය කිරීම පිණිස වූ අපගේ ප්‍රයත්න අප කිහිප ගුණයකින් වැඩි කිරීමේදී වසර තුළ කාල ණය 15% කින් වර්ධනය විය. ඉහළ නැංවුණු කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හේතු කොට ගෙන උපයෝජනය ඉහළ නැංවුණු නිසාවෙන් වර්ෂය තුළදී අයිරාද 15% කින් වර්ධනය විය.

කල්බදු වෙළඳපලේ කවර හෝ උද්ධමන බලපෑමක් වැලැක්වීමට සහ කර්මාන්තය විසින් අත්දකිනු ලැබූ වත්කම් ගුණාත්වය පිළිබඳ අභියෝග වලක්වාලීමට බැංකුව මන්දගාමීව කටයුතු කිරීමේ උපාය මාර්ගයක් යොදා ගත් බැවින් කල්බදු කළඹේ වර්ධනය 1% පමණක් විය. බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල තරඟකාරිත්වය සහ රේගු බදු වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස රථවාහන සඳහා ඉල්ලුම අඩු වීමද මෙම මන්දගාමිත්වයට හේතු විය. ලියාපදිංචි නොකළ වාහන මිල ඉහළ යාම හේතුවෙන් පාවිච්චි කල වාහන වෙළඳපල සැලකිය යුතු ප්‍රමාණයකට වර්ධනය වූ අතර මෙම තත්ත්වයෙන් නිසි ඵල නෙලාගැනීමට කුලී පිට ගැනුම් පහසුකම හඳුන්වා දෙන ලදී.

රාජ්‍ය අංශය, සන්නද්ධ හමුදා, අධිකරණ සහ අනෙකුත් කණ්ඩායම්වල අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා පහසුකම් සැපයීම පිණිස ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලනු වස් විශේෂ ණය යෝජනා ක්‍රම දියත් කරනු ලැබීය. ලබා දුන් මුළු ණය රු. මිලියන 14,900 ක් විය. තම උසස් අධ්‍යාපනය සඳහා මුදල් සම්පාදනය කිරීමේ සිසුන්ගේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් විශේෂ දිගුකාලීන අධ්‍යාපනික ණය හඳුන්වා දෙන ලදී. ඔවුන්ගේ අධ්‍යාපනය නිමා කිරීමෙන් පසුව සහ රැකියාවක නියුක්ත වීමේදී ආපසු ගෙවීමට සිසුනට ඉඩ ලබා දෙමින් සහන පොළී අනුපාත යටතේ මෙම ණය ප්‍රදානය කරන ලදී.

ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සංවර්ධනය සඳහා බැංකුව ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 12කට සහභාගි වූ අතර ඒ හරහා 2013 දී රු. මිලියන 721 ක ණය ලබා දුනි. සහාය ලබාදුන් ප්‍රධාන අංශ අතරට කෘෂිකර්මය, ධීවර කර්මාන්තය, සත්වපාලනය, තේ, රබර් සහ පොල් ඇතුළුව වැවිලි කර්මාන්තය, කර්මාන්ත ශාලා නවීකරණය, යටිතල පහසුකම් සංවර්ධනය, සංචාරක ව්‍යාපාරය සහ අධ්‍යාපනය අයත් විය. බැංකුව රු. මිලියන 14,823 ක ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ප්‍රදානය කළ අතර ඒ අතුරින් රු. මිලියන 2,113 ක් උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ සංවර්ධනය සඳහා පිහිටවූ විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ එම ප්‍රදේශවල ශාඛා මඟින් පිරිනමන ලදී.

සංවර්ධන බැංකුකරණය

සමාජීය අංශ ගණනාවක් කෙරෙහි සිය අවධානය යොමු කරන සංවර්ධන බැංකුකරණ අංශය 2013 දී පරිපූර්ණ කාර්යසාධනයක් අත් කරගන්නා ලදී. පහත දැක්වෙන ඡායාරූප තොරතුරු සටහන එහි මෙහෙයුම් පිළිබඳ අන්තර්දෘෂ්ටියක් සපයයි.



'BOC මිතුරු'

කණ්ඩායමක් ලෙස ක්‍රියා කරන පුද්ගලයන්ගේ සහයෝගී ප්‍රයත්න හරහා දිළිඳුකම පිටුදැකීමේ මෙම ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමය අරඹනු ලැබුයේ 2008 වසරේදීය. මෙම පර්ෂද හෝ කුඩා කණ්ඩායම්වලින් අදහස් වනුයේ සංවාදය සහ ඒකාබද්ධ ප්‍රයත්න තුළින් තම දුෂ්කරතා බෙදා හදා ගනිමින් ඒවාට විසඳුම් ලබා දෙන පුද්ගලයන්ගේ සංසදයකි. තම අත්දැකීම් බෙදා හදාගැනීම සහ එකිනෙකාට උපකාර කිරීම තුළින් දරිද්‍රතාවයේ සහ ණයගැතිභාවයේ චක්‍රයෙන් මිදී තම ජීවිත යහපත් බවට පත් කරගැනීමට මෙම කණ්ඩයම්වල සාමාජිකයන්ට හැකි වේ.

BOC මිතුරු ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස එම සමාජ 160 ක් එහි සාමාජියන් විසින් සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි කර ඇති අතර තවත් එබඳු සංවර්ධන සමිති 300 ක් යටතේ කුඩා කණ්ඩායම් 19,200 ක් ක්‍රියාත්මක වේ. සාමාන්‍යයෙන් සාමාජිකයන් 5 - 8 ක් අතර සංඛ්‍යාවකින් සමන්විත මෙම කණ්ඩායම්වල සාමාජිකයන් වන පුද්ගලයන් සංඛ්‍යාව ලක්ෂයකට වැඩිය. එබඳු කුඩා කණ්ඩායම් කිහිපයක් එක්ව සංවර්ධන සමිති පිහිටුවා ගන්නා අතර ඒවා හරහා ඔවුනගේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට හා මගපෙන්වීමට ලංකා බැංකුවට හැකි වී තිබේ.

2008 වසරේ සිට දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල ලංකා බැංකුව විසින් ආරම්භ කරන ලද BOC මිතුරු ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමය මේ වන විට ලංකාව පුරාම ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය යටතේ ලංකා බැංකුව 2013 වසරේදී ණය 1,304 ක් සපයා ඇති අතර ඒවායේ මුළු වටිනාකම රු. මිලියන 102 කි.



නව විස්තීරණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය

මෙම අඩු පොළී ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙනු ලැබුයේ අඩු නිෂ්පාදන පිරිවැයක් සහ එමඟින් තම නිෂ්පාදන සඳහා වඩා හොඳ මිලක් සහිත වෙළඳපලක් පවත්වා ගැනීමට ගොවීන්ට හැකිවනු පිණිසය. මෙම ණය සපයනුයේ මහ බැංකුව විසින් අනුමත කර ඇති පරිදි වී සහ අතිරේක ආහාර බෝග වගා කිරීමට සහ වගා පූර්ව ක්‍රියාකාරකම් (බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය) සඳහාය. මෙම යෝජනා ක්‍රමය යටතේ ගනුදෙනුකරුවන් 33,592 දෙනෙකු හඳුනාගෙන ඇති අතර ඔවුන් වෙත 2013 දී ලබා දුන් මුළු ණය මුදල රු. මිලියන 3,834 කි.



ඉස්සන් ගොවිපල ව්‍යාපෘතිය

ආයෝජකයෙකු විසින් ප්‍රවර්ධනය කරන ලද සහ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ඉස්සන් ගොවිපල ව්‍යාපෘතියකට සම්බන්ධවීමට අවශ්‍ය වූ මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරෙයි ප්‍රදේශයේ ඕවර පවුල් 276 කට බැංකුව මූල්‍යාධාර සපයන ලදී. මෙම පවුල් සඳහා මුදල් සැපයීමේ අරමුණ වූයේ සුදු පුල්ලි රෝගය වැනි ව්‍යසනයන් අඩු කිරීම පිණිස නිසි තාක්ෂණික දැනුම යොදා ගැනීම මඟින් ඉස්සන් වගාව සඳහා සම්බන්ධ වීමට මෙම පවුල් දිරිගැන්වීමටය.



දියවර දිරිය ණය යෝජනා ක්‍රමය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතාගේ නායකත්වය යටතේ ක්‍රියාවට නංවන ලද ධීවර සංවර්ධන වැඩසටහනේ කොටසක් ලෙස සමාජ ආර්ථික සංවර්ධනය සහ ධීවර ක්ෂේත්‍රයට නව තාක්ෂණය හඳුන්වා දීම කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සඳහා විශේෂයෙන් සකස් කරන ලද ලංකා බැංකුවේ දියවර දිරිය අඩු පොළී අනුපාත ණය ක්‍රමයේ දෙවන අදියර ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය දියත් කරන ලදී.

මෙම යෝජනා ක්‍රමයේ පළමු අදියර හඳුන්වා දෙනු ලැබුයේ 'ජාතික ධීවර සැලැස්ම' යථාර්ථයක් බවට පත්කිරීමේ අරමුණිනි. මෙම යෝජනා ක්‍රමය යටතේ ලංකා බැංකුව ප්‍රතිලාභීන් 800කට වැඩි පිරිසකට රු. බිලියනයක ණය පහසුකම් නිකුත් කර තිබේ.

සමුද්‍රීය සහ මිරිදිය යන ධීවර කර්මාන්ත දෙකම සඳහා මුදල් සැපයීමට දිවයින පුරා මෙම ණය යෝජනා ක්‍රමය හඳුන්වා දුන් අතර මෙය උතුරු පළාතේ බෙහෙවින් ජනප්‍රිය විය. මෙම යෝජනා ක්‍රමය යටතේ බහුදින යාත්‍රා OFRD බෝට්ටු සහ එක් දින යාත්‍රා ඇතුළු ධීවර යාත්‍රා එන්ජින් සහ ධීවර ආම්පන්න සඳහා ධීවර ප්‍රජාවට ණය සපයන ලදී.

දියවර දිරිය දෙවන අදියර යටතේ රු. බිලියන දෙකක් වටිනා ණය ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ. දෙවන අදියර 2013 අගෝස්තු 19 දින දියත් කළ අතර ඒ යටතේ ප්‍රතිලාභීන් 927 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දෙමින් 2013 වසරේදී ණය 773 ක් ප්‍රදානය කර තිබේ.



තුරුසවිය ණය යෝජනා ක්‍රමය

කුඩා රබර් වතු හිමියන්ට සහායවීම පිණිස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ස්ථාපිත කළ නෛතික ආයතනයක් වන රජයේ තුරුසවිය අරමුදල සමඟින් ලංකා බැංකුව කුඩා තේ වතු හිමිකරුවන්ට උපකාර කිරීම පිණිස ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. රු. 25,000 ක අවමයක සිට රු. 300,000 ක උපරිමයක් දක්වා වූ පරාසයක වන මෙම ණය ආපසු ගෙවීම සඳහා මාස 36 ක උපරිම කාලසීමාවක් ඇති අතර එයට මාස 6 ක විකල්ප සහන කාලයක් ඇතුලත් වේ. ලිහිල් ඇප යටතේ 12% ක වාර්ෂික පොළී අනුපාතයකට මෙම ණය ලබා දෙනු ලැබේ. කළුතර, කෑගල්ල, රත්නපුර, මොනරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට, කොළඹ, ගම්පහ සහ අම්පාර යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාවට නැංවීමට නියමිත වැඩසටහනෙන් තුරුසවිය අරමුදලේ සාමාජිකයන් 20,000 ක් ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 2013 වසර තුළදී ගනුදෙනුකරවැන් 868 දෙනෙකුට ප්‍රතිලාභ සලසමින් බැංකුව රු. මිලියන 37 ක් ප්‍රදානය කරන ලදී.



කුඩා තේ වතු හිමියන් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ලංකා බැංකුව හා එක්ව හඳුන්වා දී 2013 දෙසැම්බර් මස දියත් කළ විශේෂ ණය යෝජනා ක්‍රමයෙන් ශ්‍රී ලංකාවේ 400,000 ක් පමණ කුඩා තේ වතු හිමියන් ප්‍රතිලාභ ලබනු ඇත. මෙම විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ රු. 25,000 සිට රු. 500,000 දක්වා වූ ණයක් 12% ක පොළියකට කුඩා තේ වතු හිමියන්ට ලබාගත හැක.

ගනුදෙනුකාර බැංකු සේවා සැපයුම් මාර්ග

ශාඛා බැංකු කටයුතු

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර බැංකු කටයුතු


ජංගම බැංකුකරණය

අන්තර්ජාල බැංකු සේවා

ණය සහ හර කාඩ්පත්

ගනුදෙනුකරුවන්ට පහසුවන පරිද්දෙන් බැංකු සේවා සැපයීම සඳහාත් ගනුදෙනුකරුවන්ට මෙහෙයුම් කාර්යක්ෂමතා සහ ඔවුන්ගේ වර්ධනය වෙමින් පවතින ඉල්ලීම් සඳහා බැංකුකරණ විසඳුම් සැපයීම පිණිසත් ලංකා බැංකුව සතුව ගනුදෙනුකාර බැංකු සේවා සැපයුම් මාර්ග ගණනාවක් තිබේ. අපගේ අන්තර්ජාල බැංකු සහ ජංගම බැංකු ගනුදෙනු අනුපිළිවෙලින් 68% ක් සහ 17% ක් වශයෙන් වර්ධනය වද්දී අපි වෙනස්වන ප්‍රවණතා දුටුවෙමු. 2013 වසරේ 3 වන කාර්තුව අවසාන වන විට අන්තර්ජාල බැංකු සහ ජංගම ගනුදෙනු සඳහා කර්මාන්තයේ වර්ධනය පිළිවෙලින් 33% ක් සහ 62% ක් විය. මෙම සුවිශේෂී වර්ධන ක්ෂේත්‍රයේ වෙළඳපොල කොටස වර්ධනය කිරීම සඳහා වන අවස්ථා ලංකා බැංකුව නොකඩවා ගවේෂණය කරන අතර බැංකුවේ තොරතුරු තාක්ෂණ පරිණාමනය එහි තරඟකාරී තත්ත්වය විශාල ලෙස ඉහළ නංවනු ඇති බවට බැංකුව දැඩි විශ්වාසයෙන් පසුවෙයි.

සෑම වැඩිහිටියෙකුටම කාඩ්පතක් හිමි බව සහතික කිරීමේ දිගුකාලීන ඉලක්කය සමඟ රටේ ණය සහ හර කාඩ්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීමට බැංකුවේ කාඩ් මධ්‍යස්ථානය සක්‍රීයව උත්සාහ දරමින් සිටී. 2013




අන්තර්ජාල ප්‍රවේශ ධාරිතා


ජංගම බැංකු ගනුදෙනු ධාරිතා

අවසානය වන විට ලංකා බැංකුව සතු ණය කාඩ්පත් 76,736 ක් ද හර කාඩ්පත් 2,776,928 ක් ද සංසරණයේ පැවති අතර එය පිළිවෙලින් 6% ක සහ 10% ක වර්ධනයක් පිලිබිඹු කිරීමකි. මෙහි වර්ධනය සඳහා විභවයක් ඇති බව අප විශ්වාස කරන අතර 2014 අවසාන වන විට අපගේ කළඹ දෙගුණයකින් ඉහළ නංවාගැනීමට කටයුතු කරන්නෙමු. වසර තුළ රටේ නිකුත් කළ මුළු හර කාඩ්පත්වලින් 23% ක් නිකුත් කරනු ලැබුයේ ලංකා බැංකුවයි. අපගේ ණය කාඩ්පත් ධාරිතාව 2012 පැවති 72,485 සිට 2013 දී 76,376 දක්වා වර්ධනය වුණි. නව්‍ය ප්‍රවර්ධන සහ වාසිදායක කොන්දේසි භුක්තිවිඳින අපගේ ගනුදෙනුකරුවන්ට ආකර්ෂණීය නව්‍යකරණ සපයමින් 2012 දී 4,770 ක් වූ අපගේ වෙළඳ ජාලය ද 2013 දී 5,520 ක් දක්වා වර්ධනය වී තිබේ.

වෙළඳපොල තිරසරව පවත්වාගැනීම සහ වර්ධනය කිරීම පිණිස ගනුදෙනුකරුවන්ට ප්‍රතිලාභ ලබාදීමට නිකුත් කරන පාර්ශ්වය හා ලබාගන්නා පාර්ශ්වය යන දෙපිරිස සඳහාම ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් දියත් කරන ලදී.



ණය කාඩ්පත්



හර කාඩ්පත්



"සෑම වැඩිහිටියෙකුටම කාඩ්පතක් හිමි බව සහතික කිරීමේ දිගුකාලීන ඉලක්කය සමඟ රටේ ණය සහ හර කාඩ්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීමට බැංකුවේ කාඩ් මධ්‍යස්ථානය සක්‍රියව උත්සාහ දරමින් සිටී. 2013 අවසානය වන විට ලංකා බැංකුව සතු ණය කාඩ්පත් 76,736 ක් ද හර කාඩ්පත් 2,776,928 ක් ද සංසරණයේ පැවති අතර එය පිළිවෙලින් 6% ක සහ 10% ක වර්ධනයක් පිලිබිඹු කිරීමකි."



සාමාජීය මෙහෙය





අප ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමේ මූලාරම්භ

සමස්ත රටටම ලබාගත හැකි බැංකු නිපැයුම් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම පිණිස 2013 වසර පුරාම දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් සඳහා බැංකුව මුල පුරන ලදී. 2013 දී බැංකුව දැනුවත් කිරීමේ වැඩසහටන් පහලොවකට වඩා පවත්වන ලදී.



අප ප්‍රජාවගේ ජීවන මට්ටම වැඩි දියුණු කිරීම

මහජන සෞඛ්‍ය නිලධාරීන්, පවුල් සෞඛ්‍ය නිලධාරීන්, මූලික රෝහල් කාර්ය මණ්ඩලය සහ ගැමි සමිතිවල සහාය ඇතිව වකුගඩු රෝගය වැළඳීමේ ප්‍රවණතා සහිත ගම්වැසියන්ගේ රෝග විනිශ්චය සඳහා උතුරුමැද පළාතේ ශාඛා වෛද්‍ය සායනයක් සංවිධානය කරන ලදී. මඩාටුගම මූලික රෝහලේ පවත්වනු ලැබූ සායනයට එම ප්‍රදේශයන්හි වැසියන් 2,000කට ආසන්න පිරිසක් සහභාගි විය. ප්‍රතිකාර සඳහා ප්‍රවේශය නොමැති ප්‍රදේශයේ රෝගීන් 170කට පමණ වකුගඩු ආශ්‍රිත රෝගී තත්ත්වයන් ඇති බවට එදින රෝග විනිශ්චයේදී හඳුනා ගන්නා ලදී.

වවුනියාවේ පදවිය පාරේ පිහිටා ඇති බෝගස්වැව සිවිල් යුද්ධයෙන් සැලකිය යුතු බලපෑමකට ලක්වූ ප්‍රදේශයකි. යුද්ධයේ නිමාවත් සමඟ බොහෝ පවුල් එම ප්‍රදේශයේ නැවත පදිංචි වී ඇති අතර ප්‍රදේශයේ ආර්ථික වර්ධනය දිරිගැන්වීම සඳහා රජය සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාවට නංවා තිබේ. එම ප්‍රදේශයට ආසන්නතම බැංකු ශාඛාව වනුයේ බෝගස්වැව සිට කිලෝමීටර් 40 ක් දුරින් පිහිටි වවුනියා ශාඛාවයි.

ස්ථිර පරිශ්‍රයක් නොමැතිව ශාඛාවක් විවෘත කිරීමේ දුෂ්කරතාවය මධ්‍යයේ වුවද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම සහිත ශාඛාවක් විවෘත කිරීම මඟින් ප්‍රදේශයේ වැසියන්ට බැංකු පහසුකම් සැපයීමට අප මුලපුරන ලදී. ප්‍රදේශයේ ප්‍රජාවගේ සහ යුධ හමුදාවේ සහාය ඇතිව බහාලුම් ආවරණයක මෙම ශාඛාව දින නවයක් තුළ විවෘත කරන ලදී.

බැංකුවේ ගිණුම් විවෘත කිරීමට ප්‍රජාව දිරිමත් කරමින්, බැංකුවල මුදල් තැන්පත් කිරීමේ වැදගත්කම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමට බැංකුව වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.










සමාජීය ප්‍රතිලාභ සැපයීමට සැලසුම් කළ නිපැයුම් සහ සේවා

සමාජයට සමාජීය ප්‍රතිලාභයක් සැපයීමේ කාර්යය සඳහා සැලසුම් කරනු ලැබූ ණය යෝජනා ක්‍රම ගණනාවක් බැංකුව අරඹන ලදී. එබඳු එක් නිපැයුමක් වූයේ රටේ උතුරු සහ නැගෙනහිර වාසය කරන බහුතරය ඉලක්ක කරමින්, අඩු වරප්‍රසාදිත ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීමට විශේෂිතව සැලසුම් කරන ලද පුද්ගල, දේපල, සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය යටතේ වූ ණය යෝජනා ක්‍රමයයි (REPPIA) (යෝජනා ක්‍රමය III, IV, සහ V). මෙම යෝජනා ක්‍රම ආරම්භයේ සිට රු. මිලියන 500 කට වඩා වැය කර තිබේ.

අඩු ජනගහනයන් සහිත හෝ ආර්ථිකව අඩු වරප්‍රසාදිත ප්‍රදේශවල ප්‍රවේශ ලක්ෂ්‍ය

බෝගස්වැව, සම්පත් නුවර, ඇතිමලේ සහ මහඔය ආදී ආර්ථිකව අවවරප්‍රසාදිත ප්‍රදේශවල සිය ශාඛා ජාලය සක්‍රියව ව්‍යාප්ත කිරීමේ ප්‍රවණතාව බැංකුව ඉහළ නංවා තිබේ.



ඉදිරි ගමන් මග

මෙම අංශයේ උපාය මාර්ගයෙහි ප්‍රධාන ඉලක්කය වී ඇත්තේ 2014 වසර සඳහා ආදායම් ඉලක්ක උත්පාදනය කිරීම පිණිස වාණිජ ණයදීම, සු. ම. ප. ව. ණයදීම, පුද්ගලික ණය, නිවාස ණය සහ කල්බදු ඇතුළුව සාමාන්‍ය ණය මෙහෙයවීමයි. ණය සංකේන්ද්‍රණයේ යහපත් තුලිතතාවක් පවත්වාගැනීමේ අපේක්ෂාවෙන් පෙර වසරවලට සාපේක්ෂව කළඹෙහි උකස් අත්තිකාරම් මත නිරාවරණය සැලකිය යුතු ලෙස අඩු කරනු ලබනු ඇත. නියමිත ඉලක්ක සපුරා ගැනීම පිණිස උකස් ගැනීම මඟින් අහිමිවන ආදායම ඌන පූරණය සඳහා අනෙකුත් නිපැයුම් කාණ්ඩ යොදාගනු ඇත.


ගනුදෙනුකරුවන්ට වඩා උසස් අත්දැකීමක් සපයනු වස් කාර්ය මණ්ඩල ඉලක්ක සහ අරමුණු සමඟ එක පෙළට ගනු ඇත. ඒ අනුව සේවා ග්‍රාහකයන්ට සේවා සැපයීම සඳහා වැයවන කාලය අවම කිරීමටත් වඩා වැඩි සේවා ග්‍රාහක පිරිසකට සේවා සැපයීමටත් කාර්ය මණ්ඩලය පුහුණු කරනු ලබන අතර එය ගනුදෙනුකරුවන්ට මෙන්ම බැංකුවේ නිලධාරීන්ට ද ධනාත්මක දායකත්වයක් වනු ඇත. ගනුදෙනුකරුවන්ගේ කාලයට ගැලපෙන ලෙස සකස්වීම පිණිස නම්‍යශීලීත්වය වැඩි දියුණු කිරීමට ශාඛාවන්හි කාර්යාල කාලවේලාවන් වැඩි කිරීමට විශේෂ මුලපිරීමක් සිදු කරනු ලැබේය.

ණය ලබාදීමේ ක්‍රියාදාමයේ වඩා ඉහළ කාර්යක්ෂමතාවයන් සහ සඵලතාවක් සාක්ෂාත් කරගැනීම කෙරෙහි වූ ප්‍රධාන ගාමක බලවේගය වූයේ ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිපෝෂණයයි. සමස්ත බැංකුවේ සේවා ගුණත්වය මෙන්ම අංශයේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලත් ධනාත්මක ප්‍රතිපෝෂණය තවදුරටත් යොදාගනු ඇත. ඉදිරියට එළඹෙන වසර ගණනාව තුළ අපේ සේවාග්‍රාහකයන්ට වඩා සඵල සේවාවක් සැපයීමට බැංකුවට ඇති හැකියාව අවහිර කරන්නා වූ බාධක එමඟින් ඉවත් කරනු ඇත. එහෙයින්, අනාගතයේදී සේවාග්‍රාහකයන් සමඟ වඩ වඩාත් සම්බන්ධ වීමටත් 2014 වසර තුළදී ණය දීමේ ක්‍රියාදාමයේ ගුණත්වය ඉහළ නැංවීමටත් මෙම අංශය වැඩි අවධානයක් යොමු කරනු ඇත.

ආයතනික සහ අක්වෙරළ බැංකු කටයුතු

ආයතනික බැංකුකරණ අංශය පුද්ගලික ආයතනික ගනුදෙනුකරුවන්ට, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනයන්ට ඉහළ ධාරිතා බැංකුකරණ සේවා සපයයි. වර්ධන අවස්ථා හඳුනාගැනීම සහ ඇගයීම පිණිස ඉහළම මට්ටමේ වෘත්තිකයන්ගේ විශාල මූල්‍ය ශක්තිය එය සතු බැවින් එය රටේ සමාජ ආර්ථික සංවර්ධනයේ පෙරමුණේ සිටී. රටේ උපාය මාර්ගයේ හඳුනාගෙන ඇති බලකේන්ද්‍ර හය සඳහාම අප මුදල් සපයා ඇති අතර අප රටේ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අත්තිවාරම වන යටිතල පහසුකම් සඳහා ද මුදල් යොදවා තිබේ. අපේ සේවාදායක පිරිස සමන්විත වනුයේ රටේ විශාලතම ආයතන ගණනාවකින් වන අතර පුළුල් නිෂ්පාදන පරාසයකින් සහ වර්ධනය සඳහා හැකියාව ලබාදෙන අසමසම දේශීය සහ ගෝලීය ජාලයක් හරහා ඔවුන්ගේ සංකීර්ණ අවශ්‍යතා සපුරාලයි.

රටේ උපාය මාර්ගයේ හඳුනාගෙන ඇති බල කේන්ද්‍ර හය සඳහාම අප මුදල් සපයා ඇති අතර අප රටේ අභිලාෂයන් සක්ෂාත් කරගැනීම සඳහා අත්තිවාරම වන යටිතල පහසුකම් සඳහා ද මුදල් යොදවා තිබේ.



ආයතනික බැංකුකරණ අංශය මඟින් කළමනාකරණය කරනු ලබන වත්කම් ප්‍රමාණය රු. මිලියන 710,409 ක් වන අතර එය බැංකුවේ මුළු වත්කම්වලින් 60% කි. අනුපිළිවෙලින් රු. මිලියන 63,473 ක් සහ රු. මිලියන 6,658 ක් වන බැංකුවේ මුළු ආදායමට සහ බදු පෙර ලාභයට මෙම අංශය 50% ක සහ 42% ක දායකත්වයක් ලබා දුනි. පුද්ගලික අංශයෙන් රජයෙන් සහ රජයට අයත් ව්‍යවසායකයන්ගෙන් ණය සඳහා ඉල්ලුම මධ්‍යස්ථව පැවතියද පසුගිය වසරට සාපේක්ෂව 11% ක වර්ධනයක් පිළිබිඹු කරමින් මුළු ණය සහ අත්තිකාරම් රු. මිලියන 403,300 ක් විය. සමස්ත බැංකු පද්ධතියේ මුළු ණය සහ අත්තිකාරම්වලින් 12% ක් වූ ණය කළඹක් සහිත අප, ආයතනික බැංකුකරණයේ වෙළඳපොල ප්‍රමුඛයා ලෙස අඛණ්ඩව රැඳී සිටින්නෙමු.

ආයතනික බැංකුකරණ අංශය ආයතනික ණයදීම, වෙළඳ මූල්‍යයනය, අක්වෙරළ බැංකු කටයුතු, නගර ශාඛාව සහ පිටකොටුව ශාඛාවෙන් සමන්විත වේ.

එමඟින් සපයන සේවාවන්ට ණය දීම, වෙළඳ මූල්‍යයනය, මුදල් කළමනාකරණය, ආයෝජන සේවා ව්‍යාපෘති මූල්‍යයනය, කාරක ප්‍රාග්ධන මූල්‍යයනය සහ විදේශ මුදල් ගනුදෙනු පිළිබඳව කටයුතු කිරීම අයත් වේ.

අපගේ උපාය මාර්ගික ප්‍රමුඛතා

රාජ්‍ය සහ පුද්ගලික යන දෙඅංශයේම ණය සඳහා ඉල්ලුම ආන්තික මට්ටමක නොවූ බැවින් 2013 සමස්ත බැංකු ක්ෂේත්‍රයටම අභියෝගාත්මක වසරක් විය. සිය ඉලක්ක ක්ෂේත්‍ර කළමනාකරණය කිරීම සහ මූල්‍ය සහ මූල්‍ය නොවන යන දෙයාකාරයේ ඉලක්කයන්හි කාර්යසාධනය දැඩිව අධීක්ෂණය කිරීම මඟින් ආයතනික බැංකුකරණ අංශය ප්‍රශංසනීය කාර්යසාධනයක් පෙන්නුම් කළේය.

ඉලක්ක සපුරා ගන්නා	
ඉලක්කය	**සපුරා ගන්නා ලද**
ගනුදෙනුකරුවන් ප්‍රසාදයට පත් කිරීම සඳහා සේවාවේ ගුණාත්මක බව ඉහළ නැංවීමට ආයතනගත නිපුණතා වැඩි දියුණු කිරීම.	• සම්පත් දායකයන් 400කට වඩා පුහුණු කරන ලදී. • රු. බිලියන 15ට වැඩි නිරාවරණයක් සහිත නව ආයතනික ගනුදෙනුකරුවන් 20 ක් • 5 + 1 බල කේන්ද්‍ර උපාය මාර්ග යට ඉහළම ප්‍රමුඛතාව ලබා දෙමින් අයවැයට වඩා රු. බිලියන 6.7 කින් ණය කළඹ වැඩි කරන ලදී.
ඉහළ වටිනාකමක් සහිත ගනුදෙනු ආකර්ෂණය කර ගැනීම	• වසර තුළදී මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 10,300 ක් සපයන ලදී. අති නවීන පහසුකම් සහිත ව්‍යාපාරික පාසලක් සඳහා රු. මිලියන 8,600ක අරමුදල් වෙන් කරන ලදී. හෝටල් සංවර්ධනය සඳහා රු. මිලියන 5,000 ක් ලබා දුන් අතර රෝහල් යටිතල පහසුකම් සඳහා වැය කළ මුදල රු. මිලියන 931 කි.
පොළී ආදායම වැඩි දියුණු කිරීම	• පෙර වසරට සාපේක්ෂව පොළී ආදායම 10%කින් වැඩි කර ගැනීම
ගනුදෙනු සරල කිරීම	• සේ.අ.අ./සේ.භා.අ./රේගු ගෙවීම් මධ්‍යගතව සිදුකිරීම සඳහා ඉඩ සලසනු ලැබූ "ප්‍රතිබිම්බ" පද්ධතිය සාර්ථකව දියත් කිරීම සහ ක්‍රියාවට නැංවීම

ගෝලීය බැංකුකරණයට ප්‍රවිෂ්ඨ වීම තවදුරටත් වරප්‍රසාද ලත් කිහිපදෙනෙකුට පමණක් සීමා නොවේ. ලංකා බැංකුව සිය ගනුදෙනුකරුවන් සොයා ඉතා දුරස්ථ ප්‍රදේශ කරා ළඟාවීමට සැලසුම් කරමින් සිටියි. අපි බැංකුකරණයෙන් ඔබ්බට සේවා සලසමින් සිටින්නෙමු.

මූල්‍ය කාර්යසාධනය


ප්‍රධාන කාර්යසාධන මිනුම්	2013 රු. මිලියන	2012 රු. මිලියන	පෙර වසරට සාපේක්ෂව වෙනස
පොළිය	59,644	54,242	10
ගාස්තු සහ කොමිස්	3,059	4,141	(26)
වෙනත්	770	1,100	(30)
මුළු ආදායම	63,473	59,483	7
පොළී වියදම්	32,156	22,370	44
ශුද්ධ මෙහෙයුම් ආදායම	6,658	8,076	(18)
මුළු වත්කම්	710,409	617,765	15
මුළු වගකීම්	554,034	450,551	23

පොළී අනුපාත හීන වෙමින් පැවතියද ආයතනික වත්කම් කළඹ 15% කින් ප්‍රසාරණය වීම හේතුවෙන් වසර තුළදී සිදු වූ පොළී ආදායමේ වර්ධනය 10% කි. මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම නිසාවෙන් ආනයන අඛණ්ඩව අඩුවීම නිසා සහ ප්‍රධාන වෙළඳපොළවල මන්දගාමී යළි නැඟී සිටීම හේතුවෙන් අපනයන ඉතා සුළු වශයෙන් පමණක් වැඩිවීම නිසා රටේ වෙළඳ ධාරිතාව ප්‍රකාරව ගාස්තු හා කොමිස් මත පීඩනයක් ඇති වූ අතර ක්ෂේත්‍රය තුළ පවතින දැඩි තරඟකාරිත්වයද ගාස්තු සහ කොමිස් ඌනනය වීමට දායක විය. කෙටිකාලීන පොළී අනුපාත තනි ඉලක්කමේ පැවැතීම සහ ඉල්ලුම අඩුවීම හේතුවෙන් ශුද්ධ පොළී ආන්තික හීන විය. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන ලෙසම හීන වන පොළී ආන්තික, ආයතනික ණයෙහි සීමිත වර්ධනය සහ ගාස්තු ආදායමේ පහළ වැටීම නිසාවෙන් ශුද්ධ පොළී ආදායම අඩු වුණි. බැංකුව ද්‍රවශීලව පැවැති අතර වත්කම් වර්ධනය මූලිකවම සිදුවූයේ ආයෝජන සහ රාජ්‍ය අංශයට ණය සැපයීම මඟිනි.

ණයදීම

2012 වසරේ සිදුවූ දැවැන්ත ඉහළ යාමෙන් පසුව, විශේෂයෙන්ම පුද්ගලික අංශයෙහි සිය කළඹෙහි ඉලක්කගත වර්ධනයක් කෙරේ මෙම අංශය අවධානය යොමු කරන ලදී. රටේ වර්ධනය සඳහා වූ අභිලාෂයන් මුදුන්පත් කර ගැනීම සඳහා පුද්ගලික අංශයෙන් සැළකිය යුතු ආයෝජනයක් අවශ්‍ය බැවින් පුද්ගලික අංශය සමඟ තම සබඳතා වඩාත් ශක්තිමත් කිරීම කෙරෙහි බැංකුව අවධානය යොමු කර තිබේ.


තම කළඹ විවිධාංගීකරණය කිරීමේ ඉලක්කය අනුව යමින් තම පුද්ගලික අංශයේ ආයතනික ගනුදෙනුකාර කළඹ රු. බිලියන 112 දක්වා බැංකුව ඉහළ නංවා ගන්නා ලදී. 2013 වසරේ ඉහළම ගනුදෙනුකරුවන් 20 දෙනා අතර පුද්ගලික අංශයේ ආයතනික ගනුදෙනුකරුවන් 10 දෙනෙකු සිටීම මෙම උපායමාර්ගයේ ප්‍රතිඵල පිළිබිඹු කරයි. එසේම මූලිකවම ආදායමේ සහ මුළු වත්කම්වල ඉහළයාමට දායක වූ යටිතල සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රදානය කළ පහසුකම් නිසාවෙන් රජයට අයත් ව්‍යාපාර සමඟ කළඹද රු. බිලියන 291 දක්වා වැඩි විය.



2013 වසරේදී නව ආයෝජකයන්ගේ අංශ විශ්ලේෂණය

- ඉදි කිරීම්
- අධ්‍යාපනය
- මූල්‍ය
- සේවා
- යටිතල පහසුකම්
- වෙළඳ
- නිෂ්පාදන
- සංචාරක

වාණිජ අංශය, කෘෂිකර්ම හා ධීවර අංශ සංවර්ධනය කෙරෙහි බැංකුව අඛණ්ඩව වැඩි බරක් යෙදවීම පෙන්නුම් කරන 2012 වසරට සාපේක්ෂව 2013 සඳහා අංශ නිරාවරණය පහත දැක්වෙන වගුවලින් අවධාරණය කරයි.



කර්මාන්ත අනුව විශ්ලේෂණය

- වාණිජ වෙළෙඳ
- කෘෂිකර්ම සහ ධීවර
- පාරිභෝගික
- ඉදිකිරීම්
- රජය
- නිෂ්පාදන
- ප්‍රවාහන
- වෙනත්
- යටිතල පහසුකම්
- සෞඛ්‍ය සේවා
- හෝටල්, සංචාර සහ සේවා
- බැංකු, මූල්‍ය, රක්ෂණ සහ ව්‍යාපාරික සේවා

ණය පිළිබඳ ගුණාත්මක තත්ත්වය කෙරේ සිය කැපවීම සමඟින් මෙම අංශය ඉතා යහපත් 1.48% ක අක්‍රිය වත්කම් අනුපාත සාමාන්‍යයක් (2012 : 1.51%) පවත්වා ගන්නා ලදී. ස්ථම්භ පහේ ප්‍රවේශය නමින් හඳුන්වන විස්තීරණ විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතා කරමින් සියළු නව සේවාදායකයන් ඇගයීමට ලක් කරනු ලැබේ. මෙම ක්‍රමවේදය යටතේ ප්‍රධාන ඇගයීම් නිර්ණායක වනුයේ ශක්‍ය සේවාදායකයන් කටයුතු කරන කර්මාන්තය, තරඟකාරී ස්ථානය, කර්මාන්තය තුළ උපාය මාර්ග, ශක්‍ය සේවාදායකගේ මූල්‍ය තත්ත්වය, කළමනාකරණ ගුණත්වය සහ ඇපයේ ගුණත්වය වේ.

11%

ණය වර්ධනය

ආයතනික සහ අක් වෙරළ බැංකු කටයුතු අංශය පසුගිය වසරට සාපේක්ෂව තම ණය කළඹ 11% කින් වර්ධනය කර ගන්නා ලදී.

"ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු අතුරින් ඇ. ඩො. බිලියන 1.92 ක් වන වත්කම් පදනමක් සහිත අක්වෙරළ බැංකුකරණ ඒකකය ඒ සඳහා වෙළඳපල ප්‍රමුඛයා වන අතර පෙර වසරට වඩා 3.2% ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී."

වෙළඳ මූල්‍යනය

රට තුළට සහ රටෙන් පිටතට සිදුවූ අපනයන සහ ආනයන ගනුදෙනුවල සමස්ත ධාරිතාව සැලකිය යුතු ලෙස මන්දගාමී වීමේ ලකුණු පෙන්නුම් කරන ලදී. අතිරේක බදු පැනවීම සහ වාහන ආනයනකරුවන්ගෙන් 100% ක ආන්තික අවශ්‍යතාවය නිසාවෙන් රථවාහන ආනයනයටද බලපෑම් ඇති විය. ඊට අමතරව, බැංකුවේ මැදිහත්වීම වළක්වමින් ආනයන / අපනයන සඳහා ගිණුම් මාර්ග විවෘත කිරීම සඳහා ගනුදෙනුකරුවන් අතර වර්ධනය වෙමින් පවතින ප්‍රවණතාවක් තිබේ. මෙම ප්‍රවණතාවන් මඟින් බැංකුවේ වෙළඳ මූල්‍යන ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් කර ඇති අතර පසුගිය වසරට සාපේක්ෂව ආදායම 10% කින් අඩු වී තිබේ.

ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව අනෙකුත් රාජ්‍ය බැංකු අතර සිය කළඹ විවිධාංගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එහි නිරාවරණය අඩුවීමද මෙම ප්‍රතිඵලවලින් බනිජ තෙල් සංස්ථාව හරහා ජනනය කරන ලද බැංකුවේ ගාස්තු ආදායමද රු. මිලියන 2,360 සිට රු. මිලියන 1,202 දක්වා අඩුවුණි. කෙසේ වෙතත් ඇඟලූම් කර්මාන්තයෙන් සහ නිෂ්පාදන අංශයේ ප්‍රධාන සේවා දායකයෙක් නැවී තැනීම සඳහා නැවී තැනීමේ කර්මාන්තයේ පහසුකම් භාවිතා කිරීම මඟින් ජනිත වැඩි දියුණු වූ ව්‍යාපාරික කටයුතු නිසා බනිජතෙල් නීතිගත සංස්ථාව හැර ආදායම 2012 ට වඩා 4% ක ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ප්‍රවණතාව පුද්ගලික අංශයේ ව්‍යවසාය මඟින් බලය ලබා දෙන අනාගත වර්ධනය සඳහා සුබනිමිති පහළ කරයි.

බැංකු පද්ධතිය හරහා විවෘත ගිණුම් ගනුදෙනු වෙනස් මඟකින් යැවීම සඳහා ඉඩ දෙනු ලබන ඉන්වොයිසි මිලදී ගැනීම නව නිෂ්පාදනයක් ලෙස පිරිනැමීම බැංකුව ආරම්භ කර තිබේ. මෙම නිපැයුම ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමේ ලකුණු පෙන්නුම් කර ඇති අතර එය 2014 වර්ෂයේදී නව ජවයකින් යුතුව ඉදිරියට යනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු. 2012 වසරේ සිට ප්‍රතිබිම්බ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සමඟින් තොරතුරු තාක්ෂණය සංවර්ධනය සඳහා බැංකුවේ කැපවීම නොකඩවා ඉදිරියට රැගෙන යන ලද අතර එය දැනට පවතින බැංකු වෙළඳ පද්ධතියට ඒකාබද්ධ කර ඇති අතර 2013 තුළදී තවත් ශාඛා 10 ක් එයට එක් කරන ලදී. ගනුදෙනු විශාල සංඛ්‍යාවක් ග්‍රහණය කිරීමට සහ ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මෙය බැංකුවට ඉඩ ප්‍රස්ථා සලසන අතර නගරයෙන් ඔබ්බට ගොස් පළාත් තුළට වෙළඳ මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශයද සපයයි. පරිමාණානුකූල පිරිමැසුම් ව්‍යුත්පන්න කිරීම පිණිස අඩුකළ පිරිවැයකින් මෙම සේවා පිරිනැමීමට තාක්ෂණය හැකියාව සපයනු ඇත.

අක්වෙරළ බැංකු ඒකකය

පුද්ගලික අංශයේ ණයෙහි 10%ක වැඩිවීමක් උපයා ගැනීමට අක්වෙරළ බැංකු ඒකකයට හැකි වූ අතර ප්‍රදානය කළ අත්තිකාරම්වලට අදාළ ගාස්තු කලින් එකතු කළ බැවින් ගාස්තු ආදායමේ වැඩිවීමක්ද සිදු විය. බැංකුකරණ ක්ෂේත්‍රයේ අක්වෙරළ මෙහෙයුම්වල ඉල්ලූම අඩුවීම සඳහා හේතුකාරක වූ විදේශ විනිමය ලිහිල් කිරීමේ පසුබිමක් තුළ මෙම කාර්යසාධනය සුරක්ෂිතය.

ඇ. ඩො. බිලියන 1.8 ක ආමුඛ ප්‍රේෂණ සහ ඇ. ඩො. බිලියන 2 ක බැහැර ප්‍රේෂණ අක්වෙරළ බැංකුකරණ ඒකකය හරහා ප්‍රේෂණය කරනු ලැබේ.

දිවයින පුරාම මුළු අපනයන ඉපැයුම්වලින් 20% ක සහ ආනයන ගෙවීම් වලින් 9% කින් මෙය පිලිබිඹු වේ.

ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු අතුරින් ඇ. ඩො. බිලියන 1.92 ක් වන වත්කම් පදනමක් සහිත අක්වෙරළ බැංකුකරණ ඒකකය ඒ සඳහා වෙළඳපල ප්‍රමුඛයා වන අතර පෙර වසරට වඩා 3.2% ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී.



ඉදිරි ගමන් මග

පුද්ගලික අංශයේ ගනුදෙනුකාර පදනම සඳහා සේවා සැපයීම සහ එය පිරිනමන සේවා පුළුල් කිරීම පිණිස ආයතනික බැංකුකරණ අංශය ප්‍රතිස්ථාන ගතවෙමින් සිටී. එයට අමතරව, ජාතියේ ආර්ථික වර්ධනය මඟින් පිරිනමන අවස්ථාවන්ගෙන් නිසි ඵල ලැබීමට තම ව්‍යාපාති ණයදීමේ හැකියාවන් ශක්තිමත් කිරීමට අවස්ථාව උදා වී ඇති බව එය දකී. සුවිසල් ගනුදෙනු සඳහා දිගු කාලයක් මුළුල්ලෙහි අරමුදල් සැපයීමට සහ ව්‍යාපෘතිය ආරම්භයේ සිට අවසානය දක්වා එයට අවශ්‍ය සහාය දැක්වීමට ධාරිතාවය සහ ද්‍රවශීලතාව ඇති බැංකු අතරින් එය එකක් වන බැවින් මෙයින් විපුල ඵල ලැබීමට මැනැවින් ස්ථානගතව සිටී.


එළඹෙන වසරේදී මෙම අභියෝගයන්ට මුහුණදීම සඳහා සූදානම් වීමට බැංකුව ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන තිබේ.

සේවක අංශයෙන් ගත් ගත් කළ 400ක පිරිසක් පුහුණු කිරීම සඳහා මෙම ඒකකය කටයුතු කර ඇති අතර තෝරාගත් සම්පත් දායකයන් විශේෂ පුහුණු සඳහා යොමු කර තිබේ.

ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ගනුදෙනුකරුවන්ගේ හමුවන් බැංකුව පවත්වන ලද අතර ඒ හරහා බැංකුව මධ්‍යම ආයතනික සේවාදායකයන් ඉලක්ක කර තිබේ. තම ISO සහතිකකරණය මෙම අංශය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර එය ශාඛාවන්ට පිරිනමනු ලැබේ. පිරිවැය අඩු කිරීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගත් 5S වැඩසටහන මෙම අංශය සාර්ථකව ක්‍රියාවට නැංවූ අතර 2014 මුල් භාගයේදී එය සම්පූර්ණ කිරීමට නියමිත අතර වඩා යහපත් ගනුදෙනුකාර කේන්ද්‍රීය තොරතුරු කළමනාකරණයක් ස්ථාපිත කිරීමට නව ගොනු කිරීම් පද්ධතියක් ක්‍රියාවට නංවන ලදී.

මෙම ගනුදෙනුකරුවන්ට සේවා සැපයීමේදී තොරතුරු තාක්ෂණය තීරණාත්මක සාධකය සේ පිළිගෙන ඇති අතර ප්‍රතිබිම්බ පද්ධතිය සහ ප්‍රේෂණ ක්‍රියාමාර්ග තවදුරටත් ශාඛාවන්ට ව්‍යාප්ත කිරීමට සැලසුම් කර තිබේ. තවද, ණය පහසුකම් සැපයීම මෙන්ම සේවාදායකයන් වඩා හොඳින් ග්‍රහණය කිරීම සහ සේවා සැපයීම විධිමත් කිරීම පිණිස තොරතුරු තාක්ෂණ ධාරිතා හඳුන්වා දීමට නියමිතය. තම අන්තර්ජාතික ගෙවීම් සඳහා පිවිසුම් පහසුකම 2014 දී දියත් කර සිය ණය කාඩ්පත්, ගනුදෙනු ආදායම වැඩි කරගැනීමට මෙම අංශය අපේක්ෂා කරයි.

ක්‍රියා පටිපාටි වඩා සරල කරමින්, පිරිවැය අඩු කරමින් සහ ගනුදෙනුකරුවන් ප්‍රසාදයට පත් කරමින් කළඹ සංක්ෂිප්ත කිරීම සහ විවිධාංගීකරණය කිරීම ඉදිරි වසරේ ප්‍රධාන ඉලක්කයන් වේ.


3
21
27
1
29
3
25
4
7
48
8
4
17
12
16
26
11
3
13
2
1
6
20
1
9
12
5
24
46
5
38
43
4
41
23
10
2
3
42
23
15
1
11
22
40
45
8
2
39
37
2
36
30
10
9
14
7
32
8
2
31
18
2
27
34
35
13

5+1 කේන්ද්‍ර කෙරෙහි අපගේ කැපවීම

ගුවන් සේවා කේන්ද්‍රය

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	11,776
වැයකළ වටිනාකම (රු. මිලියන)	4,184
සැපයූ ගුවන්යානා ගණන	3

නාවික කේන්ද්‍රය

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	27,719
වැයකළ වටිනාකම (රු. මිලියන)	13,399
TEU ධාරිතාව (ඒකක)	70,000
නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන	2,220
ඉන්ධන සැපයුම් ධාරිතාව (MT)	80,000
නාවික ඉදිකිරීම් පහසුකම්	3

බලශක්ති කේන්ද්‍රය

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	235,392
වැයකළ වටිනාකම (රු. මිලියන)	229,862
ජාතික සැපයුමට මෙගා වොට් පැය (Mwh)	54.5
නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන	146

දැනුම් කේන්ද්‍රය

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	11,350
වැයකළ වටිනාකම (රු. මිලියන)	1,633
පහසුකම් ලද සිසුන් ගණන	7,510
නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන	740

වාණිජ කේන්ද්‍රය

මහා මාර්ග

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	52,332
වැයකළ වටිනාකම (රු. මිලියන)	10,343
කිලෝ මීටර් ගණන	368

ජලය

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	30,882
වැයකළ වටිනාකම (රු. මිලියන)	645
ප්‍රතිලාභී පවුල් ගණන	200,000
නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන	150

ඇඟලුම්

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	44,552
වැයකළ වටිනාකම (රු. මිලියන)	65,894
සපයන ලද යන්ත්‍ර ගණන	13,240
නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන	30,699

සේවාවන්

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	5,100
වැයකළ වටිනාකම (රු. මිලියන)	7,210

සෞඛ්‍ය සේවා

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	2,063
වැයකළ වටිනාකම (රු. මිලියන)	931
රෝහල් ඇඳන් ගණන	550
නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන	200

සංචාරක කේන්ද්‍රය

වෙන්කළ වටිනාකම (රු. මිලියන)	8,783
වැයකළ වටිනාකම (රු. මිලියන)	5,200
හෝටල් කාමර ගණන	1,384
නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන	2,524
ව්‍යාපෘති ගණන	13

ගුවන් කේන්ද්‍රය

යොමු අංකය	ස්ථානය	වැයකළ වටිනාකම රු. මිලියන	වෙන්කළ වටිනාකම රු.මිලියන	සැපයූ ගුවන්යානා ගණන
1	කොළඹ	780	780	0
2	කොළඹ	3,404	10,996	3
		4,184	**11,776**	**3**

නාවික කේන්ද්‍රය

යොමු අංකය	ස්ථානය	වැයකළ වටිනාකම රු. මිලියන	වෙන්කළ වටිනාකම රු. මිලියන	TEU ධාරිතාව	නාවික ඉදිකිරීම් පහසුකම්	නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන	ඉන්ධන සැපයුම් ධාරිතාව (MT)
1	කොළඹ	9,968	9,968	0	3	1775	
2	හම්බන්තොට / කොළඹ	3,165	17,485			245	80,000
3	කොළඹ	266	266	70,000		200	
		13,399	**27,719**	**70,000**	**3**	**2,220**	**80,000**

බලශක්ති කේන්ද්‍රය

යොමු අංකය	ස්ථානය	වැයකළ වටිනාකම රු. මිලියන	වෙන්කළ වටිනාකම රු.මිලියන	ජාතික සැපයුමට මෙගා වොට් පැය (Mwh)	නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන
1	පුත්තලම	386	386	10	10
2	පුත්තලම	271	271	10	10
3	උතුර	175	275	30	10
4	මාතලේ	300	460	4.5	116
5	කොළඹ	228,730	234,000		
		229,862	**235,392**	**54.5**	**146**

සංචාරක කේන්ද්‍රය

යොමු අංකය	ස්ථානය	වැයකළ වටිනාකම රු. මිලියන	වෙන්කළ වටිනාකම රු. මිලියන	හෝටල් කාමර ගණන	නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන
1	කල්පිටිය	74	280	17	40
2	හික්කඩුව	200	520	150	300
3	කොළඹ	1,485	2,750	243	40
4	සීගිරිය	354	602	96	210
5	කොළඹ	484	799	90	200
6	කොළඹ	100	100	60	67
7	කොස්ගොඩ	650	1,137	172	300
8	කොළඹ	595	595	224	500
9	මහනුවර	351	351	120	240
10	උඩවලව	-	410	57	70
11	බත්තරමුල්ල	100	100	-	300
12	මහනුවර	186	406	56	150
13	කටුනායක	621	733	99	107
		5,200	**8,783**	**1,384**	**2,524**

දැනුම් කේන්ද්‍රය

යොමු අංකය	ස්ථානය	වැයකළ වටිනාකම රු. මිලියන	වෙන්කළ වටිනාකම රු. මිලියන	පහසුකම් ලද සිසුන් ගණන	නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන
1	මාලඹේ	215	2,000	1,010	540
2	මොරටුව	-	750	1,500	-
3	හෝමාගම	1,418	8,600	5,000	200
		1,633	**11,350**	**7,510**	**740**

වාණිජ කේන්ද්‍රය - මහා මාර්ග/යටිතල ව්‍යුහය

යොමු අංකය	ස්ථානය	මහා මාර්ග ශ්‍රේණිය	වැයකළ වටිනාකම රු. මිලියන	වෙන්කල වටිනාකම රු. මිලියන	කි. මී. ප්‍රමාණය
1	තැන්නකුඹුර රන්දෙනිගල මාර්ගය	B	1,215	2,648	34.00
2	වස්කඩුව-කැස්බෑව-බණ්ඩාරගම මාර්ගය	B	803	2,104	23.85
3	පොලොන්නරුව සෝමාවතිය මාර්ගය	B	1,279	2,750	33.00
4	ගලිගමුව රුවන්වැල්ල මාර්ගය	B	585	2,472	29.21
5	බිබිලේ ඉඟිනියාගල මාර්ගය	B	597	4,605	62.30
6	පන්නල කුලියාපිටිය මාර්ගය	B	868	1,995	26.97
7	බංගදෙණිය සිට ආණමඩුව	B	264	2,571	38.00
8	මහඔය අරලගංවිල මාර්ගය	AA	1,610	2,364	24.50
9	බෝදාගම හෙම්බාගමුව මාර්ගය		733	3,916	48.20
10	හලාවත වාරියපොළ මාර්ගය	B	504	2,615	29.40
11	තල්දූව මීවිටිගම්මාන මාර්ගය	B	1,885	1,885	18.90
12	කුරුණෑගල-නාරම්මල මාදම්පේ මාර්ගය	B	-	2,347	-
13	ඉඹුල්ගොඩ - වැලිවේරිය මාර්ගය	B	-	650	
14	වැලිගත්ත - ලූණුගම්වෙහෙර මාර්ගය	B	-	2,600	
15	වරකාපොළ - අඟුරුවැල්ල - කරවනැල්ල මාර්ගය	B	-	2,700	
16	මල්ලවපිටිය - කැප්පෙට්ටිගොල්ල - රම්බගොඩැල්ල මාර්ගය	B	-	2,750	
17	තල්ගොඩපිටිය - යටවත්ත - දොඹවෙල මාර්ගය	B	-	3,200	
18	දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර සිට හම්බන්තොට තෙක්		-	850	-
19	කොළඹ පුරය - අවධිය 1 - පෝට්සිටි		-	2,800	
20	නිවාස සහ සංවර්ධන ව්‍යාපෘතිය		-	2,700	
21	උතුර II පිටරවුම් මාර්ගය සඳහා උපදෙස් ලබා දීම		-	1,810	-
			10,343	**52,332**	**368**

වාණිජ කේන්ද්‍රය-සෞඛ්‍ය සේවා

යොමු අංකය	ස්ථානය	වැයකළ වටිනාකම රු. මිලියන	වෙන්කල වටිනාකම රු. මිලියන	රෝහල් ඇඳන් ගණන	නිර්මාණය කළ රැකියා අවස්ථා ගණන
22	කොළඹ	568	1,700	150	200
23	කොළඹ	363	363	400	-
		931	**2,063**	**550**	**200**

වාණිජ කේන්ද්‍රය - සේවා

යොමු අංකය	නම	වැය කළ වටිනාකම (චක්‍රීය පහසුකම්) රු. මිලියන	වෙන්කළ වටිනාකම රු. මිලියන
24	කොළඹ	-	600
25	කොළඹ	6,066	4,000
26	කොළඹ	1,144	500
		7,210	**5,100**

වාණිජ කේන්ද්‍රය - ජල ව්‍යාපෘති

යොමු අංකය	ස්ථානය	වැයකළ වටිනාකම රු. මිලියන	වෙන්කළ වටිනාකම රු. මිලියන	ප්‍රතිලාභී පවුල් ගණන	නිර්මාණය කරන ලද රැකියා අවස්ථා ගණන
27	පානීය ජල ව්‍යාපෘතිය, අම්පාර	145	145	200,000	150
28	පානීය ජල ව්‍යාපෘතිය,හාලිඇල	500	506		
29	හංවැල්ල හෝමාගම ජල සම්පාදන ව්‍යාපෘතිය		7,000		
30	කොස්ගම - අවිස්සාවේල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය		2,000		
31	කොළඹ නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතිය III		4,000		
32	වැලිකන්ද ජල සම්පාදන ව්‍යාපෘතිය		2,775		
33	දංකොටුව ඒකාබද්ධ ව්‍යාපෘතිය	ව්‍යාපෘති	3,800		
34	කන්දකැටිය හා මොනරාගල ජල සම්පාදන ව්‍යාපෘති	ඇරඹීමට නියමිතයි	2,000		
35	ඇහැලියගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය		3,500		
36	මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය		1,300		
37	හම්බේගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය		2,800		
38	ගෝනාපීනුවල ජල සම්පාදන ව්‍යාපෘතිය		525		
39	පිටිගල ජල සම්පාදන ව්‍යාපෘතිය		531		
		645	**30,882**	**200,000**	**150**

වාණිජ කේන්ද්‍රය -ඇඟලුම්

යොමු අංකය	නම	වැයකළ වටිනාකම (චක්‍රීය පහසුකම්) රු. මිලියන	වෙන්කළ වටිනාකම රු. මිලියන	මූල්‍ය පහසුකම් ලබා දෙන ලද යන්ත්‍ර ගණන	නිර්මාණය කරන ලද රැකියා අවස්ථා ගණන
40	මහඔය, නින්තාවූර් හා තිරුක්කෝවිල්	1,935	1,935	2000	2711
41	මන්නාරම	260	260	300	398
42	මන්නාරම	293	293	275	325
43	කොළඹ	24,434	24,434	8000	17000
44	පානදුර	2,364	2,364	800	1800
45	පානදුර	189	189	0	4015
46	හොරණ	1,879	1,879	0	1002
47	කොළඹ	3,642	3,642	1865	3448
48	තුල්හිරිය	30,898	9,556	විකිණීම සඳහා	
		65,894	**44,552**	**13,240**	**30,699**


ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර

අංශයේ කාර්යසාධනය පිළිබඳ ඒකාබද්ධ තත්ත්ව රූපයක්

කාණ්ඩය	ප්‍රධාන උපාය මාර්ගය	2013	2012
මූල්‍ය	ආදායම් වර්ධනය (%)	15.1	70.2
	ලාභදායිත්වය (රු. මිලියන)	5,592	4,815
	තැන්පතුවලට ණය අනුපාතය (%)	89.6	103.1
	ද්‍රවශීලතා අනුපාතය (දේශීය) (%)	27.7	21.8
සමාජීය	ප්‍රේෂණ සඳහා සබල ප්‍රවේශ ලක්ෂ්‍යය සංඛ්‍යාව (ගණන)	859	855
	ලංකා බැංකුව හරහා සබල කරන ලද ප්‍රේෂණ ගනුදෙනු (ගණන)	2,082,787	1,786,838
	ලංකා බැංකුව හරහා සබල කරන ලද ප්‍රේෂණ ගනුදෙනු වටිනාකම (රු. මිලියන)	308,061	283,259

භාණ්ඩාගාර සහ ජාත්‍යන්තර බැංකු කටයුතු අංශය සමන්විත වන්නේ භාණ්ඩාගාර, ජාත්‍යන්තර, විදේශ ශාඛා සහ ආයෝජන බැංකු කටයුතු යන ඒකකයන්ගෙනි. එහි නිපැයුම් හා සේවාවන්ට වත්කම් සහ වගකීම් කළමනාකරණය, ද්‍රවශීලතා කළමනාකරණය, පොළී අනුපාත අවදානම් කළමනාකරණය, මුදල් වෙළඳපල ගනුදෙනු, විදේශ විනිමය කළමනාකරණය, රජයේ සුරැකුම්පත්වල ආයෝජනය, ණයකර නිකුතුව, ස්කන්ධයන්හි ආයෝජනය, අරමුදල් කළමනාකරණ සංචිත අනුපාත පවත්වා ගැනීම, ද්‍රවශීලතා අනුපාත, නිපැයුම් මිලකරණය, ඒ. ජ. ඩෝ. බැඳුම්කරු නිකුතුව, රැකවරණ සහ භාරකරු සේවා ආදිය අයත් වේ. ජාත්‍යන්තර අංශය බැංකුවේ ප්‍රේෂණ කටයුතු සහ ලොව පුරා නියෝජිත බැංකුකරණ සබඳතා මෙහෙයවනු ලබයි.

නිෂ්පාදන කළඹ



භාණ්ඩාගාර

භාණ්ඩාගාර අංශය අපේක්ෂාවන් ඉක්මවා ගොස් මුළු ලාභයට 35% ක දායකත්වයක් ලබා දෙන ලදී. මෙම අංශය ක්‍රියාත්මක වූයේ අධි ද්‍රවශීලතාව, පහළ පොළී අනුපාත සහ දැඩි තරගකාරිත්වයකින් යුත් වෙළඳපල පරිසරයක් තුළය. අවස්ථා උපරිම කිරීමේ අරමුණු පෙරදැරිව බැංකුව විසින් යොදාගනු ලැබූ උපාය මාර්ග ඥාණාන්විතය. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව අනෙකුත් රාජ්‍ය බැංකු අතර සිය කළඹ විවිධාංගීකරණය කිරීමත් සමඟ, ඉහළ පොළී අනුපාතයක් සහිත කෙටිකාලීන විදේශ ණය ගැනුම් අඩු කිරීම සඳහා ලංකා බැංකුව අධි ද්‍රවශීලතාව යොදාගත් අතර එමඟින් වසර අවසන් වන විට ණය කළඹ 48% කින් අඩු කර ගන්නා ලදී. ශ්‍රී ලාංකික නිකුතුවක් සඳහා එදා මෙදා තුර අවම කූපන අනුපාතය වූ 5.325% කට මිල කරන ලද දෙවන පස් අවුරුදු ඇ. ඩො. මිලියන 500 බැඳුම්කර බැංකුව නිකුත් කරන ලදී. (මේ පිළිබඳ වැඩි විස්තර සඳහා පහත දැක්වෙන වගුව බලන්න.)

ණය සඳහා ඉල්ලුම පහළ මට්ටමක පැවැති සහ පොළී අනුපාත පහළ වැටෙමින් පැවැති ආර්ථික වටපිටාව හේතුකොට ගෙන පොළී ආදායමේ මූර්ත වර්ධනයක් නොවුණි. ස්ථාවර ආදායම් සුරැකුම්පත් බහුතරයක් කල් පිරීම දක්වා රඳවා ගන්නා ලදී. කෙසේ වුවත්, සිය භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ බැඳුම්කර මත සැළකිය යුතු ප්‍රාග්ධන ලාභ ඉපැයීමට බැංකුව සමත් විය.

වර්ධනය	2013 රු. මිලියන	2012 රු. මිලියන
විදේශ මුදල් අත්තිකාරම්	225,049	167,514
විදේශ මුදල් තැන්පතු	205,180	184,044


එසේම බැංකුව සඳහා දිගුකාලීන අරමුදල් ඒකරාශී කිරීම සඳහා, පවතින වෙළඳපල ද්‍රවශීලතාව සහ අඩු පොළී අනුපාත සහිත වාතාවරණයන් සාර්ථකව වාසි ලබාගනිමින් බැංකුව ප්‍රථම වතාවට අවුරුදු 10ක නිල කාලයක් සහිත දේශීය ණයකර නිකුත් කරන ලදී. එසේම අරමුදල්කරණ පිරිවැය පහළ මට්ටමක රඳවා ගැනීම පිණිස ආයෝජකයන්ට ලබා දුන් බදු සහනවලින් බැංකුව වාසි සලසා ගන්නා ලදී.

කාලසීමාව	පොළී සංඛ්‍යාතය	පොළී අනුපාතය
වසර 5	ස්ථාවර අනුපාතය - වාර්ෂිකව පොළී ගෙවයි	වසරකට 13.00%
වසර 5	ස්ථාවර අනුපාතය - අර්ධ වාර්ෂිකව පොළී ගෙවයි	වසරකට 12.60%
වසර 5	චල අනුපාතය - අර්ධ වාර්ෂිකව පොළී ගෙවයි	මාස 6 හා/බිල්පත් දළ + වසරකට 1.00%
වසර 8	ස්ථාවර අනුපාතය- වාර්ෂිකව පොළී ගෙවයි	වසරකට 13.25%
වසර 8	චල අනුපාතය - අර්ධ වාර්ෂිකව පොළිය ගෙවයි	මාස 6 හා/බිල්පත් දළ + වසරකට 1.00%
වසර 9	ස්ථාවර අනුපාතය - වාර්ෂිකව පොළී ගෙවයි	වසරකට 13.25%
වසර 9	චල අනුපාතය - අර්ධ වාර්ෂිකව පොළී ගෙවයි	මාස 6 හා/බිල්පත් දළ + වසරකට 1.25%
වසර 10	ස්ථාවර අනුපාතය - වාර්ෂිකව පොළී ගෙවයි	වසරකට 13.75%
වසර 10	චල අනුපාතය - අර්ධ වාර්ෂිකව පොළී ගෙවයි	මාස 6 හා/බිල්පත් දළ + වසරකට 1.25%

"වෙළඳපළ ප්‍රමුඛයා වන බැංකුව ප්‍රේෂණයන්හි 9% කද අනේවාසික විදේශ මුදල් තැන්පතුවල 6%කද වර්ධනයක් වාර්තා කරන ලදී."

ණයකර මඟින් ජනනය කළ අරමුදල්, 2013 දී කල් පිරෙමින් පැවැති, කලින් ගෙවීමට නියමිතව තිබූ ගෙවීම් මඟින් මතුවන ප්‍රතිපෙළගැස්ම කාර්යයන් සඳහා සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා ශක්තිමත් කිරීම සඳහා යොදා ගන්නා ලදී.


2012 දී 11.35% ක්ව පැවති ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය හා සැසඳීමේදී 2013 දී එය 12.4% ක් විය. කෙසේ වෙතත් එය නියාමන අවශ්‍යතාවන්ට වඩා තවදුරටත් ඉහළින් පවතියි.



ප්‍රාග්ධන අනුපාත ප්‍රවණතා
(රු. මිලියන)

● අවදානම් බරිත වත්කම්
— හර ප්‍රා.ප්‍ර.අ. (%)
— මුළු ප්‍රා.ප්‍ර.අ. (%)

බැංකුවේ කාර්යසාධනය




ප්‍රාග්ධන අනුපාත ප්‍රවණතා
(රු. මිලියන)

● අවදානම් බරිත වත්කම්
— හර ප්‍රා.ප්‍ර.අ. (%)
— මුළු ප්‍රා.ප්‍ර.අ. (%)

කර්මාන්තයේ කාර්යසාධනය

ණය සඳහා සැපයුම, ඉල්ලුම ඉක්මවා ගිය බැවින් වසර පුරාම අතිරික්ත ද්‍රවශීලතා මට්ටම් බැංකුව සතු විය. ලාභ ලැබීම පිණිස මෙම අතිරික්ත අරමුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන ලදී. අතිරික්ත ද්‍රවශීලතාව සමීප කාලීනව ශුද්ධ පොළී ආදායම මත නිෂේධනාත්මක බලපෑමක් ඇති කරන ලදී.


බැංකුවේ ද්‍රවශීලතා ප්‍රවණතාව



බැංකුවේ ද්‍රවශීලතා ප්‍රවණතා
ද්‍රවශීලතා ප්‍රවණතාව (%)

— තැන්පතු සහ ණය ගැනුම් වලට ණය
— මුළු වත්කම් වලට ද්‍රවශීලතා වත්කම්

කර්මාන්තයේ ප්‍රවණතාව (ශ්‍රී ලංකා මහ බැංකු මාර්ග සිතියම 2014)



බැංකුවේ ද්‍රවශීලතා ප්‍රවණතා
ද්‍රවශීලතා ප්‍රවණතාව (%)

— තැන්පතු සහ ණය ගැනුම් වලට ණය
— මුළු වත්කම් වලට ද්‍රවශීලතා වත්කම්

උද්ධමනය පාලනය කිරීමට සහ අඩු කිරීමට අඛණ්ඩව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව සහ වඩා අඩු පිරිවැයකින් ණය ගැනීමට ආයතනික සහ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා අවස්ථා උදා කරමින් පොළී අනුපාත පහළ මට්ටමක් දක්වා ක්‍රමයෙන් අඩුවනු ඇති බවටත් ශ්‍රී ලංකා මහ බැංකුව 2014 සඳහා වූ සිය මාර්ග සිතියමෙන් විස්තර කරන ලදී. පසුගිය මාස කිහිපය තුළ පටු පරාසයක ක්‍රියාත්මක වූ විනිමය අනුපාතය එළඹෙන වසර තුළදී ස්ථාවර වීම අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මධ්‍යකාලීනව 8%කට වඩා මූර්ත ආර්ථික වර්ධනයක අපේක්ෂාව සමඟ ණය වර්ධනය ප්‍රවර්ධනය කිරීමට බැංකුව දිගින් දිගටම කටයුතු කරනු ඇත.

ආර්ථික වර්ධන ප්‍රක්ෂේප පථයෙන් සහ 5 + 1 බල කේන්ද්‍ර වැඩසටහනෙන් මතුවන අවස්ථාවන්ගෙන් නිසි ඵල ප්‍රයෝජන ලබා ගැනීමට හැකියාව බැංකුවට ලබා දෙන්නා වූ දීර්ඝකාලීන ව්‍යාපෘති සඳහා වඩ වඩාත් ණය ලබා දීම සඳහා වැඩි අභිරුචියක් දැන් බැංකුවට තිබේ.

ඊට අමතරව, විදේශ ණය ගැනුම් මත රඳා පැවැත්ම අඩු කිරීමට බැංකුව නොකඩවා කටයුතු කරනු ඇත. ශ්‍රී ලංකාවේ වෙළඳපල පරිණත වීමේදී, ව්‍යුත්පන්න නිෂ්පාදන හඳුන්වාදීමට සහ ප්‍රවර්ධනය කිරීමට බැංකුව සක්‍රියව සහභාගි වනු ඇත. නව භාණ්ඩාගාර මෘදුකාංගයක් සහ වත්කම් හා වගකීම් කළමනාකරණ මෘදුකාංගයක් ක්‍රියාත්මක කිරීම සිදුකරමින් පවතින අතර ගනුදෙනුකරුවන්ට සහ බැංකුවට ප්‍රතිලාභ ලැබෙන පරිදි බැංකුවේ ගනුදෙනු මෙහෙයුම් පුළුල් කිරීමට බැංකුවට හැකියාව ලබා දෙනු ඇත.

ජාත්‍යන්තර අංශය

ලන්ඩනයේ සිය පරිපාලිත සමාගම සහ චෙන්නායි සහ මාලේ පිහිටි ශාඛා තුළින් සහ විදේශ නියෝජිතයන් සහ නියෝජිත බැංකු ජාලයක් හරහා බැංකුව දේශ සීමා ඉක්මවා කටයුතු කරයි. 2013 දී සීෂෙල්ස් හි ශාඛාවක් විවෘත කරමින් සහ තවත් අතිරේක අනුනියෝජිතයන් අටකින් සිය විදේශ නියෝජිත ජාලය ඉහළ නංවා ගනිමින් බැංකුව සියළු පෙරමුණුවල සිය ජාලය පුළුල් කරන ලදී.

විදේශ ප්‍රේෂණ රටට එවනු ලැබීමට හැකියාව ඇති කළ ප්‍රාණ නාලිය වූයේ මෙම අන්තර්ජාතික ජාලයයි.

ලොව පුරා විනිමය හුවමාරු මධ්‍යස්ථාන 96ක් හරහා අරමුදල් ප්‍රේෂණය කිරීමට ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ට අවස්ථාව උදා කළ BOC SMART REMIT ක්‍රියාවට නැංවීමත් සමඟින් තොරතුරු තාක්ෂණ ක්‍රියාමාර්ග භාවිතය වැඩි දියුණු කිරීමේ සහ ශක්තිමත් කිරීමේ බැංකුවේ ප්‍රකාශිත අරමුණු සඵල වන ලදී. ප්‍රේෂණවලින් බහුතරය පැමිණියේ මැද පෙරදිග, ඇ.එ.ජ., දකුණු කොරියාව, ඉතාලිය, සිංගප්පූරුව සහ මැලේසියාවෙනි. SWIFT බඳු ප්‍රකට ප්‍රේෂණ පද්ධති සහ අනෙකුත් ගෝලීය මුදල් හුවමාරු පද්ධති සමඟ ඒකාබද්ධ වීමට මෙම පද්ධතිය හැකියාව ලබා දෙන ලදී.

මෙම පද්ධතියේ සුවිශේෂී ලක්ෂණයක් වූ ඕනෑම ශාඛාවකින් මුදල් ලබා ගැනීමේ "Anywhere Payout" ක්‍රමය දිවයින පුරා පිහිටි ශාඛා / ව්‍යාප්ත කාර්යාල 616 සමඟ සඵලව යොදා ගන්නා ලදී. වෙළඳපල ප්‍රමුඛයා වන බැංකුව ප්‍රේෂණයන්හි 9%කද අනේවාසික මුදල් තැන්පතුවල 6%කද වර්ධනයක් වාර්තා කරන ලදී.

විධිමත් බැංකු මාර්ග හරහා මුදල් එවීමේ වැදගත්කම අවධාරණය කරනු පිණිස විදේශයන්හි මෙන්ම දේශීය ශාඛා ජාලය ආවරණය කරමින් ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සංක්‍රමණික සේවකයන්ගේ පවුල්වල සාමාජිකයන් සහ ඉදිරියේදී විදේශගතවීමට බලාපොරොත්තු වන සේවකයින් සමඟ යම් මට්ටමින් ඉලක්කගත රැස්වීම් ද මෙම අංශය විසින් පවත්වන ලදී.

ඊට අමතරව රටේ දේශපාලන තත්ත්වයන් ස්ථාවරවීමට ප්‍රතිචාර දක්වමින් විදේශීය ශාඛා ජාලය විශේෂයෙන්ම මාලේ ශාඛාව වඩ වඩාත් මෙම කටයුතුවල නිරත වීම අරඹන ලදී. මෙය හේතු කොට ගෙන ඇණහිට තිබූ ව්‍යාපෘති යළි පණගැන්වුණු අතර ඉලක්කගත පදනමකින් මෙම වෙළඳපලේ සිය ක්‍රියාකාරකම් තවදුරටත් ව්‍යාප්ත කිරීමට බැංකුව ක්‍රියාමාර්ග ගනු ඇත.

විදේශ ශාඛා මෙහෙයුම්

2013 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුව සතුව ඉන්දියාවේ චෙන්නායි හි සහ මාලදිවයිනේ මාලේ හි විදේශ ශාඛා දෙකක් ද එක්සත් රාජධානියේ ලන්ඩන් හි පරිපාලිත සමාගමක් ද ඇත. මෙම ශාඛා සහ පරිපාලිත සමාගම තැන්පතු ගිණුම්, ප්‍රේෂණ සේවා, වෙළඳ මූල්‍ය පහසුකම්, භාණ්ඩාගාර නිෂ්පාදන, ඒකාබද්ධ ණය ඒකාබද්ධකරණ සහ උපදේශන සේවා සපයනු ලැබේ.

චෙන්නායි ශාඛාව සිය ණය සහ අත්තිකාරම් රු. මිලියන 3,052 දක්වා 30% කින් වර්ධනය කළ අතර මාලේ ශාඛාවේ ණය කළඹ රු. මිලියන 7,413 දක්වා 6%කින් සුළු වශයෙන් පහත වැටුණි.

ඇ. ඩො. බිලියන 1 ක් රැස් කරමින් බැංකුව ඉතිහාසයට එක් වේ.

බැංකුව සිය දෙවන පස් අවුරුදු ඇ. ඩො. බැඳුම්කර නිකුතුව (ජ්‍යෙෂ්ඨ බැඳුම්කර 2018 දී ගෙවීමට නියමිතය) සාර්ථකව දියත් කර ඇ.ඩො. මිලියන 500 ක් උපයා ගන්නා ලදී. එම බැඳුම්කර 5.325% ක ඵලදාවකට මිල කරන ලදී. මෙම සුවිශේෂී ජයග්‍රහණය බැංකුව සඳහා වැදගත් සන්ධිස්ථාන කිහිපයක් සනිටුහන් කරන ලදී.

- බැංකුව මුලින්ම සැලසුම් කරන ලද්දේ ඇ. ඩො. මිලියන 300 ක නිකුතුවක් නමුත් ඇ. ඩො. මිලියන 2000කට අධික අර්පණ නිසාවෙන් (6.8 ගුණයකින් අධිදායක වීමෙන්) නිකුතුව ඇ.ඩො. මිලියන 500 දක්වා ඉහළ නැංවීමට ලංකා බැංකුව තීරණය කරන ලදී.
- පෙර බැඳුම්කර නිකුතුවෙන් මාස 12ක කාල සීමාවක් ඇතුළත් රැස් කරන ලද පස් අවුරුදු බැඳුම්කර
- ඇණවුම් පොතේ ගුණාත්වය සහ ශක්තිය පිළිබිඹු කරමින් මුල් මගපෙන්වීම වූ 5.50%කට වඩා අඩු 5.325% ක් ලෙස අවසාන කූපනයේ මිල කරන ලද සහ පසුගිය වසරේ මුල් බැඳුම්කර නිකුතුවට වඩා ඒකක පදනම් 155කින් අඩු වූ නිකුතුව එදා මෙදා තුර ඕනෑම ශ්‍රී ලාංකික නිකුතුවක් සඳහා වූ අඩුම කූපන අනුපාතය විය.
- නිකුතුව සඳහා එකම ප්‍රාරක්ෂක සහ සංගත කළමනාකරු වූයේ USB AG මූල්‍ය සේවා සමාගමේ සිංගප්පූරු ශාඛාවයි. මෙම නිකුතුවේ සාර්ථකත්වය පිළිබඳව බැංකුවට සහ USB ආයනයට දැඩි විශ්වාසයක් තිබූ අතර එය හේතු කොට ගෙන එක්සත් ජනපදය තුළ ආයෝජනයන් බැහැර කරමින් Reg S Only ආකෘතිය මත එය දියත් කිරීමට තීරණය කරන ලදී. මෙම ගනුදෙනුව එක් සුරක්ෂිත ශ්‍රේණිගත කිරීමක්, එක් අන්තර්ජාතික ගනුදෙනු නීති උපදේශකයෙක් සහිතව සහ කිසිදු මූලික හඳුන්වාදීමකින් තොරව එක් දිනක් ඇතුළත සම්පූර්ණ කරන ලදී. තම අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමේ සහ ජාත්‍යන්තර බැඳුම්කර වෙළඳපලේ තම ණය චක්‍රය ස්ථාපිත කිරීමේ බැංකුවේ දිගුකාලීන අරමුදල් උපාය මාර්ගයට අනුකූලව මෙම ගනුදෙනුව සිදු කරන ලදී.

අපේ ජයග්‍රහණ පිළිබඳ සහතික

Daily FT 2013 අප්‍රේල් 01

ලංකා බැංකු බැඳුම්කර සඳහා ඉහළ ඉල්ලුමක්, ඇ. ඩො. මිලියන 300 නිකුතුවට ඇ. ඩො. බිලියන 2කට වැඩි ඉල්ලුමක්

බැංකුකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වන ලංකා බැංකුව මාස 12 ක් ඇතුලත සිය දෙවන පස් අවුරුදු ඇ.ඩො. බැඳුම්කර නිකුත් කර තිබේ. බැඳුම්කර ඵලදාවේදී 5.325% ක් ලෙස මිල කර තිබේ.

ලංකා බැංකුව මුලින් සැලසුම් කර ඇත්තේ ඇ. ඩො. මිලියන 300 ක නිකුතුවක් වුවත්, ඇ. ඩො. මිලියන 2000කට අධික අර්පණ (6.8 ගුණයකින් අධිදායකවීමෙන්) නිසාවෙන් නිකුතුව ඇ. ඩො. මිලියන 500 දක්වා ඉහළ නැංවීමට බැංකුව තීරණය කරනු ලැබීය.

දිනක් තුළ සියළු ගනුදෙනු කටයුතු අවසන් වූ නිකුතුව අතිශයින් සාර්ථක වූ අතර විවිධත්වයෙන් යුත් සහභාගිත්වයක් ආකර්ෂණය කරමින් ආයෝජකයන් 140කට වැඩි පිරිසක් ඇණවුම් සිදු කළේය. එය ඉහළ ගුණාත්මක බවින් යුත් ආයතනික සහ පුද්ගලික බැංකුකරණ ආයෝජනයන් ගණනාවකගේ ශක්තිමත් සහභාගිත්වයක් වූ අතර, කණිකාකාර විභේදනය ලංකා බැංකු බැඳුම්කර සඳහා වූ විශාල ඉල්ලුම නිරූපණය කරයි.

The Sunday leader - 2013 අප්‍රේල් 04

ලංකා බැංකුව ඇ. ඩො. මිලියන 500 ක දෙවන බැඳුම්කර අලෙවි කරයි.

තම පස් අවුරුදු ඇ. ඩො. නාමනය කරන ලද බැඳුම්කර නිකුතුව 5.325% ක ඵලදාවකින් 6.8 ගුණයකින් අධිදායක වූ බව ලංකා බැංකුව තහවුරු කරයි. ෆිච් ශ්‍රේණිගත කිරීම් ආයතනය '[BB-[Exp]' ලෙස ශ්‍රේණිගත කළ සහ ආසියාවේ සහ යුරෝපයේ පමණක් අලෙවි කරන ලද නිකුතුව හරහා ඇ. ඩො. මිලියන 300 ක් රැස් කිරීමට බැංකුව පළමුව සැලසුම් කරන ලදී. 2012 වසරේදී ලංකා බැංකුව 6.875% ඵලදාවකදී ඇ. ඩො. මිලියන 500 ක් රැස් කරන ලදී. ඇ. ඩො. වෙළඳපලේ තම දෙවන නිකුතුවෙන්ම මෙවැනි ශක්තිමත් වෙළඳපලක් ග්‍රහණය කර ගැනීමට හැකිවීම සහ නිකුතුවෙන් 74% ක් සහ 26% ක් ආසියානු සහ යුරෝපීය වෙළඳපල මිලට ගත් එවැනි පුළුල් සහභාගිත්වයක් ලබාග ැනීමට හැකිවීම දිරිගන්වන සුළු බව බැංකුවෙහි නියෝජිතයෝ සඳහන් කළේය.

Lanka Business online - 2013 අප්‍රේල් 09

ලංකා බැංකුව 5.3% කට ඇ. ඩො. මිලියන 500 ක බැඳුම්කර විකුණයි.

යුරෝපය සහ ආසියාව පදනම්කර ගත් ආයෝජකයන් 140 දෙනෙකුගෙන් ඩොලර් බිලියන දෙකක ඇණවුම් ලබාගනිමින් 5.325% කට ඇ.ඩො. මිලියන 500 ක පස් අවුරුදු බැඳුම්කර තමන් විකුණූ බව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ණය දෙන්නා වන රජයට අයත් ලංකා බැංකුව පවසයි.

USB මූල්‍ය සේවා ආයතනය සංවිධානය කර කළමනාකරණය කරනු ලැබූ මෙම නිකුතුව මුලින් වෙළඳපලට ප්‍රවිෂ්ඨ වූයේ ඇ. ඩො. මිලියන 300 ක් සඳහා වුවත්, එය 6.8 ගුණයකින් අධිධායක වීමෙන් පසුව ඇ. ඩො. මිලියන 500 ක් විකුණනු ලැබීය.

ආසියානු ආයෝජකයන් බැඳුම්කරයෙන් 74% ක් ලබාගත් අතර ඉතිරිය යුරෝපීය ආයෝජකයන්ට අලෙවි කරන ලදී. ඇ.ඒ.ජ. පදනම් කරගත් ආයෝජකයන්ට එය අලෙවි නොකරන ලදී.

The Island - 2013 අප්‍රේල් 09

ලංකා බැංකු ජාත්‍යන්තර ඩොලර් බැඳුම්කර පිළිබඳ ආයෝජකයන් අතර දැඩි උනන්දුවක්

රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම බැංකුව වන ලංකා බැංකුවේ ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව ඊයේ 6.8 ගුණයකින් අධිදායක වූ අතර බැංකුව 5.325% ඵලදාවකදී ඇ.ඩො. 500 දක්වා ඉහළ නංවන ලදී. එය පසුගිය වසරේ නිකුතුවට වඩා ඒකක පදනම් 150කින් අඩුවීමකි.

එසේම මාස 12ක් ඇතුළත ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොලින් ඇ. ඩො. බිලියන 1 ක් රැස් කරමින් බැංකුව ඓතිහාසික කඩඉමක් සනිටුහන් කරන ලදී.

ලංකා බැංකුව සිය දෙවන පස් අවුරුදු ඇ. ඩො. නාමනය කරන ලද බැඳුම්කර (ජ්‍යෙෂ්ඨ බැඳුම්කර 2018 දී ගෙවීමට නියමිතය) දියත් කළේ මාස 12 ක් ඇතුළතය. බැඳුම්කර 5.325% ක ඵලදාවකට මිල කරන ලදී.

නිවේදනයක් නිකුත් කරමින් ලංකා බැංකුව ඊයේ පවසා සිටියේ තමන් මුලින් සැලසුම් කර තිබුණේ ඇ.ඩො. මිලියන 300 ක් ජනනය කිරීමට නමුත් නිකුතුව 6.8 ගුණයකින් අධිදායක කරමින් ඇ.ඩො. මිලියන 2000 කට වැඩි අර්පණ හේතුවෙන් එය ඇ. ඩො. මිලියන 500 දක්වා ඉහළ දැමීමට තීරණය කළ බවයි.

Thomson Reuters - 2013 අප්‍රේල් 09

ලංකා බැංකුව සුවිශේෂී ජයග්‍රහණයක් අත් කරගනී.

ශ්‍රී ලංකාවේ මුළුමනින්ම රජයට අයත් ණය වෙත නිරාවරණය පිණිස ආයෝජකයන් කඩිමුඩියේ ඉදිරිපත්වීම හේතු කොටගෙන ශක්තිමත් ඇණවුම් පොතක (order book) පිටුබලයෙන් වසරකට පසුව ඇමෙරිකන් ඩොලර් වෙළඳපල වෙත ලංකා බැංකුව සාර්ථකව යළි ප්‍රවිශ්ඨ විය.

ඇ. ඩො. මිලියන 500 ක් වූ Reg S බැඳුම්කර 5.325% ඵලදාවකට සම මිලට මිල කර තිබුණි. සියයට 6.875% කට Regs/144a පස් අවුරුදු බැඳුම්කර සමඟින් 2012 අප්‍රේල් මාසයේදී බැංකුව අවසන් වරට වෙළඳපල වෙත පිවිසීමේදී සපුරාගත් කූපනය මත ඒකක පදනම් 150 ක අභිවෘද්ධියක් නව බැඳුම්කර සලකුණු කරනු ලැබීය.

ගිණුම් 140කින් ඇ. ඩො. බිලියන 2 ක ඇණවුම් පොතක් බැංකුව සතු වූ අතර බැඳුම්කරවලින් 74% ක් ආසියානු ආයෝජකයන් ද 26% ක් යුරෝපීයන්ද මිලයට ගන්නා ලදී.

ඇ. ඩො. මිලියන 500 ක Reg S ගනුදෙනුව සඳහා ෆිච් ආයතනයෙන් BB ශ්‍රේණිගත කිරීම ලැබුණු අතර එය කළමනාකරණය කරනු ලැබුයේ UBS ආයතනයයි.

www.ifrasia.com - 2013 අප්‍රේල් 08

ලංකා බැංකුව නව මංපෙත් විවර කරයි.

ශ්‍රී ලංකාවේ අනෙකුත් බැඳුම්කර නිකුත් කරන්නන්ට තම ගමන් මග අනුව යාමට මග පාදමින් ලංකා බැංකුව පසුගිය සඳුදා ඇ.ඒ. ජ. ඩොලර් වෙළඳපලට සාර්ථකව යළි පිවිසෙන ලදී.

2012 අප්‍රේල් මාසයේ අවසන් වරට වෙළඳපල වෙත පැමිණි අවස්ථාවේ බැංකුව සාක්ෂාත් කර ගත් කූපනය මත ඒකක පදනම් 150 ක අභිවෘද්ධියක් නව බැඳුම්කර සලකුණු කරයි. එබැවින්, වෙළඳපල සහභාගිවන්නන් නොපැකිලව අනාවැකි පළ කර සිටියේ අනෙකුත් ශ්‍රී ලාංකික බැඳුම්කර නිකුත් කරන්නන් ලංකා බැංකුවේ ගමන් මග අනුගමනය කරනු ඇති බවයි.

හොංකොංහි සිට සිය ව්‍යාපාරික කටයුතු කරන ආයෝජකයෙක් පැවසුයේ "ලංකාවේ බැංකු ගණනාවක් තිබෙනවා. මට විශ්වසයි ඔවුන් අප පිළිබඳව විමසිල්ලෙන් සිටින බව. අපට ශ්‍රී ලංකාවෙන් ගනුදෙනු කිහිපයක් බලාපොරොත්තු වෙන්න පුළුවන්." නිසාය.

අඟහරුවාදා දිනයේ ගනුදෙනු සඳහා ඉදිරිපත් කරන මෙම බැඳුම්කර ඉංග්‍රීසි නීතිය යටතේ නිකුත් කරනු ලැබූ අතර සිංගප්පූරු කොටස් වෙළඳපොලේ ඇතුළත් කරනු ලැබ තිබේ.


www.ifrasia.com - 2013 අප්‍රේල් 13

බැඳුම්කර : ලංකා බැංකුව මග පෙන්වන්නකු ලෙස

රජයට අයත් ලංකා බැංකුව හරියටම එක් වසරක නිහැඬියාවකින් පසුව ඇ. ඩො. වෙළඳපල වෙත යළි ප්‍රවිෂ්ඨ වූ අතර 2013 දී බැඳුම්කරයක මිල නියම කරන ශ්‍රී ලංකාවේ පළමු ණයකරය බවට පත්වීමට බැංකුව අරමුණු කරද්දී එහි මෙම ගනුදෙනුව සමීප අධීක්ෂණයට ලක් වෙමින් තිබේ.

මූලික අදහසක් ලෙස මතුව ඇති 5.50% ක් හෝ ඊට ආසන්න මිලකට ලංකා බැංකුව පස් අවුරුදු Reg S නිකුතුව අලෙවි කරමින් ශ්‍රී ලංකා ණයකරවල විරල වටිනාකම සැලකිල්ලට ගැනීමේදී මේ සඳහා ඉහළ ඉල්ලුමක් පවතී යැයි අපේක්ෂා කරන අතර මුලින් සාකච්ඡා වූ මිලට වඩා අඩු මිලක් නියම කිරීමට නිකුත් කරන්නට හැකිවනු ඇත.

විදේශයන්හි අරමුදල් රැස් කිරීම සඳහා රන් පවුම මත විශ්වාසය තබනු වෙනුවට තමන් විසින්ම ඩොලර් වෙළඳපලට පිවිසෙන ලෙස රජයට අයත් ආයතනවලට රජය දැනුම් දී තිබීම නිසා ලංකා බැංකුවේ මෙම ගනුදෙනුව ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් විය. එබඳු ගණුදෙනු වලින් පළමුවැන්න විය හැක.


ලංකා බැංකුව
BANK OF CEYLON இலங்கை வங்கி



කාලය හා ස්ථානය ජය ගත් බැංකු සේවා

ලංකා බැංකුව සමඟ විද්‍යුත්-බැංකුකරණය

ලංකා බැංකුව මෑත කාලයේදී තාක්ෂණික වැඩිදියුණු කිරීම් කිහිපයකම ආයෝජනය කළ අතර ඒ ඔස්සේ බහුවිධ නාලිකා ඔස්සේ විසඳුම් හා සේවා සපයන්නට හැකි වේ. මේ ශාඛා, අතර ඇමතුම් මධ්‍යස්ථාන, නවීනතම ජාලගත හා ජංගම විහිදුවුම් වේ. මේ සියල්ල යෙදවෙනුයේ අපේ ගනුදෙනුකරුවන්ට වඩා පහසු, නම්‍යශීලී සේවාවක් සපයනු සඳහා ය.

ඔබට බැංකුව හා ගනුදෙනු කරන්නට අවශ්‍ය වන්නේ කෙසේද?

අපි ඔබට - ඔබ නිවසේ සිටියද - ගමනේ නිරතව සිටියද - ගනුදෙනු කර හැකි මංපෙත් කිහිපයක් ම විවර කරන්නෙමු. මාර්ගයත පද්ධතියට ඇතුළු වී, ජංගම දුරකථනය මඟින්, දුරකථනය ඔස්සේ හෝ ශාඛාවකට පිවිස.

මාර්ගගත විද්‍යුත් - ප්‍රකාශත
සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රවේශය
ජංගම දුරකථන පිහිටැවුම් ඔස්සේ ප්‍රවේශය
දිවයින හාත්පස ජාලගත ශාඛා පද්ධතිය
ගිණුම් හා සේවා
ගෙවීම් හා මුදල් හුවමාරු කිරීම්
නිමැවුම් හා සේවා වෙත කඩිනම් සම්බන්ධක
දේශීය හා ජාත්‍යන්තර ගෙවීම්
දුරකථන බැංකුකරණය

තොරතුරු සන්නිවේදන තාක්ෂණය

බැංකුවේ තොරතුරු තාක්ෂණ අංශය තීරණාත්මක උපකාරක සේවා කාර්යයකි. එහි භූමිකාව හොඳහැටි විද්‍යාමාන වූයේ 2013 වසරේදී අපේ තොරතුරු තාක්ෂණ කණ්ඩායම අයිසීටී පරිවර්තන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පටන්ගත් අවස්ථාවේදීය. මේ ව්‍යාපෘතියේ අරමුණ ලංකා බැංකුව, දේශීය ජාත්‍යන්තර බැංකුව වශයෙන් ගෝලීය තලයේ තරඟ කරන්නට සූදානම් බව තහවුරු කරලීමය.

මෙම ව්‍යාපෘතිය බහුවිධ පැතිකඩ සහිත එකකි. එහිලා ප්‍රමුඛ බැංකු කටයුතු අවශ්‍යතා සේ ම බැංකු ගනුදෙනු කටයුතු ද සලකා බැලෙන අතර අපේ උන්නතිකාමී ඉලක්ක කරා එළඹීමෙහි දී මුහුණපාන්නට සිදුවන නව අභියෝග හා අවදානම් විල්ලේ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ඉහළ නැංවීමද අපේක්ෂිත ය. අපේ උපාය මාර්ගික ප්‍රමුඛතාව වන්නේ වර්ධනය සඳහා වේදිකාවක් සපයන අතර ගනුදෙනුකරුවන්ට ගනුදෙනු පහසුව සලසා දීම ය. ඒ අතරතුරේ, අභ්‍යන්තර පිරිවැය කාර්යක්ෂමතා ද තොරතුරු සුරක්ෂණය හා අනුකූලතාවය කෙරේ දැඩි අවධානයක් සහිතව අභ්‍යන්තර හැකියා ඉහළ නැංවීමය. තොරතුරු සන්නිවේදන තාක්ෂණය උදෙසා දරන මේ ආයෝජනයේ ඵල නෙලා ගැනීමට නම් අපේ අභ්‍යන්තර නිපුණතා ඊට සරිලන සේ ඉහළ නැංවිය යුතුය යන මතය අපි තරයේ පිළිගන්නා අතර අප කණ්ඩායම ඒ සඳහා සූදානම් කරලනු වස් ව්‍යුහගත පුහුණු වැඩ සටහනක් මීට සමගාමීව ආරම්භ කර ඇත.

තොරතුරු සන්නිවේදන තාක්ෂණය උදෙසා 2013 වසරේදී වෙන් කළ ආයෝජනය රු.මිලියන 595 කි. ඉදිරි දෙවසර සඳහා වෙන් කර ඇති මුදල රු. මිලියන 1500 ක් වේ.

තොරතුරු තාක්ෂණ පරිවර්තනයේ කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරන කෘතහස්ත තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් පිරිසක් අප සතුව ඇත.

බැංකුවේ තොරතුරු තාක්ෂණ උපාය මාර්ග එහි ආයතනික උපාය මාර්ග හා අනුගත වී ඇත. අපගේ ඉදිරි දැක්ම වනුයේ ව්‍යාපාරික විශිෂ්ටත්වය ළඟා කර ගැනීම, ගනුදෙනුකාර අවශ්‍යතා අතික්‍රමණය හා තාක්ෂණය ඔස්සේ සීඝ්‍ර බෙදා හැරීමය. බැංකුවේ තොරතුරු තාක්ෂණ උපාය මාර්ග යේ ප්‍රධාන ඉලක්කයන් අංශ 4 කි.



බෙදාහැරීමේ නාලිකා තත්ත්වය ඉහල නැංවීම	අභ්‍යන්තර පිළිවෙත් ස්වයංකෘතය හා පවත්නා පද්ධති තත්ත්වය උසස් කිරීම	යටිතල පහසුකම් ඉහළ නැංවීම	සුරක්ෂිතතාව හා අනුකූලතාවය	**නිම කළ ව්‍යාපෘති**
				ජාතික පොදු ස්වයංක්‍රීය ටෙලර් සේවාව (Common ATM Switch) හා සම්බන්ධ වීමට පුරෝගාමීත්වය
				ප්‍රධාන උපයෝග සර්වරය වන අයි.බී.එම්-Power 7+ පද්ධතිය ස්ථාපිත කිරීම. (මේ ශ්‍රී ලංකාවේ මුල්ම ස්ථාපනයයි)
				අභ්‍යන්තර සන්නිවේදන යටිතල පහසුකම් තත්ත්වය ඉහළ නැංවීම
				සියළුම අනුශාඛා ප්‍රධාන ජාලය හා සම්බන්ධ කිරීම.
				ඇමතුම් මධ්‍යස්ථානය සඳහා අංගෝපාංග වලින් පොහොසත් උපයෝගය ස්ථාපනය කිරීම
				කාර්යාලීය සන්නිවේදන පද්ධතිය ජංගම දුරකථන දක්වා ඉහළ නැංවීම
				ආපදා තත්ත්වයකදී අඛණ්ඩව සේවා සැපයීමේ හැකියාවන් තවදුරටත් ව්‍යාප්ත කිරීම
				උකස් ව්‍යාපාරික කටයුතු උදෙසා පූර්ණ සර්වග්‍රාහී මධ්‍යගත විසඳුමක් අභ්‍යන්තරිකව සංවර්ධනය කිරීම
				ISO 27001 ක්‍රියාත්මකකරන්නට අවශ්‍ය ප්‍රතිපත්ති හා කාර්යාවලි නිම කිරීම.
				ලංකා බැංකුවේ කේන්ද්‍රීය බැංකු පද්ධතිය ධාරිතා ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (signature project) ආරම්භය
				ජාත්‍යන්තර තථ්‍ය කාල මුදල් මාරුකිරීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම
				අභ්‍යන්තරව වර්ධනය කරන ලද ආයතනික ගනුදෙනුකරුවන් සඳහා අවදානම් ප්‍රමාණන මොඩියුලය ක්‍රියාත්මක කිරීම.
				කේන්ද්‍රීය බැංකු පද්ධතිය තුල ඉස්ලාමීය බැංකුකරණ විසඳුමක් වර්ධනය කිරීම.
				වැඩිදුර සේවා පිරිනමනු සඳහා අන්තර්ජාල බැංකු පහසුකම් පුළුල් කිරීම
				සර්වර් ප්‍රශස්තකරණය ඔස්සේ හරිත තොරතුරු තාක්ෂණය
				චිප් කාඩ්පත් පුද්ගලායනය සඳහා අභ්‍යන්තර ධාරිතාව ක්‍රියාත්මක කෙරුණි

බැංකුව ප්‍රධාන බැංකු පද්ධතිය උසස් කිරීමේ ක්‍රියාවලියට මුලපිරුවේ "Signature" නම් නව සංස්කරණය සමඟිනි. මේ ව්‍යාපෘතියද එම නමින් ම හැඳින්වේ. මේ උසස්කරණය මඟින් පාර්ශවකරුවන්ගේ වාර්තාකරණ අවශ්‍යතා සපුරාලන්නට නියමිතය.

සේවා මාධ්‍යයන් උසස් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව හා සී/ස ලංකා ක්ලියර් (පුද්ගලික සමාගමෙහි) හි නිපැයුමක් වන පොදු ATM ස්විචය හා සම්බන්ධ වීම 2013 සිදු කරන ලද ප්‍රධාන පෙලේ සාර්ථක ආයාසයක් විය. මෙමඟින් බැංකු අතර සහ සම්බන්ධයේ නව යුගයක් සනිටුහන් කෙරෙනුයේ ගනුදෙනුකාර සේවා ස්ථාන සංඛ්‍යාව 2,000 කටත් වඩා වැඩි කරමිනි. මෙය, ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිදුවීමක් වූ නිසා එහි සාර්ථක ක්‍රියාත්මක කිරීමට ඉඩහසර සලසමින් ලංකා බැංකුව මුල්ම පුරෝගාමී බැංකුවක් සේ ඊට සම්බන්ධවිය. මෙය ක්ෂේත්‍රයට නව අත්දැකීමක් වූ නිසා එය ඉටු කරන ලද්දේ බැංකු අතර ගනුදෙනු බේරුම්කරණ ක්‍රියාවලිය අතිරේක අවදානමක් ද තිබියදී ය. අපේ තාක්ෂණික කණ්ඩායම මෙහිලා අවශ්‍ය යටිතල පහසුකම් සාර්ථකව ස්ථානගත කළහ. ඒ, බලාපොරොත්තුවූ කාල රාමුව තුලය.

අනෙකුත් බැංකුවලට මෙමඟින් අප රට පුරා විහිදුම ප්‍රයෝජනයට ගත හැකි වෙතත් අනෙක් අතට නව ආයෝජන අවම කරමින් වර්ධනය උදෙසා පහසුකාරකයකු වීමට බැංකුවට අවස්ථාව උදාවේ. මෙහි අවසන් ඵලාභියා වන්නේ අපේ ගනුදෙනුකරුවන්ය.

බැංකුව අන්තර්ජාල මත පදනම් බැංකුකරණයේදී තවත් උසස් කිරීම් - අනෙකුත් බැංකු හා තෙවන පාර්ශව ගනුදෙනු, බැංකුවේ ගිණුම් අතර විදේශ මුදල් මාරුකිරීම් - ක්‍රියාවට නැංවීමට පියවර ගත්තේය. අපි අපේ වෙබ් පිටුව යළි සැකසුවෙමු. ඒ, පරිශීලක මිතුරු ප්‍රවේශය, පහසු ප්‍රවේශය හා පිටු අතර ගමන් කිරීම තුලින් අවසන් ගමනාන්තය, අපේ ගනුදෙනුකරු සිතේ තබාගනිමිනි.

අභ්‍යන්තර කාර්යාවලි ස්වයංක්‍රීයතය හා පවත්නා පද්ධති උසස්කරණය

බැංකුව ප්‍රධාන බැංකු පද්ධතිය උසස් කිරීමේ ක්‍රියාවලියට මුලපිරුවේ "Signature" නම් නව සංස්කරණය සමඟිනි. මේ ව්‍යාපෘතියද එම නමින් ම හැඳින්වේ. මේ උසස්කරණය මඟින් පාර්ශවකරුවන්ගේ වාර්තාකරණ අවශ්‍යතා සපුරාලන්නට නියමිතය. මෙම ව්‍යාපෘතියේ මුළු ආයෝජනය රු. මිලියන 600 කට වඩා වැඩිවන අතර, 2014 මැදහරිය වන විට පළමු ශාඛාව උසස්කරණය සම්පූර්ණ කිරීමට නියමිතය. මෙම උසස්කරණය මඟින් පරිශ්‍රීලක ප්‍රවේශය වඩා පහසු කරවන අතර, සියළුම ශාඛා සර්වර් මධ්‍යගත කොට මුල් පෙලේ ටෙලර්වරුන්ට පහසුවක් සලසමින් ශාඛා යටිතල පහසුකම් ද ඉහළ නංවනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මඟපෙන්වීම් අනුරූපව අපේ සියළුම උප ශාඛා පූර්ණ ශාඛා බවට පත් කරන ලදී. මෙම ශාඛා මධ්‍යගත ප්‍රධාන බැංකු පද්ධතිය හා සම්බන්ධ කරමින් ගනුදෙනුකරුවන්ට වඩා ඒකාබද්ධ සේවයන් සලසන්නට අපේ තාක්ෂණික කණ්ඩායම පෙරමුණ ගත්තේ ය.

අපි, ඇමතුම් මධ්‍යස්ථානය උදෙසා ගුණාංග වලින් පිරි නවපන්නයේ උපයෝගයක් ක්‍රියාත්මක කළ අතර එමඟින් ඇමතුම් මධ්‍යස්ථානයේ ඇමතුම්කරුවන්ට, ගනුදෙනුකාර පොරොත්තු කාලය අවම කරමින් වඩා ප්‍රශස්ත ලෙස ප්‍රතිචාරය දක්වමින් වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්නට හැකිවේ.

උකස් ණය කටයුතු වල වර්ධනය හමුවේ ඒකාබද්ධ මධ්‍යගත පද්ධතියක් සකස් කරමින් අපේ කණ්ඩායම කඩිනම් ප්‍රතිචාරයක් දැක්වූහ. එමඟින් මෙම ව්‍යාපාරික අංශයේ වැඩිදියුණු කල අභ්‍යන්තර පාලන පිලිවෙතට හා තොරතුරු අවශ්‍යතා කෙරෙහිද අවධානය යොමු කෙරේ. ලාභ බෙදීමේ පිලිවෙත ස්වයංක්‍රීත කරමින් ඉස්ලාමීය බැංකුකරණ බන්ධයටද විසඳුමක් ක්‍රියාත්මක විය.

මෙයට අමතරව අප කණ්ඩායම දිවයින මුළුල්ලේම ගනුදෙනුකාර අවදානම් ප්‍රමාණ මොඩියුලයක් වර්ධනය කළහ. මෙමඟින් අප අවදානම් කළමනාකරණ අංශයට ආයතනික මට්ටමේ ගනුදෙනුකරුවන්ගේ අවදානම මූල්‍ය හා මූල්‍ය නොවන සාධක මත ප්‍රමාණනය කරන්නට ඉඩ සැලසේ.

බැංකුව කල්බදු පහසුකම් සඳහා මෘදුකාංගයක් තුන් අවුරුදු කාලයක් ඇතුළත සමස්ත ශාඛා පද්ධතිය ඔස්සේ ක්‍රියාත්මක කළේය. එය දැන් මාර්ගගත ය. තථ්‍ය කාල පදනම මත ක්‍රියාත්මක වේ. අතුරු මුහුණතක් (interface) මඟින් ප්‍රධාන බැංකු පද්ධතිය හා සම්බන්ධිත අතර ණය තොරතුරු කාර්යාංශයේ වාර්තාකරණයට පහසුකම් සපයයි.

අපර-ව්‍යුහ තත්ත්වය ඉහළ නැංවීම

බැංකුව ප්‍රබල අයි.බී.එම්. Power 7+ සර්වර භාවිතා කොට පවත්නා අපර-ව්‍යුහය ධාරිතා ඉහළ නැංවීය. මේ හරහා බැංකුවේ ප්‍රධාන බැංකුකරණ පද්ධතිය ඇතුළුව ව්‍යාපාරික අංශයට තීරණාත්මක උපයෝගයන් කිහිපයක්ම ධාවනය කෙරෙනුයේ තාක්ෂණික ඉහළ තලයකට නැංවෙන පසුබිම මත ඒ හා අනුගත වෙමිනි. ඒ හැර මේ තුළින් බැංකු කර්මාන්තයේ නිබඳ වර්ධනය වන දත්ත පරිමාවන් සංවිධිත කරන්නටද හැකිවේ. මෙම සර්වර් තුල දක්නට ලැබෙන උසස් තාක්ෂණික ගුණාංග සිඹ්‍ර එමෙන් ම විශ්වාසනිය ගනුදෙනුකාර සේවයක් සලසනු ඇත.

බැංකුව සිය අතිරික්ත සම්බන්ධිත වැඩිකරමින් ඉහළ මට්ටමේ පොරොත්තුව රඳවා ගැන්මට මෙන් ම සන්නිවේදන කාලපරාස අවම කරන්නටද කටයුතු කළේය. කලාප පළල පුළුල් කරන ලද්දේ Signature ව්‍යාපෘතියේ අපේක්ෂිත උසස්කරණය තුළින් මතුවන අවශ්‍යතා සපුරාලනු පිණිසය.

බැංකුව සිය හරිත තොරතුරු තාක්ෂණ වැඩසටහනට මුලපිරුවේ ප්‍රධාන කාර්යාලයේ හා ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ පැවති සර්වර් 25 වෙනුවට සර්වර් 03 ක් ආදේශ කරමින් සිය අතථ්‍යකරන ක්‍රියාවලියේ මුල් අදියර ක්‍රියාත්මක කරමිනි. අතථ්‍යකරණය අන්තර්ගත සර්වර් විසඳුමක් තුළින් සර්වර් උපයෝගිතාව වැඩිකරන්නට, බලශක්ති පරිභෝජනය අවම කරන්නට හා භෞතික ඉඩකඩ නිදහස් කරන්නටද හැකිවේ.

වැඩිවූ සර්වර් පරිහරණය 6% සිට 60%

25 ක් වූ දෘඩාංග ඒකක 03 කට අඩු කරන ලදී

බලශක්ති පරිභෝජනය 75% කින් අවම කෙරුණි

ආරක්ෂණ හා අනුකූලතාව

ISO 27001 ප්‍රමිතිය මත පදනම්ව සංවර්ධනය කළ ආරක්ෂක ප්‍රතිපත්තිය ක්‍රියාවලීන් හා මඟපෙන්වීම් බැංකුව විසින් භාවිතා කරන්නට මුලපුරා ඇත. මෙම ක්‍රියාත්මක කිරීම දැනට බැංකු ජාලය හරහා සිදුවෙමින් පවතී.

බැංකුව තම ආපදා ප්‍රතිසාධක මධ්‍යස්ථානයෙහි (DRC) සර්වග්‍රාහී ආපදා ප්‍රතිභාධන වැඩ සැලැස්මක් ස්ථාපිත කර ඇත. මෙම මධ්‍යස්ථානයෙහි, සියළුම තීරණාත්මක උපයෝගයන් සඳහා පහසුකම් සලසා ඇති අතර සියළුම ප්‍රධාන උපයෝගයන් සඳහා මාර්ගගත ප්‍රතිගුණන පහසුකම් විවර කර ඇත. මෙයට අමතරව, ආපදා අවස්ථාවකදී ප්‍රධාන කාර්යාලීය තීරණාත්මක අංශ, මධ්‍යස්ථානය තුලදී මෙහෙයුම් කරන්නට ඉඩකඩ ද සලසා තිබේ. බැංකුව තම ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම සාර්ථකව අත්හදා බලා ඇත්තේ ආපදා ප්‍රතිසාධන පොරොත්තුව වසර තුල දෙවතාවක් පරීක්ෂා කරමිනි.


තොරතුරු තාක්ෂණ යහපාලනය

මෙම අංශයට, ව්‍යාපාර අඛණ්ඩත්ව කළමනාකරණ මෙහෙයුම් කමිටුව හා මෙහෙයුම් අවදානම් කළමනාකරන විධායක කමිටුව බඳු ප්‍රධාන පෙළේ කමිටු ගණනාවක නියෝජනය ඇත. සියළුම තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති අනුමත කරන හා පසු විපරමෙහි නියුතු තොරතුරු තාක්ෂණ හැසිරවීම් කමිටුව, මහා කළමනාකාරතුමාගේ සභාපතීත්වය යටතේ මෙහෙයැවේ.

ආයතනික දත්ත සුරක්ෂිත, කමිටුවද මහා කළමනාකරු යටතේ ක්‍රියාත්මක වන අතර බැංකුවේ තොරතුරු සුරක්ෂිතතා ආයාසයන් එතුමාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

ඉදිරි වපසරිය

බැංකුවේ ඊළඟ වර්ධන අදියර ඉදිරිපෙළ මෙහෙයුම් මෙන්ම පසුපෙළ ක්‍රියාවලීන් ද ආවරණය කෙරෙන තාක්ෂණික මෙහෙයැවීමක් බවට හඳුනාගෙන ඇත. බැංකුව මෙම කුළුණු හතර ඔස්සේ ඉදිරියට මෙහෙයවන ප්‍රධානතම තාක්ෂණ බද්ධ උපාය මාර්ගයන් කරා අවතීර්ණ වෙමින් සිටී.



උපාය මාර්ගික තාක්ෂණික අරමුණු සාර්ථකව ඉටු කර ගත හැකි බවට බැංකුව තුළ විශ්වාසයක් ඇත. තවද බැංකුව තම අන්තර්ජාල බැංකු කටයුතු ධාරිතාව අබණ්ඩව පවත්වාගෙන යාමට හා වැඩිදියුණු කිරීමටත් නව ජංගම බැංකුකරණ පද්ධති ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට අරමුණු කර ඇත. ආයතනික ගනුදෙනුකරුවන්ගේ සියළුම අවශ්‍යතා, විශේෂ ආකාරයකට සැලසූ විසඳුම් තුළින් 99.5% සේවා අවස්ථාවන් ළඟා කර ගැනීම හා බෙදා හැරීම් නාලිකා ප්‍රසාරණයන් සමඟ පැය 24ක් ක්‍රියාත්මක වන දුරකථන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගෙන ඇත.

වගකීමක් සහිත සේවා යෝජකයෙක්

ලංකා බැංකුව, බැංකු හා මූල්‍යකරණ ක්ෂේත්‍රයේ විශාලතම සේවයා ය. ගණනින් 8,883 ක් වන අපගේ ක්‍රියාශීලී කණ්ඩායම දිවයින පුරා ශාඛා 567 ක හා ඉන්දියාව, මාලදිවයින හා සීෂෙල්ස් රාජ්‍යයේ සේවය සලසති. ඉහළ මට්ටමක සහභාගීත්වයක් විදහාපාන මෙම කණ්ඩායම 99% ක රඳවා ගැනීමේ ප්‍රතිශතයක් වාර්තා කර ඇත. 2013 වසර තුළ සමස්ත නව බඳවා ගැනීම් 1,706 ක් විය. මින් 1110 ක් නව තනතුරු වන අතර 596 ක් වසර තුළ පුරප්පාඩු වූ තනතුරු පිරවීමට බඳවා ගන්නා ලදී. අපි අපගේ හැකියා සංචිතය සංවර්ධනය කරනු සඳහා සර්වග්‍රාහී පුහුණු කිරීම් හා සංවර්ධන ක්‍රියාදාමයක් ව්‍යුහගත කර ඇති අතර, අපේ මානව සම්පත් උපාය මාර්ගයේ එක් කුළුණක් වන ඒ සඳහා වසර තුළ රු.මිලියන 235.8 ක පිරිවැයක් ආයෝජනය කර ඇත්තේ දේශීය හා විදේශීය පුහුණු වැඩ සටහන් ව්‍යුහගත්ය.


	ප්‍රමුඛ උපාය මාර්ගය	ප්‍රමිතිකය	2012	2013	2014 ඉලක්කය
මූල්‍යමය	සේවක කාර්යඵලය	එක් සේවකයෙකු ව්‍යුහගත්ලේ ලාභය (රු.'000)	2,541	1,768	2,028
	කාර්යසාධන ප්‍රතිශතය - ගෙවීම් සාමාන්‍ය වැටුපේ ප්‍රතිශතය	%	16%	16%	16%
	පුහුණුකිරීම් ව්‍යුහගත්ලේ ආයෝජනය	රු.මිලියන	196.0	235.8	288.2
පාරිසරික	පරිසරය හා බැඳුණු වැඩසටහන් තුළ සේවක සහභාගීත්වය	සහභාගී වූ සේවක සංඛ්‍යාව	බැංකුව පාරිසරික වැඩ සටහන්වල වැදගත්කම අවබෝධ කර ඇත. රටපුරා හැම ශාඛාවකම සේවක පිරිස පාරිසරික වර්ධන වැඩසටහන් තුළ සක්‍රීය සහභාගීත්වයක් පළ කරති.		
සමාජයීය	සම අවස්ථා සපයන සේවායා	ස්ත්‍රී-පුරුෂ සහභාගීත්වය	පුරුෂ– 3,866 ස්ත්‍රී– 3,924	පුරුෂ- 4,240 ස්ත්‍රී – 4,643	කාර්යඵල ඇගයීම් ක්‍රියාදාමය මත අනුයුක්ත කරනු ඇත.
	වෘත්තීය සමිති	සාමාජිකයන් සංඛ්‍යාව	7,634	7,046	උපරිම සහභාගීත්වය

කළමනාකරණ ප්‍රවේශය

අධ්‍යක්ෂ මණ්ඩලයේ මානව සම්පත් හා වේතන කමිටුව බැංකුව තුළ කුසලතා සංවර්ධනය මෙන්ම අනුප්‍රාප්තික සැලසුම්කරණය තුළ සුපරීක්ෂණ වගකීම් පැවරී ඇත. ගණනින් සිව්දෙනෙකු වන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත මේ කමිටුව බැංකුවේ වාර්තාකරණ හා යහපාලන ව්‍යුහයන් ද ප්‍රමුඛ කළමනාකරණ සේවක ගණයේ බඳවා ගැනීම්, උසස් කිරීම් හා කාර්යඵල සමාලෝචනය අනුමත කරන අතර, වේතන ගෙවීම් ඇතුළුව මානව සම්පත් ප්‍රතිපත්තිද අනුමැතියට ලක් කොට, මානව සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය අධීක්ෂණය කරයි. මහා කළමනාකරු, නියෝජ්‍ය මහා කළමනාකරුවන් හා සමාන්තර ශ්‍රේණිගත සේවක පිරිස ප්‍රමුඛ කළමනාකරණ සේවක ගණය සේ සැලකෙති.


මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අරමුණු සහ ඉලක්ක බැංකුවේ සමස්ත ආයතනික සැලැස්මට අනුරූපව උපාය මාර්ගික අවශ්‍යතා පදනම් කොට සකස් කරනු ලබන්නේ මානව සම්පත් හා වේතන කමිටුව විසිනි. නියෝජ්‍ය මහා කළමනාකරු-මානව සම්පත් එහි ක්‍රියාකාරී සාර්ථකත්වය පිළිබඳව වග කියයි.

බැංකුවේ මානව සම්පත් ව්‍යුහය පහත දැක්වෙන පරිදිය.



මානව සම්පත් ප්‍රතිපත්ති රාමුව

ශ්‍රී ලංකාවේ කම්කරු නීති සහ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සුචරිත කාර්ය වැඩසටහන බඳු ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත පරිචයන් මත පදනම් සර්වග්‍රාහී ප්‍රතිපත්ති රාමුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස්කොට අනුමත කරනු ලැබ ඇත. ඒ, සේවක මානව හිමිකම් සුරකින පරිදි මෙන්ම ආයතනයේ සංස්කෘතිය ඔස්සේ ඉහළ මට්ටමේ කාර්යඵලයක් ලබාගනුද පිණිසය. මෙම ප්‍රතිපත්ති රාමුව තුළ, බඳවා ගැනීම්, සේවක සංවර්ධනය හා රඳවා ගැනීම් කෙරේ අවධානය යොමු කරන මූලික අංගෝපාංග සයක් අන්තර්ගතය. මෙම රාමුව පහත සටහනින් නිරූපණය වේ. මෙම ප්‍රතිපත්ති, වසර තුනකට වරක් සමාලෝචනය කරන අතර, විෂයබද්ධව අදාළ වන බව මෙන්ම ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන් හා අනුකූල වන බවට තහවුරු කරනු සඳහා නිබඳව සංශෝධනය කෙරේ. බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්ති අඩංගු සේවක අත්පොතක් සේවක පිරිස අතර බෙදාහැර ඇත. එමඟින් ඔවුන් බැංකුවේ ප්‍රතිපත්ති රාමුව හා අනුකූලව කටයුතු කරන බවට තහවුරු කරන අතරේ සෙසු පරිපාලන විධිවිධාන පිළිබඳවද කරුණු පැහැදිලි කරයි.



බඳවා ගැනීම් හා සම අවස්ථා

බඳවා ගැනීම් සිදු කෙරෙනුයේ ව්‍යාපාරික අවශ්‍යතා මත පදනම්වය. බැංකුව, නිසඟ දක්ෂතා, හැකියාව හා අපේක්ෂාවන් සහිත ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීමට අපේක්ෂා කරනුයේ ස්ත්‍රී-පුරුෂ භාවය, ජන වාර්ගිකත්වය, හෝ රට තුළ භූගෝලීය පිහිටීම නොතකා හරිමිනි.

කාර්ය-ඵල මත පදනම් ඇගයීම

ස්ථාපිත කර ඇති කාර්ය ඵල මත පදනම් ඇගයීම් ක්‍රියාදාමය විසින් සියළුම කාර්ය මණ්ඩලය ආවරණය කෙරෙන අතර විකඟවූ ප්‍රමාණාත්මක හා ගුණාත්මක අරමුණු ඔස්සේ ඔවුන්ගේ කාර්ය ඵලය මනී. මේ හැර ඒ තුළ සේවකයින්ගේ පුහුණු කිරීම් අවශ්‍යතා මෙන්ම වෘත්තීයමය ප්‍රගති අවස්ථා ළඟා කර ගැනීමට ඇති සූදානම ද විමසා බලයි.



වෘත්තීය මංපෙත් සංවර්ධනය

සමස්ත කාර්ය මණ්ඩලයටම බැංකුවට අදාළ ක්ෂේත්‍රයන් තුළ ජීවිතාන්ත අධ්‍යයන අවස්ථා ලබාදෙන බවට බැංකුවේ පුහුණුකිරීම් හා සංවර්ධන ක්‍රියා පිළිවෙත් තහවුරු කරයි. ඒ සමගම ප්‍රදානය කරන ආයතන අපේක්ෂා කරන මට්ටමේ පුහුණුව හා උපදේශනය ලබාදෙන බවටද වග බලා ගැනේ. අප, මූලික වශයෙන් බඳවා ගැනීම් කරනුයේ ආරම්භක තලයෙන් බැවින්, වෘත්තීය මංපෙත් සංවර්ධනය අතිශයින් වැදගත් අංගයක් වේ. අපේ කණ්ඩායම හා ඔවුන්ගේ කාර්යඵලය මෙහි කාර්යක්ෂමතාවයට සාක්ෂි දරයි.

නිපුණතා සංවර්ධනය හා පුහුණු කිරීම්

සේවකයන්ගේ මුදු නිපුණතා හා තාක්ෂණික නිපුණතා, ස්ථාපිත නිපුණතා හා පුහුණු කිරීම් වැඩ සටහනක් ඔස්සේ තහවුරු කරනු ලබන්නේ ඔවුන් වෘත්තීය දිවිපෙවෙත මුළුල්ලේම සංවර්ධනය කරමින් බැංකුව තුළ වෘත්තීය හිණිහිස තුළ ප්‍රගතිය අත්පත් කර ගැනීමට පහසුකාරකයක් වෙමිනි. අපේ ව්‍යාපාරික අවශ්‍යතා මත සේවකයන් විසින් ළඟා කරගත යුතු නිපුණතා, සාමූහිකව අත්පත් කරගන්නා බව තහවුරු කරගනු වස් ඔවුන්ට ඇවැසි දේශීය හා විදේශීය පුහුණුව සැපයේ. වසර මුළුල්ලේම පුහුණු කිරීම් ලබාදීමට අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපිත කර ඇති අතර, මෙහිලා 100% සාර්ථකත්වය උදා කර ගැනීම පිළිබඳව අභිමානවත් වන්නෙමු.

කාර්මික සබඳතා

බැංකුව ඇතුළත ලියාපදිංචි වෘත්තීය සමිති හයක් ක්‍රියාකාරී වන අතර, ඔව්හු සාමූහික කේවල් කිරීමේ ක්‍රියාදාමය ඔස්සේ කළමනාකාරිත්වය සමඟ සක්‍රීයව කටයුතු කරති. සමස්ත කාර්ය මණ්ඩලය අතරින් 80% ක් වෘත්තීය සමිති සාමාජිකයන් වන අතර බැංකුව 1989 සිට ඔවුන් හා සාමූහික ගිවිසුම්වලට එළඹෙයි. අවසන් සංශෝධිත සාමූහික ගිවිසුම 2012 වසරේදී එකඟවන ලදී . නවතම ගිවිසුම යටතේ සේවක මණ්ඩලය වෙත පහසුකම් හා ප්‍රදාන රැසක්ම පිරිනමනු ලැබීය. 2013 වසර තුළදී බැංකුව පූර්ව ක්‍රියාකාරී පදනමක් මත වෘත්තීය සමිති හා එක්ව කටයුතු කළේ ඔවුන්ගේ ගැටළු හඳුනාගෙන සමථයකට එළඹීම අරමුණු කරගෙනය. මේ මඟින් වර්ධනය වූ සබඳතාවයක් පවත්වා ගත හැකිවිය.

සේවා-ජීවන තුලිතය

සේවක රඳවා ගැනීම් හා සංවර්ධනය පහසුකරණය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වනුයේ මනා සේවා-ජීවන තුලිතයක් බව අපි වටහාගෙන සිටින්නෙමු. මෙකී තුලිතයට බලපාන ගැටළු පූර්ව-ක්‍රියාකාරී මානව සම්පත් හමු තුළින් නිරාකරණය කිරීමට ද පියවර ගෙන ඇත. අප බැංකුවේ නිවාඩු නිකේතන හා ඉසිඹු නිවස්න තුළින් සේවක මණ්ඩලයට සහනදායී මිල ගණන් මත නිවාඩු ගතකිරීමේ පහසුකම් සලසන්නේ ඔවුන්ට හා පවුල්වලට දැරිය හැකි මට්ටමේ ගුණාත්මක විනෝද කාල පරාසයක් ලබාදෙනු සඳහාය.

නිර්වචනය කළ ප්‍රතිලාභ හා සැලසුම්

ලංකා බැංකුව තුළ ක්‍රියාත්මක දායකත්ව අර්ථ සාධක අරමුදල හා වැන්දඹු-අනත්දරු විශ්‍රාම අරමුදල ඔස්සේ පුළුල් පරාසයක ප්‍රතිලාභ සැලසේ. මෙයට අමතරව, දායකත්ව-රහිත ලංකා බැංකු විශ්‍රාම අරමුදල මඟින් පශ්චාත්-විශ්‍රාම මූල්‍ය රැකවරණයක් තහවුරු කෙරේ. මෙම අරමුදල් ත්‍රිත්වයම කණ්ඩායම් සාමාජිකයන් හා විශ්‍රාමිකයන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩල මඟින් මෙහෙයවනු ලැබේ. අරමුදල් අනාගත කාල පරාසයන් තුළ අගය එකතු වන සේ විචක්ෂණශීලී ලෙසින් ආයෝජනය කරනු ලබන බවට භාරකාර මඩුල්ල වග බලා ගනී. වාර්ෂිකව කෙරෙන ආයු-ගණක තක්සේරු මඟින් අරමුදල් සැපයුමේ ඌනතා හඳුනාගෙන ඒ සඳහා පිළියම් නිර්දේශ කරයි. මෙම අරමුදල් වෙනුවෙන් පවත්වන වාර්ෂික සභා රැස්වීම්වලදී සාමාජිකයන්ට මුදල් කළමනාකරණය පිළිබඳව ප්‍රශ්න නැඟිය හැකිය.

දුක්ගැනවිලි සමථය

බැංකුව සතුව ඉදිරිපත් කරන දුක්ගැනවිලි සමථය සඳහා ස්ථාපිත යාන්ත්‍රණයක් මෙන්ම රටේ කම්කරු නීතිය හා අනුකූල විධිමත් විනය පරීක්ෂණ ක්‍රියා පිළිවෙතක් ඇත. බැංකුව තුළ ක්‍රියාත්මක 'අනතුරු හැඟවීමේ ප්‍රතිපත්තිය' ඔස්සේ සියළුම සේවකයන්ට පැමිණිලි සුපරීක්ෂකවරයා වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.

කණ්ඩායම් පැතිකඩ

අපේ කණ්ඩායමේ සංයුතිය මානව සම්පත් ප්‍රතිපත්ති රාමුව නොකඩවා වෙනසක් රහිතව ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කරයි. පහත දැක්වෙන දත්ත, ස්ත්‍රී-පුරුෂ භාවය, වයස, භූගෝලීය ස්ථානගත වීම හා ජනවාර්ගිකත්වය අනුව, කණ්ඩායමේ විවිධත්වය නිරූපණය කරයි.

බඳවා ගැනීම්

රැකියා අවස්ථා, වැටුප්, අනෙකුත් ප්‍රතිලාභ හා උසස්වීම් හමුවේ ලංකා බැංකුව, ස්ත්‍රී-පුරුෂ භාවය, වයස හා ආගමික විශ්වාස නොතකන සම අවස්ථා සපයන සේව්‍යයෙකි. අපේ ප්‍රතිපත්තිය මත හැකි සෑම අවස්ථාවකම වෙනස් වූ හැකියාවන් ඇත්තවුන්ද බඳවා ගැනීමට පහසුකම් සලසා ඇත. ඔවුන් සාමාන්‍ය සේවක කණ්ඩායම හා මැනවින් අන්තර්ග්‍රහණය කෙරෙන අතර දැනටමත් මේ ප්‍රතිපත්තිය යටතේ දහ දෙනෙකු සේවයට බඳවා ගෙන ඇත. ගණනින් 567 ක් වන,

රැකියා ස්වභාවය අනුව කණ්ඩායම	2013			2012		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ස්ථිර	4,240	4,643	8,883	3,866	3,924	7,790
ස්ථිර-කාල කොන්ත්‍රාත්	10	1	11	68	3	71
බාහිරින් සපයාගත්	1,133	18	1,151	1,083	24	1,107
එකතුව	5,383	4,662	10,045	5,017	3,951	8,968

රැකියා වර්ගීකරණය මත	2013			2012		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ආයතනික කළමනාකාරීත්වය	12	2	14	8	3	11
විධායක කළමනාකාරීත්වය	38	6	44	42	7	49
ප්‍රධාන කළමනාකරු	62	25	87	71	26	97
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	111	41	152	118	49	167
කළමනාකරණ හා නිලධාරී ශ්‍රේණි	1,575	1,809	3,384	1,575	1,480	3,055
බැංකුකරණ/කළමනාකාර පුහුණුවන්නන්	70	97	167	151	196	347
මාණ්ඩලික සහකාර හා සමාන්තර ශ්‍රේණි	1,782	2,648	4,430	1,061	2,144	3,205
කාර්යාල සහකාර හා සමාන්තර ශ්‍රේණි	590	15	605	840	19	859
එකතුව	4,240	4,643	8,883	3,866	3,924	7,790

භූගෝලීය පිහිටීම මත	2013			2012		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
බස්නාහිර පළාත	1,893	2,092	3,985	1,768	1,922	3,690
මධ්‍යම පළාත	352	398	750	347	317	664
නැගෙනහිර පළාත	295	180	475	242	145	387
උතුරු පළාත	283	251	534	245	215	460
උතුරු මැද පළාත	316	275	591	261	234	495
වයඹ පළාත	356	387	743	314	297	611
සබරගමුව පළාත	255	315	570	196	250	446
දකුණු පළාත	288	486	774	317	344	661
ඌව පළාත	202	259	461	176	200	376
එකතුව	4,240	4,643	8,883	3,866	3,924	7,790

ඒ ඒ ශ්‍රේණි මත සේවක පිරිස අතර වයස් කාණ්ඩ ව්‍යාප්තිය

වයස් කාණ්ඩය	ආයතනික කළමනාකාරිත්වය	විධායක කළමනාකාරිත්වය	ප්‍රධාන කළමනාකරු	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	කළමනාකරු හා නිලධාරී	බැංකු කළමනාකරණ පුහුණු වන්නන්	බැංකු සහකාර සමාන්තර	කාර්යාල සහකාර සමාන්තර	2013 එකතුව	2012 එකතුව
55 – 60	8	32	56	104	1,290	0	304	110	1,904	2,077
45 – 54	6	11	25	43	591	0	274	134	1,084	1,396
35 – 44	0	1	2	5	483	2	115	137	745	722
25 – 34	0	0	4	0	1,020	165	2,078	150	3,417	2,855
18 – 24	0	0	0	0	0	0	1,659	74	1,733	740
Total	14	44	87	152	3,384	167	4,430	605	8,883	7,790

නව බඳවා ගැනීම් අතර 1,265 ක් බස්නාහිර පළාතෙන් බැහැර පළාත්වලින් විය. එමඟින් කුසලතා පූර්ණ පළාත්බද යෞවනයන් අපේ කණ්ඩායමට ඇතුළු වී රටේ ආර්ථික සෞභාග්‍යයේ කොටස්කරුවන් වන්නට අවකාශ සලසන ලදී.


රට තුළ පැතිරුණ විශාලතම ශාඛා ජාලය දිවයිනේ හැම ප්‍රධාන පෙළේ පළාතක්ම සමසේ නියෝජනය කරන අතර, නව සේවකයන් බඳවා ගැනීමේදී ළඟපාත පදංචිකරුවන් කෙරේ ලැදියාවක් දක්වනුයේ පෙදෙස්බද ප්‍රජාව සමඟ අන්‍යොන්‍ය ක්‍රියාකාරිත්වය ඉස්මතු කිරීමේ අරමුණෙනි.

හැම නවක සේවකයෙක්ම විස්තීර්ණ හා විනිවිද භාවය සහිත තෝරා ගැනීමේ ක්‍රියා පිළිවෙතක බඳුන් කෙරේ. බඳවා ගැනීමට පෙර සියළුම අයදුම්කරුවෝ විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට හා ඉන් අනතුරුව තීව්‍ර සම්මුඛ සාකච්ඡාවකටද බඳුන් කෙරෙති. නවක සේවකයන් ආරම්භක තලයේදී - මාණ්ඩලික සහකරුවන්, ලේකම් සහායකයන් හා කාර්යාල සහායකයන් ලෙස බඳවාගනු ලබන අතර, සුදුසුකම් සහිත වෘත්තිකයන් හා උපාධිධාරීන් කළමනාකරණ පුහුණුවන්නන් ලෙසින් බඳවා ගැනේ. සුළු ප්‍රමාණයක විශේෂ බඳවා ගැනීම් කෙරෙනුයේ විශේෂඥ දැනුමැති වෘත්තිකයන් සඳහා වන අතර එය කෙරෙනුයේ බැංකුවේ උපාය මාර්ගික ව්‍යාපාරික අවශ්‍යතා මතය. මෙහිලා අපේ මුඛ්‍ය උපාය මාර්ගය වන්නේ අප කුසලතා සංචිතය, වෘත්තීය ප්‍රගතිය තහවුරු කෙරෙන බාහිර සුදුසුකම් භාවිතා කරමින් සංවර්ධනය කොට, සේවාස්ථ පුහුණුව, අභ්‍යන්තර තාක්ෂණික පුහුණුවීම් හා මෘදු නිපුණතා වර්ධනය ඔස්සේ සුමට කරලීමය.

වසර තුළදී නව බඳවා ගැනීම් 1,706 ක් සිදු කෙරුණු අතර ඉන් බහුතරය වූ 1,688, මාණ්ඩලික සහකරුවන් විය. ඒ අතර විශේෂ අවශ්‍යතා සහිත එක් අයෙකුද විය. සියළුම බඳවා ගැනීම් කෙරෙනුයේ බැංකුවේ අවශ්‍යතාවයට අනුරූපවය. නව බඳවා ගැනීම්වලදී බැංකුව පවත්නා පුරප්පාඩු මෙන්ම අනාගත අවශ්‍යතාද සැලකිල්ලට බඳුන් කරයි.

නව බඳවා ගැනීම් අතර 1,265 ක් බස්නාහිර පළාතෙන් බැහැර පළාත්වලින් විය. එමඟින් කුසලතා පූර්ණ පළාත්බද යෞවනයන් අපේ කණ්ඩායමට ඇතුළු වී රටේ ආර්ථික සෞභාග්‍යයේ කොටස්කරුවන් වන්නට අවකාශ සලසන ලදී. මේ නව බඳවා ගැනීම් සඳහා හේතුවක් වූයේ පළාත්බද බැංකු කටයුතු සඳහා පැවති වර්ධනය වන ඉල්ලූම මත වසර තුළ නව ශාඛා 16 ක් විවෘත කරමින් ශාඛා ජාලය පුළුල් කළ බැවිනි.

අප සේවක කණ්ඩායම තුළ කාන්තා සහභාගීත්වය 46% ක මට්ටමක පවතී. මෙය සසඳා බැලිය යුත්තේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය සංඛ්‍යා ලේඛන - 2013 දෙවන කාර්තුවේ විවරණිකාව මඟින් පෙන්නුම් කර ඇති සමස්ත දත්ත හා සමඟය. ඒ අනුව 2013 දෙසැම්බර් වන විට රටේ ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය 35% කි. සේවක කණ්ඩායම තුළ කාන්තා සහභාගීත්වය ආයතනයේ හැම මට්ටමකම පැතිරී ඇතත් පහළ ශ්‍රේණි කරා එළඹෙන විට සැලකිය යුතු අඩුවීමක් පළ කරන්නේ, මෙකී ශ්‍රේණිවල කටයුතු බොහෝ විට පිරිමින් විසින් ඉටු කළ යුතු ශ්‍රමයක් වන බැවින්ය. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය තුළද කාන්තා සහභාගීත්වය වැඩි කිරීමේ අරමුණින් කාන්තා සේවිකාවනට වෘත්තීය මංපෙත් සංවර්ධනය මැදහත්වීම් තුළ ක්‍රියාකාරිව සහභාගීවන්නට දිරි දෙන වැඩ සටහන් කිහිපයක්ම බැංකුව විසින් ක්‍රියාත්මක කොට ඇත.



කුසලතා සංවර්ධනය

බැංකුවේ ව්‍යාපාරික උපාය මාර්ග තුළ ගැබ් වූ සර්වග්‍රාහී පුහුණු කිරීම් හා සංවර්ධන උපාය මාර්ගයක් වනු ඇත. අපේ කණ්ඩායමේ වෘත්තීය සංවර්ධනය හා බැංකුවේ වර්ධනය තුළින් ගම්‍යමාන වන්නේ දශක ගණනාවක් මුළුල්ලේ වර්ධනය කෙරුණු මේ උපාය මාර්ගයේ

46%

ස්ත්‍රී දායකත්ව අනුපාතය

කාර්යක්ෂමතාවය හා බැංකුවේ දුරස්තරම ශාඛාවන්හි පවා දැකිය හැකි අධ්‍යයන හා උපදේශන සංස්කෘතියය. අප නොකඩවා බඳවා ගැනීම් කරනු ලබන්නේ බොහෝ කොට ආරම්භක තලයෙන් බැවින්,අප ව්‍යාපාරික පරිමා වර්ධනය අත්පත් කර ගැනීම මෙන්ම ජාත්‍යන්තර හා පුද්ගලික අංශයේ බැංකු සමඟ වෙළඳපල තුළ තරඟ කිරීමෙහිදීද කාර්යක්ෂමතාවය තහවුරු කර ගන්නේ හුදෙක් පුහුණු කිරීම් හා සංවර්ධන ක්‍රියාදාමයන් හරහාය.


බැංකුව පුහුණු කිරීම් අංශයේ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කර ඇත. ඒ අතර, ශ්‍රවණාගාර, දේශන ශාලා හා නේවාසික පහසුකම් ද වේ. වාර්ෂික පුහුණු කිරීම් අත්පොතක් නිකුත් කරනු ලබන්නේ සැලසුම් කර ඇති පුහුණු වැඩ සටහන් පිළිබඳව සේවක මණ්ඩලය දැනුවත් කිරීමට මෙන්ම, තමන්ගේ සේවක පිරිස පුහුණුව සඳහා මුදා හැරීමට රේඛීය කළමනාකරුවන්ට සැලසුම් කළ හැකි වනු සඳහාය.


පුහුණු කිරීම්

2013 වසර සඳහා අපේ පුහුණු කිරීම් ආයෝජනය රු.මිලියන 235.8ක් වූ අතර එය බොහෝ කොට යෙදවුණේ දේශීය හා විදේශීය දෙඅංශයේම තාක්ෂණික, නායකත්ව හා මෘදු කුසලතා සංවර්ධන වැඩ සටහන් සඳහාය. විදේශීය පුහුණුව සඳහා රු.මිලියන 130.5 ක් ද දේශීය පුහුණුවීම් සඳහා ඉතිරි රු.මිලියන 105.3 ද වැය කරනු ලැබීය. පුහුණු කිරීම් වෙනුවෙන් ආයෝජනය 2012 වසරට සාපේක්ෂව රු.මිලියන 39.8 කින් වර්ධනය වූ අතර එයට හේතු වූයේ කලින් වසර හා සසඳා බලන කල අභ්‍යන්තර පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව, 100% කින් වැඩි වීමය. අප, විශේෂ භාෂා නිපුණතා වැඩ සටහන් වසර මුළුල්ලේ පවත්වාගෙන ගියේ අපේ කාර්ය මණ්ඩලයට ගනුදෙනුකාර අවශ්‍යතා හඳුනා ගැනීමේ කාර්යේ පහසුකාරකයක් ලෙසින් ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබා දීමේ අරමුණෙනි. 2013 වසරේදී, 2012 ට සාපේක්ෂව වැය කළ පුහුණු කිරීමේ පැය ගණන අඩු වුවද පෙර වසරට සාපේක්ෂව සේවක සහභාගීත්වයෙහි 1,093 ක වැඩිවීමක් තුලින් මෙහිලා ආයෝජනය ඉහළ නැංවිණ. පුහුණු වැඩ සටහන් තුළින් 100% ක බැංකු සේවක පිරිසක් ආවරණය කරන ලදී. සම්පත් දායකත්වය බැංකුව තුළින්ම මෙන්ම සිය

බැංකුව පුහුණු කිරීම් අංශයේ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කර ඇත. ඒ අතර, ශ්‍රවණාගාර, දේශන ශාලා හා නේවාසික පහසුකම් ද වේ.

ක්ෂේත්‍ර තුල ප්‍රවීණයන් වන බාහිර විශේෂඥයන් වෙතින් ලබා ගන්නා ලදී. බැංකුව ගතවූ කාලය තුළ පුහුණු කිරීම් අංශයේ යටිතල පහසුකම් සඳහා ද ආයෝජනය කර ඇත. මේ අතර ශ්‍රවණාගාරයක්, දේශන ශාලා වෙන්වූ පිරිමි හා කාන්තා නේවාසිකාගාරවලින් සමන්විත මධ්‍යම පුහුණු කිරීමේ ආයතනය ද වේ. මේ පහසුකම් වසර මුළුල්ලේම භාවිතයට ගනු ලැබීය.





2013 වසර තුළ පැවැත්වූ පුහුණු වැඩසටහන් හා පිරිවැය

වසර	වැඩසටහන් සංඛ්‍යාව			පුහුණු කිරීම් පිරිවැය			සමස්ත පිරිවැය
	අභ්‍යන්තර	විදේශීය	දේශීය	අභ්‍යන්තර රු.මිලියන	විදේශීය රු.මිලියන	දේශීය රු.මිලියන	රු.මිලියන
2012	232	97	460	24	134	38	196
2013	583	119	320	57.2	130.5	48.1	235.8

2013 වසර තුළ පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව

තනතුර	සේවක සංඛ්‍යාව				වසරේ සාමාන්‍ය පුහුණු පැය			
	2013		2012		2013		2012	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
ආයතනික කළමනාකාරිත්වය	15	2	8	3	44	12	41	34
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	39	6	42	7	21	19	28	26
විධායක නිලධාරී	373	179	379	176	18	34	40	38
විධායක සහායකයන්	1445	1,793	1,536	1,576	19	16	63	58
මාණ්ඩලික පුහුණු වන්නන් හා වෙනත්	2,368	2,663	1,901	2,162	59	64	102	12
එකතුව	4,240	4,643	3,866	3,924	161	145	274	168

වෘත්තීයමය ප්‍රගතිය

බැංකුව සේවක මණ්ඩලයට තමන් තෝරා ගත් සුවිශේෂී මංපෙත ඔස්සේ වෘත්තීය අධ්‍යාපනය කරගෙන යාමට දිරි ගන්වයි. මෙහිලා සහභාගිත්වය සලසන වෘත්තික සංවිධාන අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ජාතික ව්‍යාපාරික කළමනාකාරිත්ව ආයතනය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සියළුම ශ්‍රී ලාංකේය විශ්ව විද්‍යාල සහ උසස් තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ආදී ආයතන වේ. වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කරලන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ඒ වෙනුවෙන් ප්‍රසාද දීමනාවක් පිරිනැමෙන අතර, අදාළ ආයතනයට ගෙවන ලද සාමාජිකත්ව මුදල් ප්‍රතිපූරණය කෙරේ. බැංකුව මෙම ආයතනයන් හි අනුමත සේවායෝජකයකු වෙමින්, ඒවායේ සිසුනට අවශ්‍ය වෘත්තීය සීමාවාසික පුහුණුව සේම ඒ ඒ ක්ෂේත්‍රයන්හි උපදේශකයන්ගේ අධීක්ෂණය මත සේවා පලපුරුද්ද සැපයීමට ද කටයුතු කරයි. මෙයට අමතරව, තමන්ගේ සේවා ස්වභාවයට අදාළ පශ්චාත් උපාධි සඳහා අධ්‍යයනය කරන සේවකයන්ට ඒ සඳහා මූල්‍ය පහසුකම් ද සලසයි. වෘත්තීය සුදුසුකම් වෘත්තීය විභාග සමත්වීම් හා ඒ හා බැඳී ජයග්‍රහණ කාර්යඵල ඇගයීමේදී පිලිගනු ලබයි. පුරප්පාඩු මතුවූ අවස්ථාවන්හි බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ බාහිර අයදුම්පත් කැඳවීමට පෙර අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඒ සඳහා මුල් අවස්ථාව ලබාදීමය. මෙම ප්‍රතිපත්තිය ඔස්සේ සිය වෘත්තීය මංපෙතේ ඉහළට නඟින්නට අපේක්ෂා කරන සේවකයන්ට වඩා පුළුල් අවස්ථා සලසා දෙනවාට අමතරව අභියෝග වලට මුහුණ දීමේ සනාථ කල හැකියාවක් ඇති කැපවූ හා හිතෛෂී කණ්ඩායමක් නිර්මාණය කරයි. උසස්වීම් උසස් වීම් හා ස්ථාන මාරු පිළිබඳව විශේෂිත ප්‍රතිපත්ති හා පිලිවෙත් කෙරෙහි තරයේ අනුකූල වන බවට කළමනාකාරිත්වය වග බලා ගනී. මෙහිදී අතෘප්තියට පත් වන සේවකයන්ට සේවක අත්පොතෙහි පැහැදිලිව සඳහන් කර ඇති මනාව නිර්වචනය කළ අභියාචනා පිලිවෙතක් ස්ථාපිත කර ඇත. ස්ථාන මාරු තුළ විනිවිදභාවය සුරකිනු සඳහා නිර්වචනය කළ ස්ථාන මාරු පිලිවෙතක් ද ක්‍රියාත්මක කෙරේ.



ලංකා බැංකු සේවකයින් ඉවතලන කඩදාසි භාවිතයෙන් නිර්මාණය කරන ලද සැරසිල්ලක්

සේවක කාර්යක්ෂමතාවය

එක් සේවකයෙකු මත ආදායම ඔස්සේ මනිනු ලබන සේවක කාර්යක්ෂමතාවය පසුගිය වසර කිහිපය තුළ නොකඩවා වර්ධනය වී ඇත්තේ ඉහළ මට්ටමක නිපුණතා හා කාර්යක්ෂම පිලිවෙත් සේම මේ අංශ විධිමත් කරනු සඳහා සේවක සහභාගිත්වය වඩ වඩා ලැබෙන පසුබිමක් තුළය. මේ කාර්යඵලය තවදුරටත් වර්ධනය වෙතැයි කණ්ඩායම අපේක්ෂා කරයි. ඒ අතර, වත්මන් සේවා-ජීවන තුලිතය මට්ටම, මෙහෙයුම් විධිමත් කිරීම්, ව්‍යාපාරික පිලිවෙත් ප්‍රති-නිර්මාණය ද්විගුණිතය පිටු දැකීම තුළින් තවදුරටත් පවත්වා ගත හැකිවේ. එස් 5 සංකල්පය, ශාඛා 151 කට හඳුන්වා දී ඇති අතර ඒ ඔස්සේ ගනුදෙනුකාර සේවයේ සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් දැකිය හැකි අතර, එදිනෙදා වැඩ කටයුතු වඩා කාර්යක්ෂම කර ඇත. සේවකයන් උදෙසා තිරසර සේවා ජීවන තුලිතයක් වෙනුවෙන් ප්‍රමුඛතාව සලසන සංස්කෘතියක් බැංකුව ගතවූ වසර තුළ වැඩ සටහන් කිහිපයක්ම ක්‍රියාත්මක කළ අතර ක්‍රීඩා, විනෝද කටයුතු, කලා, සෞන්දර්යය හා ආගමික අංශයන් සඳහා රුචියක් පළ කරන සේවක පිරිස වෙනුවෙන්ද වැඩ සටහන් ආරම්භ කොට ඇත.

පැමිණීමේ ලේඛන, වෛද්‍යාධාර ඉල්ලූම්, බඳවා ගැනීමේ පිලිවෙත් හා කාර්යඵල ඇගයීම් පද්ධතිය ඇතුළු, මානව සම්පත් පිලිවෙත් රැසක්ම ගතවූ වසර තුල පරිගණකගත කරනු ලැබීය.

අනුප්‍රාප්තික සැලැස්ම.

දැනට 74 වසරක් ගෙවා ඇති ලංකා බැංකුව ශ්‍රී ලංකා වෙළඳපලට පමණක් නොව විදේශීය වෙළඳපලට පවා ව්‍යවහාරික වෘත්තීය බැංකුකරුවන් බිහිකරලීමෙහි ලා කීර්තියක් අත්කර ගෙන ඇත. ලන්ඩන් (එක්සත් රාජධානිය) මාලේ (මාලදිවයින) හා චෙන්නායි (ඉන්දියාව) බඳු විදේශීය මධ්‍යස්ථානයන්හි බැංකුවේ ප්‍රවිෂ්ටය අනෙකුත් බැංකු හා සාපේක්ෂව ඊට කිසියම් වාසියක් සැලසීය.

බැංකුවේ සමාරම්භයේ සිට මේ දක්වා මහා කළමනාකරුවන් 18 දෙනෙක් පදවිය හොබවා ඇති අතර ඉන් බහුතරය බැංකුව තුලින්ම බිහිවූ කුසලතා පූර්ණ බැංකුකරුවන් වූහ. ඔවුන් හැම තලයකම සේවක පිරිස හා සහයෝගීව වෘත්තීය මං පෙත ඉහළට නැගුනේ හැම පරිවර්තනයක්ම සුමට ලෙස හරවමිනි. මේ නිසා ප්‍රමුඛ කළමනාකාරිත්ව අයවලුන් සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලැස්මක් ස්ථාපිත කර තිබීම අවශ්‍යතාවයක් වන්නේ බැංකුවේ මානව සම්පත් රාමුවේ ඒ පිලිබඳ අවධාරණය කර ඇති බැවිනි. එයට පාදක වන්නේ බැංකු පනතේ 11 විධානය පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවල ආයතනික යහපාලනය පිලිබඳ සලසා ඇති විධිවිධානය.

බැංකුවේ අනුප්‍රාප්තික සැලසුම් පිලිවෙතෙහි, අධ්‍යක්ෂ මණ්ඩලීය නාමයෝජනා කමිටුව මඟින් මුලපුරන ලද විභවයක් සහිත අනුප්‍රාප්තිකයා හඳුනාගැනීම සඳහා ඉටුකළ යුතු වාරානුකූල සමාලෝචනය අන්තර්ගතවේ.

ප්‍රතිපත්තිය ප්‍රමුඛ කළමනාකරණ තනතුරු දරන්නන් අතර ඕනෑම අවස්ථාවක මතුවිය හැකි පුරප්පාඩු පිරවීමට සමත් සුදුසු පරිදි විචක්ෂණ හා අත්දැකීම් සපිරි එමෙන්ම ඉහළ මට්ටමේ කාර්ය ඵලයක් හා විභවයක් සහිත සේවකයන් දිගින් දිගටම නොකඩවා සිටින බවට ප්‍රතිපාදන සැලසීම. ප්‍රමුඛ කළමනාකරන තනතුරුවලට සුදුසුම අපේක්ෂකයන් අනුප්‍රාප්තිකයන් ලෙස හඳුනාගැනීම තුලින් බැංකුවේ ප්‍රධාන මෙන්ම ප්‍රධාන පෙලේ නොවන මෙහෙයුම් සුමටව මෙහෙයවීම ස්ථාවර වේ. අවශ්‍යතා පරිදි සුදුසු අපේක්ෂකයන් සංවර්ධනය කළ හැකිවන පරිදි අවශ්‍ය පුහුණු කිරීම් අවස්ථා සලසාලනු ලැබේ. පහත වර්ගීකරණය යටතේ ආයතනික කළමනාකාරිත්ව මට්ටම දැනටමත් හඳුනාගෙන ඇත.

හදිසි පිටවීම තනතුරට පිය තබා ඊට අදාළ මූලික අවශ්‍යතා එක්වරම සම්පූර්ණ කිරීම. මෙය විශේෂයෙන් අදාලවන්නේ කෙටි කාල සීමාවකටය.

හොඳම දෙවැන්නා පූර්ව-හඳුනාගැනීමකට ලක්කොට තනතුර භාරගැනීමට සූදානම්ව සුදුසු නිරාවරණය හා පුහුණුව සහිතව වර්ධනය කරනු ලබන්නා.

කඩිනමින් සූදානම්ව යෝජිත තනතුර සඳහා ගැලපීමට සුදුසුකම් රහිත තැනැත්තා.

කුසලතා රඳවාගැනීම

දිවයිනේ ඉහලම ප්‍රතිශතයක් වන 99% ක බැංකුවේ සේවක රඳවා ගැනීමේ ප්‍රතිශතය පැසසුම් සහගතය. නව බඳවාගැනීම් අතරින් උසස් අධ්‍යාපන කටයුතු හා විවාහය සඳහා වසර තුල සේවය හැරගියේ 23 දෙනෙක් පමණි. අප විශ්වාස කරන්නේ මේ ඉහළ මට්ටමක සේවක රඳවා ගැනීම, සේවක තෘප්තිමත් බව, වෘත්තීය මංපෙත් සංවර්ධනය, විවිධත්වය, ජයග්‍රහණ නිසිසේ පිලිගැනීමට ලක්කිරීම, සදාචාරාත්මක පරිසරයක් පවත්වා ගෙන යෑම, වෘත්තීය කෘතහස්තභාවය, සානුබල හා වෙනත් ප්‍රදාන වලින් සුසැදුනු අපේ සංස්කෘතියේ කොටසක්ම බවය. මෙයට අමතරව විශ්‍රාම සැලසුම් බඳු ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ වලට ඔබ්බෙන් පහසුකම් හා ප්‍රතිලාභ රැසකි. ඒ සාළුය්‍යතාව හා ලාභශීලීතාවය මත පදනම් පාරිතෝෂික දීමනා, විවිධාකාර අවශ්‍යතා ගොනුවකට සැපයෙන සහන පොළී ණය පහසුකම්, පවුලේ සාමාජිකයන් ආවරණය කෙරෙන වෛද්‍යාධාර යෝජනා ක්‍රම, උසස් අධ්‍යාපනය හා පුහුණුවීම් වැඩසටහන් සඳහා වන ගෙවීම්, ගෘහ භාණ්ඩ සහිත කාර්ය මණ්ඩලීය නිවස්න, ගමන් වියදම් දීමනා, නිවාඩු නිකේතන හා අවමංගල්‍ය වියදම් ප්‍රතිපූරණය ආදී වශයෙනි.

ලංකා බැංකුව ඉහල ආකර්ෂණයක් සහිත සේවායෝජකයකු වන බැවින් බොහොමයක් කුසලතා පූර්ණ පාසැල් හැරගිය තරුණ පිරිස හා උපාධිධාරීහු එහි රැකියා නිබඳ අපේක්ෂා කරති. කැපී පෙනෙන ජයග්‍රහණයක් වන්නේ බැංකුවේ සේවක පිරිස අතරින් 3,413 දෙනෙක් වසර දහයකට වඩා සේවය කර ඇති අතර තවත් 2,738 ක් දශක දෙකකට වඩා සේවය කර තිබීමය. දීර්ඝ සේවා කාලයක් සහිත සේවකයන් හඳුනාගෙන වසර 25 කට වඩා සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන්ගේ කැපවීම අගය කරමින් තිළිණද ප්‍රදානය කරන ලදී.

වසර තුලදී 25 වසරක සේවා කාලය සහිත සේවකයන් 66 දෙනෙකුගේ දායකත්වය අගයමින් තිළිණ ප්‍රදානය කරන ලද්දේ අලංකාරවත් සැමරුම් උළෙලකදී ය.

සේවා කාලය අනුව සේවක වර්ගීකරණය

සේවා කාලය	සංඛ්‍යාව	ප්‍රතිශතය
අවුරුදු 20 ට වැඩි	2,788	31%
අවුරුදු 15 – 19	385	4%
අවුරුදු 10-14	240	3%
අවුරුදු 5 – 09	1,411	16%
අවුරුදු 5 අඩු	4,059	46%
එකතුව	8,883	100%

2013 වසර තුල සේවය හැරයාම්

වයස් පරාසය	පුරුෂ	ස්ත්‍රී	එකතුව
18 - 29	5	18	23
30 - 39	5	5	10
40 - 49	0	3	3
50 - 60	0	0	0
එකතුව	10	26	36

කණ්ඩායමේ ජයග්‍රහණ

නම	ජයග්‍රහණය/ප්‍රදානය	තරඟය/සුදුසුකම	ආයතනය
මාලේ ශාඛාව	ජයග්‍රාහකයන්	මූල්‍ය ක්ෂේත්‍රයේ දැනුම මිනුම තරඟය	මාලදිවයින් මූල්‍ය අධිකාරිය
කේ කේ සුසන්ත මහතා චිල් පී ආරියසිංහ මිය කේ ඕ එම් ද සිල්වා මිය චිල් පී ඩී පීරිස් මෙනවිය	ජයග්‍රාහකයන්	අන්තර් - බැංකු දැනුම මිනුම තරඟය	ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
ඩබ් ඩී එච් සුමතිරත්න මහතා	ස්වර්ණ මුද්‍රිකාව	බැංකු කළමනාකරනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
ඊ එම් එන් අයි මධුභාෂා මෙනෙවිය	ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.	තරුණ සහභාගී වන්නන්ගේ 53 වන ජාත්‍යන්තර සැසිය.	ජාත්‍යන්තර ඔලිම්පික් ඇකඩමිය, ග්‍රීසිය.

ස්ථිර කාර්ය මණ්ඩලයට සපයන ප්‍රතිලාභ

වෘත්තීය සමිති, කමිටු හා සංගම් විශාල සංඛ්‍යාවක් සමස්ත සේවක මණ්ඩලය ආවරණය කරමින් ප්‍රතිලාභ සලසමින් ද නොයෙකුත් ක්‍රියාකාරකම් වල යෙදෙමින් ද සිටිති.

බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත වෛද්‍ය මධ්‍යස්ථානය සියළුම සේවකයන්ට විවෘත වන අතර දිනකට 40 ක පමණ කාර්ය මණ්ඩලයක් ඉන් සේවා ලබාගනිති.

සේවකයන් සඳහා සහන මිලගණන් මත සුභසාධක වාහන ලබා ගත හැක


ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව තුලින් දිනකට දළ වශයෙන් 1,000 ක සේවක පිරිසකට සහන මිලකට ආහාර සැපයේ.

සියළුම පළාත්වල නිතිපතා ක්‍රීඩා තරඟ හා වාර්ෂික ක්‍රීඩා උත්සව සංවිධානය කෙරේ. ඉන් ඉහළ දක්ෂතා දක්වන්නෝ මධ්‍යම ක්‍රීඩා උළෙල නියෝජනය කරති.

සාහිත්‍ය සංගම්, සංස්කෘතික සංවිධාන, කමිටු හා වෘත්තීය සමිති සමාජයීය වැදගත්කමක් සහිත ක්‍රියාකාරකම් සංවිධානය කරලීමෙන්/ පැවැත්වීමෙන් ප්‍රධානපෙලේ භූමිකාවක් ඉටුකරති.

සියළු ආගම් සංකේතවත් වන ආගමික කටයුතු පවත්වනු ලබයි. 7000 කට වැඩි සංගම් සාමාජිකයෝ මෙම කටයුතු සඳහා සහභාගීත්වය දරති.

රට තුල ප්‍රධාන පෙළේ නිවාඩු ගමනාන්තයන්හි නිකේතන ස්ථාපිත කර ඇති අතර, සේවක මණ්ඩලය හා පවුල්වල අයට වෙන්වූ මෙම නිකේතන තුල සහන මිල ගණන් යටතේ ඉඳුම් හිටුම් හා ආහාර සැපයේ. 2013 වසර තුල 9,000 ක පමණ පිරිසක් මෙම පහසුකම් භුක්ති වින්දාහ.



එම් එම් ඒ මඟින් සංවිධානය කරන ලද මූල්‍ය අංශය සඳහා වූ දැනුම මිනුම තරඟයේ ජයග්‍රාහිකයන්



ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මඟින් සංවිධානය කරන ලද අන්තර් බැංකු දැනුම් මිනුම් තරඟයේ ජයග්‍රහකයන්

කාර්ය මණ්ඩලය සඳහා ණය පහසුකම්

ණය වර්ගය	පොළී අනුපාතය
නිවාස ණය	2.25% to 5 % - (අඩියර වශයෙන්)
ආපදා ණය (වැක් මසක වැටුප)	0 %
ආපදා ණය (තෙමසක වැටුප)	6 %
පරිගණක ණය	6.5 %
අර්ථසාධක අරමුදල් ණය	5 %
ඒකාබද්ධ සාමාන්‍ය ණය	5.5 %
ආයෝජන ණය	5 %
මෝටර් රථ ණය	6.5 %

2013 වසර තුල ක්‍රියාත්මක කෙරුණු සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්

අවස්ථාව	සහභාගීත්වය	දිනය	ස්ථානය
නිරෝගී ලංකා ජාතික ව්‍යාපෘතිය විසින් ලංකා බැංකුවේ සේවක පිරිස ඉලක්ක කරගනිමින් පැවැත්වූ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ විශේෂ වෛද්‍ය මණ්ඩලයක් හා සම්බන්ධීකරණය විය.	150 සේවක පිරිස	2013 අප්‍රේල් 08	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරය
ලංකා බැංකුවේ 74 වන සංවත්සරය හා සමගාමී ලේ දන් දීමේ වැඩසටහන	210 සේවක පිරිස් ලේ දන් දුන්හ.	2013 අගෝස්තු 01	ප්‍රධාන කාර්යාල 30 වන මහල
ප්‍රතිශක්තිය වඩවා ගනිමු. මී උණ රෝගය පිළිබඳ ප්‍රතිශක්ති තත්ත්වයන්, රෝගය පැතිරීමට බලපාන පරිසර තත්ත්වයන් හා සම්බන්ධිත සායන විධි- ආචාර්ය උපාධි පර්යේෂණයකි.	100 ක සේවක පිරිස රුධිර සාම්පල භාරදුන්හ.	2013 සැප්තැම්බර් 24	ප්‍රධාන කාර්යාල ශ්‍රවණාගාරය
පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව	200 ක සේවක පිරිසක් සහභාගී වුහ. 10 දෙනෙක් පරීක්ෂණ වලට ඉදිරිපත් වූහ.	2013 දෙසැම්බර් 09	ප්‍රධාන කාර්යාල ශ්‍රවණාගාරය

වැටුප් හා වෙනත් ප්‍රතිලාභ - රු. මිලියන

	2013	2012
වැටුප් හා දීමනා	10,004	8,239
වාර්ෂික නිවාඩු දීමනා හා ප්‍රසාද දීමනා	2,116	2,008
සේවක සුභසාධනය	95	104
සේවක වෛද්‍යාධාර පිරිවැය	457	432
නිශ්චිත දායකත්ව සැලසුමට දායකත්වය	852	794
නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට දායකත්වය	1,145	1,350
කාර්ය මණ්ඩලීය ණය	12,937	12,176

රැකියා බද්ධ සෞඛ්‍යය හා රැකවරණය

අප කාර්ය මණ්ඩලයේ මෙන්ම අපේ ශාඛාවනට ගනුදෙනු සඳහා පැමිණෙන ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍යය හා රැකවරණය පිළිබඳව දැඩි සැලකිල්ලක් යොමු කරන්නේ එහි අගය වටහා ගෙන ඇති බැවිනි. අපගේ පද්ධති හා පිළිවෙත් කාර්යක්ෂම ලෙසින් ක්‍රියාත්මක වන්නේ රැකවරණයට බලපාන උවදුරු, රෝගාබාධ, රැකියාබද්ධ රෝග හා හදිසි අනතුරු වළක්වාලීම සඳහා ය. සෞඛ්‍යය හා රැකවරණය පිළිබඳව පූර්ව ක්‍රියාකාරී ප්‍රවේශයක් බැංකුව සතුව ඇති අතර, එය කැපී පෙනෙන ඉහල මට්ටමේ කාර්ය ඵල සංස්කෘතියක් නිර්මාණය කර ඇත. 2013 වසර තුල සේවකයන් 27 දෙනෙකු වෙනුවෙන් දින 608 ක හදිසි අනතුරු නිවාඩු ලබා දෙන ලදී. මින් 19 දෙනෙක් සේවයේ යෙදී සිටියදී අනතුරට ලක්වූවන් වූ අතර 8 දෙනෙක් සේවයට යමින් සිටියදී හෝ සේවය නිමවී පෙරළා එමින් සිටියදී අනතුරට ලක්වූහ.

2013 ඔක්තෝබර් 11 දින ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයේ හදිසි ඉවත් කිරීමේ අභ්‍යාසයක් සිදුකරනු ලැබීය. මෙම අවස්ථාවට යුද හමුදාව, ගුවන් හමුදාව, ගිනි නිවන හමුදාව, පොලීසිය, ගිලන් රථ සේවා හා සෙසු අදාළ ආයතන/ සමූහන දායකත්වය සැපයූහ. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය දැනුවත් කොට, අනුමැතිය ලබා ගන්නා ලදී. මෙබඳු හදිසි ඉවත් කිරීමේ අභ්‍යාස වාර්ෂිකව සිදුකෙරේ.

ප්‍රධාන කාර්යාලයේ හැම දෙපාර්තමේන්තුවම හා සෑම මහලක්ම ආවරණය වන පරිදි ගිනි පාලකවරුන් අනුයුක්ත කර ඇත. ගිනි නිවන හමුදාව විසින් වාර්ෂිකව පවත්වනු ලබන පුහුණු වැඩසටහනය සියළුම ගිනිපාලකවරු හා ශාඛා ජාලයේ නියෝජිතයෝ සහභාගී වෙති.

මානව හිමිකම්

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති, එමෙන්ම ශ්‍රී ලංකාවට බැඳීමක් සහිත ජාත්‍යන්තර ප්‍රකාශන හා සම්මුති මඟින්ද ප්‍රකාශිත මානව හිමිකම් උදෙසා වන ගෞරවය බැංකුවේ මූලික ප්‍රතිපත්තිය මෙන්ම හරයාත්මක වටිනාකම් පද්ධතීන් අතර එකක් වෙයි. වෙනස්ව සැලකීමෙන් බැහැරව කටයුතු කරන අතරතුරේ බැංකුව සිය පාර්ශවකරුවන්ට ද වෙනස් ආකාරයට සැලකීමෙන් බැහැර වන ලෙසද, ව්‍යාත්තීය සමිති වශයෙන් ගොනුවීමේ නිදහස ස්ථාපිත කොට බලකල/ අනිවාර්ය ළමා ශ්‍රමයද පිටුදකින සේ දිරිගන්වයි. බැංකුව

ප්‍රතිපත්තියක් ලෙස ළමා ශ්‍රමය භාවිතා නොකරන අතර ගනුදෙනුකාරණය ඉල්ලූම් වලදී ළමා ශ්‍රමය භාවිතා කරන්නේද යන්න විමසා බලයි. මානව හිමිකම් ප්‍රශ්න ගැන කටයුතු කරනුයේ නියෝජ්‍ය මහා කළමනාකරු මානව සම්පත් ගේ සෘජු අධීක්ෂණය යටතේ මෙහෙයවෙන මානව සම්පත් අංශයේ කාර්මික සබඳතා ඒකකය මගිනි. ස්ථානමාරු, උසස්වීම් හා විනය කටයුතු වලදී බැංකුවේ ස්ථාපිත රීති හා රෙගුලාසි අනුව තරයේ කටයුතු කරන බවට වගබලා ගැනේ.

ලංකා බැංකුව මානව හිමිකම් පිළිබඳ හැම පැතිකඩක්ම සැලකිල්ලට බඳුන්කොට ඊට අනුකූලව කටයුතු කරයි. එසේ වුව ද තමන්ට වෙනස්ව සලකනු ලැබුවේ යැයි සමහර කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් දුක්ගැනවිලි ලැබී ඇත. සංඛ්‍යාත්මකව බලනකල කලින් වසරවලට වඩා මේ වසර තුල දුක්ගැනවිලි ප්‍රමාණයේ අඩුවක් දක්නට ලැබීම සුවිශේෂ ය. දුක්ගැනවිලි උදෙසා ඉහළම ප්‍රමුඛතාවය ලබාදෙන අතර සේවක මණ්ඩලය ස්ථාපිත කර ඇති පිළිවෙත් අනුව සිය දුක්ගැනවිලි මානව සම්පත් අංශයට යොමු කරතැයි අපේක්ෂා කෙරේ. සියළුම දුක්ගැනවිලි සඳහා ඒ ඒ වසර තුලම කටයුතු කරනු ලබන අතර කිසියම් අනපේක්ෂිත හේතුවක් මත ඒ වසර තුල ඒ පිළිබඳ කටයුතු කළ නොහැකි වී නම් එලඹෙන වසරේදී ඊට ප්‍රමුඛතාවය සලසනු ලැබේ.

සමස්ත දුක්ගැනවිලි සංඛ්‍යාව හා වසර තුල ගත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග	පුරුෂ	ස්ත්‍රී	එකතුව
2012 වසරේ සිට ඉදිරියට ගෙන ආ දුක්ගැනවිලි සංඛ්‍යාව	21	6	27
2013 වසර තුල වාර්තා වූ දුක්ගැනවිලි සංඛ්‍යාව	8	5	13
වසර තුල සමථයකට පත් කළ දුක්ගැනවිලි සංඛ්‍යාව	5	6	11
වසර අවසානයේ පිටහිටි දුක්ගැනවිලි සංඛ්‍යාව	24	5	29

සේවක චර්යා සංග්‍රහය

ආචාර ධර්ම සංග්‍රහය මඟින් සේවක හැසිරීම, උචිත ඇඳුම් පැළඳුම් හා ප්‍රතිභාසය පිළිබඳව මඟ පෙන්වන අතර සියළුම සේවකයන් ඊට අනුකූලව කටයුතු කළ යුතුවේ.

සමාජ හා පාරිසරික කටයුතුවල නියැලීම

සියළුම මට්ටම්වල සේවකයන්ට බැංකුව විසින් මුලපුරණු ලබන සමාජයීය හා පාරිසරික ආයාසයන් තුල නියැලෙන ලෙස දිරිගන්වනු ලැබේ. මක්නිසාද යත් එමඟින් පෙදෙස්බද ප්‍රජාව සමඟ පමණක් නොව සේවක මණ්ඩලය අතරද අන්‍යොන්‍ය සහයෝගය ගොඩනැංවෙන බැවිනි. මෙමඟින් නායකත්ව හැකියාව සහිත අයට ඉස්මතුවීමට අවස්ථාව සැලසෙන අතර, තමන්ගේ සාමාන්‍ය වැඩකටයුතු වලින් ඔබ්බේ වන ව්‍යාපෘති කළමනාකරණය කරන්නටද අවස්ථාව උදාවේ. එස් 5 සංකල්පය බඳු ආයාස දියත් කරන්නට සේ ම බැංකුවේ ත්‍රිත්ව යටිපෙළ උපාය මාර්ගය ස්ථාපිත කරන්නටද සේවක සහභාගීත්වය අත්‍යවශ්‍ය සාධකයකි. අප කණ්ඩායම ආයතනික මෙන්ම පෞද්ගලික හර පද්ධතීන්ට අනුකූල මෙවන් සංකල්ප හදවතින්ම වැළඳගත් බව ඔවුන්ගේ සක්‍රීය සහභාගීත්වය තුලින් අත් දැක සිටින්නෙමු. සම්ප්‍රදායික රාජකාරී රටාවෙන් බැහැරව සමාජයීය හා පාරිසරික වැඩසටහන් තුල ඔවුන්ගේ දායකත්වය පිළිබඳ නිදර්ශන පහත දක්වා ඇත.

2014 වසර තුල ඉදිරි මඟ

බැංකුව සේවක පුහුණු කිරීම් හා හැකියා සංවර්ධනය ඉසව්වේ තවදුරටත් ආයෝජනය කරන්නට බලාපොරොත්තු වන අතර 2014 තුල පුහුණු කිරීමේ උදෙසා වඩා ඉහළ ආවරණයක් ලබා ගන්නට අපේක්ෂා කරනු ඇත. ව්‍යාපාරික පිලිවෙත් විධිමත් කිරීම හා පරිගණකගත කිරීම හරහා සේවක ඵලදායීතාව වැඩිදියුණු කිරීමට ද කටයුතු කරනු ඇත. මානව සම්පත් අංශය, පවත්නා මානව සම්පත් පද්ධතිය (IHRM) සමාලෝචනය හමාර කරන්නට නියමිත අතර, ඉලක්ක ගත මානව සම්පත් ප්‍රතිඵල ලබාදිය හැකි, එමෙන්ම බැංකුවේ අපේක්ෂාවන්ට අනුගත, නව මානව සම්පත් පරිගණක පද්ධතියක් පිළිබඳව යෝජනා සඳහා ඉල්ලූමක් සකස් කරමින් සිටී. මීට අමතරව කාර්යඵලය මත පදනම් දීමනා වැඩසටහනක් හඳුන්වා දෙන්නට ද එමඟින් හැම වසරකම ඉහළ නැංවූ ඉලක්ක කරා ඵලඹෙන්නට කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කරන්නට ද බලාපොරොත්තු වන්නෙමු. නව සාමූහික ගිවිසුමක් අරභයා කේවල් කිරීමේ පිළිවෙතක් ඇති අතර මුදල් අමාත්‍යාංශය ඒ පිළිබඳව රාජ්‍ය බැංකු හතරට මඟ පෙන්වනු ඇත.

බැංකුව විද්‍යුත් - ඉගෙනුම මත පදනම් පුහුණු වැඩසටහන් හඳුන්වා දෙන්නට ද අපේක්ෂා කරයි. මෙහිදී පුහුණුවන්නන්ට තම තමන්ට හැකි පරිදි පවතින කාලය යොදවා ස්වයං අධ්‍යයනයකට මං සැලසෙන අතර බැංකුවේ ඇගයීම් පිළිවෙතට අනුකූලව එය ක්‍රියාවට නැංවෙනු ඇත. කාර්ය මණ්ඩලයට මුහුණ පාන්නට සිදුවන අපහසුතා අවම කර ගනිමින් පලාත්බද බැඳියාවන්ට ආසන්නව පුහුණුවන්නට ඉඩකඩ සැලසේ. මෙමඟින් පුහුණු වැඩසටහන්වල අදාලත්වය ඉහල නැංවෙන අතර ජාතික මට්ටමේ පුහුණු සැසියක මතු කරන්නට අසීරු පලාතට ආවේණික ගැටළු, වඩා කුඩා කණ්ඩායමක් හමුවේ සාකච්ඡා කරන්නට ද හැකිවේ. අනුප්‍රාප්තික සැලසුම් හා උසස්වීම් පිලිවෙත් ක්‍රියාකාරීත්වය වඩා පහසු කරවන නිපුණතා ඇගයීමේ ක්‍රියාදාමයක් සකස් කොට ක්‍රියාත්මක කරන්නටද බලාපොරොත්තු වන්නෙමු.

විද්‍යුත් ඉගෙනුම මත පදනම් පුහුණු වැඩසටහන් මඟින් පුහුණු අවශ්‍යතා සපුරාලීම

පළාත්බද පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම

නිපුණතා ඇගයීම් පිලිවෙතක් සකස් කොට ස්ථාපනය










සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සහභාගී වූ ආගමික ක්‍රියාකාරකම්



සියළුම ශාඛාවන් විසින් බැංකුවේ 74 සංවත්සරයට සමගාමීව ඩෙංගු වැලැක්වීමේ ශ්‍රමදාන වැඩසටහනක් වසර තුල ක්‍රියාත්මක කරනු ලැබීය. මෙහිදී ප්‍රදේශයේ පාසලක් තෝරාගෙන ගුරුවරුන්, දෙමාපියන්, පොලීසිය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා පළාත් පාලන නිලධාරීන්ගේ ද සහාය ඇතිව දැනුවත් කිරීමේ වැඩසටහනක් හා පරිසරය ශුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදානයක් පවත්වනු ලැබීය.



උතුරු මැද පළාතේ ශාඛා පද්ධතිය එක්ව වකුගඩු ආශ්‍රිත රෝගාබාධ සඳහා නැමියාවක් සහිත ගැමියන් වෙනුවෙන් සායනයක් සංවිධානය කරනු ලැබීය. මෙහිලා මහජන සෞඛ්‍ය නිලධාරීන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන්, රෝහල් කාර්ය මණ්ඩලය හා ග්‍රාමීය සංවිධානයන්හි සහාය ද ලබා ගන්නා ලදී. මඩාටුගම මූලික රෝහලේ දී පවත්වන ලද සායනය සඳහා ගැමියන් 2000 කට ආසන්න පිරිසක් සහභාගී වූ අතර, රෝගයට ගොදුරු විය හැකි යැයි හඳුනා ගන්නා ලද 170 ක පිරිස වැඩිදුර ප්‍රතිකාර සඳහා යොමු කරනු ලැබීය.

සමාජයීය වාර්තාව

"අප ග්‍රාමීය ප්‍රජාව අතර ආර්ථික කටයුතු උත්තේජනය කරමින් ඔවුන්ගේ සමාජ ආර්ථික ප්‍රගතිය උදෙසා පහසුකම් සපයන්නෙකු වෙමින් ඒ අතරතුරේ ග්‍රාමීය ව්‍යවසායකයන්ට සිය මූල්‍ය ගනුදෙනු නිසිසේ කළමනාකරණය උදෙසා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්ද ක්‍රියාවට නංවන්නෙමු."

රජය සමඟ ඇති සබඳතා මෙන්ම රටේ සංවර්ධන උපාය මාර්ග හා සමීපව අනුගතවීම ඔස්සේ සමාජයේ පොදු යහපත උදෙසා කටයුතු කිරීමේ උරුමයක් ලංකා බැංකුව සතුව පවතී. අපි අපේ ශාඛා ජාලය හරහා ප්‍රජාව සමඟ සක්‍රීය ලෙසින් සබඳතා පවත්වන්නෙමු. අප ග්‍රාමීය ප්‍රජාව අතර ආර්ථික කටයුතු උත්තේජනය කරමින් ඔවුන්ගේ සමාජ ආර්ථික ප්‍රගතිය උදෙසා පහසුකම් සපයන්නෙකු වෙමින් ඒ අතරතුරේ ග්‍රාමීය ව්‍යවසායකයන්ට සිය මූල්‍ය ගනුදෙනු නිසිසේ කළමනාකරණය උදෙසා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්ද ක්‍රියාවට නංවන්නෙමු. මෙයට අමතරව, මෙම වසරේදී අප ගෙවූ ලාභාංශය රාජ්‍ය ව්‍යවසායයක් විසින් මෙතෙක් භාණ්ඩාගාරයට ගෙවූ විශාලතම ලාභාංශය වේ. බැංකුවේ සමාජ සංවර්ධනය හා මූල්‍ය ඇතුළත්කරණ ක්‍රියාවලිය වල්ලේ බැංකුවේ කැපවීම පහත දැක්වෙන දත්ත හා දර්ශක වලින් නිරූපණය වේ.

සමාජයීය හා සබඳතා ප්‍රාග්ධනය	2013	2012
ගණුදෙනුකරුවන් සංඛ්‍යාව (000)	10,944	10,576
මුළු ජනගහනයෙන් අපගේ ගනුදෙනුකාර ප්‍රතිශතය	54%	54%
ගනුදෙනුකාර සේවා ස්ථාන		
• ශාඛා	567	324
• ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	523	451
• පාසැල් ඉතුරුම් ඒකක	3,738	2,498
නියෝජිත බැංකු	759	762
විනිමය ආයතන	96	97
ජනිත කළ රැකියා අවස්ථා	1,706	296
පාසැල් හැරගිය තරුණයන් හා උපාධි අපේක්ෂකයන් උදෙසා සීමාවාසික පුහුණුව		
• උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව	449	440
• විගණන හා වෙනත් වෘත්තික පුහුණුවන්නන්	170	34
• පාසැල් හැර යන්නන්	359	2,089
පළාත්බඳව පැවැත්වූ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්		
- වැඩමුළු සංඛ්‍යාව	9	8
- සහභාගීත්වය	855	963
ආයෝජනය (රු.මිලියන)	1.1	1.3

ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා දායකවන්නට අපි කැපවී සිටින්නෙමු. සමාජ තත්ත්වය ඉහළ නැංවීම සඳහා බැංකුවේ ආයතනික සමාජ සත්කාරක ආයාසයන් උපයෝගී කර ගන්නෙමු. මෙහිලා අප රජයේ විවිධ සංවර්ධන වැඩ සටහන් ඔස්සේ මග පෙන්වීම ලබන අතර අප රජය විසින් ප්‍රකාශිත 5+1 සංවර්ධන උපාය මාර්ගයේ කේන්ද්‍රීය පුරුකක් වන්නෙමු. පලාත්බඳ ආර්ථික කටයුතු උත්තේජනය තුළින් ජනිත කළ රැකියා අවස්ථා සංඛ්‍යාව ගණනය කොට නැති බැවින් මෙහිලා එය වාර්තා නොකෙරේ. එසේ වුවද මේ ප්‍රතිඵලය අපේ ශාඛා බැංකුකරණ ක්‍රියාවලිය තුළ ප්‍රමුඛ පෙලේ සංසිද්ධියකි.

අපේ ආයතනික සමාජ සත්කාරක ආයෝජන, ප්‍රජාවේ තත්ත්වය ඉහළ නංවා රට පුරා සමාජ ආර්ථික සංවර්ධනය කිරීම අරමුණු කරගත් තේමා පහක් වටා ගොනුවී පවතී. 2013 වසර තුළ පහත සවිස්තරව සඳහන් කර ඇති කටයුතු උදෙසා රු.මිලියන 165 ක් ආයෝජනය කර ඇත.



අධ්‍යාපනය
රු. මිලියන 25.3

බැංකුව හපනා අධ්‍යාපනික වැඩ සටහන ඔස්සේ රට පුරා පාසල්වල පහ වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා සූදානම් වන සිසුන් වෙනුවෙන් අධ්‍යාපනික වැඩමුළු පවත්වයි. අපේ වාර්ෂික ඉලක්කය වනුයේ මෙම සිසු දරුවන් අතරින් 2,000 කට වකක් රු. 10,000 බැගින් වන ශිෂ්‍යත්වයන් ප්‍රදානය කරන්නටය. මෙය අදාල වන්නේ සිය රන් කැකුළු ගිණුමෙහි රු. 2,500 ක ශේෂයක් රඳවාගත් සිසුන්ටය. 2013 වසරේදී කඩඉම් ලකුණු ප්‍රමාණය වූ 173 ඉක්මවූ සිසුන් 1,412 දෙනෙකුට මෙම ශිෂ්‍යත්වයන් ප්‍රදානය කරන ලදී. කඩඉමට ළඟාවිය නොහැකි වූ සිසුන් 3,100 ක් හට ශබ්දකෝෂය බැගින් ත්‍යාග ලබා දෙන ලදී.

අ.පොස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත, විද්‍යාව, ගණිතය, කලා හා වාණිජ ධාරාවන්ගෙන් ඉහළ ලකුණු ලැබූ ශිෂ්‍යයන් 20 දෙනෙකුට රු.35,000 බැගින් ශිෂ්‍යත්ව පිරිනමන ලදී. මෙයට අමතරව, විභාගයට ඉදිරිපත් වන්නට පෙර වසර තුළ රු.5,000 අවම ශේෂයක් රඳවා ගත් සිසු සිසුන් 73 දෙනෙකුටද ශිෂ්‍යත්ව පිරිනැමිණ.



ක්‍රීඩා
රු.මිලියන 6.28

බැංකුව ජාතික මට්ටමේ මලල ක්‍රීඩා තරඟාවලි කිහිපයකටම අනුග්‍රාහක දායකත්වය දැක්වූයේ සෞඛ්‍ය සම්පන්න සමාජයක් බිහිකිරීම සඳහා ඉවහල් වන, ඉහළ ජයග්‍රහණ සනිටුහන් කරන ක්‍රීඩකයන්ට ජාතික වශයෙන් පිළිගැනීමක් ලබා දෙන මෙවන් තරඟාවලි සඳහා ආයතනික මට්ටමේ දායකත්වය අත්‍යවශ්‍ය බැවිනි.



ගැටුම් නිසා හානියට පත් බිම්පෙත් යළි ගොඩ නැංවීම
රු. මිලියන 86

ලංකා බැංකුව ගැටුම් නිසා හානියට පත් බිම්පෙත් හරහා පුනරුත්තාපන කටයුතු වලදී සක්‍රීයව සහභාගී වේ. එය, මේ පෙදෙස් වල මූල්‍ය පහසුකම් සැපයීම සඳහා ඉදිරිපත් වූ පළමු වැන්නා විය. මේ බිම්පෙත් විශ්වාසනීය ප්‍රවාහන සේවාවක් හා වෙළෙඳපළ ප්‍රවේශයක අවශ්‍යතාවය හඳුනාගත් බැංකුව යාපනය දුම්රිය ස්ථානය යළි ගොඩ නැංවීමේ පූර්ණ බර පැන දැරිය. කලකට ඉහත බෙහෙවින් ජනාකීර්ණ සන්ධිස්ථානයක් වූ මෙහි පුනරුත්තාපනය යළි ගොඩ නැංවීමේ හා සංහිඳියාව බිහිකරලීමේ ක්‍රියාදාමය තුළ අත්‍යාවශ්‍ය සාධකයක් වේ.



ව්‍යවසායකත්ව සංවර්ධනය
රු. මිලියන 12.7

ග්‍රාමීය ව්‍යවසායකයන්ගේ සාර්ථකත්වයට අත්‍යාවශ්‍ය නපුණතා හා දැනුම සපයන කුඹුර මූල්‍යන වැඩමුළු කිහිපයක්ම මේ කාලය තුළ පවත්වන ලදී.



ජාතික උරුමය
රු. මිලියන 23

බැංකුව මහනුවර දළදා පෙරහැර හා කොළඹ නවම් පෙරහැර බදු දැවැන්ත සංස්කෘතික වැඩසටහන් කීපයකටම අනුග්‍රාහකත්වය සැපයීය. මෙයට අමතරව, ලෝක උරුමයක් ලෙස නම් කර ඇති සෙංකඩගල පුර දළඳා මාළිගාවේ නඩත්තු කටයුතු සඳහාද දායක විය.



සෞඛ්‍ය සේවා
රු. මිලියන 11.7

ප්‍රජාව වෙනුවෙන් වූ නිදහස් සෞඛ්‍ය සේවයේ තිරසර පැවැත්ම රැඳවා ගන්නට මෙන්ම ඊට අත්වැල සපයනු සඳහා රෝහල් සහ ආයුර්වේද රෝහල් කිහිපයකම ගොඩනැගිලි මෙන්ම නඩත්තු කටයුතු සඳහා මූල්‍යාධාර පිරිනමන ලදී.

පූර්ව ආරක්ෂණ ප්‍රවේශය
අප 1992 රයෝ ප්‍රකාශනයේ 15 වැනි මූලධර්මය පිළිගන්නා අතර, තිරසර පැවැත්ම හා සංවර්ධනය අතර තුලනය නිශ්චය කිරීමෙහිදී, අවස්ථානුකූලව එකී මූලධර්ම භාවිතා කරන්නෙමු.

බැංකු ක්ෂේත්‍රය හා සම්බන්ධ සමිති/සංගම් තුළ සාමාජිකත්වය

- ආසියා-පැසිපික් ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය සංගමය (APRACA)
- බැංකු ක්ෂේත්‍රයේ අවදානම් වෘත්තිකයන්ගේ සංවිධානය
- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන සංගමය (ශ්‍රී ලංකා පාර්ශවය)
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
- සීමාසහිත ශ්‍රී ලංකා බැංකු සංගමය (ගරන්ටි)
- ශ්‍රී ලංකා නීති පුස්තකාලය
- ලංකා වාණිජ මණ්ඩලය
- සීමාසහිත ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (ගරන්ටි)

එකතු කළ අගය

2013 වසර තුළ බැංකුව රු. මිලියන 56,439 ක ධන උත්පාදනයකට දායක වූ අතර පහත දැක්වෙන වගුව ධන උත්පාදනය හා ඒ භාවිතා කළ අන්දම පිළිබඳ විශ්ලේෂණයක් ගෙන එයි.

	2013 රු. මිලියන	2012 රු. මිලියන	%
එකතු කළ අගය			
බැංකු සේවා කටයුතු සැපයීමෙන් ලද ආදායම	123,562	105,674	17
සේවා සැපයීම් පිරිවැය	(64,102)	(46,385)	38
බැංකු සේවා තුලින් එකතු කළ අගය	59,460	59,289	0
බැංකු සේවා නොවන ආදායම	3,902	4,464	(13)
ණය හා අනෙකුත් අලාභ සඳහා අපහායනය	(6,923)	(5,904)	17
	56,439	57,849	(2)
අගය විසර්ජනය			
සේවකයන්ට			
වැටුප්, වේතන හා අනෙකුත් ප්‍රතිලාභ	14,669	12,927	13
රජයට			
ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ	5,346	5,346	-
ආදායම් බදු	3,703	5,508	(33)
එකතු කළ අගය මත බදු	2,711	3,214	(16)
	11,760	14,068	(16)
බාහිර අරමුදල් සපයන්නන්ට			
සෙසු ණය ගැනීම් උදෙසා පොලිය	16,256	16,334	(0.5)
නිකුත් කළ ණයකර සඳහා පොලිය	5,977	4,619	29
	22,233	20,953	6
ව්‍යාප්තිය හා වර්ධනය උදෙසා			
රඳවා ගත් ලාභය	6,741	9,071	(26)
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	1,117	960	16
විලම්බිත බදු	(81)	(130)	(38)
	7,777	9,901	(21)
	56,439	57,849	(2)

එකතු කළ ආර්ථික අගය

	2013 රු. මිලියන	2012 රු. මිලියන
ආයෝජනය කළ ප්‍රාග්ධනය		
සාමාන්‍ය කොටස් හිමි ප්‍රාග්ධනය	54,327	46,153
ප්‍රති ප්‍රමාණිත සංචිත	(5,211)	(5,222)
2006 නිකුත් කළ ප්‍රසාද කොටස්	(1,400)	(1,400)
	47,716	39,531
ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ		
වාර්තා කළ පරිදි බදු පසු ලාභය	12,087	14,417
ප්‍රති ප්‍රමාණිත අතිරික්තය මත අදාල වන ක්ෂය කිරීම්	(521)	(522)
ආයෝජිත ප්‍රාග්ධනය මත සමස්ත ප්‍රතිලාභ	11,566	13,895
ආයෝජිත ප්‍රාග්ධනයේ ආවස්තික පිරිවැය*	(3,956)	(3,763)
එකතු කළ ආර්ථික අගය	7,610	10,132
එකතු කළ ආර්ථික අගය	8.29%	9.52%

පාරිසරික වාර්තාව

අපගේ සමාජ ආර්ථික හිමිකමෙහි පිළිබිඹුව

10.9 මිලියන

බඳවා ගැනීමේ මට්ටමේ ගණුදෙනුකාර හිණුම්

රු. බිලියන

4.5

සේවකයින්ට අපහසුවක් නොමැතිව ගෙවිය හැකි ණය

ජාලගත පිවිසුම තුළින් සියළුදේ සපිරි බැංකුකරණය සහ විවිධ ඛණ්ඩ වෙත අපගේ නිමවුම් ගැළපීම.

රු. බිලියන

52.3

ජාලගත මාර්ග සංවර්ධනය උදෙසා දරණ ලද දායකත්වය

රු. බිලියන

421

කේන්ද්‍ර හයක් සංවර්ධනය කිරීම උදෙසා දක්වන ලද දායකත්වය

36,000


අපගේ අරමුදල් තුළින් වක්‍රව ජනිත කරන ලද රැකියා සංඛ්‍යාව

ලංකා බැංකුව ත්‍රිත්ව යටිතල (triple bottom line) ප්‍රවේශයක් අනුගමනය කරන අතර පරිසරය සුරැකීම, අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍රයකි. ඒ අනුව අප විසින් වර්ෂය තුළදී කඩදාසි කිලෝග්‍රෑම් 49,860 ක් සහ ඉලෙක්ට්‍රොනික තොරතුරු තාක්ෂණ අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 371ක් ප්‍රතිචක්‍රීකරණය කරන ලදී. තවද විමෝචනය සහ පරිභෝජනය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. රු. මිලියන 250ට වැඩි සියළුම ණය සහ අත්තිකාරම්, (2013 වර්ෂයේදී මෙහි සමස්තය රු.මිලියන 67,268ක් විය). ණය ඇගයීමේ සහ පරිපාලන ක්‍රියාවලියේදී පරිසර සහතිකය ලබා ගන්නා බවට අප විසින් සහතික කෙරේ. මෙම ක්ෂේත්‍රයෙහි අපගේ කාර්යසාධනය නිරීක්ෂණය කිරීම උදෙසා තවදුරටත් වැඩි දියුණු කර ගත යුතු ක්ෂේත්‍ර කිහිපයක් ඇති බවට අප විසින් හඳුනා ගෙන ඇති අතර එය 2013 වර්ෂයේ අපගේ ප්‍රතිපත්ති සහ අරමුණු වල ඉතා හොඳින් විග්‍රහ කර ඇත. පරිසරය සම්බන්ධයෙන් ප්‍රකාශිත අරමුණු වලට වූ අපගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට හැකි බවට සහතික කිරීම සඳහා බැංකුව විසින් වැඩසටහනක් ක්‍රියාවෙහි යොදවා ඇත.

අනාගත ඉලක්ක

- සියළුම ශාඛා සඳහා පරිසර කාර්ය සාධන ඉලක්ක ලබා දීම.
- පරිසර සංරක්ෂණ කටයුතු වලට සේවක මණ්ඩලයේ දායකත්වය ඉහළ නැංවීම
- අපගේ කාබන් පිය සටහන මැනීමට සහ අවම කිරීමට ක්‍රියා මාර්ග අන්තර් ගත කිරීම
- පරිසරය සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් සේවක මණ්ඩලය දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කාබන් දහනය අවම කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම
- අපගේ ප්‍රථම ''හරිත ගොඩනැඟිල්ල'' 2014 වසරේදී ඉදි කිරීම

අපගේ පාරිසරික පියසටහන්



රු. මිලියන

1,000

නැවත භාවිතා කළ හැකි බලශක්ති ව්‍යාපෘති සතරක් සඳහා ණය සහ අත්තිකාරම්

2013 වර්ෂයේ දී කඩදාසි මධ්‍යයෙන් සිදුකළ ගණුදෙනු විද්‍යුත් මධ්‍යට හිලව් කිරීම හේතුවෙන් කඩදාසි මිලියන 25 ක් පමණ ඉතිරි කර ගැනීමට හැකිවිය.



ප්‍රතිචක්‍රීකරණය කිරීම

371 කි.ග්‍රෑම්

ඉලෙක්ට්‍රොනික (තොරතුරු තාක්ෂණ) අපද්‍රව්‍ය

ශබ්ද දූෂණය 90 db සිය 70 db දක්වා අවම කිරීම



සුරැකීම

848

හොඳින් වැඩුණු ගස් 848ක් ප්‍රතිචක්‍රීකරණය

හරිතාගාර වායු විමෝචනය

49,860 කි.ග්‍රෑම්

අඩු කිරීම



අපගේ වාහන බල ඇණිය දෙමුහුන් වාහන වලට ක්‍රමිකව පරිවර්තනය වීම

පාරිසරික ව්‍යාපෘති සඳහා සේවක මණ්ඩල දායකත්වය

ස්වාධීන සහතික වාර්තාව

Ernst & Young
Chartered Accountants
201 De Saram Place
P.O. Box 101
Colombo 10
Sri Lanka

Tel : +94 11 2463500
Fax Gen : +94 11 2697369
Tax : +94 11 5578180
eysl@lk.ey.com
ey.com

තිරසර පැවැත්ම පිළිබඳ වාර්තාව 2013 සම්බන්ධයෙන් ලංකා බැංකුවේ පාර්ශවකරුවන් වෙත යොමු කෙරෙන ස්වාධීන සහතික වාර්තාව

හැඳින්වීම හා ප්‍රතිඥාත වපසරිය

ලංකා බැංකුවේ (බැංකුව) කළමනාකාරිත්වය, තිරසර පැවැත්ම 2013 පිළිබඳව (වාර්තාව) පහත දැක්වෙන අංගයන් පිළිබඳ ස්වාධීන සහතිකයක් සැපයීම සඳහා අපට භාර කර ඇත.

- වාර්තාවේ පිටු අංක 129 හි සඳහන් කර ඇති මූල්‍ය කාර්ය සාධන තොරතුරු පිළිබඳ සාධාරණ සහතිකයක්
- ගෝලීය වාර්තාකරණ මුලපිරීම G4 - සර්වග්‍රාහී මඟපෙන්වීම අනුව යමින් සකස් කර ඇති වාර්තාවේ අඩංගු අනෙකුත් තොරතුරු පිළිබඳ සීමිත සහතිකයක්.

අපේ කාර්යයේ පදනම හා සහතික මට්ටම

අප මෙම සීමත සහතික ප්‍රතිඥානය සඳහා (SLSAE 3000) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති විගණනය හා වෙතිහාසික මූල්‍ය තොරතුරු හැර සහතික ප්‍රතිඥාත හා අනුගත වෙමින් අපේ පිළිවෙත් මෙහෙයවීමු.

මෙම සීමිත සහතික ප්‍රතිඥාතය සඳහා භාවිතා කළ උපමාන පාදකවී ඇත්තේ තිරසර පැවැත්ම මඟපෙන්වීම (GRI මඟපෙන්වීම) හා ඊට අදාළ තොරතුරු- විශේෂයෙන් GRI G4 ළඟා කර ගැනීමට අවශ්‍යතාවය අනුවය. මේ අනුව පොදු දැනගැනීම සඳහා විස්තීර්ණ මාර්ග නිර්දේශ "www.globalreporting.org" ප්‍රකාශ කර ඇත.

අපේ ප්‍රතිඥාතය සීමිත සහතිකයක් මෙන්ම සාධාරණ සහතිකයක් ද සපයයි. සීමිත සහතික ප්‍රතිඥානයන් SLSAE - 3000 ට අනුකූලව නිමකළ සාධාරණ සහතික ප්‍රතිඥාතයකට වඩා සැලකිය යුතු තරම් අඩු වපසරියකින් යුක්ත වන අතර ඒ හේතුව නිසාම සාධාරණ සහතික ප්‍රතිඥාතයක හඳුනාගත හැකි සියළුම වැදගත් අංග පිළිබඳ දැනුවත් වේ යැයි තහවුරු කරලන්නට හැකියාවක් ලබානොදේ. ඒ අනුව අපි සාධාරණ සහතිකයක් පිළිබඳව මතයක් පළ නොකරන්නෙමු.

වාර්තාව පිළිබඳව බැංකු කළමනාකාරිත්වයේ වගකීම

ස්වයං-ප්‍රකාශනය පිලියෙල කිරීම, වාර්තාව තුල අඩංගු තොරතුරු හා ප්‍රකාශ සහ GRI තිරසර පැවැත්ම වාර්තාකරණ මඟපෙන්වීම් වලට අනුරූප පරිදි තිරසර පැවැත්ම වාර්තාකරණ පිළිවෙත සඳහා නිර්මාණය කර ඇති ප්‍රමාණවත් වාර්තා සහ අභ්‍යන්තර පාලන විධි පිළිබඳ වගකීම බැංකු කළමනාකාරිත්වයට පැවරී ඇත.

'අර්න්ස්ට් ඇන්ඩ් යංග්' හි වගකීම

අපගේ වගකීම වන්නේ මෙම වාර්තාව 'ගෝලීය වාර්තාකරණ මුලපිරීම G4- අනුරූප සර්වග්‍රාහී මඟපෙන්වීම්' සමඟ අනුගත නොවන පරිදි පිළියෙල කර ඇතැයි විශ්වාස කරන්නට අප මෙහෙයවන කිසිදු කරුණක් පිළිබඳව අපට දැනගන්නට ලැබී ඇත්දැයි නිශ්චිත මතයක් ප්‍රකාශ කිරීමය.

මෙම වාර්තාව ඉදිරිපත් කරනුයේ හුදෙක් බැංකුවට පමණක් වන අතර, ඒ 2014 ජනවාරි 17 දිනැති අපගේ ප්‍රතිඥාත ලිපිය හා අනුරූපවය. බැංකුව හැර වෙනත් පුද්ගලයෙකු හෝ මෙය සකස් කළ හේතුව හැර අන් හේතුවක් සඳහා හෝ මෙම වාර්තාව මත විශ්වාසය රැඳවීමේ වගකීම පිළිබඳව කවර හෝ ආරෝපණයක් අපි, ප්‍රතික්ෂේප කරන්නෙමු. අපගේ ප්‍රතිඥාත හැසිරවීමේ දී, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ වෘත්තීය ගණකාධිකාරීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයේ ස්වාධීන අවශ්‍යතාවනට අනුකූලව කටයුතු කළෙමු.

ප්‍රධාන සහතික කිරීම් ක්‍රියා පටිපාටි

අපි, අපේ සීමිත සහතිකය පිළිබඳ නිශ්චය සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කරන්නට අවශ්‍ය යැයි හැඟුණු තොරතුරු හා පැහැදිලිකිරීම් ලබාගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටිය සැලසුම් කොට නිම කළෙමු.

Partners: A D B Talwatte FCA FCMA M P D Cooray FCA FCMA R N de Saram ACA FCMA Ms. N A De Silva ACA Ms. Y A De Silva FCA W R H Fernando FCA FCMA
W K B S P Fernando FCA FCMA A P A Gunasekera FCA FCMA A Herath FCA D K Hulangamuwa FCA FCMA LLB (Lond) H M A Jayesinghe FCA FCMA
Ms. A A Ludowyke FCA FCMA Ms. G G S Manatunga ACA N M Sulaiman ACA ACMA B E Wijesuriya ACA ACMA

A member firm of Ernst & Young Global Limited

ප්‍රධාන සහතිකකිරීම් ක්‍රියාපටිපාටියෙහි පහත දැක්වෙන දෑ අඩංගු විය.

- තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය, ඒකරාශීකරණය හා ඉදිරිපත් කිරීම පිළිබඳ ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම සඳහා බැංකුවේ අදාළ නිලධාරීන් හමුවී සාකච්ඡා කිරීම.

- වාර්තාවේ අඩංගු තොරතුරු විමර්ශනය කොට වලංගු කිරීම.

- නියැදි පදනමක් මත ප්‍රති-ගණනය කරමින් බැංකුව විසින් සිදුකල ගණනයන් පිරික්සීම.

- මූල්‍යමය කාර්යඵලය පිළිබඳ දත්ත, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන තුලින් නිසිසේ උකහා ගත්තේ ද යන්න පිළිබඳව සසඳා චකාශ්වීම.

- වාර්තාවේ අන්තර්ගතය, ගෝලීය වාර්තාකරණ මුලපිරීම G4 අනුරූප ස්වර්ගාහී මඟපෙන්වීම් උපමානයන් සමඟ සංසන්දනය කිරීම. තොරතුරු රැස්කිරීමට හා ඒකරාශී කිරීමට භාවිතා කළ ඉලෙක්ට්‍රොනික පද්ධති පරීක්ෂාව අපේ ක්‍රියාවලියට අන්තර්ගත නොවීය. පාරිසරික හා සමාජයීය දත්ත, ඒවායේ ස්වභාවය හා එබඳු දත්ත නිශ්චය, ගණනය හා ඇස්තමේන්තු කරන්නට භාවිතා කළ ක්‍රම වේද මත එයටම ආවේනික සීමාවන්ට යටත්වේ.

නිගමනය

ඉහතින් සඳහන් කර ඇති ආකාරයට, ඉටු කළ පිළිවෙත් මත පදනම් ව, අපි මෙසේ නිගමනය කරමු.

- වාර්තාවේ පිටු 129 දක්වා ඇති මූල්‍ය කාර්යඵල තොරතුරු 2012 හා 2013 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශවලින් නිසි සේ උකහා ගෙන ඇත.

- මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති කාර්යඵල දර්ශක අනෙකුත් තොරතුරු, පසු GRI G4 තිරසර පැවැත්ම මඟ පෙන්වීම් තුළින් ජනිත වන බැංකුවේ තිරසර පැවැත්ම පරිචයන් හා ප්‍රතිපත්තිවලට අනුකූලව ඉදිරිපත් කර නැතැයි විශ්වාස කරන්නට හේතු කාරක වන කිසිවක් අපේ අවධානයට ලක්වී නැත.

Ernst & Young

වරලත් ගණකාධිකාරීවරු

කොළඹ දී ය.

G4 සම්මත හෙළිදරව් කිරීමේ දර්ශකය

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
	උපාය මාර්ග හා විශ්ලේෂණය		
G4-1	ආයතනයේ වඩාත්ම ජ්‍යෙෂ්ඨ තීරණ ගන්නාගේ වාර්තාව	සභාපතිතුමාගේ වාර්තාව	22 - 29
G4-2	ප්‍රධාන පෙළේ බලපෑම්, අවදානම් හා අවස්ථාවන්	ව්‍යාපාරික ආකෘතිය	16 - 17
	සංවිධාන ආකෘතිය		
G4-3	ආයතනයේ නම	පසුපස ඇතුල් කවරය	
G4-4	මූලික සන්නාම, නිෂ්පාදන/සේවා	නිෂ්පාදන/සේවා	389 - 401
G4-5	ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම	පසුපස ඇතුල් කවරය	
G4-6	ආයතනය මෙහෙයුම් කටයුතු කරන රටවල් සංඛ්‍යාව, ඒවායේ නම්	දේශයේ බැංකුකරුවා	9
G4-7	හිමිකම් ස්වභාවය හා නෛතික තත්ත්වය	පසුපස ඇතුල් කවරය	
G4-8	සේවා සැපයුම් වෙළඳපල	දේශයේ බැංකුකරුවා	9
G4-9	වාර්තාකරණ ආයතනයේ පරිමාව	වැදගත් මූල්‍ය තොරතුරු	12
G4-10	සේවක මණ්ඩල තොරතුරු	සේවක මණ්ඩල වාර්තාව	116-117
G4-11	සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් මඟින් ආවරණය වන සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතය	සේවක මණ්ඩල වාර්තාව	114
G4-12	ආයතනයේ සැපයුම් දාමය	ව්‍යාපාරික ආකෘතිය	17
G4-13	වාර්තාගත කාලසීමාව තුළ ආයතනයේ ප්‍රමාණය, ව්‍යුහය හා හිමිකමේ සිදුවූ සැලකිය යුතු වෙනස්කම්	සැලකිය යුතු වෙනසක් නැත	
G4-14	පූර්ව ආරක්ෂණ ප්‍රවේශය ආයතනය විසින් සැලකිල්ලට ගත්තේද එසේ නම් ඒ කෙසේද යන වග	සාමාජයීය වාර්තාව	126 - 128
G4-15	බාහිරව සංවර්ධනය කරන ලද, ආයතනය පිළිගන්නා හා දායකත්වය සැපයූ පාරිසරික හා සාමාජයීය ප්‍රඥප්ති, ප්‍රතිපත්ති හා අනෙකුත් මූල පිරිම්	සාමාජයීය වාර්තාව	126 - 128
G4-16	සංගම්, සමාජ සහ/හෝ දේශීය/ ජාත්‍යන්තර පාර්ශ්වික සංවිධානයන්හි සාමාජිකත්වය	සාමාජයීය වාර්තාව	126 - 128
	හඳුනාගත් අනුරූප විෂය පථය හා සීමාවන්		
G4- 17	ආයතනයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ හෝ ඒ හා සමාන ලේඛණයන්හි ඇතුලත් කර ඇති ආයතන	සමූහයේ ආකෘතිය	76 - 77
G4-18	අන්තර්ගතය හා විෂය පථයේ සීමාවන් නිර්වචනය කිරීමේ පිළිවෙත	අනුරූප විෂයපථ හා සීමාවන්	7 - 8
G4-19	අනුරූප විෂයපථය	අනුරූප විෂයපථ හා සීමාවන්	7 - 8
G4-20	ආයතනය තුල විෂයපථ සීමාවන්	අනුරූප විෂයපථ හා සීමාවන්	7 - 8
G4-21	ආයතනයෙන් බැහැර විෂයපථ සීමාවන්	අනුරූප විෂයපථ හා සීමාවන්	7 - 8

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
G4- 22	පෙර වාර්තාවේ තොරතුරු පිළිබඳ පුන ප්‍රකාශයක් වේ නම් ඉන් මතුවන ප්‍රතිඵලය හා එබඳු පුන ප්‍රකාශයකට හේතු	ඒක පුද්ගල විදුලි පරිභෝජනය 2.35 Mwh සිට 1.9 Mwh දක්වා ඒක පුද්ගල ජල පරිභෝජනය 41.68 L සිට 35.5 L දක්වා ඒක පුද්ගල බල ශක්ති පරිභෝජනය 149.5 L සිට 78.4 L දක්වා	
G4- 23	පෙර වාර්තාකරණ කාලච්ඡේද හා අනුරූප විෂයපථ හා සීමාවන් තුළවූ සැලකිය යුතු වෙනස්වීම්	වාර්තාව පිළිබඳව	6
	පාර්ශ්වකරු සම්බන්ධතා ක්‍රියාදාමය		
G4-24	ආයතනය හා අන්‍යෝන්‍ය සම්බන්ධතාවේ නියැලෙන පාර්ශ්වකාර කණ්ඩායම්	පාර්ශ්වකරු සම්බන්ධතා ක්‍රියාදාමය	35 - 36
G4-25	පාර්ශ්වකරුවන් හඳුනාගැනීම හා තෝරා ගැනීමේ පදනම	පාර්ශ්වකරු සම්බන්ධතා ක්‍රියාදාමය	35 - 36
G4-26	පාර්ශ්වකරුවන් ගේ සම්බන්ධතා ක්‍රියාදාමයේ ප්‍රවේශය	පාර්ශ්වකරු සම්බන්ධතා ක්‍රියාදාමය	35 - 36
G4-27	පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතා තුළින් මතුවූ ප්‍රධාන කරුණු, සැලකිලිමත්වීම් හා ඒ මත ආයතනයේ ප්‍රතිචාරය	පාර්ශ්වකරු සම්බන්ධතා ක්‍රියාදාමය	35 - 36
	වාර්තාකරණ පැතිකඩ		
G4-28	වාර්තාකරණ කාල පරිච්ඡේදය	වාර්තාව පිළිබඳව	6
G4-29	වඩාත් ආසන්නතම වාර්තාවේ දිනය	31 දෙසැම්බර් 2012	
G4-30	වාර්තාකරණ චක්‍රය	වාර්ෂික	
G4-31	වාර්තාව හෝ එහි අඩංගු දෑ පිළිබඳව විමසුම් ලබා ගත හැකි ස්ථානය	පසුපස ඇතුල් කවරය	
G4-32	GRI G4 මඟ පෙන්වීම්, GRI අන්තර්ගත දර්ශකය හා වාර්තාව උදෙසා බාහිර සහතිකය	G4 සම්මත හෙළිදරව් කිරීම් හා සහතික වාර්තාව	134 - 143
G4-33	වාර්තාව සඳහා බාහිර සහතිකයක් ලබා ගැනීම පිළිබඳව පවත්නා ප්‍රතිපත්ති හා වත්මන් පරිචය	වාර්තාව පිළිබඳව	6
	යහපාලනය		
G4-34	ආයතනයේ යහපාලන ව්‍යුහය	ආයතනික යහපාලනය	144 - 187
G4-35	ආර්ථික, පාරිසරික හා සමාජයීය විෂයයන් පිළිබඳ බලතල විමධ්‍යගත කිරීමේ පිලිවෙත	ආයතනික යහපාලනය	144 - 187
G4-36	ආර්ථික, පාරිසරික හා සමාජයීය විෂයයන් පිළිබඳ වගකීම දැරීමට විධායක තලයේ තනතුරක්/තනතුරු ස්ථාපිත කර තිබේද යන්න	ආයතනික යහපාලනය	144 - 187
G4-37	ඉහළම යහපාලන සමූහනය හා පාර්ශ්වකරුවන් අතර ආර්ථික, පාරිසරික හා සමාජයීය විෂයයන් පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීම සඳහා ඇති පිළිවෙත්	ආයතනික යහපාලනය	144 - 187
G4-38	ඉහළම යහපාලන මණ්ඩලයේ සංයුතිය	අධ්‍යක්ෂ මණ්ඩලය	42 - 45
G4-39	ඉහළම යහපාලන මණ්ඩලයේ ප්‍රධානියා ඒ සමඟම විධායක නිලධාරියෙකු වන්නේද යන වග	අධ්‍යක්ෂ මණ්ඩලය	42

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
G4-40	ඉහළම යහපාලන සමූහනය හා එහි කමිටු සඳහා නම් කරනු ලැබීම හා තෝරා ගැනීමේ පිළිවෙත සහ ඉහළම යහපාලන සමූහනයේ සාමාජිකයන් තෝරා ගැනීමේදී භාවිත උපමාන	ආයතනික යහපාලනය	144 - 187
G4-41	බැඳියා පිළිගැටුම් වළක්වන බවට තහවුරු කරනු සඳහා උසස්ම යහපාලන සමූහනයේ පිළිවෙත් බැඳියා පිළිගැටුම් පාර්ශ්වකරුවන්ට හෙළිදරව් කරන්නේද යන්න	ආයතනික යහපාලනය	144 - 187
G4-42	අරමුණ, අගය හා උපාය මර්ග ස්ථාපිත කරලීමෙහිලා උසස්ම යහපාලන සමූහනයේ භූමිකාව	ආයතනික යහපාලනය	144 - 187
G4-43	ආර්ථික, සාමාජීය හා පාරිසරික විෂය පිළිබඳ උසස්ම යහපාලන සමූහනයේ සාමූහික දැනුම	ආයතනික යහපාලනය	144 - 187
G4-44	ආර්ථික, පාරිසරික හා සමාජයීය විෂයයන්ට අදාළව ආයතනයේ උසස්ම යහපාලන සමූහනයේ කාර්යඵල ඇගයීමේ පටිපාටිය	ආයතනික යහපාලනය	144 - 187
G4-45	ආර්ථික, සමාජයීය හා පාරිසරික බලපෑම්, අවදානම් හා අවස්ථා හඳුනාගැනීම හා කළමනාකරණය පිළිබඳ උසස්ම යහපාලන සමූහනයේ භූමිකාව	ආයතනික යහපාලනය	144 - 187
G4-46	ආර්ථික, සමාජයීය හා පාරිසරික විෂය මත ආයතනයේ අවදානම් කළමනාකරණ පිලිවෙතෙහි කාර්යක්ෂමතාවය සමාලෝචනය කිරීමෙහිලා ඉහළම යහපාලන සමූහනයේ භූමිකාව	ආයතනික යහපාලනය	144 - 187
G4-47	ආර්ථික, සමාජයීය හා පාරිසරික බලපෑම්, අවදානම් හා අවස්ථා සමාලෝචනය පිළිබඳ ඉහළම යහපාලන සමූහනයේ සංඛ්‍යාතය	ආයතනික යහපාලනය	144 - 187
G4- 48	ආයතනයේ තිරසර පැවැත්ම වාර්තාව විධිමත්ව සමාලෝචනය කොට, සමස්ත අනුරූප විෂය පථ ආවරණය වී ඇතැයි තහවුරු කොට අනුමත කරන ඉහළම කමිටුව හෝ නිලය	ආයතනික යහපාලනය	144 - 187
G4-49	ඉහළම යහපාලන මණ්ඩලය වෙත තීරණාත්මක සැලකිලිමත්වීම් සන්නිවේදනය කිරීමට ඇති පිළිවෙත්	ආයතනික යහපාලනය	144 - 187
G4-50	ඉහළම යහපාලන මණ්ඩලය වෙත යොමු කළ තීරණාත්මක සැලකිලිමත්වීම් ස්වභාවය, සංඛ්‍යාව හා ඒ පිළිබඳ අවධානය යොමු කොට සමථය කරා එළඹීමට පවත්නා යාන්ත්‍රණය	ආයතනික යහපාලනය	144 - 187
G4-51	ඉහළම යහපාලන මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ට පාරිශ්‍රමික ගෙවීම් ප්‍රතිපත්තිය	ආයතනික යහපාලනය	144 - 187
G4-52	පාරිශ්‍රමික තීරණය කරන පිළිවෙත	ආයතනික යහපාලනය	144 - 187
G4-53	පාරිශ්‍රමික පිළිබඳව පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබා ගන්නා ආකාරය	සේවක වාර්තාව	114 - 125
G4-54	ආයතනයේ සැලකිය යුතු මට්ටමේ මෙහෙයුම් ඇති හැම රටක් පාසාම ඉහළම ගෙවීම් ලබන්නාගේ වාර්ෂික පාරිශ්‍රමිකය හා සමස්ත සේවක මණ්ඩලයේ වාර්ෂික පාරිශ්‍රමිකයේ මධ්‍යස්ථය අතර අනුපාතය	මූල්‍ය වාර්තා	332 - 333
G4-55	G4-54 අනුව ප්‍රතිශත වැඩිවීමෙහි අනුපාතය	මූල්‍ය වාර්තා	332 - 333

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
	ආචාර ධර්ම හා විශ්වසනීයත්වය		
G4-56	ආයතනයේ වටිනාකම්, ප්‍රතිපත්ති, ප්‍රමිති සහ චර්යා හා ආචාර ධර්ම සංග්‍රහ බඳු සම්මුතීන්	ආයතනික යහපාලනය	144 - 187
G4-57	ආචාර ධර්ම හා නීත්‍යානුකූල චර්යා සඳහා උපදෙස් ලබා ගැනීමට ඇති අභ්‍යන්තර හා බාහිර යාන්ත්‍රණ	ආයතනික යහපාලනය	144 - 187
G4-58	ආචාර ධර්ම විරෝධී හා නීත්‍යානුකූල නොවන චර්යා හා ආයතනයේ විශ්වසනීයත්වයට හානිකර දෑ පිළිබඳව වාර්තා කිරීමට ඇති අභ්‍යන්තර හා බාහිර යාන්ත්‍රණ	ආයතනික යහපාලනය	144 - 187
	විශේෂිත සම්මත හෙලිදරව් කිරීම්		
G4-DMA	කළමනාකරණ ප්‍රවේශය පිළිබඳ හෙලිදරව්ව	වාර්තාව මුළුල්ලේම	
	ආර්ථික		
	ආර්ථික කාර්ය එලය		
G4-EC1	ජනිත කළ සෘජු ආර්ථික අගය හා විසර්ජනය	එකතු කළ අගය මත ප්‍රකාශය	129
G4-EC2	දේශගුණික විපර්යාසය හේතුවෙන් ආයතනයේ කටයුතුවලට වූ මූල්‍යමය බලපෑම්, අනෙකුත් අවදානම් හා අවස්ථාවන්	අදාල නැත	
G4-EC3	ආයතනයේ නිර්වචනය කළ ප්‍රතිලාභ සැලසුම් ආවරණය	මූල්‍ය ප්‍රකාශ	312 - 316
G4-EC4	රජයෙන් ලැබූ සැලකිය යුතු මූල්‍යාධාර	බැංකුව රජයෙන් සැලකිය යුතු මූල්‍යාධාර නොලබයි	
	වෙළඳපල නියෝජනය		
G4-EC5	සැලකිය යුතු මෙහෙයුම් පිහිටීම් හි දේශීය අවම වැටුපට සාපේක්ෂව, පිවිසුම් තලයේ සම්මත වැටුප් අනුපාත පරාසය - ස්ත්‍රී පුරුෂභාවය මත	පිවිසුම් තලයේ වැටුප් දේශීය අවම වැටුපට වඩා වැඩිය	
G4-EC6	සැලකිය යුතු මෙහෙයුම් පිහිටීම්හි දේශීය ප්‍රජාව තුළින් බඳවා ගන්නා ලද ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව අනුපාතය	සේවක වාර්තාව	116
	වක්‍ර ආර්ථික බලපෑම්		
G4-EC7	අත්වැල් සැපයූ යටිතල පහසුකම් ආයෝජන හා සේවා මඟින් ලත් බලපෑම හා සංවර්ධනය	ශ්‍රී ලංකාව සංවර්ධනයේ මුවවිට	18
G4-EC8	සැලකිය යුතු මට්ටමේ වක්‍ර ආර්ථික බලපෑම්, බලපෑමේ වපසරියද ඇතුළුව	ශාඛා බැංකු කටයුතු	84 - 85
	සම්පාදන පිළිවෙත්		
G4-EC9	සැලකිය යුතු මෙහෙයුම් ස්ථානයන්හි දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලදී ගත් ප්‍රමාණය	අදාල නැත	
	පාරිසරික		
	ද්‍රව්‍ය		
G4-EN1	බර හා පරිමාව අනුව භාවිතා කළ ද්‍රව්‍ය	පාරිසරික වාර්තාව	131
G4-EN2	ප්‍රතිචක්‍රීකරණය කළ යෙදවුම් ද්‍රව්‍ය සංඛ්‍යාව	කිසිවක් නැත	
	බලශක්තිය		
G4-EN3	ආයතනය තුළ බලශක්ති පරිභෝජනය	අපගේ සය ආකාර ප්‍රාග්ධන කාර්යසාධනය	13
G4-EN4	ආයතනයෙන් බැහැර බල ශක්ති පරිභෝජනය	අදාල නැත	
G4-EN5	බලශක්ති තීව්‍රතාවය	වාර්තා කර නැත	

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
G4-EN6	බලශක්ති පරිභෝජනය අවම කිරීම	අපගේ සය ආකාර ප්‍රාග්ධන කාර්යසාධනය	13
G4-EN7	නිමැවුම් හා සේවා සඳහා බලශක්ති අවශ්‍යතා	අපගේ සය ආකාර ප්‍රාග්ධන කාර්යසාධනය	13
	ජලය		
G4-EN8	ප්‍රභවය අනුව ලබා ගත් ජලය	සැලකිය යුතු මට්ටමක නැත	
G4-EN9	ජලය ලබා ගැනීම නිසා සැලකිය යුතු මට්ටමක බලපෑමට ලක්වූ ජල මූලාශ්‍ර	සැලකිය යුතු මට්ටමක නැත	
G4-EN10	ප්‍රතිචක්‍රීකරණය කොට යළි භාවිත කළ ජලයේ ප්‍රතිශතය හා පරිමාව	නැත, ජලය ප්‍රතිචක්‍රීයකරණය කර නැත	
	ජෛව විවිධත්වය		
G4-EN11	සංරක්ෂිත ප්‍රදේශ තුළ හා සංරක්ෂිත ප්‍රදේශවලින් පිටත ඉහළ ජෛව විවිධත්ව අගයක් සහිත ප්‍රදේශ තුළ හෝ ඊට යාබදව, අයිති, බදුගත් හෝ කළමනාකරණය කළ භූමි ප්‍රමාණය හා පිහිටීම	බැංකුවේ මෙහෙයුම් ඒකක සංරක්ෂිත ප්‍රදේශ තුළ හෝ ඉහළ ජෛව විවිධත්ව අගයන් සහිත ප්‍රදේශ තුල පිහිටා නැත	
G4-EN12	සංරක්ෂිත ප්‍රදේශ තුළ හා සංරක්ෂිත ප්‍රදේශවලින් පිටත ඉහළ ජෛව විවිධත්ව අගයක් සහිත ප්‍රදේශ තුළ ක්‍රියාකාරකම්, නිමැවුම් හා සේවා මඟින් ජෛව විවිධත්වයට ඇති සැලකිය යුතු බලපෑම පිළිබඳ විස්තරය	බැංකුවේ නිමැවුම් හෝ මෙහෙයුම් ජෛව විවිධත්වය කෙරෙහි බලපෑමක් නොකරයි	
G4-EN13	සංරක්ෂිත හෝ පිළිසකර කළ ජීවී බිම්	කිසිවක් නැත	
G4-EN14	ජීවී බිම්වල මෙහෙයුම් නිත්‍ය බලපෑමට ලක් වූ, IUCN රතු ලැයිස්තුවේ අඩංගු ජීව විශේෂ සංඛ්‍යාව, විනාශයට ලක් කිරීමේ මට්ටම් මත	කිසිවක් නැත. බැංකුවේ මෙහෙයුම්, රතු ලැයිස්තුවේ අඩංගු ජීව විශේෂ කෙරෙහි බලපෑමක් නොකරයි	
	විමෝචන		
G4-EN15	සෘජු හරිතාගාර වායු විමෝචනය (වපසරිය 1)	අදාල නැත	
G4-EN16	වක්‍ර හරිතාගාර වායු විමෝචනය (වපසරිය 2)	අදාල නැත	
G4-EN17	වෙනත් වක්‍ර හරිතාගාර වායු විමෝචන (වපසරිය 3)	අදාල නැත	
G4-EN18	තීව්‍රතාවය අනුව හරිතාගාර වායු විමෝචන	අදාල නැත	
G4-EN19	හරිතාගාර වායු විමෝචන අවම කිරීම්	පාරිසරික වාර්තාව	130 - 131
G4-EN20	ඕසෝන් ස්ථරය ක්ෂය කරවන ද්‍රව්‍ය විමෝචනය	වාර්තාකර නැත	
G4-EN21	Nox, SOx හා වෙනත් සැලකිය යුතු වායු විමෝචනයන්	වාර්තාකර නැත	
	අපවාහ සහ අපද්‍රව්‍ය		
G4-EN22	ගුණාත්මක තත්ත්වය භාවිතා කළ ක්‍රමවේදය, ගමනාන්තය හා වාර්තාකරණ ප්‍රමිතිය අනුව පිට කළ සමස්ත ජලය සහ භාවිතා කළ උපකල්පනද සමඟ	අදාල නැත	
G4-EN23	වර්ගීකරණය හා භාවිතා කළ ක්‍රමවේදය අනුව පිට කළ සමස්ත අපද්‍රව්‍ය ප්‍රමාණය	අර්ධ වශයෙන් අනුකූලය පාරිසරික වාර්තාව	130 - 131
G4-EN24	සැලකිය යුතු පිටාර පරිමාව හා සංඛ්‍යාව	අදාල නැත	
G4-EN25	බාසල් සම්මුතිය - අතිරේක I,II,III හා VIII අනුව අහිතකර අපද්‍රව්‍ය සේ සැලකෙන අපද්‍රව්‍ය ආනයනය, අපනයනය, ප්‍රවාහනය හෝ අපනයන ප්‍රමාණය හෝ පිළියම් කළ බර ප්‍රමාණය හා ජාත්‍යන්තරව ප්‍රවාහනය කළ ප්‍රතිශතය	කිසිවක් නැත	

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
G4-EN26	වාර්තාකරණ ආයතනයේ ජලය මුදා හැරීම් හා පිටාර හේතුවෙන් සැලකිය යුතු මට්ටමක බලපෑමට ලක්වූ ජලාශ්‍රිත ප්‍රදේශ හා ඒ හා බැඳුණු ජීව බිම්වල ප්‍රෙව විවිධත්ව අගය, සංරක්ෂිත තත්ත්වයන් හා ප්‍රමාණය	අපේ මෙහෙයුම්වලට අදාල නැත	
	නිමැවුම් හා සේවා		
G4-EN27	නිමැවුම් හා සේවාවන්හි පාරිසරික බලපෑම් වැළැක්වීමට ගත් පියවර හා වැළැක්වීමේ වපසරිය	පාරිසරික වාර්තාව	130 - 131
G4-EN28	අලෙවි කළ නිමැවුම් ප්‍රතිශතය හා ඊට අදාළ යලි භාවිතා කළ හැකි ඇසුරුම් ද්‍රව්‍ය වර්ගීකරණය	කිසිවක් නැත	
	අනුකූලතාවය		
G4-EN29	පාරිසරික නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම මත පැනවුණු සැලකිය යුතු දඩයන්හි මූල්‍ය අගය හා මූල්‍ය නොවන සම්බාධක සංඛ්‍යාව	කිසිවක් නැත	
	ප්‍රවාහනය		
G4-EN30	ආයතනයේ මෙහෙයුම් සඳහා භාවිතා කරන නිමැවුම්, අනෙක් භාණ්ඩ හා ද්‍රව්‍ය සහ සේවකයන් ප්‍රවාහනය කිරීමේදී මතුවූ සැලකිය යුතු පාරිසරික බලපෑම්	වාර්තා කර නැත	
	සමස්තය		
G4-EN31	ස්වභාවය අනුව සමස්ත පාරිසරික සංරක්ෂණ පිරිවැය හා ආයෝජන	අඩක් අනුකූලව ඇත පාරිසරික වාර්තාව	130 - 131
	සැපයුම්කරුවන්ගේ පාරිසරික තක්සේරුව		
G4-EN32	පාරිසරික උපමාන භාවිතා කොට පරීක්ෂාවට ලක් කළ නව සැපයුම්කරු ප්‍රතිශතය	අදාල නැත	
G4-EN33	සැපයුම්දාමයේ පවත්නා සැලකිය යුතු මට්ටමේ සත්‍ය හා විභව ඍණ පාරිසරික බලපෑම් හා ගත් පියවර	අදාල නැත	
	පාරිසරික ගැටළු සම්බන්ධ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය		
G4-EN34	විධිමත් දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් ඔස්සේ පාරිසරික ගැටළු පිළිබඳ ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව සහ විසඳුම් ලබා දුන් ගැටළු සංඛ්‍යාව	කිසිවක් නැත	
	සමාජයීය		
	ශ්‍රම පරිචයන් හා යහපත් වැඩ පරිසරය		
G4-LA1	වයස් ප්‍රමාණ, ස්ත්‍රී පුරුෂභාවය හා ප්‍රදේශය අනුව සමස්ත නව බඳවා ගැනීම් හා ඉවත්ව යෑම් සංඛ්‍යාව හා ප්‍රතිශත	සේවක වාර්තාව	114
G4-LA2	ප්‍රධාන මෙහෙයුම් අනුව පූර්ණකාලීන කාර්ය මණ්ඩලයට සලසන, එහෙත් තාවකාලික හා අර්ධකාලීන සේවකයන්ට නොසලසන ප්‍රතිලාභ	සේවක වාර්තාව	122
G4-LA3	දෙමාපිය නිවාඩුවලට අනතුරුව ආපසු පැමිණීම අනුපාතිකය හා නැවත සේවයේ යෙදවීම ස්ත්‍රී/පුරුෂභාවය මත	100% ආපසු පැමිණීම හා නැවත සේවයේ යෙදවීම සියළුම කාන්තා සේවිකාවන්ට මෙය හිමිවේ	

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
	ශ්‍රම කළමණාකරන සම්බන්ධතා		
G4-LA4	මෙහෙයුම් වෙනස්කම් පිළිබඳව අවම දැනුම්දීමේ කාල සීමාව හා ඒ ගැන සාමූහික හිවිසුමේ සඳහන් වේද යන්න	මාස 03	
	රැකියා ආශ්‍රිත සෞඛ්‍යය හා ආරක්ෂණය		
G4-LA5	විධිමත් කළමනාකරණ - සේවක ඒකාබද්ධ සෞඛ්‍ය හා ආරක්ෂණ කමිටුවල නියෝජනයවන ශ්‍රම බලකායේ ප්‍රතිශතය	සේවක වාර්තාව	123
G4-LA6	අනතුරු, රැකියා ආශ්‍රිත ආබාධ, අහිමි වූ දිනගණන හා සේවයට වාර්තා නොකිරීම	සේවක වාර්තාව	123
G4-LA7	තම රැකියාවට සාපේක්ෂව රෝගවලට ලක්වීමේ ඉහළ මට්ටමේ අවදානමක් සහිත සේවක සංඛ්‍යාව	අපගේ මෙහෙයුම් සඳහා අදාල නැත	
G4-LA8	වෘත්තිය සමිති හා එලඹෙන විධිමත් හිවිසුම් තුල ආවරණය වන සෞඛ්‍ය හා ආරක්ෂණ මාතෘකා	මෙබඳු විශේෂිත හිවිසුම් නොමැත	
	පුහුණු කිරීම් හා අධ්‍යාපනය		
G4-LA9	සේවක වර්ගීකරණය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව සැකසූ වසරකට වික් සේවකයකු සඳහා පුහුණු පැය සාමාන්‍යය	සේවක වාර්තාව	120
G4-LA10	සේවකයන්ගේ අඛණ්ඩ සේවය ලබා ගැනීමට හා වෘත්තීය සමාප්තිය කළමනාකරණයට සහාය සලසන කුසලතා පුහුණු හා දිවිය පුරා පවතින දැනුම සඳහා වූ වැඩසටහන්	සේවක වාර්තාව	119
G4-LA11	ස්ත්‍රී පුරුෂ භාවය හා සේවක වර්ගීකරණය අනුව කාර්ය සාධන හා වෘත්තීය සංවර්ධන සමාලෝචන නිතිපතා ලබන සේවක ප්‍රතිශතය	සේවක වාර්තාව	115 - 116
	විවිධත්වය හා සම-අවස්ථා		
G4-LA12	ස්ත්‍රී පුරුෂ භාවය, වයස් කාණ්ඩය, සුළු ජන සාමාජිකත්වය හා විවිධත්වය හඟවන සෙසු දර්ශක අනුව යහපාලන සමූහනයන්හි හා සේවක වර්ගීකරණය	සේවක වාර්තාව	116
	පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට සම පාරිශ්‍රමික		
G4-LA13	සැලකිය යුතු මට්ටමේ මෙහෙයුම් ස්ථාන හා සේවක වර්ගීකරණය මත ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ මූලික වැටුප් හා පාරිශ්‍රමික අනුපාතය	සම වැටුප් හා පාරිශ්‍රමික ගෙවීයි	
	ශ්‍රම පරිචයන් පිළිබඳ සැපයුම්කරු තක්සේරුව		
G4-LA14	ශ්‍රම පරිචය පිළිබඳ උපමාන භාවිතා කරමින් පරීක්ෂාවට ලක් කළ නව සැපයුම්කරුවන් ප්‍රතිශතය	අදාල නැත	
G4-LA15	සැපයුම් දාමය තුළ ශ්‍රම පරිචය පිළිබඳ සැලකිය යුතු සැබෑ හා විභවයක් සහිත ඍණ මානව හිමිකම් බලපෑම් හා ගත් පියවර	අදාල නැත	
	ශ්‍රම පරිච දුක් ගැනවිලි යාන්ත්‍රණය		
G4-LA16	විධිමත් දුක් ගැනවිලි යාන්ත්‍රණයක් මඟින් ගොනු කළ/සලකා බැලූ/සමථයකට පත් කළ දුක් ගැනවිලි සංඛ්‍යාව	සේවක වාර්තාව	124

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
	මානව හිමිකම්		
	ආයෝජනය		
G4-HR1	මානව හිමිකම් වගන්ති ඇතුලත් හෝ මානව හිමිකම් පිරික්සුමට ලක්වූ සැලකිය යුතු ආයෝජන ගිවිසුම් සමස්ත ප්‍රමාණය හා ප්‍රතිශතය	වාර්තා කර නැත	
G4-HR2	මානව හිමිකම් ප්‍රතිපත්ති හෝ මානව හිමිකම් හා බැඳුණු පිලිවෙත් පිළිබඳව සේවක මණ්ඩලය වෙනුවෙන් වැය කළ පුහුණු පැය ගණන	වාර්තා කර නැත	
	වෙනස්ව නොසැලකීම		
G4-HR3	වෙනස්ව සලකන ලද අවස්ථා ගණන හා ගන්නා ලද පියවර	සේවක වාර්තාව	124
	සංගම් වලට ගොනුවීමේ නිදහස හා සාමූහික කේවල් කිරීම්		
G4-HR4	සංවිධානය වීමේ නිදහස භුක්ති විඳීමේ හා සාමූහික කේවල් කිරීම සැලකිය යුතු පරිදි අවදානමට ලක් කරනු විය හැකි යැයි හඳුනාගත මෙහෙයුම් හා එම අයිතීන් සුරකින්නට ගත් පියවර	සේවක වාර්තාව	
	ළමා ශ්‍රමය		
G4-HR5	ළමා ශ්‍රමය පිළිබඳ සැලකිය යුතු මට්ටමේ අවදානමක් ඇතැයි හඳුනාගත් මෙහෙයුම්	සේවක වාර්තාව	123
	බල කළ හෝ අනිවාර්ය ශ්‍රමය		
G4-HR6	බල කළ හෝ අනිවාර්ය ශ්‍රමය ලබා ගත හැකි සිදුවීම් හෝ සැලකිය යුතු මට්ටමේ අවදානමක් ඇතැයි හඳුනාගත් මෙහෙයුම්	සේවක වාර්තාව	123
	ආරක්ෂක පරිචයන්		
G4-HR7	මෙහෙයුම් කටයුතුවලට අදාල මානව හිමිකම් පැතිකඩ පිළිබඳ ආයතනයේ ප්‍රතිපත්ති හා පිළිවෙත් සම්බන්ධයෙන් පුහුණු කරන ලද ආරක්ෂක සේවක ප්‍රතිශතය	වැඩසටහන් 42 ක් පවත්වා ඇත	
	ආදිවාසීන්ගේ අයිතිවාසිකම්		
G4-HR8	ආදිවාසීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කළ බවට වාර්තාගත සිදුවීම් සංඛ්‍යාව හා ගන්නා ලද පියවර	ආදිවාසීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කළ බවට කිසිදු වාර්තාවීමක් නැත	
	තක්සේරුව		
G4-HR9	මානව හිමිකම් සමාලෝචන/බලපෑම් තක්සේරුවට ලක් කළ මෙහෙයුම් සංඛ්‍යාව හා ප්‍රතිශතය	කිසිවක් නැත	
	සැපයුම්කරුවන්ගේ මානව හිමිකම් තක්සේරුව		
G4-HR10	මානව හිමිකම් උපමානයන් භාවිතා කරමින් පරීක්ෂණයට ලක් කළ නව සැපයුම්කරුවන්ගේ ප්‍රතිශතය	අදාල නැත	
G4-HR11	සැපයුම් දාමයෙහි සැලකිය යුතු මට්ටමේ සත්‍ය හා විභව, සෘණ මානව හිමිකම් බලපෑම් හා ගන්නා ලද පියවර	අදාල නැත	
	මානව හිමිකම් පිළිබඳ වූ දුක්ගැනවිලි		
G4-HR12	විධිමත් මානව හිමිකම් උල්ලංඝණ යාන්ත්‍රණයක් මඟින් සලකා බැලූ හා සමථයකට පත් කළ මානව හිමිකම් දුක්ගැනවිලි සංඛ්‍යාව	සේවක වාර්තාව	124

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
	සමාජය		
	ප්‍රාදේශීය ප්‍රජාවන්		
G4-SO1	ප්‍රාදේශීය ප්‍රජා සහභාගීත්වය සහිතව ක්‍රියාත්මක කළ මෙහෙයුම්, බලපෑම් ඇගයීම් හා සංවර්ධන වැඩ සටහන් ප්‍රතිශතය	සමාජයීය වාර්තාව	126 - 128
G4-SO2	පලාත්බද ප්‍රජාව අතර සැලකිය යුතු මට්ටමේ සත්‍ය හෝ විභව ඍණ බලපෑමක් සහිත මෙහෙයුම්	කිසිවක් නැත	
	දූෂණ මර්ධන කටයුතු		
G4-SO3	දූෂණ හා බැඳුණු අවදානම් විල්ලේ තක්සේරු කළ මෙහෙයුම් හා හඳුනාගත් සැලකිය යුතු අවදානම්	අවදානම් වාර්තාව	208
G4-SO4	දූෂණ විරෝධී ප්‍රතිපත්ති හා පිලිවෙත් පිළිබඳ පුහුණුව හා සන්නිවේදනය	ආයතනික යහපාලනය	144 - 187
G4-SO5	දූෂණ පිළිබඳ සනාථ කළ අවස්ථා හා ඒ සඳහා ගත් පියවර		
	පොදු මහජන ප්‍රතිපත්ති		
G4-SO6	රට/අර්ථලාභියා අනුව දේශපාලනික කටයුතු සඳහා දුන් මූල්‍ය දායකත්වය	අදාල නැත	
	තරඟකාරීත්ව විරෝධී චර්යා		
G4-SO7	තරඟකාරීත්ව විරෝධී, සංගත විරෝධී හා ඒකාධිකාරී චර්යාවන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය කටයුතු හා ඒවායේ ප්‍රතිවිපාක	කිසිවක් නැත	
	අනුකූලතාව		
G4-SO8	නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම මත පැනවුණු සැලකිය යුතු දඩයන්හි මූල්‍ය අගය හා මූල්‍ය නොවන සම්බාධක සංඛ්‍යාව	කිසිවක් නැත	
	සමාජයීය බලපෑම් එල්ලේ සැපයුම්කරු ඇගයීම		
G4-SO9	සමාජයට වන බලපෑම පිළිබඳ උපමාන භාවිතා කරමින් පරීක්ෂාවට ලක් කරන ලද නව සැපයුම්කරුවන් ප්‍රතිශතය	අදාල නැත	
G4-SO10	සැපයුම් දාමය තුළ දැකිය හැකි සැලකිය යුතු මට්ටමේ සත්‍ය හෝ විභව ඍණාත්මක සමාජයීය බලපෑම් හා ඒ පිළිබඳ ගත් පියවර	අදාල නැත	
	සමාජයීය බලපෑම් මත දුක් ගැනවිලි යාන්ත්‍රණ		
G4-SO11	විධිමත් දුක්ගැනවිලි යාන්ත්‍රණයක් තුළ ගොනු කළ, සලකා බැලූ හා සමථයට පත් කළ, සමාජයීය බලපෑම පිළිබඳ දුක් ගැනවිලි සංඛ්‍යාව	වාර්තා වී නැත	
	නිමැවුම් පිළිබඳ වගකීම		
	ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව		
G4-PR1	වර්ධනය කරනු සඳහා සෞඛ්‍ය හා ආරක්ෂණ බලපෑම් තක්සේරු කරන ලද සැලකිය යුතු මට්ටමේ නිමැවුම් හා සේවා කාණ්ඩ ප්‍රතිශතය	අදාල නැත	
G4-PR2	නිමැවුම් හා සේවාවන්හි ජීවන චක්‍රය තුළ සෞඛ්‍ය හා ආරක්ෂණ බලපෑම් විල්ලේ පවත්නා රෙගුලාසි හා ස්වේච්ඡා ආචාර ධර්ම හා අනුකූලතාවය ලබා නොගත් අවස්ථා සංඛ්‍යාව	අදාල නැත	

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
	නිමැවුම් හා සේවා නම්කිරීම		
G4-PR3	ආයතනයේ නිමැවුම් හා සේවා තොරතුරු හා නම්කිරීම් පිළිබඳ පිලිවෙත් මඟින් අවශ්‍ය කරන නිමැවුම් හා සේවා තොරතුරු කාණ්ඩ හා එබඳු තොරතුරු අවශ්‍යතාවන්ට යටත්වන සැලකිය යුතු මට්ටමේ නිපැයුම් හා සේවා කාණ්ඩ ප්‍රතිශතය	අදාල නැත	
G4-PR4	නම්කිරීම් ද ඇතුළුව නිමැවුම් හා සේවා තොරතුරු පිළිබඳ රෙගුලාසි හා ස්වේච්ඡා ආචාර ධර්ම හා අනුකූල නොවූ අවස්ථා ගණන එහි ප්‍රතිඵලයේ ස්වභාවය මත	අදාල නැත	
G4-PR5	ගනුදෙනුකාර තෘප්තිය ගණනය කළ සමීක්ෂණ ප්‍රතිඵල	වාර්තා වී නැත	
	අලෙවිකරණ සන්නිවේදනය		
G4-PR6	තහනම් කරන ලද හෝ මතභේදයට ලක්වූ භාණ්ඩ අලෙවිය	කිසිවක් නැත	
G4-PR7	ප්‍රචාරණය, ප්‍රවර්ධනය හා අනුග්‍රහකත්වය ද ඇතුළුව වෙළඳ සන්නිවේදනය හා සම්බන්ධිත රෙගුලාසි හා ස්වේච්ඡා ආචාර ධර්ම සමඟ අනුකූල නොවූ අවස්ථා ගණන හා එහි ප්‍රතිඵලයේ ස්වභාවයන්	කිසිවක් නැත	
	ගනුදෙනුකාර පෞද්ගලිකත්වය		
G4-PR8	ගනුදෙනුකාර රහස්‍යභාවය උල්ලංඝණය හා ගනුදෙනුකාර දත්ත නැතිවීම පිළිබඳ ලැබුණු කරුණු සහිත පැමිණිලි සංඛ්‍යාව	කිසිවක් නැත	
	අනුකූලතාව		
G4-PR9	නිමැවුම් හා සේවා සැපයුම හා භාවිතය පිළිබඳ නීති හා රෙගුලාසි නොපිලිපැදීම නිසා පනවනු ලැබූ සැලකිය යුතු මට්ටමේ දඩයන්හි මූල්‍ය අගය	එබඳු සැලකිය යුතු මට්ටමේ දඩ කිසිවක් නැත	

ආයතනික යහපාලනය

උපාය මාර්ගික ඉලක්ක මුදුන්පත් කර ගැනීම සඳහා මූලික වන, ප්‍රමාණවත් යහපාලන ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ සංයුතිය

ලංකා බැංකුවේ ඉහළම තීරණ ගැනීමේ අයිතිය එහි අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර එය සම්පූර්ණයෙන්ම සමන්විත වන්නේ මුදල් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙනි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ බැංකුව සඳහා උපාය මාර්ගික දැක්මක් සැපයීම සහ ආර්ථික, සමාජීය සහ පාරිසරික අරමුණු දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන වශයෙන් සකස් කිරීමයි.

විශේෂිත ක්ෂේත්‍රයන් සඳහා කාර්යයන් ඉටුකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපකමිටු සතරක් පත්කර ඇති අතර එම උපකමිටු වලටම ඒ සඳහා වූ වගකීම පවරා ඇත. එම උපකමිටු සතර වනුයේ විගණන කමිටුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව සහ නාමයෝජනා සහ ආයතනික පාලන කමිටුවයි. උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරීක්ෂණය කරනු ලැබේ. ඒ සඳහා ව්‍යුහාත්මක තොරතුරු වාර්තා කිරීමේ ක්‍රමවේදයක් භාවිතා කරනු ලබන අතර එය අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සතරෙන් සහ මහා කළමනාකාරතුමාට වාර්තා කරනු ලබන බැංකුවේ විධායක නිලධාරීන්ගෙන් සමන්විත වේ. මුදල් ආමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු තුන් අවුරුදු කාලසීමාවක් සඳහා පත් කරනු ලබන අතර එයින් එක් අධ්‍යක්ෂවරයෙකු මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය නියෝජනය කරන්නෙකු වන අතර ඔහු නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ වශයෙන් හැඳින්වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු රැස්වීම් වලදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නියෝජනය වන බවට සහතික කිරීම සඳහා නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ වෙනුවෙන් විකල්ප අධ්‍යක්ෂවරයෙකු ද පත් කර ඇත.

2013 ජනවාරි මාසයේදී පත් කරනු ලැබූ සභාපතිතුමා වන රසීක් සරූක් මහතා මහ බැංකු නිතී රිතී වලට අනුකූලව උපරිම වයස් සීමාවට ළඟාවීම හේතුවෙන් වර්ෂය තුළදී විශ්‍රාම ගත් අතර 2013 දෙසැම්බර් 27 වනදා සිට රාජු සිවරාමන් මහතා වැඩබලන සභාපති වශයෙන් පත්විය. කේ එම් මහින්ද සිරිවර්ධන මහතා 2013 අප්‍රේල් මාසයේදී එස් ආර් ආටිගල මහතා වෙනුවට නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබිණි. වී කනගසභාපති මහතා 2013 ජනවාරි මාසයේදී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් ඔහු නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ වෙනුවෙන් විකල්ප අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කිරීම අවසන් විය.

ආර් එම් ඒ රත්නායක මහතා නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ වෙනුවෙන් වූ විකල්ප අධ්‍යක්ෂ වශයෙන් 2013 ජනවාරි මාසයේදී පත් කරනු ලැබූ අතර එම මහතා වර්තමානයේදී එම නිලයේ කටයුතු කරමින් සිටියි. සිය තුන් අවුරුදු කාලීන පත්වීම 2013 ජුනි 6 වෙනි දිනෙන් අවසන් වූ බැවින් කේ එල් හේවගේ මහතා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කිරීම අවසන් වූ අතර ඒ වෙනුවෙන් ලලිත් විතාන මහතා 2013 ජුනි 19 වෙනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත්විය.

බැංකුවේ උපාය මාර්ගික දැක්ම සහ ප්‍රතිපත්ති රාමුව සාකච්ඡා කිරීම සහ විවාද කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් විවිධාකාර පැතිකඩවල් සහ සිය අත්දැකීම් සපයනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය මඟින් සියළුම අධ්‍යක්ෂවරුන් විසින් සපයනු ලබන බලයෙහි සහ දායකත්වයෙහි ප්‍රමාණාත්මක තුලනයක් ඇති බවට සහතික කරනු ලැබේ. එමඟින් එක් අධ්‍යක්ෂවරයෙකු හෝ කිහිප දෙනෙකු විසින් අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාවලිය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පාලනය කිරීමේ ක්‍රමවේදය හැකිතාක් අවම කෙරේ. උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශක්තිමත් යහපාලන ක්‍රියා පටිපාටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාවෙහි යොදවා ඇත. සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා මහා කළමනාකාරතුමාට සහ අදාළ විධායක නිළධාරීන්ට ආරාධනා කරනු ලැබේ. ඔවුන් විසින් නිරන්තරයෙන් වැඩමුළු පවත්වා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලබන අතර ඊට උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, මූල්‍ය, සමාජීය සහ පාරිසරික කාර්යසාධනය, මෙහෙයුම් පරිසරය මඟින් සිදු කරනු ලබන වෙනස්කම් සහ අභියෝග, නිර්දේශිත ප්‍රතිපත්ති ව්‍යුහයන් සහ විධායක යහපාලන ව්‍යුහයන් ඇතුළත් වේ.

බැංකු ක්ෂේත්‍රයට නියාමන විධිවිධාන වල සිදුවන වෙනස්කම් හා රටේ ආර්ථිකය නිසා ගෝලීය වශයෙන් හා දේශීය වශයෙන් කාලානුරූපීව මුහුණ දීමට සිදුවන නව සංවර්ධනයන් පිළිබඳව අධ්‍යක්ෂවරුන් නිරන්තරයෙන් දැනුවත්ව සිටියි. සමාලෝචිත වර්ෂය තුළදී ඔවුන් රෙගුලාසි, මූල්‍ය වර්තාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ පුහුණු වැඩමුළු වලට සහභාගි විය. තවද ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනය මඟින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ සඳහාද අධ්‍යක්ෂවරුන් වර්ෂය තුල සහභාගි විය. නියාමන ව්‍යුහයන්හි සිදුවන වෙනස් වීම් පිළිබඳව කළමනාකාරිත්වය මඟින් අධ්‍යක්ෂවරුන්ට වැඩමුළු පවත්වනු ලබන අතර එමඟින් බැංකුවේ ව්‍යාපාරික කටයුතු වලට බලපාන නව සංවර්ධන විධිවිධාන පිළිබඳ ඔවුන් දැනුවත් බවට තහවුරු කෙරේ.

වැදගත් තොරතුරු 2013

අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සිදු වූ වැදගත් වෙනස්වීම්

- 2013 ජනවාරි 9 වෙනි දින සිට රසීක් සරූක් මහතා සභාපති වශයෙන් පත්වීම.
- රසීක් සරූක් මහතාගේ විශ්‍රාම ගැනීමෙන් අනතුරුව 2013 දෙසැම්බර් 27 වෙනිදා සිට වැඩබලන සභාපති වශයෙන් රාජු සිවරාමන් මහතා පත්වීම.
- එස් ආර් ආටිගල මහතා වෙනුවට කේ එම් මහින්ද සිරිවර්ධන මහතා 2013 අප්‍රේල් 24 වෙනි දින පත්වීම
- කේ එල් හේවගේ මහතා වෙනුවට ලලිත් විතාන මහතා 2013 ජූනි 19 වෙනි දින පත්වීම.
- වී. කනගසභාපති මහතා වෙනුවට 2013 ජනවාරි 30 වෙනිදා සිට ආර් එම් ඒ රත්නායක මහතා නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂවරුන්ට විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීම.

අනෙකුත් වැදගත් තොරතුරු

- සමෝධානිත වාර්තාවේ පහත සඳහන් අංශ පිළිබඳව විගණකාධිපති දෙපාර්තමේන්තුව තහවුරු කර ඇත.
  - බැංකුව සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය වාර්තා
  - අභ්‍යන්තර පාලන විධි පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනතේ ආයතනික යහපාලන විධිවිධානයන්ට දක්වා තිබෙන අනුකූලතාවය පිළිබඳව විගණකාධිපති විසින් සහතික කරනු ලැබේ.
- සාමාජිකයින්ගේ ප්‍රවීණතාවය ලබා ගැනීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු ප්‍රතිනිර්මාණය කෙරේ.
- සේවකයින් සඳහා නව කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.
- සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු රැස්වීම් විශේෂිත මෘදුකාංග පද්ධතියක් භාවිතා කරමින් කඩදාසි රහිතව පවත්වනු ලැබේ.

ආචාරධර්ම සහ රෙගුලාසි වලට දක්වන අනුකූලතාවය

බැංකුවේ ආයතනික යහපාලනය, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ටද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනතේ ආයතනික යහපාලන විධිවිධානයන්ටද සුරැකුම් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය 2007 වසරේදී ඒකාබද්ධව නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳ ස්වේච්ඡා පදනම මත වූ මනා පරිචයන්ගේ සංග්‍රහයටද අනුකූලතාවය දක්වා ඇත. කෙසේ වෙතත් බැංකුව ඉහතින් සඳහන් 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කරන බැවින් කොළඹ විනිමය හුවමාරුවෙහි ලැයිස්තුගත රීතින්හි වගන්ති අංක 7.10 ප්‍රකාර වූ ආයතනික යහපාලනය සම්බන්ධ අවශ්‍යතාවයන්ගෙන් මුදාහැර ඇත.

සභාපතිතුමාගේ සහ මහා කළමනාකාරතුමාගේ කාර්යභාරය

සභාපතිතුමාගේ සහ මහා කළමනාකාරතුමාගේ කාර්යභාරයන් එකිනෙකට වෙනස් වන අතර එම කාර්යභාරයන් ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ පැහැදිලිව නිර්වචනය කර ඇත. සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවන අතර එතුළින් අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායීව සහ බැංකුවේ උපරිම වාසිය සඳහා ක්‍රියා කරන බවට සහතික කෙරේ.

මහා කළමනාකරු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු නොවන අතර ඔහුට සියළු තීරණ ගැනීමට සහ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිදහස ඇත. තවද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සහ බැංකුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතුවේ.


වර්ෂය තුළදී සභාපති වූ රසීක් සරූක් මහතා විශ්‍රාම ගිය අතර, ඉන්පසු ඉතා ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා වන රාජු සිවරාමන් මහතා වැඩ බලන සභාපති වශයෙන් පත්විය. 2013 ජනවාරි 8 වෙනිදා සිට ඩී ඇම් ගුණසේකර මහතා මහා කළමනාකරු ලෙස වැඩ භාරගත් අතර ඔහු ඊට පෙර ලංකා බැංකුවේ වසර 29 ක් පුරා ප්‍රධාන දෙපාර්තමේන්තු රැසක සේවය කර ඇත.

උපාය මාර්ග

බැංකුවේ උපාය මාර්ගික දිශාව තීරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙය වාර්ෂිකව මහා කළමනාකරු සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පිරිස සමඟ අදහස් හුවමාරු කරගනිමින් සිදු කරන අතර එහිදී බැංකුවේ දැක්ම, වටිනාකම් සහ අවදානම් අභිරුචියට සමගාමී වන බවට තහවුරු කෙරේ. උපාය මාර්ග ක්‍රියාවෙහි යෙදවීම මාසික කාර්ය සාධන වාර්තා මඟින් නිරීක්ෂණය කරනු ලැබේ. එම වාර්තා වලට මූල්‍ය කාර්යසාධනය, අවදානම් ස්වරූපය සහ අනෙකුත් කලින් තීරණය කරන ලද ආර්ථික, සාමාජීය සහ පාරිසරික නිර්ණායක ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු ඔවුන්ට අදාළ අංශ වල කාර්යසාධනය නිරීක්ෂණය කර එය අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබේ.

ආයතනික ව්‍යූහය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපකමිටු වලින් සමන්විත සුදුසු ආයතනික ව්‍යූහයක් ක්‍රියාවෙහි යොදවා ඇත. එම උපකමිටු වලට බැංකුවේ විධායක කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති රාමු සහ ආයතනික ව්‍යූහයන් තීරණය කිරීමේ වගකීම පැවරී ඇත. මෙම විධායක ආයතනික ව්‍යූහය මහා කළමනාකරු, විධායක කමිටු, මෙහෙයුම් සහ උපකාරක දෙපාර්තමේන්තු වලින් සමන්විත වේ. මෙම උපකාරක දෙපාර්තමේන්තු ප්‍රධාන කළමනාකරණ පිරිස් මඟින් මෙහෙයවන අතර ඔවුන් අදාළ අංශවල පළපුරුදු වෘත්තිකයන් සහ නායකයින් වේ.



අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / ලංකා බැංකුවේ ලේකම්, සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු රැස්වීම් වල ලේකම් ලෙස කටයුතු කරන අතර මෙම රැස්වීම් වල කාර්ය සටහන් ඇයගේ භාරයේ පවතියි. සියළුම උපකමිටු සඳහා අදාළ වන නීතිරීති ලිඛිත මාධ්‍යයෙන් පවත්වා ගෙන යනු ලැබේ. මෙම උපකමිටු වලට අදාළ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 189 සිට 197 දක්වා ඇත.

විධායක කමිටු

කළමනාකරණ කමිටු	අරමුණ සහ කාර්යයන්
වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO)	වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වත්කම් හා වගකීම් සංකලනය අධීක්ෂණය කරනු ලබන අතර එතුළින් ඉතා ලාභදායී ලෙස වත්කම් වෙන්කිරීම, අරමුදල් සපයා ගැනීමේ උපාය මාර්ග, වත්කම් මත ප්‍රතිලාභ, මුදල් යෙදවීමේ ව්‍යුහය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට මුදල් යෙදවීමේ පිරිවැය පිළිබඳව සහතික කෙරේ.
ණය කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩලයට පසුව ඉහළම ණය ප්‍රදානය කිරීමේ බලය මෙම කමිටුව සතු වේ. මෙම කමිටුව විසින් මහා පරිමාණයේ ණය යෝජනා ඉතා පුළුල් වශයෙන් සමාලෝචනය කර අනුමත කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිය යුතු සියළුම ණය යෝජනා මෙම කමිටුව මඟින් සමාලෝචනය කර නිර්දේශ කරනු ලැබේ.
මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව	මෙම කමිටුවේ අරමුණු වන්නේ ආයතනයේ හර පද්ධතීන්, දැක්ම, මෙහෙවර සහ සංකල්ප වලට අනුකූල වන මානව සම්පත් ප්‍රතිපත්තීන් ක්‍රියාවෙහි යෙදවීමයි.
තොරතුරු තාක්ෂණ හැසිරවීමේ කමිටුව	තොරතුරු තාක්ෂණ ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමේ සහ විමර්ශනය කිරීමේ වගකීම මෙම කමිටුව සතු වන අතර එය තොරතුරු තාක්ෂණ උපාය මාර්ගික සැලසුම් සහ බැංකුවේ ඉදිරි දිශාව අනුව සිදුකළ යුතුය. ව්‍යාපාරික අරමුණු ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර ඇති බවට සහ ව්‍යාපෘති සිය පාලනයට යටත්ව ඇති බවට මෙම කමිටුවේ සාමාජිකයන් විසින් තහවුරු කළ යුතුය. මෙම කමිටුවේ ප්‍රධාන අරමුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම, තොරතුරු තාක්ෂණ සැළසුම්, ව්‍යාපෘති සැලසුම් අනුමත කිරීම, ප්‍රමුඛතා සකස් කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මුල් පිරීම, ව්‍යාපෘති වල සාර්ථකත්වය නිරීක්ෂණය කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කණ්ඩායම් නිර්මාණය කිරීම, තොරතුරු තාක්ෂණ මෙහෙයුම් වලට අදාළ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම ඇතුළත් වේ.
ආයෝජන කමිටුව	කෙටි කාලීන ආයෝජන හා දිගු කාලීන උපාය මාර්ගික ආයෝජන ඇතුළත් බැංකුවේ අයෝජන තීරණ වලට ආයෝජන කමිටුව වගකිව යුතු අතර එම කමිටුව විසින් ආයෝජන විකුණුම් සහ ආයෝජන ඉවත් කර ගැනීමේ තීරණ විමර්ශනය කරනු ලැබේ. තවද මෙම කමිටුව විසින් ආයෝජන කළඹ වල ලාභදායීත්වය විමර්ශනය කරන අතර එමඟින් බැංකුවේ ආයෝජන වලින් ඉතා විශාල ලාභයක් ලබා ගැනීම සඳහා සුදුසු තීරණ ගැනීමට හැකිවේ.

කළමනාකරණ කමිටු	අරමුණ සහ කාර්යයන්
අක්‍රිය ණය කමිටුව (NPAC)	මෙම කමිටුව මඟින් බැංකුවේ අය කර ගැනීමට නොහැකි තත්ත්වයට පත්වන ණය සහ අත්තිකාරම් විමර්ශනය කරන අතර එම ණය යළි අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කෙරේ. තවද එම ණය වලින් බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට වන බලපෑම අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කෙරේ.
ව්‍යාපාරික අවිච්ඡින්නතා කළමනාකරණ නියමු කමිටුව	ව්‍යාපාර අවිච්ඡින්නතා මෙහෙයුම් කමිටුව (BCCC) ස්ථාපිත කරන ලද්දේ බැංකුවේ ව්‍යාපාර අවිච්ඡින්නතා කළමනාකරණ ක්‍රියාවලිය මෙහෙයවීම සඳහාය. ආපදා අවස්ථාවකදි බැංකුවේ ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම මෙම කමිටුවේ ප්‍රධාන අරමුණ වේ. ව්‍යාපාර අවිච්ඡින්නතා කළමනාකරණ ක්‍රියාවලිය හැසිරවීම සහ මෙහෙයවීම, ආපදා ප්‍රතිසාධන ක්‍රියාවලිය කළමනාකරණය කිරීම, ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානය කළමනාකරණය කිරීම, ව්‍යාපාර අඛණ්ඩත්ව සැලැස්ම පිළිබඳව දැනුවත් කිරීම් සහ පුහුණු කිරීම් ක්‍රියාත්මක කිරීම, ව්‍යාපාර අඛණ්ඩත්ව සැලැස්ම කලින් කලට පරීක්ෂා කිරීම, අභ්‍යන්තර හා බාහිර පාර්ශව සමඟ මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය කිරීම, ව්‍යාපාර අවිච්ඡින්නතා ලේඛන සංශෝධනය කිරීම සහ කළමනාකරණය කිරීම යන ක්‍රියාවලින් මෙම කමිටුවේ ප්‍රධාන වගකීම් අතර වේ.
තිලිණ හා සම්මාන ප්‍රතිපත්ති කමිටුව	මෙම කමිටුවේ අරමුණු වනුයේ ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා දායක වූ සේවකයින් හඳුනාගැනීම සහ ආයතනය සිය අපේක්ෂාවන් ඉක්මවා වැඩිදියුණු කිරීමට දායක වන සේවකයින්ට සහ සේවක කණ්ඩායම් සිය දායකත්වය වෙනුවෙන් අගය කිරීම සහ පාරිතෝෂික ප්‍රදානය කිරීමයි.
මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව	බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරන ප්‍රමුඛම කමිටුව මෙම කමිටුවයි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වගකීම මෙහෙයුම් අවදානම් කළමනාකරණ වැඩසටහන පාලනය කිරීම බව මෙම කමිටුව අවධාරණය කරන අතර කාර්යයන් කිහිපයක් තුලින් මතුවන අවදානම් කළමනාකරණය කිරීම ද මෙමඟින් ඉටුවේ. ආයතනය පුරා විහිදුණු මෙහෙයුම් අවදානම් කළමනාකරණ වැඩසටහනක් ඇති බවට මෙම කමිටුව මඟින් සහතික කෙරේ.
වංචා අවදානම් කමිටුව	වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවට පැවරී ඇත. සියළුම පාර්ශවකරුවන් අතර අවදානම් පිළිබඳව දැනුවත් බවක් ඇති කිරීම සහ බැංකුව කීර්තිනාම අලාභ සහ මූල්‍ය අවදානම් වලට ලක්විය හැකි පුනරාවර්තන අවදානම් වැළැක්වීම මෙම කමිටුව මඟින් සිදු කෙරේ.
තිරසර පැවැත්ම කමිටුව	තිරසර පැවැත්ම ප්‍රතිපත්තිය සහ ආයතනික සමාජ වගකීම්, ආයතනික අරමුණු හා උපාය මාර්ග සමඟ අනුගත කිරීමේ අරමුණින් බැංකුවේ ඉහළ කළමනාකාරීත්වයෙන් සමන්විතව මෙම කමිටුව ස්ථාපිත කර ඇත. මෙම කමිටුව තිරසර පැවැත්ම ක්‍රියාදාමයන් සම්බන්ධීකරණය කරනු ඇත. ඒ සඳහා යෝග්‍ය ක්‍රමවේදයන් නිර්මාණය කොට ඊට අවශ්‍ය අංගෝපාංග සම්පාදනය සැලසුම් කිරීමට අමතරව එහි ප්‍රගතිය නිරන්තරයෙන් සුපරීක්ෂණය කිරීමටද නියමිතය.
ව්‍යාජ ලෙස සකස් කළ චෙක්පත් හා වංචා කමිටුව	ව්‍යාජ ලෙස සකස් කල මූල්‍ය උපකරණ සහ වංචාකාරී ක්‍රියාවන් හේතුවෙන් ශාඛා ජාලයට සහ ව්‍යාපාරික දෙපාර්තමේන්තු වලට ඇතිවන අලාභ කපා හැරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමට මෙම කමිටුව ස්ථාපිත කර ඇත.
අක්‍රිය වත්කම් කමිටුව	1938 අංක 53 දරණ ලංකා බැංකු පනත සහ එහි සංශෝධන, ණය අය කරගැනීමේ පනත සහ අභ්‍යන්තර උපදෙස් චක්‍රලේඛ වල සඳහන් නීති ප්‍රකාරව බැංකුව තුල පවතින දේපල විකිණීමේ ක්‍රියාවලිය මෙම කමිටුව මඟින් කළමනාකරණය කර නිරීක්ෂණය කරනු ලැබේ. අත්පත් කරගත් දේපල අංශයට එම දේපල ඉතා ලාභදායී ආකාරයට විකිණීම සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ සහ උපදෙස් ලබාදීමේ වගකීම මෙම කමිටුවට පැවරී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු වර්ෂය තුලදී පැවැත්වූ වාර ගණන පහත වගුවෙහි දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සිය ඵලදායීත්වය වාර්ෂිකව අගය කරනු ලබන අතර වැඩිදියුණු කලයුතු අංශ සාකච්ජා කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු ද මෙම ක්‍රියාවලිය අනුගමනය කරයි.

2013 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම.

අධ්‍යක්ෂවරුන්	අධ්‍යක්ෂ මණ්ඩලය	විගණන කමිටුව	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව	නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව	ඒකාබද්ධ අවදානම් කළමනාකාරණ කමිටුව
රසීක් සරෑක් මහතා	22		3		
එස් ආර් ආටිගල මහතා (2013 අප්‍රේල් 23 දක්වා)	6			0	
කේ එම් මහින්ද සිරිවර්ධන මහතා (2013 අප්‍රේල් 24 සිට)	10	1			0
රාජු සිවරාමන් මහතා	22	8	4	4	5
නලිනි ඩී අබේවර්ධන මෙනෙවිය	18		4		
චන්ද්‍රසිරි ද සිල්වා මහතා	21		4	0	
කේ එල් හේවගේ මහතා (2013 ජුනි 6 දක්වා)	10	3	1	3	2
ලලිත් විතාන මහතා (2013 ජුනි 19 සිට)	10	5		1	3
වී කනගසභාපති මහතා (එස් ආර් ආටිගල මහතා වෙනුවට විකල්ප අධ්‍යක්ෂ) (2013 ජනවාරි 29 දක්වා)		2			
ආර් එම් ඒ රත්නායක මහතා (කේ එම් මහින්ද සිරිවර්ධන මහතා වෙනුවට විකල්ප අධ්‍යක්ෂ)	3	6			3
මුළු රැස්වීම් ගණන	22	8	4	4	5


තිරසර පැවැත්ම

බැංකුව සඳහා වූ තිරසර පැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය අනුමත කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. එහි දර්ශනය, අරමුණු, සමාජ හා පාරිසරික අංශ සම්බන්ධයෙන් වූ උපාය මාර්ගික ඉලක්ක සේවකයින් වෙත පැහැදිලිව සන්නිවේදනය වී ඇති බවට තහවුරු කිරීම සඳහා පාලන ව්‍යුහයක් ස්ථාපිත කර ඇත. මෙහි සඳහන් ප්‍රතිපත්ති බැංකුවේ ව්‍යාපාර කටයුතු පවතින සියළුම භූගෝලීය ප්‍රදේශ වල ත්‍රිත්ව යටිතල (triple bottom line) මූල ධර්ම හරහා ස්ථාපිත කර ඇත. මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 114 සිට 131 දක්වා සමාජ වාර්තාව, සේවක වාර්තාව සහ පාරිසරික වාර්තාව හරහා මෙය සම්පූර්ණයෙන් විස්තර කර ඇත.

මහා කළමනාකරු විසින් මෙහෙයවනු ලබන තිරසර පැවැත්ම පිළිබඳ කමිටුවේ වගකීම වනුයේ බැංකුවේ තිරසර පැවැත්ම පිළිබඳ කටයුතු කළමනාකරණය කිරීමයි.

පහත සඳහන් වනුයේ මෙම කමිටුවේ කටයුතු වලින් සමහරකි.

- බැංකුව තුල දැනටමත් ආරම්භ කර ඇති කාර්යයන් විමර්ශනය කිරීම
- සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීම සඳහා නව පුරෝගාමීත්ව, ආයතන සහ ප්‍රජා නායකයින් සොයා බැලීම.
- වාර්ෂික තිරසර පැවැත්ම කටයුතු සඳහා බැංකුවේ ආයෝජන ප්‍රතිශතය තීරණය කිරීම. මෙම ප්‍රතිශතය බදු පෙර ලාභය සමඟ වෙනස් වේ.



සාමාජිකයා	බලපාන අංශ
නියෝජ්‍ය මහා කළමනාකරු නිමැවුම් හා සංවර්ධන බැංකු	ක්ෂුද්‍ර ණය වේදිකාව හා එය ශාඛා ජාලය ඔස්සේ ක්‍රියාත්මක වන ආකාරය ගණුදෙනුකරුගේ අපේක්ෂා මූර්තිමත් වන පරිදි නිමැවුම් බිහි කිරීම හා සංවර්ධනය සංවර්ධනය කල මූලික ධාවන රේඛා ඔස්සේ ප්‍රමුඛතා අංශයේ වර්ධනය ඉහළ නංවනු සඳහා එහි දායකත්ව මට්ටම
නියෝජ්‍ය මහා කළමනාකරු උපකාරක සේවා	ද්‍රව්‍ය, බලශක්ති හා ඉන්ධන පාරිභෝජනය, කාබන් පිය සටහන අවම කිරීමේ ක්‍රියාමාර්ග, ප්‍රතිචක්‍රීකරණ හා බලශක්ති සංරක්ෂණ යාන්ත්‍රණ, සේවා ස්ථාන අලංකරණය, ගණුදෙනුකාර ප්‍රවේශ ඉඩකඩ හා සේවා සැපයුම් අත්වැල් මට්ටම
ප්‍රධාන මූල්‍ය නිළධාරි	ආර්ථිකමය චකතු කල අගය - උපනති විපරම පාර්ශවකරුවන් අතර ආදායම බෙදා හැරීම, බැංකුවේ මෙහෙයුම් තුලින් පැන නගින චක්‍ර ආර්ථික ප්‍රතිලාභ
නියෝජ්‍ය මහා කළමනාකරු මානව සම්පත්	උචිත කම්කරු පරිචයන් නිර්වචනය කළ ප්‍රතිලාභ, සැලසුම් ආවරණය හා අරමුදල් ප්‍රමාණවත් බව මානව හිමිකම් ප්‍රශ්න කණ්ඩායම් නිපුණතා සංවර්ධන හා ජීවිතාන්ත ඉගෙනුම ජීවනෝපාය මං පෙත සංවර්ධනය සේවා - ජීවන තුලිතය පිළිබඳ වැඩසටහන් වෘත්තිය සමිති හා සම්බන්ධතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකරු විකුණුම් හා බෙදාහැරීම්	සේවා ස්ථාන ව්‍යාප්ති ප්‍රතිපත්තිය ප්‍රගතිය පළාත් බද සංවර්ධනය
නියෝජ්‍ය මහා කළමනාකරු ශාඛා බැංකු කටයුතු	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කටයුතු සංවර්ධනය කිරීම
ප්‍රධාන අලෙවිකරණ නිළධාරි	සමාජ සත්කාරක (CSR) පුරෝගාමීත්වයන් හඳුනාගන්නා ලද සමාජ සත්කාරක ව්‍යාපෘති ක්‍රියාවෙහි නැංවීම

දූෂණ විරෝධීතාව

ආයතනය තුල අල්ලස් හා දූෂණ පිටුදැකීම සඳහා යාන්ත්‍රණ කිහිපයක් ස්ථාපිත කර ඇත.

- සියළුම සේවකයින් සහ අධ්‍යක්ෂවරුන් වාර්ෂික වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් ලබාදිය යුතුය
- බැංකුව තුල සියළුම අංශ නියෝජනය වන පරිදි විනිවිද භාවයෙන් යුත් මිලදී ගැනීමේ ක්‍රියාපටිපාටියක් සහිත ටෙන්ඩර් කමිටු ඇත.
- සමූහ පදනම මත ණය, ආයෝජන සහ මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රධාන තීරණ ගැනීම ඊට අදාළ කමිටු වෙත පවරා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලාංකික බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන් සමඟ ඇති අනුකූලතා මට්ටම

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(1) මණ්ඩලයේ වගකීම්		
3(1)(i)	පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම තුළින් බැංකුවේ ආරක්ෂාව හා ශක්තිමත්භාවය වර්ධනය කිරීම සඳහා මණ්ඩලය ක්‍රියාකළ යුතු වන්නේය.	
	(අ) බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික හර පද්ධතීන් අනුමත කිරීම, සුපරීක්ෂණය කිරීම සහ ඒවා සමස්ත බැංකුව තුළ හොඳින් සන්නිවේදනය වන බවට තහවුරු කිරීම.	අනුගමනය කරන ලදී, බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ හර පද්ධතීන් 2013-2015 කාලපරිච්ඡේදය සඳහා වූ ආයතනික සැලැස්මෙහි අන්තර්ගත වන අතර ඒවා ආයතනික සැලැස්ම දියත් කිරීමේදී සමස්ත බැංකුව පුරා සන්නිවේදනය කරන ලදී.
	(ආ) අවම වශයෙන් ඉදිරි තෙවසර සඳහා වූ මැනිය හැකි ඉලක්ක සහිත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් හා යාන්ත්‍රණයන් ඇතුළත් බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග අනුමත කිරීම.	අනුගමනය කරන ලදී, 2013-2015 ආයතනික සැලැස්මෙහි සමස්ත ව්‍යාපාරික උපායමාර්ග අන්තර්ගත වේ. ආයතනික සැලැස්මෙහි උපායමාර්ග සහ ඊට අදාළ අවදානම් සාධක විස්තර කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් ප්‍රතිපත්තියද මෙහි අන්තර්ගත කර ඇත.

මූලධර්ම	අනුකූලතා මට්ටම
(ඇ) ප්‍රධාන විභව අවදානම් වර්ග හඳුනාගැනීම සහ අවදානම් විචක්ෂණශීලී ආකාරයෙන් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය වූ විධි ක්‍රම ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් ප්‍රතිපත්තියෙහි ණය අවදානම, වෙළඳපල අවදානම, මෙහෙයුම් අවදානම, උපායමාර්ගික සහ කීර්තිය පිළිබඳ අවදානම යනාදි සියළුම අවදානම් වර්ග අන්තර්ගත වේ. හඳුනාගත් අවදානම් කළමනාකරණය කිරීමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවක් වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරා ඇත. ප්‍රධාන අවදානම් නිලධාරී විසින් විධිමත් ලෙස කමිටුව වෙත ඉදිරිපත් කරන අවදානම් වාර්තා මඟින් කමිටුව විසින් බැංකුවෙහි අවදානම් කළමනාකරණය කිරීම සිදු කරයි. මෙම වාර්තා අවශ්‍ය නිර්දේශයන්ද සමඟ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීමට පසු එළඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඉදිරිපත් කරයි.
(ඈ) තැන්පතුකරුවන්, ණය හිමියන්, කොටස්කරුවන් සහ ණයගැතියන් ඇතුළු උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම.	අනුගමනය කරන ලදී, උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් ආවරණය වන පරිදි සකස් කරන ලද සන්නිවේදන ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ක්‍රියාත්මක කරන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෑතකදි විමර්ශනය කරන ලදී.
(ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ විශ්වාසනීයත්වය විමර්ශනය කිරීම.	විගණන කමිටුව හරහා ඉදිරිපත් කරන වාර්තා මඟින් බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ විශ්වාසනීයත්වය, අවශ්‍ය අවස්ථාවන්හිදි නිර්දේශයන් හා හුවාදැක්වීම් ඉදිරිපත් කරමින් නිතිපතා විමර්ශනය කරයි. බැංකුවේ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ විශ්වාසනීයත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනය කරයි.
(ඊ) ජාත්‍යන්තර ගණකාධිකරණ ප්‍රමිතීන්හි අර්ථ දක්වා ඇති අකාරයට, ප්‍රධාන කළමනාකරණ මඩුල්ල හඳුනාගැනීම සහ ඔවුන් නම් කිරීම. මෙසේ තෝරා පත්කර ගන්නවුන් (i) ප්‍රතිපත්ති කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කළ හැකි (ii) කටයුතු මෙහෙය විය හැකි සහ (iii) ව්‍යාපාරික කටයුතු, ක්‍රියාවලීන් සහ අවදානම් කළමනාකරණය වැනි කටයුතු කෙරෙහි පාලනයක් ඇති කළ හැකි, පුද්ගලයන් විය යුතුය.	අනුගමනය කරන ලදී, ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 24 - සම්බන්ධිත පාර්ශව අනාවරණය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතනික යහපාලනය පිළිබඳ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ විධිවිධානය ප්‍රකාරව බැංකුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය (අතිරේක අධ්‍යක්ෂවරයා ද ඇතුළුව), මහා කළමනාකරු සහ ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයන් සහ අනුකූලතා නිලධාරී ප්‍රධාන කළමනාකරණ මඩුල්ල ලෙස සලකනු ලබයි.
(උ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ මඩුල්ලට අයත් අධිකාරී බල ක්ෂේත්‍රය හා ප්‍රධාන වගකීම් නිර්වචනය කිරීම.	අනුගමනය කරන ලදී, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්හි සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මහා කළමනාකරුගේ අධිකාරී බලතල හා වගකීම් පැහැදිලිව නිර්වචනය වෙයි. ප්‍රධාන කළමනාකරණ මඩුල්ලෙහි අධිකාරී බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි හා රැකියා පිරිවිතරයෙහි හඳුනා ගත හැක.

මූලධර්ම		අනුකූලතා මට්ටම
(උ)	මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූලව, ප්‍රධාන කළමනාකාරිත්ව මඩුල්ල විසින් බැංකුවේ කටයුතු යෝග්‍ය ආකාරයෙන් අධීක්ෂණය කරනු ලබන බවට සහතික කිරීම.	අනුගමනය කරන ලදී, ආයතනික සැලැස්මේ අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සිදු කෙරේ. ආයතනික සැලැස්මේ ප්‍රගතිය විමර්ශනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වයෙන් බැංකුවෙන් පිට ස්ථානයකදි සිදු කරන ලදී. අවශ්‍ය වූ විට ප්‍රධාන කළමනාකරණ පිරිස් කැඳවා ඔවුන්ට අදාළ ක්‍රියාවලීන් පිළිබඳ පැහැදිලිකිරීම් ලබා ගනී.
(ව)	පහත සඳහන් දෑ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ යහපාලන පරිචයන්හි ඵලදායීතාවය කලින් කලට දැනගැනීම.	අනුගමනය කරන ලදී, නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව මඟින් යහපාලන පරිචයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව කලින් කලට සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.
	(i) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ මඩුල්ල තෝරා ගැනීම, නම් කිරීම සහ පත් කිරීම	මුළුමනින්ම රජයට අයත් බැංකුවක් වන ලංකා බැංකුවෙහි අධ්‍යක්ෂවරුන්, බැංකුව පිහිටුවීමේදි නීතිගත කරන ලද 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුකූලව මුදල් ඇමති විසින් පත් කරනු ලැබේ. මුදල් ඇමතිගේ අනුමැතිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා කළමනාකරු පත්කරනු ලබන අතර, නියෝජ්‍ය මහා කළමනාකරුවන් හා සමාන ශ්‍රේණීන්හි සිටින නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබයි. මෙහිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උසස් වීම් ක්‍රම සහ/හෝ බඳවා ගැනීමේ ක්‍රම භාවිතා කෙරේ.
	(ii) අරමුණු අතර ගැටුම් කළමනාකරණය කිරීම, සහ	අනුගමනය කරන ලදී, අරමුණු අතර ගැටුම් වේ නම් ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමේ ක්‍රියාදාමයක් පවතින අතර, සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් ආරම්භයේදිම සාකච්ඡාවට බඳුන් වේ. අරමුණු අතර ගැටුම් කළමනාකරණය පිණිස ඒ සඳහා වූ ප්‍රතිපත්තීන් යොදා ගනියි.
	(iii) දුර්වලතාවයන් නිශ්චය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දි වෙනස්කම් ඇති කිරීම.	අනුගමනය කරන ලදී . යහපාලන පරිචයන්ගේ කිසියම් දුර්වලතාවයක් වේ නම් එය ඉහත සඳහන් කළ නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව මඟින් අදාළ යහපාලන පරිචයන්ට අනුකූලතාවය පිරික්සන සමස්ත ඇගයීම් ක්‍රියාවලියේදි පරීක්ෂා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ වාර්ෂික ස්වයං ඇගයීම් මඟින් දුර්වලතාවයන් සහ වෙනස්කම් ඇති කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡා කිරීම සහ තීරණ ගැනීම සිදුවේ.
(ඒ)	ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සඳහා යෝග්‍ය වූ අනුප්‍රාප්තික සැලසුමක් බැංකුවට පවතින බවට සහතික කිරීම.	අනුගමනය කරන ලදී, ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සඳහා යෝග්‍ය වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලසුමක් බැංකුවට පවතී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග පිහිටුවීම සහ ආයතනික අරමුණු මුදුන්පත් කර ගැනීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම යනාදිය සඳහා අවශ්‍යතාවයන් අනුව නිතිපතා ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සමඟ රැස්වීම් පැවැත්වීම.	අනුගමනය කරන ලදී,
	(ඕ) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ නියාමකයින් සමඟ බැංකුව ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගන්නා බවට සහතික කිරීම.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂවරුන් ලෙස පත් වීමේදී සියළුම නියාමන අවශ්‍යතාවයන් හා අදාළ වන ආයතනික යහපාලන මූලධර්ම පිළිබඳව අන්තර්ගත වන ලිපි ගොනුවක් අලූතින් නිකුත්වන විධිවිධාන හා චක්‍රලේඛන පිළිබඳව ද ඔවුන් දැනුවත් කරයි.
	(ක) බාහිර විගණකයන් බඳවා ගැනීමේදී සහ අධීක්ෂණය කිරීමේදී නිසි ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කටයුතු කිරීම.	අනුගමනය කරන ලදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව, විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.
3(1)(ii)	මෙම නියමයන්ගේ 3(5) නියමයේ දක්වා ඇති ආකාරයට මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමත්, ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් නිශ්චය කර අනුමත කිරීමත් කළයුතු වන්නේය.	අනුගමනය කරන ලදී, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව මුදල් ඇමතිගේ පූර්ව අනුමැතිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා කළමනාකරු නමින් හඳුන්වන බැංකුවේ ප්‍රධාන විධායක නිළධාරියා පත්කරනු ලබයි. සභාපතිතුමාගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර සමාලෝචනය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි සඳහන් වේ.
3(1)(iii)	මණ්ඩලය නිතිපතා රැස්විය යුතු අතර, ආසන්න වශයෙන් මාසික පරතරයක් සහිතව අවම වශයෙන් වසරකට දොළොස් වරක් වත් මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතු ය. එවැනි රැස්වීම්වල දී පැමිණීමට අයිතිය ඇත්තා වූ අධ්‍යක්ෂවරුන් බහුතරයකගේ පුද්ගලික ක්‍රියාශීලී සහභාගිත්වය තිබිය යුතුය. ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය තුළින් මණ්ඩලයේ කැමැත්ත ලබාගැනීම හැකිතාක් දුරට වැළැක්විය යුතු වේ.	අනුගමනය කරන ලදී, 2013 වර්ෂය තුළදී, විශේෂ රැස්වීම් එකක් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 22ක් පවත්වන ලද අතර මෙම රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන් සක්‍රීයව සහභාගී විය. ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම හැකිතාක් දුරට අවම කර ඇත. සමාලෝචනයට භාජනය වූ වසර තුළදී ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා නොගැනුනි.
3(1)(iv)	මණ්ඩලයේ රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍රයට විෂයන් හා යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලැබෙන අයුරින් නිසි පියවර ගෙන ඇති බවට මණ්ඩලය විසින් සහතික කළ යුත්තේය. ඒවා බැංකු ව්‍යාපාරික කටයුතු හා අවදානම් කළමනාකරණය වර්ධනය කිරීමට අදාළ වූ විෂයයන් හා යෝජනා විය යුතුය.	අනුගමනය කරන ලදී, මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි අන්තර්ගත වේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(1)(v)	සියළුම අධ්‍යක්ෂවරුන්ට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් සාමාන්‍ය මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින 7 ක පෙර දැනුම්දීමක් කරන බව මණ්ඩල පටිපාටියක් විසින් සහතික කළ යුත්තේය. අනෙකුත් මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කළ හැකිය.	අනුගමනය කරන ලදී, වර්ෂය තුල පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ ලේඛනයක් සකස් කර වර්ෂ ආරම්භයට පෙරාතුව එය අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදීම සිදු කරයි. තවද, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් අවසන් වූ වහාම ඊළඟ රැස්වීම පිළිබඳ දැනුම් දෙනු ලබන අතර සාමාන්‍ය මණ්ඩල රැස්වීමකට දින 07කට පෙරාතුව ඒ පිළිබඳ දැනුවත් කරයි. අනෙකුත් විශේෂ රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කරනු ලැබේ.
3(1)(vi)	පසුගිය මාස 12 ක කාලය තුළ පැවැත්වූ රැස්වීම් වාර අඩුම වශයෙන් 2/3 කට සහභාගි නොවුණ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ පසුගිය රැස්වීම් වාර 3 කට අඛණ්ඩව සහභාගි නොවුණු අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂ ධූරය අහිමි වන බවට මණ්ඩල පටිපාටිය මඟින් සහතික කළයුතු ය. විකල්ප අධ්‍යක්ෂවරයෙකු මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීම, නිසි පැමිණීමක් ලෙස පිළිගත හැකිය.	සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුලදී මෙවැනි තත්වයක් උදා වී නොතිබුණි.
3(1)(vii)	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ දැක්වෙන විධි විධාන සපුරන්නා වූ සමාගම් ලේඛකාධිකාරිවරයෙකු මණ්ඩලය විසින් පත් කළ යුත්තේය. ඔහුගේ මූලික වගකීම් විය යුත්තේ මණ්ඩලය හා කොමසාරිස්වරයාගේ රැස්වීම් සඳහා ලේඛකාධිකාරී සේවා ලබාදීම සහ අණපනත්වල හා වෙනත් නියාමනයන් මඟින් දන්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය/ලංකා බැංකුවේ ලේකම්තුමිය,නීතිඥවරියක වන අතර 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන ඇය විසින් සපුරාලනු ලබයි.
3(1)(viii)	මණ්ඩලයේ පටිපාටීන් සහ අදාළ සියළු රීති හා නියාමනයන් පිළිපදින බව සහතික කරනු පිණිස සියළුම අධ්‍යක්ෂවරුන්ට සමානව ලේඛකාධිකාරිවරයාගේ උපදෙස් හා සේවා ලබාගැනීම සඳහා අවකාශය තිබිය යුතු ය.	අනුගමනය කරන ලදී, මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි දක්වා ඇත.
3(1)(ix)	මණ්ඩල රැස්වීම්වල වාර්තා ලේඛකාධිකාරිවරයා විසින් පවත්වා ගතයුතු අතර, ඕනෑම සාධාරණ වේලාවක දී සාධාරණ දැනුම්දීමකින් පසු ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට එවැනි වාර්තා පරීක්ෂා කිරීම සඳහා විවෘතව පැවතිය යුතු ය.	අනුගමනය කරන ලදී, සියළුම මණ්ඩල රැස්වීම් වල වාර්තා iPads පහසුකම සහිත විශේෂ මෘදුකාංග පද්ධතියක් හරහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට බෙදා හරියි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට පහසුවෙන් ලබාගත හැකි වන පරිදි සියළු වත්මන් හා පූර්ව මණ්ඩල රැස්වීම් වල වාර්තා එම පද්ධතියට අන්තර්ගත කර ඇත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(1)(x)	මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලී බවකින් කටයුතු කළා ද යන්න වාර්තා මඟින් තොරතුරු ලබාගත හැකිවන ආකාරයෙන්, මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් අයුරින් විස්තරාත්මක විය යුතු ය. මණ්ඩල රැස්වීම් වලදී ඇතිවන සාකච්ඡාවන්ගේ ගැඹුරු බව පිළිබඳ තක්සේරු කිරීමට මෙම වාර්තා නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට උපකාරී විය යුතු ය. එම නිසා මණ්ඩල රැස්වීම් වාර්තා තුළ පහත දෑ පැහැදිලිව ඇතුළත් විය යුතුය. අ) මණ්ඩලය තම සාකච්ඡා සඳහා භාවිතා කරනු ලැබූ තොරතුරු හා දත්ත පිළිබඳ සාරාංශයක් (ආ) මණ්ඩලය විසින් සලකා බැලීමට යෙදුන විෂය කරුණු (ඇ) මණ්ඩලය විසින් තම යුතුකම් නිසි සැලකිල්ලෙන් හා ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කරගෙන යන්නේ ද යන්න පිළිබඳ තොරතුරු ලබාදිය හැකි, තොරතුරු රැස්වීමේ සාකච්ඡා සහ මතභේදයට හෝ විරෝධයට බඳුන් වූ විෂය කරුණු (ඈ) මණ්ඩලයේ උපාය මාර්ග හා ප්‍රතිපත්ති සහ අදාළ නීති හා නියාමනයන් වලට අනුකූල වන බව විදහාපාන්නා වූ, අදාළ විධායකයින් විසින් කරනු ලබන සාකෂිදිම් සහ සනාථ කිරීම් (ඉ) බැංකුව මුහුණ දී සිටින අවදානම් වලින් ද මණ්ඩලයේ දැනුම හා අවබෝධය සහ අනුගමනය කළා වූ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග වලින් ද සමස්ත නිරීක්ෂණයක් සහ (ඊ) තීරණ සහ මණ්ඩල යෝජනා	අනුගමනය කරන ලදී, විස්තරාත්මක අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා මඟින් මෙම මූලධර්මවලට අදාළ කරුණු ආවරණය වේ.
3(1)(xi)	යෝග්‍ය අවස්ථාවන්හි දී, සාධාරණ ඉල්ලීම් මත, බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීයමය උපදෙස් පැතීම සඳහා අධ්‍යක්ෂවරුන්ට අවස්ථා ලබාදෙන මණ්ඩලය විසින් එකඟ වූ පටිපාටියක් තිබිය යුත්තේය. අදාළ අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරුන්ට ඔහුගෙන්/ඇයගෙන්/ඔවුන්ගෙන් බැංකුවට ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීම සඳහා ආධාර වීම පිණිස වෙනම ස්වාධීන වෘත්තීයමය උපදෙස් අධ්‍යක්ෂවරුන්ට ලබාදීම මණ්ඩලය විසින් සිදුකළ යුතුය.	අනුගමනය කරන ලදී, ස්වාධීන වෘත්තීමය උපදෙස් පැතීම සඳහා බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසා ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි උපදෙස් කරා යොමුවෙයි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(1)(xii)	අනෙකුත් සංවිධාන හෝ සම්බන්ධිත පාර්ශවයන් සමඟ කටයුතු කිරීමේදී සහ ඒවාට ඇති බැඳීම්වල දී, අරමුණු අතර ගැටුම් ඇතිවීම හෝ එවැනි ගැටුම් ඇති බව පෙන්නුම් කිරීම අධ්‍යක්ෂවරුන් විසින් වළක්වා ගතයුත්තේය. මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කිරීමට ඇති සහ මණ්ඩලය විසින් සැලකිය යුතු වැදගත්කමකින් යුතු විෂය කරුණක් බව නිශ්චය කර ඇති, විෂය කරුණක් සම්බන්ධයෙන් යම් අධ්‍යක්ෂවරයෙකුට අරමුණු අතර ගැටුමක් තිබේ නම්, එවැනි විෂය කරුණු සාකච්ඡාවට බඳුන් කළ යුත්තේ අදාළ විෂය කරුණ සම්බන්ධයෙන් කිසිදු සැලකිය යුතු හිමිකමක් නොමැති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් (මෙම නියමයන්ගේ 3(2)(iv) නියමය බලන්න) සහභාගි වන මණ්ඩල රැස්වීමක දිය. තවද, ඔහුට/ඇයට හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු හිමිකමක් ඇත්තා වූ ව්‍යාපාරයකට සම්බන්ධතාවයක් ඇති කිසිදු මණ්ඩල යෝජනාවක දී අධ්‍යක්ෂවරයෙකු විසින් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය. එසේම එම මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයේ අදාළ අධීක්ෂණය සඳහා ඝණපූරණය ගණන් බැලීමේදී ඔහු/ඇය ඊට ඇතුළත් නොකළ යුතු ය.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, අරමුණු අතර ගැටුම් සඳහා වූ ප්‍රතිපත්තීන් යොදා ගෙන ඇත. තවද, සාමාන්‍යයෙන් සෑම මණ්ඩල රැස්වීමකදීම (සති 02 කට වරක් පවත්වනු ලබන) අධ්‍යක්ෂවරුන් විසින්, අරමුණු අතර ගැටුම් වේ නම් හෝ වෙනත් අධ්‍යක්ෂ මණ්ඩල හෝ ආයතන වලට නව පත්වීම් ලැබුවේ නම් හෝ ඒවා ප්‍රකාශයට පත්කළ යුතු වේ.
3(1)(xiii)	බැංකුවේ මෙහෙයවීම හා පාලනය ස්ථිරසාර ලෙස තම අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම පිණිස, තම තීරණ ගැනීම සඳහා තමන්ට විශේෂයෙන් වෙන් කරන ලද්දා වූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ විධිමත් උප ලේඛනයක් මණ්ඩලය විසින් තබාගත යුතුය.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ, අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි බලතල දක්වයි.
3(1)(xiv)	බැංකුවට තම වගකීම් ගෙවීමට නොහැකි යැයි හෝ නොහැකිවීමට ඉඩ ඇතැයි හෝ බැංකුව බුන්වත් වීමට ආසන්න යැයි හෝ තැන්පතුකරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට නියමිත ගෙවීම් අත්හිටුවීමට ආසන්න යැයි හෝ බැංකුව සළකන්නේ නම්, වෙනත් කිසිම තීරණයක් හෝ ක්‍රියාවක් ගැනීමට පෙර වහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු වේ.	2013 වර්ෂය තුළදි මෙවැනි තත්ත්වයක් මතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන මාසික මූල්‍ය වාර්තා මඟින් බැංකුවේ නුබුන්වත්බව සහතික කෙරේ.
3(1)(xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ අනෙකුත් විචක්ෂණශීලී පදනම් අනුව මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති මට්ටම්වලට අනුකූල වන මට්ටමක බැංකුවේ ප්‍රාග්ධනය පවතින බවට මණ්ඩලය විසින් සහතික කළයුතු ය.	බැංකුව මුදල් මණ්ඩලයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයන්ට පූර්ණ අනුකූලතාවයක් දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන මාසික මූල්‍ය වාර්තාවන්හි ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පිළිබඳ විස්තර කරයි. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත සඳහා පිටු අංක 363 පරිශීලනය කරන්න.
3(1)(xvi)	මෙම නියමයන්ගේ 3 වැනි නියමයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් වූ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවක්, මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාව තුළින් ප්‍රසිද්ධ කළයුතු ය.	අනුගමනය කරන ලදී.
3(1)(xvii)	වාර්ෂිකව සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම ස්වයං ඇගයීමක් කිරීම සඳහා වූ ක්‍රමයක් මණ්ඩලය විසින් අනුගමනය කළයුතු අතර, එවැනි ඇගයීම්වල වාර්තා තබා ගතයුතු වන්නේය.	අනුගමනය කරන ලදී. වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ ස්වයං ඇගයීමක් කරනු ලබන අතර එවැනි ඇගයීම් වල වාර්තා පවත්වා ගනී. මෙම ඇගයීම් ක්‍රියාවලිය සඳහා නාමයෝජනා හා ආයතන යහපාලන කමිටුව පහසුකම් සලසයි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(2) මණ්ඩලයේ සංයුතිය		
3(2)(i)	මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7ට වඩා අඩු නොවිය යුතු අතර, 13ට වඩා වැඩි නොවිය යුතුය.	1938 අංක 53 දරණ ලංකා බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව 6ක් වන අතර 2013 දෙසැම්බර් 31 වෙනි දිනට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරු 5 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම විධිවිධානයට අනුකූල වන පරිදි ලංකා බැංකු ආඥා පනත සංශෝධනය කිරීමට බැංකුව විසින් පියවර ගනිමින් පවතී.
3(2)(ii)	(අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුරේ සිටින අධ්‍යක්ෂවරයා හැර, අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර 9 නොඉක්මවිය යුතු අතර, එම සේවා කාලයට 2008 ජනවාරි 01 දින දක්වා එවැනි අධ්‍යක්ෂවරයෙකු එම ධුරයේ සේවය කරන ලද මුළු කාලයද ඇතුළත් විය යුත්තේය.	ලංකා බැංකුවේ වත්මන් අධ්‍යක්ෂවරුන් වසර 9කට වඩා අඩු සේවා කාලයක් එම තනතුරේ සේවය කර ඇත. වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර යටතේ පිටු අංක 42 සිට 45 දක්වා සඳහන් කර ඇත.
	(ආ) මෙහිදී, පහත සඳහන් සාමාන්‍ය නිදහස් කිරීම අදාළ විය යුතුය. 2008 ජනවාරි 01 දිනට වසර 09 ක සේවා කාලය සම්පූර්ණ කළ අධ්‍යක්ෂවරයෙකුට හෝ 2008 දෙසැම්බර් 31 දිනට පෙර එය සම්පූර්ණ කළ අධ්‍යක්ෂවරයෙකුට 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන උපරිම වසර 3 ක කාලසීමාවක තවදුරටත් සේවාව සැපයිය හැක.	අදාළ නොවේ.
3(2)(iii)	විධායක අධ්‍යක්ෂවරුන් ගණන මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් තුනෙන් එකක ප්‍රමාණය නොඉක්මවන පරිදි බැංකු සේවකයකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස (මින් මතු විධායක අධ්‍යක්ෂවරුන් ලෙස හඳුන්වන) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එවැනි අවස්ථාවකදී එක් විධායක අධ්‍යක්ෂවරයකු ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කළ යුතු ය.	ලංකා බැංකුවේ කිසිම සේවකයෙකු අධ්‍යක්ෂවරයකු ලෙස පත් කර නොමැති අතර එනිසා ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂවරුන් කිසිවකු නොමැත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(2)(iv)	මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් එක යන දෙකෙන් වැඩි ගණනකින් සමන්විත විය යුතු ය. මෙම අනු විධානය අදාළ වන්නේ 2010 ජනවාරි 01 දිනෙන් පසුවය.	ලංකා බැංකුවේ සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. ඒ අතරින් තිදෙනෙකු මෙම විධිවිධානයට අනුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස හඳුනාගත හැකිය. පිටු අංක 42 සිට 45 දක්වා අධ්‍යක්ෂවරුන්ගේ විස්තර යටතේ සහ පහත සඳහන් විධිවිධාන අංක 3(2)(viii) හි ඔවුන්ව දක්වා ඇත.
	විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් පහත සඳහන් දෑට යටත් වන්නේ නම් ඔහු/ඇය ස්වාධීන අයෙක් ලෙස නොසැලකේ.	2013 වර්ෂය අවසාන භාගයේදී රාජු සිවරාමන් මහතා වැඩ බලන සභාපති ලෙස පත් කරන තෙක් , බැංකුව තුළ ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු විය. ඔහුගේ පත්වීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය තුළ ඇති වන පුරප්පාඩුව බැංකුවේ චකම කොටස්හිමියා විසින් පිරවිය යුත්තක් බැවින් 2013 දෙසැම්බර් මස අවසානයේදී බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් පමණක් සමන්විත විය.
	(අ) බැංකුවේ කොටස් හිමිකාරත්වයෙන් 1% කට වඩා සෘජු ලෙස හෝ වක්‍ර ලෙස අත්කර ගෙන සිටීම.	
	(ආ) දැනට හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර 2 ක කාල පරිච්ඡේදයක් තුළ මෙහි 3(7) වන වගන්තියෙන් දක්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන කිසිඳු ව්‍යාපාරික ගනුදෙනුවක වර්තමානයේ යෙදී සිටීම/ යෙදී සිට තිබීම.	
	(ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාලයක් තුළ බැංකුවේ සේවා නියුක්ත වී සිට තිබීම.	
	(ඈ) කිට්ටු ඥාතිත්වයක් ඇති අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන විධායක නිලධාරියෙක් හෝ ජ්‍යෙෂ්ඨ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයෙක් හෝ වෙනත් සැලකිය යුතු කොටස් හිමිකරුවෙක් බැංකුවේ හෝ වෙනත් බැංකුවක සිටීම. මෙහි අරමුණ සඳහා, සමීප ඥාතියකු, යන්නෙන් අදහස් වන්නේ කාලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන්නා වූ ළමයෙකි.	
	(ඉ) බැංකුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් නියෝජනය කිරීම.	
	(ඊ) පහත දැක්වෙන සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වීම.	
	(i) පහත 3(7) විධානයේ දැක්වෙන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක බැංකුව සමඟ වර්තමානයේ සිටින හෝ	
	(ii) බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරුන් සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරයෙක් වන හෝ සැලකිය යුතු කොටස් හිමියකු වී සිටින හෝ	
	(iii) මෙම විධානයන්ගේ 7 වන විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරයෙක් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක යෙදී සිටින	

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(2)(v)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති විටක එසේ පත් කරන ලද පුද්ගලයා ද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන මිනුම් දඬු සම්පූර්ණ කළයුතු ය.	ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස විකල්ප අධ්‍යක්ෂවරු පත්කර නොමැත.
3(2)(vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් තරමේ කීර්තිමත් පෙර වාර්තා සහිත ඉහළ හැකියාවකින් යුතු පුද්ගලයන් විය යුතු අතර, ක්‍රමෝපාය, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳව මතුවන ගැටළුවලට ස්වාධීන වූ තීරණ ගැනීමේ පළපුරුද්ද සහ හැකියාවන්ගෙන් ද යුක්ත විය යුතු ය.	අනුගමනය කරන ලදී. පිටු අංක 42 සිට 45 දක්වා වූ අධ්‍යක්ෂවරුන්ගේ විස්තරයෙහි අවශ්‍ය තොරතුරු දක්වා ඇත.
3(2)(vii)	මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ ගණපූර්ණය සම්පූර්ණ වුවද, එම රැස්වීමට සහභාගි වන අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් භාගයකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටිය යුතු අතර, එසේ නොවේ නම් එවැනි රැස්වීමක් නිසි පරිදි පවත්වන ලද්දක් නොවනු ඇත. මෙම අනු විධානය බලපැවැත්වෙනුයේ 2010 ජනවාරි 01 දින සිටය.	අනුගමනය කරන ලදී. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සියළුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3(2)(viii)	සියළුම ආයතනික සන්නිවේදන කටයුතුවලදී බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළි කිරීමේ දී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නිශ්චිතව හඳුනාගත යුතු ය. සභාපති, විධායක අධ්‍යක්ෂ, විධායක නොවන අධ්‍යක්ෂ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් නම් සහිතව මණ්ඩලයේ සංයුතිය සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයක් බැංකුව විසින් තම වාර්ෂික යහපාලන වාර්තා මඟින් අනාවරණය කළයුතු ය.	අනුගමනය කරන ලදී. 2013 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ. • 2013 ජනවාරි 08 වෙනිදා දක්වා ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ මහතා සභාපති ධූරය දැරීය. • 2013 ජනවාරි 09 වෙනිදා සිට රසීක් සරෑක් මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ/ සභාපති • රාජු සිවරාමන් මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.2013 දෙසැම්බර් 27 වෙනිදා ඔහු වැඩ බලන සභාපති ලෙස පත් විය. • එස් ආර් ආටිගල මහතා 2013 අප්‍රේල් 23 දක්වා විධායක නොවන නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේය. • කේ එම් මහින්ද සිරිවර්ධන මහතා විධායක නොවන නිල බලයෙන් අධ්‍යක්ෂ (2013 අප්‍රේල් 24 වන දින සිට එස් ආර් ආටිගල මහතා වෙනුවට) • එන් අබේවර්ධන මෙනෙවිය - විධායක නොවන අධ්‍යක්ෂ • චන්ද්‍රසිරි ද සිල්වා මහතා - විධායක නොවන අධ්‍යක්ෂ • කේ එල් හේවගේ මහතා - 2013 ජුනි 06 වෙනිදා දක්වා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ • 2013 ජුනි 19 වෙනි දින සිට ලලිත් විතාන මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස හේවගේ මහතා වෙනුවට පත් විය. ආර් එම් ඒ රත්නායක මහතා එස් ආර් ආටිගල මහතාට විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස 2013 ජනවාරි 29 දින සිට විකල්ප අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ වී කනගසභාපති මහතා වෙනුවෙන් පත් විය. ආර් එම් ඒ රත්නායක මහතා කේ එම් මහින්ද සිරිවර්ධන මහතාට විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස 2013 අප්‍රේල් 24 වන දින සිට පත් විය.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(2)(ix)	මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වූ විධිමත්, සිතාමතා සකස් කරන ලද විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය. එසේම මණ්ඩලයට අනුප්‍රාප්තිකයන් පත් කිරීම සිදු කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ද තිබිය යුතු ය.	මුදල් අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුව පත්කිරීම් සිදුකරන හෙයින් මෙය අදාළ නොවේ.
3(2)(x)	තාවකාලික ඇබෑර්තු පිරවීම සඳහා පත් කරනු ලැබූ සියළුම අධ්‍යක්ෂවරුන් එම පත් කිරීම්වලින් පසුව එළඹෙන පළවෙනි මහා සභා රැස්වීමේදි කොටස්කරුවන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමට යටත් විය යුතු ය.	මුදල් අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුව පත්කිරීම් සිදු කරන හෙයින් මෙය අදාළ නොවේ.
3(2)(xi)	අධ්‍යක්ෂවරයෙක් සිය ධුරයෙන් ඉවත් කරන ලද්දේ නම් හෝ ඉල්ලා අස්වූයේ නම් මණ්ඩලය විසින්,	සභාපති වශයෙන් කටයුතු කළ ගාමිණී වික්‍රමසිංහ මහතා පෞද්ගලික හේතූන් මත 2013 ජනවාරි 08 වන දින ඉල්ලා අස්වූයේය.
	(අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීමේ හෝ ඉවත් කිරීමේ හේතූන් එම අධ්‍යක්ෂවරයා බැංකුව සමඟ එකඟ නොවීමට අදාළ තොරතුරු තිබේ නම් එම තොරතුරු ද සමඟ ප්‍රසිද්ධ කළයුතුය. සහ	වික්‍රමසිංහ මහතාගෙන් පසුව සභාපති වූ රසීක් සරූක් මහතාගේ ධුරයේ වැඩකටයුතු 2013 වසර අග භාගයේදි අවසන් විය. (2013 දෙසැම්බර් 27 වෙනිදා රාජ්‍ය සිවරාමන් මහතා වැඩ බලන සභාපති ලෙස පත් විය.) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මඟින් නව නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමෙන් පසුව එස් ආර් ආටිගල මහතාගේ ධුරයේ වැඩකටයුතු 2013 අප්‍රේල් 23 වෙනි දිනෙන් අවසන් විය. 2013 ජුනි 06 වෙනි දිනෙන් අධ්‍යක්ෂ කේ එල් හේවගේ මහතාගේ තුන් අවුරුදු සේවා කාලය අවසන් විය. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් ඉවත් වූ, එස් ආර් ආටිගල මහතාට විකල්ප අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ, නිල බලයෙන් අධ්‍යක්ෂ වී කනගසභාපති මහතා 2013 ජනවාරි 29 දින සිට බලපැවැත්වෙන පරිදි එම ධුරයෙන් ඉවත් වූයේය.
	(ආ) කොටස්කරුවන්ගේ අවධානයට ලක්විය යුතු කිසියම් කරුණක් තිබීම හෝ නොතිබීම සහතික කරමින් ප්‍රකාශනයක් නිකුත් කළ යුතුය.	බැංකුවේ එකම කොටස්හිමියා වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් අමාත්‍යවරයා විසින් පත්කිරීම් හා ඉවත් කිරීම් සිදු කරයි. ඉල්ලා අස්වීමක් වේ නම් එයද එම අමාත්‍යවරයාට යොමු කරයි.
3(2)(xii)	බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් හෝ සේවකයෙක් බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම නොකළ යුතුය.	2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කළමනාකරු (ආයතනික හා අක්වෙරළ අංශය) පත් කිරීම හැර ලංකා බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයකු ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු නොකරයි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(3) අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය ඇගැයීමේ නිර්ණායක		
3(3)(i)	අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරන පුද්ගලයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු ය. මෙවැනි අවස්ථාවලදී පහත දැක්වෙන සාමාන්‍ය නිදහස් කිරීම් අදාළ වන්නේය. 2008 ජනවාරි 01 දිනට වයස අවුරුදු 70 සපුරන හෝ 2008 දෙසැම්බර් 31 දිනට පෙර වයස අවුරුදු 70 සපුරන අධ්‍යක්ෂවරයෙකුට 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන උපරිම වසර 3 ක කාලසීමාවක තවදුරටත් රාජකාරියේ යෙදිය හැක.	වත්මන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සියළු දෙනාම 2013 දෙසැම්බර් 31 වෙනි දිනට වයස අවුරුදු 70ට අඩු පුද්ගලයින් වන නිසා මෙම රීතියට අනුකූල වේ.
3(3)(ii)	පුද්ගලයකු විසින් බැංකුවේ පාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළත්ව සමාගම්/ ඒකකයන්/ ආයතන 20 කට වඩා වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂ තනතුර දැරිය නොයුත්තේය.	අනුගමනය කරන ලදී.
3(3)(ii)(අ)	මෙවැනි අවස්ථාවකදී පහත සඳහන් සාමාන්‍ය නිදහස් කිරීම් අදාළ වේ. ඉහත දැක්වූ සීමාවන් ඉක්මවා ගිය පුද්ගලයෙකු වේනම්, එවැනි පුද්ගලයෙකු 2009 ජනවාරි 01 දින සිට උපරිම වසර 03 ක කාලයක් තුළ දී ඉහත සඳහන් කළ සීමාවන් සමඟ අනුකූල වීම සහ මුදල් මණ්ඩලය දැනුවත් කරයි.	අදාළ නොවේ.
3(4) මණ්ඩලය විසින් පවරා ඇති කළමනාකරණ කාර්යයන්		
3(4)(i)	බලතල පවරා දීම සඳහා පවතින ක්‍රියාවලිය අධ්‍යක්ෂවරුන් විසින් සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීම හා නිරවුල්ව අවබෝධ කර ගැනීම කළයුතු ය.	අනුගමනය කරන ලදී. 1938 අංක 53 දරණ ලංකා බැංකු පනත හා එහි සංශෝධන අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල පවරාදීම දක්වයි. මහා කළමනාකරු පත් කිරීමේ බලතල හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් බලතල පවරා දිය හැකි අතර එවැනි පවරාදීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශිත සියළු රෙගුලාසිවලට අනුකූලතාවය දැක්වීමට යටත්ව සිදු කරයි. එවැනි පවරාදීම් ඉවත් කිරීමේ බලයද අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ හැකියාවන්ට බාධා නොවන ලෙස පවරා දීම් මණ්ඩලය විසින් සිදු කරයි.
3(4)(ii)	මණ්ඩලයට සමස්තයක් ලෙස තම කාර්යයන් ඉටු කිරීම සඳහා සැලකිය යුතු ලෙස අවහිරවන්නා වූ හෝ ඉටුකිරීමේ හැකියාව අඩු කරන්නාවූ ආකාරයේ ප්‍රමාණයකට, මණ්ඩලය විසින් මණ්ඩලීය කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ට කිසිම කාර්යයක් පවරා දීම නොකළ යුත්තේය.	
3(4)(iii)	බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ වන ආකාරයෙන් තිබෙන බව සහතික කර ගැනීම සඳහා, මණ්ඩලය විසින් පවතින බලතල පවරාදීමේ ක්‍රියාවලිය කාලීනව විමර්ශනය කළයුතු වේ.	අනුගමනය කරන ලදී. බලතල පවරා දීමේ ක්‍රියාවලිය කාලීනව විමර්ශනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදු වේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(5) සභාපති හා විධායක නිලධාරී		
3(5)(i)	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරයන් වෙන් කළයුතු අතර මෙම කාර්යයන් තනි පුද්ගලයෙක් විසින් සිදු නොකළ යුතු ය.	අනුගමනය කරන ලදී. ලංකා බැංකුවේ සභාපති තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.
3(5)(ii)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයකු වන්නේ නම් මැනවි. සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන විට, ස්වාධීනත්වය සහතික කිරීම පිණිස ලිඛිත කාර්යභාරයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු පත්කළ යුතු ය. මෙම ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි පළ කළ යුතු ය.	ලංකා බැංකුවේ සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.
3(5)(iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික වාර්තාවේ අනිවාර්ය කොටසක් විය යුතු ආයතනික යහපාලන වාර්තාවේ, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියාගේ අනන්‍යතාවය ද, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර කිසියම් සම්බන්ධතාවයක් ඇත්නම්, (මූල්‍ය, ව්‍යාපාරික, පවුලේ හෝ අනෙකුත් සැලකිය යුතු/ අදාළ සම්බන්ධතාවයන් ඇතුළුව) එය ද පල කළ යුතුයි.	සභාපති - 2013 ජනවාරි 08 දක්වා ගාමිණී වික්‍රමසිංහ මහතා 2013 ජනවාරි 09 සිට රසීක් සරූක් මහතා • ප්‍රධාන විධායක නිලධාරී (ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස හඳුන්වයි), කේ ධර්මසිරි මහතා 2013 ජනවාරි 07 දක්වා,2013 ජනවාරි 08 සිට ඩී.එම් ගුණසේකර මහතා. මෙම විධිවිධානයේ දක්වන ආකාරයේ කිසිඳු සම්බන්ධතාවයක් ඔවුන් අතර නොමැති බව දක්වමින් ප්‍රකාශනයක් සභාපතිතුමාගෙන්, මහා කළමනාකරුගෙන් සහ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගෙන ඇත.
3(5)(iv)	සභාපතිතුමා විසින් (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බව හා සිය වගකීම් නිසි ලෙස ඉටුකරන බව සහතික කිරීම (ඇ) ප්‍රධාන ගැටළු කාලීන ලෙස මණ්ඩලය තුළ සාකච්ඡා කරන බව සහතික කිරීම කළයුතු වේ.	අනුගමනය කරන ලදී. සභාපතිතුමා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයන අතර අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බව හා සියළු වගකීම් නිසිලෙස ඉටු කරන බව සහතික කරයි. සියළු ප්‍රධාන ගැටළු කාලීන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡා කරයි.
3(5)(v)	සෑම රැස්වීමකම න්‍යාය පත්‍රය පිළියෙළ කිරීමේ හා අනුමත කිරීමේ මූලික වගකීම සභාපතිතුමා සතු වන අතර අනෙකුත් අධ්‍යක්ෂවරුන් විසින් යෝජනා කරන ඕනෑම කරුණක් යෝග්‍ය වන්නේ නම් න්‍යාය පත්‍රයට ඇතුළත් කළයුතු ය. න්‍යාය පත්‍රය පිළියෙළ කිරීමේ කාර්යය සභාපති විසින් සමාගම් ලේකම්ට පැවරිය හැකිය.	අනුගමනය කරන ලදී. සභාපති විසින් බලය පවරාදීම යටතේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ලංකා බැංකුවේ ලේකම් විසින් න්‍යාය පත්‍රය පිළියෙල කිරීමේ කාර්යය සිදු කරනු ලබයි. මහා කළමනාකරු හරහා ඉදිරිපත් කරන සංදේශය මත හා කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන වෙනත් අදාළ කරුණු මත පදනම්ව න්‍යාය පත්‍රය සකස් කිරීම සිදු කරයි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(5)(vi)	සභාපති විසින් සියළුම අධ්‍යක්ෂවරුන් රැස්වීමේ පැනනගින කරුණු පිළිබඳව නිසි ලෙස දැනුවත්ව සිටින බවට සහතික විය යුතු අතර ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට ද සහතික විය යුතු ය.	අනුගමනය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල සංදේශ මඟින් ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත රැස්වීමට දින 6 සිට 7 දක්වා කාලයකට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට නව මෘදුකාංග පද්ධතියක් වන i Pads පහසුකම ඔස්සේ ඉදිරිපත් කරයි. ප්‍රමාද වූ සංදේශයන් වෙතොත් එයද හැකිතරම් ඉක්මනින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර ඉදිරිපත් කරයි. කෙසේ වෙතත්, සංදේශයේ අඩංගු කරුණු වලට අමතරව ඉතා හදිසි කරුණක් පැණනැගුනහොත් තීරණ ගැනීමට හැකිවන ආකාරයේ ප්‍රමාණාත්මක තොරතුරු සහිත විස්තරාත්මක පැහැදිලි කිරීමක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිදු කරයි. මෙම ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම පිළිබඳව සභාපති සහතික වේ.
3(5)(vii)	සභාපති විසින් මණ්ඩලයේ කටයුතු සඳහා සම්පූර්ණ හා සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා සියළුම අධ්‍යක්ෂවරුන් ධෛර්යමත් කළයුතු අතර බැංකුවේ උපරිම වාසිය සඳහා ක්‍රියාකරන බව සහතික කිරීමට මූලිකත්වය ගතයුතු ය.	අනුගමනය කරන ලදී.
3(5)(viii)	සභාපතිතුමා විසින් විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය ලබාගැනීමට පහසුකම් සැපයිය යුතු අතර විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර හිතකර සබඳතාවයන් පවත්වා ගැනීම ද සහතික කළයුතු ය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුදෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3(5)(ix)	ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන් හෝ වෙනත් කිසිම විධායක කාර්යයක් සෘජුවම අධීක්ෂණය සඳහා සභාපති සම්බන්ධ නොවිය යුතු ය.	අනුගමනය කරන ලදී. සභාපතිතුමන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ප්‍රධාන කළමනාකරණ පිරිස් අධීක්ෂණය කිරීමේ කටයුතු වලට සෘජුවම සම්බන්ධ නොවේ.
3(5)(x)	කොටස්හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමියන්ගේ අදහස් මණ්ඩලයට සන්නිවේදනය වන බවට සභාපති විසින් සහතික විය යුතු ය.	අනුගමනය කරන ලදී. මුළුමනින්ම කොටස් හිමිකාරිත්වය දරණ ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගනී. සෑම විටම මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු නිලබලයෙන් අධ්‍යක්ෂ ලෙස පත් කරන අතර කොටස් හිමියාගේ අදහස් සන්නිවේදනය කෙරේ.
3(5) (xi)	ප්‍රධාන විධායක නිලධාරිවරයා බැංකුවේ දෛනික මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතු භාර ඉහළම විධායකයා වශයෙන් ක්‍රියා කළයුතු ය.	අනුගමනය කරන ලදී. මහා කළමනාකරුගේ බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට විශේෂයෙන් අදාළ වේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(6) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ කමිටු		
3(6)(i)	මෙම විධානයන්ගේ 3(6)(ii), 3(6)(iii), 3(6)(iv) සහ 3(6)(v) යන විධානවල දක්වා ඇති ආකාරය අනුව සෑම බැංකුවකම අඩුම තරමේ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක්වත් තිබිය යුතු ය. සෑම කමිටුවක්ම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළයුතු ය. කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම හා රැස්වීම් වාර්තා පවත්වා ගැනීම යනාදිය සඳහා සෑම කමිටුවක් විසින්ම ලේකම්වරයෙක් පත්කර ගතයුතු ය. සෑම කමිටුවකම යුතුකම් හා කාර්යයන් ඇතුළත් කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා සභා රැස්වීමට ඉදිරිපත් කළයුතු ය.	අනුගමනය කරන ලදී. මෙම විධිවිධානය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලීය උප කමිටු 4ක් (විගණන, මානව සම්පත් හා පාරිශ්‍රමික, නාමයෝජනා හා ආයතනික යහපාලන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ) ස්ථාපිත කර ඇති අතර රැස්වීම් වාර්තා සමඟ නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ලංකා බැංකුවේ ලේකම් සියළුම කමිටුවල ලේකම් ලෙස පත්කර ඇති අතර සමිතියේ සභාපතිගේ අධීක්ෂණය යටතේ රැස්වීම් වාර්තා පවත්වා ගනී. උප කමිටු වල සංයුතිය, එක් එක් උප කමිටු වල කාර්යසාධනය සහ අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පිළිබඳව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 188,189 සිට 197 හා 149 යන පිටු වල පිළිවෙලින් විස්තර කරයි. ලංකා බැංකුව වාර්ෂික මහා සභාවක් නොපවත්වයි. කෙසේ වෙතත්, එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු මණ්ඩල සාමාජිකයෙකු වන අතර ඔහු කොටස්කරුගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටියි.
3(6)(ii)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත රීති අදාළ වේ. (අ) ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් කමිටුවේ සභාපතිවරයා විය යුතු ය.	විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන, නිලබලයෙන් අධ්‍යක්ෂගේ විකල්ප අධ්‍යක්ෂවරයා වන, වී. කනගසභාපති මහතා ගණකාධිකරණය හා විගණනය සම්බන්ධයෙන් සුදුසුකම් හා අත්දැකීම් වලින් පරිපූර්ණ වූ පුද්ගලයෙකු වන අතර 2013 ජනවාරි 29 වෙනි දින දක්වා ඔහු විගණන කමිටුවේ සභාපතිධුරය උසුලන ලදී. 2013 පෙබරවාරි 07 වෙනි දින සිට 2013 ජුනි 18 වෙනි දින දක්වා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන, නිල බලයෙන් අධ්‍යක්ෂගේ විකල්ප අධ්‍යක්ෂවරයා ලෙස පත්වූ, ගණකාධිකරණය හා විගණනය සම්බන්ධයෙන් සුදුසුකම් හා අත්දැකීම් වලින් පරිපූර්ණ වූ ආර් එම් ඒ රත්නායක මහතා විගණන කමිටුවේ සභාපති ලෙස කටයුතු කළේය.2013 ජුනි 19 වෙනි දින සිට ගණකාධිකරණය හා විගණනය සම්බන්ධයෙන් සුදුසුකම් හා අත්දැකීම් වලින් පරිපූර්ණ වූ ලලිත් විතාන මහතා විගණන කමිටුවේ සභාපති ලෙස කටයුතු කරයි. සභාපතිවරුන් ලෙස විකල්ප අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලදී.
	(ආ) කමිටුවේ සෑම සාමාජිකයෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විය යුතු ය.	අනුගමනය කරන ලදී. කමිටුවේ සෑම සාමාජිකයෙකුම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඇ) කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බැංකුවේ විගණක, විගණකාධිපති වන නිසා මෙය අදාළ නොවේ.
	(i) අදාළ නීති ප්‍රකාරව විගණන සේවා සඳහා බාහිර විගණකවරුන් පත් කිරීම	2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවෙහි හා එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති විසින් ඔහුගේ සහය පිණිස අර්න්ස්ට් ඇන්ඩ් යංග් ගණකාධිකාරී ආයතනය පත් කරන ලදී
	(ii) මහ බැංකුව විසින් විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද උපදෙස් මාලාවන් ක්‍රියාත්මක කිරීම	අනුගමනය කරන ලදී. 2007 අංක 11 දරණ ශ්‍රී ලංකා මහ බැංකු විධිවිධානයට අනුකූලව විගණකයින් විසින් පිළියෙල කොට ඉදිරිපත් කරන ලද මූල්‍ය වාර්තා වල විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවෙහි අනාවරණය කිරීමේ අවශ්‍යතාවය දක්වමින් විගණකයින් සඳහා නිකුත් කොට ඇති ශ්‍රී ලංකා මහ බැංකු විධිවිධාන වලට අදාළ ගැටළු සාකච්ඡා කිරීම හා ස්ථිර කර ගැනීම විගණන කමිටුව විසින් සිදු කරන ලදී.
	(iii) අදාළ හිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීම	අනුගමනය කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRS) වලට අනුකූල වීමේ ප්‍රගතිය තක්සේරු කිරීමේදී විගණකයින් විසින් හඳුනාගන්නා ලද අතුරු කරුණු විගණන කමිටුවේදී සාකච්ඡා කර සුදුසු නිර්දේශ ලබා දෙන ලදී.
	(iv) විගණකවරුන්ගේ සේවා කාලය, ගාස්තු සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීමක් හෝ ඉවත් කිරීම. මෙහි දී විගණක හවුල්කරුවකුගේ සේවය ලබා ගැනීම වසර පහක් නොඉක්මවිය යුතු අතර, එම කාලය සපිරූ හවුල්කරුවකු නැවත පත්කළ හැකි වන්නේ මුල් වාරය සම්පූර්ණකර වසර තුනක් ඉක්මවූ පසුවය.	ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපති, බැංකුවේ විගණක වන නිසා අදාළ නොවේ.
	(ඈ) බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියේ සඵලදායකත්වය, අදාළ ප්‍රමිතීන් සහ මනා පරිචයන් අනුව සමාලෝචනය කිරීම කමිටුවේ කාර්යයකි.	ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපති, බැංකුවේ විගණක වන නිසා අදාළ නොවේ.

මූලධර්ම	අනුකූලතා මට්ටම
(ඉ) අදාළ නීති නියමයන්, අවශ්‍යතාවයන් සහ මාර්ගෝපදේශ මඟින් අවසර දෙන ලද විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකයින් යොදා ගැනීම පිළිබඳව ප්‍රතිපත්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම විගණන කමිටුවේ වගකීමකි. බාහිර විගණකවරයා විසින් සපයනු ලබන එවැනි විගණන නොවන සේවා ඔහුගේ ස්වාධීනත්වය සහ විෂයමූලිකභාවයට හානි නොවන බවට කමිටුව වගබලා ගතයුතු ය. විගණන නොවන සේවා සැපයීමේ දී විගණකවරයාගේ ස්වාධීනත්වය හෝ විෂයමූලිකභාවය තක්සේරු කිරීමේදී කමිටුව විසින් පහත කරුණු සළකා බැලිය යුතුය.	විගණකාධිපති, බැංකුවේ විගණක වේ.
(i) විගණන සමාගමේ නිපුණතා සහ පළපුරුද්ද විගණන නොවන සේවා සැපයීම සඳහා යෝග්‍ය වන්නේ ද නැද්ද යන්න	
(ii) බාහිර විගණකවරයා විසින් එවැනි සේවා සැපයීමේදී විගණනයේ ස්වාධීනත්වය හා/හෝ විෂයමූලිකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇද්දැයි යන්න සහ	
(iii) විගණන නොවන සේවාවල ස්වභාවය, අදාළ ගාස්තු මට්ටම්, විගණන සමාගමට සාපේක්ෂව එක් එක් ගාස්තු මට්ටම් හා සමුච්චිත ගාස්තු මට්ටම් යනාදිය බාහිර විගණකවරයාගේ විෂය මූලිකභාවයට හෝ ස්වාධීනත්වයට කිසියම් බලපෑමක් කරන්නේ ද යන වග.	

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඊ) විගණනය ආරම්භ කිරීමට පෙර කමිටුව විසින් පහත සඳහන් දේ ඇතුළත් විගණනයේ ස්වභාවය සහ විෂයපථය පිළිබඳව බාහිර විගණකවරයා සමඟ සාකච්ඡා කර අවසන් කළ යුතුය. (i) අදාළ ආයතනික රීති සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකරණයේ අභ්‍යන්තර පාලන විධිවිධානවලට බැංකුවේ අනුකූලවීම පිළිබඳ ඇගැයීමක් (ii) අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් අනුව බාහිර අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම. (iii) එක් විගණන සමාගමකට වඩා වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ වන විට ඒවා අතර සම්බන්ධීකරණය යනාදියයි.	විගණකාධිපති බැංකුවේ විගණක වේ. විගණනයේ විෂය පථය හා පරාසය පිළිබඳව විගණකාධිපති විසින් තීරණය කරනු ලබන අතර විගණකාධිපතිගේ සහය පිණිස කටයුතු කරන අර්න්ස්ට් ඇන්ඩ් යංග් ආයතනයට, ප්‍රමාණය සහ අවදානම පිළිබඳ සලකා බලමින් විෂය පථය සම්බන්ධයෙන් වැඩිදුර වෙනස් කිරීම්/සංශෝධනය කිරීම් සිදු කළ හැක.
	(උ) තොරතුරු අනාවරණය කිරීම සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල සත්‍යතාවය සහ ඒවායේ අඩංගු මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් පරීක්ෂා කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර කමිටුව විසින් විශේෂයෙන් අවධානය යොමු කළයුතු කරුණු වන්නේ (i) ප්‍රධාන විනිශ්චයන් සහිත ක්ෂේත්‍ර (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්ගේ සිදුවූ වෙනස්කම් (ii) විගණනය තුළින් ඇතිවූ ප්‍රධාන ගැලපීම් (iv) අඛණ්ඩ පැවැත්මේ උපකල්පනයන් සහ (vi) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම ආදියයි.	අනුගමනය කරන ලදී. මෙය මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික මූල්‍ය තොරතුරු සමාලෝචනය කරමින් සිදු කරන අඛණ්ඩ ක්‍රියාවලියකි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(උ) කමිටුව විසින් අතුරු සහ වසරාවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කළයුතු අතර, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ සහභාගිත්වය නොමැතිව විගණකවරයාට සාකච්ඡා කිරීමට අවශ්‍ය දෑ වේ නම් ඒවාද ඇතුළුව අනෙකුත් කරුණු ද අවශ්‍ය විට සාකච්ඡා කළයුතුය.	කමිටුව විසින් අතුරු සහ වසරාවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කරයි. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන අතර ඔහුගේ නියෝජිතයෙකු විගණන කමිටුවට ඉදිරිපත් වෙයි. සමාලෝචනයට පාත්‍ර වූ වසර තුලදී කළමනාකරණ පුද්ගලයන්ගේ සහභාගීත්වයෙන් තොරව කිසිඳු කරුණක් සාකච්ඡා කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් නොවුණි.
	(ඒ) බාහිර විගණකවරයාගේ කළමනාකරණ ලිපිය සහ එයට යවන ලද කළමනාකරණයේ පිළිතුරු, කමිටුව විසින් සමාලෝචනය කළයුතුය.	අනුගමනය කරන ලදී. ඒ ආකාරයෙන් පසුවිපරමක් සිදුවේ.
	(ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය සම්බන්ධයෙන් කමිටුව පහත සඳහන් ක්‍රියාමාර්ග ගතයුතුය.	
	(i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කටයුතු සහ සම්පත් ප්‍රමාණවත් ද යන්න සමාලෝචනය කිරීම සහ එහි කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් බලතල තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත්වීම.	අනුගමනය කරන ලදී.
	(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අදාළ අවස්ථාවන්හි දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සහතික වීම.	අනුගමනය කරන ලදී.
	(iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ සේවකයන්ගේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය කිරීම.	අනුගමනය කරන ලදී. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහ අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියා පිළිවෙල සහ ප්‍රතිඵල වල කාර්යසාධනය ඇගයීම විගණන කමිටුව මඟින් සිදු කරයි. ජ්‍යෙෂ්ඨ සේවකයින්ගේ කාර්යසාධනය ඇගයීම ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත ඇගයීමේ ක්‍රියාවලියකට අනුව සිදු කරනු ලබන අතර එය විගණන කමිටුවට ඉදිරිපත් කරයි.
	(iv) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, ජ්‍යෙෂ්ඨ සේවකයන් සහ බාහිරින් ලබාගන්නා සේවාදායකයින් පත්කිරීම හෝ සේවය හමාර කිරීම සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කිරීම.	අනුගමනය කරන ලදී. 2013 දෙසැම්බර් 02 වෙනි දින සිට නව අභ්‍යන්තර විගණකවරයෙක් ප්‍රධාන අභ්‍යන්තර විගණක (CIA) යටතේ පත් කර ඇත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(v) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සේවකයන්ගේ සහ බාහිර සේවා සපයන්නන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුවට තොරතුරු ඉදිරිපත් වන බවට සහ ඔවුනට සිය ඉල්ලා අස්වීමට හේතු පැහැදිලි කිරීමට අවස්ථාවක් දී ඇති බවට සහතික වීම.	අනුගමනය කරන ලදී.
	(vi) අභ්‍යන්තර විගණනය, එහි විගණනයට භාජනය වන කටයුතු වලින් ස්වාධීනව පවතින බව සහ එය නිපුණතාවයෙන් සහ නිසි සැළකිල්ලෙන් යුක්තව කරගෙන යන බව සහතික කිරීම.	අනුගමනය කරන ලදී. බැංකුවේ සංවිධාන ආකෘතියට අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක, විගණන කමිටුව හරහා මණ්ඩලයට සෘජුවම වාර්තා කරන අතර බැංකුවේ මෙහෙයුම් වලින් ස්වාධීන වේ.
	(ඔ) අභ්‍යන්තර පරීක්ෂණ වල ප්‍රධාන සොයාගැනීම් සහ ඒවාට ලබාදුන් කළමනාකරණ ප්‍රතිචාරයන් කමිටු විසින් සලකා බැලිය යුතුය.	අනුගමනය කරන ලදී.
	(ඕ) ප්‍රධාන මූල්‍ය නිළධාරියා, ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයන් හට සාමාන්‍යයෙන් රැස්වීම් වලට සහභාගිවිය හැකිය. කමිටුවේ ආරාධනය මත අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ටද රැස්වීම් වලට සහභාගි විය හැක. කෙසේ වුවද විධායක අධ්‍යක්ෂවරුන්, නොමැතිව අඩුම ගණනේ වර්ෂයකට දෙවරක්වත් බාහිර විගණකයින් සමඟ රැස්වීම් පැවැත්වීමට කමිටුව වගබලා ගතයුතුය.	අනුගමනය කරන ලදී. සියළුම කමිටු රැස්වීම් ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මහා කළමනාකරු සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පවත්වයි. විගණකාධිපතිට සහය පිණිස අර්න්ස්ට් ඇන්ඩ් යංග් ආයතනය පත් කිරීමෙන් පසු එහි නියෝජිතයන් ද රැස්වීම් වලට සහභාගි වූහ. මීට අමතරව,ප්‍රධාන ණය නිළධාරිතුමාටද සියළුම විගණන කමිටු රැස්වීම් වලට ආරාධනා කෙරේ. බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂවරුන් කිසිවෙක් නැත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ක) කමිටුවට පහත බලතල තිබිය යුතුය.	
	(i) එහි විෂය පථයට අයත් වන කරුණක් විමර්ශනය කිරීම සඳහා ප්‍රකාශිත අධිකාරිය;	අනුගමනය කරන ලදී.
	(ii) එය කිරීම සඳහා අවශ්‍ය සම්පත්	
	(iii) තොරතුරු ලබාගැනීමේ පූර්ණ හැකියාව සහ	
	(iv) අවශ්‍යනම් බාහිර වෘත්තීය උපදෙස් ලබාගැනීමට සහ අදාළ පළපුරුද්ද ඇති බාහිර පුද්ගලයන්ට රැස්වීම්වලට ඇරයුම් කිරීම සඳහා අධිකාරය.	
	(ග) සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳව කල් ඇතිව දැනුම්දී කමිටුව නිතිපතා රැස්විය යුතු අතර, එහි බලතල සහ වගකීම් ඉටු කිරීමේදී එළඹෙන නිගමනයන් වාර්තාගත කළයුතු ය.	අනුගමනය කරන ලදී. සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳව කල් ඇතිව දැනුම් දී කමිටුව නිතිපතා රැස් විය. සලකා බලනු ලබන වසර තුළදී කමිටුව 8 වතාවක් රැස් විය. මෙම කමිටු රැස්වීම්වල වාර්තා සකස්කර පවත්වාගෙන යයි.
	(ඝ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්,	අනුගමනය කරන ලදී. කමිටුවේ කටයුතු, පිටු අංක 189 සිට 141 දක්වා විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත.
	(i) විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර	
	(ii) වසර තුළදී පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ	2013 වසර තුළදී කමිටුව 8 වරක් රැස්වී ඇති අතර පැමිණීමේ විස්තර පිටු අංක 149 හි දක්වා ඇත.
	(iii) ඒ ඒ අධ්‍යක්ෂවරයා රැස්වීම්වලට පැමිණි වාර ගණන යනාදිය පිළිබඳ විස්තර අනාවරණය කළයුතුය.	
	(ඞ) නියම පරිදි පත්කරනා ලද කමිටුවේ ලේකම්වරයා විසින් එහි රැස්වීම්වල විස්තරාත්මක වාර්තා පවත්වා ගතයුතුය. (ලේකම්වරයා වශයෙන් සමාගම් ලේකම්වරයා හෝ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා පත්කර ගත හැකිය.)	අනුගමනය කරන ලදී. කමිටුවේ ද ලේකම්වරයා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ලංකා බැංකුවේ ලේකම් විසින් වාර්තා පවත්වා ගනී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඩ) මූල්‍ය වාර්තා කිරීම, අභ්‍යන්තර පාලන ක්‍රම හෝ වෙනත් විෂයයන් සම්බන්ධයෙන් විය හැකි අයථා ක්‍රියාවන් පිළිබඳව බැංකුවේ සේවකයන්ට රහස්‍යභාවයෙන් යුතුව ප්‍රශ්න නැඟීම සඳහා සලකා ඇති පහසුකම් පිළිබඳව කමිටුව විසින් සමාලෝචනය කළයුතු ය. ඒ අනුව, එවැනි කරුණු පිළිබඳව සාධාරණ හා නිදහස් පරීක්ෂණ කිරීම සඳහාත්, ඒ සඳහා අවශ්‍ය පසු විපරම් කටයුතු කිරීම සඳහාත් සහ බාහිර විගණන සමඟ බැංකුවේ ඇති සම්බන්ධය නිරීක්ෂණය කිරීමේ ප්‍රධාන නියෝජිත මණ්ඩලය ලෙස ක්‍රියාකිරීම සඳහාත් අවශ්‍ය කටයුතු සම්පාදනය වී තිබෙන බවට කමිටුව විසින් සහතික කළයුතු ය.	අනුගමනය කරන ලදී. මෙම කරුණු ආවරණය වන පරිදි විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන අතර සුදුසු පසු විපරම් කටයුතු සඳහා වැදගත් සොයා ගැනීම් විගණන කමිටුවට වාර්තා කරනු ලබයි.
3(6)(iii)	**මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව** සම්බන්ධයෙන් පහත සඳහන් ඊති අදාළ වේ.	මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයන්/ලේඛන මත පදනම්ව අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය වන අතර එම චක්‍රලේඛයන් මත පදනම්ව බැංකුව විසින් පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවයි.
	(අ) බැංකුව අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයන්ගේ පාරිශ්‍රමික (වැටුප් දිමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) ප්‍රතිපත්තිය කමිටුව විසින් තීරණය කළයුතු ය.	මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාළ පාරිශ්‍රමික පිළිබඳව කමිටුව විසින් නිර්දේශ සකස් කරන අතර එම නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අවසානයේ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගනී.
	(ආ) බැංකුවේ අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයන්ට අදාළ අරමුණු සහ ඉලක්ක ලබාදීම කමිටුව විසින් කළයුතු ය.	සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන නිසා ඔවුන් වෙනුවෙන් ඉලක්ක ස්ථාපිත කර නොමැත. ප්‍රධාන කළමනාකරණ පිරිස වෙනුවෙන් අරමුණු හා පරමාර්ථ ආයතනික සැලැස්ම මත පදනම්ව පිළියෙල කර ඇත. ප්‍රධාන කළමනාකරණ පිරිස හරහා ආයතනික සැලැස්ම ක්‍රියාවට නැංවීම ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම වේ. ඔවුන්ගේ කාර්යසාධනය සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ. ප්‍රධාන විධායක නිලධාරියාගේ ද කාර්යසාධනය ඇගයීම සඳහා වෙනමම ක්‍රියාවලියක් වාර්ෂික පදනම මත සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සිදු කරයි.
	(ඇ) බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයන්ගේ කාර්යසාධනය දෙන ලද අරමුණු සහ ඉලක්ක සමඟ කලින් කලට අඟයා ඔවුන්ගේ පාරිශ්‍රමික ප්‍රතිලාභ සහ කාර්යසාධනය මත ලබාදෙන අනෙකුත් ගෙවීම් සංශෝධනය කරන පදනම නිශ්චය කළයුතු ය.	මෙම උප කමිටුව හරහා කාර්යසාධනය සමාලෝචනය කිරීමට විධිවිධාන යොදා ඇත.
	(ඈ) ප්‍රධාන විධායක නිළධාරියාට අදාළ කරුණු සාකච්ඡා කරනු ලබන විට හැර, ප්‍රධාන විධායක නිළධාරියා කමිටුවේ සියළුම රැස්වීම් සඳහා සහභාගි විය යුතු ය.	අනුගමනය කරන ලදී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(6)(iv)	**නාම යෝජනා කමිටුව** සම්බන්ධයෙන් පහත සඳහන් රීති අදාළ වේ.	බැංකුව විසින් නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවක් ස්ථාපිත කර ඇත. මෙම විධිවිධානයේ දක්වා ඇති නාමයෝජනා කමිටුවේ කාර්යයන්ට අමතරව මෙම කමිටුවේ නිර්දේශයන් යටතේ අන්තර්ගත වන පිළිගන්නා ලද අදාළ ආයතනික යහපාලන ප්‍රතිපත්තීන්ට අයත් අනෙකුත් කාර්යයන් ද වේ.
	(අ) නවක අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස තෝරාගැනීමේ හා පත්කර ගැනීමේ ක්‍රමවේදයක් කමිටුව විසින් ක්‍රියාත්මක කළයුතු ය.	මුදල් අමාත්‍යාංශය මඟින් අධ්‍යක්ෂවරුන් පත් කරන අතර කමිටුව විසින් මේ සම්බන්ධයෙන් කටයුතු නොකරයි. ප්‍රධාන කළමනාකරණ පිරිස ඇතුළුව ලංකා බැංකුවේ කාර්ය මණ්ඩලය තේරීම/ පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ක්‍රමවේදයක්/ යෝජනාවලියක් පවතී.
	(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම් ඉටුකිරීමේදි ඒ ඒ අධ්‍යක්ෂවරයා දක්වන ලද කාර්යසාධනය සහ දායකත්වය සැලකිල්ලට ගෙන දැනට සිටින අධ්‍යක්ෂවරුන් නැවත පත්කිරීමට (හෝ පත් නොකිරීමට) සලකා බැලීම හා නිර්දේශ කිරීම කමිටුව විසින් කළයුතු ය.	මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන බැවින් මෙය අදාළ නොවේ.
	(ඇ) ප්‍රධාන විධායක නිලධාරී තනතුර සහ ප්‍රධාන කළමනාකරණ තනතුරුවලට තෝරා ගැනීමේදි හෝ උසස් කිරීමේදි සලකා බලන සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන අවශ්‍යතා කමිටුව විසින් තීරණය කළයුතු ය.	1938 අංක 53 දරණ ලංකා බැංකු පනතට අනුව, මුදල් ඇමතිගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ බැංකුව විසින් පිළිගත් ක්‍රමවේදයක් අනුව මහා කළමනාකරුව පත් කිරීම සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත උසස්වීම් යෝජනාවලීන් මඟින් ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා සලකා බලන සුදුසුකම් දක්වයි.
	(ඈ) 3(3) වැනි රීතියේ සහ අදාළ නීතියේ දක්වා ඇති නිර්ණායක අනුව ප්‍රධාන විධායක නිළධාරියා සහ ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස වම තනතුරු සඳහා සුදුසු සහ යෝග්‍ය පුද්ගලයන් බවට කමිටුව සහතික විය යුතුය.	තවද මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් දැනට භාවිතයේ පවතින මිනුම්දඩු සමාලෝචනය කරන ලදී. අනුගමනය කරන ලදී.
	(ඉ) අතිරේක නව විශේෂඥ දැනුම ලබා ගැනීමේ අවශ්‍යතාවයන් සහ අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයන්ගේ විශ්‍රාම යාම තුළින් ඇති වූ පුරප්පාඩු පිරවීම සඳහා වන අනුප්‍රාප්තික සැලසුම් යනාදිය කමිටුව විසින් කලින්කලට සලකා බලා අවශ්‍ය නිර්දේශ කළයුතු වේ.	අධ්‍යක්ෂවරුන් පත් කිරීම මුදල් අමාත්‍යවරයා විසින් සිදු කරයි. මහා කළමනාකරුට සහ ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාළව අනුප්‍රාප්තික සැලැස්මක් ඇත.
	(ඊ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපති විය යුතු අතර, කමිටුවේ බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වීම මැනවි. ආරාධනයෙන් ප්‍රධාන විධායක නිළධාරියාට රැස්වීම්වලට සහභාගි විය හැකිය.	අනුගමනය කරන ලදී. මේ සම්බන්ධ විස්තර සඳහා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 194 සිට 195 දක්වා ඇති කමිටුව පිළිබඳ වාර්තාව පරිශීලනය කරන්න.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(6)(v)	**ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට** පහත සඳහන් නීති අදාළ වේ.	මෙහි දක්වා ඇති පරිදි මෙම කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් ද, මහා කළමනාකරුගෙන් ද, මෙම විධානයේ දක්වා ඇති පරිදි පුළුල් අවදානම් ක්ෂේත්‍ර පාලනය කරන ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් ද සමන්විත වේ. කමිටුවේ ආරාධනය පරිදි ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සියළුම කමිටු රැස්වීම් සඳහා සහභාගි විය. අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අනෙකුත් සේවකයන් ද කමිටුවට ඔවුන්ගේ සහභාගීත්වය අවශ්‍ය වූ විටදි රැස්වීම් වලට සහභාගී වීමට ආරාධනා ලබයි.
	(අ) ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් අධීක්ෂණය කරන ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයන්ගෙන් ද ප්‍රධාන විධායක නිළධාරියාගෙන් ද සහ අඩුම තරමේ විධායක නොවන අධ්‍යක්ෂවරු තුන් දෙනෙකුගෙන් ද මෙම කමිටුව සමන්විත විය යුතු ය. ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයන් සමඟ සමීපව කටයුතු කරමින් පවරා දෙන බලතල සහ වගකීම් සීමාව තුළ සිටිමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගැනීම කමිටුව විසින් සිදු කළයුතු ය.	
	(ආ) සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු ආශ්‍රයෙන් බැංකුවට බලපාන සියළුම අවදානම් වනම්, ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම් පිළිබඳව, මාසික තක්සේරුවක් කමිටුව විසින් සිදු කළයුතු ය. බැංකුව සතුව පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් පවතින විට අවදානම් ඇස්තමේන්තුව සහ කළමනාකරණය බැංකුව වශයෙන් හා සමූහය වශයෙන් යන දෙආකාරයටම කළයුතු ය.	ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය මඟින් බැංකුවේ ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, උපාය මාර්ගික සහ කීර්තිනාම අවදානම් පිළිබඳව, මාසික තක්සේරුවක් සිදු කරන අතර සාරාංශගත කරන ලද වාර්තා ත්‍රෛමාසිකව කමිටුව වෙත හා ඊට පසුව එළඹෙන ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරයි. පරිපාලිත හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් වන අවදානම් වලට මුහුණ දීම සඳහා අවදානම් කළමනාකරණ පුවරුවක් නිර්මානය කර ක්‍රියාවෙහි යොදවා ඇත.
	(ඇ) කමිටුව විසින් දක්වන ලද ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා තුළ තිබෙන පරිදි අවදානම් කළමනාකරණය කිරීම සහ විශේෂිත අවදානම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස, ණය කමිටුව සහ වත්කම් වගකීම් කමිටුව යනාදී කළමනාකාරිත්ව කමිටුවල ප්‍රමාණාත්මකභාවය සහ ප්‍රතිඵලදායක බව කමිටුව විසින් සමාලෝචනය කළයුතුය.	කමිටුව විසින් දක්වන ලද ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඉක්මවා ගිය අවදානම් පිළිබඳව කමිටුවට වාර්තා කෙරේ.
	(ඈ) බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතාවයන්ට අනුව තීරණය කළ විවේකණ මට්ටම්වලට වඩා ඉහළ මට්ටමක යම් අවදානමක් ඇත්නම් කමිටුව එය නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග නොවලහා ගතයුතු ය.	සීමාවන් ඉක්මවා ගිය, විශේෂිත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් පිළිබඳව ප්‍රධාන අවදානම් නිළධාරී අධීක්ෂණය කළ අතර ඒවායේ ප්‍රබලතාවය මත පදනම්ව සෘජුවම කමිටුවට වාර්තා කරන ලදී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඉ) කමිටුව අඩුම ගණනේ ත්‍රෛමාසිකව රැස්වී යාවත්කාලීන ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ද ඇතුළත්ව අවදානම් කළමනාකරණයේ සියළු පැතිකඩ ඇගැයීම කළයුතු ය.	අනුගමනය කරන ලදී. වර්ෂය තුළදී කමිටු රැස්වීම් 5ක් පැවැත්වුණි. රැස්වීම් සහ පැමිණීම පිළිබඳ විස්තර පිටු අංක 149 හි දක්වා ඇත.
	(ඊ) විශේෂිත අවදානම් හඳුනාගැනීමට හා කමිටුව විසින් හා/හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශිත නිවැරදි කිරීමේ ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වූ නිලධාරීන් සම්බන්ධයෙන් කමිටුව සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු ය.	අභ්‍යන්තර විගණන හා මානව සම්පත් සඳහා වන විධිමත් ලෙස ලේඛණගත කරන ලද විනය නීති පටිපාටියක් බැංකුව සතුව පවතී.
	(උ) රැස්වීමක් පවත්වා සතියක් ඇතුළත කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැනගැනීම, අනුමැතිය සහ/ හෝ උපදෙස් සඳහා අවදානම් ඇස්තමේන්තු වාර්තාවක් මණ්ඩලයට සැපයිය යුතු ය.	කමිටු රැස්වීම්වල වාර්තා අවදානම් කළමනාකරණ වාර්තා සහ නිර්දේශයන් සමඟ ඊට පසුව එලඹෙන ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරයි.
	(ඌ) සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍රවලට අදාළ නීති, නියාමනයන්, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන ක්‍රම සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාවය ඇගැයීම සඳහා කමිටුව විසින් අනුකූලතා යාන්ත්‍රණයක් පිහිටුවිය යුතු ය.	සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍ර වලට අදාළ නීති, නියාමනයන්, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන ක්‍රම සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාවය ඇගයීම සඳහා බැංකුව විසින් වෙනමම අනුකූලතා ඒකකයක් ස්ථාපිත කර ඇත. අනුකූලතා නිලධාරී (වර්තමානයේ ඔහු ප්‍රධාන කළමනාකරණ නිළධාරියෙකු ලෙස නම් කර ඇත) විසින් කාර්තුමය ලෙස අනුකූලතා වාර්තා කමිටුවට ඉදිරිපත් කරයි. බැංකුවේ සියළුම ව්‍යාපාරික මෙහෙයුම් වල ක්‍රියාත්මක වන නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන ක්‍රම සහ අනුමත ප්‍රතිපත්ති ඇගයීම සඳහා අනුකූලතා කාර්යය විසින් තවදුරටත් කටයුතු සම්පාදනය කර ඇත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(7) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු		
3(7)(i)	මෙම විධානයේ අරමුණු සඳහා, සම්බන්ධිත පාර්ශවයන් , වශයෙන් සැලකිය යුතු පහත දැක්වෙන කාණ්ඩයට ඇතුළත් පුද්ගලයන් සමඟ විශේෂයෙන් ද, පොදුවේ ඕනෑම පුද්ගලයකු සමඟ බැංකුව කරනු ලබන ගනුදෙනුවකින් අරමුණු අතර ගැටීම් ඇතිවීම වැළැක්වීම සඳහා මණ්ඩලය විසින් පියවර ගතයුතුය. (අ) බැංකුවේ ඕනෑම පරිපාලිත සමාගමක්, (ආ) බැංකුවේ ඕනෑම ආශ්‍රිත සමාගමක්, (ඇ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකු, (ඈ) බැංකුවේ ඕනෑම ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකු, (ඉ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකුගේ ළඟම ඥාතියෙකු, (ඊ) බැංකුවේ සැලකිය යුතු කොටස් හිමිකාරිත්වයක් දරන කොටස්කරුවෙකු, (උ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකුගේ හෝ බැංකු අධ්‍යක්ෂවරයෙකුගේ ළඟම ඥාතියෙකුගේ හෝ ඕනෑම සැලකිය යුතු කොටස් හිමිකාරිත්වයක් ඇති කොටස්කරුවෙකුගේ සැලකිය යුතු සම්බන්ධයක් ඇති ව්‍යවසායක්.	සම්බන්ධිත පාර්ශවයන්, ඔවුන් සමඟ සිදු කෙරෙන ගනුදෙනු සහ වඩා වාසිදායක සැලකිල්ලක් ලබාදීම වැලැක්වීම යනාදි කරුණු ආවරණය වන පරිදි සකස් කරන ලද සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ වූ ප්‍රතිපත්ති ප්‍රකාශයක් යොදා ගනී. මෙම ගනුදෙනු ස්වයංක්‍රීය පද්ධතියක් භාවිතා කරමින් අධීක්ෂණය කරයි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල නිරතවෙමින් සම්බන්ධිත පාර්ශව සමඟ සිදුකළ ගනුදෙනු පිටු අංක 332 සිට මෙම වාර්ෂික වාර්තාවේ සටහන් අංක 55 වන "සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය" යටතේ දක්වා ඇත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(7)(ii)	මෙම විධානය මඟින් ආවරණය වන සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනුවලට පහත දේ ඇතුළත් විය යුතු ය. (අ) උපරිම ණය පහසුකම් ප්‍රමාණය පිළිබඳ මුදල් මණ්ඩලය විසින් නිකුත් කර ඇති විධානයේ අර්ථ දැක්වා ඇති පරිදි ඕනෑම වර්ගයේ ණය පහසුකමක් සැපයීම, (ආ) තැන්පතු, මුදල් ණයට ගැනීම් හෝ ආයෝජන වශයෙන් ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම, (ඇ) බැංකුවට ලබාදුන් හෝ බැංකුවෙන් ලබාගත් මූල්‍ය හෝ මූල්‍ය නොවන ආකාරයේ ඕනෑම සේවාවක්, (ඈ) සම්බන්ධිත පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාදීමට සමත් බැංකුවට අයත්, රහසිගත හෝ සංවේදී තොරතුරු වාර්තා කිරීමේ මාර්ග සහ තොරතුරු ගලායාම් බැංකුව සහ ඕනෑම සම්බන්ධ පාර්ශවයක් අතර ඇති කර ගැනීම හෝ පවත්වා ගැනීම,	අනුගමනය කරන ලදී. මේ සම්බන්ධ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ සටහන් අංක 49 වන "සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය" යටතේ දක්වා ඇත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(7)(iii)	සමාන ආකාරයේ ව්‍යාපාරයක යෙදී සිටින බැංකුවේ ගනුදෙනුකරුවකුට ලබාදෙන සැලකිල්ලට, වඩා වාසිදායක සැලකිල්ලක් ලබාදෙන ඉහත 3(7)(i) විධානයේ අර්ථ දක්වා ඇති ගනුදෙනු සම්බන්ධිත පාර්ශවයන් සමඟ බැංකුව නොයෙදෙන බව සහතික කිරීමට මණ්ඩලය වගබලා ගතයුතු ය. මෙහිදී, වඩා වාසිදායක සැලකිල්ල යන්නෙන් අදහස් විය යුත්තේ හා ඇතුළත් විය යුත්තේ පහත සඳහන් දේය. (අ) මණ්ඩලය මඟින් තීරණය කළ බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් යම් ප්‍රතිශතයක් ඉක්මවා සම්බන්ධ පාර්ශවයන්ට මුළු ශුද්ධ ණය පහසුකම් ප්‍රදානය කිරීම. මෙම අනුවිධානය සඳහා (i) පහසුකම් යන්නෙන් අදහස් විය යුත්තේ 2007 අංක 7 දරණ උපරිම පහසුකම් ප්‍රමාණය පිළිබඳ බැංකු පනත් විධානයන්ගේ අර්ථ දක්වා ඇති පහසුකම්ය. (ii) ශුද්ධ මුළු පහසුකම් ගණනය කළයුත්තේ, මුළු පහසුකම් වලින්, මුදල් සුරැකුම්, බැංකුවේ කොටස් ප්‍රාග්ධනයේ අදාළ සම්බන්ධිත පාර්ශවය කර ඇති ආයෝජනයන් සහ අවුරුදු 5 ක් හෝ ඊට වැඩි පරිණත කාලයක් සහිත බැංකුවේ ණය උපකරණවල අදාළ සම්බන්ධිත පාර්ශවයන් කර ඇති ආයෝජනයන් අඩු කිරීමෙනි. (ආ) සම්බන්ධ නොවන වෙනත් පාර්ශවයක් සමඟ සංසන්දනය කළ හැකි සමාන ගනුදෙනුවකදී බැංකුවේ හොඳම ණය පොළී අනුපාතිකයට වඩා අඩු පොළී අනුපාතිකයක් අය කිරීම හෝ තැන්පතු සඳහා ඉහළ අනුපාතිකයක් ගෙවීම. (ඇ) සම්බන්ධිත නොවන පාර්ශව සමඟ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල යෙදෙන විට දෙන කොන්දේසිවලට වඩා වාසි සහගත කොන්දේසි, වෙළෙඳ අලාභ ආවරණය කිරීම සහ ගාස්තු/කොමිස් ආදිය අත්හැරීම ආදී වාසි සහගත සැලකිලි ලබාදීම. (ඈ) ඇගයීම් ක්‍රියාපාටියක් නොමැතිව සම්බන්ධිත පාර්ශවයන්ට සේවාවන් සැපයීම හෝ ඔවුන්ගෙන් සේවාවන් ලබාගැනීම. (ඉ) නිත්‍යානුකූල යුතුකම් සහ කාර්යයන් සඳහා අවශ්‍ය වන විට හැර, බැංකුවට අයිතිවිය හැකි, රහසිගත හෝ නැතහොත් සංවේදී තොරතුරු සම්බන්ධිත පාර්ශවයන්ට ගලායාමට ඉඩ ඇති වාර්තා කිරීමේ මාර්ග සහ තොරතුරු ගලායාමේ ක්‍රම පවත්වා ගැනීම.	අනුගමනය කරන ලදී. 3(7)(i) සඳහන් කර ඇති පරිදි සම්බන්ධිත පාර්ශව සමඟ ඇතිවන කිසියම් ගනුදෙනුවක් මඟින් අරමුණු අතර ගැටුම් ඇතිවීම වළක්වා ගැනීමට අවශ්‍ය පියවර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබේ . වාසිදායක සැලකීම් හඳුනා ගැනීම සම්බන්ධයෙන් පවතින අධීක්ෂණ ක්‍රියාවලිය වැඩි දියුණු කෙරේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(7)(iv)	ණය පහසුකම් ප්‍රදානය කිරීමේදී, ණය ලබාගන්නා අධ්‍යක්ෂවරයාගේ ජන්දය හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ 2/3 ක අනුමැතිය නොමැතිව අධ්‍යක්ෂවරයෙකුට හෝ සමීප ඥාතියෙකුට බැංකුව ණය ප්‍රදානය නොකළ යුතු ය. මෙම ණයමුදල් මණ්ඩලය වරින් වර තීරණය කරන සුරැකුම් මඟින් සුරක්ෂිත කළයුතු ය.	අනුගමනය කරන ලදී.
3(7)(v)	(අ) යම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ ළඟම ඥාතියෙකුට හෝ එම පුද්ගලයාගේ සැලකිය යුතු හිමිකමක් ඇති ව්‍යාපාරයකට බැංකුව විසින් මුදල් ණයට දීමක් කර ඇති විටක, එම පුද්ගලයා පසුකාලීනව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කළේ නම්, බැංකුව මුදල් මණ්ඩලය මඟින් එම කටයුත්ත සඳහා අනුමත කර ඇති සුරැකුම්, එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කළ දින සිට වසරක් ඇතුළත ලබාගැනීමට අවශ්‍ය පියවර ගතයුතුය. (ආ) ඉහත 3(7)(ii)(අ) විධානයේ සඳහන් ආකාරයට එවැනි සුරැකුම් සපයා නොමැති නම්, බැංකුව ලැබිය යුතු මුළු මුදල, අදාළ පොලිය ද සමඟ, එම ණය ප්‍රදානය කිරීමේදී නිශ්චය කළ කාලසීමාව හෝ එලෙස අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර මාස 18 ක් ගතවීම හෝ යන්නෙන් කලින් යෙදෙන දිනට, අයකර ගැනීමට බැංකුව විසින් පියවර ගතයුතු ය. (ඇ) මෙම අනුවිධානය සමඟ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම අධ්‍යක්ෂවරයෙකු, ඔහුගේ නිලය අත්හැර ගියා සේ සලකන අතර, ඒ බව බැංකුව මහජනතාවට හෙළිදරව් කළයුතු ය. බැංකුව ණය ප්‍රදානය කරන අවස්ථාවේදී අධ්‍යක්ෂවරයා බැංකුවේ සේවකයෙකු නම් සහ ණය ප්‍රදානය කර ඇත්තේ බැංකුවේ සියළුම සේවකයන්ට පොදු වූ යෝජනා ක්‍රමයකට නම් මෙම අනුවිධානය එවැනි අධ්‍යක්ෂවරයකුට අදාළ නොවේ.	2013 වසර තුළදී මෙවැනි තත්ත්වයක් උදා වී නොමැත. 3(7)(i) යටතේ දක්වා ඇති ස්වයංක්‍රීය පද්ධතිය මෙයට යොදා ගනියි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(7)(vi)	බැංකුවේ සේවකයින්ට පොදු වූ යෝජනා ක්‍රමයක් මත හෝ ඉහත සඳහන් 3(7)(iv) විධානයේ සඳහන් පරිදි මුදල් ණයට දීමේදි මුදල් මණ්ඩලය අනුමත කර ඇති සුරැකුම් මඟින් සුරක්ෂිත කර ඇති විට හැර, මුදල් ණයට දීමක් හෝ ගාස්තු සහ කොමිස් අතහැර පක්ෂග්‍රාහී වාසිදායක සැලකිල්ලක් ඕනෑම සේවකයෙකුට හෝ එවැනි සේවකයෙකුගේ ළඟම ඥාතියෙකුට හෝ සේවකයා හෝ ළඟම ඥාතියා සමඟ ප්‍රමාණවත් බැඳියාවක් ඇති ඕනෑම සම්බන්ධිත පාර්ශවයකට බැංකුව විසින් නොකළ යුතු ය.	සියළුම සේවකයින්ට පොදු වූ සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය හැර වෙනත් පක්ෂග්‍රාහී වාසිදායක සැලකිල්ලක් කිසිදු සේවකයෙකුට,පුද්ගලයෙකුගේ ළඟම ඥාතියෙකුට හෝ බැංකුව කෙරෙහි සැලකිය යුතු බැඳියාවක් ඇති ඕනෑම සම්බන්ධිත පාර්ශවයක් වෙනුවෙන් කර නොමැත. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛීය උපදෙස් නිකුත් කර ඇත.
3(7)(vii)	මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව, ඉහත සඳහන් විධානයන් 3(7)(iv) සහ 3(7)(iv) යටතේ ප්‍රදානය කළ කිසිම ණය මුදලක් හෝ එම ණය මුදලේ කොටසක් හෝ ඊට අදාළ පොලිය හෝ ප්‍රේෂණය කළ නොහැකි අතර, එවැනි අනුමැතියක් නොමැතිව කළ ඕනෑම ප්‍රේෂණය කිරීමක් අවලංගු සහ බල රහිත එකක් වන්නේය.	අනුගමනය කරන ලදී. 2013 වසර තුළදි මෙවැනි කිසිදු සිදුවීමක් සිදු වී නොමැත.
3(8) හෙළිදරව් කිරීම්		
3(8)(i)	(අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණ හා නියාමන ආයතනයන් විසින් නියම කරන ලද ආකෘතීන්ට සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ප්‍රසිද්ධ කිරීම කළ බවටත් (ආ) සම්පිණ්ඩිත ස්වරූපයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල එම ප්‍රකාශන ප්‍රසිද්ධ කරන බවටත් සහතික විය යුතු ය.	අනුගමනය කරන ලදී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(8)(ii)	පහත අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතු ය :	අනුගමනය කරන ලදී.
	(අ) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ විශේෂිත හෙළිදරව් කිරීම් ඇතුළත් නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව සඳහන් ප්‍රකාශයක්.	පිටු අංක 212 හි දක්වා ඇති "ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව" යටතේ විස්තර කර ඇත.
	(ආ) මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසවන්තභාවය පිළිබඳ සාධාරණ සහතිකයක් ලැබෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණය සැලසුම් කර ඇති බවත් අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන්ට අනුව බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත්, සහතික කරන්නාවූ බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුගමනය කරන ලදී. මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 221 සහ 222 දක්වා ඇති "අභ්‍යන්තර පාලනය පිළිබඳව වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව" යටතේ විස්තර කර ඇත.
	(ඇ) සහතික වීම් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිත SLSAE 3050 - අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා සඳහා බැංකු වලට ලබාදෙන සහතිකය යටතේ විගණකවරුන් විසින් නිකුත් කරනු ලබන සහතික වීමේ වාර්තාව	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් _ "සහතික වීම් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිත (SLSAE) 3050 - අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා සඳහා බැංකු වලට ලබාදෙන සහතිකය" යටතේ විගණකවරුන් විසින් නිකුත් කරනු ලබන සහතික වීමේ වාර්තාව ලබා ගෙන ඇත. මෙය, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 221 සහ 222 හි දක්වා ඇත.
	(ඈ) අධ්‍යක්ෂවරුන්ගේ නම්, යෝග්‍ය බව හා උචිතභාවය, බැංකුව සමඟ කර ඇති ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවන ලද ගාස්තු/පාරිශ්‍රමික ඇතුළත් අධ්‍යක්ෂවරුන්ගේ විස්තර.	අනුගමනය කරන ලදී. අධ්‍යක්ෂවරුන්ගේ විස්තර සඳහා පිටු අංක 42 සිට 45 දක්වාද, ගනුදෙනු හා ගාස්තු සඳහා සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය දක්වන පිටු අංක 332 සිට 339 දක්වා ද, අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තුවල නිශ්චිත අගය සඳහා පිටු අංක 255 ද පරිශීලනය කරන්න.
	(ඉ) 3(7)(iii) හි අර්ථ දක්වා ඇති සෑම වර්ගයකම සම්බන්ධිත පාර්ශවයන්ට ප්‍රදානය කළ මුළු ශුද්ධ පහසුකම් සෑම වර්ගයකම සම්බන්ධිත පාර්ශවයකම ප්‍රදානය කර ඇති ශුද්ධ මුළු පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස හෙළිදරව් කළයුතු ය.	අනුගමනය කරන ලදී. පිටු අංක 332 සිට 339 දක්වා පරිශීලනය කරන්න.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඊ) බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවූ මුළු පාරිශ්‍රමිකවල එකතුව සහ පාරිශ්‍රමික ගෙවීම්, ප්‍රදානය කළ ණය පහසුකම් සහ බැංකුවේ කර ඇති තැන්පතු හෝ ආයෝජන යනාදි පුළුල් කාණ්ඩයන් වශයෙන් බැංකුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සිදුකළ ගනුදෙනු.	අනුගමනය කරන ලදී. "සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය" යටතේ පිටු අංක 255 පරිශීලනය කරන්න.
	(ඌ) "ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පරිචය පිළිබඳ ප්‍රකාශය 4750" යටතේ නිකුත් කරන ලද විගණකයින්ගේ "අනාවරණය කරගත් කරුණු ඇතුළත් වාර්තා" වල අඩංගු කරුණු වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවෙහි අන්තර්ගත කොට බැංකු අධීක්ෂණය පිළිබඳ අධ්‍යක්ෂ වෙත තහවුරුවක් ලබාදීම සිදුකළ බවට සහතිකයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවෙහි ඉදිරිපත් කළ යුතුය.	අනුගමනය කරන ලදී. මෙම වාර්තාව අවසානයේ දක්වා ඇත. විගණකාධිපතිගේ නිර්දේශ ඇතොත් ඒවා 2014 වසරේදි සලකා බලනු ඇත.
	(එ) විචක්ෂණශීලී අවශ්‍යතා, නියාමන, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූල බවට සහ ප්‍රමාණාත්මක අනුකූල නොවීම් නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක්.	අනුගමනය කරන ලදී. කරුණාකර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 208 හි වාර්තාව පරිශීලනය කරන්න. බැංකුවට බලපාන විචක්ෂණශීලී අවශ්‍යතා, නියාමන, නීති සහ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් සැලකිය යුතු අනුකූල නොවීම් සිදු නොවුණි.
	(ඒ) මුදල් මණ්ඩලය විසින් මහජනයාට හෙළිදරව් කළයුතු බවට විධානය කර ඇත්නම්, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දි ඇති බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුපාඩු සම්බන්ධ නියාමන හා අධීක්ෂණ සැලකිල්ල යොමු වූ කරුණු සහ එවැනි සළකා බැලීම් නිවැරදි කිරීමට ගත් පියවරයන් ඇතුළත් වාර්තාවක්.	මෙවැනි තත්ත්වයන් ඇති නොවුණි.
3(9)	**සංක්‍රාන්තිමය සහ අනෙකුත් පොදු විධිවිධානයන්**	
3(9)(i)	අනුකූල වීම සඳහා විශේෂිත කාලයක් මෙම විධානයේ ලබාදි ඇති අවස්ථා හැර, මෙම විධානය සමඟ 2008 ජනවාරි 01 දින පටන් අනුකූල වීම ආරම්භ කළයුතු අතර, 2009 ජනවාරි 01 දින හෝ ඊට පෙර මෙම විධානය සමඟ සම්පූර්ණයෙන් අනුකූල විය යුතු ය.	අනුගමනය කරන ලදී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3(9)(ii)	විශේෂිත ව්‍යවස්ථා මඟින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත බැංකු, අදාළ ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට පටහැනි නොවන්නා වූ මෙම විධානයේ විධිවිධාන සමඟ අනුකූලවීම සඳහා පියවර ගැනීමේ කොන්දේසියට යටත්ව, එම අදාළ ව්‍යවස්ථාවන්හි විධිවිධානයන්ට අනුකූලව කටයුතු කරගෙන යාමට ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු කළයුතු ය.	ලංකා බැංකුව, එය පාලනය වන ව්‍යවස්ථාව, එනම් 1938 අංක 53 දරණ ලංකා බැංකු පනත සහ එහි සංශෝධනයන් වලට පටහැනි නොවන්නා වූ මෙම විධානයේ විධිවිධාන සමඟ අනුකූලව කටයුතු කරගෙන යාමට කළ හැකි සියළු කාර්යයන් සිදු කරයි. ලංකා බැංකුව, එය පාලනය වන ව්‍යවස්ථාවට අනුව කටයුතු කරගෙනයාමේදී මෙම විධානයේ කිසියම් විධිවිධානයකට අනුකූලතාවයක් නොදක්වයි නම් එය ඉහත දක්වන ලද අදාළ අංශයන් යටතේ නිශ්චිතව දක්වා ඇත.
3(9)(iii)	වාර්ෂික විගණනය කරන ලද මුල්‍ය වාර්තා සමඟ, මව් බැංකුවේ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවේ සාරාංශයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල පළ කල යුතු ය.	අදාළ නොවේ.
3(9)(iv)	එවැනි බැංකු සංස්ථාපිත රටේ නියාමනයන් හා නීතිවලට පටහැනි නොවනතාක් දුරට, ලංකාවේ ක්‍රියාත්මක වන විදේශීය බැංකුවල ශාඛාවලට මෙම විධානය බලපාන්නේය. විදේශීය බැංකුවක ශාඛාවක් විසින්, තම වාර්ෂික වාර්තාව සහ ලංකාවේ ශාඛාවේ ගිණුම් කටයුතු සමඟ තම මව් බැංකුවේ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව පළ කළයුතු වේ.	අදාළ නොවේ.
3(9)(v)	බැංකු පනතේ සඳහන් පරිදි අසනීප තත්ත්වයක් හෝ අයෝග්‍යතාවයක් වැනි කිසියම් හේතුවක් වේ නම් විධිවිධාන 3(2)(ii)(ආ), 3(3)(i)(අ) සහ 3(3)(ii)(අ) හි ව්‍යතිරේක ප්‍රයෝජනවත් නොවන බව මුදල් මණ්ඩලය සලකන අතර එවැනි විටක දී මුදල් මණ්ඩලය විසින් අදාළ පුද්ගලයන්ට දැනුම් දෙයි. පසුව මුදල් මණ්ඩලය විසින් නිදහස් කිරීම් ලබා දෙන කාලසීමාව අඩු කරනු ලැබේ.	අදාළ නොවේ.
3(9)(vi)	මෙම විධානයේ යම් ප්‍රතිපාදනයක් කිසියම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය (හෝ අභ්‍යන්තර නීතිරීති) සමඟ ගැටීමක් ඇති වන අවස්ථාවකදී, මෙම විධානයේ විධිවිධානයන් බලාත්මක වේ. නමුත් යම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය විසින් මීට වඩා දැඩි ප්‍රමිතීන් දක්වා ඇත්නම්, සාංගමික ව්‍යවස්ථාවලියේ ඇති එවැනි විධිවිධානයන් අනුගමනය කළහැකි වන්නේය.	අදාළ නොවේ.

ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය බද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳව මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම පිළිබඳව විස්තර පහත වේ.

විෂයය	හෙළිදරවිකිරීම	ප්‍රතිචාරය
සභාපති සහ මහා කළමනාකරු		
	සභාපති සහ මහා කළමනාකරු එකම තැනැත්තා වේනම්, සභාපති/ මහා කළමනාකරුගේ නම සහ පත්කරන ලද ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයා සහ මෙම තනතුරු දෙක ඒකාබද්ධ කිරීමේ තීරණය සාධාරණීකරණය කිරීමට හේතු.	සභාපති සහ මහා කළමනාකරු යන තනතුරු පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරයි.
මණ්ඩලයේ තුල්‍යතාවය		
	• ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු හඳුනාගත යුතුය.	
• ආචාරධර්ම සංග්‍රහයේ අදාළ සාධක පිළිබඳව සැලකීමකින් තොරව, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන වශයෙන් හඳුනාගෙන ඇත්නම්, එවැනි හඳුනා ගැනීමක් සඳහා බලපෑ සාධක අනාවරණය කළ යුතුය.	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා නිකුත් කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනත් විධානයෙහි ස්වාධීන අධ්‍යක්ෂවරුන් හඳුන්වා දී ඇත.	
නව අධ්‍යක්ෂකවරු පත් කිරීම්	නව අධ්‍යක්ෂකවරු පත්කළ විට පහත විස්තර අනාවරණය කළ යුතුය. • එම අධ්‍යක්ෂවරයා පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් • ඔහුගේ විශේෂඥතාවයේ ස්වභාවය හා අදාළවන ක්‍රියා ක්ෂේත්‍රයන් • අධ්‍යක්ෂ ධූරයන් සහ මාණ්ඩලීය උපකමිටුවල සාමාජිකත්වය හොබවන සමාගම්වල නම් සහ • එවැනි අධ්‍යක්ෂවරයෙකුට ස්වාධීනව කටයුතු කළ හැකිද යන බව.	අනුගමනය කරන ලදී.
අධ්‍යක්ෂ මණ්ඩලීය කාර්යසාධන ඇගයීම	කාර්යසාධන ඇගයීමේ කාර්යය සම්පූර්ණ කරන ලද්දේ කෙසේද යන්න අනාවරණය කළ යුතුය.	ප්‍රශ්නාවලියක් සම්පූර්ණ කිරීමෙන් සිදු කරන ස්වයං ඇගයීමකින් සහ ඉන්පසු එම ප්‍රශ්නාවලි සසඳා ක්‍රියාත්මක කළ යුතු අවසාන ප්‍රතිඵලය විග්‍රහ කෙරේ.

විෂයය	හෙළිදරවිකිරීම	ප්‍රතිචාරය
අධ්‍යක්ෂ මණ්ඩලය හා සම්බන්ධ අනාවරණයන්	එක් එක් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් පහත විස්තර අනාවරණය කළ යුතුය:	
	• නම, සුදුසුකම් සහ සංක්ෂිප්ත ජීවදත්ත	අනුගමනය කරන ලදී. කරුණාකර මෙම වාර්ෂික වාර්තාවේ පහත සඳහන් පිටු අංක පරිශීලනය කරන්න. පිටු අංක 42 සිට 45
	• අදාළ ක්‍රියාකාරී ක්ෂේත්‍ර පිළිබඳව ඔහුගේ/ඇයගේ ප්‍රවීනතාවයේ ස්වභාවය	පිටු අංක 42 සිට 45
	• ආසන්නතම පවුලේ සහ/හෝ සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරු සමඟ ප්‍රමාණාත්මක ව්‍යාපාර සම්බන්ධකම්	එවැනි සම්බන්ධතා නොමැති බව අධ්‍යක්ෂවරුන් විසින් සහතික කරන ලදී.
	• අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන ශ්‍රී ලංකාවේ අනෙකුත් ලැයිස්තුගත සමාගම්වල නම්	පිටු අංක 34 සිට 37
	• අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන අනෙකුත් සමාගම්වල හෝ සමූහ සමාගම්වල නම්	පිටු අංක 34 සිට 37
	• අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පැමිණි සංඛ්‍යාව/ප්‍රතිශතය	පිටු අංක 149
	• අධ්‍යක්ෂවරයා සාමාජිකයෙක් හෝ සභාපති වශයෙන් සේවය කරන ලද කමිටු වල නම් සහ	පිටු අංක 149
	• කමිටු රැස්වීම්වලට සහභාගී වූ සංඛ්‍යාව/ප්‍රතිශතය.	පිටු අංක 149
පාරිශ්‍රමික අනාවරණය කිරීම	අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත පාරිතෝෂිකය සහ පාරිශ්‍රමික ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශනයක්.	වර්ෂ 2013 සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමිකය වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 333 හි ඉදිරිපත් කර ඇත. පාරිශ්‍රමික ප්‍රතිපත්තිය පිළිබඳ තොරතුරු සඳහා පිටු අංක 192 පරිශීලනය කරන්න.
ප්‍රධාන ගනුදෙනු	සමාගම විසින් එළැඹ ඇති සියළුම ප්‍රධාන ගනුදෙනු පිළිබඳව අනාවරණය කළ යුතුය.	අනුගමනය කරන ලදී.
විගණන කමිටුව	• විගණන කමිටුවේ සාමාජිකයින්ගේ නම් අනාවරණය කළ යුතු වේ.	විගණන කමිටු සාමාජිකයින්ගේ නම් පිටු අංක 189 හි විගණන කමිටු වාර්තාවෙහි ඇතුළත් කර ඇත.
	• විගණකවරුන්ගේ ස්වාධීනත්වය තීරණය කිරීමේ පදනම.	ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව බැංකුවේ විගණක, විගණකාධිපතිවරයායි. විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් තහවුරු කර ඇත.

විෂයය	හෙළිදරව්කිරීම	ප්‍රතිචාරය
ව්‍යාපාර පරිචය සහ ආචාරධර්ම සංග්‍රහය	• සමාගමට ව්‍යාපාර පරිචය හා ආචාරධර්ම සංග්‍රහයක් ඇත්ද යන්න හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් මෙන්ම ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සඳහා ආචාරධර්ම පද්ධතියක් ඇත්ද යන්න අනාවරණය කළ යුතුය.	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ආචාරධර්ම සංග්‍රහයක් පවතී. බැංකුවේ සේවකයින් සඳහාද වෙනමම ආචාරධර්ම සංග්‍රහයක් සකස් කර ඇත.
	• ඔවුන් විසින් එවැනි ආචාරධර්මවලට එකඟව කටයුතු කළ බව තහවුරු කෙරෙන ප්‍රකාශයක් කළ යුතුය.	වාර්ෂිකව අනුකූලතා සහතිකයක් ලබාගනී.
	• සභාපතිවරයා ඔහු හෝ ඇය මෙම ඕනෑම ආචාරධර්මයකට පටහැනිව කටයුතු කළ බව නොදන්නා බව සහතික කළ යුතුය.	අනුගමනය කරන ලදී.
අඛණ්ඩභාවය	භාවිතාකරන ලද උපකල්පන මත සමාගමට අඛණ්ඩ පැවැත්මක් ඇත්ද යන්න හා අවශ්‍ය වේනම් ඒ සඳහා තත්වාගණනයක් කළ යුතු අතර, ඒවා වාර්තාකරණය කළ යුතු වේ.	අනුගමනය කරන ලදී.
පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයින්	පාරිශ්‍රමික කමිටු සාමාජිකයින්ගේ නම් පාරිශ්‍රමික කමිටු වාර්තාවේ හෙළිදරව් කළ යුතුය.	අනුගමනය කරන ලදී. පාරිශ්‍රමික කමිටු සාමාජිකයින්ගේ නම් මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 192 හි මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාවේ හෙළිදරව් කර ඇත.
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවට පහත සඳහන් දෑ සම්බන්ධව අධ්‍යක්ෂවරුන් විසින් කරන ප්‍රකාශනයන්ද ඇතුළත් කළ යුතු වේ: • සමාගම නීති හා රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නියුක්ත නොවූ බව • සියළුම ප්‍රමාණාත්මක ගනුදෙනු හා බැඳුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇල්ම අනාවරණය කර ඇති බව හා එවැනි ප්‍රමාණාත්මක ඇල්මක් සහිත ගනුදෙනු සම්බන්ධව ඡන්දය දිමේදී අදාළ අධ්‍යක්ෂවරු ඔවුන්ගේ ඡන්දය දිමෙන් වැළකී කටයුතු කළ බව • සෑම කොටස්කරුවාටම සමාන ආකාරයට සැළකීම සනාථ කෙරෙන ආකාරයට සියළුම ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බව • සභායාත්මක උපකල්පන මත ව්‍යාපාරය අඛණ්ඩව පවතින ව්‍යාපාරයක් බව හෝ අවශ්‍ය වන්නේනම් ඒ සඳහා තත්වාගණනයක් කිරීමත් සහ • ඔවුන් විසින් මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලනය සහ අවදානම් කළමනාකරණය සමන්විත වන අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කළ බව හා ඒවායේ ඵලදායීතාවය හා සාර්ථක ලෙස එකඟතාවයක් දක්වන ආකාරයට ක්‍රියාත්මක වන බව.	අනුගමනය කරන ලදී. බැංකුවේ ඇත්තේ එක් කොටස්කරුවෙකි. එනම් ශ්‍රී ලංකා රජයයි.

විෂයය	හෙළිදරවිකිරීම	ප්‍රතිචාරය
මූල්‍ය ප්‍රකාශන	• අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව තම වගකීම සම්බන්ධව වෙනම ප්‍රකාශයක් ඇතුළත් කළ යුතුය.	අනුගමනය කරන ලදී.
	• විගණකවරුන් විසින්ද ඔවුන්ගේ වාර්තාකරණ වගකීම පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.	පිටු අංක 224 පරිශීලනය කරන්න.
කළමනාකරණ වාර්තාව	අවම වශයෙන් පහත දෑ අඩංගු කර 'කළමනාකරණ සමාලෝචනය සහ විශ්ලේෂණ වාර්තාවක්' වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළ යුතුය: • කර්මාන්ත ව්‍යුහය හා සංවර්ධනයන් • අවස්ථාවන් හා තර්ජනයන් • අවදානම් සහ අවධානයන් • අභ්‍යන්තර පාලන ක්‍රමයන් සහ ඒවායේ ප්‍රමාණාත්මකභාවය • සමාගම විසින් අනුගමනය කරන ලද සමාජ සහ පරිසරාත්මක සුරැකීමේ ක්‍රියාකාරකම් • මූල්‍ය කාර්යසාධනය • මානව සම්පත් හා කර්මාන්ත සම්බන්ධකම් හි ප්‍රමාණාත්මක සංවර්ධනයන් සහ • අනාගතය සඳහා වන අපේක්ෂාවන්.	අනුගමනය කරන ලදී. මෙම වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇත.
ආයතනික යහපාලන වාර්තාව	සමාගම විසින් අදාළ සංග්‍රහයේ දක්වා ඇති මූලධර්ම හා ප්‍රතිපාදන සමඟ අනුකූලවන පරිදි කටයුතු කළ ආකාරය හා එලෙස කටයුතු කරන ලද පරාසය අනාවරණය කළ යුතුය.	මෙම ක්‍රියාවලිය මඟින් මෙයට අනුකූලතාවය දක්වයි.
විගණන කමිටු වාර්තාව	කමිටුව විසින් ඉටුකරන ලද කාර්යභාරය පිළිබඳ විස්තර අනාවරණය කළ යුතුය.	අනුගමනය කරන ලදී. කරුණාකර පිටු අංක 189 සිට 191 දක්වා පරිශීලනය කරන්න.

විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද සියළුම කරුණු ආයතනික යහපාලන වාර්තාවේ අන්තර්ගත කොට ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් සහතිකය

"ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පරිචය පිළිබඳ ප්‍රකාශය 4750" යටතේ විගණකාධිපති විසින් නිකුත් කරන ලද "අනාවරණය කරගත් කරුණු ඇතුළත් වාර්තාවේ" සඳහන් සියළුම කරුණු මෙම ආයතනික යහපාලන වාර්තාවේ අන්තර්ගත කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

මේ පිළිබඳ තහවුරුවක් විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ජානකී සේනානායක සිරිවර්ධන

ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කාර්යාලය

2014 මාර්තු 31
කොළඹ දීය.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු සාමාජිකත්වය

විගණන කමිටුව

සභාපති

ලලිත් විතාන මහතා - 19.06.2013 සිට අද දක්වා
ආර් එම් ඒ රත්නායක - 07.02.2013 සිට
(විකල්ප නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ) 18.06.2013 දක්වා
වී කනගසභාපති මහතා - 29.01.2013 දක්වා

සාමාජිකයන්

රාජු සිවරාමන් මහතා
කේ එල් හේවගේ මහතා - 06.06.2013 දක්වා
කේ එම් මහින්ද සිරිවර්ධන මහතා
(නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ) - 18.06.2013 සිට 28.01.2013 දක්වා
කේ එම් ඒ එන් දවුලගල මහත්මිය-
(නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ) - 06.02.2014 සිට අද දක්වා

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

සභාපති

ලලිත් විතාන මහතා - සභාපති 19.06.2013 සිට අද දක්වා
කේ එම් මහින්ද සිරිවර්ධන මහතා
(නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ) - 15.05.2013 සිට 18.06.2013 දක්වා
එස් ආර් ආටිගල මහතා
(නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ - 23.04.2013 දක්වා

සාමාජිකයන්

රාජු සිවරාමන් මහතා
කේ එම් මහින්ද සිරිවර්ධන මහතා
(නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ) - 19.06.2013 සිට 28.01.2014 දක්වා
කේ එම් ඒ එන් දවුලගල මහතා
(නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ) - 06.02.2014 සිට අද දක්වා

මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව

සභාපති

රාජු සිවරාමන් මහතා - 02.01.2014 සිට අද දක්වා
රසීක් සරූක් මහතා - 19.06.2013 සිට 2013 අග භාගය තෙක්
නලිනි ඩී අබේවර්ධන මෙනෙවිය - 18.06.2013 තෙක්

සාමාජිකයන්

චන්ද්‍රසිරි ද සිල්වා
කේ එල් හේවගේ මහතා - 06.06.2013 දක්වා
නලිනි ඩී අබේවර්ධන මෙනෙවිය - 19.06.2013 සිට අද දක්වා

නාමයෝජනා සහ ආයතනික පාලන කමිටුව

සභාපති

රාජු සිවරාමන් මහතා

සාමාජිකයන්

එස් ආර් ආටිගල මහතා
(නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ) - 23.04.2013 දක්වා
කේ එල් හේවගේ මහතා - 06.06.2013 දක්වා
ලලිත් විතාන මහතා - 19.06.2013 සිට අද දක්වා
චන්ද්‍රසිරි ද සිල්වා - 19.06.2013 සිට අද දක්වා

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වාර්තා

විගණන කමිටු වාර්තාව

කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුව, විගණන කමිටු ප්‍රඥප්තිය අනුව ක්‍රියාත්මක වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර එය නිරන්තරයෙන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කෙරේ.

අනෙකුත් කරුණු අතර, විගණන කමිටු ප්‍රඥප්තියෙන් පැහැදිලිව හඳුනාගෙන ඇති ප්‍රධාන කාර්යභාරය සහ වගකීම් වලට පහත කරුණු ඇතුළත් වේ.

- බැංකුවේ මූල්‍ය ප්‍රකාශ, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් ආදියේ විශ්වාසනීය බව අධීක්ෂණය කරනු පිණිස බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම.
- බැංකුවේ අභ්‍යන්තර විගණන කර්තව්‍යයේ ප්‍රමාණවත් බව හා සඵලතාව අධීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම සහ ඇගයීම.
- අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන කළමනාකරණ ලිපි හා තදනන්තර පසු විපරම් විගණන, ඒවා සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමඟින් සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව සහ සඵලතාව ඇගයීම.
- මූල්‍ය තත්ත්වය හෝ ව්‍යාපාරයට අදාළ කටයුතු සඳහා සැලකිය යුතු අන්දමින් බලපෑමට ඉඩ ඇති කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලැබීම සහතික කිරීම.
- කමිටු ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම සහ යෝග්‍ය නිර්දේශ සිදුකිරීම.

සංයුතිය හා ගණපූර්ණය

අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ.

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් අධ්‍යක්ෂවරුන් කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

සභාපති

ලලිත් විතාන මහතා	-	19.06.2013 සිට අද දක්වා
ආර් එම් ඒ රත්නායක මහතා	-	07.02.2013 සිට 18.06.2013
(විකල්ප නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ)		
වී කනගසභාපති මහතා	-	29.01.2013 දක්වා
(විකල්ප නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ)		

සාමාජිකයන්

රාජු සිවරාමන් මහතා		
කේ එල් හේවගේ මහතා	-	06.06.2013 දක්වා
කේ එම් මහින්ද සිරිවර්ධන මහතා	-	18.06.2013 සිට

වී කනගසභාපති මහතා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමෙන් අනතුරුව එනම් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් නික්ම යාමෙන් අනතුරුව ඔහු කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කිරීම අවසන් විය. 2013 පෙබරවාරි 07 වෙනි දින සිට නව විකල්ප නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ වන ආර් එම් ඒ රත්නායක මහතා කමිටුවේ සභාපති ලෙස පත් වූ අතර වරලත් ගණකාධිකාරී ලලිත් විතාන මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමත් සමඟ සභාපති වශයෙන් කටයුතු කිරීම අවසන් විය. කේ එම් ඒ නෙළුමනී දුවුලගල මහත්මිය බැංකුවේ නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ ලෙසද ඉන්පසු විගණන කමිටුවටද 06.02.2014 දින පත්වීමත් සමඟම කේ එම් එම් සිරිවර්ධන මහතා සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම අවසන් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳව නිකුත් කරනු ලැබූ 2007 අංක 11 දරන බැංකු පනත් නියමය ප්‍රකාරව විගණන කමිටුවේ සභාපති ස්වාධීන විය යුතු අතර ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් හා අත්දැකීම් ඇති අයෙකු විය යුතුය. අදාළ වර්ෂය තුළදී ලංකා බැංකුව වරලත් ගණකාධිකාරීවරයෙකු වන වී කනගසභාපති මහතා සහ අදාළ ක්ෂේත්‍රයන්හි අවශ්‍ය අත්දැකීම්වලින් සපිරි වූ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ප්‍රමුඛ පෙලේ සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ අයතනයේ අධි සාමාජිකයෙකුද වූ ආර්. එම්. ඒ. රත්නායක මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලබලයෙන් පත් අධ්‍යක්ෂවරුන්ට අනුක්‍රමිකව විකල්ප අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරනු ලැබීය. කනගසභාපති මහතා සහ රත්නායක මහතා බැංකුවේ එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජය නියෝජනය කරන බැවින් ඉහත නියමයෙහි ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු සඳහා දී ඇති නිර්වචනය අනුව ඔවුන් ස්වාධීන යැයි සැලකිය නොහැක. 1938 අංක 53 දරණ ලංකා බැංකු පනත සහ එහි සංශෝධන වලට අනුකූලව මුදල් අමාත්‍යවරයා විසින් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබන බැවින් බැංකුව ඉහත නිර්දේශය සිය යහපතට අනුකූල වන පරිදි අදාළ කර ගෙන ඇත. මෙම සැකසුම ශ්‍රී ලංකා මහා බැංකුව වෙත දැනුම් දී එහි අනුමැතිය ලබාගෙන තිබේ.

වර්තමානයේ බැංකු විගණන කමිටු මුලසුන දරන්නේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අදාළ ක්ෂේත්‍ර අත්දැකීම්වලින් යුත් වරලත් ගණකාධිකාරීවරයෙකු වන ලලිත් විතාන මහතාය.

සාමාජිකයන් විසින් දරා ඇති තනතුරු මඟින් ඔවුන් කමිටුවට ගෙන ආ පුළුල් පරාසයක අත්දැකීම් මෙම වාර්ෂික වාර්තාවේ 42 සිට 45 දක්වා පිටු වල පළකර ඇති අධ්‍යක්ෂවරුන්ගේ චරිතාපදාන විස්තර මඟින් දැකිය හැක.

කමිටුවේ ගණපූර්ණය සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

මහා කළමනාකරු, විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙක් (බැංකුවේ බාහිර විගණක), ප්‍රධාන අභ්‍යන්තර විගණක බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිළධාරිතුමා සහ ප්‍රධාන අවධානම් නිළධාරිතුමා රැස්වීම් සඳහා සහභාගි වේ. 2013 වර්ෂය සඳහා බැංකුව සහ එහි පරිපාලිත සමාගම් වල ඒකාබද්ධ මූල්‍ය වාර්තා වාර්ෂික විගණනය කිරීම සඳහා විගණකාධිපති විසින් බාහිර විගණකවරුන් වශයෙන් වරලත් ගණකාධිකාරීවරුන් වන

අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනය පත් කරන ලද අතර එහි නිලධාරීන්ද ඉහත රැස්වීම සඳහා සහභාගි විය.

කළමනාකාරිත්වයේ අනෙකුත් සාමාජිකයන් සහ බැංකුවේ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගිත්වය අවශ්‍ය යැයි කමිටුවට හැඟී ගියහොත් ඔවුන්ට රැස්වීම් සඳහා පැමිණෙන ලෙස ආරාධනය කෙරේ. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව 8 වරක් රැස්වන ලදී. රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පිළිබඳ විස්තර 149 වැනි පිටුවේ ඇති වගුවේ දක්වා තිබේ. මෙම සියළු රැස්වීම් සඳහා අදාළ විස්තර සමඟ නිසි දැනුම්දීම්/ සාකච්ඡා සඳහා සිහිකැඳවීම් ලබා දෙන ලදී.

සමාලෝචිත වර්ෂය තුළදී කමිටුව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණනය

බැංකුවේ අභ්‍යන්තර විගණනය ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් මෙහෙයවනු ලබන අභ්‍යන්තර විගණක දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ අතර එය විගණක කමිටුව මඟින් විගණන ප්‍රඥප්තිය අනුව නිරන්තරයෙන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කෙරේ.

- නිරන්තර වාර්තා මඟින් 2013 වසර සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සඵලතාව අධීක්ෂණය කරන ලදී. අවශ්‍ය අවස්ථාවන්හිදී සුදුසු පසුවිපරම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.
- අනාගතයේදී යළිත් සිදුවීම වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණ ඇතිව, අභ්‍යන්තර විගණනයේදී සොයාගත් වැදගත් කරුණු හා ඒවාට කළමනාකාරිත්වය දැක්වූ ප්‍රතිචාර සමාලෝචනය කරන ලද අතර අභ්‍යන්තර පාලන ක්‍රම සඵලදායක බව සහතික කරන ලදී.
- අභ්‍යන්තර පාලන ක්‍රම සහතික කිරීමේ ක්‍රියාවලියට සහය දැක්වීම සඳහා 2013 වසරේදී පාලන ක්‍රමවේදය වැඩි දියුණු කරන ලදී.
- භාණ්ඩාගාරික සොයාගැනීම් පිළිබඳව පැවැත්වූ පසුවිපරම් විගණනය සමාලෝචනය කිරීම.
- විමර්ශන වාර්තා සමාලෝචනය කරන ලද අතර අත්‍යවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම වඩා ශක්තිමත් කරන ලදී/හඳුන්වාදෙන ලදී.
- 2014 වසර සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණන සැලැස්ම අනුමත කරන ලදී.
- විගණන වාර්තා සමාලෝචන රැස්වීම්වල ප්‍රතිඵලයන් සමාලෝචනය කිරීම.

බාහිර විගණනය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලිය අනුව 2013 වසර සඳහා බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරන ලද අතර ඒ සඳහා අර්නස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරීන්ගේ සහයෝගය ලබා ගන්නා ලදී.

- අර්නස්ට් ඇන්ඩ් යංග් විසින් 2013 වර්ෂය සඳහා මූල්‍ය විගණන සැලැස්ම ඉදිරිපත් කරන ලද අතර වර්ෂය තුළ ගත යුතු ක්‍රියාමාර්ග සටහන් කරන ලදී.
- 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ ගිණුම් පිළිබඳව විගණකාධිපතිවරයා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව, කළමනාකාරිත්ව ලිපිය සහ ඒවා සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කරන ලද අතර විශේෂ අවධානය යොමු කළ ගැටළු නැවත සිදුවීම වැලැක්වීම සඳහා බැංකුව විසින් ගන්නා ලද ප්‍රතිකාරක ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම් සිදු කරන ලදී.
- 2011 වර්ෂයේ ගිණුම් පිළිබඳ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විගණකාධිපති වාර්තාවේ සාකච්ඡාවට භාජනය වූ ගැටළු සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවෙහි පවත්වන ලද රැස්වීමෙහි ප්‍රතිචාර සමාලෝචනය කරන ලදී.

තොරතුරු පද්ධති විගණනය

- පෙර සිදුකරන ලද සමාලෝචනයට අනුව තොරතුරු පද්ධතියන්හි කරනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- තොරතුරු පද්ධති විගණන අංශයට ප්‍රතිසම්පාදනය කිරීමට අවශ්‍ය විගණන උපකරන නිර්දේශ කිරීම.

නියාමක අධිකාරියෙහි පරීක්ෂණය

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරන ව්‍යවස්ථාපිත පරීක්ෂණ පිළිබඳව යොමුකරන ලද කාර්තුමය වාර්තා සමාලෝචනය කිරීම සහ නොවිසඳුන ගැටළු පසුවිපරම් කිරීම.

මූල්‍ය වාර්තාකරණය

- වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා අතුරු මූල්‍ය වාර්තා අදාළ ගිණුම්කරණ ප්‍රමිතයන්ට හා පාලන අධිකාරීන්ගේ නිර්දේශයන්ට අනුව පිළියෙල කොට ප්‍රකාශයට පත් කරන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වන ලදී.
- මෙම වසර නව ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිත) වලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබන දෙවන වසර වන අතර කමිටුව විසින් මෙම ප්‍රමිතියන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කිරීමද පසුවිපරම් කිරීම සහ විගණකයින් විසින් හඳුනාගත් අතුරු ගැටළු නිරාකරණය කිරීමද සිදු කරන ලදී. මෙම කර්තව්‍ය සඳහා සුදුසුකම්ලත් ගණකාධිකාරීවරුන් සහිත විශේෂ ඒකකයක් ප්‍රධාන මූල්‍ය නිලධාරිතුමා යටතේ ස්ථාපිත කරන ලදී.
- නව ගිණුම්කරණ ප්‍රමිත යටතේ බැංකුව තුළ ක්‍රියාත්මක විය යුතු පසුවිපරම් ක්‍රියාවලියේ අවශ්‍යතාවය සමාලෝචනය කරන ලදී.
- කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත් කරන මූල්‍ය ප්‍රකාශ පරීක්ෂා කරන ලදී.
- මාසික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.

ලංකා බැංකුවේ පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් අධීක්ෂණය සහ විගණනය

- සමූහයේ කාර්යසාධනය ශක්තිමත් කිරීමේ අරමුණින් කළමනාකරණ ප්‍රඥප්තිය අනුව පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල කාර්යසාධනය සාකච්ඡා කිරීම සඳහා එම සමාගම් සමඟ දැනුවත් කිරීමේ රැස්වීමක් පවත්වන ලදී.
- පරිපාලිත සමාගම් වල අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සඳහා සහය දැක්වීමේ අරමුණින් ස්ථාපිත කළ ප්‍රතිපත්තියට පදනම්ව ඇතැම් පරිපාලිත හා ආශ්‍රිත සමාගම්හි විගණන ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම නිර්දේශ කරන ලදී.
- සමූහයේ කාර්යසාධනය ශක්තිමත් කිරීමේ අරමුණින් පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල කාර්යසාධනය කාර්තුමය පදනම මත තක්සේරු කරන ලදී. එහිදි අවධානය යොමු කළ යුතු කරුණු සහ ඒවා නිවැරදි කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඉස්මතු කරන ලදී.

කාර්ය මණ්ඩල අවශ්‍යතා

- අභ්‍යන්තර විගණක ධූරය සඳහා බඳවා ගැනීම නිර්දේශ කරන ලදී.
- වෘත්තීය මට්ටම උසස් කිරීම සඳහා සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරුන් අභ්‍යන්තර විගණක සහ මූල්‍ය හා සැලසුම් යන දෙඅංශයට බඳවා ගැනීමට පහසුකම් සැලසීම.
- බැංකුවේ විගණක ක්‍රියාවලිය සමාලෝචනය කිරීමෙන් විගණක අංශයට සේවක මණ්ඩල අවශ්‍යතා සඳහා සහය දීම.

වෙනත් ක්‍රියාකාරකම්

- උනන්දුවක් දක්වන පාර්ශවයන් අතර පවතින ගැටුම් සහ සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය සඳහා පවතින ප්‍රතිපත්ති සමාලෝචනය/සංශෝධනය කරන ලදී.
- ඉස්ලාමීය බැංකුකරණ මෙහෙයුම හා අදාළ ගිණුම්කරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම.

කාර්ය සටහන් / අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

කමිටු රැස්වීම් වල කටයුතු පිළිබඳව ප්‍රමාණවත් කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පවත්වාගෙන යනු ලබයි. කමිටු රැස්වීම් වල සියළු කාර්ය සටහන් සභාගත කර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ස්ථිර කරන අතර එමඟින් කමිටු මඟින් සිදුකරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනේ. නොවිසඳුණු කරුණු සඳහා නිරන්තරයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගනු ලබයි.

පැමිණිලි සඳහා පටිපාටිය

සලකා බලන වර්ෂයේදී ගිණුම්කරණය, අභ්‍යන්තර පාලනය සහ විගණන කරුණු ආදිය පිළිබඳව බැංකුවට ලැබෙන පැමිණිලි භාරගැනීම, රඳවා ගැනීම හා ප්‍රතිකර්ම යෙදීමේ ක්‍රියා පටිපාටිය විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තියට අනුව සිදුකෙරේ.

සාරාංශය

විගණන කමිටුවේ සාමාජිකයින් විසින් විගණන කමිටුවේ කාර්යසාධනය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ඔහු යටතේ සිටිනා ජ්‍යෙෂ්ඨ සේවකයින් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ කාර්යයන් පිළිබඳව සාමුහික ඇගයීමක් සිදු කරන ලදී. බැංකුවේ අභ්‍යන්තර විගණන කර්තව්‍යය, එය විගණනය කරන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන බවටත්, එය අපක්ෂපාතී බව, ප්‍රවීණතාවය හා නිසි වෘත්තීය සැලකිල්ල දක්වමින් කටයුතු කළ බවටත් කමිටුවට නිසැකවම පැවසිය හැක. බැංකුවේ අභ්‍යන්තර පාලන කටයුතු වල ප්‍රමාණවත් බව විගණන කමිටුව නිරතුරුවම සමාලෝචනය කරන ලදී.

අධ්‍යක්ෂවරුන් විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳව කළ ප්‍රකාශය සහ ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 221 සිට 223 දක්වා පළ කර තිබේ. ඒ අනුව, බැංකුවේ වත්කම් ආරක්ෂා කරනු ලබන බවටත්, විගණනය කරන ලද ගිණුම් වලින් හෙළි වූ මූල්‍ය තත්ත්වය සහ ප්‍රතිඵල වාස්තවික අවප්‍රකාශයන්ගෙන් තොර බවටත්, සාධාරණ සහතිකයක් සැපයීමට අවශ්‍ය සංවරණ හා තුලන යොදවා ඇති බවටත් කමිටුවේ අදහස වේ.

විගණන කමිටුවේ වර්ශය තුළ හිටපු සභාපතිවරු වන වී කනගසභාපති මහතා හා ආර් එම් ඒ රත්නායක මහතා විසින් විගණන කමිටු කර්තව්‍යයන් සඳහා ලබාදෙන ලද දායකත්වය වෙනුවෙන් විගණන කමිටුවේ කෘතඥතාවය පළ කෙරේ.

විගණන කමිටුව වෙනුවෙන්



ලලිත් විතාන මහතා
සභාපති, විගණන කමිටුව

2014 මාර්තු 13
කොළඹ දීය

මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව

කමිටුවේ කාර්යභාරය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකු පනත් නියමය මත මූලිකව පදනම් වූ කමිටුවේ ප්‍රධාන වගකීම් පහත සඳහන් පරිදි වේ :

- බැංකුවේ මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් (ප්‍ර.ක.පි)සඳහා අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) නිර්ණය කිරීම.
- මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අරමුණු සහ ඉලක්ක නියම කිරීම.
- ලබා දෙන ලද අරමුණු සහ ඉලක්ක වලට සාපේක්ෂව, කලින් කලට මහා කළමනාකරුගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වල කාර්යසාධනය ඇගයීම සහ පාරිශ්‍රමිකය, ප්‍රතිලාභ සහ කාර්යසාධන සඳහා දෙනු ලබන අනෙකුත් දිරි දීමනා ගෙවීම් සංශෝධනය සඳහා පදනම නිර්ණය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොමු කරන ලද කාර්ය මණ්ඩලයට අදාළ කරුණු සමාලෝචනය කිරීම.
- බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය සහ සංවිධාන ව්‍යුහය නිර්ණය කිරීම.

බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස සලකනුයේ අධ්‍යක්ෂවරුන්, මහා කළමනාකරු, නියෝජ්‍ය මහා කළමනාකරුවන්, සමාන්තර ශ්‍රේණි වල සේවක මණ්ඩලය සහ අනුකූලතාවේ නිලධාරී මහතාය.

මහ කළමනාකරුගේ හා නියෝජ්‍ය මහ කළමනාකරුවන්ගේ අරමුණු සහ ඉලක්ක සංයුක්ත සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත වේ. මහ කළමනාකරු ආයතනික සැලැස්ම නියෝජ්‍ය මහ කළමනාකරුවන් හරහා ක්‍රියාවට නැංවීමෙහි වගකීමට යටත් වේ. ඔවුන්ගේ කාර්යඵල ඇගයීම සම්බන්ධයෙන් බැංකුව විසින් ගොඩනඟා ගනු ලැබූ ක්‍රියාපටිපාටිය අනුව මහ කළමනාකරු විසින් නියෝජ්‍ය මහ කළමනාකරු ක්‍රියාකාරී සැලැස්මේ ඉෂ්ට කරගත් ජයග්‍රහණ මත පදනම්ව ඇගයීම් සිදුකරනු ලැබූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සමාලෝචනයට හා ඇගයීමට වාර්තා කරනු ලැබේ. මින් ඉදිරියට මෙම ඇගයීම් හා සමාලෝචනයන් මෙම කමිටුව මඟින් සිදුකරනු ලබන අතර අවශ්‍ය නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරනු ලබයි. අධ්‍යක්ෂවරුන් සියළුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන නිසා ඔවුන් සියළුම දෙනා හට ඉලක්ක දෙනු නොලබයි.

සංයුතිය සහ ගණපූර්ණය

කමිටුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සතර දෙනෙකුගෙන් සමන්විතය. කමිටුවේ සභාපති/ සභාපතිනිය, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ.

සමාලෝචිත වර්ෂය තුළ හා අනතුරුව වූ කමිටු ව්‍යුහය පහත දැක්වේ.

*රාජු සිවරාමන් මහතා - සභාපති

චන්ද්‍රසිරි ද සිල්වා මහතා

නලිනි ඩී අබේවර්ධන මෙනෙවිය

*අධ්‍යක්ෂවරියකු වන අබේවර්ධන මෙනෙවිය කමිටු සභාපති ලෙස කටයුතු කිරීම 2013 ජූනි 18 වන දින රසීක් සරූක් මහතා ලංකා බැංකුවේ හා කමිටුවේ සභාපති ලෙස පත්වීමත් සමඟම අවසන් විය. ඔහු ලංකා බැංකුවේ සභාපති ධුරය දැරූ කාලය තුරාම කමිටුවේ සභාපතිත්වයද දරනු ලැබීය.

** කේ එල් හේවගේ මහතා ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස 2013 ජූනි 06 තෙක් දැරූ තුන් අවුරුදු කාල වකවානුව අවසන් වීමත් සමඟම කමිටුවේ සාමාජිකත්වයද අවසන් විය.

2013 වර්ෂය තුළ කමිටුවේ සාමාජිකත්වය දැරූ ලංකා බැංකුවේ වැඩ බලන සභාපති වන රාජු සිවරාමන් මහතා 2014 ජනවාරි 02 දින සිට කමිටුවේ සභාපති ලෙස පත් විය.

කමිටුවේ ගණපූර්ණය සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. මහා කළමනාකාරවරයාට අදාළ කරුණු සාකච්ඡා කරනු ලබන අවස්ථාවන්හි හැර, ඔහු කමිටුවේ සියළු රැස්වීම් වලට සහභාගී වේ. කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන්ගේ සහභාගීත්වය අවශ්‍ය වූ විට ඒ සඳහා ඔවුනට ආරාධනා කරනු ලැබේ. ලංකා බැංකුවේ/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව 4 වරක් රැස්වී තිබේ. රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ පැමිණීම 149 පිටුවේ දැක්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්හි දී සියළුම කමිටු රැස්වීම් වාර්තා ලේඛනගත කිරීම සහ ස්ථිර කර ඇති අතර කමිටුවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය මණ්ඩලයෙන් ලබා ගෙන ඇත. නොවිසඳී ඇති කරුණු සම්බන්ධයෙන් විදිනෙදා පදනම මත පසුවිපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ඉහතකී 2007 අංක 11 දරණ බැංකු පනත් නියමයන්ට අනුව, අධ්‍යක්ෂවරුන් අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මෙම කමිටුව විසින් නිර්ණය කළ යුතුය. එතකදු වුවත්, ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත් කළ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික නිර්ණය කරනු ලබන්නේ එහි එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ හා උපදෙස් ප්‍රකාරවය. ලංකා බැංකුව ස්ථාපිත කරන පනත වූ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධන වල විධිවිධාන ද, අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික හා ඔවුනට ලබා දෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් සැලකිල්ලට ගනු ලැබේ. ඉහත නීතිරීති හා උපදෙස් වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරුන් සඳහා අමාත්‍යාංශය විසින් නව රෙගුලාසි නිකුත් කරන විටදී විමර්ශණය කළ හැකි පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සකස් කර තිබේ. සලකා බලනු ලබන වර්ෂය තුළදී මෙම ප්‍රතිපත්තිය සංශෝධනය

කරන ලදී. අධ්‍යක්ෂවරුන්ට ලබා දෙනු ලබන පාරිශ්‍රමික පිළිබඳ විස්තර වාර්ෂික පදනමින් වාර්ෂික වාර්තාවේ පූර්ණ ලෙස හෙළිදරව් කර ඇත.

ලංකා බැංකු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව සේවකයන්ගේ පාරිශ්‍රමිකය වසර 3 කට වරක් සංශෝධනය කෙරේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ (එනම් මහා කළමනාකරු, නියෝජ්‍ය මහා කළමනාකරුවන් සහ සහකාර මහා කළමනාකරුවන්) වැටුප් පිළිබඳව සාකච්ඡා අවසන් කිරීමට පෙර කමිටුව යෝජනා පිළිබඳව සාකච්ඡා කර සිය නිර්දේශය ලබා දෙයි.

සමාලෝචිත වර්ෂය තුළදී කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත විය.

- අභියාචනා ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටිය නැවත පරීක්ෂා කොට සමාලෝචනය කිරීම.
- කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ ඇගයීම් නිර්ණායක නැවත සකස් කිරීම.
- වෘත්තීය මට්ටම උසස් කිරීම සඳහා පිළිගත් විදේශීය විශ්ව විද්‍යාල/ආයතනයන්හී පූර්ණ කාලීන විද්‍යාපති උපාධි සඳහා තෝරාගත් සේවකයින් නිර්දේශ කිරීම සහ පුහුණු කිරීමේ අවශ්‍යතා හඳුනාගැනීම.
- කණිෂ්ඨ නිලධාරීන් හා ඊට උසස් ශ්‍රේණියන් සඳහා නව කාර්යඵල ඇගයීමේ ක්‍රියාපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
- භාණ්ඩාගාර අංශයේ වෙළඳ කටයුතුවල නියුතු අය සඳහා නව ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාපටිපාටියක් නිර්දේශ කිරීම.
- පාසැල් හැර ගිය සිසුන්ගේ වෘත්තීය නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ඒ සඳහා ශිෂ්‍යයන් යෙදවීමට අනුමැතිය ලබා දීම.
- කමිටුවේ කාර්යඵල ඇගයීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

නිගමනය

මානව සම්පත් සහ පාරිශ්‍රමික කරුණු වලට අදාළව කමිටුවේ අධීක්ෂණ වගකීම් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීම කමිටුව අඛණ්ඩව සිදු කරනු ඇත.

කමිටුවේ හිටපු සභාපතිවරයා වන රසීක් සරූක් මහතා බැංකුවේ මානව සම්පත් පරිචය වැඩි දියුණු කිරීම සඳහා දැක්වූ අති විශාල දායකත්වය වෙනුවෙන් එතුමා වෙත කමිටුවේ කෘතඥතාවය පළ කෙරේ.

මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව වෙනුවෙන්



රාජු සිවරාමන් මහතා
සභාපති
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2014 මාර්තු 13
කොළඹ දීය.

නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටු වාර්තාව

කමිටුවේ කාර්යභාරය

කමිටුව ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ පිළිබඳව වගකියනු ලැබේ:

- මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් (ප්‍ර. ක. පි.) තෝරාගැනීම/පත් කිරීමට අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.
- මහා කළමනාකාර තනතුරට සහ ප්‍ර. ක. පි. තනතුරුවලට පත් කිරීම හෝ උසස්වීම් ලබා දීම සඳහා යෝග්‍යතාව සලකා බැලීමට සුදුසුකම්, පළපුරුද්ද සහ මුඛ්‍ය ගුණාංග බඳු නිර්ණායක නියම කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නිකුත් කරනු ලැබූ සහ ප්‍රඥප්තිවල දක්වා ඇති පරිදි ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනත් නියමයේ අංක 3 (3) දරණ නියමයේ සඳහන් නිර්ණායකවල නිශ්චිතව දක්වා ඇති පරිදි, අදාළ තනතුරු දැරීමට මහා කළමනාකාරවරයා සහ ප්‍ර. ක. පි. යෝග්‍ය සහ සුදුසු බව සහතික කිරීම.
- ප්‍ර. ක. පි. සඳහා අතිරේක / විශේෂඥ දැනුම පිළිබඳ අවශ්‍යතා සහ අනුප්‍රාප්තික සැකසුම් කලින් කලට සකසා බැලීම සහ නිර්දේශ කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල සඵලතාව, වාර්ෂික ඇගයීම පිළිබඳ ක්‍රමවේද නිර්ණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වාර්ෂික කාර්යසාධන ඇගයීම් ක්‍රියාදාමයට සහාය දැක්වීම.
- බැංකු ආචාර ධර්ම පද්ධතිය කලින් කලට සමාලෝචනය කිරීම.

කමිටුවේ සංයුතිය

කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විතය. කමිටුවේ සභාපතිවරයා විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි.

සමාලෝචිත වර්ෂය තුළ කමිටු ව්‍යුහය පහත විස්තර කෙරේ.

එම්. සිවරාමන් මහතා	-	සභාපති
* චන්ද්‍රසිරි ද සිල්වා මහතා	-	සාමාජික
**ලලිත් විතාන මහතා	-	සාමාජික

* නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ වන එස් ආර් ආටිගල මහතා කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම අවසන් කිරීමත් සමඟ එම ස්ථානයට 2013 ජූනි 19 වන දින සිට අධ්‍යක්ෂවරයෙකු වන චන්ද්‍රසිරි ද සිල්වා මහතා කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් විය.

** කේ එල් හේවගේ මහතා ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස දැරූ තුන් අවුරුදු කාල වකවානුව අවසන් වීමෙන් කමිටුවේ සාමාජිකත්වයද අවසන් වීමත් සමඟ එම ස්ථානයට අධ්‍යක්ෂවරයකු වන ලලිත් විතාන මහතා 2013 ජූනි 19 දින සිට කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් විය.

ආරාධනා කිරීම මඟින් මහා කළමනාකරු රැස්වීම් සඳහා සහභාගී වේ. කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන්ගේ සහභාගිත්වය අවශ්‍ය වූ විට ඒ සඳහා ඔවුනට ඇරයුම් කරනු ලැබේ. ලංකා බැංකුවේ/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව 4 වරක් රැස්වී තිබේ. රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම 149 පිටුවේ දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

කමිටු රැස්වීම් වල සියළු කාර්ය සටහන් සහාගත කර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ස්ථිර කරන අතර එමඟින් කමිටු මඟින් සිදුකරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනේ. නොවිසඳුණු කරුණු සඳහා නිරන්තරයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පත්වීම්

ඉහතකී 2007 අංක 11 දරණ බැංකු පනත් නියමයන්ට අනුව, නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව නව අධ්‍යක්ෂවරුන් තේරීම/පත් කිරීම ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කළ යුතුයි. එතකදු වුවත්, ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත් කළ එහි පූර්ණ හිමිකරු ශ්‍රී ලංකා රජය වන නිසා අධ්‍යක්ෂවරුන් පත් කිරීම් මූල්‍ය අංශය භාර ඇමති විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධන වල විධිවිධාන අනුව සිදුකරනු ලබයි. අධ්‍යක්ෂවරුන් පත්කිරීමට අදාළව ඉටු කිරීමට කිසිදු කාර්යභාරයක් නාම යෝජනා සහ ආයතනික පාලන කමිටුවට නොමැත.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදී

- වෙළඳ සේවා හා ණය කාඩ්පත් පද්ධතියනට අදාළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ග්‍රහණය කරගැනීමට ස්වංක්‍රීය පද්ධතියක් ක්‍රියාවට නැංවීම.
- නව යෝජිත සංවිධාන ව්‍යුහය සමාලෝචනය කිරීම සහ වැඩි දියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.
- බැංකු අනුප්‍රාප්තික සැලසුම්කරණයට ඇති වැඩි දියුණු කිරීම් සමාලෝචනය කිරීම.
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු වලට පත්වෙන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දැනුම් පරතරය පියවීම සඳහා කමිටුව විසින් ආරම්භ කර දැනට ඉතා සාර්ථකව කොටසක් අවසන් කර ඇති නිපුණතා සංවර්ධන පුහුණු පාඨමාලාවේ ප්‍රතිඵල පරීක්ෂා කරන ලදී.
- ප්‍රධාන කළමනාකරණ පිරිස් වල ප්‍රබල ක්ෂේත්‍ර හා වැඩි දියුණු කළ යුතු ක්ෂේත්‍රයන් තක්සේරු කිරීම් කේන්ද්‍රගත කිරීමේ වැඩමුළුවක් ඇති කිරීමට නිර්දේශ කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරනු ලබන දිවුරුම් ප්‍රකාශන හා ප්‍රකාශන තුළින් ප්‍රධාන කළමනාකරන පිරිස් අදාළ තනතුරු දැරීමට යෝග්‍ය හා සුදුසු බව සහතික කිරීම.

- විශේෂිත තනතුරු සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා විශේෂඥ සහය ලබා ගැනීම නිර්දේශ කිරීම.
- බැංකුවේ අධ්‍යක්ෂ ප්‍රඥප්තිය සහ සන්නිවේදන ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම.
- බැංකුවේ අනුප්‍රාප්තික සැලසුම්කරණය පසුවිපරම් කිරීම සහ අවසන් ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ අධ්‍යයනය කිරීමෙන් අවශ්‍ය නිර්දේශ ලබා දීම.
- සේවකයින් හා අධ්‍යක්ෂවරුන් සඳහා වන බැංකු ආචාර ධර්ම පද්ධතිය සමාලෝචනය කරන ලදී.
- සිදුකළ යුතු ඇගයීම් ක්‍රියාදාමය නිර්දේශ කිරීම මඟින් අනු කමිටුවල කාර්යසාධනයද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයට සිය ස්වයං ඇගයීම සිදු කිරීමට පහසුකම් සපයන ලදී.
- 2007 අංක 11 දරණ බැංකු පනත අනුව පවත්වාගත යුතු අනුකූලතා මට්ටම ඒවාට අනුකූල වීමේ අරමුණ ඇතිව තීරණය කරන ලදී.
- කමිටුව විසින් සිය කාර්යඵලය සමාලෝචනය කිරීමෙන් කමිටුවේ සඵලදායකත්වය හා සුමට මෙහෙයුම සහතික කරන ලදී. ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබීය.

නිගමනය

කමිටුව බැංකුවේ සුභවාදී ආයතනික යහපාලන භාවිතයන් ඉහළ නැංවීම සඳහා ප්‍රයත්න දරනු ඇත.

නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව වෙනුවෙන්

රාජු සිවරාමන් මහතා
සභාපති
නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව

2014 මාර්තු 13
කොළඹ දීය.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

කමිටුවේ කාර්යභාරය

අවදානම් කළමනාකරණයේ සියළු අංශ සඳහා සිය අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දැක්වීම කමිටුවේ ප්‍රධාන භූමිකාව හා වගකීම වේ. උචිත අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු මඟින් ණය, වෙළඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම්, උපාය මාර්ගික සහ කීර්තිය පිළිබඳ අවදානම් ආදිය පිළිබඳව කමිටුව අවධානය යොමු කර සමාලෝචන සිදු කරයි.

ඉහත සඳහන් කළ කරුණාට අමතරව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය මඟින් හඳුනාගනු ලැබූ පහත දැක්වෙන කරුණු සමාලෝචනය කිරීම සහ/ හෝ නිර්දේශ කිරීම කමිටුවේ වගකීම වේ.

- අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ කළමනාකරණ කමිටු ප්‍රඥප්ති
- ප්‍රධාන අවදානම් නිළධාරිතුමා විසින් නිර්දේශ කළ පරිදි ණය, වෙළඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් අවදානම් සඳහා රුචියක් ඇති කරන අවදානම් සීමා සහ ප්‍රතිපත්ති
- නිශ්චිත අවදානම් වලට පිළියම් යෙදීම සඳහා සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එකී අවදානම් කළමනාකරණ කිරීම සඳහා ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවල ප්‍රමාණවත් බව සහ සඵලතාව
- බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳව අවදානම් කළමනාකරණ වාර්තා මෙන්ම මතු වී එන වෙළඳපොළ සහ නියාමන අවදානම් සහ එබඳු අවදානම් හඳුනා ගැනීමට, මැනීමට, අධීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට සිදු කරනු ලබන ක්‍රියාමාර්ග
- නිශ්චිත අවදානම්, එබඳු අවදානම් බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරනු ලබන විචක්ෂණ මට්ටම් ඉක්මවා යන අවස්ථාවන්හිදී අවම කිරීම සඳහා ප්‍රතිකාරක ක්‍රියාමාර්ග
- බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා හෝ අන්‍යාකාරයෙන් නියම කරන ලද පරිදි නිශ්චිත අවදානම් සහ කඩිනම් ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග හඳුනාගැනීමට අපොහොසත් වීම සඳහා වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග
- අදාළ සියළු අවදානම්වල අවදානම් හඳුනාගැනීමේ, මැනීමේ, අධීක්ෂණය කිරීමේ සහ අවම කිරීමේ ප්‍රමාණවත් බව සහ සඵලතාව

සංයුතිය සහ ගණපූර්ණය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විතය.

2013 වර්ෂය අවසානයේ කමිටුව පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය.

* ලලිත් විතාන මහතා - සභාපති

**කේ එම් මහින්ද සිරිවර්ධන මහතා (නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ)- සාමාජික

රාජු සිවරාමන් මහතා - සාමාජික

කමිටුවේ ස්ථිර කළමනාකරන නියෝජිතයින්

ඩී එම් ගුණසේකර මහතා - මහා කළමනාකරු

එම් එල් ජේ ප්‍රනාන්දු මහතා - ප්‍රධාන අවදානම් නිලධාරී

* අධ්‍යක්ෂවරයෙකු වන කේ එල් හේවගේ මහතා, බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සිටි තුන් අවුරුදු කාල පරිච්ඡේදය අවසන් වීමත් සමඟම කමිටුවේ සාමාජිකත්වය අවසන් වීමෙන් එම ස්ථානයට අධ්‍යක්ෂවරයෙකු වන ලලිත් විතාන මහතා 2013 ජූනි 19 වන දින කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් විය.

** 2013 අප්‍රේල් 24 වන දින සිට කේ එම් මහින්ද සිරිවර්ධන මහතා නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ ලෙස එස් ආර් ආටිගල මහතාගේ ස්ථානයට පත් වීමෙන් පසු කමිටුවේ සභාපති ලෙස පත් කෙරුනි.

කමිටු සමාජිකයින්ගේ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 42 සිට 45 දක්වා පළකර ඇත.

කමිටුවේ ගණපූර්ණය සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විතය.

ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. ප්‍රධාන මූල්‍ය නිලධාරී හා ප්‍රධාන අභ්‍යන්තර විගණක හට, කමිටුවේ රැස්වීම් සඳහා පැමිණෙන ලෙස ආරාධනය කරනු ලබයි. අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගි වීම කමිටුවට අවශ්‍ය විටදී රැස්වීම් සඳහා පැමිණෙන ලෙස ඔවුනට ආරාධනය කරනු ලබයි.

රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව 5 වරක් රැස් විය. රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම 149 පිටුවේ ඇති වගුවේ දැක්වේ.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව සිදු කළ ක්‍රියාකාරකම් පහත සාරාංශ කර දක්වා ඇත:

- පහත දැක්වෙන පවත්නා ප්‍රතිපත්ති සහ කාර්ය සංග්‍රහයන් සමාලෝචනය කරන ලද අතර බැංකුවේ අවදානම් පැතිකඩ ඒවා මත පදනම්ව තක්සේරු කරන ලදී.

  (අ) ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

  (ආ) වෙළඳපොල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ කාර්ය සංග්‍රහය

  (ඇ) මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ කාර්ය සංග්‍රහය

(ඈ) අනුකූලතා ප්‍රතිපත්තිය

(ඉ) මිලදී හා සැපයුම් ගැනීම් ක්‍රියාපිළිවෙතෙහි කාර්ය සංග්‍රහය

(ඊ) ව්‍යාපාරික අවිච්ඡින්නතා කළමනාකරණ ප්‍රතිපත්තිය

(උ) තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්ති

- පහත දැක්වෙන නව ප්‍රතිපත්ති සහ කාර්ය සංග්‍රහයන් බැංකුවට හඳුන්වා දෙන ලදී

(අ) ආකෘති වලංගු කිරීමේ ප්‍රතිපත්තිය

(ආ) විදේශීය විනිමය හුවමාරු අවදානම් කළමනාකරන ප්‍රතිපත්තිය

(ඇ) ද්‍රවශීලතා අවදානම් කළමනාකරන ප්‍රතිපත්තිය

(ඈ) මධ්‍යම කාර්යාලීය ක්‍රියාපටිපාටියෙහි කාර්ය සංග්‍රහය

(ඉ) ආකෘති අවදානම් කළමනාකරන ප්‍රතිපත්තිය

- ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ අවදානම මාසික පදනම මත අගය කරනු ලබන අතර එහි සාරාංශ ගත වාර්තා කාර්තුමය වශයෙන් කමිටුව වෙත ඉදිරිපත් කෙරේ. කමිටුව විසින් එම වාර්තා සමාලෝචනය කර රැස්වීම් වාර්තා මඟින් සිය නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගස ඉදිරිපත් කෙරේ. ආයතනික සැලැස්ම තුළ අන්තර්ගත කර ඇති ප්‍රධාන උපාය මාර්ග වලට සම්බන්ධ අවදානම් වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී.

- 2013 වර්ෂය සඳහා අවදානම් අභිරුචිය ස්ථාපිත කිරීම.

- සීමාව ඉක්මවා ගිය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් නියාමනය කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- ප්‍රධාන අවදානම් නිලධාරිතුමා විසින් සීමාව ඉක්මවා ගිය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සඳහා ගත යුතු අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශයන් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

- ණය, මෙහෙයුම් සහ වෙළඳපොළ අවදානම් කළමනාකරණය සඳහා නවීන කළමනාකරණ පද්ධතියක් සහ ප්‍රතිමුදල් විශුද්ධිකරණ මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම සඳහා දැනට මූලික අවස්ථාවේ පවතින විධිවිධාන නැවත සොයා බලන ලදී.

- සංශෝධිත අභ්‍යන්තර මූලධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) යොදාගැනීම නිර්දේශ කිරීම.

- අනුකූලතා නිලධාරිතුමා විසින් භාරදෙන ලද පුළුල් අනුකූලතා වාර්තා කාර්තුමය වශයෙන් සමාලෝචනය කරන ලදී.

- සියළුම මෙහෙයුම් දෙපාර්තමේන්තුවල දැනට ක්‍රියාත්මක වෙමින් පවතින චිස් පහ සංකල්පය / තත්ත්ව කව භාවිතා කිරීම පරීක්ෂා කරන ලදී.

- පරිපාලිත සමාගම් වල අවදානම් ක්‍රියාවලියට සහය දැක්වීම සඳහා අවදානම් කළමනාකරන පුවරුවක් ඇති කිරීම. තවද අවදානම් පිළිබඳ කාරණයන්හි පරිපාලිත සමාගම් වලට සහය දීමට අවදානම් කළමනාකරන අංශයේ කණ්ඩායමක් පිහිටුවීම.

- ශාඛා පද්ධතිය, තීරණාත්මක ව්‍යාපාර සහ උපකාරක ඒකකයන් තුළ මුඛ්‍ය අවදානම් දර්ශක අධීක්ෂණය කිරීම.

- ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර අංශයන්හි සිදුකරනු ලැබූ අවදානම් සහ පාලනයන් ස්වයං තක්සේරුවෙහි ප්‍රතිඵල සමාලෝචනය කිරීම.


- පළාත්වල සහ අත්හදා බැලීමේ ධාවනයන්හි ව්‍යාපාරික අඛණ්ඩත්ව සැලැස්ම අරබයා මෙහෙයවනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳව පසුවිපරම් කිරීම.

කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය නිර්දේශ කාර්ය සටහන් මඟින් වාර්තා කරන ලදී. කමිටු රැස්වීම්වල සියළු කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කර අනුමත කරන අතර නොවිසඳී ඇති කරුණු සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

නිගමනය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සමාජිකයින් විසින් කමිටුවේ කාර්යඵලය සාමූහිකව අගය කරන ලදී. බැංකුවේ පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් සුරක්ෂිත වන පරිදි අවදානම් කළමනාකරණයේදී හා අනුකූලතා ක්‍රියාවලියේදී වන අභියෝගයන්ට මුහුණ දීමේදී බැංකුව නිවැරදි මාර්ගයට ප්‍රවේශ වී ඇති බව කමිටුවේ අදහසයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙනුවෙන්



ලලිත් විතාන මහතා
සභාපති, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2014 මාර්තු 13
කොළඹ දීය.


අවදානම් කළමනාකරණය

දළ විශ්ලේෂණය

බැංකුවෙහි සුවිලදායී අවදානම් කළමනාකරණය ව්‍යාපාරය තුළ අගය නිර්මාණය කරන අතර, එය බැංකුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි අතිශය වැදගත් අංශයකි. දීර්ඝ කාලීන ලාභදායීත්වය ඇති කිරීමට හා ආරක්ෂා කර ගැනීමට වැදගත් වන සුවිශේෂී හැකියාවක් ලෙස බැංකුව අවදානම් කළමනාකරණය හඳුනා ගෙන ඇත.

අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවෙහි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ අරමුණ වන්නේ අවදානම් නිරාවරණයේ තරම කළමනාකරණය කිරීම, එය මෙහෙයවෙන්නේ කවරකින්දැයි හඳුනා ගැනීම, එයට එරෙහිව ප්‍රාග්ධනය ප්‍රතිපාදනය කිරීම සහ බැංකුවේ අවදානම් නිරාවරණයෙන් ඇති විය හැකි අලාභයන් පුරෝකථනය කිරීමට ඉවහල් වන ප්‍රවණතා අභ්‍යන්තරිකව හා බාහිරව හඳුනා ගැනීමයි. මෙම රාමුව මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අවදානම් ගැනීමේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පාලනය, අවදානම් රුචිය සහ අවදානම් කළමනාකරණ ශිල්පක්‍රම ස්ථාපනය කෙරේ.



අවදානම් පාලනය

අවදානම කළමනාකරණය කිරීමෙහිලා වගකීම, විනිවිදභාවය හා ස්වාධීන වාර්තාකරණය ඇති කර ගත හැකි තෙවැදෑරුම් ආරක්ෂක මාර්ග ප්‍රවේශයක් මත බැංකුවෙහි අවදානම් පාලනය රුඳී තිබෙන අතර, එය බැංකුවේ ව්‍යාපාරික කටයුතු සිදු කිරීමෙහිලා ද මූලික වේ.

තෙවැදෑරුම් ආරක්ෂක මාර්ග ප්‍රවේශය බැංකුව සිසාරා ස්වාධීන හා උචිත අවදානම් අධීක්ෂණය සැපයීමට අපේක්ෂා කරන අතර එය බැංකුවට තරඟකාරී වාසියක් හා ස්ථාවරතාව ගොඩනගනු පිණිස අත්‍යවශ්‍යය. අවදානම් කළමනාකරණ රාමුවෙහි සියළුම අංග විචක්ෂණශීලීව මනින ලද අවදානම් ගැනීම සහ උචිත ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා පහසුකම් සලසයි.

බැංකුවේ අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහයේ ආරක්ෂක මාර්ග තුන ඇරඹෙනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණයත් සමඟිනි. අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ත අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපනය කර ඇති අතර, එය අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, නිරීක්ෂණය, වාර්තා කිරීම හා අවම කිරීම සඳහා වූ ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි හරහා ක්‍රමෝපායික දිශානතිය නියම කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණ කාර්යයන්හි ක්‍රියාකාරිත්වය හා සඵලදායීත්වය සම්බන්ධයෙන් වූ සිය වගකීම් ඉටු කිරීමට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) සහාය වෙයි. මෙය අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවකි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)සිය ප්‍රඥප්තිය තුළ හඳුනා ගෙන ඇති පහත දේ සමාලෝචනය සහ/හෝ නිර්දේශ කිරීම සඳහා වගකීම දරයි:

- අධ්‍යක්ෂ මණ්ඩලය නිර්ණය කළ අවදානම් අභිරුචියේ සන්දර්භය ඇතුළත ව්‍යාපාරයේ අවදානම් ස්වරූපය අධීක්ෂණය හා අවදානම් කළමනාකරණය
- අවදානම් අභිරුචිය සහ නිශ්චිත අවදානම් හෝ අවදානම් කළමනාකරණ පිළිවෙත් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම
- බැංකුව හමුවේ ඇති සැලකිය යුතු අවදානම් සමනය කිරීම සඳහා වූ ක්‍රමෝපායික සැලසුම් සමාලෝචනය කිරීම සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) හරහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව නිර්ණය කිරීම
- අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පිළිපැදීම් හා පාලන පද්ධති ක්‍රියාත්මක කෙරෙන අයුරු අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීම
- අවදානම් පාලන සංස්කෘතියක් පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම හා අවදානම හා භාර ගත් අවදානම සඳහා වූ ප්‍රතිලාභ අතර සමබරතාවයක් අත්කර ගැනීම

බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කරන ඒකකයක් වශයෙන්, ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) ප්‍රධානත්වය දරන, ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)ව්‍යාපාරය ඇතුළත පවතින විශේෂිත අවදානම් ගැටළු පිළිබඳ කළමනාකරණ අවධානය සැපයීම හා ජාත්‍යන්තර විශිෂ්ටතම පිළිවෙත් හා නියාමන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම පිණිස, ආදායම් උපයන ව්‍යාපාර ඒකකවලින් ස්වායත්ත වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් කටයුතු කරයි. අනාගත ගැටළු මතු වීමේ හැකියාව අඩු කරමින් ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) අවිනිශ්චිත තත්ත්වයන්ට ක්‍රමෝපායික ප්‍රතිචාර සැකසීමෙහි අභික්‍රියාකාරී ලෙස නියැළී සිටී. තවද, සංවිධානයේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගනු පිණිස

අපගේ ආරක්ෂක මාර්ග තුන සිසාරා අවදානම් වගවීම

ව්‍යාපාරික මෙහෙයුම (පළමු මාර්ගය)	අවදානම් කළමනාකරණය (දෙවන මාර්ගය)	අභ්‍යන්තර විගණනය (තුන්වන මාර්ගය)
හිමිකාරිත්වය	අන්තර්දැක්ම, අභිරුචිය, සමාලෝචනය	ස්වාධීන සහතිකය
• අවදානම් අභිරුචිය ක්‍රියාවේ යෙදවීම හා කළමනාකරණය • අවදානම් හඳුනා ගැනීම, පාලනය හා නිරීක්ෂණය • ශක්තිමත් අවදානම් හා පාලන පරිසරයක් පිහිටුවා, පවත්වා ගෙන යාම. • ව්‍යාපාරික කටයුතු උචිත පාලන පරිසරයක සිදු කෙරෙන බවට වග බලා ගැනීම	• ප්‍රතිපත්ති, රාමු, මෙවලම් හා ක්‍රියාවලින් සංවර්ධනය කොට පවත්වා ගැනීම • අවම ප්‍රමිති නිර්ණය කිරීම හා ආශ්‍රිත ප්‍රතිවිපාක කළමනාකරණය • අවදානම් අභිරුචිය ස්ථාපනය කිරීම. • ව්‍යාපාරය පිළිබඳ අධීක්ෂණය, නිරීක්ෂණය හා අභියෝග කිරීම • අදහස් ලබා දීම	• පළමු හා දෙවන මාර්ග සිසාරා ස්වාධීන ලෙස සමාලෝචනය, නිර්ක්ෂණය හා පරීක්ෂා කිරීම. • අවදානම මතු කරන ගැටළු මඟින් දැනුවත් වීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම්. • නියාමකයින්ගේ අනුකූලන නියමයන් පිළිපැදීම පිළිබඳව ස්වාධීනව සහතික කිරීම. • ව්‍යාපාරයේ අවදානම හා පාලන පරිසරය සහ ස්වයං තක්සේරු හැකියාව පිළිබඳ සමස්ත සුදුසුකම්වත්වය තක්සේරු කිරීම

සංවිධානය ඇතුළත අවදානම් කළමනාකරණ හැකියාවන් ඒකාබද්ධ කිරීමෙහිදී ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) නියැළී සිටී.

විධායක මට්ටමේදී ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් කමිටු කීපයක සහාය ඇතිව අවදානම අධීක්ෂණය කෙරේ. එම කමිටුවලට බැංකුව නිරාවරණය වන විවිධ අවදානම් කළමනාකරණය කිරීමෙහි නිරතව සිටින ණය කමිටුව, වත්කම් සහ බැරකම්කළමනාකරණකමිටුව (ALCO), මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC), තොරතුරු තාක්ෂණ නියමු කමිටුව (ITSC), ව්‍යාපාරික අඛණ්ඩතා කළමනාකරණ නියමු කමිටුව (BCMSC), ආයෝජන කමිටුව, ව්‍යාජ චෙක්පත් හා චංචා කමිටුව (FCFC), අකර්මණ්‍ය වත්කම් කමිටුව (IAC), අක්‍රීය අත්තිකාරම් ආපසු අයකර ගැනීමේ කමිටුව (NPARC) ඇතුළත් වේ.

අවදානම් සංස්කෘතිය

අවදානම් කළමනාකරණය බැංකුවේ සිටින සියළු සේවකයින්ගේ වගකීම බව ලංකා බැංකුවේ අපි විශ්වාස කරමු.අපගේ අවදානම් සංස්කෘතිය බැංකුව සිසාරා ගැඹුරට මුල් බැස ඇති අතර, එහි අවදානම් සංස්කෘතිය අවදානම් කළමනාකරණ රාමුව සමඟ දිශාගත වී ඇත. එය අප අවදානම දකින හා කළමනාකරණය කරන ආකාරය යළි හැඩ ගස්වන අතර, අපගේ සේවකයින් අවදානම මෙන්ම ප්‍රතිලාභය හඳුනා ගැනීම, අර්ථකථනය කිරීම, සාකච්ඡාවට භාජනය කිරීම හා ඒවා හමුවේ තේරීම් සිදු කිරීම කරන විට ඔවුන්ගේ ක්‍රියාවන් හා චර්යාවන් තුළ එය විද්‍යමාන වේ.

අපගේ අවදානම් කළමනාකරණය හැකියාවන් වර්ධනය කිරීමට හා අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීමට උපකාරී වීමට, අපි ප්‍රධාන වශයෙන් පළාත් මට්ටමෙන් පවත්වා ඇති අවදානම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ඉගෙනුම් අවස්ථා එක් කරමින් සිටිමු.

අවදානම් අභිරුචිය

බැංකුව සිය ව්‍යාපාරික ක්‍රමෝපාය ක්‍රියාවේ යොදන අතර දැරීමට සූදානම් අවදානමේ මට්ටම ලෙස අවදානම් අභිරුචිය නිර්වචනය කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුව සඳහා පුළුල් සමස්ත පිළිගත හැකි අවදානම් අභිරුචිය නිර්ණය කරන අතර, කළමනාකාරිත්වය වෙන් කරන ලද ප්‍රාග්ධනයේ සීමාව ඇතුළත සිය එක් එක් ව්‍යාපාරික ඒකකය සඳහා වූ අවදානම් ව්‍යූහය හා අවදානම් අභිරුචිය ස්ථාපනය කරන අතර අවදානම්-ප්‍රතිලාභ හුවමාරුව හඳුනා ගැනීමෙහිලා ක්‍රියාකාරී ලෙස සහභාගි වෙති.

බැංකුවේ අවදානම් අභිරුචිකත්ව ප්‍රකාශය ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක කරුණුවලින් යුක්ත වන අතර එය බැංකුව මුළුල්ලේම ඒකාකාරී ලෙස ප්‍රකාශ කෙරෙන්නක් හා ව්‍යවහාරයේ යෙදවෙන්නකි. උපායමාර්ගික මට්ටමේදී බැංකුව සිය ණය, වෙළඳපල හා මෙහෙයුම් අවදානම සඳහා වූ ප්‍රාග්ධන ප්‍රමාණය එහි සීමාව ලෙස සලකයි.නියම කරන ලද අයුරින් නියාමන ප්‍රාග්ධනය පවත්වා ගෙන යාමද ඉන් අදහස් කෙරේ. මෙම පනවන ලද සීමාවන් බැංකුවේ වෙනස් වන ව්‍යාපාරික ක්‍රමෝපාය සහ නිරන්තරයෙන් ව්‍යාප්ත වන ව්‍යාපාරික කටයුතු අනුව

ප්‍රතිශෝධනය කරනු ලැබීමට යටත් වේ. එම නිසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචිකත්ව සීමාවන් කලින් කලට හෝ අවශ්‍ය යැයි හැඟී යන පරිදි සමාලෝචනය කෙරේ.

ප්‍රමාණාත්මක ක්‍රියාමාර්ගවලට ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ගණනයන්, ආතති පරීක්ෂාව හා මුඛ්‍ය අවදානම් දර්ශක, අභ්‍යන්තර නැති වූ දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය ඇතුළත් වේ.

බැංකුව යම් වර්ගයක අවදානම් සඳහා ඉඩ දීමට කැමති උපරිම බලපෑම වශයෙන් අවදානම් අභිරුචියේ ගුණාත්මක පැතිකඩ නිර්වචනය කෙරෙන අතර, එමඟින් බැංකුව ඉඩ නොදෙන පිළිගත නොහැකි අවදානම් සිද්ධිවාචකයන්ද විග්‍රහ කෙරේ.මෙය බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති, පාලනවිධි හා කාර්ය පටිපාටි හරහා නියම කෙරේ.

රූපය - ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය



අවදානම් කළමනාකරණ ශිල්පක්‍රම

මිනුම් සඳහා භාවිතා කෙරෙන ශිල්පක්‍රම හා යොදා ගනු ලබන ප්‍රතිපත්ති 201 වන පිටුවේ සිට විස්තරාත්මකව දී ඇති එක් එක් අවදානම යටතේ දැකිය හැකි වනු ඇත.

ප්‍රාග්ධන කළමනාකරණය

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලිය(ICAAP**)**

බැංකුවේ අවදානම් ආකෘතිය හා සම්බන්ධ වූ සමස්ථ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව ඇගයීමේ ක්‍රියාවලියක් පවතින අතර තවද ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගැනීම සඳහා උපාය මාර්ග ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලනය සඳහා වූ රාමුව, අවදානම් හා ප්‍රාග්ධන කළමනාකරණ විධිවිධාන ක්‍රියාත්මක කෙරෙන ආකාරයද අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) මඟින් දැක්වේ.මෙම ක්‍රියාවලිය බැංකුවේ ව්‍යාපාර කටයුතුවලදී ඇති වන සියළු අවදානම් සඳහා උර දීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සහ සිය ව්‍යාපාරික ව්‍යූහය පදනම් වූ උචිත ප්‍රාග්ධන අතිරික්තයක් තිබෙන්නේය යන සහතිකය ලබා දෙයි.

බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලි (ICAAP) රාමුවේ අරමුණු වන්නේ:

- අවදානම් හඳුනා ගැනීමේ හා මිනුම් ක්‍රියාවලිය උචිත වන බව
- අභ්‍යන්තර ප්‍රාග්ධන මට්ටම බැංකුවේ අවදානම් ව්‍යුහයට ගැලපෙන බව
- අවදානම් කළමනාකරණ පද්ධති සුදුසු ලෙස සංවර්ධනය වී ඇති හා ව්‍යවහාරයේ යෙදෙන බව

බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලියේ (ICAAP) පරමාර්ථය වන්නේ ව්‍යාපාරයෙහි අන්තර්ගත අවදානම් හඳුනා ගැනීම, අවදානම් පාලන හා කළමනාකරණ ප්‍රවේශය නියම කිරීම සහ බැංකුව ගන්නා අවදානම් සම්බන්ධයෙන් එය භාවිතා කරන හානි අවම ආකාරකයින් සැලකිල්ලට ගැනීමයි. මේ සඳහා බැංකුව ගන්නා පියවර ගණනාවක් වෙයි:

- පවතින මූල්‍ය අවදානම හා ව්‍යාපාරික තත්ත්වය සැලකිල්ලට ගැනීම
- ඉදිරි කාල පරිච්ඡේදය සඳහා වූ අවදානම් අභිරුචිය, ව්‍යාපාරික සැලැස්ම හා ක්‍රමෝපාය දැක්වීම
- ව්‍යාපාරික සැලැස්ම ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම
- එක් එක් අවදානම සම්බන්ධයෙන් ස්ථානගතව තිබිය යුතු අතිරේක ප්‍රාග්ධනය හෝ කළමනාකරණ ක්‍රියාමාර්ග පෙන්වා දීම
- උචිත තැන්හිදී, ව්‍යාපාරික සැලැස්ම මත අදාළ අවදානම්වල ඵලය සලකා බලන ආතති පරීක්ෂාවන් සිදු කිරීම
- ආතති පරීක්ෂාවන්ගේ ප්‍රතිඵල සලකා බලා එක් එක් අවදානම සම්බන්ධයෙන් අතිරේක ප්‍රාග්ධනය තබා ගත යුතුද, එසේ නැති නම් වෙනස් හානි අවම කිරීමේ ක්‍රමයක් වඩාත් උචිතද යන්න හඳුනා ගැනීම.

ආතති පරීක්ෂාව

අනපේක්ෂිත සමාජ-ආර්ථික අර්බුදවලට මුහුණ දීමෙහිලා බැංකුවට ඇති ප්‍රත්‍යාස්ථතාව හා ස්ථාවරත්වය සහතික කරනු පිණිස, ආතති පරීක්ෂාව ඉතා වැදගත් වන අතර, එය බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවේ වැදගත් කොටසකි. ආතතිය ඒල්ල වූ සිද්ධිරූපණයන්ගෙන් දැක්වෙනුයේ ඇති විය හැකි ගැටළුය. ආතති පරීක්ෂාව අපගේ අවදානම් හා ප්‍රාග්ධන කළමනාකරණ රාමුවේ මුඛ්‍ය සංරචකයක් වන අතර, එය අපගේ ව්‍යාපාරික සැලසුම්කරණ, උපාය මාර්ග හා තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හිදී දැනුවත් කරයි. වැරදිය හැක්කේ කුමක්ද, කෙසේද හා එය බැංකුවට කෙතෙක් අහිතකර ලෙස බලපායිද යන්න දැකීමට ඒවා

කළමනාකාරවරුන්ට හැකියාව ලබා දෙයි. තවද, එය ඔවුන්ට සීඝ්‍ර හා සඵලදායී ප්‍රතිචාර සඳහා ඇති ඉඩ ප්‍රස්ථා හඳුනා ගැනීමට ඉඩ සලසයි.

බැංකුව සිය නෛතික, ආයතනික, ව්‍යාපාරික මාර්ග, ව්‍යාපාර වස්තු හා නිෂ්පාදන සිසාරා ආතති පරීක්ෂාව සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාවේ යෙදවීම හා සමෝධානය කිරීම සිදු කරනු පිණිස පාලනය, ක්‍රියාවලීන් හා පද්ධති වඩා යහපත් කරන ආතති පරීක්ෂා රාමුවක් දැනටමත් ක්‍රියාත්මක කොට ඇත. මෙය ආතති පරීක්ෂාවන්හි ප්‍රතිඵල හා අපගේ අවදානම් අභිරුචිය අතර වඩාත් සඵලදායී සම්බන්ධතා සඳහා පහසුකම් සලස්වනු ඇත.

බැංකුව නිතිපතා පදනමින් ආතති පරීක්ෂා වැඩසටහනක් ක්‍රියාවේ යොදවන අතර. එහි ප්‍රතිඵල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත වාර්තා කෙරේ.මෙම වර්ෂය තුළ සිදු කෙරුණු ආතති පරීක්ෂාවන් ඉහළ යන අක්‍රීය අත්තිකාරම් තත්ත්වය හා ලාභදායකත්වය, ද්‍රවශීලතාව හා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව මත එහි බලපෑම වැනි

බැංකුවට විශේෂිත සිද්ධිරූපණවලට සම්බන්ධ වූයේ ඒවා රටේ පවතින සාමාන්‍ය වෙළඳපල තත්ත්වයන් ආවරණය කළ බැවිනි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධනය කිරීමේදී මෙම බැංකුව සිය සමස්ත අවදානම් කළමනාකරණ ප්‍රවේශයෙහි සම්පූර්ණ බව මෙන්ම ස්ථායී බව සහතික කරනු පිණිස විවිධ ආකාරයේ අවදානම් කළමනාකරණය සඳහා වූ කාර්යපටිපාටි හා රාමුව සමෝධානය කළ යුත්තේ කෙසේදැයි සලකා බලයි.

අපි අපගේ ශක්තිමත් අවදානම් කළමනාකරණ පදනම මත ගොඩනැගීම අඛණ්ඩව සිදු කරන අතර, විශිෂ්ටතම පිළිවෙත්වලට සාපේක්ෂව ආදර්ශ ප්‍රමිති ඇති කිරීම හා අපගේ අවදානම් කළමනාකරණ යටිතල පහසුකම්, ක්‍රියාවලීන් හා හැකියාවන් වර්ධනය කිරීමද ඇතුළුව අඛණ්ඩ දියුණුව සඳහා යත්න දරමු.අප ගෙන ඇති පියවර සහ අප අඛණ්ඩව ක්‍රියාත්මක කරන මූලකෘත්‍යයන් අපගේ ක්‍රමෝපාය සාර්ථකව ක්‍රියාවේ යොදවනු පිණිස අපව හොඳින් ස්ථානගත කරන බව අපි විශ්වාස කරමු.


මුඛ්‍ය අවදානම් කළමනාකරණය කිරීම

ණය අවදානම

බැංකුව වෙත සිය මූල්‍යමය හෝ කොන්ත්‍රාත්තුමය වගකීම් ඉටු කිරීමට ණයගැනුම්කරුවකු හෝ ප්‍රතිපාර්ශ්වයක් අසමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන අලාභයන් වෙතින් ණය අවදානම පැන නගී. ණය අවදානම් කළමනාකරණයේ ඉලක්කය වනාහි ණය අවදානම් නිරාවරණයන් පිළිගත හැකි පරාමිතීන් තුළ පවත්වා ගැනීම මඟින් බැංකුවේ අවදානම්වලට ගළපන ලද ප්‍රතිදානය උපරිම මට්ටමට ගෙන ඒමයි.


අවදානම	තත්ත්වය	ගනු ලබන ක්‍රියාමාර්ග/ හානි අවම කිරීම
ණය ප්‍රතිපත්තියේ ශක්තිය	අඩු අවදානම	ණය අවදානම අවම හා කළමනාකරණය කරනු පිණිස මෙම බැංකුව ක්‍රියාමාර්ග ගණනාවක් යොදවයි.මෙම ක්‍රියාමාර්ගයන්ට පරිපූර්ණ ණය ඇගැයීම, ශක්තිමත් නිරීක්ෂණ හා සමාලෝචන ක්‍රියාවලින් ඇතුළත් වේ. බැංකුවේ ණය ප්‍රතිපත්තියට අනුකූලව ණය ප්‍රදානය කෙරෙන්නේ ද යන්න පිරික්සීමට සහ වත්කම් ගුණාත්මකතාව පිළිබඳව ස්වාධීන විනිශ්චයක් ලබා දීමට නිතිපතා ණය සමාලෝචන සිදු කෙරේ.යටත් පිරිසෙයින් වාර්ෂිකව පූර්ණ විමර්ශනයන් සිදු කෙරෙන අතර, "සෝදිසි ලැයිස්තු" නිරාවරණයන් සඳහා යාවත් කාලීන වාර්තා සාදනු ලැබේ. අවශ්‍ය පරිදි හා අවශ්‍ය විටෙක, ගැටළු ඇති විය හැකි ණයමුදල් හඳුනා ගෙන ණය කමිටු වෙත වාර්තා කරනු ලැබේ. ණයගැනුම්කරුගේ ණය ශක්තිය පිළිබිඹු කරනු පිණිස ණය නිරාවරණයන් නිසි ලෙස හා අනලස්ව ශ්‍රේණිගත කරනු ලැබේ.ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)විසින් සංවර්ධනය කරන ලද අභ්‍යන්තරික ශ්‍රේණිකරණ පද්ධතිය ආයතනික ණයගැනුම්කරුවන්ගේ අවදානම් ව්‍යුහය ඇගැයීමට භාවිතා කරනු ලබන අතර, එය සියළුම ක්‍රියාත්මකව ඇති ණයමුදල් විවිධ අවදානම් ශ්‍රේණි තුළට වර්ගීකරණය කරයි. ණයමුදල් දීම ආරම්භයේදීම අවදානම් ශ්‍රේණි ලබා දෙන අතර, වාර්ෂිකව ඒවා සමාලෝචනය කෙරේ.

අවදානම	තත්ත්වය	ගනු ලබන ක්‍රියාමාර්ග/ හානි අවම කිරීම
		ණය ඇගැයීම් ක්‍රියාවලිය ප්‍රමිතිකරණය කරන අතරම, සාමාන්‍ය ගනුදෙනුකරුවන් වෙත පිරිවැය සූක්ෂ්ම, සඵලදායී හා කාර්යක්ෂම සේවයක් ලබා දෙනු පිණිස පාරිභෝගික ණය සඳහා ණය ලකුණු දීමේ ආකෘති සංවර්ධනය කරන ලදී. ණය අවදානම් පරාමිතීන් ගණනය කිරීමේ අරමුණින් මෙම ආකෘති මඟින් ජනනය කරන ලද අවදානම් ඛේතයන් කේන්ද්‍රීක බැංකු පද්ධතියට ඇතුළත් කරන ලදී. බැංකුව විසින් යොදා ගනු ලබන අවදානම් පාදක මිලකරණ ක්‍රමවේදය අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධතාවය මත අවශ්‍ය අවධාරණය යොදයි.මෙය වත්කම් මිලකරණයෙහි ඒකාකාර බව ප්‍රවර්ධනය හා පාලනය කොට අවම්ල කරන ලද අවදානම් අසමානුපාතික පංගුවක් ඇති වීම වළක්වනු ඇත. ණය හානි අවම කිරීමේ කාර්යයන් සඳහා ඇප දේපළ භාවිතා කෙරෙන අතර, එමඟින් ඇති විය හැකි අලාභයන් අවම කෙරේ.ණය ගැනුම්කරුගේ තත්ත්වය, තිබෙන වත්කම්, සහ ණය වගකීම්වල ව්‍යුහය හා කාලය අනුව ඇපය විවිධ ස්වරූපයේ වීවා විය හැකිය.අදාළ පාලන ප්‍රතිපත්ති හා ප්‍රමිති තුළ නියම කර ඇති අයුරින්, ඇපය නිතිපතා තක්සේරු කිරීමට යටත් වේ.
ණය කළඹ කළමනාකරණය	අඩු අවදානම්	බැංකුවෙහි ණය කළඹ පහත නිරූපනය කර ඇති පරිදි විවිධ භූගෝලීය කලාප හරහා විවිධාංගීකරණය කොට ඇත.
සංකේන්ද්‍රණ අවදානම ● භූගෝලීය සංකේන්ද්‍රණය		බස්නාහිර පළාත මත සැලකිය යුතු සංකේන්ද්‍රණය වීමක් ඇත්තේ ආර්ථිකයට හා සමස්තයක් වශයෙන් රටට ප්‍රතිලාභ ගෙන දීමට අපේක්ෂිත වර්ධිත යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා රාජ්‍ය ව්‍යාපාර හා රජය කෙරෙහි නිරාවරණය වීම හේතුවෙනි.




ණය කළඹෙහි සංකේන්ද්‍රණ අවදානම නිරීක්ෂණය කරනු පිණිස, තනි ණය ගැනුම්කරුවන්, හෝ එකට සම්බන්ධ ණය ගැනුම්කරුවන් කණ්ඩායම්, අදාළ කර්මාන්තය, ක්ෂේත්‍රය සහ අදාළ නිෂ්පාදනය සඳහා අවදානම් අභිරුචි සීමාවන් නියම කෙරේ. මෙම සීමාවන් වාර්ෂිකව සමාලෝචනය කොට අනුමැතිය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ

අවදානම	තත්ත්වය	ගනු ලබන ක්‍රියාමාර්ග/ හානි අවම කිරීම
සංකේන්ද්‍රණ අවදානම ● කර්මාන්ත අනුව	මධ්‍යම අවදානම	මෙම බැංකුවේ ණය සංකේන්ද්‍රණය ජාතික න්‍යායපත්‍රයට රුකුලක් වීම කරා සංචලනය වෙමින් ඇත. ඒ අනුව සය වැදෑරුම් ආර්ථික කේන්ද්‍ර මත වැඩි අවධාරණයක් යොදා ඇත.මෙම ණය දීමනා බොහොමයක් යටිතල පහසුකම් ආශ්‍රිත ඒවා වන බැවින් ඇපකැපවීම් මත ඇති වූ පසුබෑම ඉදිරි වර්ෂවලදී කර්මාන්ත අනුව සංකේන්ද්‍රණය වන ආකාරය වෙනස් කෙරෙනු ඇත.



වත්කම් භාණ්ඩාගාරණය	මධ්‍යම අවදානම	



කර්මාන්තය සමඟ දිශාගතව, ජාත්‍යන්තර වෙළඳපලේ පහළ යන රන් මිළගණන් බැංකුවේ රන් උකස් තැබීම ආශ්‍රිත වත්කම්වල තත්ත්වයට අහිතකර ලෙස බලපෑවේය. මෙමඟින් 2012 වර්ෂයේ 2.76 % ට සාපේක්ෂව 2013 වර්ෂයේ අක්‍රීය අත්තිකාරම් 4.32 % දක්වා වැඩි වීමක් ඇති කෙරුණි. ණය හා ආපසු අයකිරීමේ කණ්ඩායම්වල සමායෝජිත ප්‍රයත්නවල ප්‍රතිඵලයක් වශයෙන් අක්‍රීය අත්තිකාරම් අනුපාතය කර්මාන්තයේ සාමාන්‍ය අගය වන 5.6 % ඇතුළත පවත්වා ගෙන යාමට බැංකුව සමත් විය.


උකස් අවදානමට නිරාවරණය වීම අවම කරනු පිණිස බැංකුව විසින් සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී.

වෙළඳපල අවදානම කළමනාකරණය

පොළී අනුපාතික, විදේශ විනිමය අනුපාතික, ප්‍රාග්ධන කොටස් මිල ගණන් හා භාණ්ඩ මිලගණන් සහ ඒවායේ ගම්‍ය විචල්‍යතාවයන් වැනි වෙළඳපල වෙනස්වීම්වලින් ඇති වන බැංකුවේ වත්කම් හා බැරකම්වල අගයෙහි අහිතකර වෙනස්කම් සඳහා ඇති විභවය වෙළඳපල අවදානම වේ.

වෙළඳපල අවදානම කළමනාකරණය කිරීමේ මූලික අරමුණ වනුයේ අපගේ ව්‍යාපාරික ඒකක අවදානම්-ප්‍රතිලාභ සබඳතාවය ප්‍රශස්ත කරන බවටත්, අපගේ අවදානම් අභිරුචියේ සීමාවෙන් පිටත අහිතකර අලාභයන්ට අප නිරාවරණය නොවන බවටත් වග බලා ගැනීමයි.

අවදානම	තත්ත්වය	ගනු ලබන ක්‍රියාමාර්ග/ හානි අවම කිරීම
අහිතකර පොළී අනුපාතිකවල අවදානම	අඩු අවදානම	බැංකුවේ ණය දීම්, අරමුදල් සම්පාදන හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් පැන නගින පොළී අනුපාතික අවදානම කළමනාකරණය කෙරෙනුයේ බැංකුවේ ආදායම හා ශුද්ධ වටිනාකම කෙරෙහි ඇති අවදානම කළමනාකරණය කරනු පිණිස නිර්මාණය කෙරෙන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිවලට හා සීමා රාමුවට අනුකූලවය. වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුව (ALCO), වත්මන් හා අපේක්ෂිත ව්‍යාපාර සැලකිල්ලට ගෙන පොළී අනුපාතික හා ද්‍රවශීලතා පරතර තත්ත්වයන් නිරීක්ෂණය හා සමාලෝචනය කිරීම, පොළී අනුපාතික පිළිබඳව අදහස් සැකසීම, ආදර්ශ ආකෘතික ණය දීම හා පාදක අනුපාතික නියම කිරීම, වත්කම් හා බැරකම් කළමනාකරණ උපාය මාර්ග නිර්ණය කිරීම සිදු කරයි.
අසාමාන්‍ය විදේශ විනිමය උච්ඡාවචනයන් වෙතින් වූ අවදානම්	අඩු අවදානම	විදේශ විනිමය අවදානමේ විචල්‍යතාවය කළමනාකරණය කරනු ලබනුයේ පරිපූර්ණ ගනුදෙනු හා තත්ත්වයන් පාදක කර ගත් සීමා රාමුවක් හරහාය. එම රාමුවට සාපේක්ෂව නිතිපතා නිරීක්ෂණ සිදු කරනු ලැබේ. ප්‍රතිපාර්ශ්ව සීමාවන්, මුදල් වෙළඳපල සීමාවන්, අවදානම් අභිරුචිකත්ව සීමාවන්, සහ අවදානමෙහි අගය (VaR) මිනුම් හරහා විදේශ විනිමය අවදානම දිනපතා නිරීක්ෂණය කෙරේ.කවර හෝ සීමා ව්‍යාතිරේඛයන් අදාළ උසස් බලධාරීන්ගේ අනුමැතිය සඳහා ඔවුන් වෙත නිසි පරිදි වාර්තා කරනු ලබන බවට ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)සහතික වෙයි. විදේශ විනිමය තත්ත්වයන් කාල්පනික ආයෝජන කාර්යයන් නිසා නොව, සේවාලාභී ව්‍යාපාරයන් සඳහා පහසුකම් සැලැස්වීමේදී පැන නගින බවට වග බලා ගනු ලැබේ. තවදුරටත් විවෘත තත්ත්වයන් නියම කර ඇති මහ බැංකු සීමාවන්ට බොහෝ පහළින් පවත්වා ගෙන යනු ලැබේ.
සමකොටස් තුළ ආයෝජනය වෙතින් පැන නගින අවදානම	අඩු අවදානම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට ඇති ගනුදෙනු කෙරෙන සමකොටස් කළඹ පිළිබඳ සීමාවන් ඇතුළත ආයෝජන සිදු කරනු ලැබේ. බැංකුවේ ගනුදෙනු කෙරෙන කොටස් කළඹ තුළ දරනු ලබන සමකොටස් සුරුකුම්වල අගය සෘජුවම සමකොටස් සුරුකුම් මිලගණන්වලට යාවී ඇති අතර, වැඩි/අඩු වීම් වෙළඳපල ක්‍රියාවලියෙහි දෛනික ලකුණු තුළ හඳුනා ගනු ලැබේ ඉදිරි කාර්යාලයෙන් ස්වායත්ත මැදි කාර්යාලය කළඹ පදනම්න් විවිධ අවදානම් ප්‍රමාණීකරණය කිරීම මඟින් ආයෝජන අධීක්ෂණය කරයි. ආයෝජන ප්‍රතිපත්තිය තුළ නියම කර ඇති සීමාවන්, අවදානම් රුචිකත්ව සීමාවන් හා අවදානමේදී අගය මිනුම් හරහා බැංකු සමකොටස් අවදානම නිරීක්ෂණය කරයි. සියළුම ආයෝජනයන් අනුමත කරනු ලබන්නේ නිතිපතා රැස්වන ආයෝජන කමිටුව විසිනි.




ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම වනාහි ගෙවීමට බැඳී සිටින දිනය වන විට ගෙවීමට නොහැකි වීම හෝ අධික පිරිවැයක් දරා පමණක් ගෙවීමට හැකි වීම මඟින් ඇති විය හැකි අවදානමයි. වත්කම් සහ බැරකම් කළමනාකරණ ඒකකය (ALM) සමඟින් වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුව (ALCO) බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණය සඳහා වගකීම දරයි.

තැන්පත්කරුවන්ගේ හා ප්‍රතිපාර්ශ්වකරුවන්ගේ විශ්වාසය පවත්වා ගැනීම, සිය අරමුදල්වල පිරිවැය කළමනාකරණය කර ගැනීම මෙන්ම අහිතකර තත්ත්වයන් යටතේ පවා කේන්ද්‍රික ව්‍යාපාරය අඛණ්ඩව කර ගෙන යාමට බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව ඉතා වැදගත් සාධකයක් වී ඇත.

වෙළඳපල ප්‍රවණතා පූර්ව-අපේක්ෂණය කිරීමට හා එම අභියෝගයන්ට මුහුණ දීමට කළමනාකාරිත්වයට ඇති හැකියාව බැංකුවෙහි ආත්ම-විශ්වාසය පවත්වා ගැනීමෙහිලා සාර්ථකත්ව සාධකයක්ව පවතී. 2013 දෙසැම්බර් 31 දිනට ද්‍රවශීල වත්කම් අනුපාතය 27.8% (2012-21.8%) ක්ව පැවති අතර එය මහ බැංකු මාර්ගෝපදේශයන්ට වඩා ඉහළ අගයකි. මෙය ප්‍රධාන වශයෙන්ම බැංකුව විසින් ඇ.ඩො මිලියන 500 ක බැඳුම්කර අර්පණය සහ රු.බිලියන 8 ක දේශීය මුදල් ණයකරය හරහා බාහිර ආයෝජන අරමුදල් පැතීම නිසා ඇති වූවකි. මෙය අපට යටිතල පහසුකම් සඳහා අරමුදල් සම්පාදනයට යොමු වීම වැඩි කරන අතරේ ඇති වූ කල්පිරීමේ නොගැලපීම තුනී කර ගැනීමට අපට උපකාරී වන සම ප්‍රමාණයේ දීර්ඝ කාලීන අරමුදල් ලබා ගැනීමට හැකියාව ඇති කළේය.

අවදානම	තත්ත්වය	ගනු ලබන ක්‍රියාමාර්ග/ හානි අවම කිරීම
ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් නොතිබීමේ අවදානම	අඩු අවදානම	මිනුම හා ආකෘතිකරණය බැංකුවේ වත්කම් හා බැරකම් ව්‍යුහය තක්සේරු කරනු පිණිස බැංකුව ප්‍රධාන වශයෙන් භාවිතා කරනුයේ, මුදල් ඇතුළට හා පිටතට ප්‍රවාහය වන ප්‍රමාණයන් පිළිබඳව පුරෝකථනය කරන, පරිනති විශ්ලේෂණ (ගැප්) විශ්ලේෂණයයි.ද්‍රවශීලතා අවදානම විචක්ෂණීය ලෙස කළමනාකරණය කරනු පිණිස මුඛ්‍ය ද්‍රවශීලතා අනුපාතයන් ද නිරීක්ෂණය කරනු ලැබේ. වාර්තාකරණය: ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)විශ්ලේෂණ, අවදානම් මිනුම්, අවදානම් හානි අවමකාරකයින් හා ආතති පරීක්ෂණ ප්‍රතිඵල මඟින් වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුව (ALCO) හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හට උපකාර කරමින්, සියළුම සැලකිය යුතු ද්‍රවශීලතා අවදානම් පිළිබඳව ස්වාධීන අධීක්ෂණයක් ලබා දෙයි. ආතති පරීක්ෂාව: ද්‍රවශීලතා බාධකයන් මත කර්මාන්තයට හා බැංකුවට විශේෂිත ආතති සිද්ධිරූපන ඵල නිර්ණය කරනු පිණිස කාලීන ආතති පරීක්ෂාවන් සිදු කෙරේ. අනපේක්ෂිත තත්ත්ව සැලසුම්කරණය: මෙම බැංකුව ගනුදෙනුකාර බැංකු හරහා අරමුදල් සම්පාදන මාර්ග ගණනාවක් පිහිටුවා ඇති අතර, සෑම විටම ද්‍රවශීලතා අවශ්‍යතාවන්ට මුහුණ දෙනු පිණිස රජයේ බැඳුකර වැනි උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් පවත්වා ගෙන යයි. වෙනත් බැඳීම් වලට යටත් නොවූ සුරැකුම් ස්වරූපයෙන් ද්‍රවශීලතා අතිරික්තයක් පවත්වා ගෙන යාමට පියවර ගෙන ඇත.  අරමුදල් සම්පාදනය සඳහා ඇති වෙනත් බැඳීම් වලට යටත් නොවූ සුරැකුම් (රු. මිලියන) අරමුදල් විවිධාංගීකරණය: දේශීය මෙන්ම ගෝලීය මූල්‍ය වෙළඳපලවල් වෙත පිවිසෙනු පිණිස විවිධ අරමුදල්කරණ ක්‍රම ගණනාවක් භාවිතා කරමින් මෙම බැංකුව සිය තොග අරමුදල්කරණ කටයුතු විචක්ෂණීය ලෙස විවිධාංගීකරණය කරන අතර, විවිධ කාලපරිච්ඡේදයන්, මුදල් ඒකක සහ ආයෝජක පංති සිසාරා අරමුදල් ජනනය කරයි.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවූ හෝ අසාර්ථක අභ්‍යන්තරික ක්‍රියාවලීන්,පුද්ගලයින් හෝ පද්ධති වෙතින්, එසේත් නැති නම් බාහිර සිදුවීම්වලින් ඇති වන අලාභය පිළිබඳ අවදානමයි. මෙයට නෛතික අවදානමද ඇතුළත් වන නමුත්, උපායමාර්ගික අවදානම හා කීර්තිනාම අවදානම අයත් නොවේ.

මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීමේ ප්‍රාථමික අරමුණ වන්නේ ව්‍යාපාරික හා උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉඩ සලසන අතරම මෙහෙයුම් අවදානම හඳුනා ගන්නා, තක්සේරු කෙරෙන හා පිළිගත හැකි මට්ටම්වලට සමනය කෙරෙන බවට වග බලා ගැනීමයි.

පරිපූර්ණ ප්‍රතිපත්ති, ප්‍රමිති හා මෙහෙයුම් මාර්ගෝපදේශක කට්ටලයකින් සමන්විත ශක්තිමත් කමිටු ව්‍යුහයකින් මෙහෙයුම් අවදානම් කළමනාකරණය පාලනය වේ. ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) ප්‍රධානත්වය දරන මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC), සියළුම මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාරණාවන් සඳහා වූ ප්‍රධාන තීරක කමිටුව වෙයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC)ව්‍යාපාරික මාර්ගවලට මෙහෙයුම් අවදානම් තක්සේරු, මිනුම්, සමනය හා වෙනස්වන මූලකෘත්‍යයන් නිරීක්ෂණය පිළිබඳ උපදෙස් හා මාර්ගෝපදේශකත්වය ලබා දෙයි.


සමාලෝචිත වර්ෂයේදීද ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) සියළුම වැදගත් නිපැයුම්, ක්‍රියාකාරකම්, ක්‍රියාවලි හා පද්ධති හරහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව සඳහා සුදුසු යටිතල පහසුකම් ගොඩනැගීය. බැංකුවේ අභ්‍යන්තර ඒකක හා මෙහෙයුම් අවදානම් කළමනාකරණ සිද්ධි වෙතින් ලැබෙන වාර්තා විශ්ලේෂණය කිරීම සිදු කොට, මෙහෙයුම් අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් කාර්යපටිපාටි ඇති කිරීම හා යාවත් කිරීම සිදු කිරීමෙන් අධි අවදානම් ක්ෂේත්‍ර සඳහා ප්‍රතිකර්ම නිර්දේශ කරයි.

වර්ෂය තුළ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) අභිනව උගස් මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙහි ක්‍රියාකාරී ලෙස නියැළුණි. මෙම ක්‍රියාකාරකම්වලට ඇතුළත් වූයේ:

- පද්ධති කාර්යපටිපාටි වලංගු කිරීමට පෙර ඒවා සමාලෝචනය කිරීම
- එමඟින් ඇති වන අවදානම් හා එයට සරිලන හානි අවම කරන පාලකයන් පෙන්වා දීම
- ක්‍රියාත්මක කිරීමෙන් පසු කාර්යසාධනය තක්සේරු කිරීම.


අවදානම	තත්ත්වය	ගනු ලබන ක්‍රියාමාර්ග/ හානි අවම කිරීම
දැනට භාවිතා කෙරෙන මෙහෙයුම් අවදානම් ශිල්පක්‍රම	අඩු අවදානම	ශිල්පක්‍රම කීපයක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ඒවා නම්: ප්‍රමුඛ අවදානම් දර්ශක (KRI) යන්න නර්වචනය කෙරෙනුයේ බැංකුවේ අවදානම් තත්ත්වය පිළිබඳ අන්තර් දසුනක් ලබා දිය හැකි (බොහෝ විට මූල්‍යමය) සංඛ්‍යා දත්ත හෝ න්‍යාසයක් වශයෙනි.බැංකුවට ඇති වීමට ඇති ගැටළු කාලෝචිත ආකාරයකට අනතුරු ඇඟවීමට ප්‍රමුඛ අවදානම් දර්ශක (KRI) භාවිතා කෙරේ.මෙම දර්ශක බැංකුවේ පාලන සංස්කෘතිය මෙන්ම මෙහෙයුම් අවදානම් පැතිකඩ නිරීක්ෂණය කිරීමටත්, අවදානම් සමනය කරන ක්‍රියාමාර්ග ක්‍රියා ගැන්වීමටත් ඉඩ සලසයි. බැංකුව ශාඛා මට්ටමේ ප්‍රමුඛ අවදානම් දර්ශක (KRI) ග්‍රහණය හා නිරීක්ෂණය කොට, ත්‍රෛමාසිකව විවිධ කළමනාකාරිත්ව මට්ටම් හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත වාර්තා කරයි. අවදානම් හා පාලන ස්වයං තක්සේරුව (RCSA) වනාහි බැංකුව සිසාරා මෙහෙයුම් අවදානම මෙන්ම එම අවදානම් කළමනාකරණය කරනු පිණිස නර්මාණය කරන ලද අභ්‍යන්තර පාලනවිධි සමාලෝචනය හා තක්සේරු කිරීම සිදු කෙරෙන ක්‍රමවේදයකි. අවදානම් හා පාලන ස්වයං තක්සේරු (RCSA)ක්‍රියාවලිය සිදු කිරීමේදී මෙම බැංකුව පහළ සිට ඉහළට යන ප්‍රවේශයක් භාවිතා කරයි. හඳුනා ගනු ලබන ගැටළු නිරාකරණය කරනු පිණිස අවදානම් හානි අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉහළ අවදානම් විභවයක් සහිත ක්ෂේත්‍රයන්හි අවදානම් හා පාලන ස්වයං තක්සේරුව (RCSA) යටත් පිරිසෙයින් වාර්ෂිකව සිදු කෙරේ. අභ්‍යන්තර හානිවු දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය (ILDCA) බැංකුවේ මෙහෙයුම් අවදානම්වලට නිරාවරණය හා අභ්‍යන්තර පාලනවිධිවල සඵලදායිත්වය තක්සේරු කිරීම සඳහා අර්ථාන්විත තොරතුරු ලබා දෙයි.''මෙහෙයුම් අලාභ සිදුවීම්වල'' සහ ''ව්‍යාපාර කටයුතු අඩාල කරන සිදුවීම්වල'' වාර්තාකරණ යාන්ත්‍රණය මඟින් කළමනාකාරිත්වයට සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (IRMC) විස්තරාත්මක විශ්ලේෂණ හා කාලෝචිත තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇති කෙරේ. අභ්‍යන්තර අලාභ සිදුවීම් සම්බන්ධයෙන් ක්‍රමානුකූල අවදානම් විශ්ලේෂණ, මූල හේතු විශ්ලේෂණ හා උගත් පාඩම් අභ්‍යාස සිදු කෙරේ.බැංකු කර්මාන්තයේ සිදු වන බාහිර සිදුවීම් පිළිබඳ විශ්ලේෂණයන් සිදු කෙරෙනුයේ නෛසර්ගික අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහ සුදුසු අවදානම් හානි අවම කරන ක්‍රියාමාර්ග නිර්ණය කිරීමටත්ය.

අවදානම	තත්ත්වය	ගනු ලබන ක්‍රියාමාර්ග/ හානි අවම කිරීම
දුර්වල අභ්‍යන්තර පාලන විධිවලින් පැන නගින අවදානම්	අඩු අවදානම	අභ්‍යන්තර අනතුරු ඇඟවීමේ හැකියාව




ඉපැයීම්, මූලධනය හා ද්‍රවශීලතාව මත අහිතකර වාතාවරණයන්ගේ බලපෑම විශ්ලේෂණය කරනු පිණිස බැංකුව අභ්‍යන්තර හා බාහිර අලාභ තොරතුරු පිළිබඳව සිද්ධිරූපණ විශ්ලේෂණය හා ආතති පරීක්ෂාව සිදු කරයි.

අලාභ ව්‍යාප්ති ප්‍රවේශය යටතේ ප්‍රාග්ධන ගණනයන්ට උපකාර කරනු පිණිස 8 x 7 පරීක්ෂාව ආකෘතියක් (වීනම් අවදානම් සිදුවීම් ප්‍රභේදය හා ව්‍යාපාරික අංශය) භාවිතා කරමින් පරිපූර්ණ මෙහෙයුම් අලාභ දත්ත සමුදායක් පවත්වා ගෙන යාම සිදු කෙරේ.



සිදු වන සුලභතාව

- බාහිර වංචා
- ක්‍රියාවේ යෙදවීම්, සේවා සැලසීම් හා ක්‍රියාවලි කළමනාකරණය
- අභ්‍යන්තර වංචා
- රැකී රක්ෂා පිළිවෙත් හා රැකියාවේදී ආරක්ෂාව
- ව්‍යාපාරික කටයුතු ඇණහිටීම් සහ පද්ධති බිඳවැටීම්
- සේවාලාභීන්, නිපැයුම් හා ව්‍යාපාරික පිළිවෙත්
- භෞතික වත්කම්වලට හානි



අවදානම් සිදුවීම්වල තදබල බව

- බාහිර වංචා
- ක්‍රියාවේ යෙදවීම්, සේවා සැලසීම් හා ක්‍රියාවලි කළමනාකරණය
- අභ්‍යන්තර වංචා
- රැකී රක්ෂා පිළිවෙත් හා රැකියාවේදී ආරක්ෂාව
- ව්‍යාපාරික කටයුතු ඇණහිටීම් සහ පද්ධති බිඳවැටීම්
- සේවාලාභීන්, නිපැයුම් හා ව්‍යාපාරික පිළිවෙත්
- භෞතික වත්කම්වලට හානි

අනුකූලතා අවදානම

අනුකූලතා අවදානම යනු බැංකුවක් එහි ක්‍රියාකාරකම්වලට අදාළ වන නීතිරීති, රෙගුලාසි, නියමයන් ආශ්‍රිත ස්වයං නියාමන, සංවිධාන ප්‍රතිති හා ආචාර ධර්ම සංග්‍රහය පිළිපැදීමට අසමත් වීම නිසා එය නෛතික හෝ නියාමන සම්බාධක, මූල්‍ය අලාභ හෝ කීර්තිය අහිමි වීම අත්විඳීමට ඇති අවදානමයි. ගෝලීය මූල්‍ය අර්බුදයෙන් (GFC) පසු යුගයේදි වඩා දැඩි භාවයක් හා අතිරේක නියාමනයක් මූල්‍ය සේවා අංශයට හඳුන්වා දෙන ලදී. එමඟින් නව රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට උත්සුක වන අතරේ බැංකුව තුළ පිළිපැදීම් අභියෝගය වඩා යහපත් තත්ත්වයට පත් වී ඇත.

දැනටමත් ස්ථාපිතව ඇති ශක්තිමත් පදනම් මත ගොඩනගමින්, නව රෙගුලාසි ක්‍රියාත්මක කිරීම පිළිබඳ විවිධ අදියරවල බැංකුව පසු වෙයි. පිළිපැදීම් වැඩසටහනට පිළිපැදීම් ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි, පුහුණුව, රැකවල, පරීක්ෂාව, පද්ධති හා පාලන කාර්යයන් ඇතුළත් වන අතර, ඒ එක එකක් සඳහා බැංකුවේ පිළිපැදීම් පරමාර්ථවලට උපකාරී වීමට හා මෙහෙයවීමට නිර්මාණය කරන ලද විශේෂිත කාර්යභාරයකින් සමන්විතය.

අනුකූලතාවය

බැංකුවේ පිළිපැදීම් කාර්යයන් සිදු කෙරෙනුයේ 2005 අංක 25 දරන ත්‍රස්තවාදී මූල්‍ය සම්පාදන මර්ධන සම්මුතිය පනත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ මර්ධන පනත (PMLA), 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත (FTRA) සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකුවල ගනුදෙනුකාර ප්‍රඥප්තිය ඇතුළු අදාළ සියළු නීතිරීති, රෙගුලාසි හා මාර්ගෝපදේශ පිළිපදිමිනි. දත්ත ලබා ගැනීමේදී හා නියාමන බලධාරීන් වෙත ඒවා සම්ප්‍රේෂණය කිරීමේදී යොදා ගනු ලබන පිළිපැදීම් කාර්යයන්, පද්ධති හා කාර්යපටිපාටි,පාරිසරික ක්‍රියාකාරකම් කෙරෙහි සංවේදීතාව සහ නියාමන බලධාරීන් සමඟ පවත්වා ගෙන යන යහපත් සම්බන්ධීකරණය හා සබඳතාවය යන මේවා පූර්ණ ලෙස පිළිපැදීමේ අවසන් පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා ඉවහල් වෙයි.

2012/2013 වසර වලදී හඳුන්වා දුන් රෙගුලාසි වලට දක්වන ලද අනුකූලතාව

නිකුත් කළ දිනය	අනිවාර්ය රෙගුලාසි/විධානයන්/නිර්ණයන්	බැංකුවේ වත්මන් තත්ත්වය
2013 ජූනි 17	ශ්‍රී ලංකාව විදේශ විනිමය තහංචි මාලාවක්ම ලිහිල් කළේය. ඒ අනුව, බැංකු මට්ටමෙන් විනිමය පාලන රෙගුලාසි සඳහා පිළිපැදීම් භාර, එයටම කැප වූ පිළිපැදීම් නිලධාරියකු පත් කිරීමට මහ බැංකුව තීරණය කළේය. - බැංකු පනත යටතේ රෙගුලාසිය පී.එස්./21/98.	2013 ජූනි 28 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම කාර්යභාරය සහකාර ප්‍රධාන කළමනාකාර (පිළිපැදීම්) වෙත පවරන ලදී.
2013	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු සඳහා අභිනවයෙන් හඳුන්වා දෙන ලද අවදානම් පාදක විමර්ශන ක්‍රියාවලිය. බැංකු විමර්ශනය වෙත නව ප්‍රවේශයකි.	බැංකුව සාර්ථක ලෙස ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ අනුව යමින් පුළුල් අවදානම අවම කිරීමේ ක්‍රියාවලියක් සංවර්ධනය කරන ලදී
2013	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද වෙනත් නියාමන වෙනස්කම්	බැංකුව එම වෙනස්කම් සපුරාලනු පිණිස ක්‍රියාමාර්ග ගන්නා ලදී

යහපත් පිළිපැදීම් වැඩසටහන පවත්වාගෙන යාමට බැංකුවේ සේවක පිරිස් දැනුවත් කිරීම අත්‍යවශ්‍යය. වර්ෂය තුළ සේවකයින්ට ගනුදෙනුකාර ප්‍රඥප්ති වගකීම් පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි වනු පිණිස හා ඔවුන්ගේ රැකියාවලට ඍජුවම බලපාන දැනුම වර්ධනය කරනු පිණිස සියළු පළාත්වල 1600 දෙනකු සඳහා පුහුණු වැඩසටහන් 22 ක් පවත්වන ලදී.

මුදල් විශුද්ධිකරනය වැළැක්වීම (AML) ත්‍රස්තවාදය සඳහා මුදල් සම්පාදනය කිරීම පිටුදැකීම (CTF)'

ව්‍යවස්ථාපිත හා නියාමන බලධාරීන් විසින් ක්‍රියාවේ යොදවනු ලබන හා එමඟින් ඉහළ මට්ටමේ ආචාරධර්මානුකූල හා පිළිපැදීම් මෙහෙයුම් පරිසරයක් සහතික කරන රෙගුලාසි,'ඔබේ ගනුදෙනුකරු හඳුනා ගැනීමේ (KYC) පිළිවෙත, මුදල් විශුද්ධිකරණ විරෝධී සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම මර්ධනය කිරීම පිළිබඳ නීතිරීතිවලට මෙම බැංකුව තදබල ලෙසම අනුගත වෙයි.

වත්මන් 'ඔබේ ගනුදෙනුකරු හඳුනා ගැනීමේ (KYC) ප්‍රතිපත්තිය සඳහා ගනුදෙනුකාර දත්ත හා තොරතුරු රැස් කිරීම, තබා ගැනීම හා නිසි කලට පවත්වා ගෙන යාම අවශ්‍ය කෙරෙන අවදානම් පාදක ප්‍රතිපත්ති, කාර්යපටිපාටි හා ක්‍රියාවලි අවශ්‍ය වේ.

බැංකුවේ ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි නව රෙගුලාසි අනුව සමාලෝචනය හා යාවත් කිරීම සිදු කෙරුණි. බැංකුව ආශ්‍රිත සියළු ලිපි හුවමාරු සබඳතා ඇතුළුව සියළු ලංකා බැංකු ගනුදෙනුකරුවන් සඳහා ශක්තිමත් 'ඔබේ ගනුදෙනුකරු හඳුනා ගැනීම ' (KYC) / 'ගනුදෙනුකරු පිළිබඳ නිසි සුපරීක්ෂාව' (CDD) පිළිබඳ ක්‍රියාමාර්ග යොදා ඇත. මුදල් විශුද්ධිකරනය හා ත්‍රස්තවාදී මූල්‍ය සම්පාදනය පාලනය කරනු පිණිස ඒ සඳහාම වෙන් වූ දියුණු මෘදුකාංගයක් හඳුන්වා දීම සඳහා පිළිපැදීම් ඒකකය කටයුතු කරමින් සිටී.

ආකෘති අවදානම

ලාභදායකත්වය, වටිනාකම හා අවදානම මැනීම පිළිබඳ සියළු අංශයන්හිදී ආකෘති භාවිතා වීම ව්‍යාප්ත වීම මඟින් ආකෘතිවලට ව්‍යාපාරික තීරණ දියුණු කිරීමට හැකි ප්‍රමාණය පිළිබිඹු වෙයි. කෙසේ වුවත් ආකෘති පැමිණෙන්නේ ඒවායේ නෛසර්ගික අවදානමිද සමඟය. මෙම අවදානම් හානි අවම කරනු පිණිස වලංගුකරණ ක්‍රියාවලි අවශ්‍යය. වලංගුකරණය වනාහි අභ්‍යන්තරික ආකෘති පරිපාලනය පිළිබඳ ප්‍රමුඛ සංරචකයකි. එම අවදානම් ආවරණය කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වලංගුකරණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර තිබේ.

තොරතුරු පද්ධතියේ ආරක්ෂාව

අහඹු ලෙස හෝ හිතාමතා කෙරෙන විනාශය, විකෘතිය, අනවසර භාවිතය හා රහස්‍යභාවය උල්ලංඝණය කිරීම කෙරෙන් තොරතුරු ආරක්ෂා කෙරෙන බවට බැංකුව වග බලා ගැනීම අත්‍යවශ්‍ය වේ. බැංකුවට මෙන්ම එහි කොටස්කරුවන්ට බැංකුව සවි ගන්වන ප්‍රගමණයන්ගෙන් ප්‍රතිලාභ ලැබීමට නම්, ආරක්ෂිත සන්නිවේදනය අවශ්‍ය වේ. බැංකුව අයි.එස්.ඕ 27001 ප්‍රමිතිය මත පදනම්ව සංවර්ධනය කරන ලද ආරක්ෂක ප්‍රතිපත්තියක්, කාර්යපටිපාටි හා මාර්ගෝපදේශ ස්ථාපිත කළේය. ප්‍රධාන කළමනාකාරතුමා ප්‍රධානත්වය දරන ආයතනික තොරතුරු ආරක්ෂක කමිටුව (CISC) බැංකුවේ තොරතුරු ආරක්ෂක මූලකෘත්‍යයන් මෙහෙයවයි.

ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම

ව්‍යාපාරික අඛණ්ඩතා කළමනාකරණ ප්‍රතිපත්තිය විශේෂිතවම ව්‍යාපාර කටයුතු බිඳවැටීමේ අවදානම පිළිබඳව කටයුතු කරන අතරම, ගනුදෙනුකරුවන්ට හා මූල්‍ය වෙළඳපල සහභාගිකයින්ට අතිශයින්ම අත්‍යාවශ්‍ය වැදගත් මූල්‍ය සේවාවන් අඛණ්ඩව ලැබෙන බවට සහතික වන රාමුවක් ස්ථාපනය කරයි.

ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම (BCP) මඟින් සියළු තීරණාත්මක ව්‍යාපාරික අංශවල ව්‍යාපාරික අඛණ්ඩතාව සහතික කරනු පිණිස අවශ්‍ය කරන විෂයපථය, උචිත වගකීම්, අභිප්‍රාය, අධිකාරි බලය හා සබඳතා නිර්වචනය කෙරේ.එය සියළුම ව්‍යාපාරික ඒකක ස්වකීය කර්තව්‍යයන් සඳහා 'ඒකක ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්මක්' සංවර්ධනය කරන බවට සහතික වෙයි. සමාලෝචිත වර්ෂය තුළ අත්හදා බැලීම් දෙකක් සාර්ථකව සිදු කරන ලදී. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම (BCP) ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කරන අතර, මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC) හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත නිතිපතා වාර්තා කරයි.

බැංකුවේ ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්මේ (BCP) ප්‍රමුඛ අවශ්‍යතාවයක් වශයෙන්, පරිපූර්ණ ව්‍යසන ප්‍රකෘතිකරණ මධ්‍යස්ථානයක් කොළඹ නගර සීමාවෙන් පිටත පිහිටුවා ඇති අතර එය විවිධ සිද්ධිරූපණවලින් පූර්ව-නිර්ණිත සිදුවීම්වලදී ප්‍රමුඛ මෙහෙයුම් අඛණ්ඩව සිදු කිරීමට පහසුකම් සලස්වන විකල්ප විධිවිධානවලින් සමන්විතය.

රක්ෂණය

පාලනය කළ නොහැකි මූලාශ්‍රවලින් වන අධික අවදානම්වල හානිය අවම කිරීමට මෙම බැංකුව අවදානම් සංක්‍රාමණ ක්‍රමෝපායක් වශයෙන් රක්ෂණ ලියැවිලි භාවිතා කරයි. අවදානම් සංක්‍රාමණය වනාහි යම් විශේෂිත සිදුවීම්වල නොදන්නා මූල්‍ය බලපෑම දන්නා මූල්‍ය පිරිවැයකට තුන්වන පාර්ශ්වයක් සමඟ හුවමාරු කර ගැනීමේ මාර්ගයකි. බැංකුවේ සීබෑන්ක් ඉන්ෂුවරන්ස් සර්විසස් යුනිට් නමැති රක්ෂණ සේවා ඒකකය විවිධ බැංකු මෙහෙයුම්වලට අදාළ අවදානම තක්සේරු කොට එම අවදානම් ප්‍රමාණවත් ලෙස ආවරණය කරනු පිණිස කීර්තිමත් රක්ෂණ සේවා සම්පාදකයින් වෙතින් රක්ෂණ ආවරණය ලබා ගනී.

බැහැර මූලාශ්‍රණය

සේවා සම්පාදකයින් පරිපූර්ණ ලෙස ඇගැයීමෙන් පසුව, ස්ථාවර මෙන්ම ප්‍රවර්තන වියදම අඩු කර ගනු පිණිස සහ විශේෂඥතාඥානය හෝ සම්පත් මඳකම පිරිමසනු පිණිස යම් කාර්යයන් බැහැරට පවරයි. මෙම බැහැර මූලාශ්‍රිත කාර්යයන් බැංකුව හා බාහිර සේවා සම්පාදකයින් අතර වගකීම් බෙදා හැරෙන ආකාරය නිරවුල්ව දක්වන බවට සහතික වන ශක්තිමත් ගිවිසුම්වලින් හෝ සේවා මට්ටම් එකඟතාවන්වලින් ආවරණය වේ.

නෛතික අවදානම

නෛතික අවදානම මෙහෙයුම් අවදානමේ නිර්වචනය ඇතුළතට වැටේ. එය පැන නඟිනුයේ අසාර්ථක අභ්‍යන්තර පද්ධති, පුද්ගලයින්, ක්‍රියාවලි හෝ බාහිර සිදුවීම් වල නෛතික බලපෑම් හේතුවෙනි. බැංකුව වෙනුවෙන් නීති කෘත්‍ය ක්‍රියාවේ යෙදවීමේ වගකීම නීති දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ප්‍රධාන නීති නිළධාරිවරයා බැංකුවේ මෙහෙයුම් අවදානම්කාරණාවල නීතිමය බලපෑම් පිළිබඳව කටයුතු කිරීමට මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුවට (ORMEC) සහාය වෙයි. 2013 වර්ෂය තුළ බැංකුව අවදානමට පත් කිරීමෙහි සමත් විශාල නෛතික කාරණා කිසිවක් නොවීය.

කීර්තිනාම අවදානම

ලොව පුරා මාධ්‍ය ආවරණය එකම මොහොතේ සිදුවන හා කීර්තිනාමය තරගකාරී වාසියේ ප්‍රමුඛ මූලාශ්‍රයක් ලෙස සැලකෙන විචිලල්‍යතාවය ගෝලීය වෙළඳපල තුළ, විශ්වාසය හා ආත්ම විශ්වාසය ප්‍රමුඛ ව්‍යාපාරික ගාමක බලයන් ලෙස වටහා ගැනේ. මහජන මුදල් පිළිබඳව කටයුතු කරන බැංකුවකට කීර්තිය ශක්ති ප්‍රභවයකි. කීර්තිනාම අවදානම් කළමනාකරණය ආයතනික විශ්වාසය පිළිබඳ කාරණයක් විය හැකි අතරම, එය අර්බුද වැළැක්වීමේ මෙවලමක සේවයද සලසයි. එම නිසා මෙම බැංකුව සංවිධානයේ සියළුම මට්ටම්වලදී ශක්තිමත් ආයතනික යහපාලන සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම මඟින් කීර්තිනාම අවදානම කළමනාකරණය කිරීමට කැප වී සිටී. බාසල් II මාර්ගෝපදේශ යටතේ වූ නිර්වචනයට අනුව, කීර්තිනාම අවදානම පිළිබඳ කටයුතු කර ඇත්තේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව ඇඟයීම් ක්‍රියාවලි (ICAAP) රාමුසැකැස්මේ කුළුණු අංක II යටතේය. කාලීනව කීර්තිනාම අවදානම තක්සේරු කරනු පිණිස බැංකුව ලකුණු පත්‍ර ප්‍රවේශයක් භාවිතා කරයි.

උපාය මාර්ගික අවදානම

උපාය මාර්ගික අවදානම පැන නඟිනුයේ උචිත ව්‍යාපාරික සැලසුම්, උපාය, තීරණ ගැනීම් හා සම්පත් ප්‍රතිපාදනය ක්‍රියාත්මක කිරීමටත් ව්‍යාපාරික පරිසරය තුළ වන වෙනස්කම්වලට අනුවර්තනය වීමටත් බැංකුව අසමත් වූ විටය.

මෙම බැංකුව කටයුතු කරනුයේ අතිශය තරගකාරී, ජවසම්පන්න හා නියාමනිත පරිසරයකය. සුලභව සිදු වන වෙනස්කම්වලට ප්‍රතිචාර දැක්වීමට නොහැකි නම්, එය බැංකුවේ ඉපයීම්, මූලධනය හා ද්‍රවශීලතාවට අහිතකර ලෙස බලපායි. බැංකුවේ ආයතනික සැලැස්ම හා ආයතනික අයවැය තුළුවහි උපාය මාර්ගික දිශානතිය මනාව විග්‍රහා කොට ඇත. තථ්‍ය කාර්යසාධනය උපාය මාර්ගික දිශානතිය සමඟ සමරූපී වන බව සහතික වනු පිණිස බැංකුව ශක්තිමත් යාන්ත්‍රණයක් පිහිටුවා තිබේ.

බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇඟයීමේ ක්‍රියාවලියේ (ICAAP) කොටසක් වශයෙන්, නියමිත කාලයකට වරක් පරාමිතීන් 5ක් සහිත ලකුණු පත්‍ර පාදක ආකෘතියක් භාවිතා කරමින් උපාය මාර්ගික අවදානම තක්සේරු කෙරේ.

උපාය මාර්ගික අවදානම් දර්ශකය 2013

අවදානම් දර්ශකය	බරතැබූ ලකුණු (%)
කර්මාන්තය/පද්ධතිය	5.25
තරඟකාරිත්වය	7.81
උපාය මාර්ගික සැලැස්ම	19.69
ප්‍රාග්ධන වෙළඳපලවලට ප්‍රවිෂ්ඨය	3.75
කළමනාකාරිත්වය	9.38
එකතුව	45.88

2013 වර්ෂයේ ප්‍රමුඛ මූලකෘත්‍ය

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇඟයීමේ ක්‍රියාවලිය (ICAAP) ආරම්භ කරන ලද්දේ 2013 වර්ෂයේදීය. මෙම බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇඟයීමේ ක්‍රියාවලියේ (ICAAP) පරමාර්ථය වන්නේ ව්‍යාපාරයේ නෛසර්ගික අවදානම් හඳුනා ගැනීම, අවදානම් පාලන හා කළමනාකරණ ප්‍රවේශය නියම කිරීම සහ බැංකුව ගන්නා අවදානම් සම්බන්ධයෙන් බැංකුව භාවිතා කරන හානි අවම කිරීම් කවරේදැයි සලකා බැලීමයි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇඟයීමේ ක්‍රියාවලි (ICAAP) ලියැවිල්ල පිළියෙළ කරන අතරේ, අපගේ ශේෂ පත්‍රය, ඉපැයීම්, ද්‍රවශීලතාව හා මූලධන තත්ත්වය මත පසුව ඇති වන නියත සිදුවීම් මඟින් ඇති කෙරෙන විභව්‍ය ඵලයන් ඇඟැයීමට ආතති පරීක්ෂාව සිදු කෙරේ.


BOC
CALADARI

මූල්‍ය තොරතුරු

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව
බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව / 212
ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම / 217
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව / 221
ස්වාධීන සහතිකවීමේ වාර්තාව / 223
අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ ප්‍රකාශය / 224
විගණකාධිපති වාර්තාව / 225
ආදායම් ප්‍රකාශය / 226
විස්තීරණ ආදායම් ප්‍රකාශය / 227
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය / 228
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය / 229
මුදල් ප්‍රවාහ ප්‍රකාශය / 230
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් / 232



ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

1 හැඳින්වීම

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ කටයුතු පිළිබඳසිය වාර්තාව සහ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන්හි අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලද, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධිත මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශ මත ඉදිරිපත් කරන විගණන වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. තවද මෙම වාර්තාව තුල, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ වන 2007 අංක 11 දරණ බැංකු පනත් විධානය සහ එහි පසුකාලීන සංශෝධනයන් මඟින් හා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති මඟින් දක්වන අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කරන හෙළිදරව් කිරීම්ද ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 13 දින සමාලෝචනය කර අනුමත කරන ලදි. 1988 අංක 30 දරණ බැංකු පනත යටතේ ස්ථාපනය කරන ලද ලංකා බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන අතර 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත යටතේ 1939 අගෝස්තු 1 දින සංස්ථාපනය කරන ලදි. බැංකුවේ පූර්ණ හිමිකාරීත්වය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව විසින් සුරුකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර නිකුත් කර ඇති අතර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත.

2. ව්‍යාපාර කටයුතු පිළිබඳ සමාලෝචනය

2.1 ප්‍රධාන ක්‍රියාකාරකම් බැංකුව

සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වලට වාණිජ බැංකු කටයුතු, පුද්ගල බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, උකස් මූල්‍යකරණය, කල්බදු මූල්‍යකරණය, ආයෝජන බැංකු කටයුතු, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, ආයතනික මූල්‍යකරණය, රාජ්‍ය සුරුකුම්පත් ගනුදෙනු, රන් උකස් ගැනීම්, ණය කාඩ්පත් පහසුකම්, අක්වෙරළ බැංකු කටයුතු හා විදේශීය මුදල් මෙහෙයුම්,විද්‍යුත් බැංකු සේවා සහ අනෙකුත් මූල්‍ය සේවා පහසුකම් සැපයීම ඇතුළත් විය.

2.2 පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම්

පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක කරුණු වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ පිටු අංක 232 සිට 233 දක්වා ඇතුළත් වේ. සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි දක්වා ඇති වෙනස් වීම් හැරෙන්නට බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවය සැලකිය යුතු තරමේ වෙනසකට භාජනය වී නැත.

2.3 සමූහයේ ආකෘතියේ වෙනස්වීම්

සමාලෝචිත වර්ෂය තුළදී සමූහයේ ආකෘතියේ සිදුවූ වෙනස්කම් වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 29 සහ 30, පිටු අංක 286 සහ 288 යටතේ ඉදිරිපත් කර ඇත.

2.4 දැක්ම, මෙහෙවර, සංස්ථාපිත පරිචය

බැංකුවේ දැක්ම හා මෙහෙවර මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 1 හි ඉදිරිපත් කර ඇත. බැංකුව උසස්ම ආචාරධර්ම පද්ධතියකට අනුරූපව තම කටයුතු ඉටු කරන අතර, එමඟින් දැක්ම හා මෙහෙවර යටතේ ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු කරා බැංකුව මෙහෙයවනු ලැබේ.

2.5 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ/සමූහයේ කාර්යසාධනය සහ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව විවරණයක් අංක 22 සිට 29 දක්වා වූ පිටුවල අන්තර්ගත සභාපතිගේ පණිවිඩයෙහි ඇතුළත්කර ඇත. සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් අංක 30 සිට 34 දක්වා වූ පිටුවල මහා කළමනාකාරතුමාගේ පණිවිඩයෙහි ඇතුළත්කර ඇත.බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම් පිළිබඳ විස්තරාත්මක විශ්ලේශණයක් පිටු අංක 64 සිට 75 දක්වා වූ මූල්‍ය තොරතුරු සමාලෝචනයේ අඩංගුවේ. මෙම වාර්තාවලින් සාධාරණ සමාලෝචනයක් ඉදිරිපත් කර ඇති අතර ඒවා මෙම වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.6 වර්ෂය තුළ ශාඛා ව්‍යාප්තිය

සමාලෝචිත වර්ෂය තුළදී බැංකුව නව ශාඛා 16 ක් ආරම්භ කරමින් තම සේවා තවදුරටත් ව්‍යාප්ත කර ඇත. අනෙකුත් සේවා සපයන ස්ථාන 227ක් ශාඛා මට්ටමට වැඩි දියුණු කරන ලදි පාරිභෝගිකයින්ට වඩාත් පහසු සේවාවක් ලබාදීම පුළුල් කිරීමේ අදහසින් ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. වර්ෂය තුළදී බැංකුව විසින් නව ස්වයංක්‍රීය ටෙලර්යන්ත්‍ර 72 ක් ස්ථාපිත කළ අතර, එමඟින් ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 523 දක්වා වැඩි කිරීමට හැකිවූ අතර, මෙම සංඛ්‍යාව අනෙකුත් බැංකු ආයතන සතු, ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ විය හැකි ස්වයංක්‍රීය ටෙලර් පහසුකම් වලට අතිරේක වශයෙනි.

2.7 ආයතනික පරිත්‍යාග

මේ යටතේ බැංකුව 2013 වර්ෂය තුල ප්‍රදානයක් සිදුකර නොමැත. නමුත් ආයතනික යහපාලනය සහ වගකීම් කටයුතු සඳහා රු. මිලියන 165 ක් බැංකුව විසින් දරා ඇත.

2.8 මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කරන ආකාරයට මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට, 1988 අංක 30 දරන බැංකු පනතේ සහ එහි සංශෝධනවලට, 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනතේ සහ එහි සංශෝධනයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීතිවලට අනුකූලවන ආකාරයට වන මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති බවයි. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී 2007 අංක 07 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදනද භාවිතා කර ඇත. මූල්‍ය ප්‍රකාශ මත අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 224 හි ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ සංකලිත කොටසකි.

2.9 විගණක වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලියේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා, ලංකා බැංකුවේ විගණක වශයෙන් පත්කර ඇත. 2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ බැංකුවේ හා පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 225 හි දක්වා ඇත.

2.10 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය සිය මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අනුව පිළියෙල කරයි. මූල්‍ය වර්තා සැකසීමේදී භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 232 සිට 251 දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුලදී බැංකුව විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැත.

3 අනාගත සංවර්ධනය

අනාගත සංවර්ධනය පිළිබඳව බැංකුවේ දර්ශනය හා සැලසුම් පිටු අංක 26 සිට 29 දක්වා වූ වැඩ බලන සභාපතිතුමාගේ පණිවිඩයෙහි ඉදිරිපත් කර ඇති අතර මූල්‍ය සමාලෝචනය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 64 සිට 75 දක්වා ඇත.

4 දළ ආදායම

සමූහයේ ප්‍රධාන ආදායම පොළී ආදායමෙන් සමන්විත වූ අතර, පොළී ආදායම මුළු ආදායමෙන් 89% ක නියෝජනයක් කර ඇත. පෙර වර්ෂයේ සමූහයේ ආදායම වූ රු. මිලියන 115,527 සංසන්දනාත්මකව බැලීමේ දී 2013 වර්ෂය සඳහා සමූහයේ ආදායම රු. මිලියන 134,230 ක් වශයෙන් වාර්තා විය. බැංකුවේ මුළු ආදායම වර්ෂය සඳහා සමූහයේ මුළු ආදායමෙන් 95% ක් (2012 - 95%) වශයෙන් වාර්තා විය.

5 ලාභාංශ සහ සංචිත

5.1 ලාභය සහ වෙන් කිරීම්

සමාලෝචිත 2013 වර්ෂය තුළදී බැංකුව රු. මිලියන 15,709 ක බදුපෙර ලාභයක් වාර්තා කිරීමට සමත් වී ඇති අතර, එය සංසන්දනාත්මකව පෙර වර්ෂයේ රු. මිලියන 19,794 ට වඩා 21% ක අඩුවීමක් නිරූපණය කරයි. රු. මිලියන 3,622 ක් ආදායම් බදු වෙනුවෙන් අඩු කළ පසු (2012 දී රු. මිලියන 5,378) 2013 වර්ෂය සඳහා බදුපසු ලාභය රු. මිලියන 12,087 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය සාපේක්ෂව 2012 වර්ෂයේ වාර්තා වූ බදු පසු ලාභය වන රු. මිලියන 14,417 ට වඩා 16% ක අඩු වීමක් වේ. බැංකුවේ සහ සමූහයේ ලාභය හා සම්බන්ධව දත්තයන් වගු අංක 1 හි දක්වා ඇත. සමූහයේද බදුපෙර ලාභය සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 20,246 සිට රු. මිලියන 16,105 දක්වා පත්වෙමින් පෙර වර්ෂයට සාපේක්ෂව 20.5% ක අඩුවීමක් නිරූපණය කරන ලදී. රු. මිලියන 3,956 ක් ආදායම් බදුවෙනුවෙන් අඩු කළ පසු (2012 දී රු. මිලියන 5,638) 2012 වර්ෂය සඳහා සමූහයේ බදුපසු ලාභය වූ රු. මිලියන 14,608 සිට 2013 වර්ෂය සඳහා රු. මිලියන 12,148 ක් දක්වා අඩු විය.

වගු අංක 1 **රු.'000**

	බැංකුව		සමූහය	
	2013	**2012**	**2013**	**2012**
සියළුම වියදම් දැරීමෙන් සහ ක්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් මෙන්ම විය හැකි අත්තිකාරම් අලාභ සහ අසම්භව්‍යන් සඳහා වෙන්කිරීමෙන් පසු, එහෙත් එකතු කළ අගය මත බදු සහ ආදායම් බද්දට පෙර වර්ෂයේ ලාභය	18,420	23,009	18,632	23,482
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු (VAT)	(2,711)	(3,214)	(2,756)	(3,275)
ආශ්‍රිත සමාගම්හි බදුපෙර ලාභයේ කොටස	-	-	229	39
ආදායම් බද්දට පෙර ලාභය	15,709	19,794	16,105	20,246
ආදායම් බදු වියදම	(3,622)	(5,378)	(3,956)	(5,638)
වසරේ ලාභය	12,087	14,417	12,148	14,608
අනෙකුත් විස්තීරණ ආදායම්, බදු ගැලපූ	18	529	1,501	603
වර්ෂය සඳහා වූ සමස්ථ විස්තීරණ ආදායම, බදු ගැලපූ	12,105	14,945	13,649	15,211
විසර්ජනයන්				
ස්ථාවර සංචිත අරමුදලට මාරු කිරීම	253	278	253	278
ප්‍රාථමික වෙළඳ විශේෂ අවදානම් සංචිතයට මාරු කිරීම	74	85	74	85
ආයෝජන අරමුදලට මාරු කිරීම	2,340	3,233	2,379	3,280
ලාභාංශ	5,346	5,346	5,346	5,346

5.2 ලාභාංශ

සියළුම බදු, ණය අලාභයන් සඳහා වෙන්කිරීම් සහ සංචිත සඳහා අවශ්‍ය වන්නාවූ මාරු කිරීම් යනාදිය අඩුකළ පසු ලාභය මත පදනම්ව බැංකුව විසින්, ශ්‍රී ලංකා රජයේ වනම්, බැංකුවේ කොටස්කරුවන්ගේ උපදෙස් මත ලාභාංශ තීරණය කරනු ලැබේ. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා බැංකුව විසින් රු. මිලියන 5,346ක මුදලක් ලාභාංශ වශයෙන් ගෙවා ඇත. (2012 - රු. මිලියන 5,346)

5.3 සංචිත

2013 දෙසැම්බර් 31 දිනට සමූහය සතු මුළු සංචිත වටිනාකම රු. මිලියන 60,616 (2012 - රු. මිලියන 52,225) වශයෙන් වාර්තා විය.

		රු. මිලියන
	2013	2012
ස්ථාවර සංචිත අරමුදල	3,538	3,286
ප්‍රත්‍යාගණන සංචිතය	9,600	8,368
ප්‍රාථමික වෙළඳ විශේෂ අවදානම් සංචිතය	897	823
විනිමය පරිවර්තන සංචිත	946	998
ආයෝජන අරමුදල් ගිණුම	7,229	4,850
විකිණීම සඳහා රඳවාගත් සංචිතය	4,516	3,971
වෙනත් සංචිත	629	611
රඳවා ගත් ලාභ	33,261	29,318
එකතුව	60,616	52,225

6 දේපළ, පිරියත හා උපකරණ

වර්ෂය තුළදී දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. මිලියන 1,805 ක් (2012 දී රු. මිලියන 1,317) වූ අතර, ඒවා පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 292 සිට 303 දක්වා ඇති සටහන් අංක 32 න් නිරූපණය කරයි.

7 නිදහස් දේපළවල අගය

2013 දෙසැම්බර්31 දිනට සමූහය සතු නිදහස් දේපළවල අගය රු. මිලියන 10,877 ක් වශයෙන් (2012 දී රු. මිලියන 10,142) මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 32 හි දක්වා ඇත.

8 ප්‍රකාශිත ප්‍රාග්ධනය හා කොටස් හිමිකම

8.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

නිකුත් කරන ලද හා මුළුමනින්ම ගෙවා නිම කරන ලද බැංකුවේ ප්‍රාග්ධනය 2013 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය කොටස් 5,000,000 කින් සමන්විත වූ රු. මිලියන 5,000 ක් විය.

8.2 කොටස් අයිතීන්

ලංකා බැංකුවේ එකම කොටස්හිමියා ශ්‍රී ලංකා රජයයි.

9 යටත් කාලීන ණයකර නිකුතුව

2013 දෙසැම්බර් 31 දිනට සමූහය විසින් නිකුත්කර තිබූ යටත් කාලීන ලැයිස්තුගත ණයකරවල අගය රු. මිලියන 8,000 ක් (2012 දී රු. මිලියන 6,000) විය. වත්කම් සහ වගකීම් වලින් ඇතිවන පරතරය පියවීම සහ බැංකුවේ අතිරේක ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම සඳහා මෙම ණයකර නිකුතුව මගින් ජනනය වූ අරමුදල් යොදාගන්නා ලදී.මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය දිනට පැවති ණයකර පිළිබඳව තොරතුරු පිටු අංක 308 සිට 311 දක්වා සහ 317 සිට 320 දක්වා වූ මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 41 සහ 45 හි ඇතුළත්කර ඇත.

10 කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය තුළදී සමූහයේ කොටසක ඉපැයුම හා කොටසක් සඳහා වූ ශුද්ධ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. 2,446.88 ක් සහ රු. 13,123.27ක් විය.

11 ආයතනික තිරසාරභාවය සහ වගකීම

ආයතනික තිරසාරභාවය සහ සමාජීය වගකීම් යටතේ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් පිළිබඳව විස්තරාත්මක සමාලෝචනයක් මෙම වාර්තාවෙහි අංක 126 සිට 131 දක්වා වූ පිටුවල සමාජීය සහ පාරිසරික වාර්තාවෙහි ඇතුළත් කර ඇත.

12 අධ්‍යක්ෂ මණ්ඩලය

2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වැඩ බලන සභාපතිතුමා ද ඇතුළුව සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සමන්විත විය.එය සමාන්‍යයෙන් සාමාජිකයින් 6 දෙනෙකුගෙන් සමන්විත වන අධ්‍යක්ෂ මණ්ඩලය තුළ එක් සාමාජිකයෙකුගේ පුරප්පාඩුවක් එම දිනට විය. ඔවුන් කිසිවෙක් බැංකුවේ විධායක තනතුරු දරනු නොලැබේ. ඔවුන්ගේ විශාල පරාසයක කුසලතාවයන් සහ පළපුරුද්ද සමස්ත අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සඳහා දායක කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 42 සිට 45 දක්වා විස්තරාත්මකව සඳහන්කර ඇත.

12.1 අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ විස්තර

සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ විස්තර

අධ්‍යක්ෂකගේ නම	විධායක/විධායක නොවන තත්වය	ස්වාධීනත්වය
රාජු සිවරාමන් මහතා (2013 දෙසැම්බර් 27 දින සිට වැඩ බලන සභාපති)	විධායක නොවන	ස්වාධීන
කේ එම් මහින්ද සිරිවර්ධන මහතා	විධායක නොවන නිල බලයෙන් පත් වූ	ස්වාධීන නොවන
නලිනි ඩී අබේවර්ධන මෙනෙවිය	විධායක නොවන	ස්වාධීන නොවන
චන්ද්‍රසිරි ද සිල්වා මහතා	විධායක නොවන	ස්වාධීන නොවන
ලලිත් විතාන මහතා	විධායක නොවන	ස්වාධීන
ආර් එම් ඒ රත්නායක මහතා (නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂට විකල්ප අධ්‍යක්ෂ)	විධායක නොවන නිල බලයෙන් පත් වූ	ස්වාධීන නොවන

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනතේ විධි විධානයන්ට අනුව අධ්‍යක්ෂකවරු ස්වාධීන/ ස්වාධීන නොවන අධ්‍යක්ෂකවරු ලෙස වර්ග කර ඇත.

12.2 අධ්‍යක්ෂ මණ්ඩලීය උප කමිටු

ඉහත දැක්වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධානයන්ට අනුකූල වීම සඳහා සහ බැංකුවේ කටයුතු මනාව පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය උප කමිටු 4ක් පිහිටුවා ඇත. උප කමිටු සංයුතීන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 188 හි සඳහන් කර ඇත.

12.3 අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල හා උප කමිටු රැස්වීම් වලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 149 වන පිටුවේ දක්වා ඇත.

12.4 ගිවිසුම් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

බැංකුව සමඟ ඇති ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ට ඇති සෘජු හා වක්‍ර ඇල්ම පිළිබඳව දත්තයන් අංක 217 සිට 220 දක්වා වූ පිටුවල විස්තර කර ඇත. මෙම ඇල්ම පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂවරු විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අනාවරණය කර ඇත. දී ඇති ගිවිසුම් වලට අමතරව කිසිදු අධ්‍යක්ෂවරයෙකුට වෙනත් සෘජු හෝ වක්‍ර ඇල්මක් බැංකුව සමඟ ඇතිකරගෙන ඇති හෝ අනාගතයේදී යෝජිත ගිවිසුමකට සම්බන්ධයක් හෝ නොමැති බව ප්‍රකාශ කෙරේ.

12.5 බැංකුව/සමූහය මඟින් නිකුත් කර ඇති ණයකර පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

කිසිදු අධ්‍යක්ෂකවරයෙකුගේ නමින් ණයකර ලේඛනගතකර නොතිබිණි.

12.6 අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා/ගාස්තු

අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන දීමනා/ගාස්තු සියල්ලම, 2011 සැප්තැම්බර් 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 58(2) සහ 2013 නොවැම්බර් 12 දාතම දරන ලිපිය ඇතුළු මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝග අනුව සහ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව සිදු කර ඇත.

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ තොරතුරු පිටු අංක 255 හි දක්වා ඇත.

13 අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

13.1 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරන ලද විශේෂ ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 198 සිට 209 දක්වා ඇතුළත් කර ඇත.

13.2 අභ්‍යන්තර පාලනය

බැංකුව තුළ විගණන කමිටුව හරහා වඩාත් ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ. විගණන කමිටුව විසින් භාරකාර වගකීම් නිදහස් කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දෙනු ලබයි. විගණන කමිටුවේ සභාපතිතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 189 සිට 191 දක්වා ඇතුළත් කර ඇත. සමාලෝචනයට පාත්‍ර වූ වර්ෂය තුළ සහ මූල්‍ය වාර්තා සහ වාර්ෂික වාර්තාව නිකුත් කළ දිනය දක්වා වූ අභ්‍යන්තර විගණන පාලන පද්ධතියෙහි ඵලදායීතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳව වූ 2007 අංක 11 දරණ බැංකු පනත් විධිවිධානයේ විධිවිධාන අංක 3(8)(ii)(ආ) අනුව අභ්‍යන්තර විගණන යාන්ත්‍රණය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කර ඇත. ඉහත සඳහන් වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 221 සිට 222 දක්වා ඇතුළත් කර ඇත. මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සාධාරණ තහවුරුවක් ලැබෙන පරිදි නිර්මාණය කර ඇති බවටත්, බාහිර පාර්ශවයන්ට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සකස් වී තිබෙන බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත සහතික වීමේ වාර්තාවක් විගණකාධිපතිතුමාගෙන් ලබාගෙන ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 223 හි දක්වා ඇත.

14. ආයතනික යහපාලනය

වඩාත් ඵලදායී ආයතනික යහපාලන රාමුවක් සහ ක්‍රියාවලියන් පවත්වාගෙන යෑමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටියි. බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාකාරකම් ආයතනික යහපාලන පරිචයට අනුකූලවන පරිදි මෙහෙයවීම සහ කාර්යක්ෂමව පාලනය කිරීම සිදු වේ. වාණිජ බැංකුවල නියාමක වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, 2007 අංක 11 දරණ බැංකු පනත් විධිවිධානය යටතේ නිකුත් කරන ලද ආයතන යහපාලන විධිවිධානයන්ට සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය බද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට මෙම පද්ධතීන් සහ පරිචයන් අනුකූල වන අතර, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 144 සිට 187 දක්වා ඇති ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේ සවිස්තරාත්මකව සඳහන් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉහත දැක්වූ 2007 අංක 11 විධිවිධානයන්ට අනුකූල වීම මත විගණකාධිපතිතුමාගෙන් වාර්තාවක් ලබා ගෙන ඇත.

15. මානව සම්පත්

බැංකුව සතු ඉහළ වටිනාකමක් සහිත සම්පතක් ලෙස එහි සේවකයින් සලකන අතර, ඔවුන්ගේ සංවර්ධනය බැංකුවට ඉතාමත් වැදගත්වනු ඇත. සංස්ථාපිත අරමුණු ඉටුකරගැනීමේදී ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යෑම සඳහා ඉතා වටිනා මෙම මානව ප්‍රග්ධනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියක් ගෙන ඇත. බැංකුවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ පරිචයන්, තිරසාර පැවැත්ම පිළිබඳ වාර්තාවේ පිටු අංක 114 සිට 125 දක්වා ඇතුළත්කර ඇත.

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

16. නීති හා රෙගුලාසි පිළිබඳ අනුකූලතාවය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි බැංකුව නීති හෝ රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නියුක්ත වී නොමැති බව ප්‍රකාශ කරයි. මෙම වාර්තාවේ සංකලිත කොටසක් වන අවදානම් හා අනුකූලතාවය පිළිබඳ වාර්තාව යටතේ පිටු අංක 208 හි නීති හා රෙගුලාසි සමග බැංකුවේ අනුකූලතාවය පිළිබඳ විස්තර ඇතුළත්වේ.

17. සමථයට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය පරිදි දැනට බැංකුව විසින් මෙහෙයවනු ලබන තවමත් සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්වලින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ අනාගත මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් අහිතකර බලපෑමක් සිදුවෙතැයි අපේක්ෂා නොකෙරේ.

18. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට සහ සියළුම සේවකයින්ට ගෙවිය යුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත කාලයේදී සිදු කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසයෙන් තහවුරු කරයි.

19. පාරිසරික ආරක්ෂාව

පරිසරයට අයහපත් ප්‍රතිඵල ළඟා කර දෙන කිසිදු ක්‍රියාකාරකමක බැංකුව නියුක්ත වී නැත. තවද, පරිසරය රැකගැනීමේ අරමුණින් ගත් පියවර පිටු අංක 130 සිට 131 දක්වා තිරසාර පැවැත්ම පිළිබඳ වාර්තාවේ ඇත.


20. ශේෂ පත්‍රයෙන් පසු සිදුවූ සිද්ධීන්

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ප්‍රමාණාත්මක ගැලපීමක් හෝ හෙලිදරව්වක් සිදුකල යුතු කිසිදු ප්‍රමාණාත්මක සිද්ධියක් ශේෂ පත්‍ර දින හා මෙම වාර්තාව නිකුත් කළ දින අතර කාල පරාසය තුළදී සිදුවී නැති බවයි.

21. අඛණ්ඩභාවය

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණයේ සම්පත් බැංකුව සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අඛණ්ඩව පවැත්ම යන සංකල්පය භාවිතාකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් කාර්යාලය

2014 මාර්තු 13
කොළඹ දීය.

ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි අවශ්‍යතාවන්ට අනුකූලව, සම්බන්ධිත පාර්ශවයන්ගේ අනාවරණයන් විස්තරාත්මක වශයෙන් මූල්‍ය ප්‍රකාශ වල සටහන් අංක 55 (පිටු අංක 332 සිට 339 දක්වා) හි දක්වා ඇත. අතිරේක වශයෙන් ව්‍යාපාරයීය සාමාන්‍ය ක්‍රියාකාරකම් තුළ බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති හෝ අධ්‍යක්ෂ ධූර දරන අනෙකුත් ආයතනයන් සමඟ අතේ දුරින් සිදුකරන ලද ගනුදෙනු සම්බන්ධව විස්තරයක් දැක්වේ.

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000*	2013.12.31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	2012.12.31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	සුරැකුම
රාජු සිවරාමන් මහතා***						
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී.එල්.සී	සභාපති	ජංගම ගිණුම		5,279	8,084	
		කාලීන තැන්පතු		1,300,665	1,216,734	
		REPO ශේෂය		356,126	99,888	
		කුළී අත්තිකාරම් ගෙවීම		258,518	235,179	
		ඉන්ධන සඳහා තැන්පතු		907	907	
		ණයවර ලිපි	5,000	-	-	
		ඇපකාර ලිපි		3,993	3,630	
සී/ ස එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගම****	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		5,084	16,968	
		ඉතිරිකිරීමේ ගිණුම		ඇ.ඩො 11	ඇ.ඩො. 3	
				**1,429	**336	
				යුරෝ 4	යුරෝ 3	
				**769	**583	
				ඕස්.ඩො. 0.5	ඕස්.ඩො 0.4	
				**60	**54	
				සි.ඩො. 0.2	-	
				**17	-	
		ජංගම ගිණුම		52,648	34,079	
		කාලීන තැන්පතු		72,785	16	
		ණය මාලාව	925,000	203,948	459,640	
		අයිරා	100,000	-	45,949	ඇටර්නි බලපත්‍රයක් මඟින් ආවරණය කරන ලද ලැබිය යුතු කල්බදු / කුළී පිට ගැනුම්
		මුදල් වෙළඳපළ ණය	400,000	350,174	402,372	
		REPO ශේෂය		25,004	42,009	
		ණයවර ලිපි	10,000	2,500	-	
		ඇපකාර ලිපි	6,500	-	2,500	
		වෙනත් ගෙවීම්		6,180	6,331	

* මුදල් ඒකකය විශේෂයෙන් සඳහන් කොට නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

** රුපියල් වලට සමාන අගය

*** රාජු සිවරාමන් මහතා සී/ස ආර්ක් ට්‍රයඩ් (පෞද්ගලික) සමාගමෙහි කළමණාකාර අධ්‍යක්ෂ ධූරය දරණ අතර එම සමාගම ලංකා බැංකුව නැගෙනහිර පළාත් කාර්යාලය, ත්‍රිකුණාමලය අධිශ්‍රේණි ශාඛාවල, නුගේගොඩ ශාඛා කාර්යාල සංකීර්ණය, නෙල්ලියාඩි කළමණාකාර නිල නිවස සහ නුවර එළිය නිවාඩු නිකේතනය සහ සීබෑන්ක් තානායම (අදියර II) ඉදිකිරීමේ ව්‍යාපෘතීන්හි උපදේශකයන් ලෙස පත් කර ඇත.

**** 2013 අගෝස්තු 22 දින සිට සී/ ස එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගම සහ සී/ස සීලීස් සමාගම ඒකාබද්ධ වීමනිසා එම ආයතන දෙකෙහිම සීමාවන් ඇතුළත් කොට ඇත.

ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000*	2013.12.31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	2012.12.31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	සුරැකුම
සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම		3,104	31,090	
		ජංගම ගිණුම		ඇ.ඩො. 13	ඇ.ඩො.44	
				**1,737	**5,601	
		කාලීන තැන්පතු		94,236	51,639	
		කාලීන තැන්පතු		ඇ.ඩො. 62	-	
				**8.097	-	
		ණයවර ලිපි		ඇ.ඩො. 11	ඇ.ඩො. 356	කාලීන තැන්පතු
				**1,397	**45,290	
		ඇපකාර ලිපි		32,640	-	
සී/ස මිරේකා කැපිටල් හෝම්ස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම		61,050	-	
				ඇ.ඩො. 22		
				**2,915		
		කාලීන තැන්පතු		21,281	-	
		ණය	ඇ.ඩො. 40,000	ඇ.ඩො.14,000	-	කාලීන තැන්පතු
			**5,236,200	**1,832,670		
		අයිරාව	100,000	-	-	
		ණයවර ලිපි	(ඇ.ඩො. 40,000)	ඇ.ඩො. 2,245	-	
			(**5,236,200)	**293,835		
				යුරෝ 15		විනිමය බිල්පත්, නැවිගත කිරීමේ ලියවිලි
				**2,260		
				ඒ.රා.ප. 5		
				**1,150		
කේ එම් මහින්ද සිරිවර්ධන මහතා						
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		1	-	
		ජංගම ගිණුම		19,268	-	
		ඇපකාර ලිපි	300	-	-	මුදල
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		109	-	
				යුරෝ 0.2	-	
				**29	-	
		ජංගම ගිණුම		623	-	
		කාලීන තැන්පතු		ඇ.ඩො. 2,566	-	
				**335,885	-	

* මුදල් ඒකකය විශේෂයෙන් සඳහන් කොට නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

** රුපියල් වලට සමාන අගය

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000*	2013.12.31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	2012.12.31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	සුරැකුම
නලිනි ඩී අබේවර්ධන මෙනෙවිය						
සී/ස හොටෙල්ස් කලම්බු (1963) (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		3,912	-	
		ජංගම ගිණුම		11,647	35,303	
		කාලීන තැන්පතු		114,717	102,075	
		ණය		7,801	-	
		වෙනත් ලැබීම්		23,038	31,548	
සී/ස බී.ඕ.සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		-	5,000	
		ජංගම ගිණුම		9,085	36,760	
		කාලීන තැන්පතු		110,846	83,131	
		කල්බදු		6,967	-	
		ණයකර		10,347	15,436	
		අයිරාව	7,600	-	-	පොත් අගය මත ණය
		ඇපකාර ලිපි	56,000	-	56,050	කාලීන තැන්පතු සහ ණයකර
		වෙනත් ගෙවීම්		12	12	
		වෙනත් ලැබීම්		689	428	
චන්ද්‍රසිරි ද සිල්වා මහතා						
සී/ස හොටෙල්ස් කලම්බු (1963) (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		3,912	-	
		ජංගම ගිණුම		11,647	35,303	
		කාලීන තැන්පතු		114,717	102,075	
		ණය		7,801	-	
		වෙනත් ලැබීම්		23,038	31,548	
සී/ස බී.ඕ.සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		-	5,000	
		ජංගම ගිණුම		9,085	36,760	
		කාලීන තැන්පතු		110,846	83,131	
		කල්බදු		6,967	-	
		ණයකර		10,347	15,436	
		අයිරාව	7,600	-	-	පොත් අගය මත ණය
		ඇපකාර ලිපි	56,000	-	56,050	කාලීන තැන්පතු සහ ණයකර
		වෙනත් ලැබීම්		12	12	
		වෙනත් ගෙවීම්		689	428	
ලලිත් විතාන මහතා						

* මුදල් වීකකය විශේෂයෙන් සඳහන් කොට නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

** රුපියල් වලට සමාන අගය

ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000*	2013.12.31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	2012.12.31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	සුරැකුම
සී/ස ඔරිට් ඇපරල්ස් (පුද්ගලික) සමාගම	ප්‍රධාන විධායක නිළධාරී	ජංගම ගිණුම		ඇ.ඩො. 11 **1,465	-	
		ණය	ඇ.ඩො 1,400 **183,267	ඇ.ඩො. 820 **107,288	-	යන්ත්‍ර මත උකස, ආයතනික ඇපකරයන් සහ වාණිජ දේපළ
		අයිරාව		86	-	
සී/ස ඔරිට් ට්‍රේඩින් ලංකා (පුද්ගලික) සමාගම	ප්‍රධාන විධායක නිළධාරී	ඉතිරිකිරීමේ ගිණුම		ඇ.ඩො. 116 **15,190	-	
		ජංගම ගිණුම		31	-	
		කාලීන තැන්පතු		ඇ.ඩො. 200 **26,181	-	
		අයිරාව		ඇ.ඩො. 25 **3,231	-	
		ණයවර ලිපි	ඇ.ඩො. 5,900 **772,340	ඇ.ඩො. 398 **52,104	-	ආයතනික ඇපකරයන්, විනිමය බිල්පත් සහ පුද්ගල ඇපකරයන්
ආර් එම් ආනන්ද රත්නායක මහතා						
ඩි ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සිකියුරිටි ප්‍රින්ට් (පුද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම		9,113	-	
				ඒ.රා.ප 54	-	
				**11,602	-	
		කාලීන තැන්පතු		8,253	-	
		අයිරාව	30,000	26,291	-	

* මුදල් ඒකකය විශේෂයෙන් සඳහන් කොට නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

** රුපියල් වලට සමාන අගය

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

වගකීම

2007 අංක 11 දරණ බැංකු පනත් විධානයෙහි 3 (8)(ii) වගන්තිය ප්‍රකාරව මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළබඳ වූ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා බැංකුවෙහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මතාවය සහ සඵලදායීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. මෙහිදී බැංකු කටයුතු වලට අදාළ අවදානම් හා ප්‍රතිඵල සමබර ලෙස කළමනාකරණය කළ යුතු අතර බැංකුවේ අවදානම් අභිරුචිය පිළිබඳ සීමා හා දර්ශක වල විචල්‍යතා ඉස්මතු වන සේ අභන්තර පාලන පද්ධති මූලික වශයෙන් නිර්මාණය කරයි. මේ අනුව මූල්‍ය තොරතුරු හා වාර්තාවල මූලික අවප්‍රකාශයන් හෝ මූල්‍ය අලාභයන් හෝ වංචා වලට එරෙහිව අභ්‍යන්තර පාලන පද්ධතීන්ට ලබාදිය හැක්කේ පූර්ණ සහතිකයක් නොව සාධරණ සහතිකයක් පමණි.

බැංකුව විසින් මුහුන පෑ හැකි සැලකිය යුතු අවදානම් කාරකයන් හඳුනාගැනීම ප්‍රමාණ නිර්ණය නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ අබණ්ඩව බලපැවැත්වෙන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කර ඇත. ව්‍යාපාර පරිසරයේ සහ ව්‍යවස්ථාපිත මාර්ග සූචකයන්හි සිදුවන වෙනස් වීම් වලට අනුරූපීව මූල්‍ය වාර්තාකරණයට අදාල අභ්‍යන්තර පාලන පද්ධති වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමද මෙයට ඇතුලත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී වරුන්ගේ ආයතන විසින් බැංකු අධ්‍යක්ෂවරුන් හට මඟ පෙන්වීම සඳහා නිකුත්කර ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව උපයෝගී කරගනිමින් සහ ඒ අනුව යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරතුරුවම ඉහත සඳහන් ක්‍රමවේදය නිරීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන කටයුතු නිරීක්ෂණයේදී ඉහත මගපෙන්වීම්හි සඳහන් පරිදි අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේ මූලධර්ම යොදාගෙන ඇත.

දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති සාධාරණ සහතික ප්‍රතිඥාවක් ලබා දීමට ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. තවද බාහිර උපයෝගීතාවය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශයන් අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

මතුවූ අවදානම් හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට මෙන්ම එම අවදානම් අවම කිරීමට හා පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන විධි නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මඟින් අවදානම් සහ පාලනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග භාවිතයට කළමණාකාරිත්වය සහාය දක්වනු ලැබේ.

අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි සැලැස්ම සහ සඵලදායීත්වය නිරීක්ෂණය කිරීමේදී යොදා ගන්නා ලද ක්‍රමවේදය සහ එහි මූලික ලක්ෂණ.

අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මකතාවය සහ සම්පූර්ණත්වය නිරීක්ෂණය කිරීමට ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රමවේදයන්හි පහත දෑ ඇතුලත් වේ.

- බැංකුවෙහි දෛනික කටයුතු වල සඵලතාවය සහ බැංකුවේ සමස්ථ මෙහෙයුම් අනුමත කළ ආයතනික සැලැස්ම මඟින් උකහා පිළියෙල කල ආයතනික අරමුණු, උපක්‍රම සහ වාර්ෂික අයවැය අනුව පවතීද යන්න සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය පිණිස විවිධ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත.

- නියැදි හා චක්‍රීය ක්‍රම භාවිතයෙන්, ප්‍රතිපත්තීන්ට හා ක්‍රියාදාමයන්ට අනුගත වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි කාර්යසාධනය පිළිබඳව අබණ්ඩව පරීක්ෂා කිරීම බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබන අතර එමඟින් සොයාගනු ලබන සැලකිය යුතු අනුගත නොවීම් අවධානයට ලක් කරනු ලබයි. සියලු අංශ වල සහ ශාඛාවල විණානනයන් පවත්වනු ලබන අතර, ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් නිකුත් කිරීම උදෙසා විගණනයෙහි වාර ගණන ඇගයීමට ලක්වූ අවදානම මත තීරණය වේ. වාර්ෂික විගණන සැලසුම අධ්‍යක්ෂ මණ්ඩල විගණන නිරීක්ෂණ කමිටුව නිරීක්ෂණය කොට අනුමත කරනු ලබයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන නිරීක්ෂණ කමිටුවේ නිරන්තර රැස්වීම්හි නිරීක්ෂණය සඳහා යොමු කරයි.

- නියාමන අධිකාරීන්, කළමනාකාරිත්වය, අභ්‍යන්තර හා බාහිර විගණකයින් විසින් හදුනාගත් පාලනය පිළිබඳ ගැට පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවධානය යොමුකර අවදානම් කළමනාකරණයෙහි සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සිදුකරයි. අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය සහ විෂයපථය පිරික්සීමද විගණන කමිටුව මඟින් සිදු කරයි. විගණන කමිටුවේ රැස්වීම් වාර්තා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා කාලීනව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. පිටු අංක 189 සිට 191 දක්වා ඇති විගණන කමිටු වාර්තාවෙහි විගණන කමිටුව විසින් අදාළ වර්ෂය තුළ ක්‍රියාත්මක වීම සවිස්තරව දක්වා ඇත.

- අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේදී, හදුනාගත් බැංකු නිලධාරීන් විසින් මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් ගිණුම් සහ හෙලිදරව් කිරීම් වලට සම්බන්ධ සියළු ක්‍රියා පිළිවෙත් සහ පාලනයන් පරතුලනය කරන ලදී. එහි සැලස්මේ උචිතභාවය හා සඵලතාවය පිළිබඳ අභ්‍යන්තර විගණන අංශය විසින් නැවත නිරීක්ෂණය කරන ලදී.

- බැංකුව 2012 වර්ෂයේදි නව ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා ශ්‍රී ලං මූ වා ප යොදා ගන්නා ලදී. ඉහත ගිණුම්කරණ ප්‍රමිත මූලිකව භාවිතා කිරීමේදී යොදාගත් ක්‍රමවේදයන් සහ ක්‍රියාපටිපාටීන්, නියාමන අධිකාරීන්, අභ්‍යන්තර හා බාහිර විගණකයින් හා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මඟින් ලද ප්‍රතිචාර මත 2013 වර්ෂයේදී තවදුරටත් ශක්තිමත් කරන ලදී. තවද මූල්‍ය උපකරණ කාර්යක්ෂම සහ සඵලව හදුනාගැනීමේ, මිණුම් කිරීමේ හා වර්ගීකරණය කිරීම සඳහා යෝග්‍ය ගිණුම් වාර්තා ක්‍රියාවලියක අවශ්‍යතාවය බැංකුව හදුනා ගෙන ඇත. මෙහිදී බැංකුවේ පරිපාලිත සමාගම් විසින් සිදු කරන ලද ක්‍රියාපටිපාටීන් විශ්ලේෂණය කර නැත.

- පෙර වර්ෂයන්හි මූල්‍ය වාර්තාකරණයට අදාල අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකයින්ගේ නිර්දේශයන් සමාලෝචනය කර යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වර්ෂය තුළදී ගන්නා ලදී. මූල්‍ය වාර්තාකරණයට අදාල අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් 2013 වර්ෂයේදී බාහිර විගණක නිර්දේශයන් සම්බන්ධයෙන් අනාගතයේදී ක්‍රියා කරනු ඇත.

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

තහවුරු කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලීන් හා ක්‍රියා දාමයන් පදනම්ව බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවයන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව, බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශන සැකසීමේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතික වීමක් සැපයෙන අයුරින් බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරනු ලැබේ.

විගණකාධිපති වාර්තාව පිළිබඳ සමාලෝචනය

බැංකුවේ බාහිර විගණක වන විගණකාධිපති විසින් 2013 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසරට අදාල වාර්ෂික වාර්තාවේ දක්වා ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂක වරුන්ගේ වාර්තාව සමාලෝචනය කරන ලදී. බැංකුවේ මූල්‍ය වාර්තාකරණය උදෙසා වූ අභ්‍යන්තර පාලන පද්ධතියේ නිර්මාණය හා සඵලදායීතාවය සමාලෝචනය උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය මත ලද අවබෝධය සමඟ මෙම වාර්තාව සංගත නොවන බවට පැවසීමට තරම් කරුණක් විගණකාධිපතිගේ අවධානයට යොමු නොවූ බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත. අභ්‍යන්තර පාලනය පිළිබඳ වාර්තාවේ විගණකාධිපතිගේ ස්වාධීන විගණන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 223 හි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



සභාපති - විගණන කමිටුව



වැඩ බලන සභාපති



අධ්‍යක්ෂ

2014 මාර්තු 13 දින
කොළඹ දීය

ස්වාධීන සහතිකවීමේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එග්බී/එග්/බීඕසී/අයිසී/2013

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 මාර්තු 21

සභාපති
ලංකා බැංකුව,

ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයන්ට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන සහතිකවීමේ වාර්තාව

හැඳින්වීම

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවේ ඇතුළත් ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකවීමක් මෙම වාර්තාවෙන් සපයනු ලැබේ. මෙම සහතිකවීමේ කාර්යයේදී මා විසින් වෘත්තීය වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක සහාය ලබාගන්නා ලදී.

කළමනාකරණයේ වගකීම

2007 අංක 11 දරන බැංකු පනතේ 3 (8)(ii)(බී) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති ''අභ්‍යන්තර පාලනයට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වූ මාර්ගෝපදේශයට'' අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, කළමනාකරණය සතු වගකීම වේ.

මාගේ වගකීම හා ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාර ප්‍රමිත (ශ්‍රී ලං ස කා ප්‍ර) 3050 ට අනුකූලවීම මාගේ පරීක්ෂණ මත පදනම්ව මෙම අභ්‍යන්තර පාලනයන්ට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ වාර්තාවක් නිකුත්කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති අභ්‍යන්තර පාලනයට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු ආයතන සඳහා සහතික වීමේ වාර්තාව ශ්‍රී ලං ස කා ප්‍ර 3050 ට අනුකූලව මාගේ සහතිකවීමේ කාර්යභාරය මා විසින් මෙහෙයවා ඇත.

ඉටුකළ කාර්යයේ සාරාංශය

අදාල ප්‍රකාශය, අධ්‍යක්ෂවරුන් විසින් හෝ අධ්‍යක්ෂවරු සඳහා හෝ පිළියෙල කළ ලිපි ලේඛන මඟින් තහවුරු වන්නේද, සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන තිබෙන ක්‍රියාවලිය මඟින් මැනවින් පිළිබිඹු වන්නේද යන්න අගයකර බැලීම සඳහා මාගේ කාර්යභාරය මෙහෙයවා තිබේ.

ඉටුකරන ලද ක්‍රියාපටිපාටීන්, නියැඳි පදනම මත ලබාගත් බැංකු කාර්ය මණ්ඩල විමසීම් හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගනු ලැබූ ක්‍රියාවලීන් සඳහා උපකාරීවන ලිපිලේඛන වල පැවැත්ම මත මූලික වශයෙන් සීමා වේ.

මෙම ප්‍රකාශය තුළින් සියලූ අවදානම් හා පාලනයන් ආවරණය වන්නේ දැයි සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියාපටිපාටි වල සඵලදායීතාවය පිලිබඳ මතයක් ගොඩනැගීම හෝ ශ්‍රී ලං ස කා ප්‍ර 3050 ට අනුව අවශ්‍ය නොවේ. එසේම ශ්‍රී ලං ස කා ප්‍ර 3050 ට අනුව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන අංශයන් පිළිබඳව පවතින සැලකිය යුතු ගැටළු සඳහා ක්‍රියා කිරීමට විස්තර කර ඇති ක්‍රියාවලීන් මඟින් එම ගැටළු සඳහා නියත පිළියම් ලැබේ දැයි යන්න මා විසින් සලකා බැලම අවශ්‍ය නොවේ.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියාපටිපාටීන් මත පදනම්ව වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම හා සඵලදායකත්වය පිළිබඳ සමාලෝචනයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදවා ඇති ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය හා සංගත නොවන බවට විශ්වාස කිරීමට හේතුවන කරුණු කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

එච් ඒ එස් සමරවීර
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණයට අදාල අධ්‍යක්ෂවරුන්ගේ හා විගණකවරුන්ගේ වගකීම් පැහැදිලිව දැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ ප්‍රකාශය සකසනු ලබයි. ලංකා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශය මඟින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශ

1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් සමඟ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් සහ විධිවිධානයන්ට අනුව, සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් නිරවද්‍යතාවක් සමඟ බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබිඹු කෙරෙන ගිණුම් පොත් බැංකුව විසින් පවත්වා ගෙන යාම තහවුරු කිරීමත් සහ බැංකුවේ කටයුතු පිළිබඳ තත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය වන ආකාරයට සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කිරීමත් බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි මෙම වාර්ෂික වාර්තාවේ නිරූපනය කර ඇති, 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති අතර, ඒවා ඒකාකාරීව භාවිතා කර, කළමනාකරණය විසින් වඩාත් සාධාරණ හා විචක්ෂණ ලෙස තම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම් පාදක කරගෙන ඇත. භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් එවැනි දෑ පිළිබඳව අනාවරණය හා පැහැදිලි කිරීමකර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත්කර ඇති 2013 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන් හා අනෙකුත් නියාමන අවශ්‍යතාවයන් හා අනුකූලවන පරිදි සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කෙරේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, බැංකුවට හා සමූහයට අනාගතය දැකිය හැකි නිශ්චිත කාලයක් සඳහා තම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් ඇති බවයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී තවදුරටත් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය භාවිතාකර ඇත.

අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය

බැංකුවේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් සහ අවකළමනාකරණය වැළැක්වීමට, වඩාත් ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරයක් පවත්වාගෙන යෑම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දීම, අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය ද අධ්‍යක්ෂවරුන් සතු වගකීමකි.

ආවේණික හා අවශේෂ අවදානම් මුළුමනින්ම තුරන්කරලීම කළ නොහැකි නමුත් කලින් තීරණය කරන ලද පද්ධති හා සීමා පැනවීම් තුළ උචිත යටිතල පහසුකම්, පාලනයන්, පද්ධති හා ආචාරධර්ම පදනම් වූ චර්යාවන් භාවිතය හා ක්‍රියාවට නැංවීම තුළින් එවැනි දෑ අවම කරගැනීම තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

මූල්‍ය වාර්තාකරණයේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාදෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකසා ඇති බව පිටු අංක 221 සහ 222 හි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මඟින් තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ ඒ සඳහා වන මඟපෙන්වීම් මනා ලෙස සංවිධානය කර ඇත. ප්‍රමාණාත්මක අවදානම් පාලනය කිරීමටත්, ඒවා කළමනාකරණය කිරීමටත්, කළමනාකරණ කමිටු ස්ථාපිත කර ඇත. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සාකච්ජා කිරීම සඳහා කාර්තුමය පදනමක් මත අවදානම් වාර්තාවන් සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. අදාල නීති, රෙගුලාසි, රීති, විධානයන් සහ මඟපෙන්වීම් සමග අනුකූලවන ආකාරය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව විසින් අධීක්ෂණය කරන අතර, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමණාකරණ ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා විගණන කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව අඛණ්ඩව ක්‍රියා කරයි. විගණන කමිටුවේ හා ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුවේ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 189 සහ 196 හි අන්තර්ගත වේ.

විගණන වාර්තාව


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත විගණන වාර්තාව සහ අවසාන විගණන මතය ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 225 හි ඇතුළත් කර ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳ විගණකාධිපතිවරයා විසින් ලබා දුන් සහතිකය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 223 හි දක්වා ඇත.

අනුකූලතාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනට නියාමන හා ව්‍යවස්ථාපිත අධිකාරීන්ට ගෙවීමට ඇති සියළු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ පරිපාලිතයන් විසින් නියමිත පරිදි ගෙවා අවසන් කර හෝ ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි සෑහීමට පත් වේ.

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ඔවුන්ගේ වගකීම් යථා පරිදි ඉටුකර ඇති බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව / අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් කාර්යාලය

2014 මාර්තු 13
කොළඹ දීය.

විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } ඊවිග්/එග්/බීඕසී/එෆ්වී/2013

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2014 මාර්තු 20

සභාපති,
ලංකා බැංකුව

ලංකා බැංකුව හා එහි පරිපාලිතයන්ගේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

ලංකා බැංකුවේ (බැංකුව) සහ බැංකුව හා එහි පරිපාලිතයන්ගේ (සමූහය) 2013 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මාගේ විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකරණ සමාගමක සහාය ලබාගන්නා ලදී. පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන එම පරිපාලිතයන්ගේ සමාජිකයින් විසින් පත්කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. මෙම වගකීමට සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාමට සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් ඇතුලත් වේ.

විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කළ අතර මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිතීන් අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය වන අගයන්ට අදාලව නියැදි පරීක්ෂණයන් සිදුකිරීම ඇතුළුව ගිණුම්කරණ ප්‍රතිපත්ති තක්සේරු කිරීම, කළමනාකරණය විසින් සිදුකරන ලද සුවිශේෂ ඇස්තමේන්තු සහ සියළුම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම යන සියළු දෑ ද විගණනයට අයත් වේ.

මාගේ විගණනයට අදාල සියළුම තොරතුරු හා පැහැදිලි කිරීම් මාගේ උපරිම දැනුම පරිදි ලබාගෙන ඇත. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

මතය

2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ එහි පරිපාලිතයන්ගේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් බැංකුව විසින් සුදුසු ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යන බවත් මා දරන්නා වූ මතය වේ.

2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ එහි පරිපාලිතයන්ගේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

නිදහස් කිරීම්

1971 අංක 38 දරන මුදල් පනතේ 5(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍යවරයා විසින් 1992 මැයි 14 දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයක් මඟින් බැංකුව එකී මුදල් පනතේ II කොටසේ විධිවිධානවලින් නිදහස් කර ඇත.

පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කරනු ඇත.

එච් ඒ එස් සමරවීර
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන් අංකය	බැංකුව 2013 රු.'000	බැංකුව 2012 රු.'000	වෙනස %	සමූහය 2013 රු.'000	සමූහය 2012 රු.'000	වෙනස %
මුළු ආදායම	7	127,464,058	110,137,919	15.7	134,229,641	115,527,161	16.2
පොළී ආදායම	8.1	114,863,091	95,021,794	20.9	119,504,363	98,751,348	21.0
පොළී වියදම	8.2	(77,719,731)	(59,700,875)	30.2	(80,162,512)	(61,489,053)	30.4
ශුද්ධ පොළී ආදායම	8	37,143,360	35,320,919	5.2	39,341,851	37,262,295	5.6
ගාස්තු සහ කොමිස් ආදායම	9	6,457,118	7,320,001	(11.8)	6,789,600	7,531,297	(9.8)
ගාස්තු සහ කොමිස් වියදම	9	(720,232)	(654,195)	10.1	(854,587)	(761,209)	12.3
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	9	5,736,886	6,665,806	(13.9)	5,935,013	6,770,088	(12.3)
වෙළඳ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	10	3,232,748	3,773,334	(14.3)	3,268,177	3,753,375	(12.9)
මූල්‍ය ආයෝජනවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	11	425,543	366,407	16.1	469,989	368,206	27.6
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)		-	-	-	-	-	-
වෙනත් මෙහෙයුම් ආදායම්	12	2,485,558	3,656,383	(32.0)	4,197,512	5,122,935	(18.1)
මුළු මෙහෙයුම් ආදායම		49,024,095	49,782,849	(1.5)	53,212,542	53,276,899	(0.1)
ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා (ප්‍රතිපාදන)/ප්‍රතිවර්ත්‍ය කිරීම	13	(6,922,902)	(5,904,282)	17.3	(7,339,144)	(6,005,882)	22.2
ශුද්ධ මෙහෙයුම් ආදායම		42,101,193	43,878,567	(4.1)	45,873,398	47,271,017	(3.0)
සේවක මණ්ඩල වියදම	14	(14,669,120)	(12,926,831)	13.5	(15,906,831)	(14,016,559)	13.5
වෙනත් වියදම්	15	(9,012,465)	(7,943,147)	13.5	(11,334,577)	(9,772,058)	16.0
මුළු මෙහෙයුම් වියදම්		(23,681,585)	(20,869,978)	13.5	(27,241,408)	(23,788,617)	14.5
එකතු කළ අගය මත බද්දට පෙර මෙහෙයුම් ලාභය		18,419,608	23,008,589	(19.9)	18,631,990	23,482,400	(20.7)
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු		(2,710,836)	(3,214,291)	(15.7)	(2,756,179)	(3,274,717)	(15.8)
එකතු කළ අගය මත බද්දට පසු මෙහෙයුම් ලාභය		15,708,772	19,794,298	(20.6)	15,875,811	20,207,683	(21.4)
බදු අයකරීමට පෙර ආශ්‍රිත සමාගම්වල ලාභයේ /(අලාභයේ) කොටස	16	-	-	-	228,813	38,585	493.0
ආදායම් බද්දට පෙර ලාභය		15,708,772	19,794,298	(20.6)	16,104,624	20,246,268	(20.5)
ආදායම් බදු වියදම	17	(3,621,659)	(5,377,677)	(32.7)	(3,956,302)	(5,638,274)	(29.8)
වර්ෂය සඳහා ලාභය		12,087,113	14,416,621	(16.2)	12,148,322	14,607,994	(16.8)
වර්ෂයේ ලාභයෙන් :							
මව් සමාගමේ ස්කන්ධ හිමියන්ට අදාල කොටස		12,087,113	14,416,621	(16.2)	12,234,412	14,580,264	(16.1)
පාලනයට යටත් නොවන හිමිකම		-	-	-	(86,090)	27,730	(410.5)
වර්ෂය සඳහා ලාභය		12,087,113	14,416,621	(16.2)	12,148,322	14,607,994	(16.8)
කොටසක ඉපැයුම							
කොටසක මූලික ඉපැයුම (රු.)	18.1	2,417.42	2,883.32	(16.2)	2,446.88	2,916.05	(16.1)
කොටසක තනුක ඉපැයුම (රු.)	18.2	2,417.42	2,883.32	(16.2)	2,446.88	2,916.05	(16.1)
කොටසක ලාභාංශය (රු.)	18.3	1,069.28	1,069.28	-	1,069.28	1,069.28	-

පිටු අංක 232 සිට 362 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන් අංකය	බැංකුව 2013 රු.'000	බැංකුව 2012 රු.'000	බැංකුව වෙනස %	සමූහය 2013 රු.'000	සමූහය 2012 රු.'000	සමූහය වෙනස %
වර්ෂය සඳහා ලාභය		12,087,113	14,416,621	(16.2)	12,148,322	14,607,994	(16.8)
වෙනත් විස්තීරණ ආදායම්							
විදේශීය මෙහෙයුම් පරිවර්තනයේදී ඇතිවන විනිමය අසමානතා	48.5	(197,220)	253,847	(177.7)	(52,743)	567,944	(109.3)
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ජීවගණක ලාභ/(අලාභ)		(408,625)	431,641	(194.7)	(395,668)	421,634	(193.8)
ජීවගණක ලාභ මත විලම්බිත බදු බලපෑම		114,415	-	100.0	111,824	-	100.0
දේපළ, පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ)		-	696,307	(100.0)	1,737,252	738,219	135.3
ප්‍රත්‍යාගණන ලාභ මත විලම්බිත බදු බලපෑම		-	(86,654)	100.0	(480,294)	(86,654)	(454.3)
		(491,430)	1,295,141	(137.9)	920,371	1,641,143	(43.9)
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය වත්කම් නැවත අගය කිරීමෙන් ලැබූ ලාභ/(අලාභ)		509,527	(766,275)	166.5	574,903	(1,038,486)	155.4
ආශ්‍රිත සමාගම්වල වෙනත් විස්තීරණ ආදායම් කොටස		-	-	-	5,543	-	100.0
මුළු වෙනත් විස්තීරණ ආදායම		18,097	528,866	(96.6)	1,500,817	602,657	149.0
වෙනත් විස්තීරණ ආදායම්වලට අදාළ ආදායම් බදු වියදම		-	-	-	-	-	-
වර්ෂය සඳහා අදාළ මුළු වෙනත් විස්තීරණ ආදායම, බදු ගෙවූ පසු		18,097	528,866	(96.6)	1,500,817	602,657	149.0
වර්ෂය සඳහා අදාළ මුළු විස්තීරණ ආදායම, බදු ගෙවූ පසු		12,105,210	14,945,487	(19.0)	13,649,139	15,210,651	(10.3)
මුළු විස්තීරණ ආදායමෙන්:							
මව් සමාගමේ ස්කන්ධ හිමියන්ට අදාල කොටස		12,105,210	14,945,487	(19.0)	13,684,287	15,204,828	(10.0)
පාලනයට යටත් නොවන හිමිකම		-	-	-	(35,148)	5,823	(703.6)
		12,105,210	14,945,487	(19.0)	13,649,139	15,210,651	(10.3)

පිටු අංක 232 සිට 362 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන් අංකය	බැංකුව 2013 රු.'000	බැංකුව 2012 රු.'000	බැංකුව වෙනස %	සමූහය 2013 රු.'000	සමූහය 2012 රු.'000	සමූහය වෙනස %
වත්කම්							
මුදල් හා කෙටිකාලීන අරමුදල්	20	24,901,189	31,544,558	(21.1)	25,182,043	31,955,777	(21.2)
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	21	28,699,132	29,963,240	(4.2)	28,699,132	29,963,240	(4.2)
බැංකු වල ඇති තැන්පතු	22	19,315,520	19,394,466	(0.4)	21,157,190	25,577,197	(17.3)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	23	3,261,073	507,451	542.6	3,261,073	507,451	542.6
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්		22,319,717	797,425	2,699.0	22,851,895	1,423,796	1,505.0
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	24	13,539,791	15,541,185	(12.9)	13,898,242	16,028,758	(13.3)
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	25	129,108,613	99,206,859	30.1	130,190,296	99,182,351	31.3
ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	26	725,331,966	691,899,207	4.8	746,571,819	709,933,498	5.2
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	27	10,325,214	12,080,988	(14.5)	12,852,445	14,361,925	(10.5)
මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින	28	156,899,761	110,956,202	41.4	157,441,572	111,706,459	40.9
පරිපාලිත සමාගම්වල ආයෝජන	29	6,828,699	6,792,848	0.5	-	-	-
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	30	842,988	842,988	-	1,471,267	1,268,995	15.9
ආයෝජන දේපළ	31	-	-	-	151,914	147,047	3.3
දේපළ, පිරියත සහ උපකරණ	32	12,006,180	11,430,827	5.0	20,622,161	18,437,863	11.8
කල්බදු දේපළ	33	83,026	84,976	(2.3)	121,417	124,724	(2.7)
අස්පෘශ්‍ය වත්කම්	34	501,064	376,002	33.3	669,657	461,955	45.0
විලම්බිත බදු වත්කම්	35	-	-	-	47,818	73,042	(34.5)
වෙනත් වත්කම්	36	39,616,967	16,801,769	135.8	40,572,450	18,199,140	122.9
මුළු වත්කම්		1,193,580,900	1,048,220,991	13.9	1,225,762,391	1,079,353,218	13.6
වගකීම්							
බැංකුවලට ගෙවිය යුතු	37	1,166,427	10,127,983	(88.5)	1,336,267	10,329,510	(87.1)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	38	274,948	74,314	270.0	274,948	74,314	270.0
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	39	842,070,000	693,440,642	21.4	850,767,521	700,168,802	21.5
වෙනත් ණය ගැනීම්	40	235,370,269	233,795,515	0.7	240,802,111	245,140,679	(1.8)
නිකුත් කළ ණය සුරැකුම්පත්	41	20,968,357	23,296,349	(10.0)	24,986,818	24,481,798	2.1
ප්‍රවර්තන බදු වගකීම්		-	2,208,461	(100.0)	251,475	2,418,079	(89.6)
විලම්බිත බදු වගකීම්	35	151,623	351,279	(56.8)	2,034,216	1,699,612	19.7
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	42.1	-	-	-	220,748	166,087	32.9
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	42.2	-	-	-	670,073	571,068	17.3
වෙනත් වගකීම්	43	11,521,521	10,155,542	13.5	13,158,933	11,859,101	11.0
යටත් කාලීන ණය	45	24,357,595	23,818,024	2.3	24,347,248	23,801,505	2.3
මුළු වගකීම්		1,135,880,740	997,268,109	13.9	1,158,850,358	1,020,710,555	13.5
ස්කන්ධය							
කොටස් ප්‍රාග්ධනය	46	5,000,000	5,000,000	-	5,000,000	5,000,000	-
ස්ථාවර සංචිත අරමුදල	47	3,538,455	3,285,955	7.7	3,538,455	3,285,955	7.7
රඳවාගත් ඉපයුම්		31,418,794	27,639,146	13.7	33,261,300	29,318,089	13.4
වෙනත් සංචිත	48	17,742,911	15,027,781	18.1	23,816,578	19,621,126	21.4
මව් සමාගමට අයත් මුළු ස්කන්ධය		57,700,160	50,952,882	13.2	65,616,333	57,225,170	14.7
පාලනයට යටත් නොවන හිමිකම		-	-	-	1,295,700	1,417,493	(8.6)
මුළු ස්කන්ධය		57,700,160	50,952,882	13.2	66,912,033	58,642,663	14.1
මුළු වගකීම් සහ ස්කන්ධය		1,193,580,900	1,048,220,991	13.9	1,225,762,391	1,079,353,218	13.6
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	50	655,441,409	455,180,815	44.0	656,226,093	455,863,271	44.0
කොටසක ශුද්ධ වත්කම් (රු.)		11,540.03	10,190.58	13.2	13,123.27	11,445.03	14.7

පිටු අංක 232 සිට 362 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන 2013 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කරන බවට සහතික කරමි.

ඩබ්ලිව් ඒ අසෝක රූපසිංහ
ප්‍රධාන මූල්‍ය නිළධාරී

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කළේ,

රාජු සිවරාමන්
සභාපති

ලලිත් විතාන
අධ්‍යක්ෂ

ඩී එම් ගුණසේකර
මහා කළමනාකරු

2014 මාර්තු 13 දින
කොළඹ දීය

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

බැංකුව

	සටහන් අංකය	කොටස් ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	අනෙකුත් සංචිත: උපලබ්ධිය සඳහා තබා ඇති මූල්‍ය උපකරණ සඳහා සංචිත [සටහන 48.6]	අනෙකුත් සංචිත: ආයෝජන අරමුදල් ගිණුම	අනෙකුත් සංචිත: අනෙකුත් සංචිත	අනෙකුත් සංචිත: ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපැයුම්	මුළු ස්කන්ධය
		රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000
2012 ජනවාරි 1 දිනට ශේෂය		5,000,000	3,008,000	4,169,463	1,484,073	1,346,600	4,612,661	21,733,008	41,353,805
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම									
වර්ෂය සඳහා ලාභය		-	-	-	-	-	-	14,416,621	14,416,621
වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)		-	-	(766,275)	-	253,847	609,653	431,641	528,866
		-	-	(766,275)	-	253,847	609,653	14,848,262	14,945,487
2012 වර්ෂය සඳහා ලාභාංශ	18.3	-	-	-	-	-	-	(5,346,410)	(5,346,410)
ආයෝජන අරමුදල් ගිණුමට පැවරුම්	48.1	-	-	-	3,232,612	-	-	(3,232,612)	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	47	-	277,955	-	-	-	-	(277,955)	-
ප්‍රාථමික වෙළඳ විශේෂ අවදානම් සංචිතයට පැවරුම්	48.3	-	-	-	-	85,147	-	(85,147)	-
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	3,285,955	3,403,188	4,716,685	1,685,594	5,222,314	27,639,146	50,952,882
2013 ජනවාරි 1 දිනට ශේෂය		5,000,000	3,285,955	3,403,188	4,716,685	1,685,594	5,222,314	27,639,146	50,952,882
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම									
වර්ෂය සඳහා ලාභය		-	-	-	-	-	-	12,087,113	12,087,113
වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)		-	-	509,527	-	(197,220)	-	(294,210)	18,097
		-	-	509,527	-	(197,220)	-	11,792,903	12,105,210
2013 වර්ෂය සඳහා ලාභාංශ	18.3	-	-	-	-	-	-	(5,346,410)	(5,346,410)
ආයෝජන අරමුදල් ගිණුමට පැවරුම්	48.1	-	-	-	2,340,405	-	-	(2,340,405)	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	47	-	252,500	-		-	-	(252,500)	-
දේපළ,පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ)	48.2	-	-	-	-	-	(16,003)	-	(16,003)
ප්‍රත්‍යාගණන ලාභ මත විලම්බිත බදු බලපෑම	48.2	-	-	-	-	-	4,481	-	4,481
ප්‍රාථමික වෙළඳ විශේෂ අවදානම් සංචිතයට පැවරුම්	48.3	-	-	-	-	73,940	-	(73,940)	-
2013 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	3,538,455	3,912,715	7,057,090	1,562,314	5,210,792	31,418,794	57,700,160

සමූහය

	සටහන් අංකය	කොටස් ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	අනෙකුත් සංචිත: උපලබ්ධිය සඳහා තබා ඇති මූල්‍ය උපකරණ සඳහා සංචිත [සටහන 48.6]	අනෙකුත් සංචිත: ආයෝජන අරමුදල් ගිණුම	අනෙකුත් සංචිත: අනෙකුත් සංචිත	අනෙකුත් සංචිත: ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපැයුම්	පාලනයට යටත් නොවන හිමිකම	මුළු ස්කන්ධය
		රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000
2012 ජනවාරි 1 දිනට ශේෂය		5,000,000	3,008,000	4,987,494	1,570,276	1,754,075	7,716,172	23,355,259	1,449,031	48,840,307
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම										
වර්ෂය සඳහා ලාභය		-	-	-	-	-	-	14,580,264	27,730	14,607,994
වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)		-	-	(1,016,579)	-	567,944	651,565	421,634	(21,907)	602,657
		-	-	(1,016,579)	-	567,944	651,565	15,001,898	5,823	15,210,651
2012 වර්ෂය සඳහා ලාභාංශ	18.3	-	-	-	-	-	-	(5,346,410)	-	(5,346,410)
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	-	-	-	-	-	(60,302)	(60,302)
ආයෝජන අරමුදල් ගිණුමට පැවරුම්	48.1	-	-	-	3,279,672	-	-	(3,279,672)	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	47	-	277,955	-	-	-	-	(277,955)	-	-
වෙනත් සංචිත වලට පැවරුම්		-	-	-	-	25,360	-	(25,360)	-	-
අත්පත් කර ගැනීම්, බැහැර කිරීම් සහ පාලනයට යටත් නොවන හිමිකමෙහි වෙනස්වීම්		-	-	-	-	-	-	(24,524)	22,941	(1,583)
ප්‍රාථමික වෙළඳ විශේෂ අවදානම් සංචිතයට පැවරුම්	48.3	-	-	-	-	85,147	-	(85,147)	-	-
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	3,285,955	3,970,915	4,849,948	2,432,526	8,367,737	29,318,089	1,417,493	58,642,663
2013 ජනවාරි 1 දිනට ශේෂය		5,000,000	3,285,955	3,970,915	4,849,948	2,432,526	8,367,737	29,318,089	1,417,493	58,642,663
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම										
වර්ෂය සඳහා ලාභය		-	-	-	-	-	-	12,234,412	(86,090)	12,148,322
වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)		-	-	544,746	-	(52,743)	1,216,233	(258,360)	50,941	1,500,817
		-	-	544,746	-	(52,743)	1,216,233	11,976,052	(35,149)	13,649,139
2013 වර්ෂය සඳහා ලාභාංශ	18.3	-	-	-	-	-	-	(5,346,410)	-	(5,346,410)
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	-	-	-	-	-	(30,952)	(30,952)
ආයෝජන අරමුදල් ගිණුමට පැවරුම්	48.1	-	-	-	2,378,600	-	-	(2,378,600)	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	47	-	252,500	-	-	-	-	(252,500)	-	-
දේපළ, පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණන ලාභ / (අලාභ)		-	-	-	-	-	(16,003)	-	-	(16,003)
ප්‍රත්‍යාගණන ලාභ මත විලම්බිත බදු බලපෑම		-	-	-	-	-	4,481	-	-	4,481
වෙනත් සංචිත වලට පැවරුම්		-	-	-	-	18,332	-	(18,332)	-	-
අත්පත් කර ගැනීම්, බැහැර කිරීම්, ඒකාබද්ධ කිරීම් සහ පාලනයට යටත් නොවන හිමිකමෙහි වෙනස්වීම්		-	-	-	-	-	27,866	36,941	(55,692)	9,115
ප්‍රාථමික වෙළඳ විශේෂ අවදානම් සංචිතයට පැවරුම්	48.3	-	-	-	-	73,940	-	(73,940)	-	-
2013 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	3,538,455	4,515,661	7,228,548	2,472,055	9,600,314	33,261,300	1,295,700	66,912,033

පිටු අංක 232 සිට 362 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන් අංකය	බැංකුව 2013 රු.'000	බැංකුව 2012 රු.'000	සමූහය 2013 රු.'000	සමූහය 2012 රු.'000
මෙහෙයුම් කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ					
ආදායම් බද්දට පෙර ලාභය		15,708,772	19,794,298	16,104,624	20,246,268
ගැලපීම් :					
ශුද්ධ පොළී ආදායම	8	(37,143,360)	(35,320,919)	(39,341,851)	(37,262,295)
වෙළඳ සුරැකුම්පත් වෙනුවෙන් ලැබූ ලාභාංශ ආදායම	10	(138,173)	(94,153)	(153,098)	(94,377)
පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වලින් ලැබූ ලාභාංශ	12	(244,386)	(324,799)	-	-
බදු අයකරීමට පෙර ආශ්‍රිත සමාගම්වල (ලාභයේ) /අලාභයේ කොටස	16	-	-	(228,813)	(38,585)
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	49.1	(77,016,684)	(116,036,895)	(82,264,945)	(115,905,927)
මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්	49.2	119,165,110	82,392,310	119,104,860	83,188,312
බදු පෙර ලාභයේ ඇතුලත් මුදල් නොවන වෙනත් අයිතම	49.3	6,860,242	7,632,741	7,722,380	8,008,818
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද වෙනත් ශුද්ධ (ලාභ)/අලාභ		(425,544)	(366,406)	(469,989)	(368,206)
		26,765,977	(42,323,823)	20,473,168	(42,225,992)
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය		(4,668,297)	(4,156,871)	(4,672,881)	(4,169,844)
පොළී ලැබීම්		83,182,750	66,059,418	87,390,368	69,705,947
පොළී ගෙවීම්		(53,834,481)	(34,795,501)	(49,524,430)	(37,108,275)
ලාභාංශ ලැබීම්		138,173	94,153	153,098	94,377
ආදායම් බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ලැබූ /(භාවිතා කළ) ශුද්ධ මුදල්		51,584,122	(15,122,624)	53,819,323	(13,703,787)
ආදායම් බදු ගෙවීම්		(4,533,553)	(4,148,349)	(4,705,085)	(4,382,700)
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ /(භාවිතා කළ) ශුද්ධ මුදල්		47,050,569	(19,270,973)	49,114,238	(18,086,487)
ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ					
කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ වැඩිවීම		(45,566,069)	(56,731,405)	(45,357,623)	(57,025,638)
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ (වැඩිවීම) /අඩුවීම		2,360,218	(1,727,908)	2,173,080	(1,281,698)
ණය හා ලැබිය යුතු මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ වැඩිවීම		(29,901,754)	(9,480,520)	(31,007,945)	(9,558,613)
පරිපාලිතයන්හි ඇල්මේ වැඩිවීම		(35,851)	(596,624)	(35,851)	(1,350)
ආයෝජන දේපළ (අත්පත් කර ගැනීම්)/විකිණීම්		-	-	(7,730)	1,140
දේපළ, පිරියත, උපකරණ සහ කල්බදු දේපළ අත්පත් කර ගැනීම්		(1,682,211)	(1,066,781)	(1,804,821)	(1,316,646)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම්		(262,860)	(153,783)	(372,298)	(166,401)
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		108,919	105,603	137,794	106,413
ලාභාංශ ලැබීම්		575,013	646,036	395,804	367,080
පොළී ලැබීම්		23,053,575	16,040,375	23,413,612	17,996,652
ආයෝජන කටයුතු සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		(51,351,020)	(52,965,007)	(52,465,978)	(50,879,061)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන් අංකය	බැංකුව 2013 රු.'000	බැංකුව 2012 රු.'000	සමූහය 2013 රු.'000	සමූහය 2012 රු.'000
මූල්‍යනය කිරීමේ කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
වෙනත් ණයට ගැනීම් වල ශුද්ධ වැඩිවීම		20,361,456	105,650,070	16,248,865	110,535,429
පරිපාලිත සමාගම්වල හිමිකම් නිකුතුවෙන් පාලනයට යටත් නොවන හිමිකම සඳහා ලැබීම්		-	-	21,954	18,335
ණයකර නිකුතුවෙන් ලැබීම්		8,000,000	9,400,000	11,000,000	9,400,000
ණයකර නිදහස් කිරීම සඳහා ගෙවූ මුදල්		(9,684,601)	(5,500,000)	(9,917,054)	(5,550,000)
ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ		(5,346,410)	(5,346,410)	(5,346,410)	(5,346,410)
පාලනයට යටත් නොවූ හිමිකම සඳහා ගෙවූ ලාභාංශ		-	-	(30,952)	(60,302)
ණය හා ණය සුරැකුම්පත් සඳහා පොළී ගෙවීම්		(17,707,813)	(14,563,581)	(22,966,256)	(15,874,370)
මූල්‍යනය කිරීමේ කටයුතු වලින් ලැබූ /(භාවිතා කළ) ශුද්ධ මුදල්		(4,377,368)	89,640,079	(10,989,853)	93,122,682
වර්ෂය තුලදී මූදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම)		(8,677,819)	17,404,099	(14,341,593)	24,157,134
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		46,780,915	29,376,816	55,296,768	31,139,634
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		38,103,096	46,780,915	40,955,175	55,296,768
සටහන 1					
මුදල් සහ මුදල් හා සමාන දෑ විශ්ලේෂණය					
මුදල් සහ කොටිකාලීන අරමුදල්	20	24,901,189	31,544,558	25,182,043	31,955,777
පරිණත කාලය තෙමසකට වඩා අඩු බැංකුවලින් ලැබිය යුතු දෑ		13,550,595	15,381,086	16,240,285	23,572,247
බැංකු අයිරා	37	(348,688)	(144,729)	(467,153)	(231,256)
		38,103,096	46,780,915	40,955,175	55,296,768

පිටු අංක 232 සිට 362 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

1. ආයතනික තොරතුරු

ලංකා බැංකුව, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත යටතේ 1939 අගෝස්තු 01 දින ශ්‍රී ලංකාව තුළ ප්‍රතිෂ්ඨාපිත රාජ්‍ය බැංකුවකි. 1988 අංක 30 දරණ බැංකු පනත හා ඒ හා ආනුෂාංගික සංශෝධනවලට යටත්වන ලෙස ස්ථාපිතකර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ලංකා බැංකුවේ ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ 01, ලංකා බැංකු මාවතෙහි අංක 01 දරණ ස්ථානයේ ලංකා බැංකු චතුරස්‍රයෙහි පිහිටා ඇත. ලංකා බැංකුව නිකුත් කර ඇති ණයකර කොළඹ කොටස් වෙළඳපළෙහි ලැයිස්තුගත කර ඇති අතර ඇමරිකානු ඩොලර් මිලියන.1000 ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර සිංගප්පූරුවෙහි කොටස් වෙළඳපළෙහි ලැයිස්තුගත කර ඇත.

2013 දෙසැම්බර් 31 දිනට සේවකයින් 8883 ක් ලංකා බැංකුවෙහි සේවයේ නියුක්තව සිටියහ. (2012 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 7790 කි.)

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ

2013 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ බැංකුව, ඊට අයත්වන පරිපාලිතයන් (බැංකුව සහ එහි පරිපාලිතයන්ගේ එකතුව සමූහය ලෙස හැඳින්වේ) සහ ආශ්‍රිත සමාගම්වල සමූහයට ඇති අයිතිවාසිකම් අයත්වන ආකාරයට සකස්කර ඉදිරිපත්කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ, 2014 මාර්තු මස 13 වන දින බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කිරීම සඳහා අධිකාරිය ලබාදෙන ලදි.

1.1 ප්‍රධාන ක්‍රියාකාරකම්

බැංකුව

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස වාණිජ බැංකුකරණය, පුද්ගල බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, උකස් මූල්‍යකරණය, කල්බදුකරණය, ආයෝජන බැංකුකරණය, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, ආයතනික බැංකුකරණය, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සම්බන්ධව වෙළඳ කටයුතු, උකස් සේවා, ණයපත් පහසුකම්, අක්වෙරළ බැංකු කටයුතු, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු, ටෙලි බැංකුකරණය, අන්තර්ජාල බැංකුකරණය සහ වෙනත් මූල්‍ය සේවාවන් හඳුනාගත හැකිය.

පරිපාලිතයන්

ලංකා බැංකුවේ පරිපාලිතයන්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් පී එල් සී	ලංකා බැංකු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ පාලනය හා නඩත්තු කිරීම වැඩි දියුණු කිරීම හා උපයෝගීතාවය රඳවා ගැනීම.
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී	කල්බදුකරණය සහ කුලී පිට ගනුදෙනු, සංස්ථාපිත හා සිල්ලර ණය, සංස්ථාපිත වෙළඳ මූල්‍ය උපදේශක සේවා, ප්‍රාග්ධන වෙළඳපල ක්‍රියාකාරකම්, ආන්තික ගනුදෙනු සහ ක්ෂුද්‍ර මූල්‍යනය
සී/ස බීඕසි මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම	බැංකුවට සහ එහි පරිපාලිතයන් සඳහා කළමනාකරණ සේවා සැපයීම
සී/ස බීඕසි ප්‍රෝපර්ටි ඩිවලප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම	කොළඹ 03 බීඕසි මර්චන්ට් ටවර් හි සහ මහනුවර සීබෑන්ක් හවුස් හි කාර්යාල ඉඩ පහසුකම් කුළියට දීම
සී/ස බීඕසි ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සේවා සම්බන්ධ කටයුතු
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	හෝටල් සේවා සැපයීම
සී/ස එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස්	තැන්පතු භාරගැනීම, කල්බදු පහසුකම් සැපයීම, කුලී පිට ගනුදෙනු, අත්තිකාරම් සහ අනෙකුත් ණය පහසුකම්, දේපළ සංවර්ධනය සහ ඒ ආශ්‍රිත සේවා
සී/ස සී බෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සහ ආගන්තුක නිවහන් පහසුකම් පවත්වාගෙන යාම
සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගම	ජීවිත සහ පොදු රක්ෂණ සේවා සැපයීම
සී/ස කොළදෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම	ජල විදුලි උත්පාදනය
සී/ස ලංකා බැංකුව (චික්සත් රාජධානිය) සමාගම	චික්සත් රාජධානියේ මූල්‍ය සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති අතර තැන්පතු භාරගැනීම සහ ආයෝජන කටයුතු ඇතුළු මූල්‍ය සේවා සැපයීම
සී/ස එම් බී එස් එල් සේවින්ස් බෑන්ක් සමාගම	බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන අතර තැන්පතු භාර ගැනීම, කල් බදු පහසුකම්, කුලීපිට ගනුදෙනු සහ උකස් සේවා ඇතුළු මූල්‍ය සේවා සැපයීම කරනු ලබයි

ආශ්‍රිතයන්

ලංකා බැංකුවේ ආශ්‍රිත සමාගම්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස සී බෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	ඒකක භාර අරමුදල් සහ පෞද්ගලික ආයෝජන කළඹයන් කළමනාකරණය
සී/ස සදර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම	ණය පහසුකම් සැපයීම
සී/ස ලංකා සික්‍යුරිටීස් (පෞද්ගලික) සමාගම	ලියාපදිංචි කොටස් තැරැව්කරුවෙකු වන අතර ස්කන්ධ ගනුදෙනු, ණය ගනුදෙනු සහ ආන්තික ගනුදෙනු
සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ්(පෞද්ගලික) සමාගම	දේපළ මිලදී ගැනීම,කුලියට දීම සහ අත්පත් කරගැනීම, දේපළ සංවර්ධනය සහ දේපළ සංවර්ධන ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩිස් සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගම	දේපළ කුලියට දීම

අදාළ වර්ෂය තුළදී බැංකුවේ, පරිපාලිතයන් හි සහ ආශ්‍රිතයන්හි මූලික ක්‍රියාකාරකම් වල ස්වභාවයන්හි සැලකිය යුතු වෙනසක් සිදු වී නැත.

පරිපාලිත සමාගම් දෙකක් වන සී/ස සීලීස් සමාගම සහ සී/ස එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගම 2013 අගෝස්තු 22 වැනි දින ඒකාබද්ධ කරන ලදී. ඒකාබද්ධ වීමේ ක්‍රියාවලියෙන් පසුව සී/ස එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගම නමින් අඛණ්ඩව පවතිනවා ඇත.

2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්හි ප්‍රතිපාදන, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව, බැංකුවේ සහ එහි පරිපාලනයන්හි හා ආශ්‍රිතයන්හි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

3. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

3.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත්කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් සමන්විත වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට හා ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සකස් කර ඇත. (මින් පසුව ශ්‍රී ලං මූ වා ප්‍ර යනුවෙන් සඳහන් කරනු ඇත). ලංකා බැංකු ඇඥා පනතට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර හා වාර්තා කර ඇත. තවද මෙම මූල්‍ය ප්‍රකාශ 1988 අංක 30 දරණ බැංකු පනතට අනුව සකස් කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති වල විස්තර කෙරෙන පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2013 දෙසැම්බර් 31 වැනි දිනට හෝ පසුව බලපැවැත්වෙන ශ්‍රී ලං මූ වා ප්‍ර වලට අනුකූල වන පරිදි පිළියෙල කර ඇති අතර ඒ සමඟ සංසන්දනාත්මක වර්ෂය වන 2012 දෙසැම්බර් 31 වැනි දිනට සහ දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දත්ත ඉදිරිපත් කර ඇත.

3.2 මිනුම්කරණයේ පදනම

පහත සඳහන් ඒවා හැරුණු විට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන චෛතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

- වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම් සාධාරණ අගය මත මැනීම.
- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගය මත මැනීම.
- මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින සාධාරණ අගය මත මැනීම.
- අයිතිකරු විසින් පදිංචි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයේ එනම් ප්‍රත්‍යාගණනය කළ දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන්කිරීම අඩු කළ අගයට වාර්තා කෙරේ.
- නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් පීව ගණකාඥයකු විසින් තක්සේරු කර වර්තමාන අගය මත හදුනාගත් නිශ්චිත ප්‍රතිලාභ බැදීම් වලින් සැළසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නා වූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

3.3 ව්‍යවහාර හා වාර්තාකරණ මුදල් ඒකක

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් අයිතමයන් මිනුම්කරණය කරනු ලබන්නේ බැංකුව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයක් තුළ පවතින මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සමූහයේ ව්‍යවහාර මෙන්ම වාර්තාකරණ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වන අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී වෙනත් අයුරකින් සඳහන් නොකර ඇති විටෙක සියළුම අගයන් ආසන්නම රුපියල් දහස දක්වා වන පරිදි වැටයීම කර ඇත.

3.4 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

බැංකුව සහ සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් ද්‍රවශීලතාවය අනුව පෙළ ගස්වා ඇත. ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කිරීම මඟින් ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදුවන්නේ නීතිමය වශයෙන් බලය ලබා දී ඇති විට සහ ශුද්ධ වටිනාකම මත හෝ එකවිටම වත්කම් සහ වගකීම් පියවා ගැනීමේ අදහසක් ඇති විටම පමණක් වේ. ගිණුම්කරණ ප්‍රමිතයක් මඟින් ඉඩ සලසා ඇති විටක හෝ අර්ථ නිරූපණය කර ඇති විටක සහ විශේෂයෙන් බැංකු ගිණුම්කරණ ප්‍රතිපත්තියකින් සඳහන් කර ඇතිවිටක පමණක් ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ සඳහන් ආදායම් සහ වියදම් හිලව් කරනු ලැබේ.

3.5 සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලට අනුකූල වීමේ අවශ්‍යතාවය පරිදි සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ග කරනු ලැබේ.

3.6 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේ භාවිතය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඒ සඳහා භාවිතා කළ යුතු සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, තීරණය කිරීම හා වාර්තා වන වත්කම් සහ වගකීම් අගයන් මෙන්ම ආදායම් සහ වියදම් සංඛ්‍යාවන් නිශ්චය කිරීමේදී ඒ සඳහා බලපාන ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිශ්චය කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. සැබෑ ප්‍රතිඵලය ඇස්තමේන්තු සමඟ වෙනස් විය හැක. විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් ඉතිහාසය පිළිබඳ වූ අත්දැකීම් සහ විවිධ සාධක නිසා වෙනස් විය හැකියයි සිතිය හැකි අවස්ථාවන් මත පදනම් වන අතර මේවා කාලීන පදනමක් මත සමාලෝචනයට භාජනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සමාලෝචනයේදී ඒවා පිළිබඳව සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළදී සහ අනාගත කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධනයන් අදාළ වන පරිදි ගිණුම්ගත කෙරේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යෙදීමේ ක්‍රියාවලියේදී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වඩා වැදගත් බලපෑමක් ඇති කරන්නා වූ අගයන් මත කළමනාකරණය විසින් පහත සඳහන් ඇස්තමේන්තු, උපකල්පනයන් සහ විනිශ්චයන් යොදනු ලැබේ.

බැඳීම්
සියළුම දැනගත හැකි සහ මැනිය හැකි වගකීම් හි වටිනාකම නිශ්චය කිරීම සඳහා සියළුම හඳුනාගත හැකි අවදානම් අගය කරනු ලැබේ.

අසම්භාව්‍ය වගකීම්
අසම්භාව්‍ය වගකීම් යනු අනාගත අවිනිශ්චිත සිදුවීම් වල තහවුරු කිරීමක් මත ඇතිවිය හැකි බැඳියාවක් හෝ වර්තමානයේ බැඳීමක් ඇතත් ආර්ථික ප්‍රතිලාභයන් ගලා යාමේ නම්‍යතාවක් නොමැති හෝ විශ්වසනීය ලෙස මැනිය නොහැකි වගකීම්ය. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර, ඒවායේ සිදුවිය හැකි බව දුරස්ථ නොවන්නේ නම් අනාවරණය කිරීමක් කෙරේ.

අඛණ්ඩ පැවැත්ම
තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි සහ සෑහීමකට පත්විය හැකි සම්පත්, බැංකුව සතු බව කළමනාකරණය උපකල්පනය කරයි.

තවදුරටත් බැංකුවෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැලකිය යුතු අවිශ්වාසයක් සහ අවිනිශ්චිතතාවයක් කළමනාකරණය නොදකී. එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අඛණ්ඩව පවතීය යන සංකල්පය භාවිතා කර ඇත.

සාධාරණ අගය මත මූල්‍ය උපකරණ
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වාර්තාවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළඳපලෙන් ලබා ගත නොහැකි අවස්ථාවල ඒවා ගණිතමය ආකෘතියක් පදනම් කරගත් තක්සේරු ශිල්ප ක්‍රමයක් භාවිතා කර ලබා ගනු ලැබේ. මෙම ආකෘතීන් සඳහා අවශ්‍ය යෙදවුම් සොයාගනු ලබන්නේ හැකි අයුරින් වෙළඳපල නිරීක්ෂණය කිරීමෙනි. කෙසේ වෙතත් මේ සඳහා දත්ත නොමැති විට විනිශ්චයන් මත සාධාරණ අගය ගණනය කරනු ලැබේ.

ණය සහ අත්තිකාරම් සඳහා අලාභ හානිකරණය
සමූහය විසින් නිරීක්ෂණය කරනු ලබන කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් වාර්තාකරණ දිනයට අගයකර ඒ සඳහා හානිකරණ අලාභයක් ඇත්නම් ඒවා ආදායම් ප්‍රකාශයේ වාර්තා කරනු ලබයි. අලාභ හානිකරණය තීරණය කිරීමේදී උපකල්පන අගයන් සහ අනාගත මුදල් ප්‍රවාහයන් වල කාලය නිශ්චය කරන විට නිශ්චිත කළමනාකරණ විනිශ්චයන් අවශ්‍ය වේ. මෙම විනිශ්චයන් සාධක කීපයක් පදනම් කරගත් උපකල්පනයන්ගෙන් යුක්ත වන නිසා එය සැබෑ තත්ත්වය සමග වෙනස් වන බැවින් අනාගත ප්‍රතිපාදනද එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් විය හැක.

ණය සහ අත්තිකාරම් කේවල වශයෙන් තක්සේරුකර හානිකරණයක් නොමැති විට සහ කේවල් වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ අත්තිකාරම් සාමූහිකව තක්සේරු කර දරන ලද අලාභ සිදුවීම් සඳහා විෂයබද්ධ සාධක ඇතිවිට ඒ මත පදනම්ව ඒ හා සමාන අවදානම් ලක්ෂණ ඇති සාමූහික වත්කම් සඳහා ප්‍රතිපාදන නිර්ණය කල යුතුය. සාමූහික තක්සේරුව සඳහා අවශ්‍ය දත්ත ගනු ලබන්නේ ණය කළඹ මඟින් (ඒවා නම් ණය වර්ගය, භූගෝලීය මට්ටම යනාදිය) සහ අවදානම් ඒකරාශීවීමේ බලපෑම සඳහා උපකල්පනයන් සමග ආර්ථික දත්ත (විරැකියා මට්ටම, දේපළ වෙළඳම් මිල දත්තයන්, රටේ අවදානම සහ එක් එක් සමූහයන්ගේ ක්‍රියාකාරීත්වයේ වෙනස්වීම්) උපයෝගී කරගනිමින්ය.

උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන හානිකරණය
සමූහය විසින් උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන ලෙස වර්ග කර ඇති ණය සුරුකුම්පත් ඒවා හානිකරණයට ලක් වී දැයි නිරීක්ෂණයකර අගය කරනු ලැබේ. මේ සඳහා ද ණය සහ අත්තිකාරම්වල කේවල තක්සේරුකරණයේ දී යොදාගත් විනිශ්චයන්ට සමාන විනිශ්චයන් යොදාගනු ලැබේ. සමූහය විසින් උපලබ්ධිය සඳහා පවතින ස්කන්ධ ආයෝජනවල පිරිවැයට වඩා සාධාරණ අගය සැළකිය යුතු හෝ දිගුකාලීනව ඇතිවන අඩුවීමක් ඇතිවිට ඒ සඳහා හානිකරණ වියදම් වාර්තා කරනු ලැබේ. සැළකිය යුතු හෝ දිගුකාලීන යන්න නිර්ණය කිරීමට විනිශ්චයක් අවශ්‍ය වේ. මෙම විනිශ්චයන් ගැනීමේදී අනෙකුත් සාධක අතර ඓතිහාසික කොටස් මිලෙහි චලනයන්, පැවතුම් කාලය සහ විස්තාරය යන සාධක ආයෝජනවල සාධාරණ අගයට වඩා ධාරණ අගය අඩු වූ විට සමූහය විසින් අගයනු ලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම
ආයු ගණක තක්සේරු යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම් සහ අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් නිර්ණය කරනු ලබයි. ආයුගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාත, සැලසුම් වත්කම් මත අපේක්ෂිත අනුපාතය, අනාගත වැටුප් වැඩි වීම්, මරණ අනුපාතය සහ අනාගත විශ්‍රාම වැඩිවීම යන උපකල්පන මත නිර්ණය කරනු ලැබේ. මෙම සැලසුම් දිගු කාලීන ස්වභාවයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු අවිනිශ්චිත ස්භාවයක් ගනු ඇත. සියලුම උපකල්පන සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරයි.

දේපළ, පිරියත සහ උපකරණවල සාධාරණ අගය
සමූහයේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ඇති ගොඩනැගිලි සාධාරණ අගය මත සටහන් කරනු ලැබේ.දේපලවල සාධාරණ අගය නීර්ණය කිරීම සඳහා සමූහය විශේෂඥ ස්වාධීන තක්සේරුකරුවෙකු යොදවනු ලැබේ. ඒ හා සමාන වත්කම් පවතින වෙළඳපල මිල යටතේ ලබාගත හැකිවිට ඒවා සාක්ෂි වශයෙන් ගෙන සාධාරණ අගය ඇස්තමේන්තු කරනු ලැබේ.

බදුකරණය
සමූහය විසින් ආදායම් බදු සහ මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බද්ද ඇතුළුඵව අනෙකුත් බදු ගෙවිය යුතුවේ. ප්‍රවර්තන බදු, විලම්භිත බදු සහ අනෙකුත් බදු වර්ග ශ්‍රී ලං මූ වා ප්‍ර අනුව මූල්‍ය ප්‍රකාශනවල සහ බදු අය කල හැකි ලාභය ගණනයේදී යොදා ගන්නා නමුදු මෙතෙක්, බදු මාර්ගෝපදේශයන් මගින් ස්ථිර ක්‍රමවේදයක් ඉදිරිපත් නොවුනු හෙයින් බදු ප්‍රතිපාදන තැබීමේදී සැලකිය යුතු විනිශ්චයන් සහ ප්‍රමාණාත්මක සාධකයන් සැලකිල්ලට ගනු ලැබීමට සිදුවී ඇත.

සමූහය හඳුනාගත් ප්‍රවර්ථන, විලම්බිත සහ අනෙකුත් වත්කම් සහ වගකීම් සඳහා අනාගතයේදී තවදුරටත් බදු ගෙවිය යුතු වේ දැයි තක්සේරු කර ඇත. අවසාන බදු අගය මුලින් වාර්තා කළ අගයන් සමඟ වෙනස් වන විට එහි බලපෑම නිර්ණය කරන කාලපරිච්ඡේදයේ දී ආදායම සහ විලම්බිත බදු සකස්කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීවිත කාලය
වත්කම්වල සුන්බුන් අගය, ඵලදායී ජිවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම වාර්තා තක්සේරු කිරිම සඳහා කළමනාකරණය විසින් යොදනු ලබන විනිශ්චයන් පිළිබඳව අවිනිශ්චිතතාවයක් පවතී.

ආයෝජන දේපල වර්ග කිරීම
ආයෝජන දේපලක් ලෙස සුදුසුකම් ලැබීම නිර්ණය කිරීම සඳහා කළමණාකරණ විනිශ්චයක් අවශ්‍ය වේ. බදු කුලී ලබා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම හෝ ඒ අරමුණු දෙකම සඳහා පවත්වා ගනු ලබන දේපල තුලින්, සමූහය පවත්වාගෙන යනු ලබන අනෙකුත් වත්කම් වලින් ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ජනනය කරනු ලබයි නම් එම දේපල ආයෝජන දේපලක් ලෙස නිර්ණය කෙරේ. අනෙක් අතට මෙහෙයුම් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන හෝ සේවා සැපයීමේ ක්‍රියාවලියේ යොදාගන්නා හෝ පරිපාලන අරමුණින් පවත්වාගෙන යනු ලබන එක එල්ලේ මුදල් ප්‍රවාහ ජනනය කරනු නොලබන වත්කම් දේපල පිරියත සහ උපකරණ ලෙස නිර්ණය කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ හෙළිදරව් කිරීම්හි වෙනස්කම්, නව සහ සංශෝධිත ගිණුම්කරණ ප්‍රමිති සහ අර්ථකථනයන්
සමූහය සහ බැංකුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලං ගි ප්‍ර) 19 - සේවක ප්‍රතිලාභ ප්‍රථම වරට භාවිතා කරන ලදි. සමූහය විසින් කරන ලද නවතම හෙළිදරව් කිරීම් වලට අමතරව සේවක ප්‍රතිලාභ ගණනය කිරීමේ වෙනසක් නොමැත.

4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දැක්වේ. පහත සඳහන් සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේදී සෑම කාලපරිච්ඡේදයක් සඳහා අඛණ්ඩව යොදා ඇත.

4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

4.1.1 පරිපාලිත සමාගම්

බැංකුව විසින් පාලනය කරනු ලබන ආයතන පරිපාලිතයන් වේ. පරිපාලිතයන්ගේ පාලනය පටන් ගත් දින සිට පාලනය අහිමිවන දින තෙක් එම පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල අඩංගු වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගනුදෙනු සඳහා සහ ඒ හා සමාන අනෙකුත් අවස්ථා සඳහා යොදා ගනු ලබනුයේ ඒකාකාරී ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ය. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් පොදු මූල්‍ය වර්ෂය සඳහාය. පරිපාලිතයන්ට ණය හා අත්තිකාරම් නැවත ගෙවීම හෝ මුදල් ලාභාංශ ආකාරයෙන් මවු සමාගමට කිසිදු සැළකිය යුතු බාධාවකින් තොරව පැවරීම් සිදුකල හැක. එක්සත් රාජධානියේ පිහිටුවා ඇති සී/ස ලංකා බැංකුව (එක්සත් රාජධානිය) සමාගම හැර බැංකුවේ අනෙකුත් සියලුම පරිපාලිතයන් ශ්‍රී ලංකාව තුල සංස්ථාපනය කර ඇත. බැංකුවේ ප්‍රධාන පරිපාලිත සමාගම්වල නාම ලේඛනයක් මෙම මූල්‍ය ප්‍රකාශවල 1.1 වන සටහන යටතේ ප්‍රකාශ කොට ඇත.

4.1.2 ආශ්‍රිත සමාගම්

ආශ්‍රිත සමාගම් යනු සමූහය තුල සැලකිය යුතු බලපෑමක් කළ හැකි එහෙත් මූල්‍ය සහ මෙහෙයුම් පාලනයකින් තොර සමාගම් වේ. සැලකිය යුතු බලපෑමක් යනුවෙන් අදහසක් වන්නේ 20% ක් සහ 50% ක් අතර ඡන්ද බලයක් හිමි කොටස් වලින් සමන්විත වූ සමාගම් වේ. ආශ්‍රිත සමාගම් වල සමූහයේ ආයෝජන පිරිවැයට මූලිකව හඳුනාගන්නා අතර පසුව ස්කන්ධ ක්‍රමය (ආයෝජිතයාගේ ගිණුම් මත ස්කන්ධය) භාවිතා කර ගිණුම් තබයි. ආයෝජන පිරිවැයට ගනුදෙනු පිරිවැයද ඇතුලත්ය. බැංකුව විසින් 20% ක් සහ 50% ක් අතර ස්කන්ධ ප්‍රමාණයක් දරා සිටියත් ඒ සඳහා සැලකිය යුතු බලපෑමක් කල නොහැකි නම් ඒවා ආශ්‍රිත සමාගම් ලෙස හඳුන්වනු නොලැබේ.

සැලකිය යුතු පාලනය පටන් ගත් දින සිටම අවසාන වන දින තෙක් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වලට ගලපන ලද බැංකුවේ ලාභයේ හෝ අලාභයේ කොටස සහ විස්තීරණ ආදායමේ කොටස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අඩංගු වේ.

බැංකුවේ අලාභයේ කොටස ආයෝජිතයාගේ ස්කන්ධයේ වඩා වැඩි වන විට දිගු කාලීන ආයෝජනද ඇතුළුව ධාරණ අගය වාර්තා කරනු ලබන්නේ ශුන්‍ය අගයට වන අතර සමූහය ආයෝජිතයා වෙත බැඳීමක් නොමැති විට තවදුරටත් අලාභ හඳුනා නොගනී. ආශ්‍රිතයන් විසින් ඉන්පසුව ලාභ වාර්තා කරන විට බැංකුවේ ලාභයේ කොටස හඳුනා ගැනීම ආරම්භ වන්නේ හඳුනා නොගත් අලාභයේ කොටස ලාභයේ කොටසින් සම්මත වූ පසුවය.

බැංකුවේ ආශ්‍රිත සමාගම්වල නාම ලේඛනයක් මෙම මූල්‍ය ප්‍රකාශවල 1.1 වන සටහන යටතේ ප්‍රකාශ කොට ඇත.

4.1.3 ව්‍යාපාර සංයෝජනය

අත්පත් කර ගැනීමේ ක්‍රමය මඟින් ව්‍යාපාර සංයෝජනය ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ දිනයේදී පාලනයට යටත් නොවන හිමිකම ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය මත හෝ ආයෝජකයාගේ හඳුනාගත් ශුද්ධ වත්කම් වල පාලනයට යටත් නොවන හිමිකමට සමානුපාත කොටසෙනි.

අත්පත් කර ගැනීම සම්බන්ධිත වියදම යනු ව්‍යාපාර සංයෝජනයේදී අත්පත් කරනු ලබන්නා විසින් දරන ලද වියදම් වේ. එම වියදම් වල අඩංගු වන්නේ සොයන්නාගේ ගාස්තු, උපදේශක, නීති, ගිණුම්කරණ, ඇස්තමේන්තු සහ අනෙකුත් වෘත්තිමය නීති උපදේශන ගාස්තු, සාමාන්‍ය පරිපාලන වියදම්, අභ්‍යන්තර දෙපාර්තමේන්තු අත්පත් කර ගැනීමේ සහ පවත්වා ගැනීමේ වියදම් සහ ණය සහ ස්කන්ධ සුරුකුම්පත් ලියාපදිංචි කිරීමේ සහ නිකුත් කිරීමේ වියදම්. අත්පත් කර ගැනීම සම්බන්ධිත යනු ණය ස්කන්ධ සුරුකුම් පත් නිකුත් කිරීම කල කාලපරිච්ඡේද වල ඊට සම්බන්ධිත වියදම් සහ සේවය ලබාගැනීම හැර වියදම් වේ.

අත්පත් කර ගැනීමේ දිනයේදී පාලනයට යටත් නොවන හිමිකම් ගණනය කිරීම සඳහා පදනම වශයෙන් සාධාරණ අගයට ගනුදෙනුවෙන් ගනුදෙනුවට හෝ ශුද්ධ වත්කම්වලින් සමානුපාතික කොටස සමූහය විසින් තෝරා ගනු ලැබේ.

සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයේදී දරණ ලද වියදම් ලෙස ණය නිකුත් කිරීමේදී හා ස්කන්ධ සුරුකුම්පත් සඳහා ගැණුනු වියදම් හැරුණු විට අනෙකුත් වියදම් ගනුදෙනු පිරිවැය ලෙස හැඳින්වේ.

4.1.4 පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම

පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීමේ දී ස්කන්ධ හිමියන්ගේ ගනුදෙනු සටහන් වන්නේ ඔවුන්ගේ ධාරිතාවය අනුවය. එබැවින් එම ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස කීර්තිනාමය හඳුනාගනු නොලැබේ.

4.1.5 පාලනය අහිමි වීම

පාලනය අහිමි වීමේ දී සමූහය විසින් පරිපාලිතයන්ගේ හඳුනාගත් වත්කම් සහ වගකීම් ඉවත් කරගන්නා අතර ඒ අනුව පාලනයට යටත් නොවන හිමිකම් වල ධාරණ අගය සහ සමුච්චිත පරිවර්තන වෙනස්කම් පරිපාලිතයන්ගේ ස්කන්ධයට ගලපනු ලැබේ.තවද පරිපාලිතයේ කොටස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පෙර හඳුනාගත් අතර එය සුදුසු පරිදි ආදායම් ප්‍රකාශයේ හෝ රදවාගත් ඉපයුමේ සුදුසු පරිදි වර්ග කරනු ලැබේ. පාලනය අහිමි වීමේදී ඇතිවන ඌනතාවය හෝ අතිරික්තය ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ. එවැනි හිමිකමක් පාලනය අහිමි වන දිනට සාධාරණ අගයට මනිනු ලැබේ. ඉන්පසුව මූල්‍ය ප්‍රකාශනවල සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව ආයෝජිතයන්ගේ ස්කන්ධය ගණනය කරනු ලැබේ.

4.1.6 ඒකාබද්ධකරණයේදී ඉවත් කරන ලද ගනුදෙනු

සියලුම අන්තර් - සමූහ ගනුදෙනු සහ ශේෂයන්, ආදායම් හා වියදම් (විදේශ විනිමය ගනුදෙනුවල ලාභ සහ අලාභ හැර) ඒකාබද්ධකරණයේදී ඉවත් කෙරේ. සමූහය සහ එහි ආශ්‍රිත සමාගම් අතර කරනු ලබන ගනුදෙනු වලදී ඇතිවිය හැකි ලාභ හෝ අලාභද ආශ්‍රිත සමාගම්වල සමූහයේ අයිතිය ප්‍රමාණයට ඒකාබද්ධකරණයේදී ඉවත් කෙරේ. හානිකරණය පිළිබඳව සාක්ෂි නොමැති විට පමණක් උපලබ්ධි නොවූ ලාභ මෙන් අලාභද ඉවත් කරනු ලැබේ.

4.2 විදේශ ව්‍යවහාර මුදල්

4.2.1 විදේශ විනිමය ගනුදෙනු

විදේශ විනිමය ගනුදෙනු ව්‍යවහාර මුදල් ඒකකය බවට පත්වන්නේ ගනුදෙනුව සිදුවන දිනට පවතින විනිමය අනුපාත මඟින් පරිවර්තනය කිරීමෙනි. විදේශ වලංගු මුදල් වලින් නිරූපණය කෙරෙන මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනට බලපැවැත්වෙන විනිමය අනුපාතිකයන්ට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට නැවත පරිවර්තනය කරනු ලබන අතර වෙළඳ කටයුතු තුළින් ඇතිවන්නා වූ අසමානතා ආදායම් ප්‍රකාශයේ අනෙකුත් මෙහෙයුම් ආදායම් ලෙස සටහන් කරනු ලැබේ.

විදේශ මුදල්වලින් වෙළඳපල වටිනාකමට නිරූපණය කරනු ලබන මුදල් නොවන වත්කම් සහ වගකීම් ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ මුලින්ම ගනුදෙනුව සිදුවන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය.

නැවත පරිවර්තනයේදී ඇතිවන විදේශ විනිමය අසමානතා ආදායම් ප්‍රකාශයේ සටහන් කරයි.

විදේශ මුදල් වලින් ඓතිහාසික පිරිවැයට නිරූපණය කරනු ලබන මුදල් නොවන වත්කම් සහ වගකීම් එම ගනුදෙනුව සිදුවන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් පරිවර්තනය කරනු ලැබේ.

ඉදිරි විනිමය ගිවිසුම් තක්සේරු කරනු ලබන්නේ වාර්තා කරන දිනට බලපැවැත් වෙන ඉදිරි වෙළඳපල අනුපාතිකයන්ට අනුව වන අතර ඉන් ඇතිවන උපලබ්ධි නොවූ ශුද්ධ ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

4.2.2 විදේශීය මෙහෙයුම්

ශ්‍රී ලංකා රුපියල් නොවන ව්‍යවහාර මුදල් භාවිතා කරන්නාවූ විදේශීය මෙහෙයුම් වල මෙහෙයුම් ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වයන් පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශීය මෙහෙයුම්වල පවතින වත්කම් සහ වගකීම් වාර්තාකරණ දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ ආදායම් සහ වියදම් ගනුදෙනු සිදුවන දිනයන්හීදී පවතින විනිමය අනුපාතිකයන්හි සාමාන්‍ය අගය අනුව පරිවර්තනය කෙරේ.

විදේශ මෙහෙයුම් පරිවර්තනයේදී ඇතිවන විදේශ විනිමය අසමානතා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කරයි.

විදේශ මෙහෙයුම් ඉවත්කර ගැනීමකදී අදාල වටිනාකම ආදායම් ප්‍රකාශය තුළ ඉවත්කර ගැනීමේ ලාභ හෝ අලාභ වෙනත් මෙහෙයුම් වියදම් හෝ වෙනත් මෙහෙයුම් ආදායමේ කොටසක් ලෙස හඳුනාගෙන සටහන් කරනු ලැබේ.

4.3 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ ලෙස ඇතුලත් වන්නේ අතැති දේශීය හා විදේශ විනිමය නෝට්ටු සහ කාසි, මහ බැංකු සමග ඇති සීමා නොකල ශේෂයන්, අනෙකුත් බැංකු සමග ඇති ශේෂයන් සහ කල්පිරීම් මාස තුනකට වඩා අඩු ද්‍රවශීලතාවයෙන් ඉහළ මූල්‍ය වත්කම්වල සාධාරණ අගය වෙනස්වීමේ අවදානම සැලකිය යුතු මට්ටමකින් නොපවතින සමූහය විසින් කෙටි කාලීන බැඳීම් කළමනාකරණය සඳහා භාවිතා කරන දෑය.

4.3.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කරමින් පිළියෙල කරනු ලබන අතර එය ශ්‍රී ලං ගි ප්‍ර 07 ට අනුව වක්‍ර ක්‍රමයට අනුව පිළියෙල කරනු ලැබේ. මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහයන් ලබා ගනු ලබන්නේ ලාභයට ගැලපුම් කිරීමෙනි. මුදල් සහ මුදල් සමාන දෑ ලෙස ඇතුලත් වන්නේ අත ඇති මුදල්, අනෙකුත් බැංකු වෙත ගෙවිය යුතු සහ ලැබිය යුතු මුදල් ද අත්පත් කර ගන්නා දිනයේ දී මාස 3 කට වඩා කල්පිරෙන කාලය අඩු, වැඩි ද්‍රවශීලතාවයකින් යුතු කෙටි කාලීන ආයෝජනයි.

4.4 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

4.4.1 හඳුනා ගැනීමේ දිනය

සියලුම මූල්‍ය වත්කම් සහ වගකීම් ආරම්භයේදී හඳුනා ගනු ලබන්නේ පියවුම් දිනයේදීය. එනම් උපකරණවල ගිවිසගත් නියෝග සඳහා සමූහය පාර්ශවයක් ලෙස පත්වන දිනයයි. මෙයට ඇතුලත් වන්නේ අබන්ධ වෙළඳුම් කටයුතු, වෙළඳපල නීති සහ සම්මුතීන්මත නියමිත කාල පරාසයක් තුලදී වත්කමක් හුවමාරු කිරීම අවශ්‍ය වන මූල්‍ය වත්කමක් මිලදී ගැනීම හෝ විකිණීම්.

4.4.2 මූල්‍ය උපකරණ මුල් වරට මිණුම්කරණය

මූල්‍ය උපකරණ වර්ගීකරණය ප්‍රථමයෙන් හඳුනාගැනීම සිදුවන්නේ එහි අරමුණ, ලක්ෂණ සහ ඒවා අත්පත් කර ගැනීමේ කළමනාකරණ අරමුණු අනුවය.

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම් හැරුණු විට මූල්‍ය වත්කම් සහ වගකීම් මුල් වරට මිණුම්කරණය කිරීමේදී ඒවායේ සාධාරණ අගයට ගනුදෙනු පිරිවැයද ඇතුලත් කෙරේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් මිණුම්කරණයේදී පහත සඳහන් අරමුණු අනුව වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන
ණය සහ ලැබිය යුතු දෑ
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය වත්කම්

4.4.3 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම් හා වගකීම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා වෙළඳාම් සඳහා දරා සිටින විට හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කරන විටය. මුල් වරට හඳුනා ගැනීමේදී, අත්පත් කර ගන්නා විට ඇතිවන ගනුදෙනු පිරිවැය, සෘජුවම දැරූ ලාභයක් හෝ අලාභයක් ලෙස හඳුනා ගනී.

• ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට වාර්තාකරණ ව්‍යුත්පන්න උපකරණ

සමූහය විසින් ව්‍යුත්පන්න උපකරණ ලෙස හරස් විනිමය අනුපාත, විදේශ විනිමය ඉදිරි කොන්ත්‍රාත්තු භාවිතා කරයි. ව්‍යුත්පන්න උපකරණ සාධාරණ අගයට වාර්තා කරනු ලබන අතර ඒවායේ සාධාරණ අගය ධන අගයක් ගන්නා විට එය වත්කම් ලෙසද සාධාරණ අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසද වාර්තා කරනු ලබයි. ව්‍යුත්පන්න උපකරණ වල සාධාරණ අගයේ වෙනස් වීම ශුද්ධ වෙළඳ ආදායම්වල ඇතුලත් වේ.

• වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් සහ වගකීම්

වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කරනුයේ සාධාරණ අගයටය. ඒවායේ, සාධාරණ අගයේ වෙනස් වීම සහ ලාභාංශ ශුද්ධ වෙළඳ ආදායම්වල ඇතුළත් කරනු ලැබේ.පොළී ආදායම හෝ වියදම,පොළී ආදායමේ වාර්තාකරනු ලබන්නේ ඔවිසුම් වගන්ති පරිදි හෝ වියදම් කිරීමේ අයිතිය තහවුරු වූ පසුව වේ. අත්පත් කර ගැනීමේදී ආසන්න කාලයකදී විකිණීම හෝ නැවත මිලදී ගැනීම ප්‍රධාන අරමුණු කරගත් ණය සුරැකුම්පත් මෙම වර්ගීකරණයේ ඇතුලත් වේ.

4.4.4 කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම්

ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් සහිත සහ ස්ථිර කල්පිරීමක් සහිත සමූහයේ ධනාත්මක අදහසක් සහ කල් පිරෙන තෙක් දරා සිටිය හැකි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන ලෙස හැඳින්වේ. මූලික මිනුම්කරණයෙන් පසුව කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම් මනිනුයේ සළුල පොළී ක්‍රමය මත ක්‍රමක්ෂය කළ පිරිවැය මත අඟයෙන් හාණිකරණය අඩු කිරීමෙනි. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනයේදී අත්පත් කර ගැනීමේදී ඇතිවන වට්ටම් සහ අධි මිල සලකා බලන අතර සළුල පොළී අනුපාතයේ අවශ්‍ය කොටසක් වන ගාස්තු ද සලකා බැලේ. ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම තුළ ඇතුලත් වේ. මෙවැනි ආයෝජන වල හානිකරන අලාභ, ආදායම් ප්‍රකාශයේ ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා (ප්‍රතිපාදන) / ප්‍රතිවර්ත්‍ය කිරීම යටතේ හඳුනා ගැනේ.කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන විකිණීම හෝ නැවත වර්ගීකරණය කිරීමේදී උපලබ්ධිය සඳහා පවතින ආයෝජන ලෙස වර්ගීකරණය කිරීම සැළකිය යුතු වන විට එසේ කරනු ලැබේ.එසේ කිරීමෙන් ප්‍රවර්තන වර්ෂයේ දී සහ ඉදිරි මූල්‍ය වර්ෂ 2 ක් තුළ කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන සුරැකුම්පත් වර්ගීකරණය කිරීම සමූහය විසින් වලකනු ලැබේ. විකිණීම හෝ නැවත වර්ගීකරණය කිරීම සඳහා පහලින් සඳහන් වන අවස්ථා ක්‍රියාරම්භකය නොවනු ඇත.

- විකිණීම හෝ නැවත වර්ගීකරණය තෙක් ඇති කල් පිරීමට ආසන්න, වෙළඳපල පොළී අනුපාතිකයන්ගේ වෙනස් වීම මූල්‍ය වත්කම්වල සාධාරණ අගය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් නොකරන

- සමූහය විසින් ප්‍රමාණාත්මක ලෙස වත්කමෙහි මුල් මුදල අයකර ගැනීමෙන් පසුව සිදුවන විකිණීම සහ වර්ගීකරණය

- විකිණීම හෝ නැවත වර්ගීකරණයෙන් ආරෝපණීය වන සමූහයේ පාලනයෙන් තොර කලින් බලාපොරොත්තු විය නොහැකි නැවත සිදු නොවන හුදෙකලා අවස්ථා

4.4.5 බැංකු වල ඇති තැන්පතු, සහ අනෙකුත් ගනුදෙනුකරුවන් වෙතැති ණය සහ අත්තිකාරම්

බැංකු වල ඇති තැන්පතු සහ ගනුදෙනුකරුවන් වෙතැති ණය සහ අත්තිකාරම් යනුවෙන් ගම්‍ය වනුයේ ක්‍රියාකාරී වෙළඳපලක ලැයිස්තු ගතව නොමැති ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් සම්බන්ධවන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. කෙසේ නමුත් පහත සඳහන් දෑ මීට ඇතුලත් නොවේ.

- මූලික හඳුනාගැනීමේ දී, ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල සහ ඉතා මෑත කාලයේදී අලෙවි කිරීමට බැංකුව අදහස් කර ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්.

- මූලික හඳුනාගැනීමේ දී, විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් ලෙස වර්ග කර ඇති දෑ.

- ණය හානිකරණය සඳහා වන යම් අගයක් හැර ප්‍රධාන වශයෙන්ම මූලික ආයෝජනය යලිත් අයකර ගැනීමට නොහැකි මූල්‍ය වත්කම්.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව බැංකු වල ඇති තැන්පතු, සහ ගනුදෙනුකරුවන් වෙතැති ණය සහ අත්තිකාරම් සඵල පොළී අනුපාතිකය මත ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කල පිරිවැයට, ණය හානිකරණය සඳහා වන වෙන්කිරීම් ගලපා මූල්‍ය ප්‍රකාශවල හඳුනා ගැනේ. ක්‍රමක්ෂය කල පිරිවැය ගණනය කිරීමේදී අත්පත් කර ගැනීමෙදී පැන නගින අව මිල හෝ අධි මිලත් සඵල පොළී අනුපාතිකයේ සැලකිය යුතු කොටසක් බවට පත්වන ගාස්තු සහ පිරිවැයත් සැලකිල්ලට ගනු ලැබේ. ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම යටතේ ඇතුලත් වන අතර ණය හානිකරණය මගින් පැන නගින අලාභ ආදායම් ප්‍රකාශයේදී ණය හානි සහ වෙනත් අලාභයන් සඳහා (ප්‍රතිපාදන)/ ප්‍රතිවර්ත්‍ය කිරීම යටතේ දක්වා ඇත.

ණය සහ අත්තිකාරම්, බැංකු වල ඇති තැන්පතු යලි අයකර ගත නොහැකි බවට තහවුරු වූ පසු එම අයකර ගත නොහැකි අගයන් කපා හැරීම සමූහයේ ප්‍රතිපත්තියයි.

4.4.6 උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන

උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන යටතට ගනු ලබන්නේ ණය සුරුකුම් සහ වෙළඳාම සඳහා දරා සිටින හෝ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද ස්කන්ධ ආයෝජනයන් හැර අනෙකුත් ස්කන්ධ අයෝජනයන් වේ.

මෙම වර්ගීකරණය යටතේ දරා සිටින ණය සුරුකුම් වල විශේෂත්වය වනුයේ, නිශ්චිත නොවන කාලසීමාවක් තුල රඳවා ගනිමින්, ද්‍රවශීලතා අවශ්‍යතාවයන් මත හෝ වෙළඳපල තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමක් ලෙස හෝ විකිණීම සිදු කිරීමයි. කිසිදු ණය සහ ලැබිය යුතු දෑ උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන යටතේ සමූහය විසින් වර්ගීකරණය කර නොමැත.

මූලික හඳුනාගැනීමෙන් පසුව උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සාධාරණ අගය මත පසු කාලීනව ගිණුම්ගත කරණු ලැබේ.

උපලබ්ධි නොවූ ලාභ හෝ අලාභ, උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සංචිත නමින් වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනා ගැනෙන අතර, ආයෝජන විකිණීමක් වේ නම් සංචිත යටතේ ඊට අදාලව පෙර හඳුනාගත් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේදී වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනා ගනී. සමූහය විසින් සමාන සුරුකුම් වලින් එක් ආයෝජනයකට වඩා දරණ අවස්ථාවන් හි දී, ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කරන පදනම යටතේ විකිණීමට නියමිතය. උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන මගින් උපයනු ලබන පොළී ආදායම, සඵල පොළී අනුපාතය මත ගණනය කර පොළී ආදායම යටතේ ප්‍රකාශ කරන අතර ලාභාංශ ලැබීමේ අයිතිය තහවුරු වූ පසු ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනා ගනී. ආයෝජන හානිකරණය මත වන අලාභ උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සංචිත මගින් ඉවත් කර ආදායම් ප්‍රකාශයේ ණය හානි සහ වෙනත් අලාභයන් සඳහා (ප්‍රතිපාදන)/ප්‍රතිවර්ත්‍ය කිරීම යටතේ හඳුනා ගැනේ.

4.4.7 ''එක් දින'' ලාභ හෝ අලාභ

යම් මූල්‍ය උපකරණයක ගනුදෙනුවන මිල, එම මූල්‍ය උපකරණයම ගනුදෙනු වන වෙනත් නිරීක්ෂිත වර්තමාන වෙළඳපලක සාධාරණ අගයට හෝ නිරීක්ෂිත වර්තමාන වෙළඳපලක දත්ත මත ගණනය කරන ලද සාධාරණ අගයට හෝ වෙනස් වන්නෙහි නම් එම සාධාරණ අගයෙහි හා ගනුදෙනු මිලෙහි වෙනස සමූහය විසින් වහාම ආදායම් ප්‍රකාශය යටතේ ඇති වෙළඳ කටයුතු වලින් ශුද්ධ ලාභ/අලාභ යටතේ හඳුනා ගැනේ. නිරීක්ෂිත නොවන දත්ත මත සාධාරණ අගය ගණනය කරනු ලබන අවස්ථාවන් හී දී ගනුදෙනු මිල සහ ආදර්ශ මිල අතර වෙනස එම මූල්‍ය උපකරණයේ ආයු කාලය තුල ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනී.

4.4.8 නිකුත් කර ඇති ණය සුරුකුම් සහ අනෙකුත් ණය

නිකුත් කර ඇති ණය සුරුකුම් සහ අනෙකුත් ණය ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ, ගිවිසුම් ගත එකඟතාවයේ ස්වභාවය මත මුදල්, වෙනත් මූල්‍ය වත්කමක් හෝ ස්ථාවර ප්‍රමාණයක තම හිමිකම් කොටස් අදාල පාර්ශවය වෙත ගෙවීමට වගකීමකින් සමූහය බැඳී ඇති මූල්‍ය උපකරණයි. තවද, ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වගකීම් ද මෙම ගණනයට අයත් නොවේ.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, නිකුත් කර ඇති ණය සුරැකුම් සහ අනෙකුත් ණය සඵල පොළී අනුපාතය මත ගණනය කරන ක්‍රමක්ෂය පිරිවැය මත ගිණුම් ගත කරනු ඇත. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කිරීම සඳහා සඵල පොළී අනුපාතය තීරණය කිරීමේදී නිකුත් කිරීමට අදාල වට්ටම් හෝ අධි මිලත්, පිරිවැයත් සැලකිල්ලට ගනු ලැබේ.

4.4.9 බැහැර කිරීම

මූල්‍ය වත්කම් මගින් ජනනය වන මුදල් ප්‍රවාහයන් සඳහා ඇති හිවිසුම් ගත අයිතිවාසිකම කල්පිරෙන විට දී හෝ ගනුදෙනුවක් මගින් මූල්‍ය වත්කමේ අයිතිය හා බැඳුනු සැලකිය යුතු ප්‍රමාණයක අවදානම් හා ප්‍රතිලාභ අනෙකුත් පාර්ශවය වෙත මාරු කිරීමේ දී හෝ සමූහය විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ඇත.

බැහැර කිරීමට යටත්ව මාරු කරන ලද මූල්‍ය වත්කම් වලට අදාලව සමූහය රඳවා ගනු ලබන පොළීය මූල්‍ය තත්ත්ව වාර්තාවේ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී. මූල්‍ය වත්කමක් බැහැර කිරීමේ දී ධාරණ අගය සහ පහත අගයන් හි අතර වෙනස ආදායම් ප්‍රකාශය යටතට ගැනේ.

i ප්‍රතිෂ්ඨාව මත ලද අගයන් (අත්කර ගත් නව වත්කම් වලින් කල්පිත වගකීම් අඩු කල පසු අගයන් ද ඇතුළුව)

ii විස්තීරණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගෙන තිබූ ලාභ හෝ අලාභ වල අගයන්

වත්කම් වලට අදාලව සියළු හා යම් ප්‍රමාණාත්මක අවදානම් සහ ප්‍රතිලාභ සමූහය වෙත රඳවා ගනිමින් අදාල වත්කම් වෙනත් පාර්ශවයකට පැවරීමේ හැකියාව සමූහය වෙත පවතී. එවන් අවස්ථාවක දී වත්කම් බැහැර කිරීමක් ලෙස නොසැලකේ. උදා : ප්‍රති මිල දී ගැනීමේ හිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්.

වත්කම් තෙවන පාර්ශවයක් වෙත, එහි සමකාලීන මුළු ඉපයුම් අනුපාතිකය සමඟ විකුණූ විට එය ගනුදෙනුවක් හා සමානව ගිණුම් ගත කරනු ඇත. සමූහය වෙත ප්‍රමාණාත්මක අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගනිමින් සිදු කරනු ලබන ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනු මේ හා සැසඳේ.

සමූහය විසින් සිදු කරන ගනුදෙනු මූල්‍ය වත්කමේ හිමිකම හා බැඳුණු ප්‍රමාණාත්මක අවදානම් හා ප්‍රතිලාභ සමූහය වෙත රඳවා නොගන්නා නමුත් එම වත්කමෙහි පාලන අයිතිය රඳවා ගන්නා විට එම වත්කමෙහි පාලනය දරා සිටින තාක් දුරට සමූහයෙහි ගිණුම් තුල එම වත්කම හඳුනා ගැනේ.

යම් ගනුදෙනු වලදී මූල්‍ය වත්කමක් වෙනත් පාර්ශවයක් වෙත පැවරීම සිදුකල ද එම වත්කම හා බැඳුණු සේවාවන් යම් ගාස්තුවක් අය කිරීම මත සැපයීමේ වගකීම සමූහය රඳවා ගනී. එවන් ආවස්ථා වලදී එම වත්කම බැහැර කිරීමේ උපමානයන් සපුරා ඇත්නම් එය බැහැර කෙරනු ඇත. තවද එම සේවා සැපයුමට අදාල හිවිසුමක් වේ නම් ඒහා බැඳි සේවා ගාස්තුව හා සපයනු ලබන සේවාව අතර වන වෙනස මත වත්කමක් හෝ වගකීමක් හඳුනා ගනී. මූල්‍ය වගකීමක් සහ බැඳුණු වගකීම නිසියාකාරව නිම කිරීම නිසා හෝ එය අහෝසි වී යාම නිසා හෝ කාලසීමාව ඉකුත්වීම නිසා හෝ යන කාරණා මත නිමා වී ඇති නම් එම මූල්‍ය වගකීම ගිණුම් තුලින් බැහැර කිරීම් සිදුකරයි. පවත්නා මූල්‍ය වගකීමක් එම ණයහිමියා විසින්ම වෙනත් වගකීමක් මගින් ප්‍රමාණාත්මක කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා කොන්දේසි ප්‍රමාණාත්මක හා සැලකිය යුතු ලෙස වෙනසකට භාජනය කරන විට එය මුල් වගකීමෙහි බැහැර කිරීමක් ලෙසත් නව වගකීමෙහි හඳුනා ගැනීමක් ලෙසත් ගිණුම් ගත කරනු ඇත. මුල් මූල්‍ය වගකීමෙහි ධාරණ අගයෙහි සහ ගෙවූ ප්‍රතිෂ්ඨාවෙහි අතර වෙනස ආදායම් ප්‍රකාශයෙහි සටහන් කෙරේ.

4.4.10 ප්‍රති මිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් හිවිසුම යටතේ මිලට ගනු ලබන සුරැකුම්

සමූහය වෙත ප්‍රමාණාත්මක සහ සැලකිය යුතු සියළු අවදානම් සහ ප්‍රතිලාභයන් රඳවා ගනිමින්, නිශ්චිත අනාගත දිනයකදී ප්‍රති මිලදී ගැනීමේ හිවිසුමක් මත විකුණනු ලබන සුරැකුම් මූල්‍ය තත්ත්ව වාර්තාවෙන් බැහැර කරනු නොලැබේ. මෙම ගනුදෙනු මත ලද මුදල් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව වාර්තාවේ වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර එයට අදාල වන හිවිසුම් ගත බැදීම අදාල උපචිත පොළීය ද සමග වෙනත් ණය යටතේ වගකීමක් ලෙස ගිණුම් ගත කෙරේ. එමගින් ගනුදෙනුවේ ආර්ථිකමය යථා ස්භාවය මත වගකීම සමූහයේ ණය වගකීමක් ලෙස විදහා දැක්වේ. විකුණුම් සහ ප්‍රතිමිලදී ගැණුම් මිල අතර අන්තරය පොළී වියදම ලෙස සලකන අතර, ප්‍රති විකුණුම් හිවිසුමේ ආයු කාලය තුල එය උපචිත වන පරිදි සඵල පොළී අනුපාතිකය යටතේ ගිණුම් ගත කෙරේ.

විලෝම වශයෙන්, ප්‍රති විකුණුම් හිවිසුම් යටතේ මිලයට ගත් සුරැකුම් නිශ්චිත අනාගත දිනක දී යලි විකිණිය යුතු අතර එය මූල්‍ය තත්ත්ව වාර්තාව තුලට අන්තර්ගත කරනු නොලැබේ. ගනුදෙනුවේ ආර්ථික යථා ස්වභාවය මත මෙය සමූහය විසින් දෙනු ලැබූ ණයක් ලෙස සලකා ගෙවන ලද ප්‍රතිෂ්ඨාව සහ උපචිත පොළීය ප්‍රති විකුණුම් හිවිසුම් යටතේ මූල්‍ය තත්ත්ව වාර්තාවේ සටහන් කෙරේ. මිලට ගැනුම් සහ ප්‍රති විකුණුම් යන අගයන් අතර අන්තරය පොළී ආදායම ලෙස ගැනෙන අතර එය සඵල පොළී අනුපාතිකය මත හිවිසුමේ ආයු කාලය මත ගිණුම් ගත කෙරේ.

4.4.11 ''සාධාරණ අගය'' නිර්ණය කිරීම

වාර්තාගත දිනට ක්‍රියාකාරී වෙළඳපලක ගනුදෙනු වන මූල්‍ය උපකරණයන් හී සාධාරණ අගය රදා පවතින්නේ ඒවායේ සාමාන්‍ය ප්‍රකාශිත වෙළඳපල මිල හෝ සාමාන්‍ය ඇස්තමේන්තු ගත වෙළඳ මිල මත වේ. (ගනුදෙනු ගාස්තු ඉවත් නොකර) ක්‍රියාකාරී වෙළඳපලක ගනුදෙනු නොවන මූල්‍ය උපකරණයන් හී සාධාරණ අගය තීරණය කිරීමෙදී එයට යෝග්‍යවන තක්සේරු ක්‍රමයන් අනුගමනය කරනු ඇත. තක්සේරු ක්‍රමයන් ලෙස යොදා ගැනෙන්නේ වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය, නිරීක්ෂිත වෙළඳපලක සමාන මූල්‍ය උපකරණයන් හි අගයන්, සහ අනෙකුත් යෝග්‍ය තක්සේරු ආකෘතීන්ය.

4.4.12 හිලව් කිරීම්

මූල්‍ය තත්ත්ව වාර්තාව තුල වත්කම් සහ වගකීම් හිලව් කිරීම මගින් ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදු කරනු ලබන්නේ ඒ සඳහා නීතිමය වශයෙන් බලය ලබා දී ඇති විට ශුද්ධ වටිනාකම මත හෝ එකවිට වත්කම සහ වගකීම පියවා ගැනීමේ අදහසක් ඇති විටම පමණක් වේ.

4.4.13 මූල්‍ය වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කම් හි අගය තනිව හෝ සාමූහිකව සලකන විට හානිකරණයකට ලක්ව තිබේද යන්න පිළිබඳව සපයනු ලබන විෂය බද්ධ සාක්ෂි මගින් තක්සේරු කරනු ලැබේ. එලෙස විෂය බද්ධ සාක්ෂි මගින් හානිකරණයක් සිදුව ඇති බවට විද්‍යාමාන වනුයේ වත්කමෙහි මූලික හඳුනා ගැනීමට පසු අලාභයක් ජනනය වන සිද්ධියක් සිදුව ඇති විට සහ එම අලාභ ගත සිද්ධිය එම වත්කමෙහි අනාගත මුදල් ප්‍රවාහ මත විශ්වාස ගත ලෙස නිමානය කල හැකි විටදීය.

ක්‍රමක්ෂය පිරිවැය මත වන මූල්‍ය වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදී ම මූල්‍ය වත්කම් හි අගය තනිව හෝ සාමූහිකව සලකන විට හානිකරණයට ලක්ව තිබේද යන්න පිළිබඳව සපයනු ලබන විෂය බද්ධ සාක්ෂි මගින් තක්සේරු කරනු ඇත.

සමූහය ප්‍රථමයෙන් ඇස්තමේන්තු සලකා බලන්නේ තනිව සලකන විට හානිකරණයට ලක්වීම සඳහා විෂය බද්ධ සාක්ෂි තිබේද යන්න සහ එසේ නොමැතිනම් තනිව හෝ සාමූහික වශයෙන් ඇස්තමේන්තු කරනු ලැබේ.

මෙලෙස මූල්‍ය වත්කම් (ස්කන්ධ සුරැකුම් ද ඇතුළුළුව) හානිකරණයට ලක් ව ඇති බවට තහවුරු කෙරෙන විෂය බද්ධ සාක්ෂි වනුයේ. ණයගැණුම්කරු හෝ නිකුත්කරන්නාගේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවයන් පෙන්නුම් කරයි නම්. ණයගැණුම්කරු විසින් ගෙවීම් පැහැර හැරීම. ණය හෝ අත්තිකාරම් ප්‍රතිව්‍යුහගත කිරීමක් හෝ ඒ උදෙසා සමූහය විසින් කෙරෙන සලකා බැලීමක්. ණයගැණුම්කරු හෝ නිකුත්කරන්නාගේ බුන්වත්භාවය පිළිබඳ සංඥාවක් සුරැකුම් සඳහා ක්‍රියාකාරී වෙළඳපලක් නොමැතිවීම. වත්කම් සමූහයකට අදාල වන ගෙවීම් තත්ත්වයන් හී හානිකර වෙනස්කම්, සමූහය සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පෙන්නුම් කරන, සමූහයේ පසුබැස්මකට හේතු වන ආර්ථික තත්ත්වයන් වැනි නිරීක්ෂිත දත්ත.

හානිකරණයක් සිදුව ඇති බවට විෂය බද්ධ ගත සාක්ෂි පවතින විට, වත්කමේ හි ධාරණ අගය සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් හි වර්තමාන අගය (මෙතෙක් ජනිත වී නොමැති අනාගත අලාභයන් අත්හැර) යන දෙකෙහි අන්තරය හානිකරණ අලාභය ලෙස සැලකේ. ධාරණ අගය හානිකරණ අලාභය මත වන ප්‍රතිපාදන ගිණුමක් මගින් ගැලපීමකට ලක් කෙරෙන අතර හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ. හානිකරණ අලාභය ගණනය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමට භාවිතා කරන ලද පොළී ප්‍රතිශතය යොදා ගනිමින්, හානිකරණ අලාභ මත වන ප්‍රතිපාදන ගලපන ලද ධාරණ අගය මත පොළී ආදායම ගණනය කෙරේ. එම පොළී ආදායම ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම යටතේ ගිණුම් ගත කරනු ඇත. හානිකරණ අලාභ ඇස්තමේන්තුකරණයේ දී හානිකරණයට යටත් නොවූ සියලුම කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් සාමූහික වශයෙන් යලි හානිකරණය උදෙසා සලකා බලනු ඇත. එසේම කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ අත්තිකාරම් ද එහි සමාන අවදානම් ස්වරූපය පාදක කොට සමූහ ගත කර හානිකරණය උදෙසා තක්සේරු කරනු ලැබේ. සාමූහික හානිකරණය තීරණය කිරීමේ දී සමූහය උපයෝගී කර ගනුයේ අතීතය තුල ගෙවීම් පැහැර හැරීමේ ප්‍රවනතාවය, යලි අයකර ගැනිමේ කාලය, සහ අලාභයන් වූ ප්‍රමාණය සලකා බලා සකසනු ලැබූ සංඛ්‍යානමය ආකෘතියකි. වර්තමාන ආර්ථික සහ ණය තත්ත්වයන් මත වන අලාභයන් ආකෘතිය මගින් ලබාදෙන අගය ඉක්මවන බවට කලමනාකරණය තීරණය කරන විට ඒ සඳහා වන ගැලපුම් සාධකයක් සංඛ්‍යානමය ආකෘතියට යොදා ඇත. ණය සහ අත්තිකාරම් කළඹ සඳහා වන ණය හානිකරණය ගණනය කරනුයේ අතීතයේ එම ණය සහ අත්තිකාරම් කළඹයන්හි හැසිරීම් රටාව මතවේ. කෙසේ නමුත් මෙම කළඹයන් ඒවායේ සම්පූර්ණ ආර්ථික ආයු කාලය සපුරා නොමැති හෙයින් අනාගතයේ දී පැනනැගිය හැකි අස්ථාවර තත්ත්වයන් සමාලෝචනයට භාජනය නොවේ. එබැවින් මෙම සීමා වීම් නිවැරදි ලෙස සැලකිල්ලට ගනිමින් ආර්ථික සාධක ගැලපුම් අගයන් ණය හානිකරණය ගණනය කිරීමේදී යොදා ගනේ. ණය සහ අත්තිකාරම් හි අනාගත අයකර ගැනීම පිළිබඳව යතාර්ථ අපේක්ෂාවක් නොමැති විට සහ සුරැකුම් දේපළ උපලබ්ධි වී සමූහය වෙත යලි පවරා ඇති විට ණය සහ ඒ මත කල ප්‍රතිපාදන කපා හැරීම සිදු කරනු ලැබේ. පසු වසරකදී ඇස්තමේන්තු ගත ණය හානිකරණය යම් කිසි සිද්ධියක් හඳුනා ගැනීම මත වැඩි වීමකට හෝ අඩු වීමකට ලක්වේ නම් ප්‍රථමයෙන් හිණුම් ගත කල ප්‍රතිපාදන එම වැඩි වීම හෝ අඩු වීමට අනුරූපීව සටහන් කරනු ඇත. කපා හරින ලද යම් ණය හෝ අත්තිකාරමක් පසුව යලි අයකර ගැනීමට හැකිවේ නම් එම යලි අයකර ගත් ප්‍රමාණය වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනා ගනු ලැබේ.

- කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම් මත වන හානිකරණ තක්සේරුකරණය

  ක්‍රමක්ෂය පිරිවැය මත හිණුම් ගත කර කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම් වල ධාරණ අගය සහ වත්කමේ මූලික සඵල පොළී අනුපාතිකය මගින් වට්ටම් කරන ලද තක්සේරු ගත අනාගත මුදල් ප්‍රවාහයන් හී වර්තමාන අගය අතර අන්තරය, මෙම මූල්‍ය වත්කම් මත වන ණය හානිකරණය වන අතර ආදායම් ප්‍රකාශයේ ණය හා අත්තිකාරම් හානිකරණය යටතේ මෙය සටහන් කරයි.

- උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය වත්කම් මත වන හානිකරණ තක්සේරුකරණය

  උපලබ්ධිය සඳහා පවතින ආයෝජන සුරැකුම් මත වන හානිකරණය හඳුනා ගැනෙන්නේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කලා වූ මුළු හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණ ගැලපුමක් ලෙස මාරු කිරීමෙනි. එසේ ප්‍රතිවර්ගීකරණය කරනු ලබන අගය වනුයේ අත්පත් කර ගත් අගයන් මුල් මුදල පියවීම සහ ක්‍රමක්ෂය ඉවත් කල පසු අගය සහ වර්තමාන සාධාරණ වටිනාකමින් පෙර කාලපරිච්ඡේද වලදී ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් හානිකරණ අලාභ ඉවත් කල පසු අගය යන දෙකෙහි අන්තරයයි. හානිකරණ අලාභය සඳහා වන ප්‍රතිපාදනයන් හි කාල අගයට අදාලව සිදුවන වෙනස්කම්

පොළී ආදායමෙ හි අන්තර්ගත කෙරේ. හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදනය කල, උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය වත්කමක සාධාරණ වටිනාකම එම ප්‍රතිපාදනය සිදු කල පසුව ඇති වන යම් විෂය බද්ධ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වැඩිවී ඇත්නම් ආදායම් ප්‍රකාශයට සටහන් කල හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කරනු ඇත. කෙසේ නමුත් හානිකරණ අලාභයන් හඳුනාගත් උපලබ්ධිය සඳහා පවතින ස්කන්ධ සුරැකුම් හි යලි අයකර ගැනීමක් වේ නම් එය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දී හඳුනා ගැනේ.

- ප්‍රතිකතිකා ගත ණය
  සමූහය හැකි සෑම විටකදීම අවදානම් සහිත ණය, ඇප සුරැකුම් යොදා ගනිමින් අයකර ගැනීමට වඩා ගෙවීම් ගිවිසුම් දීර්ඝ කිරීම හෝ නව ණය කොන්දේසි යෙදීමෙන් හෝ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට පෙළඹේ. නව ණය කොන්දේසි පිළිබඳ කතිකා කොට එකඟතාවයකට එළඹී පසු යම් හානිකරණයක් වේ නම් එය නව කොන්දේසි වලට පෙර පැවති සළල පොළී අනුපාතිකය මත ගණනය කරන අතර එම ණය තවදුරටත් කල්පිත ණය ලෙස නොසැලකේ. මෙම ප්‍රතිව්‍යුහගත ණය වල අනාගත ගෙවීම් ක්‍රියාවලිය පිලිබඳව කලමනාකරණය අබණ්ඩව අවධානය යොමු කරන අතර එය මුල් සළල පොළී අනුපාතිකය මත කේවල හෝ සාමුහික වශයෙන් හානිකරණ තක්සේරු කිරීමට යටත් වේ.

- ඇප සුරැකුම් ගණනය
  සමූහය හැකි සෑම විටකදීම තම මූල්‍ය වත්කම් හි අවදානම අවම කර ගැනීම සඳහා ඇප සුරැකුම් භාවිතයට පෙළඹේ. මුදල්, සුරැකුම්, ණයවර ලිපි හෝ ඇප සහතික, නිශ්චල දේපළ, ණය ගැනියෝ, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සහ ණය පුළුල් කිරීම් ආදී සියලු දේ ඇප සුරැකුම් ගණයට ගැනේ.

  ඇප සුරැකුම් වල සාධාරණ අගය ආරම්භයේ සිටම එහි අවම අගයට ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව තක්සේරු කෙරේ.

  නිශ්චල දේපළ වැනි මූල්‍ය නොවන ඇප සුරැකුම් වල සාධාරණ අගය ගණනයේ දී ස්වාධීන තක්සේරුවක් හෝ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වැනි තෙවන පාර්ශවීය දත්තයන් සැලකිල්ලට ගනී.

- නැවත භුක්තිය ලබා ගන්නා ඇප සුරැකුම්
  සමූහයේ ප්‍රතිපත්තිය වනුයේ නැවත භුක්තිය ලබාගත් ඇප සුරැකුම් එය තම අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීම සහ විකිණීම යන අවස්ථා දෙකෙන් සුදුසුම අවස්ථාව තීරණය කර ඒ මත කටයුතු කිරීමයි. තම අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමට උචිත බවට තහවුරු වන වත්කම් එහි අත්පත් කරගත් අගය සහ මූලික සුරැකුමට තැබූ වත්කමේ ධාරණ අගය යන දෙකෙහි අඩු අගය මත නියමිත වත්කම් වර්ගයට මාරු කරමින් ගිණුම් ගත කෙරේ.

4.5 මූල්‍ය නොවන වත්කම්

4.5.1 ආයෝජන දේපළ

4.5.1.1 හඳුනාගැනීම හා මිනුම්කරණ පදනම

කුලි ආදායම ලබාගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩිකර ගැනීම සඳහා හෝ ඒ අරමුණු දෙකම සඳහා හෝ පවත්වාගෙන යනු ලබන දේපළ ආයෝජන දේපලක් ලෙස හැඳින්වෙන අතර එම දේපල සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකිණීම සඳහා භාවිතා නොකෙරෙන අතර භාණ්ඩ නිෂ්පාදනයේදී හෝ භාණ්ඩ සැපයීමේදී හෝ පරිපාලන අරමුණින් සේවා සැපයීමේදී භාවිතා කෙරේ.

ආයෝජන දේපල පිරිවැය මත ගිණුම්ගත කෙරේ. ඒ අනුව මූලික හඳුනාගැනීමෙන් පසුව ආයෝජන දේපළ එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ ඉවත්කල අගය වාර්තා කෙරේ.

4.5.1.2 ක්ෂයවීම්

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලස්වනු ලබන්නේ සරල මාර්ග පදනම මත අදාල වත්කම් පන්තියේ ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය වන වත්කම් මිලදී ගත් දිනයේ සිට වත්කම විකුණන දිනය දක්වා වේ.

4.5.1.3 බැහැර කිම්

ආයෝජන දේපලක් විකුණන ලැබූ විටදී හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ජනනය නොවන බව පැහැදිලි වූ විට ස්ථිරවම භාවිතයෙන් ඉවත්කරනු ලැබීම නිසා ආයෝජන දේපල පොත් වලින් ඉවත් කරනු ලැබේ. ආයෝජන දේපල ලෙස හෝ නොවන ලෙස මාරු කිරීම් කරනු ලබන්නේ භාවිතයේ වෙනසක් ඇතිවු විට පමණක් වේ. යම් වත්කමක භාවිතයේ වෙනසක් ඇති වූ විට දේපල පිරියත හා උපකරණ ලෙස නැවත වර්ග කරනු ලැබේ. නැවත වර්ග කරන දිනයේ එම දේපලහි සාධාරණය අගය එහි පිරිවැය ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

4.5.2 දේපළ, පිරියත හා උපකරණ

4.5.2.1 හඳුනාගැනීම හා මිණුම්කරණ පදනම

සමූහය තුළට අනාගත ආර්ථික ප්‍රතිලාභයන් වත්කම් තුළින් ගලා ඒම පිළිබඳව හව්‍යතාවයක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විටක දේපළ, පිරියත හා උපකරණ වත්කම් සේ හඳුනා ගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීමේ නිර්ණායකයන් සම්පූර්ණ කළ පසු ඒවා මුල් වරට අත්පත් කර ගැනීමට හෝ ඉදිකිරීමට දරන ලද සෘජුවම හඳුනාගත හැකි පිරිවැය සහ ඒ හා ආනුෂාංගික පිරිවැය සහිතව මුළු පිරිවැයට අගය කරනු ලැබේ. ඉදිකරන ලද වත්කම් සම්බන්ධයෙන් අමුද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහිත අදාල වත්කම අපේක්ෂිත පරිහරණ තත්ත්වයට පත් කිරීම සඳහා දරන ලද අනෙකුත් පිරිවැය සහ එම ඉදිකිරීමට කරන ලද වැඩ බිමෙහි යම් ඉවත් කිරීම් සහ අපහරණයන් සඳහා දරන ලද පිරිවැය සහිතව මුළු පිරිවැයට හඳුනා ගැනීම කෙරේ. මිලදී ගත් පරිගණක මෘදුකාංගද උපකරණයේ ක්‍රියාවට අත්‍යාවශ්‍ය නම් පරිගණක උපකරණ වශයෙන් ප්‍රාග්ධනගත කෙරේ.

සමූහය විසින් දේපළ පිරියත හා උපකරණ වාර්තා කරන්නේ පිරිවැය ආකෘතියට වන අතර මෙහිදී මිලදී ගැනීම හා ඉදිකිරීම සඳහා දරන ලද පිරිවැය මෙන්ම ඒ හා අනුෂාංගික අනෙකුත් පිරිවැය එකතුවෙන් සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභයක් වේනම් සමුච්චිත හානිකරණ

අලාභ සඳහා වෙන් කිරීමද අඩුකල පසු අගයට දේපළ, පිරියත හා උපකරණ වාර්තා කෙරේ. සමූහය විසින් සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු ගිවිසුම් යටතේ වන ඉඩම් වල පිහිටි ගොඩනැගිලි යන වත්කම් පන්තියම ප්‍රත්‍යාගණන ආකෘතිය මත වාර්තා කරනු ලැබේ.

එවැනි දේපළ ප්‍රත්‍යාගණන අගයෙන් එනම් ප්‍රත්‍යාගණනය කල දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන් කිරීම් අඩු කල අගයට වාර්තා කෙරේ. සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු ගිවිසුම් යටතේ වන ඉඩම් වල පිහිටි ගොඩනැගිලි සමූහය විසින් හැම වර්ෂ පහක් හතක් අතර තුලදී හෝ නිතරම චක්‍රීය පදනම මත ප්‍රත්‍යාගණනය කරන අතර, එමගින් ශේෂ පත්‍ර දිනට ධාරණ වටිනාකම් ඒවායේ සාධාරණ අගයෙන් ප්‍රමාණාත්මකව වෙන් නොවන බවට සාක්ෂාත් කෙරේ. යම් ප්‍රත්‍යාගණන අතිරික්තයක් වේ නම් එය වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එම වත්කම් වර්ගයටම අදාලව වෙනත් විස්තීරණ ආදායමට පෙර ගලපන ලද ප්‍රත්‍යාගණන අලාභයේ ප්‍රමාණය දක්වා හඳුනාගන්නා අතර, යම් ප්‍රත්‍යාගණන අලාභයක් වේ නම් එම වත්කමට ම අදාලව වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයට කලින් ගලපන ලද ප්‍රත්‍යාගණන අතිරික්තය දක්වා හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණනය කරන දිනට පවතින සමුච්චිත ක්ෂය ප්‍රමාණය වත්කමේ ධාරණ අගයෙන් ඉවත් කර ලැබෙන ශුද්ධ අගය, ප්‍රත්‍යාගණන අගය තෙක් ගලපා ගිණුම් ගත කෙරේ. යම් සිද්ධියක් හෝ අවස්ථානුගත වෙනස්වීමක ප්‍රතිඵලයක් ලෙස වත්කමෙහි ධාරණ අගය උපලබ්ධි කරගත නොහැකි බව හැඟී යයි නම් එය හානිකරණ තක්සේරුවකට ලක් කෙරේ.

යම් වත්කමක ප්‍රධාන ප්‍රභේදයක් ලෙස සැලකිය හැකි කොටසක් වෙනත් ආයු කාලයක් දරයි නම් එම කොටස වෙනම වූ අයිතමයක් ලෙස දේපළ, පිරියත හා උපකරණ යටතේ විදහා දැක්වේ.

4.5.2.2 පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත හා උපකරණයක කොටස් ප්‍රතිෂ්ඨාපනය සඳහා දරන ලද පිරිවැය වත්කමේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එම කොටස හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් සමූහය තුළට ලැබීමේ භව්‍යතාවයක් ඇත්නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකිනම් පමණි. එදිනෙදා කටයුතු සඳහා දේපළ පිරියත හා උපකරණ මත වන පිරිවැය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

4.5.2.3 ක්ෂය වීම්

සෑම දේපළ, පිරියත හා උපකරණ ප්‍රභේදයක් සඳහාම ඒවායේ ඇස්තමේන්තු කරනු ලබන ඵලදායී ජීව කාලය තුල සරල මාර්ග පදනම මත ක්ෂයවීම් සඳහා ආදායම් ප්‍රකාශයේ ප්‍රතිපාදන සලස්වනු ලැබේ. මෙම ක්‍රමය එම වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ පරිභෝජනය හා බොහෝ දුරට ගැලපේ. කල්බදු ක්‍රමය යටතේ පවතින දේපළ, පිරියත හා උපකරණ ඒවායේ ආයුකාලය හෝ කල්බදු ගිවිසුමේ කාලය යන දෙකෙන් අඩු කාලසීමාව මත ක්ෂය කරණු ලැබේ. ඉඩම් ක්ෂය වෙන්කිරීමකට භාජනය නොවේ.

තවදුරටත් ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් හා ප්‍රමාණාත්මක ඇළුත්වැඩියා මත වන පිරිවැය ඒවායේ මූලික ගොඩනැගිල්ලේ ඉදිරියට ශේෂව පවතින ආයුකාලය මත ක්ෂය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ වෙනුවෙන් ඒවා පාවිච්චි කල කාලයට සමානුපාතිකව ක්ෂය සඳහා වෙන් කිරීම් කෙරේ.

වර්තමාන හා සමානරූපී කාලපරිච්ඡේදයන් උදෙසා සමූහයේ දේපළ පිරියත හා උපකරණ මත ඇස්තමේන්තු ගත ඵලදායී ආයු කාලය පහත පරිදි වේ.

නිදහස් අයිතිය ඇති ගොඩනැගිලි	වසර 40 - 60
කාර්යාලීය උපකරණ	වසර 08
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	වසර 08
පරිගණක උපකරණ	වසර 05
මෝටර් වාහන	වසර 04
බලශක්ති උත්පාදක	වරස 20

ක්ෂය වෙන් කිරීමේ ක්‍රමවේදය, ඵලදායී ආයුකාලය සහ වත්කමේ සුන්බුන් අගය සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම ප්‍රතිතක්සේරු ගත කර අවශ්‍ය නම් ගැලපීම් කරනු ලැබේ.

4.5.2.4 බැහැර කිරීම්

දේපළ, පිරියත හා උපකරණයක් භාවිතා කිරීමෙන් හෝ අපහරණය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ජනනය නොකරන බව පැහැදිලි වූ විට වත්කමක ධාරණ අගය පොත් වලින් ඉවත් කරනු ලැබේ. වත්කම් බැහැර කිරීමෙන් ලැබෙන ලාභය හෝ අලාභය අදාළ අපහරණය සිදු වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම්/ වියදම් හි ඇතුලත් කෙරේ.

4.5.2.5 ඵලදායී ආයුකාලය සහ සුන්බුන් අගය

සුන්බුන් අගය යනුවෙන් හඳුන්වනු ලබන්නේ වාර්තා කරන දිනට එම වත්කම එහි අපේක්ෂිත ආයුකාලය සපුරා විකිණීම සඳහා පවතින තත්ත්වයෙන්ම පවතින බව සැලකූවිට එම වත්කම් සඳහා ආයතනය වෙත ලැබෙන අගයයි.

සුන්බුන් අගය සහ ඵලදායී ආයුකාලය අඩුම වශයෙන් සෑම වාර්තාකරණ දිනකම යලි සලකා බැලෙන අතර, එහි ප්‍රමානාත්මක වෙනසක් වේ නම් එය ගිණුම්කරණ ඇස්තමේන්තු වල සිදුවන වෙනසක් ලෙස සලකා ගිණුම්ගත කෙරේ.

4.5.2.6 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ ඒවායේ පිරිවැයට නිරූපණය කර ඇත. මෙම පිරිවැය ප්‍රාග්ධන ස්වාභාවයක් ගන්නා අතර, ගොඩනැගිලි, විශාල යන්ත්‍ර හා පිරියත ඉදිකිරීමේ ක්‍රම හා පද්ධති සංවර්ධනයේදී දැනටමත් දරා ඇති අනාගතයේදී ප්‍රාග්ධනීකරණය කිරීමට අපේක්ෂිත පිරිවැයන් සේ සැලකේ.

4.5.3 බදු දේපළ

යම් ගිවිසුමක් කල්බදු ගිවිසුමක්ද යන්න තීරණය කිරීමේදී එය ආරම්භ වන දින පවතින භාවාර්ථය සැලකිල්ලට ගනී. ගිවිසුම මඟින් යම් වත්කමක හෝ වත්කම් වල පරිහරණ ක්‍රියාවලිය හෝ පරිහරණය කිරීමේ අයිතිය බදුකරුවෙකු වෙත පැවරේද යන්න ගිවිසුමේ සඳහන් නොවූවද වෙනත් කරුණු මතින් තක්සේරු කරනු ඇත.

සමූහය බදුකරු ලෙස

මූල්‍ය කල් බදුකරණයේදී සියළුම අවදානම් හා ප්‍රතිලාභ වලට අමතරව සමූහයේ කල්බදු වත්කම්වල අයිතිය සමූහය වෙත මාරු කරනු ලැබෙන අතර කල්බදු වත්කමේ සාධාරණ අගයට හෝ වාරික වල වර්තමාන අගය යන දෙකින් අඩු අගයට ප්‍රාග්ධනිත කරනු ලැබේ. ඉතිරි කල්බදු වගකීම සඳහා ස්ථිර පොලි අනුපාතිකයක් පවත්වා ගැනීමට කල්බදු ගෙවීම්, මූල්‍ය ගෙවීම් සහ කල්බදු වගකීම් අඩුවීම් ලෙස බෙදා වෙන්කරනු ලැබේ. මූල්‍ය වියදම්, මූල්‍ය වියදමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

කල්බදු ගිවිසුම අවසානයේ සමූහය විසින් වත්කම අත්පත් කර ගැනීමේ සාධාරණ නිශ්චිතතාවයක් නොමැතිනම් වත්කමේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය හෝ කල්බදු ගිවිසුම් කාලය යන අගයන් දෙකෙන් අඩු අගය තුල වත්කම් ක්ෂය කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු වියදම්, මෙහෙයුම් වියදම් ලෙස සරල මාර්ග පදනම මත කල්බදු කාලය තුල ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

සමූහය බදු හිමියා ලෙස

කල්බදුකරණයේදී සමූහය සියළු අවදානම් හා ප්‍රතිලාභ සහිත අයිතිය පැවරීමක් නොකරයි නම් එය මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ. කල්බදු ගිවිසුම්ගත කිරීමේ ආරම්භක සෘජු වියදම් මෙහෙයුම් කල්බදුකරණයේදී කල්බදු වත්කම් පවත්වාගෙන යන අගයට එකතු කරන අතර තුල ආදායමක් හඳුනාගන්නා පදනම මත කල්බදු කාලසීමාව තුල හඳුනා ගැනේ.

අසම්භාව්‍ය වාරික ලැබීම් ආදායමක් ලෙස ඒවා උපයන වර්ෂයේදී හඳුනා ගැනේ.

4.5.4 ණය ගැනුම් පිරිවැය

යම් වත්කමක් එහි අපේක්ෂිතභාවය හෝ විකිණීම සඳහා යම් සැලකිය යුතු කාල සීමාවක් ගනු ලබයි නම් එම වත්කම අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට අදාල වන ණය ගැනුම් පිරිවැය අදාල වත්කමේ පිරිවැය කොටසක් සේ ප්‍රාග්ධනය කරනු ලැබේ. අනෙකුත් සියළුම ණය ගැනුම් පිරිවැය ඒවා ඇති වූ වර්ෂයේ වියදමක් ලෙස හඳුනා ගැනේ. පොලී සහ ණය මුදල් ලබා ගැනීමේ අනෙකුත් අමතර වියදම් වලින් ණය ගැනුම් පිරිවැය සමන්විත වේ.

4.5.5 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක උපකරණයන්හි මෙහෙයුම් මෘදුකාංග හැර අනෙකුත් පරිගණක යෙදවුම් මෘදුකාංග සහ බලපත්‍ර වල වටිනාකම අස්පෘශ්‍ය වත්කම් ගණයෙහි ලා සැලකේ.

සමූහය විසින් අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් හි අගය එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණයන් අඩුකර දක්වා ඇත.

මූලික හඳුනා ගැනීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් උදෙසා දරනු ලබන පිරිවැය මඟින් ඒ හා බැඳි අනාගත ආර්ථික ලාභයන්හි වැඩිවීමක් වේ නම් පමණක් එම පිරිවැය ප්‍රාග්ධනීකරණය කරන අතර නොඑසේ නම් එය වියදමක් ලෙස ගිණුම්ගත කරනු ඇත.

ක්‍රමක්ෂය කිරීමේ සරල මාර්ග ක්‍රමය යටතේ එහි අපේක්ෂිත ඵලදායී ආයුකාලය තුල විහිදී යන ආකාරයට හඳුනා ගැනේ. අස්පෘශ්‍ය වත්කම් වල අපේක්ෂිත ඵලදායී ආයුකාලය වනුයේ වසර පහක් හෝ එහි යෝග්‍යතම අපේක්ෂිත ආයුකාලය යන දෙකින් අඩු කාලයයි.

හානිකරණය පිළිබඳව සංඥාවක් ඇති සෑම විටකදීම ක්‍රමක්ෂය නොකල නිශ්චිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමෙහි අගයන් හානිකරණය සඳහා සලකා බලන අතර එය අනාගත ප්‍රතිලාභයක් මඟින් පියවාගත නොහැකි බව තහවුරු වන ප්‍රමාණයට ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගනී.

අස්පෘශ්‍ය වත්කම් මඟින් අනාගත ප්‍රතිලාභයන් ජනනය නොවන බව පැහැදිලි වන විට සහ ධාරණ අගය හානිකරණයට ලක්ව ඇති බව තහවුරු වන විට එම වත්කම් පොත් වලින් බැහැර කෙරේ.

බැහැර කිරීම් මඟින් වන ලාභ හෝ අලාභ වනුයේ අස්පෘශ්‍ය වත්කම්හි ධාරණ අගය සහ ශුද්ධ විකුණුම් අගය යන දෙකෙහි අන්තරයයි. එය ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් කෙරේ.

4.5.6 රන් තොගය

රන් තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට තක්සේරු කරනු ලැබේ. ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය සහ තොග වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒමට දැරූ අනෙකුත් පිරිවැය රන් තොග වල පිරිවැය තුල අඩංගු වේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වල ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් විකිණීම සඳහා සුදානම් කිරීමට ඇස්තමේන්තු කල වියදම් අඩු කල පසු අගයයි.

4.5.7 මූල්‍ය නොවන වත්කම්හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනකටම අදාලව මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය හා සම්බන්ධ වන සංඥාවන් පිළිබඳව බැංකුව තක්සේරු කරනු ලැබේ. එවන් සංඥාවක් පවතින විටදී හෝ හානිකරණය පිළිබඳව පරීක්ෂාවක් අවශ්‍ය විටකදී එම මූල්‍ය නොවන වත්කම් යලි අයකර ගැනීමේ ශක්‍යතාවය පිළිබඳව සලකා බැලේ. වත්කම් නැවත අයකර ගත හැකි අගය වනුයේ වත්කමේ සාධාරණ අගය සහ එහි මුදල් ජනනය කරන ඒකකයන්ගේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් ඉවත් කල පසු අගය යන දෙකෙහි උපරිම අගයයි. වත්කමේ ධාරණ අගය හෝ මුදල් ජනනය කරණ ඒකක වල අගය එහි නැවත අයකර ගැනීමේ අගය ඉවත්වන විට එය හානිකරණයට ලක්වූ ලෙස සලකා වත්කම නැවත අයකර ගත හැකි අගයට ගිණුම් වල ගලපනු ලැබේ.

භාවිතයේ පවතින වටිනාකම ගණනයේදී, වත්කමට බද්ධ වන අවදානම සහ වෙළඳපල තක්සේරුව මත මුදලේ කාලානුරූපී වටිනාකම අර්ථ නිරූපනය කෙරෙන බදුපෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ඇත. විකුණුම් පිරිවැය සාධාරණ අගයෙන් අඩුකර තීරණය කිරීමේදී ඒ සඳහා සුදුසු තක්සේරු ආකෘතීන් භාවිතා කෙරේ. මෙම තක්සේරු කරණයන් බහුවිධ තක්සේරු ක්‍රම, පොදු වශයෙන් විකිණෙන පරිපාලිතයන්ගේ ලැයිස්තු ගත කොටස් මිල හෝ අනෙකුත් වටිනාකම් ඇති සාධාරණ මිලක් පෙන්වන සංඥාවක් මගින් තවදුරටත් තහවුරු කෙරේ.

4.6 සේවක ප්‍රතිලාභ

4.6.1 නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් යටතේ ආයතනය විසින් වෙනත් වූ පාර්ශවීය ආයතනයකට දක්වන ස්ථාවර දායකත්වයයි. මෙම ස්ථාවර දායකත්ව අගය හැරුනු විට වැඩිමනත් ගෙවීමක් සඳහා වෙනත් නීතිමය හෝ අනුමිත වගකීමක් නොමැත. වාර්තාකරණ දින අවසනට පෙර කරන ලද සේවය උදෙසා වන විශ්‍රාම වැටුප් අයිතිය වෙනුවෙන් ආයතනය තම වගකීම මත දක්වනු ලබන නිශ්චිත ප්‍රතිලාභ දායකත්වය ආදායම් ප්‍රකාශයේ වාර්තාකරන දිනට අදාලව වියදමක් වශයෙන් හඳුනා ගැනේ. නියමිත දිනට පෙර ගෙවන ලද දායකත්වය එහි මුදල් ප්‍රතිගෙවීමක් හෝ ඉදිරිගෙවීම් වල අඩුවීමක් ලෙස සලකයිනම් එය වත්කමක් ලෙස හඳුනාගැනේ. නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා වන දායකත්වය සේවකයන් වෙත ගෙවීම සිදුවන්නේ වාර්තාකරන දින සිට මාස 12 කට පසු කාල පරාසයකින් නම් එය වාර්තාකරන දිනට වන වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

• ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදල

බැංකුවේ සියලුම සේවකයින් ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදලේ සාමාජිකයෝ වෙති. මෙම අරමුදලට, සේවකයාගේ අතිකාල දීමනා එකතු නොකල දළ වැටුපෙන් 12% ක මුදලක් බැංකුව විසින් දායක මුදල් වශයෙන් ගෙවනු ලබන අතර, සේවකයින්ගේ දායක මුදල 8% කි. බැංකුවේ අර්ථසාධක අරමුදල අනුමත අරමුදලක් වන අතර, එය ස්වාධීනව පරිපාලනය කෙරේ.

• සේවක අර්ථසාධක අරමුදල

ලංකා බැංකු සේවකයින් හැර සියලුම පරිපාලිතයින් ඔවුන්ගේ සේවකයින් වෙනුවෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා එහි සංශෝධනවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී-15%) ප්‍රමාණයක් දායක මුදල් ගෙවන අතර සෑම සේවකයකුගෙන්ම සේවක අර්ථසාධක අරමුදල් සඳහා 8% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී 10%) ක මුදලක් අඩු කරගනී.

• සේවක භාරකාර අරමුදල

1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනත අනුව, බැංකුව සහ සියලුම පරිපාලිතයින් සේවකයින් සඳහා මෙම අරමුදලට දායක විය යුතු අතර, මාසිකව බැංකුව/සමූහය අතිකාල හැර, දළ වැටුපෙන් 3% ක මුදලක් මේ සඳහා ගෙවනු ලැබේ.

4.6.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත සමූහයේ ශුද්ධ වගකීම හෝ බැදීම එක් එක් සැලසුම වෙන් වශයෙන් සලකා එම සේවකයන් විසින් ඔවුන්ගේ වර්තමාන සහ පෙර සේවාවන් උදෙසා උපයාගත් අනාගත ප්‍රතිලාභයන් වර්තමාන අගයට වට්ටම් කර, ඉන් සැලසුම්ගත වත්කම් වල සාධාරණ අගය ඉවත් කල පසු අගයට ගණනය කෙරේ. වට්ටම් අනුපාතය ලෙස සලකනු ලබන්නේ වාර්තාකරණ දිනට දිගුකාලීන භාණ්ඩාගර බැඳුම්කර වල ඉපැයුම් අනුපාතයයි. මෙම ගණනය කිරීම් සුදුසුකම් ලත් පීවගණකාඥයන් විසින් " පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය" භාවිතයෙන් ගණනය කෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්හි ගණනය කරන ලද, ලාභ හෝ අලාභ සමූහය විසින් විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගන්නා අතර, ඊට අදාළ වියදම්, ආදායම් ප්‍රකාශයේ සේවක මණ්ඩල වියදම් යටතේ හඳුනාගනී.

• ලංකා බැංකු විශ්‍රාම වැටුප් භාර අරමුදල

ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් භාර අරමුදල, අරමුදල් සපයනු ලබන, දායක මුදල් අය නොකරන නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි. බැංකුවෙහි අවම වශයෙන් වසර දහයක අඛණ්ඩ සේවා කාලයක් ඇති විශ්‍රාම ගැනීමේ වයස් සීමාව වන වයස අවුරුදු 55 ට ළඟා වීමේදීත් ඉන්පසු විශ්‍රාම ගැනීමේදී හෝ ඊට පෙරාතුව සෞඛ්‍ය හේතු මත විශ්‍රාම ගන්නා වූ බැංකුවේ සේවකයින් සඳහා යාවජීව විශ්‍රාම වැටුපක් ගෙවීම සඳහා මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. විශ්‍රාම වැටුප, සමහර දීමනා අත්හැර සේවකයා විසින් අවසානවරට ලැබූ වැටුපෙහි ප්‍රතිශතයක් මත පදනම් වේ.

විශ්‍රාම වැටුප් භාර අරමුදලට දායක මුදල් යෝග්‍ය පීවගණකාඥයකුගේ උපදෙස් වලට අනුව බැංකුව විසින් මාසිකව ගෙවනු ලබේ. වර්තමානයේ එය දළ වැටුපෙන් 57% කි.

මෙම අරමුදල වසරකට වරක් සුදුසුකම් ලත් පීවගණකාඥයන් විසින් අගය කර ඇත.

පරිපාලිතයන් විශ්‍රාම අරමුදල් ක්‍රියාත්මක කරනු නොලැබේ.

- ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි අර්ථලාභීන්ට ගෙවීම් කිරීමට බැංකුව බැඳී සිටින අතර, එම ගෙවීම් සහතික කෙරේ. එම අරමුදලට සේවකයින්ගේ දායකත්වය ඔවුන්ගේ දළ වැටුපෙන් 8% ක් වේ. මෙම අරමුදලට අඛණ්ඩව අවුරුදු පහක් තුළ දායක මුදල් ගෙවනු ලැබූ සේවකයෙකු සේවයේ යෙදී සිටියදී මියගියහොත් එම සේවකයාගේ අර්ථලාභීන් වෙනුවෙන් බැංකුවට වගකීමක් ඇති වේ. තවද විශ්‍රාමිකයෙකු මියගිය විටදී ඔහුගේ/ඇයගේ අර්ථලාභීන්ට මාසික වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපක් ගෙවීමට බැංකුව බැඳී සිටී. සේවයේ යෙදී සිටියදී මියයන සේවකයෙකු වෙනුවෙන් ඔහුගේ/ඇයගේ අර්ථලාභීන්ට හිමිවන විශ්‍රාම වැටුප, සමහර දීමනා අත්හැර ඔහු/ඇය විසින් අවසාන වරට ලැබූ වැටුප මත පදනම් වේ.

වාර්ෂිකව, අරමුදල සුදුසුකම්ලත් පීව ගණකාඥයකු විසින් පීවගණක තක්සේරුකරණයකට යටත් කෙරෙන අතර ඌණතාවයක් වේ නම් පීවගණක, භාරකරුවන් සහ ප්‍රතිලාභීන්ගේ උපදේශණයන් මත සම්පූර්ණ කෙරෙනු ඇත.

විශ්‍රාම වැටුප් භාර අරමුදලත්, වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලත් යන අරමුදල් දෙකම රජය විසින් අනුමත කොට ඇති අතර, ඒවා ස්වාධීනව පරිපාලනය කෙරේ.

• පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

දායක මුදල් අය නොකරන බැංකුවට අයත් විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වන හෙයින් 1996 ජනවාරි මස 01 දිනට පෙරාතුව බැංකුවේ සේවය සඳහා බැඳුණු සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සඳහා මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිපාදන සලස්වා නොමැත. කෙසේවුවද සේවකයින් විශ්‍රාම නොගොස් වෙනත් අයුරකින් ඔවුන්ගේ සේවය නතර කරනු ලැබුව හොත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ඔවුන්ට ආන්තික පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇත. මෙම පාරිතෝෂිකය ගෙවනු ලබන්නේ අදාළ මුදල් වර්ෂයේ අවසාන මාසයට අදාළවන පීවන වියදම් දීමනා සහ අනෙකුත් දීමනාද ඇතුළුව සේවකයාගේ මූලික මාසික හෝ ඒකාබද්ධ වැටුපෙන් අඩක් ඒ සේවකයා අඛණ්ඩ සේවය කළ එක් එක් වර්ෂය සඳහා ගණන් බැලීමෙනි. 1996 ජනවාරි 01 දින හෝ ඉන් පසුව බැංකුවේ සේවයට බැඳුණු සියලුම සේවකයින් බැංකුවේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන නිසා, විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය පිළිබඳව සේවකයින්ගේ සේවයෙහි පළමුවන වර්ෂයේ සිටම විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රතිපාදන සලස්වා තිබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි නිර්දේශයන් ප්‍රකාරව පීවගණක තක්සේරු ක්‍රමය අනුව ගණනය කොට හඳුනාගෙන ඇති අතර ආදායම් ප්‍රකාශයෙහි ඒ සඳහා ප්‍රතිපාදනයන් කර ඇත.

පාරිතෝෂික වගකීම බාහිර අරමුදලකින් ආවරණය නොවේ.

4.7 ප්‍රතිපාදනයන්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමානයේ දී නෛතික හෝ සම්මුතික වගකීමක් ඇති වූ විට දී එම වගකීම නිවැරදිව තක්සේරුගත කල හැකිනම් සහ අදාල වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයන්හි පිටතට ගලා යාමක් සිදුවන බවට අපේක්ෂාවක් වේ නම් ඒ සඳහා ප්‍රතිපාදනයන් වෙන් කෙරේ. මුදලේ කාල අගයෙහි ප්‍රමානාත්මක බලපෑමක් තිබේනම් අනාගතයේදී සමූහයෙන් පිටතට ගලායාමට නියමිත මුදල් ප්‍රවාහයන් වර්තමාන පෙර බදු අනුපාතිකය යොදා ගනිමින් වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. මෙම අනුපාතිකය යොදා ගැනීම තුළින් කාල අගයෙහි වෙනස්වීම පිළිබඳව වර්තමාන වෙළඳපල තත්ත්වයන් හි බලපෑම සහ වගකීම හා බැඳි අවදානම් සැලකිල්ලට ගනු ලැබේ.

වට්ටම් කිරීමේ දී පවත්නා තත්වයන් මාරු වීම නිසා ප්‍රතිපාදන අගයන්හි වැඩිවීම මූල්‍ය වියදමක් ලෙස හඳුනා ගැනේ.

4.8 මූල්‍ය ඇපකර

සාමාන්‍යයෙන් ඒදිනෙදා සිදුවන ගණදෙනු වලදී සමූහය විසින් ණයවර ලිපි, ඇපකර සහ ප්‍රතිග්‍රහණ වැනි මූල්‍ය ඇපකරයන් එහි ධාරණ අගය මත මූල්‍ය වාර්තාවල අධි මිල ලැබීම ලෙස හඳුනාගැනෙන අතර, ඉන් අනතුරුව සමූහය විසින් සෑම ඇපකරණයක්ම එහි මූලික හඳුනාගත් අගයෙන් ආදායම් ප්‍රකාශය තුළට ගැලපූ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකල පසු අගය සහ මූල්‍ය වගකීම පියවීම සඳහා වන හොඳම ඇස්තමේන්තු ගත වියදම් යන අගයන් දෙකෙන් වැඩි අගයට හඳුනාගනී.

මූල්‍ය ඇපකර මත වන වගකීමෙහි යම් වැඩිවීමක් වේ නම් එය ආදායම් ප්‍රකාශයෙහිදී හානිකරණ අලාභයක් ලෙස වාර්තා කෙරේ. වාරික ලැබීම් ආදායම් ප්‍රකාශයෙහිදී ගාස්තු හා කොමිස් ආදායම යටතේ සරල මාර්ග ක්‍රමයට අනුව ඇපකරයේ ආයුකාලය මත හඳුනාගැනේ.

4.9 ආදායම් සහ වියදම් හඳුනා ගැනීම

4.9.1 පොළිය

සඵල පොළී අනුපාතය උපයෝගී කර ගනිමින් පොළී ආදායම් සහ පොළී වියදම් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී. සඵල පොළී අනුපාතිකය යනු වත්කමෙහි හෝ වගකීමෙහි ඇස්තමේන්තු ගත අනාගත ගෙවීම් සහ ලැබීම්, එහි අපේක්ෂිත ආයු කාලය තුළ වට්ටම් කල විට එම වත්කමෙහි හෝ වගකීමෙහි ධාරණ අගයට සමාන අගය ලබාදෙන අනුපාතිකයයි. සමූහය විසින් සඵල පොළී අනුපාතිකය ගණනය කිරීමේදී මූල්‍ය උපකරණයන්හි ගිවිසුම් ගත සියළු කොන්දේසි සැලකිල්ලට ගනිමින් අනාගත ණය අලාභයන් හැර සියළු අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කෙරේ.

සඵල පොළී අනුපාතිකයෙහි අවශ්‍යම කොටසක් වන, ලද සහ ගෙවනු ලැබූ ගාස්තු එම අනුපාතිකය ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන අතර, ගනුදෙනු පිරිවැය ලෙස සැලකෙන්නේ මූලිකවම වත්කමක් හෝ වගකීමක් අත්පත්කර ගැනීමේදී හෝ නිකුත් කිරීමේදී දරණ වර්ධනය වන පිරිවැයයි.

ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් පොළී ආදායම සහ පොළී වියදම වනුයේ:

- සඵල පොළී අනුපාතිකය මත වන ක්‍රමක්ෂය යටතේ ගිණුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් සහ වගකීම්හි පොළිය
- සඵල පොළී අනුපාතිකය මත ගණනය කෙරෙන විකිණීම සඳහා වන ආයෝජන සුරැකුම් මත වන පොළිය

වෙළඳ වත්කම් සහ වගකීම් මත වන පොළී ආදායම සහ වියදම සමූහයේ වෙළඳ කටයුතු වලින් ආගන්තුකව හඳුනා ගැනෙන අතර එය පොළී ආදායම යටතේ ද වෙළඳ වත්කම් හා වගකීම් වල සාධාරණ අගයෙහි වන වෙනස්කම් ශුද්ධ වෙළඳ ආදායම යටතේ ද ගිණුම් තැබේ.

අවදානම් කළමණාකරණ උපායමාර්ගයක් ලෙස රඳවා තබා ගන්නා ව්‍යුත්පන්න උපකරණයන්හි සාධාරණ අගයන්හි සිදුවන වෙනස්කම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම් හි සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණ මත ශුද්ධ ආදායම යටතේ සටහන් කෙරේ.

මූල්‍ය වත්කම් හෝ සමාන මූල්‍ය වත්කම් පන්තියක් හානි කරන අලාභ නිසා කපා හැරිය හොත් එයින් පසුව ඇතිවන පොළී ආදායම හඳුනාගනු ලබන්නේ හානි කරන අලාභ ගණනය කිරීම සඳහා යොදා ගන්නා අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමට යොදා ගනු ලබන පොළී අනුපාත පදනම් කරගෙන වේ.

4.9.2 ගාස්තු සහ කොමිස්
සමූහය විසින් තම සේවා දායකයන් වෙත සපයනු ලබන විවිධාකාර වූ සේවාවන් මත ගාස්තු සහ කොමිස් ආදායම උපයා ගනී.

ගාස්තු ආදායම පහත සඳහන් පරිදි වර්ග දෙකකි.

- නිශ්චිත කාල පරාසයක් තුලදී සපයනු ලබන සේවාවන් මත උපයන ගාස්තු ආදායම කොමිස් ආදායම
වත්කම් කළමනාකරණ ගාස්තු, ආරක්ෂණ සහ වෙනත් කළමනාකරණ ගාස්තු සහ උපදේශන ගාස්තු ආදී යම් කාල පරාසයක් තුල සේවා සැපයීම මත උපයන ගාස්තු ආදායම එම කාල පරාසය තුළ උපචිත කරනු ලැබේ. ණය සහ සම්බන්ධ ගාස්තු විලම්බනය කෙරෙන අතර එය සඵල පොළී අනුපාතිකයට වන ගැලපුමක් ලෙස හඳුනා ගනී.

- ගනුදෙනු සේවාවන් සැපයීම මත වන ගාස්තු ආදායම කොටස් හෝ සුරුකුම් අත්පත් කර ගැනීම, ව්‍යාපාර මිලට ගැනීම සහ විකිණීම වැනි ක්‍රියාවලීන් සඳහා තෙවන පාර්ශවයක් වෙනුවෙන් සිදු කෙරෙන කතිකාවන් හෝ ගනුදෙනු මත වන ගාස්තු ආදායම එම අදාල කාර්යය අවසානයට පැමිණීමත් සමඟම හඳුනා ගැනේ. තවද, යම් කොටසක් සඳහාම වෙන්වූ ගාස්තු ආදායමක් වේ නම් එම අදාල කාර්යය හෝ කොන්දේසි සියල්ල සම්පූර්ණ වීමත් සමඟම එම කොටසට පමණක් අදාල වන ගාස්තු ආදායම හඳුනා ගැනේ.

4.9.3 ශුද්ධ වෙළඳ ආදායම
වෙළඳ වත්කම් හා වගකීම් වලට අදාල වන ලාභ හෝ අලාභ එහි සාධාරණ අගයෙහි වන වෙනස්කම්, පොළිය, ලාභාංශ සහ විදේශීය විනිමය වෙනස්කම් ශුද්ධ වෙළඳ ආදායම් යටතට ගැනේ.

4.9.4 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල වෙනත් මූල්‍ය උපකරණ මත වන ශුද්ධ ආදායම්
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල වෙනත් මූල්‍ය උපකරණ මත වන ශුද්ධ ආදායම් යටතට ගැනෙන්නේ හෙජින් ගිවිසුම් වල කොටස් නොවන අවදානම් කලමනාකරණය උදෙසා දරා සිටින, වෙළඳ නොවන ව්‍යුත්පන්න උපකරන මගින් වන සියළු උපලබ්ධිත සහ උපලබ්ධිත නොවන සාධාරණ අගයෙහි වෙනස්කම්, පොළිය, ලාභාංශ සහ විදේශ විනිමය වෙනස්කම්ය.

4.9.5 ලාභාංශ
ලාභාංශ ආදායම හඳුනාගනු ලබන්නේ එම ගෙවීම ලැබීමේ අයිතිය තහවුරු කිරීමෙන් අනතුරුවයි.

4.9.6 කුලී ආදායම
කුලී ආදායම උපචිත පදනම මත හඳුනාගනු නොලැබේ.

4.9.7 වෙනත් ආදායම්
වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

4.9.8 කල්බදු ගෙවීම්
මෙහෙයුම් කල්බදු යටතේ කරන ගෙවීම් කල්බදු ගිවිසුම් කාලසීමාව තුල සරල මාර්ග ක්‍රමය යටතේ හඳුනා ගැනේ. යම් දිරිගැන්වීමක් හෝ වරප්‍රසාදයක් සඳහා වන ලැබීමක් වෙතොත් එය කල්බදු ගිවිසුම් වියදමට ගලපා හඳුනාගැනේ.

මූල්‍ය කල්බදු යටතේ වන අවම කල්බදු ගෙවීමක් වේනම් එය මූල්‍ය වියදම් සහ ගෙවිය යුතු වගකීම අතර විභජනය කෙරේ. ශේෂවන වගකීම මත ස්ථාවර පොළී අනුපාතයක් අයවන සේ මූල්‍ය වියදම් කල්බදු ගිවිසුමේ සෑම කාලපරිච්ඡේදයක් සඳහාම සටහන් කරනු ඇත.

කල්බදු ගිවිසුමේ යම් ගැලපීමක් තහවුරු වූ පසු එය අවම කල්බදු ගෙවීම ප්‍රතිශෝධනය කරමින් අසම්භාව්‍ය කල්බදු ගෙවීම් ගිණුම් ගත කෙරේ.

4.9.9 අනෙකුත් වියදම්
අනෙකුත් සියළුම වියදම් ඒවා අදාල කාලය මත දැරූ විට ගිණුම් ගත කර ඇත. සියළුම ව්‍යාපාරික මෙහෙයුම් වලට අදාල වියදම් සහ ප්‍රාග්ධන වත්කම් ඒවායේ නියමිත කාර්යක්ෂමතාවයෙන් පවත්වාගෙනයාම සඳහා දරණ ලද නඩත්තු වියදම් සමුහයේ ලාභය ගණනයේ දී ආදායමට එරෙහිව සටහන් කර ඇත.

4.10 ආදායම් බදු

4.10.1 ප්‍රවර්තන බදු
ආදායම් බදු ප්‍රවර්තන සහ විලම්බිත බදු යන කොටස් දෙකකින් සමන්විත වේ. සෘජුවම ස්කන්ධ ප්‍රකාශය තුල හෝ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනෙන අයිතම හැර අනෙකුත් අයිතමයන්ට අදාල, වන ප්‍රවර්තන සහ විලම්බිත බදු, ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

ප්‍රවර්තන බදු ලෙස හඳුන්වනුයේ වාර්තාකරණ දිනට පවතින බදු අනුපාතය යොදා ගනිමින් වර්ෂය සඳහා බදු අයකල හැකි ආදායම හෝ පාඩුව මත ගණනය කරන ලද බදු ගෙවීම හෝ ලැබීමයි. තවද පෙර වර්ෂයන් හි බදු ගෙවීම් සඳහා යම් ගැලපීමක් වේ නම් එයද සැලකිල්ලට භාජනය කෙරේ.

4.10.2 විලම්බිත බදු

වත්කම් සහ වගකීම් වල මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වනු ලබන ධාරණ අගය සහ ඒවා බදු පදනම උදෙසා දක්වනු ලබන අගය අතර තාවකාලික වෙනස්කම් පවතිනවිට, එම වෙනසට අදාලව විලම්බිත බදු ගණනය කරනු ලැබේ.

පහත සඳහන් වන තාවකාලික වෙනස්කම් මත විලම්බිත බදු හඳුනා නොගනී.

- මුල් හඳුනාගැනීමේ දී ඇතිවන කීර්තිනාමය
- ගිණුම්කරණ හා බදු ලාභ කෙරෙහි බලපෑමක් නොමැති ව්‍යාපාර ඒකාබද්දකරණයේ දී හැර හඳුනා ගැනෙන වත්කම් හෝ වගකීම්
- නුදුරු අනාගතයේ දී ප්‍රතිවර්තනය නොවන බවට තහවුරු වන, පරිපාලිත සමාගම් හි සිදුකර ඇති ආයෝජනයන්හි සිදුවන වෙනස්කම්

විලම්බිත බදු ගණනයේදී වාර්තාකරණ දිනට බලපැවැත්වෙන බදු නීතිය අනුව ප්‍රකාශිත අනුපාතය භාවිතා කෙරෙන අතර තාවකාලික වෙනස්කම ප්‍රතිවර්තනය කිරීම සඳහා ද එම අනුපාතය ම භාවිතා කෙරේ. ප්‍රවර්තන බදු වගකීම් ප්‍රවර්තන බදු වත්කමකට එරෙහිව කාපහැරීමට නෛතිකමය අවසරය සහ අයිතිය පවතින විටක දී පමණක් ඊට අනුරූපි වන විලම්බිත බදු වගකීම් සහ වත්කම් එකිනෙක හිලව් කරනු ඇත. තවදුරටත් එම ප්‍රවර්තන බදු වගකීම සහ වත්කම එකම ආයතනයකට අදාලව හෝ බදු වගකීම සහ වත්කම හිලව් කර පියවීමට අදහස් කරන වෙන් වශයෙන් වූ ආයතනයන්ට අදාලව හෝ එකම බදු අධිකාරියක් විසින් ආදායම් මත පනවනු ලැබුවක් විය යුතුය.

ආනාගතයේ දී බදු ලාභයක් මගින් පියවා ගත හැකි බවට විශ්වාසනීයත්වයක් ඇති විට පමණක් එම අපේක්ෂිත බදු ලාභයේ ප්‍රමාණය තෙක් භාවිතා නොකල බදු අලාභයක්, බදු බැර අගයන් සහ අඩුකල නොහැකි තාවකාලික වෙනස්කම් මත ප්‍රවර්තන බදු වත්කම හඳුනාගනී. සෑම වාර්තාකරණ දිනයකදීම විලම්බිත බදු වත්කම විශ්ලේෂණයකට ලක්කර එය අනාගතයේදී බදු ප්‍රතිලාභයක් ලෙස නිශ්කාශණය නොවන බව හැගීයන ප්‍රමාණය මත වගකීම ගලපනු ලැබේ.

4.10.3 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද

එකතු කල අගය මත බද්ද සඳහා පදනම වන්නේ සේවකයින්ගේ පාරිශ්‍රමික ගෙවීම්,ගිණුම්කරණ බදු පෙර ලාභය සමූහනය කිරීම මගින් ලබාගත් අගය ක්ෂය ගණනය සඳහා නියමකල අනුපාතිකයන් ප්‍රකාරව ගැලපීමයි.

2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතෙහි අංක 25(අ) වගන්තිය හා ආනුෂාංගික සංශෝධන අනුව වර්ෂය සඳහා බැංකුවේ මුළු එකතු කළ අගය 12% (2012:12%) ක එකතු කළ අගය මත බද්දකට යටත් විය. පනත මගින් හඳුන්වා දී ඇති ගණනය කිරීමේ ක්‍රම දෙකින් එකක් වන ''වට්නාකම ආරෝපිත ක්‍රමය''යටතේ මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු ගණනය කෙරේ.

4.10.4 ලාභාංශ මත රඳවා ගත් බදු

- බැංකුව බෙදාහල ලාභාංශ මත රඳවා ගත් බදු
  බැංකුව එහි එකම කොටස්කරුවා වන ශ්‍රී ලංකා රජයට ලාභාංශ බෙදා හැර ඇති බැවින් බැංකුව විසින් කිසිදු ලාභාංශයක් මත බද්දක් ගෙවා නොමැත.
- පරිපාලිතයන් හා ආශ්‍රිතයන්ට බෙදාහල ලාභාංශ මත රඳවාගත් බදු
  පරිපාලිතයන් සහ ආශ්‍රිතයන්හි බදු වන ලාභයෙන් බෙදා හරින ලද ලාභාංශ සඳහා ප්‍රභවයේදී, 10% ක ලාභාංශ බද්දක් අඩු කරගන්නා අතර මෙය බැංකුවේ බදු බැරකම් ගණනය කිරීමේදී එයට එරෙහිව අඩු කරගත නොහැකිය. එම නිසා ප්‍රභවයේදී අඩු කර ගන්නා ලද රඳවාගත් බද්ද, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඒකාබද්ධකරණ ගැලපුමක් සේ බදු වියදමට එකතු කරගනු ලැබේ.

4.10.5 ආර්ථික සේවා ගාස්තු

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ සහ ඇමිණුම් වගන්ති අනුව, ආර්ථික සේවා ගාස්තු, බැංකුවේ බද්දට යටත් ආදායමෙන් 0.25% ගෙවිය යුතු වන අතර එය ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකර ගත හැකිවේ. 2012 අප්‍රේල් 1 වන දිනෙන් පසුව 2012 අංක 11 දරණ ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනත පරිදි ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වන්නේ බැංකුවේ නිදහස් කල ආදායම මත පමණි. එය ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කල හැකිය. ආදායම් බද්දට යටත් ආදායම මත ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු නොවේ.

4.10.6 බෝග රක්ෂණ බද්ද

2013 අංක 12 දරණ මුදල් පනතේ 15 වගන්තිය යටතේ බෝග රක්ෂණ බද්ද 2013.4.1 දින සිට බලපැවැත්වෙන අතර බදු අය කිරීමෙන් පසු ලාභයෙන් 1% ක බද්දක් ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවිය යුතු වේ.

4.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත

සමූහය විසින් ප්‍රාග්ධන උපකරණයන් ඒවායේ ගිවිසුම් ගත කොන්දේසි වල භාවාර්ථය මත මූල්‍ය වගකීම් හෝ ස්කන්ධ උපකරණයන් ලෙස වර්ගීකරණය කෙරේ. ඒ අනුව ඒවා ස්කන්ධයෙහි හෝ මූල්‍ය වගකීමෙහි කොටසක් ලෙස නිරූපණය කරනු ඇත.

4.12 කොටසක ඉපැයුම්

සමූහය විසින්, එහි කොටසක මූලික ඉපැයුම් සහ ගලපන ලද ඉපැයුම් ගණනයේ දී සාමාන්‍ය කොටස් ප්‍රමාණය සැලකිල්ලට ගනු ලැබේ. කොටසක මූලික ඉපැයුම් ගණනය කරනු ලබන්නේ බැංකුවේ සාමාන්‍ය කොටස්හිමියන්ට අයත් ශුද්ධ ලාභය හෝ අලාභය වර්ෂය සඳහා නිකුත් කර ඇති බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙනි. ගලපන ලද කොටසක ඉපැයුම් ගණනයේ දී සාමාන්‍ය කොටස්හිමියන්ට අදාල ශුද්ධ ලාභය හෝ අලාභය සහ නිකුත් කර ඇති බර තැබූ සාමාන්‍ය කොටස් යන අගයන් දෙකම සේවකයන් සඳහා පිරිනමා ඇති කොටස් විකල්පයන් ද ඇතුළුව සියලුම තත්විකරණයන් උදෙසා ගැලපීමට ලක්කරනු ලැබේ.

4.13 බණ්ඩ පදනම මත මූල්‍ය තොරතුරු වාර්තාකරණය

මෙහෙයුම් බණ්ඩයක් ලෙස සලකනු ලබන්නේ සමූහයේ වෙනත් කොටස් සමඟ සිදු කෙරෙන ගනුදෙනු ද ඇතුළුව ආදායම් ඉපැයීම් සහ වියදම් දැරීම් සිදුකරමින් ව්‍යාපාර වල නියැලෙන සමූහයේම කොටසක් ලෙස සැලකෙන ආයතනීය බණ්ඩයකි.කලමනාකාරීත්වය ඒවායේ මෙහෙයුම්

ප්‍රතිඵල මත සම්පත් එකිනෙක බණ්ඩයන් අතර විභජනය කිරීමේ තීරණයන් ගන්නා අතර එහි ක්‍රියාකාරිත්වය තක්සේරු කරනු ලැබේ.

සමූහයේ ප්‍රධාන ව්‍යාපාර බණ්ඩයන් වනුයේ සිල්ලර බැංකු කටයුතු, ආයතනික බැංකු කටයුතු, ජ්‍යාන්තර, භාණ්ඩාර සහ ආයෝජන, ශ්‍රී ලංකා රජය, අනෙකුත් බැංකු නොවන සහ සමූහයේ කටයුතු. ශ්‍රී ලංකා රජය සමූහයේ ප්‍රධාන ගනුදෙනුකරුවෙකු ලෙස සැලකෙන අතර එය වෙනත් බණ්ඩයක් ලෙස වාර්තා කෙරේ.

4.14 වාර්තාකරණ දිනට පසු සිදු වූ සිද්ධීන්

ලං ගි ප්‍ර අංක 10 - වාර්තාකරණ දිනට පසු සිදු වන සිද්ධීන්ට අනුකූලව, වාර්තාකරණ දිනයෙන් පසු සිදු වූ සියළුම ප්‍රමාණවත් සිද්ධීන් සැලකීමට භාජනය කර, ඒවායේ අදාළභාවය අනුව මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

5 රක්ෂණ ව්‍යාපාරය

5.1 ප්‍රතිරක්ෂණය

මෙමගින් සමූහය සිය සියළු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සහ බැදි රක්ෂණ අවදානම පැවරීමකට ලක්කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම මගින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු ශේෂයන් නිරූපණය වේ. ප්‍රතිරක්ෂණය මගින් ලැබිය යුතු ප්‍රමාණය තීරණයේ ද ප්‍රතිරක්ෂණ ගිවිසුම් සහ බැදි හිමිකම් පෑම් සඳහා වන ප්‍රතිපාදන සහ ගෙවා නිමකල හිමිකම් සැලකිල්ලට භාජනය කරනු ඇත.

වාර්තාකරණ වර්ෂය තුල සංඥාවක් ලද විට හෝ වාර්තාකරණ දිනයේ දී හෝ ප්‍රතිරක්ෂණ වත්කම් වල හානිකරණය පිළිබඳව සමාලෝචනයකට ලක්කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කමෙහි මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවන ලද යම් සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිරක්ෂණය මගින් ලැබිය යුතු මුදල් නොලැබී යාමේ විෂය බද්ධ ගත සාක්ෂියක් සපයනු ලබන විට හානිකරණයක් සිදුව ඇති බවට නිගමනය කෙරේ. එය ආදායම් ප්‍රකාශයෙහි සටහන් තැබේ.

යෝග්‍යවන අවස්ථාවන්හි දී සමූහය විසින් ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් සඳහා ද සාමාන්‍ය ව්‍යාපාරික අවස්ථා යටතේ ප්‍රතිරක්ෂණ අවදානම සලකනු ලැබේ. ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ නිෂ්පාදන වර්ගීකරණය සැලකිල්ලට ගෙන එය සෘජු ව්‍යාපාරයක් ලෙස සලකා කටයුතු කල හැකි ආකාරයට ප්‍රතිරක්ෂණ වාරික ලැබීම් සහ හිමිකම් පෑම් මත ගෙවීම් ආදායම් සහ වියදම් ලෙස හඳුනා ගනී. පවරා දෙන සහ භාරගන්නා යන දෙයාකාර වූ ප්‍රතිරක්ෂණයන් හි දී, වාරික සහ හිමිකම් පෑම් දළ පදනම මත නිරූපණය වේ.

ගිවිසුම් ගත අයිතිය නිමවූ පසු හෝ වෙනත් පාර්ශවයකට පැවරූ පසු ප්‍රතිරක්ෂණ වත්කම හෝ වගකීම බැහැර කිරීම සිදු වේ.

5.2 ලැබිය යුතු රක්ෂණයන්

ලැබිය යුතු රක්ෂණයන් ඒවා උපචිත වූ විට හඳුනාගැනෙන අතර මූලික හඳුනා ගැනීමේ දී ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත හිඟුම් ගත කෙරේ. ධාරණ අගය ගත නොහැකි බවට යම් සිද්ධියක් හෝ අවස්ථාවක් සංඥාවන් සපයන විට දී, ලැබිය යුතු රක්ෂණයන්හි ධාරණ අගයෙහි හානිකරණය පිළිබඳව සලකා බැලේ. එසේ හානිකරණ අලාභයක් වේ නම් එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනී.

5.3 විලම්බිත වියදම්

5.3.1 විලම්බනය කල අත්පත් කර ගැනිමේ පිරිවැය

නව රක්ෂණ ඔප්පුවක් හා සම්බන්ධවන හෝ අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ ඇති ආයෝජන ගිවිසුමක් හෝ සම්බන්ධ වන කොමිස්, ප්‍රතිරක්ෂණ ගාස්තු, අලෙවිකරණ වියදම්, ගිවිසුම් නිකුත් කිරීමේ වියදම් ආදී පිරිවැය අනාගත වාරික මගින් පියවා ගත හැකි ප්‍රමාණයට විලම්බනය කරනු ලැබේ. අනෙකුත් සියලු ආරම්භක අත්පත් කර ගැනිමේ පිරිවැය ඒවා දැරූ විට වියදමක් ලෙස හඳුනා ගනී. මූලික හඳුනාගැනිමෙන් පසුව, උපයානොගත් වාරිකයන් ක්‍රමක්ෂය කිරීමේ පදනමෙහි කාලපරිච්ඡේදය හා සමගාමීව විලම්බනය කල අත්පත් කර ගැනිමේ පිරිවැය ද ක්‍රමක්ෂය කරනු ලැබේ. අපේක්ෂිත ඵලදායී ආයුකාලයේ හෝ වත්කම සහ බැඳුනු අනාගත ප්‍රතිලාභයන් පරිභෝජන රටාවේ අපේක්ෂිත වෙනස්කම් එම වත්කමේ ක්‍රමක්ෂය කාලපරිච්ඡේදයෙහි සිදු කරනු ලබන වෙනස් කිරීම මගින් හිඟුම් ගත කරනු ඇත. එය හිඟුම්කරණ ඇස්තමේන්තු වල සිදුවන වෙනසක් ලෙස සැලකේ. අදාල ගිවිසුම් අවසන් වූ පසු හෝ අවලංගු වූ පසු විලම්බනය කල අත්පත් කර ගැනිමේ පිරිවැය බැහැර කිරීම සිදු වේ.

5.4 ප්‍රතිරක්ෂණ කොමිස්

පිටස්තර ප්‍රතිරක්ෂණ ගිවිසුම මත ලැබිය යුතු කොමිස් විලම්බනය කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

5.5 රක්ෂණ ගිවිසුම් මත වන වගකීම්

5.5.1 ජීවිත රක්ෂණ ගිවිසුම් මත වන වගකීම්

ගිවිසුම් වෙත ඵලඹ වාරික ලැබීමත් සමඟම ජීවිත රක්ෂණ ගිවිසුම් ශුද්ධ වාරික ක්‍රමය යටතේ වගකීමක් ලෙස හඳුනා ගැනේ. අනාගත අපේක්ෂිත ප්‍රතිලාභයන්, හිමිකම් පෑමේ හා ඔප්පු කළමණාකරණයන්හි වියදම් , ඔප්පු හිමියන්ගේ විකල්ප අවස්ථා සහ ඇපවීම් යන වටිනාකම්හි වට්ටම් කල අගයෙන් ආනගත මුදල් ප්‍රවාහයන් ගේ පිටතට ගලායාම් පියවීම සඳහා අවශ්‍යවන අපේක්ෂිත සෛද්ධාන්තික වාරිකයන් හි වට්ටම් කල අගය අඩුකල පසු ලැබෙන ශේෂය වගකීම ලෙස සැලකේ.

වගකීම් වර්තා කිරීමේ දී වර්තමානයේ වන උපකල්පනයන් හෝ ගිවිසුම ආරම්භයේ දී වූ උපකල්පනයන් යොදා ගැනෙන අතර අවදානම හෝ හානිකර අපගමනයන් උදෙසා යම් ගැලපීමක් කෙරේ.

ජීවිත රක්ෂණයේදී දීර්ඝායුෂ සාධකය සඳහා වෙනම වූ සංචිතයක් පිහිටුවනු ලබන අතර එය වගකීමක් ලෙස විදහා දැක්වේ. තවදුරටත් ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් වන වගකීම් සඳහා දැනට උපයානොගත් වාරික සහ බලාපොරොත්තු නොවූ අවදානම්, ගෙවීමට ඇති ඉදිරිපත් කල සහ ඇස්තමේන්තු ගත හිමිකම් පෑම් වෙනුවෙන් වූ ප්‍රතිපාදනයන්ද ඇතුලත් වේ. සෑම වාර්තාකරණ දිනයකදීම වගකීම සඳහා වන ගැලපීම් ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් කෙරේ. අතිරික්ත ගිවිසුම් හානිකර වෙනස්කම් මත අයවන අතර ප්‍රමාණයන් මගින් ජනනය වන ලාභයන් එම ගිවිසුමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ. මෙම ගිවිසුම මත යම් අලාභයක් වේ නම්, එය සම්පූර්ණයෙන්ම අතිරික්ත

ගිවිසුමෙහි පළමු වර්ෂය තුල දී ආදායම් ප්‍රකාශයට ගැනෙන අතර ගිවිසුම කල්පිරී පසු හෝ අවලංගු වූ පසු ගිණුම් වලින් බැහැර කෙරේ.

පවත්නා වගකීම් ප්‍රමාණාත්මතාවය මැනිමේ පරීක්ෂණය මගින් සෑම වාර්තාකරණ දිනකටම හඳුනාගත් පීවිත රක්ෂණ වගකීමෙහි ප්‍රමාණාත්මතාවය පිලිබඳව තක්සේරුවක් කරනු ඇත. ඒ මත තවදුරටත් ප්‍රතිලාභයන් සහ වියදම් දැරීමට පවතින නොහැකියාව මත වගකීමෙහි වටිනාකම සඳහා ගැලපීමක් සිදුකෙරේ. ප්‍රමාණාත්මතා පරීක්ෂණයේදී අනාගත මුදල් ප්‍රවාහ පිළිබඳව වර්තමාන සුදුසුතම තක්සේරුව, සිදු කෙරේ. මෙහිදී වට්ටම් කල මුදල් ප්‍රවාහ ආකෘතිය, විකල්ප මිල ආකෘතිය සහ අනුමානික ආකෘතිය වැනි ආකෘතින් අනුගමනය කරනු ලැබේ. වට්ටම් වල මුදල් ප්‍රවාහනයන් භාවිතයේ දී ඒ සඳහා භාවිතා කරන පොළී අනුපාතය කලමනාකරණයේ වර්තමාන වෙළඳපල පොළී අනුපාතය කෙරෙහි පවතින විචක්ෂණ අපේක්ෂාවන් මත තිරණය වේ. යම් අවප්‍රමාණයක් වේ නම්, එය වර්තමාන අගයෙහි පොළී සාධකය සහ විලම්බනය කල අත්පත් කර ගැනිමේ පිරිවැය හානිකරණයට ලක්කර ආදායම් ප්‍රකාශයේ සටහන් කරන අතර ශේෂවන අලාභයන් ශිල්පිය සංචිතයක් ස්ථාපනය කිරීමෙන් පසු කාලීනව ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

5.5.2 පීවිත නොවන රක්ෂණ ගිවිසුම් මත වන වගකීම්

පීවිත නොවන රක්ෂණ ගිවිසුම් වල වගකිම් හඳුනාගනු ලබන්නේ අදාල ගිවිසුමට ඇතුලත් ව වාරික අයකරගැනීම සිදු කල විටදීය. වාර්තාකරණ දිනට ගෙවිය යුතු හිමිකම් පෑම් හි ඇස්තමේන්තු ගත අවසාන පිරිවැය සටහන් කල හෝ නොකල හිමිකම් පෑම් වෙනුවෙන් වන කලමනාකරණ ගාස්තු හා වියදම් වලින් යම් ප්‍රතිගෙවීමක් හෝ ශේෂ වූ ද්‍රව්‍ය මගින් පියවා ගැනීමක් වේ නම් එය අඩුකර ලැබෙන අගයට සිදු කරන ප්‍රතිපාදන මේ යටතේ වන වගකීම් ලෙස සටහන් කරනු ඇත. යම් හිමිකම් පෑම් සම්බන්දයෙන් දැනුම් දීම් සහ තක්සේරු කිරීම් වල සිදුවන ප්‍රායෝගික ප්‍රමාදවීම් මත වාර්තාකරණ දිනවන විට එම හිමිකම් පෑමෙහි වටිනාකම නිශ්චිතවම තහවුරු වී නොතිබීමට පුළුවන. එබැවින් වාර්තාකරණ දිනට වන වගකීම ප්‍රත්‍යක්ෂ මූලික දත්ත සහ අවදානම් වෙනසට ගැලපුම් ද සැලකිල්ලට ගෙන සකස් කරන ලද ආයුගණක හිමිකම් පෑමේ ප්‍රක්ෂේපන ක්‍රමය මගින් තීරණය කෙරේ. වගකීම් මුදලේ කාල අගයට ගැලපීමක් නොකරන අතර සමතකරණයන් සහ විපත්තීන් සඳහා ද ප්‍රතිපාදන වෙන් නොකෙරේ. ගිවිසුම අවසන්වීම මත හෝ කල්පිරීම මත හෝ අවලංගු වීම මත ඒ හා බැදි වගකීම ගිණුම් වලින් බැහැර කෙරේ.

තවදුරටත් මෙම ගණනය කිරීම් සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් පීවිත රක්ෂණ නොවන ගිවිසුම් වලට අදාලව ඇති වත්කම් මත උපයා ගිවිසුම් ගත අනාගත මුදල් ප්‍රවාහයන් හි ඇස්තමේන්තු ගත අගය ද සැලකිල්ලට ගැනේ.

උපයා නොගත් වාරික සඳහා වන ප්‍රතිපාදනයන් මගින් මෙතෙක් අවදානම උදෙසා වන බැඳීමෙහි කාලය ඉක්මනොවූ ගිවිසුම් මත ලද වාරික නිරූපණය සාමාන්‍යයෙන් සංචිතය ගිවිසුමේ කොන්දේසි මත නිදහස් කෙරෙන අතර එය වාරික ආදායම ලෙස හඳුනාගනී. සෑම වාර්තාකරණ දිනයකටම සමූහය එහි කල්ඉකුත් නොවූ ගිවිසුම් වල අවදානම් මත වන වගකීම පිළිබඳ පරීක්ෂාවට ලක්කරයි. මෙහිදී උපයානොගත් වාරිකවල ධාරණ අගයෙහි ඇස්තමේනතු ගත අගය ප්‍රමාණාත්මක නොවන බව පෙනීයයි නම් වගකිම් වල ප්‍රමාණාත්මකතාවය සඳහා වන ප්‍රතිපාදනයන් වැඩි කරමින් එම වෙනස ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ.

5.6 ආයෝජන ගිවිසුම් වගකීම්

ආයෝජන ගිවිසුම් ලෙස අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ ස ල) සහිත හා රහිත ගිවිසුම් අතර වර්ගීකරණය කරයි. අ ස ල සහිත ආයෝජන ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිත්තීන් පීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සමාන වේ.

අ ස ල රහිත ආයෝජන ගිවිසුම් වගකීම් හඳුනා ගනු ලබන්නේ ගිවිසුමට ඇතුලත් වූ පසු සහ වාරිකය අය කිරීමෙන් පසුවය. මෙම වගකීම් මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර මෙම සාධාරණ අගය වන්නේ ගිවිසුම නිකුත් කෙරෙන ගනුදෙනු මිලයි. එම ගනුදෙනු මිල සඳහා සෘජුවම ආරෝපිත කල හැකි ගනුදෙනු පිරිවැය ඇතුලත් නොවේ. ආයෝජන ගිවිසුම් වගකීම මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව එය ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මනිනු ලැබේ.

තැන්පතු හා නැවත ගැනීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වගකීම්වලට ගැලපුමක් වශයෙන් සෘජුවම වාර්තා කරයි. සාධාරණ අගයට ගැලපුම් සෑම වාර්තා කරන දිනකම සටහන් කරන අතර ඒවා ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලබයි. සාධාරණ අගය අනාගතය සඳහා වූ වට්ටම් සහිත මුදල් ප්‍රවාහ ක්‍රම භාවිතය තුලින් නිර්ණය කරනු ලබයි. ඒකක ගත ගිවිසුම් සඳහා සාධාරණ අගය ගණනය කරනුයේ සෑම ඒකකයකම ඔප්පු හිමියන් සඳහා ඇති ඒකක ගණන එම අරමුදල වාර්තාකරණ දිනයේදී ඇති ඒකක මුදලින් වැඩි කිරීම මගින්ය. වාර්තාකරණ දිනයට ඒකක මිල තීරණය කිරීම සඳහා යොදා ගනු ලබන අරමුදල්මය වත්කම් සහ වගකීම් වල පදනම රදාපවතින්නේ ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දැක්වෙන අගයට විලම්හිත බදු සහ උපචිත නොවූ ලාභ වෙනුවෙන් වන ගැලපීම් සිදු කල පසු අගයයි.

ඒකක ගත නොවූ ගිවිසුම්ද අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලබන අතර ඒවා වට්ටම් ගත මුදල් ප්‍රවාහ හා අනුමානගත ආකෘති යන තක්සේරු ක්‍රම භාවිතය මගින නිර්ණය කරනු ලබයි. මෙම ආකෘතිවල වලංගු භාවය, ක්‍රමාංකිත බව සුදුසුකම් සහිත ස්වාධීන පුද්ගලයෙකු විසින් කලින් කල නිරීක්ෂණය කරනු ලබයි.

ගිවිසුම කල් පිරුණු පසුව නිදහස් කිරීමෙන් හෝ අවලංගු කිරීමක් මගින් වගකීම් බැහැර කල යුතුය. ඔප්පු හිමියා විසින් අවලංගු කරනු ලබන ගිවිසුම් සඳහා වන සාධාරණ අගය අයිතිය අත්හරින අගයට වඩා අඩු නොවිය යුතුය.

ගිවිසුම් මූල්‍ය අවදානම් සංරචක සහ සැළකිය යුතු රක්ෂණ අවදානම් සංරචක වලින් සමන්විත වන අතර සහ මෙම සංරචක දෙක සඳහා

වූ මුදල් ප්‍රවාහයන් එකිනෙකට වෙනස් අතර ඒවා විශ්වාසී ලෙස මිනුම්කරණය කළ හැකිය. මේ සඳහා පාදක වන වටිනාකම් කලඹයක් ලෙස නොපවතී. රක්ෂණ අවදානම් සංරචක සඳහා වන වාරික ගණනය රක්ෂණය හා වන පදනම් හා සමාන වේ.

5.7 අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ ස ල)

අ ස ල මගින් ගිවිසුම් ගත අයිතීන් ඔප්පු හිමියන් වෙත පරිපූරක පොරොන්දු වූ ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ගේ අයිතීන් ලබා දෙනු ලබන අතර සැලකිය යුතු වැඩිපුර ප්‍රතිලාභ අ ස ල කළඹ පවතින වත්කම් වල ක්‍රියාකාරිත්වය මත පදනම් වේ. 90/10 පදනම මත ඔප්පු හිමියන්ට සහ කොටස් හිමියන්ට අ ස ල අරමුදලේ අතිරික්ත කොන්දේසි ප්‍රකාරව බෙදා දිය හැකිය. මෙම අතිරික්ත ඔප්පු හිමියන් වෙත බෙදා දීමේදී එහි වටිනාකම සහ කාලය තීරණය කිරීමේ අභිමතය සමූහය සතුය. පොරොන්දු වූ සහ අභිමතානුරූපී, වෙන් නොකල අතිරික්තද ඇතුළුව සියලුම අ ස ල වගකීම් රක්ෂණය යටතේ හෝ ආයෝජන ගිවිසුම් වගකීම් යටතේ සුදුසු ලෙස වාර්ෂිකව රඳවයි.

5.8 මූල්‍ය උපකරණ ණය හා ස්කන්ධය අතර වර්ගීකරණය

මූල්‍ය උපකරණ ගිවිසුම්ගත බැඳීමක් ඇති විට ණය ලෙස වර්ගීකරණය කරයි.

- වෙනත් ආයතනයක් වෙත, මුදල් හුවමාරුව හෝ අනෙකුත් මූල්‍ය වත්කම් ප්‍රවාහනය හෝ
- සමූහයට අවාසි සහගත අවස්ථාවන් වල කොන්දේසි යටතේ අනෙකුත් ආයතන සමග මූල්‍ය වත්කම් හෝ වගකීම් හුවමාරු කරන විට

සමූහයට කොන්දේසි විරහිත අයිතියක් නොමැති විට මුදල් හුවමාරුව මග හැරවීමට හෝ වෙනත් මූල්‍ය වත්කම් මගින් ගිවිසුම්ගත බැඳීමක් පියවන විට මූල්‍ය වගකීම් යන නිර්වචනය සම්පූර්ණ කෙරේ.

5.9 වෙනත් මූල්‍ය වගකීම් සහ ගෙවිය යුතු රක්ෂණ

වෙනත් මූල්‍ය වගකීම් හඳුනාගනු ලබන්නේ ඒවා ලැබිය යුතු විට සහ ප්‍රතිශ්ඨාපිත අගයෙන් සෘජුවම ආරෝපිත අගය අඩුකල පසු මූලිකව හඳුනාගනු ලබන සාධාරණ අගයට මිනිනු ලැබීමෙනි. මූලිකව හඳුනාගැනීමෙන් පසුව සාඵල්‍ය පොළී අනුපාතික ක්‍රමය උපයෝගී කරගෙන ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

5.10 මූල්‍ය වගකීම් සහ ගෙවිය යුතු රක්ෂණය බැහැර කිරීම.

වගකීම් යටතේ තිබෙන බැඳීම් නිදහස් කිරීම මගින්, අවලංගු කිරීම මගින් හෝ කල් පිරීමෙන් පසුව මූල්‍ය වගකීම් සහ ගෙවිය යුතු රක්ෂණයන් බැහැර කරනු ලබයි.

5.11 ආදායම හඳුනා ගැනීම

5.11.1 දළ වාරික

අ ස ල සමග ඇති පීවිත සහ ආයෝජන ගිවිසුම්වල නැවත ගෙවිය යුතු දළ වාරික ඔප්පු හිමියන්ගෙන් ලැබිය යුතු විට ඒවා ආදායම් ලෙස හඳුනා ගනී. එක් වාරිකයක් පමණක් ලැබෙන විට ආදායම හඳුනා ගනු ලබන්නේ ඔප්පුව බල සහිත වන දිනදීය.

සාමාන්‍ය දළ රක්ෂණ වාරික මුදල් ලෙස සමන්විත වන්නේ ගිණුම්කරණ කාළය තුලදී ඇතුල්වන විට ලැබිය යුතු මුළු ගිවිසුම් කාලය සඳහාම අදාල වාරික මුදල්ය. එය ගිවිසුම ආරම්භ වන දිනයේදීම හඳුනා ගනු ලැබේ.

5.11.2 ප්‍රතිරක්ෂණ වාරික මුදල්

පීවිත හා ආයෝජන ගිවිසුම් සඳහා දළ ප්‍රතිරක්ෂණ වාරික වියදම් ලෙස හඳුනා ගනු ලබන්නේ ඔප්පුව බල සහිත වන දිනයේදීය.

සාමාන්‍ය දළ ප්‍රතිරක්ෂණ වාරික සමන්විත වන්නේ ගිවිසුමෙන් ආවරණය වන කාලච්ඡේදය සඳහා ගෙවිය යුතු මුළු වාරික වල ප්‍රමාණයයි. එය ගිවිසුම ආරම්භ වන දිනදීම හඳුනා ගනී. පසුගිය ගිණුම් කාළච්ඡේද සඳහා අදාල ප්‍රතිරක්ෂණ ගිවිසුම් සඳහා වාරික ගැලපුම් මෙම ගිණුම්කරණ කාළච්ඡේදයේදී සිදුදුකරනු ලැබේ.

නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික නිරූපණය කරන්නේ, ශේෂ පත්‍ර දිනයෙන් පසු බැඳුණු අවදානම් සඳහා අදාළවන ප්‍රතිරක්ෂණ වාරිකවල අගයයි. අවදානම් හා බැඳුණු ගිවිසුම් සහ අදාල ප්‍රතිරක්ෂණ ගිවිසුම් කාලච්ඡේදය තුළ අලාභ හට ගන්නා ගිවිසුම් සඳහා නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික ඒ සඳහා පාදක වූ සෘජු රක්ෂණ ප්‍රතිපත්තීන්ට අදාල කාල සීමාව තුළ විලම්භනය කෙරේ.

5.12 නොඉපැයූ වාරික මුදල් සංචිතය

නොඉපැයූ වාරික මුදල් සංචිතය නිරූපණය කරන්නේ නොඉක්මවූ කාල සීමාව සඳහා ආවරණය වන අදාල වාරිකවල අගයයි. නාමික ප්‍රතිපත්තීන් හැරුණු විට නොඉපැයූ වාරික මුදල් ගණනය කර ඇත්තේ 1/24 පදනමටය. නාමික ප්‍රතිපත්තීන් සඳහා ගණනය කරනුයේ 60 - 40 පදනමටය.

5.13 ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම් හඳුනා ගැනීම

5.13.1 දළ ප්‍රතිලාභ සහ හිමිකම්

පීවිත රක්ෂණ ගිවිසුම් සඳහා අ ස ල සමග ඇති ආයෝජන ගිවිසුම් සඳහා වන දළ ප්‍රතිලාභ සහ හිමිකම්වල ඇතුලත් වර්ෂය තුල ජනිත වූ හිමිකම් පිරිවැයයි. මෙම පිවැරියෙහි සැකසුම් කිරීම සහ බේරුම් කිරීම සඳහා සෘජුවම සම්බන්ධවන බාහිර සහ අභ්‍යන්තර පරිහරණය කිරීමේ පිරිවැය සහ අ ස ල ගිවිසුම් සඳහා ප්‍රකාශිත ප්‍රසාද දීමනාද, එමෙන්ම රක්ෂණයේ දළ තක්සේරුවේ සහ අ ස ල සමග ඇති අයෝජන ගිවිසුම් හිමිකම් වල සිදුවන වෙනස් වීම්ද ඇතුලත්ය. මරණ හිමිකම් සහ අයිතිය අත්හැරීම වාර්තාවන්නේ දැනුම්දීම ලැබුණු පසුයි. කල්පිරීම් සහ වාර්ෂික ගෙවීම් වාර්තා වන්නේ යථාවත් විටය. අතුරු ගෙවීම් සහ අයිතිය අත් හැරීම් ගිණුම් ගත වන්නේ ඒවා බේරුම් කරන විටය.

වර්ෂ අවසාන දිනය දක්වා සිදුව ඇති සිදුවීම් මත හිමිකම් සහ ඒ හා සම්බන්ධ සැකසීමේ සහ බේරුම් කිරීමේ වියදම්, තවමත් දැනුම් දී නැති සිදුවීම් සඳහා හිමිකම්, සුන්බුන් විකිණීමෙන් ලැබෙන ලැබීම් සහ වෙනත් ආවරණය කර ගැනීම් වලින් ලැබිය හැකි ප්‍රමාණය අඩුකල පසු සහ පසුගිය වසරවල සිට පවතින හිඟ හිමිකම් වලට කරන ගැලපීම් කල පසු අගය හිමිකම් ලෙස හඳුනා ගැනේ.

සෘජු සහ අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ ව්‍යාපාර ලෙස නොපියවූ හිමිකම් වන හිමිකම් වියදම් සහ වගකීම් හඳුනා ගෙන ඇත. වගකීම් ලෙස ආවරණය වනුයේ වාර්තාකල නමුදු තවම ගෙවා නොමැති හිමිකම්, සිදු වූ නමුදු වාර්තාකර නොමැති හිමිකම්ය. මෙම හිමිකම් පියවීමේ සෘජු සහ වක්‍ර පිරිවැය කලින් අපේක්ෂා කෙරේ. නොපියවූ හිමිකම් එක් එක් හිමිකම් පාදකව තක්සේරු කර ඇති අතර, මෙහිදී හිමිකම් නිරවුල් කිරීමේදී ගෙවිය යුතු අවසාන පිරිවැය මත එය ඇස්තමේන්තු කර ඇත. මෙතෙක් සිදුවී ඇති එහෙත් වාර්තා නොකරන ලද හිමිකම් සඳහා වඩාත් තාත්වික ඇස්තමේන්තු කිරීමක් වෙනුවෙන් අතීත පළපුරුදු සහ ප්‍රවනතා මත ගණනය කරන ලද අනාගත බැරකම් පිළිබඳව පිවගණකාඥයින්ගේ තක්සේරුව ලබාගනු ලබන අතර එකී තක්සේරු හිමිකම් නිරවුල් කිරීම සඳහා වන සම්පූර්ණ වගකීම පසුව ලැබෙන තොරතුරු හා සිදුවන සිද්ධීන් මත තීරණය වුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි වර්තමානයේ පවතින තොරතුරු අනුව හිමිකම් මූල්‍ය ප්‍රකාශවල සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත. මෙම තත්ත්වය නිසා ප්‍රතිපාදනය කරන ලද අගයක් වෙනුවෙන් සිදු කරන ගැලපීම් අදාළ කාලච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශවල දැක්වේ. හිමිකම් වෙනුවෙන් භාවිතා කරන ලද ක්‍රම හා ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

5.13.2 ප්‍රතිරක්ෂණ හිමිකම

ප්‍රතිරක්ෂණ හිමිකම හඳුනාගනු ලබන්නේ එයට අදාල දළ රක්ෂණ වගකීම ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව හඳුනාගත් විටදීය.

6. නිකුත් කළ නමුදු වාර්තාකරණ දිනයේදී බල නොපැවෙත්වෙන ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් ගිණුම්කරන ප්‍රමිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇත. ඒවා 2014 ජනවාරි 1 වැනි දින හෝ ඊට පසුව බලපැවැත්වේ.

(i) ශ්‍රී ලං මූ වා ප්‍ර 9 - මූල්‍ය උපකරණ - වර්ගීකරණය සහ මිනුම්කරණය

ශ්‍රී ලං මු වා ප්‍ර 9 2012 වර්ෂයේදී නිකුත් කල අතර පසුව දැනුම් දෙනතුරු බලපැවැත්වීම අත්හිටුවා ඇත.

(ii) ශ්‍රී ලං මූ වා ප්‍ර 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලං මු වා ප්‍ර 10 විසින් ලං ගි ප්‍ර 27 හි කොටසක් ප්‍රතිස්ථානය කරනු ලැබේ. එය එකාබද්ධ ගිණුම්කරනය පිළිබඳ සාකච්ජා කෙරේ. එසේම ප්‍රමිත අර්ථ නිරූපණය කිරීමේ කමිටුවෙහි (ප්‍ර අ ක) අංක 12 දරණ අර්ථදැක්වීමෙහි ඇති කරුණු පිළිබඳව ද සාකච්ජා කෙරේ. ශ්‍රී ලං මූ වා ප්‍ර 10 මඟින් විශේෂ කාර්ය ආයතනද ඇතුළුව සියළුම ආයතන සඳහා එක් පාලන නියමුවෙක් පිහිටුවයි. ශ්‍රී ලං මූ වා ප්‍ර 10 ට හඳුන්වාදෙනු ලබන වෙනස් කිරීම් මඟින් කුමන ආයතන පාලනය කරන්නේද සහ කුමන ආයතන මව් සමාගම හා ඒකාබද්ධ කරන්නේද යන්න පිළිබඳව සැළකිය යුතු කළමනාකරණ විනිශ්චයන් අවශ්‍ය වේ.

බැංකුවෙහි හා එහි පරිපාලිතයින් සහ ආශ්‍රිතයින්ගේ සම්බන්ධතාවය යලිත් තක්සේරු කරනු ලබන අතර එහිදී සලකනු ලබන්නේ පරිපාලිතයින් සහ ආශ්‍රිතයින් මත බැංකුව වෙත ඇති බලය සහ ඒවායේ කටයුතු සහ විචල්‍ය ලැබීම් මත බලපෑම් කිරීමට බැංකුව සතු බලයයි. සමස්තයක් වශයෙන් ගත් කල ප්‍රමාණාත්මක බලපෑමක් ශ්‍රී ලං මූ වා ප්‍ර 10 මඟින් මූල්‍ය ප්‍රකාශ කෙරේ ඇති නොකෙරේ.

(iii) ශ්‍රී ලං මූ වා ප්‍ර 11 - බද්ධ එකඟවීම

ශ්‍රී ලං මූ වා ප්‍ර 11 මඟින් ලං ගි ප්‍ර 31 සහ ප්‍ර අ ක 13 හි අර්ථ නිරූපණය කර ඇති පාලනය ප්‍රතිස්ථාපනය කරනු ලැබේ. ශ්‍රී ලං මූ වා ප්‍ර 11 මඟින් විකල්පයක් ලෙස බද්ධ එකඟවීම් ආයතන සඳහා භාවිතා කල සමානුපාතික ඒකාබද්ධ ගිණුම්කරන ක්‍රමය ඉවත් කර ඇත. ඒ වෙනුවට බද්ද එකඟවීම් ආයතන සඳහා ස්කන්ධ ක්‍රමය මඟින් ගිණුම් තැබීම කල යුතුය. මේ සඳහා අවධානය යොමු කල යුතු වන්නේ ගිවිසුමේ අයිතිය හා වගකීම් වෙනුවට වඩා ගිවිසුමේ සැලැස්ම වේ. මූලික විශ්ලේෂණය අනුව සැලකිය යුතු බලපෑමක් මේ මඟින් බලාපොරොත්තු නොවේ.

(iv) ශ්‍රී ලං මූ වා ප්‍ර 12 - අනෙකුත් ආයතන කෙරෙහි ඇති ඇල්ම අනාවරණය කිරීම

ශ්‍රී ලං මූ වා ප්‍ර 12 මඟින් ලං ගි ප්‍ර 27, 28 සහ 31 හි ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ සියළුම අනාවරණය කිරීම් ආවරණය කරනු ලබයි. පරිපාලිතයන් බද්ධ එකඟ වීම්, ආශ්‍රිතයන් සහ ව්‍යුහගත ආයතන කෙරෙහි ආයතනයේ ඇති ඇල්ම මෙමගින් අනාවරණය කෙරේ. මූලික විශ්ලේෂණය අනුව සැලකිය යුතු බලපෑමක් මේ මඟින් බලාපොරොත්තු නොවේ.

(v) ශ්‍රී ලං මූ වා ප්‍ර 13 - සාධාරණ අගය මිනුම්කරණය

ශ්‍රී ලං මූ වා ප්‍ර 13 මඟින් සියළුම ශ්‍රී ලං මූ වා ප්‍ර සඳහා සාධාරණ අගය කෙරෙහි එක් මූලාශ්‍ර මග පෙන්වීමක් සපයන අතර එය ආවරණය කරනු ලබයි.

මෙම ගිණුම්කරන ප්‍රමිතය මඟින් සාධාරණ අගය මනිනු ලබන්නේ කෙසේද යන්න මග පෙන්වනු ලැබේ. ශ්‍රී ලං මු වා ප්‍ර මඟින් සාධාරණ අගය අවශ්‍ය වූ විට හෝ නිර්දේශ කර ඇතිවිට ශ්‍රී ලං මූ වා ප්‍ර 13 හි මිනුම් දඩු මුලධර්ම භාවිතා කිරීමට අනුබලදී ඇත. පරිපූර්ණ අධ්‍යනය කිරීම නිමකර නැති බැවින් මෙම ගිණුම්කරන ප්‍රමිතය මඟින් සිදුවන මූල්‍යමය බලපෑම් සාධාරණ ලෙස ඇස්තමේන්තු කර නැත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		බැංකුව		සමූහය	
		2013	2012	2013	2012
		රු.'000	රු.'000	රු.'000	රු.'000
7	**මුළු ආදායම**				
	පොළී ආදායම (සටහන 8.1)	114,863,091	95,021,794	119,504,363	98,751,348
	ගාස්තු සහ කොමිස් ආදායම (සටහන 9)	6,457,118	7,320,001	6,789,600	7,531,297
	වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභය/(අලාභය) (සටහන 10)	3,232,748	3,773,334	3,268,177	3,753,375
	මූල්‍ය ආයෝජන වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය) (සටහන 11)	425,543	366,407	469,989	368,206
	වෙනත් මෙහෙයුම් ආදායම් (සටහන 12)	2,485,558	3,656,383	4,197,512	5,122,935
		127,464,058	110,137,919	134,229,641	115,527,161

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		බැංකුව		සමූහය	
		2013	2012	2013	2012
		රු.'000	රු.'000	රු.'000	රු.'000
8	**ශුද්ධ පොළී ආදායම**				
8.1	**පොළී ආදායම**				
	ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	2,363,091	762,813	2,367,384	799,326
	බැංකු වල ඇති තැන්පතු	601,390	538,000	723,697	702,208
	මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	5,892,122	5,364,449	6,020,067	7,053,569
	ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	87,143,820	72,579,133	91,342,815	74,174,834
	මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	284,873	2,292,555	374,253	2,489,313
	මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	1,253,218	2,255,030	1,280,091	2,255,030
	මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින	17,324,577	11,229,814	17,396,056	11,277,068
		114,863,091	95,021,794	119,504,363	98,751,348

2013 වර්ෂය සඳහා ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය සහ අත්තිකාරම් වල පොළී ආදායම තුළ රු. මිලියන 153.3 (2012 : රු. මිලියන 245.2) ක හානිකරණ ණය මත පොළිය ඇතුළත් වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		බැංකුව		සමූහය	
		2013	2012	2013	2012
		රු.'000	රු.'000	රු.'000	රු.'000
8.2	**පොළී වියදම**				
	බැංකුවලට ගෙවිය යුතු	210,911	571,152	386,302	572,341
	ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	55,275,008	38,177,117	56,255,147	38,851,465
	වෙනත් ණය ගැනීම්	16,256,289	16,333,709	17,150,735	17,305,298
	නිකුත් කළ ණය සුරැකුම්පත්	2,964,431	2,641,343	3,357,236	2,782,395
	යටත් කාලීන ණය	3,013,092	1,977,554	3,013,092	1,977,554
		77,719,731	59,700,875	80,162,512	61,489,053
	ශුද්ධ පොළී ආදායම	37,143,360	35,320,919	39,341,851	37,262,295

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ද්විතීයික වෙළඳපොල ගනුදෙනු වලින් ඉපයූ ශුද්ධ පොළී ආදායම, නාමික බදු බැර එකතු කිරීමෙන් දළ අගයට නිරූපනය කරනු ලැබේ. සටහන් අංක 17.4 තුළ විස්තරාත්මකව දැක්වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
8.3 ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත් වලින් ලද ශුද්ධ පොළී ආදායම				
පොළී ආදායම	19,105,110	15,936,042	19,311,770	15,984,060
අඩු කළා : පොළී වියදම	5,209,070	8,398,385	5,238,555	8,403,095
	13,896,040	7,537,657	14,073,215	7,580,965

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
9 ගාස්තු සහ කොමිස් ආදායම				
ගාස්තු සහ කොමිස් ආදායම	6,457,118	7,320,001	6,789,600	7,531,297
අඩු කළා : ගාස්තු සහ කොමිස් වියදම	720,232	654,195	854,587	761,209
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම (සටහන 9.1)	5,736,886	6,665,806	5,935,013	6,770,088
9.1 ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම				
වෙළඳ සහ අනෙකුත් සම්බන්ධිත සේවා	2,518,851	3,403,344	2,566,160	3,414,058
ණය	168,219	194,413	180,258	203,202
ණයපත්	631,523	553,670	631,523	553,670
සංචාරක හා ප්‍රේෂණ	477,538	415,660	477,538	415,660
භාරකාරත්ව සේවා	39,254	30,250	39,254	30,250
තැන්පතු	942,666	934,376	943,781	934,486
ඇපකර	944,837	959,928	944,943	960,034
වෙනත්	13,998	174,165	151,556	258,728
	5,736,886	6,665,806	5,935,013	6,770,088

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
10 වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභය /(අලාභය)				
විදේශ විනිමය	2,681,323	3,985,714	2,705,249	4,027,266
පොළී අනුපාත				
වෙළඳපොල අගය මත සුරැකුම්පත් අගය කිරීමේ ලාභ /(අලාභ)	347,494	(124,109)	347,494	(137,493)
සුරැකුම්පත් විකිණීමේ ලාභ /(අලාභ)	231,096	258,310	231,206	258,310
ස්කන්ධයන්				
වෙළඳපොල අගය මත සුරැකුම්පත් අගය කිරීමේ ලාභ /(අලාභ)	(170,346)	(511,112)	(157,677)	(546,373)
සුරැකුම්පත් විකිණීමේ ලාභ /(අලාභ)	5,008	70,378	(11,193)	57,288
ලාභාංශ ආදායම	138,173	94,153	153,098	94,377
	3,232,748	3,773,334	3,268,177	3,753,375

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
11 මූල්‍ය ආයෝජනයන්ගෙන් ලද ශුද්ධ ලාභ / (අලාභ)				
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින				
රාජ්‍ය සුරැකුම්පත්	94,917	45,170	96,705	36,304
ලාභාංශ ආදායම	330,626	321,237	373,284	331,902
	425,543	366,407	469,989	368,206

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
12 වෙනත් මෙහෙයුම් ආදායම්				
ලාභාංශ ආදායම	244,386	324,799	-	-
විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ / (අලාභ)	539,423	1,823,111	539,423	1,823,111
දේපල, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ /(අලාභ)	32,242	99,415	45,133	96,041
කපාහරින ලද ණය නැවත අයකර ගැනීම්	44,691	89,805	59,641	106,699
කුලී ආදායම්	153,493	99,346	223,673	168,989
සේවා ආදායම්	893,141	772,165	1,315,567	1,082,978
රත්‍රං විකිණීමෙන් ලද ලාභයන්	35,162	36,991	35,162	36,991
විවිධ ආදායම්	419,430	308,529	428,811	648,891
දළ රක්ෂණ වාරික	-	-	1,426,512	1,057,013
ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම (සටහන 12.1)	123,590	102,222	123,590	102,222
	2,485,558	3,656,383	4,197,512	5,122,935

	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
12.1 ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම				
ඉස්ලාමීය බැංකුකරණ මෙහෙයුම් වලින් ලද ආදායම	197,210	195,291	197,210	195,291
ආයෝජකයන්ට ගෙවූ ලාභ	(73,620)	(93,069)	(73,620)	(93,069)
	123,590	102,222	123,590	102,222

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
13 ණය සහ අනෙකුත් අලාභයන් සඳහා හානිකරණය (ප්‍රතිපාදන) / ප්‍රතිවර්ත්‍ය කිරීම				
13.1 ගනුදෙනුකරුවන්ට දුන් ණය සහ අත්තිකාරම් මත හානිකරණය (ප්‍රතිපාදන) / ප්‍රතිවර්ත්‍ය කිරීම				
කේවල හානිකරණය	838,998	(1,452,710)	665,354	(1,465,396)
සමූහ හානිකරණය	(7,761,900)	(2,663,572)	(7,996,490)	(2,746,343)
	(6,922,902)	(4,116,282)	(7,331,136)	(4,211,739)
13.2 මූල්‍ය ආයෝජන මත හානිකරණය (ප්‍රතිපාදන) / ප්‍රතිවර්ත්‍ය කිරීම				
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	-	(1,788,000)	(8,008)	(1,794,143)
	-	(1,788,000)	(8,008)	(1,794,143)
ණය හා අනෙකුත් අලාභ සඳහා මුළු හානිකරණය (ප්‍රතිපාදන) / ප්‍රතිවර්ත්‍ය කිරීම	(6,922,902)	(5,904,282)	(7,339,144)	(6,005,882)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		බැංකුව		සමූහය	
		2013	2012	2013	2012
		රු.'000	රු.'000	රු.'000	රු.'000
14	**සේවක මණ්ඩල වියදම්**				
	සේවක පාරිශ්‍රමික	10,939,430	8,588,225	11,883,030	9,405,610
	නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය (සටහන 14.1)	1,144,897	1,349,923	1,197,476	1,400,531
	නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය (සටහන 14.2)	852,103	794,893	950,544	871,675
	වෙනත් සේවක පිරිවැයන්	1,732,690	2,193,790	1,875,781	2,338,743
		14,669,120	12,926,831	15,906,831	14,016,559
14.1	**නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය**				
	සේවය දායකත්වය :				
	ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල (සටහන 44.1(අ))	1,046,532	1,205,681	1,046,532	1,205,681
	ලංකා බැංකුවේ වැන්දඹු / වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල (සටහන 44.2 (අ))	41,712	92,803	41,712	92,803
	විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන (සටහන 44.3)	56,653	51,439	102,566	102,047
	සී/ස ලංකා බැංකුව (යු කේ) සමාගම - විශ්‍රාම අරමුදල	-	-	6,666	-
		1,144,897	1,349,923	1,197,476	1,400,531
14.2	**නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය**				
	සේවය දායකත්වය :				
	සේවක අර්ථසාධක අරමුදල	682,459	636,545	761,974	702,777
	සේවක භාරකාර අරමුදල	169,644	158,348	188,570	168,898
		852,103	794,893	950,544	871,675

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		බැංකුව		සමූහය	
		2013	2012	2013	2012
		රු.'000	රු.'000	රු.'000	රු.'000
15	**වෙනත් වියදම්**				
	අධ්‍යක්ෂ පාරිශ්‍රමික	2,852	3,500	60,501	71,184
	විගණන ගාස්තු				
	විගණන සේවා	16,786	21,002	26,987	31,358
	විගණන නොවන සේවා	-	-	3,200	3,314
	තැන්පතු සඳහා රක්ෂණ ගාස්තු*	917,165	640,357	926,822	646,560
	වෘත්තීය හා නීති ගාස්තු	70,789	98,959	119,132	147,006
	අනුමත පුණ්‍යායතනයන්ට පරිත්‍යාග	-	-	86	374
	දේපළ, පිරියත හා උපකරණ ක්ෂය	977,446	838,051	1,327,183	1,170,529
	අස්පෘෂ්‍ය වත්කම් හා කල්බදු දේපල ක්‍රමක්ෂය	139,757	122,465	170,057	132,792
	ස්ථාවර වත්කම් නඩත්තු කිරීමේ වියදම්	3,006,892	2,498,353	2,510,780	2,144,348
	ප්‍රතිරක්ෂණ වාරික, හිමිකම් හා වෙනත් ප්‍රතිලාභ	-	-	1,076,097	669,940
	කාර්යාල පරිපාලන හා මෙහෙයුම් වියදම්	3,880,778	3,720,460	5,113,732	4,754,653
		9,012,465	7,943,147	11,334,577	9,772,058

*2010 ඔක්තෝම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සහ ද්‍රවශීලතා සහය වැඩ සටහන මත ආසන්න විගණිත මූල්‍ය ප්‍රකාශන වල ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) මත පදනම්ව 2010 අංක 05 දරණ බැංකු පනතේ විධිවිධානයන්ට අනුව සුදුසුකම්ලත් තැන්පතු වගකීම් වලින් 0.1% ක් හෝ 0.125% ක ගෙවීමක් බැංකුව විසින් කාර්තු පදනමින් තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට සිදුකළ යුතුය.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		සමූහය	
		2013	2012
		රු.'000	රු.'000
16	**බදු අය කිරීමට පෙර ආශ්‍රිත සමාගම්හි ලාභයේ/(අලාභයේ) කොටස**		
	සී/ස සී බෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	30,088	42,003
	සී/ස ලංකා සික්‍යුරිටීස් (පෞද්ගලික) සමාගම	(16,214)	(27,675)
	සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම	206,400	7,407
	සී/ස සද්‍රන් ඩිවලප්මන්ට් ෆිනෑන්ෂල් සමාගම	208	(147)
	සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම	8,331	16,997
		228,813	38,585

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		බැංකුව		සමූහය	
		2013	2012	2013	2012
		රු.'000	රු.'000	රු.'000	රු.'000
17	**ආදායම් බදු වියදම**				
17.1	**ආදායම් බදු වියදමෙහි සංරචක පහත වේ:**				
	ප්‍රවර්තන බදු වියදම				
	වර්ෂයේ ලාභය මත ආදායම් බදු	3,657,004	5,417,245	3,914,673	5,684,614
	ආදායම් බදු වලට අදාළව පෙර වර්ෂවල ගැළපුම්	45,415	91,074	45,791	97,136
	විලම්බිත බදු වියදම				
	විලම්බිත බදු ප්‍රතිපාදන/ (ප්‍රතිවර්ත්‍ය කිරීම) (සටහන 35)	(80,760)	(130,642)	(4,162)	(143,476)
		3,621,659	5,377,677	3,956,302	5,638,274
17.2	**ඵිණුම්කරණ ලාභය සහ ආදායම් බදු වියදම සැසඳීම**				
	බදු පෙර ඵිණුම්කරණ ලාභය	15,708,772	19,794,298	16,104,624	20,246,268
	අඩු කලා: ආශ්‍රිත සමාගම් වල ලාභයේ කොටස	-	-	(228,813)	(38,585)
		15,708,772	19,794,298	15,875,811	20,207,683
	එකතු කලා: සමූහයේ සමාගම්වලින් ලද ලාභාංශ ආදායම	-	-	244,386	298,810
		15,708,772	19,794,298	16,120,197	20,506,493
	එකතු කලා: ඉඩ නොදෙන වියදම්	12,926,911	14,666,471	17,452,052	16,653,064
		28,635,683	34,460,769	33,572,249	37,159,557
	අඩු කලා: ඉඩ දෙන වියදම්	(9,227,476)	(8,076,768)	(13,722,616)	(9,703,508)
	අඩු කලා: බදු නිදහස් ආදායම	(7,224,487)	(8,020,382)	(7,259,433)	(8,320,377)
	බදු ගෙවිය යුතු ආදායම	12,183,720	18,363,619	12,590,200	19,135,672
	ප්‍රවර්තන බදු අනුපාතය 28% (2012 - 28%)	3,411,442	5,141,813	3,625,266	5,356,698
	සමූහයේ විවිධ බදු අනුපාතයන්ගේ බලපෑම	-	-	9,320	5,514
	වෙනත් රටවල වෙනස් බදු අනුපාතයන්ගේ බලපෑම	245,562	275,432	245,562	275,432
	අන්තර් සමාගම් ලාභාංශ මත 10% රඳවා ගැනීමේ බද්ද	-	-	23,117	29,881
	ආශ්‍රිත සමාගම් වල ආදායම් බදු වියදම් කොටස	-	-	11,408	17,089
	පෙර වර්ෂ වෙනුවෙන් ප්‍රවර්තන ආදායම් බදු සඳහා ගැළපීම	45,415	91,074	45,791	97,136
	විලම්බිත බදු ප්‍රතිපාදන / (ප්‍රතිවර්ත්‍ය කිරීම්) (සටහන 35)	(80,760)	(130,642)	(4,162)	(143,476)
		3,621,659	5,377,677	3,956,302	5,638,274
	සඵල ආදායම් බදු අනුපාතය	23.1%	27.2%		

	2013	2012
17.3 නේවාසික සමාගම්වල බදු වගකීම ගණනය කරන්නේ සම්මත අනුපාතය වන 28% වන අතර පහත සඳහන් සමාගම් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ බදු නිදහස් කිරීම්වලට සහ බදු සහනයන්ට හිමිකම් ලබයි.		
1. බී.ඕ.සී. ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	12.0%	12.0%
2. සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	12.0%	12.0%
4. සී/ස ලංකා බැංකුව (යු කේ) සමාගම	20.0%	24.5%
5. සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම*	නැත	නැත
6. මාලේ ශාඛාවේ බැංකු කටයුතු	25.0%	25.0%
7. චෙන්නායි ශාඛාවේ බැංකු කටයුතු	40.0%	40.0%

*ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ඇති කරගත් ගිවිසුමකට අනුව සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම එහි ව්‍යාපාරික කටයුතු ආරම්භ කර වර්ෂ 2 ක් හෝ සමාගම ලාභ උත්පාදනය ආරම්භ කල වර්ෂයේ සිට වර්ෂ 5ක් යන්නෙන් පලමුව ඇති වන්නාවූ කාලය සඳහා බදු නිදහසකට හිමිකම් ලබයි.

17.4 ද්විතීය වෙළඳපළේ ගනුදෙනු වෙනුවෙන් රජයේ සුරුකුම්පත් මත රඳවා ගැනීමේ බද්ද සඳහා නාමික බදු බැර

2006 අංක10 දරණ දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනයන්ගේ 137 වන වගන්තියේ විධිවිධාන වලට අනුව රජයේ සුරුකුම්පත් මත ද්විතීය වෙළඳපළේ ගනුදෙනුවලින් ලබන පොළී ආදායම මත බැංකුවට නාමික බදු බැර සඳහා හිමිකම් (ශුද්ධ පොළී ආදායමෙන් නමයෙන් එකක් (1/9)) ඇත. ඒ සඳහා එකී පොළී ආදායම එම තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමෙහි කොටසක් විය යුතුය. ඒ අනුව, රජයේ සුරුකුම්පත් මත ද්විතීය වෙළඳපළෙන් බැංකුව සහ සමූහය විසින් උපයන ලද ශුද්ධ ආදායම මූල්‍ය ප්‍රකාශන වල සමුච්චිත කොට දක්වා ඇති අතර, එමඟින් ඇතිවන නාමික බදු බැර බැංකුව සඳහා රු. මිලියන 1,599.4 (2012 - රු. මිලියන 847.2) සහ සමූහය සඳහා රු. මිලියන 1,629.9 (2012 - රු. මිලියන 893.2) වේ.

18 කොටසක ඉපැයුම් සහ කොටසක ලාභාංශය

18.1 කොටසක මූලික ඉපැයුම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 33 "කොටසක ඉපැයුම්" අනුව කොටසක් වෙනුවෙන් මූලික ඉපැයුම් ගණනය කරනු ලබනනේ මව් සමාගමේ සාමාන්‍ය කොටස්හිමියන්ට අයත් ශුද්ධ ලාභය හෝ අලාභය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් (හරය) බෙදීමෙනි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2013	2012	2013	2012
මව් සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් වර්ෂයේ ශුද්ධ ලාභය (රු.'000)	12,087,113	14,416,621	12,234,412	14,580,264
නිකුත් කර ඇති බරිත සාමාන්‍ය කොටස් ප්‍රමාණය	5,000,000	5,000,000	5,000,000	5,000,000
කොටසක මූලික ඉපැයුම (රු.)	2,417.42	2,883.32	2,446.88	2,916.05

18 කොටසක ඉපැයුම් සහ කොටසක ලාභාංශය (සම්බන්ධයි)

18.2 කොටසක තනුක ඉපැයුම්

කොටසක තනුක ඉපැයුම් ගණනය කරනු ලබන්නේ, මව් ආයතනයේ කොටස් හිමියන්ට අයත් ලාභය හෝ අලාභය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් සඳහා සිදු කළයුතු ගැලපුම් කළ පසු, බර්ත සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් (හරය) බෙදීමෙනි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2013	2012	2013	2012
මව් සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ලාභය (රු.'000)	12,087,113	14,416,621	12,234,412	14,580,264
වර්ෂය තුළ නිකුත් කර ඇති බර්ත සාමාන්‍ය කොටස් ප්‍රමාණය	5,000,000	5,000,000	5,000,000	5,000,000
වර්ෂය තුළ විකල්ප බර්ත සාමාන්‍ය කොටස් ප්‍රමාණය	-	-	-	-
ගැලපුම් සිදු කල පසු බර්ත සාමාන්‍ය කොටස් ප්‍රමාණය	5,000,000	5,000,000	5,000,000	5,000,000
කොටසක තනුක ඉපැයුම් (රු)	2,417.42	2,883.32	2,446.88	2,916.05

18.3 කොටසක ලාභාංශය

කොටසක ලාභාංශය ගණනය කර ඇත්තේ, කොටස්කරුවන්ට බෙදා හරින මුළු ලාභය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් (හරය) බෙදීමෙනි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2013	2012	2013	2012
වර්ෂය තුල කොටස් හිමියන්ට බෙදා දුන් මුළු ලාභය (රු.'000)	5,346,410	5,346,410	5,346,410	5,346,410
නිකුත් කල බර්ත සාමාන්‍ය කොටස් ප්‍රමාණය	5,000,000	5,000,000	5,000,000	5,000,000
කොටසක ලාභාංශය (රු)	1,069.28	1,069.28	1,069.28	1,069.28

දෙසැම්බර් 31 දිනට

	2013					
	වෙළඳාම සඳහා දරා සිටින රු.'000	කල්පිරෙන තෙක් දරා සිටින රු.'000	ණය හා ලැබිය යුතු දෑ/ ක්‍රමක්ෂය පිරිවැය රු.'000	උපලබ්ධිය සඳහා පවතින රු.'000	වෙනත් රු.'000	එකතුව රු.'000
19 මිනුම් කිරීමේ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය						
19.1 බැංකුව						
මූල්‍ය වත්කම්						
මුදල් හා කෙටි කාලීන අරමුදල්	-	-	24,901,189	-	-	24,901,189
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	28,699,132	-	-	28,699,132
බැංකුවල ඇති තැන්පතු	-	-	19,315,520	-	-	19,315,520
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	3,261,073	-	-	-	-	3,261,073
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	22,319,717	-	-	22,319,717
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	13,539,791	-	-	-	-	13,539,791
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	-	-	129,108,613	-	-	129,108,613
ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය හා අත්තිකාරම්	-	-	725,331,966	-	-	725,331,966
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින		- -	-	10,325,214	-	10,325,214
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	-	156,899,761	-	-	-	156,899,761
මුළු මූල්‍ය වත්කම්	16,800,864	156,899,761	949,676,137	10,325,214	-	1,133,701,976
මූල්‍ය නොවන වත්කම්						
පරිපාලිත සමාගම් වල ආයෝජන	-	-	-	-	6,828,699	6,828,699
ආශ්‍රිත සමාගම් වල ආයෝජන	-	-	-	-	842,988	842,988
දේපළ, පිරියත හා උපකරණ	-	-	-	-	12,006,180	12,006,180
කල්බදු දේපළ	-	-	-	-	83,026	83,026
අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-	501,064	501,064
වෙනත් වත්කම්	-	-	-	-	39,616,967	39,616,967
මුළු මූල්‍ය නොවන වත්කම්	-	-	-	-	59,878,924	59,878,924
මුළු වත්කම්	16,800,864	156,899,761	949,676,137	10,325,214	59,878,924	1,193,580,900

දෙසැම්බර් 31 දිනට

	2013			
	වෙළඳාම සඳහා දරා සිටින රු.'000	ක්‍රමක්ෂය පිරිවැය රු.'000	වෙනත් රු.'000	එකතුව රු.'000
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	-	1,166,427	-	1,166,427
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	274,948	-	-	274,948
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	-	842,070,000	-	842,070,000
වෙනත් ණය ගැනීම්	-	235,370,269	-	235,370,269
නිකුත් කළ ණය සුරැකුම්පත්	-	20,968,357	-	20,968,357
යටත් කාලීන ණය	-	24,357,595	-	24,357,595
මුළු මූල්‍ය වගකීම්	274,948	1,123,932,648	-	1,124,207,596
මූල්‍ය නොවන වගකීම්				
විලම්බිත බදු වගකීම්	-	-	151,623	151,623
වෙනත් වගකීම්	-	-	11,521,521	11,521,521
මුළු මූල්‍ය නොවන වගකීම්	-	-	11,673,144	11,673,144
මුළු වගකීම්	274,948	1,123,932,648	11,673,144	1,135,880,740

19 මිනුම් කිරීමේ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය (සම්බන්ධයි)

දෙසැම්බර් 31 දිනට	2012					
	වෙළඳාම සඳහා දරා සිටින	කල්පිරෙන තෙක් දරා සිටින	ණය හා ලැබිය යුතු දෑ/ ක්‍රමක්ෂය පිරිවැය	උපලබ්ධිය සඳහා පවතින	වෙනත්	එකතුව
	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000
19.1 බැංකුව						
මූල්‍ය වත්කම්						
මුදල් හා කෙටි කාලීන අරමුදල්	-	-	31,544,558	-	-	31,544,558
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	29,963,240	-	-	29,963,240
බැංකුවල ඇති තැන්පතු	-	-	19,394,466	-	-	19,394,466
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	507,451	-	-	-	-	507,451
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	797,425	-	-	797,425
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	15,541,185	-	-	-	-	15,541,185
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	-	-	99,206,859	-	-	99,206,859
ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය හා අත්තිකාරම්	-	-	691,899,207	-	-	691,899,207
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	-	-	-	12,080,988	-	12,080,988
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	-	110,956,202	-	-	-	110,956,202
මුළු මූල්‍ය වත්කම්	16,048,636	110,956,202	872,805,755	12,080,988	-	1,011,891,581
මූල්‍ය නොවන වත්කම්						
පරිපාලිත සමාගම් වල ආයෝජන	-	-	-	-	6,792,848	6,792,848
ආශ්‍රිත සමාගම් වල ආයෝජන	-	-	-	-	842,988	842,988
දේපළ, පිරියත හා උපකරණ	-	-	-	-	11,430,827	11,430,827
කල්බදු දේපළ	-	-	-	-	84,976	84,976
අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-	376,002	376,002
වෙනත් වත්කම්	-	-	-	-	16,801,769	16,801,769
	-	-	-	-	36,329,410	36,329,410
මුළු වත්කම්	16,048,636	110,956,202	872,805,755	12,080,988	36,329,410	1,048,220,991

දෙසැම්බර් 31 දිනට	2012			
	වෙළඳාම සඳහා දරා සිටින	ක්‍රමක්ෂය පිරිවැය	වෙනත්	එකතුව
	රු.'000	රු.'000	රු.'000	රු.'000
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	-	10,127,983	-	10,127,983
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	74,314	-	-	74,314
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	-	693,440,642	-	693,440,642
වෙනත් ණය ගැනීම්	-	233,795,515	-	233,795,515
නිකුත් කළ ණය සුරැකුම්පත්	-	23,296,349	-	23,296,349
යටත් කාලීන ණය	-	23,818,024	-	23,818,024
මුළු මූල්‍ය වගකීම්	74,314	984,478,513	-	984,552,827
මූල්‍ය නොවන වගකීම්				
ප්‍රවර්තන බදු වගකීම්	-	-	2,208,461	2,208,461
විලම්බිත බදු වගකීම්	-	-	351,279	351,279
වෙනත් වගකීම්	-	-	10,155,542	10,155,542
මුළු මූල්‍ය නොවන වගකීම්	-	-	12,715,282	12,715,282
මුළු වගකීම්	74,314	984,478,513	12,715,282	997,268,109

දෙසැම්බර් 31 දිනට	2013					
	වෙළඳාම සඳහා දරා සිටින රු.'000	කල්පිරෙන තෙක් දරා සිටින රු.'000	ණය හා ලැබිය යුතු දෑ/ ක්‍රමක්ෂය පිරිවැය රු.'000	උපලබ්ධිය සඳහා පවතින රු.'000	වෙනත් රු.'000	එකතුව රු.'000
19.2 සමූහය						
මූල්‍ය වත්කම්						
මුදල් හා කෙටි කාලීන අරමුදල්	-	-	25,182,043	-	-	25,182,043
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	28,699,132	-	-	28,699,132
බැංකුවල ඇති තැන්පතු	-	-	21,157,190	-	-	21,157,190
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	3,261,073	-	-	-	-	3,261,073
ප්‍රතිවික්‍රණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	22,851,895	-	-	22,851,895
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	13,898,242	-	-	-	-	13,898,242
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	-	-	130,190,296	-	-	130,190,296
ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය හා අත්තිකාරම්	-	-	746,571,819	-	-	746,571,819
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	-	-	-	12,852,445	-	12,852,445
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	-	157,441,572	-	-	-	157,441,572
මුළු මූල්‍ය වත්කම්	17,159,315	157,441,572	974,652,375	12,852,445	-	1,162,105,707
මූල්‍ය නොවන වත්කම්						
ආශ්‍රිත සමාගම් වල ආයෝජන	-	-	-	-	1,471,267	1,471,267
ආයෝජන දේපළ	-	-	-	-	151,914	151,914
දේපළ, පිරියත හා උපකරණ	-	-	-	-	20,622,161	20,622,161
කල්බදු දේපළ	-	-	-	-	121,417	121,417
අස්පෘෂ්‍ය වත්කම්	-	-	-	-	669,657	669,657
විලම්බිත බදු වත්කම්	-	-	-	-	47,818	47,818
වෙනත් වත්කම්	-	-	-	-	40,572,450	40,572,450
මුළු මූල්‍ය නොවන වත්කම්	-	-	-	-	63,656,684	63,656,684
මුළු වත්කම්	17,159,315	157,441,572	974,652,375	12,852,445	63,656,684	1,225,762,391

දෙසැම්බර් 31 දිනට	2013			
	වෙළඳාම සඳහා දරා සිටින රු.'000	ක්‍රමක්ෂය පිරිවැය රු.'000	වෙනත් රු.'000	එකතුව රු.'000
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	-	1,336,267	-	1,336,267
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	274,948	-	-	274,948
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	-	850,767,521	-	850,767,521
වෙනත් ණය ගැනීම්	-	240,802,111	-	240,802,111
නිකුත් කළ ණය සුරැකුම්පත්	-	24,986,818	-	24,986,818
යටත් කාලීන ණය	-	24,347,248	-	24,347,248
මුළු මූල්‍ය වගකීම්	274,948	1,142,239,965	-	1,142,514,913
මූල්‍ය නොවන වගකීම්				
ප්‍රවර්තන බදු වගකීම්	-	-	251,475	251,475
විලම්බිත බදු වගකීම්	-	-	2,034,216	2,034,216
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	-	-	220,748	220,748
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	-	-	670,073	670,073
වෙනත් වගකීම්	-	-	13,158,933	13,158,933
මුළු මූල්‍ය නොවන වගකීම්	-	-	16,335,445	16,335,445
මුළු වගකීම්	274,948	1,142,239,965	16,335,445	1,158,850,358

19 මිනුම් කිරීමේ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය (සම්බන්ධයි)

දෙසැම්බර් 31 දිනට

	2012					
	වෙළඳාම සඳහා දරා සිටින රු.'000	කල්පිරෙන තෙක් දරා සිටින රු.'000	ණය හා ලැබිය යුතු දෑ/ ක්‍රමක්ෂය පිරිවැය රු.'000	උපලබ්ධිය සඳහා පවතින රු.'000	වෙනත් රු.'000	එකතුව රු.'000
19.2 සමූහය						
මූල්‍ය වත්කම්						
මුදල් හා කෙටි කාලීන අරමුදල්	-	-	31,955,777	-	-	31,955,777
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	29,963,240	-	-	29,963,240
බැංකුවල ඇති තැන්පතු	-	-	25,577,197	-	-	25,577,197
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	507,451	-	-	-	-	507,451
ප්‍රතිවික්‍රණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	1,423,796	-	-	1,423,796
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	16,028,758	-	-	-	-	16,028,758
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	-	-	99,182,351	-	-	99,182,351
ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය හා අත්තිකාරම්	-	-	709,933,498	-	-	709,933,498
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	-	-	-	14,361,925	-	14,361,925
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	-	111,706,459	-	-	-	111,706,459
මුළු මූල්‍ය වත්කම්	16,536,209	111,706,459	898,035,859	14,361,925	-	1,040,640,452
මූල්‍ය නොවන වත්කම්						
ආශ්‍රිත සමාගම් වල ආයෝජන	-	-	-	-	1,268,995	1,268,995
ආයෝජන දේපළ	-	-	-	-	147,047	147,047
දේපළ, පිරියත හා උපකරණ	-	-	-	-	18,437,863	18,437,863
කල්බදු දේපළ	-	-	-	-	124,724	124,724
අස්පෘෂ්‍ය වත්කම්	-	-	-	-	461,955	461,955
විලම්බිත බදු වත්කම්	-	-	-	-	73,042	73,042
වෙනත් වත්කම්	-	-	-	-	18,199,140	18,199,140
මුළු මූල්‍ය නොවන වත්කම්	-	-	-	-	38,712,766	38,712,766
මුළු වත්කම්	16,536,209	111,706,459	898,035,859	14,361,925	38,712,766	1,079,353,218

දෙසැම්බර් 31 දිනට

	2012			
	වෙළඳාම සඳහා දරා සිටින රු.'000	ක්‍රමක්ෂය පිරිවැය රු.'000	වෙනත් රු.'000	එකතුව රු.'000
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	-	10,329,510	-	10,329,510
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	74,314	-	-	74,314
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	-	700,168,802	-	700,168,802
වෙනත් ණය ගැනීම්	-	245,140,679	-	245,140,679
නිකුත් කළ ණය සුරැකුම්පත්	-	24,481,798	-	24,481,798
යටත් කාලීන ණය	-	23,801,505	-	23,801,505
මුළු මූල්‍ය වගකීම්	74,314	1,003,922,294	-	1,003,996,608
මූල්‍ය නොවන වගකීම්				
ප්‍රවර්තන බදු වගකීම්	-	-	2,418,079	2,418,079
විලම්බිත බදු වගකීම්	-	-	1,699,612	1,699,612
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	-	-	166,087	166,087
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	-	-	571,068	571,068
වෙනත් වගකීම්	-	-	11,859,101	11,859,101
මුළු මූල්‍ය නොවන වගකීම්	-	-	16,713,947	16,713,947
මුළු වගකීම්	74,314	1,003,922,294	16,713,947	1,020,710,555

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
20 මුදල් හා කෙටි කාලීන අරමුදල්				
දේශීය මුදලින් රඳවාගෙන තිබූ කාසි හා නෝට්ටු	19,183,784	17,630,606	17,282,326	17,738,329
විදේශීය මුදලින් රඳවාගෙන තිබූ කාසි හා නෝට්ටු	1,146,014	1,114,086	1,169,975	1,115,256
වෙනත් බැංකු සමග ඇති ශේෂයන්	4,571,391	12,799,866	6,729,742	13,102,192
	24,901,189	31,544,558	25,182,043	31,955,777

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
21 මහ බැංකු සමඟ ඇති ශේෂයන්				
ශ්‍රී ලංකා මහ බැංකුව (සටහන 21.1)	24,681,664	27,011,531	24,681,664	27,011,531
රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්ඩියා (සටහන 21.2)	86,813	76,843	86,813	76,843
මාලදිවයින් මූල්‍ය අධිකාරිය (සටහන 21.3)	3,930,655	2,874,866	3,930,655	2,874,866
	28,699,132	29,963,240	28,699,132	29,963,240

21.1 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 93 ඡේදයේ ප්‍රතිපාදනයන්ට අනුව බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ මුදල් සංචිතයක් පවත්වා ගත යුතුයැයි නියම කෙරේ. 2013 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවත්වාගෙන යා යුතු අවම මුදල් සංචිතය ශ්‍රී ලංකා රුපියල් තැන්පතු වගකීම් වලින් 6% ක් විය (2012 - 8%). දේශීය ශාඛාවන්හි පවත්වා ගෙන යන විදේශ මුදල් තැන්පතු වගකීම් හා ශ්‍රී ලංකාවේ අක්වෙරළ අංශයෙහි පවත්වාගෙන යන තැන්පතු වගකීම් සඳහා බැංකුව විසින් මෙවැනි සංචිතයක් පවත්වා ගැනීම අවශ්‍ය නොවේ (2012 - නැත).

21.2 1934 රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්ඩියා (RBI) පනතේ අංක 42 (i) වගන්තිය ප්‍රකාරව චෙන්නායිහි පිහිටි ලංකා බැංකු ශාඛාව විසින් රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්ඩියා සමඟ 4% ක (2012: 6%) මුදල් සංචිතයක් පවත්වාගෙන යා යුතු අතර, 2013 දෙසැම්බර් 31 දිනට මුදල් සංචිත අවශ්‍යතාවය එහි ඉල්ලුම් සහ කාලීන තැන්පතු බැරකම් මත පදනම් වී තිබිණි.

21.3 මාලදිවයින් මූල්‍ය අධිකාරිය (MMA) විසින් පනවා ඇති රෙගුලාසි ප්‍රකාරව, මාලදිවයිනේ පිහිටි ලංකා බැංකු ශාඛාව විසින් වාණිජ තැන්පතු හා වගකීම් වලින් 25% ක තැන්පතු සංචිතයක් මාලදිවයින් රුෆියා වලින් සහ ඇමරිකානු ඩොලර් වලින් වෙන වෙනම පවත්වාගත යුතුය (2012 : 25%).

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2013	2012	2013	2012
	රු.'000	රු.'000	රු.'000	රු.'000
22 බැංකුවල ඇති තැන්පතු				
ශ්‍රී ලංකාවේ බැංකු				
- දේශීය මුදල්	3,896,923	-	4,158,310	485,586
- විදේශීය මුදල්	1,061,037	891,288	1,061,037	891,288
විදේශීය බැංකු				
- විදේශීය මුදල්	14,357,560	18,503,178	15,937,843	24,200,323
	19,315,520	19,394,466	21,157,190	25,577,197
23 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ				
ඉදිරි විනිමය හිවිසුම්	3,261,073	507,451	3,261,073	507,451
	3,261,073	507,451	3,261,073	507,451

දෙසැම්බර් 31 දිනට		බැංකුව		සමූහය	
		2013	2012	2013	2012
		රු. '000	රු. '000	රු. '000	රු. '000
24	**මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින**				
	භාණ්ඩාගාර බිල්පත්	7,372,137	4,965,858	7,372,137	4,965,858
	භාණ්ඩාගාර බැඳුම්කර	3,810,889	8,619,512	3,810,889	8,619,512
	ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කර	129,949	-	129,949	-
	අනෙකුත් ණය සුරැකුම්පත්	-	-	-	74,780
	මිල ප්‍රකාශිත ස්කන්ධයන් (සටහන 24.1)	2,226,816	1,955,815	2,583,212	2,368,589
	ඒකක භාර (සටහන 24.2)	-	-	2,055	19
		13,539,791	15,541,185	13,898,242	16,028,758

වෙළඳාම සඳහා දරා සිටින භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස බැංකුව 2013 දෙසැම්බර් 31 දිනට ඔඩපණය කර නොමැත. (2012 : රු.මිලියන 1,935.0)

දෙසැම්බර් 31 දිනට		බැංකුව					
		2013			2012		
		සාමාන්‍ය කොටස් ගණන	කොටසක වෙළඳපළ අගය රු.	වෙළඳපළ වටිනාකම රු. '000	සාමාන්‍ය කොටස් ගණන	කොටසක වෙළඳපළ අගය රු.	වෙළඳපළ වටිනාකම රු. '000
24.1	**මිල ප්‍රකාශිත ස්කන්ධයන්**						
	බැංකු, මූල්‍ය කටයුතු සහ රක්ෂණ						
	විලව් ෆයිනෑන්ස් පී එල් සී	828,189	12.40	10,270	784,085	14.40	11,291
	හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී	84,425	147.00	12,410	84,425	148.00	12,495
	සොෆ්ට්ලොජික් ෆයිනෑන්ස් පී එල් සී	102,201	25.30	2,586	102,201	24.90	2,545
				25,266			26,331
	ආහාරපාන හා දුම්කොළ						
	බයිරහා ෆාර්මිස් පී එල් සී	34,900	128.80	4,495	34,900	157.30	5,490
	කාගිල්ස් (සිලෝන්) පී එල් සී	809,600	147.00	119,011	809,600	145.50	117,797
	ඩිස්ටිලරීස් කම්පනි ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී	249,602	193.00	48,173	306,900	166.00	50,945
	එච් වී ඒ ෆුඩ්ස් පී එල් සී	20,000	9.90	198	20,000	13.40	268
	ලංකා මිල්ක් ෆුඩ්ස් (සී ඩබ් ඊ) පී එල් සී	775,151	105.30	81,623	716,600	100.00	71,660
	රේනුක ෂෝ වොලස් පී එල් සී	580,146	16.50	9,572	-	-	-
				263,072			246,160
	රසායනික ද්‍රව්‍ය හා ඖෂධ						
	කෙමෙනෙක්ස් පී එල් සී	100,000	85.00	8,500	100,000	75.00	7,500
	සී අයි සී හෝල්ඩින්ස් පී එල් සී - ජන්ද හිමි	650,100	47.90	31,140	600,100	64.30	38,586
	සී අයි සී හෝල්ඩින්ස් පී එල් සී - ජන්ද අහිමි	141,400	34.50	4,878	141,400	55.20	7,805
	හේකාර්බ් පී එල් සී	251,067	189.80	47,653	176,100	171.10	30,131
	ලංකෙම් සිලෝන් පී එල් සී	72,400	122.10	8,840	51,900	165.00	8,563
				101,011			92,585

දෙසැම්බර් 31 දිනට	බැංකුව					
	2013			2012		
	සාමාන්‍ය කොටස් ගණන	කොටසක වෙළඳපළ අගය රු.	වෙළඳපළ වටිනාකම රු. '000	සාමාන්‍ය කොටස් ගණන	කොටසක වෙළඳපළ අගය රු.	වෙළඳපළ වටිනාකම රු. '000
ඉදිකිරීම් හා ඉංජිනේරු						
ඇක්සස් ඉංජිනියරින් පී එල් සී	1,467,036	22.10	32,421	-	-	-
කලම්බු ඩොක්යාඩ් පී එල් සී	413,700	189.60	78,438	413,700	224.00	92,669
එම් ටී ඩී වෝර්කර්ස් පී එල් සී	815,205	32.00	26,087	537,600	26.60	14,300
			136,946			106,969
විවිධාංගීකරණය වූ සමාගම්						
එයිටිකන් ස්පෙන්ස් පී එල් සී	1,522,400	102.30	155,742	1,522,400	120.00	182,688
බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී	3,073,412	2.30	7,069	2,648,134	3.90	10,328
කාර්සන්ස් කම්බර්බැච් පී එල් සී	167,623	350.00	58,668	49,500	438.60	21,711
සී ටී හෝල්ඩින්ස් පී එල් සී	323,495	140.10	45,322	174,927	124.00	21,691
එක්ස්පෝ ලංකා හොල්ඩින්ස් පී එල් සී	857,820	7.50	6,434	-	-	-
එෆ් එල් සී හෝල්ඩින්ස් පී එල් සී	200,000	2.20	440	200,000	2.40	480
හේලීස් පී එල් සී	99,184	293.00	29,061	-	-	-
හේමාස් හෝල්ඩින්ස් පී එල් සී	484,800	34.00	16,483	229,600	27.00	6,199
ජෝන් කීල්ස් හෝල්ඩින්ස් පී එල් සී	149,997	227.30	34,094	65,100	219.90	14,315
රිචඩ් පීරිස් ඇන්ඩ් කම්පැනි පී එල් සී	4,832,300	6.30	30,443	4,832,300	7.80	37,692
සොෆ්ට්ලොජික් හොල්ඩින්ස් පී එල් සී	595,300	8.40	5,001	545,300	10.90	5,944
සන්ෂයින් හොල්ඩින්ස් පී එල් සී	626,800	28.00	17,550	626,800	28.00	17,550
ද කලම්බු ෆෝට් ලෑන්ඩ් ඇන්ඩ් බිල්ඩින් පී එල් සී	149,500	28.20	4,216	149,500	34.60	5,173
වැලිබල් වන් පී එල් සී	1,265,400	16.50	20,879	1,265,400	18.10	22,904
			431,402			346,675
පාවහන් සහ රෙදිපිළි						
ඔඩෙල් පී එල් සී	197,400	21.00	4,145	197,400	20.10	3,968
			4,145			3,968
සෞඛ්‍ය ආරක්ෂණ						
ආසිරි සර්පිකල් හොස්පිටල් පී එල් සී	233,046	10.30	2,400	179,200	9.30	1,667
නවලෝක හොස්පිටල්ස් පී එල් සී	130,700	3.00	392	130,700	3.00	392
ද ලංකා හොස්පිටල් කෝපරේෂන් පී එල් සී	2,500	40.50	101	2,500	39.20	98
			2,893			2,157

24 මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින (සම්බන්ධයි)

24.1 මිල ප්‍රකාශිත ස්කන්ධයන් (සම්බන්ධයි)

	බැංකුව					
දෙසැම්බර් 31 දිනට	2013			2012		
	සාමාන්‍ය කොටස් ගණන	කොටසක වෙළඳපළ අගය රු.	වෙළඳපළ වටිනාකම රු. '000	සාමාන්‍ය කොටස් ගණන	කොටසක වෙළඳපළ අගය රු.	වෙළඳපළ වටිනාකම රු. '000
හෝටල් සහ සංචාරක						
එයිටිකන් ස්පෙන්ස් හොටෙල් හෝල්ඩින්ස් පී එල් සී	1,625,600	69.90	113,629	1,625,600	73.10	118,831
අමායා ලෙෂර් පී එල් සී	102,000	74.00	7,548	102,000	84.00	8,568
ඒෂියන් හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපර්ටීස් පී එල් සී	2,232,400	64.20	143,320	2,232,400	75.90	169,439
සිටිරස් ලෙෂර් පී එල් සී	100,000	14.60	1,460	100,000	26.00	2,600
ඊඩින් හොටෙල් ලංකා පී එල් සී	609,600	29.00	17,678	609,600	36.00	21,946
මාරවිල රිසොට්ස් පී එල් සී	50,000	5.30	265	50,000	7.30	365
ටාජ් ලංකා හොටෙල්ස් පී එල් සී	447,400	27.80	12,438	447,400	30.00	13,422
ටැන්ජරීන් බීච් හොටෙල්ස් පී එල් සී	50,000	68.00	3,400	50,000	80.40	4,020
ද ෆෝට්ට්‍රස් රිසෝට්ර්ස් පී එල් සී	1,461,100	13.40	19,579	1,461,100	16.30	23,816
ද කිංස්බර් පී එල් සී	153,184	13.20	2,022	-	-	-
ද ලයිට්හවුස් හොටෙල් පී එල් සී	100,000	44.00	4,400	100,000	53.10	5,310
ට්‍රාන්ස් ඒෂියා හොටෙල්ස් පී එල් සී	477,200	79.90	38,128	477,200	74.00	35,313
			363,867			403,630
ආයෝජන භාර						
සිලෝන් ගාර්ඩියන් ඉන්වෙස්ට්මන්ට් ට්‍රස්ට් පී එල් සී	66,700	181.90	12,133	66,700	184.00	12,273
සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පී එල් සී	442,000	77.00	34,034	442,000	84.50	37,349
එන්වයර්මන්ටල් රිසෝර්සස් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී	-	-	-	385,000	14.90	5,736
ලංකා සෙන්චරි ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී	385,000	14.10	5,429	-	-	-
රේණුක හෝල්ඩින්ස් පී එල් සී	176,723	30.60	5,408	76,723	36.10	2,770
			57,004			58,128
ඉඩම් සහ දේපළ						
සී ටී ලෑන්ඩ් ඩිවලොප්මන් පී එල් සී	1,025,674	30.90	31,693	-	-	-
ඊස්ට් වෙස්ට් ප්‍රොපර්ටීස් පී එල් සී	307,216	11.50	3,533	150,000	14.60	2,190
ඕවර්සීස් රියල්ටි (සිලෝන්) පී එල් සී	300,000	18.30	5,490	300,000	14.40	4,320
			40,716			6,510

දෙසැම්බර් 31 දිනට	බැංකුව					
	2013			2012		
	සාමාන්‍ය කොටස් ගණන	කොටසක වෙළඳපළ අගය රු.	වෙළඳපළ වටිනාකම රු. '000	සාමාන්‍ය කොටස් ගණන	කොටසක වෙළඳපළ අගය රු.	වෙළඳපළ වටිනාකම රු. '000
නිෂ්පාදන						
අබාන්ස් ඉලෙක්ට්‍රිකල්ස් පී එල් සී	17,880	105.10	1,879	14,900	97.10	1,447
ඒ සී එල් කේබල්ස් පී එල් සී	201,419	64.90	13,072	15,000	67.40	1,011
ඒ සී එම් ඊ ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් පී එල් සී	1,078,700	9.70	10,463	1,078,700	15.00	16,180
සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් පී එල් සී	71,800	35.50	2,549	71,800	59.50	4,272
මුදල් හා කෙටිකාලීන අරමුදල්	25,182,043	25,182,043	31,955,777	31,955,777
මහ බැංකු සමඟ ඇති ශේෂ	28,699,132	28,699,132	29,963,240	29,963,240
බැංකු වල ඇති තැන්පතු	21,157,190	21,157,190	25,577,197	25,577,197
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	3,261,073	3,261,073	507,451	507,451
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	22,851,895	22,851,895	1,423,796	1,423,796
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	13,898,242	13,898,242	16,028,758	16,028,758
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	130,190,296	130,149,465	99,182,351	99,179,323
ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	746,571,819	746,571,819	709,933,498	709,933,498
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	12,852,445	12,852,445	14,361,925	14,361,925
මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින	157,441,572	167,579,630	111,706,459	112,158,837
මුළු මූල්‍ය වත්කම්	1,162,105,707	1,172,202,934	1,040,640,452	1,041,089,802
මූල්‍ය වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	1,336,267	1,336,267	10,329,510	10,329,510
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	274,948	274,948	74,314	74,314
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	850,767,521	850,767,521	700,168,802	700,168,802
වෙනත් ණය ගැනීම්	240,802,111	239,252,474	245,140,679	250,506,695
නිකුත් කළ ණය සුරැකුම්පත්	24,986,818	24,986,818	24,481,798	24,481,798
යටත් කාලීන ණය	24,347,248	24,293,515	23,801,505	23,558,084
මුළු මූල්‍ය වගකීම්	1,142,514,913	1,140,911,543	1,003,996,608	1,009,119,203

58 අවදානම් කළමනාකරණය

58.1 හැඳින්වීම

58.1.1 දළ විශ්ලේෂණය

ණය අවදානම, වෙළඳපල අවදානම, ද්‍රවශීලතා අවදානම හා මෙහෙයුම් අවදානම බැංකුව විසින් මුහුණපානු ලබන ප්‍රධානතම අවදානම් වර්ග වේ. බැංකුව උක්ත අවදානම් කෙරෙහි අනාවරණය වීම පිළිබඳව මෙම සටහනෙහි දක්වා ඇත.

58.1.2 **සමූහ අවදානම් කළමණාකරණය**

ලංකා බැංකු සමූහය පරිපාලිත සමාගම් 12 කින් හා ආශ්‍රිත සමාගම් පහකින් සමන්විත වේ. ඒවායේ මූලික ව්‍යාපාරික කටයුතු විවිධ ව්‍යාපාර අංශ වලට පැතිරී ඇත. ඒවායේ ආදායම්, වියදම්, මුළු වත්කම් සහ වගකීම් සමූහයේ ආදායම්, වියදම්, මුළු වත්කම් හා වගකීම් වලින් 3% කට වඩා අඩුය. එම නිසා පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල කටයුතු අවදානම් කළමණාකරණයට සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

කෙසේ වෙතත් බැංකුව කාර්තු පදනම මත සිය සමූහ ව්‍යාපාර කටයුතු පුළුල් වශයෙන් විමර්ෂනය කිරීම මඟින් උපාය මාර්ගික අවදානම කළමණාකරණය කෙරේ. බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල අධ්‍යක්ෂක මණ්ඩලය නියෝජනය කරන අතර එම නිලධාරීන් අවදානම් හා විගනක කමිටු හා සම්බන්ධව කටයුතු කරයි. එම නිසා බැංකුව පරිපාලිත සමාගම් වල අවදානම් හා විගණන කටයුතු හා සමීපව සම්බන්ධ වෙයි. විශේෂ තත්ව වලදී ලංකා බැංකුවේ අභ්‍යන්තර විගණක විසින් පරිපාලිතයන්ගේ විගණනයන් සිදු කරයි. බැංකුව විසින් අවදානම් ප්‍රත්‍යෂන පුවරු හරහා පරිපාලිතයන්ගේ වාර්තා කිරීමේ ක්‍රියා පිළිවෙල ගොඩනගා ක්‍රියාත්මක කර ඇත. අවදානම් ප්‍රත්‍යෂන පුවරු වලට අදාල පරිපාලිතයන්ගේ සියළු ප්‍රධාන අවදානම් සංඥා ඇතුලත් වේ. බැංකුව පරිපාලිත සමාගම් වල අදාල නිලධාරීන් සමඟ එක්ව ප්‍රමාණවත් අවදානම් අධීක්ෂණ කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම ආරම්භ කර ඇත.

58.1.3 අවදානම් කළමනාකරණ රාමුව

සමස්ථ අවදානම් කළමනාකරණ රාමුවෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳව සහතිකයක් දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහයේ පෙරමුණ ගනී. බැංකුවෙහි අවදානම් අභිරුචිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කරනු ලබන අතර අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් මඟින් උපාය මාර්ගික දිශාව ස්ථාපනය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සෘජුවම වාර්තා කරනු ලබන ප්‍රධාන අවදානම් නිලධාරිවරයා යටතේ බැංකුවෙහි ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය ස්ථාපිත කර ඇත. බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරිතුමා, ණය කමිටුව, වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව, මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව, තොරතුරු තාක්ෂණික කමිටුව සහ අක්‍රීය ණය අත්තිකාරම් අධීක්ෂණ කමිටුව ආදී විවිධ අවදානම් කළමනාකරණය සඳහා හේතුවන විධායක මට්ටමේ කමිටු රාශියක සාමාජිකත්වය දරයි.

58.1.4 අවදානම් මාපනය සහ වාර්තාකරණ පද්ධතිය

සංඛ්‍යාන ආකෘතීන් මඟින් නිර්ණය කරන්නා වූ සාමාන්‍ය අවස්ථාවන් යටතේ සිදුවිය හැකි අපේක්ෂිත අලාභයන් සහ අනපේක්ෂිත අලාභයන් ආශ්‍රිතව බැංකුවේ සත්‍ය අලාභය මාපනය කරනු ලැබේ. මෙම ආකෘතීන් අතීත අත්දැකීම් මඟින් ගොඩනගා ගත් සම්භාවිතාවයන් ආර්ථික පරිසරයට ගැලපෙන පරිදි ගලපා යොදා ගනී. සාමාන්‍යයෙන් සිදුවිය නොහැකි අන්දමේ සිදුවීම් සිදුවුවහොත් ඇතිවිය හැකි නරකම තත්ත්වය පිළිබඳ ඇගයීමක් බැංකුව විසින් සිදුකරනු ලැබේ.

බැංකුව විසින් පිහිටුවා ගත් සීමාවන් පදනම්ව අවදානම් අධීක්ෂණය හා පාලනය සිදුකෙරේ. බැංකුවේ ක්‍රමෝපායන් හා මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙහෙයුම් ව්‍යාපාරික පරිසරය සහ අවදානම් ගන්නා කාර්යයේ ස්වරූපය අනුව ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය මඟින් ලබාදුන් යෙදවුම් පදනම්ව බැංකුවේ අවදානම් අභිරුචිය හා සීමාවන් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අනුමත කර ඇත. අවදානම් අභිරුචිය මඟින් සීමා නිර්ණය කිරීමේ ක්‍රියාවලියේදී බැංකුව ණය, වෙළෙඳපොල හා මෙහෙයුම් දරාගත හැකි සීමාවන් වලට අවදානම් ගැනීමේ ක්‍රියාවන් සීමා කෙරේ.

මීට අමතරව බැංකුවේ අවදානම් පැතිකඩට අදාලව ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව ඇගයීමේ අභ්‍යන්තර ක්‍රියාවලියක් සහ ප්‍රාග්ධන මට්ටම් පවත්වාගෙන යාමේ ක්‍රමෝපායන් බැංකුව සතුව ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලනය සහ අවදානම් හා ප්‍රාග්ධන සැලසුම් කිරීමේ කටයුතු සඳහා ආකෘතිය අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා නිර්ණය කිරීමේ ක්‍රියාවලිය (ICAAP) මඟින් තීරණය කෙරේ.

සියළු ව්‍යාපාරික අවදානම් සඳහා සහය වීමට ප්‍රමාණාත්මක ප්‍රාග්ධනයක් හා ව්‍යාපාරික පැතිකඩ පදනම්ව ප්‍රමාණාත්මක ප්‍රාග්ධන අතිරික්තයක් බැංකුව සතුව ඇති බව තහවුරු කිරීමක් මෙම ක්‍රියාවලිය මඟින් සැපයේ. බැංකුවේ අවදානම් තක්සේරුව හා කළමනාකරණය සඳහා අවශ්‍ය සියළු තොරතුරු ඇතුලත් වාර්තාවක් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරයි.

58.1.5 අවදානම් අවමකරණය

සමස්ත අවදානම් කළමනාකරණයේ කොටසක් වශයෙන් බැංකුව අවදානම අවම කිරීමේ ශිල්පක්‍රම හා ක්‍රමෝපායන් අවදානම අඩු කිරීමට යොදා ගනී. ණය අවදානම් අවම කිරීම සඳහා යාවත්කාලීන ඇගයීමක් ණය අවදානම් කළමනාකරණයේදී බැංකුව විසින් සිදු කරයි. තවදුරටත් පාඩු අවම කිරීම සඳහා සුරැකුම්ද යොදා ගනී. වෙළෙඳපල අවදානම් අඩුකර ගැනීමට ව්‍යුත්පන්න උපකරණ ද සීමිත අවස්ථාවලදී යොදා ගැනේ. මෙහෙයුම් අවදානම කළමනාකරණය සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවතින අතර අවශ්‍ය අවස්ථාවල අවදානම පැවරීමේ ශිල්පක්‍රමයක් ලෙස රක්ෂණය යොදා ගැනේ.

58.2 ණය අවදානම

අධ්‍යක්ෂක මණ්ඩලය මගින් අනුමත ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ණය ප්‍රදානය කිරීමේ උපදෙස් මාලාවන් මත ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පදනම් වේ. එම උපදෙස් මාලාවෙහි ණය ගනුදෙනු මට්ටම්වලදී හා ණය කළඹ මට්ටම්වලදී ණය ප්‍රදානය, පවත්වාගෙන යාම, අධීක්ෂණය හා ණය කළමනාකරණය සම්බන්ධ කොන්දේසි සහ මඟ පෙන්වීම ඇතුලත්ව ඇත.

58.2.1 ණය අවදානම සඳහා උපරිම නිරාවරණය

ඇප සුරැකුම් සහ වෙනත් ණය වර්ධනය කිරීම්

බැංකුව විසින් ණය අවදානම අවම කිරීම වෙනුවෙන් සිය ණයනුදෙනු කරුවන්ගෙන් ඇප සුරැකුම් ලබාගනී. ණය අවදානම් ඇඟයීම මත ණය සඳහා අවශ්‍ය සුරැකුම් වර්ගය හා වටිනාකම තීරණය කෙරේ. සෑම වර්ගයකම සුරැකුම් බාරගැනීම හා අගය කිරීම සම්බන්ධව මඟ පෙන්වීම් ඉදිරිපත් කර ඇත. බැංකුව විසින් ලබා ගන්නා ප්‍රධාන සුරැකුම් වර්ග පහත පරිදි වේ.

- සුරැකුම් ණයදීම් හා ප්‍රති විකුණුම් ගනුදෙනු සඳහා මුදල් හෝ සුරැකුම්
- වාණිජ ණය සඳහා නිශ්චල දේපල, තොග සහ වෙළෙඳ ලැබීම්
- සිල්ලර ණය සඳහා දේපල උකස් ගැනීම්

පරිපාලිත සමාගම් වලට බැංකුව ලබාදෙන ණය සඳහා සමහර අවස්ථාවල ඒවායේ මව් සමාගම්වලින් ඇපයන් ලබාගනී. බැංකුව ඇප සුරැකුම් වල වෙළෙඳපල වටිනාකම අධීක්ෂණය කරන අතර අවශ්‍ය නම් ගිවිසුම අනුව අමතර ඇප සුරැකුම් ඉල්ලා සිටියි. බැංකුවේ ප්‍රතිපත්තිය වනුයේ අත්පත්කර ගත් දේපල, ක්‍රමානුකූල ආකාරයට විකිණීමයි. දේපල විකිණීමෙන් ලැබෙන මුදල ලැබිය යුතු ණය පියවා ගැනීමට යොදාගනී. සාමාන්‍යයෙන් බැංකුව අත්පත් කරගත් දේපල ව්‍යාපාර කටයුතු වලට යොදා නොගනී.

ණය අවදානම් සඳහා උපරිම නිරාවරණය, ඇප සුරැකුම්වල සාධාරණ අගය, අතිරික්ත ඇප සුරැකුම් වටිනාකම සහ ණය අවදානම් සඳහා ශුද්ධ නිරාවරණය පහත වගුව මඟින් පෙන්නුම් කෙරේ.

58 අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

58.2.1ණය අවදානම සඳහා උපරිම නිරාවරණය (සම්බන්ධයි)

2013 දෙසැම්බර් 31		ඇප සුරැකුම් වල		
මූල්‍ය වත්කම්	ණය අවදානම සඳහා උපරිම නිරාවරණය රු. '000	මුදල් රු. '000	රත්‍රං රු. '000	ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් / ඇපකර රු. '000
මුදල් හා කෙටි කාලීන අරමුදල්	24,901,189	20,371,373	-	-
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	28,699,132	28,699,132	-	-
බැංකු වල ඇති තැන්පතු	19,315,520	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	3,261,073	-	-	-
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	22,319,717	-	-	22,319,717
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	13,539,791	-	-	11,312,975
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	129,108,613	-	-	127,226,070
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	755,385,146	45,037,932	176,422,361	205,389,764
අඩු කළා: හානිකරණය	(30,053,180)			
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	10,325,214	-		1,660,970
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	156,899,761	-	-	112,107,661
එකතුව	**1,133,701,976**	**94,108,437**	**176,422,361**	**480,017,157**

2012 දෙසැම්බර් 31		ඇප සුරැකුම් වල		
මූල්‍ය වත්කම්	ණය අවදානම සඳහා උපරිම නිරාවරණය රු. '000	මුදල් රු. '000	රත්‍රං රු. '000	ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් / ඇපකර රු. '000
මුදල් හා කෙටි කාලීන අරමුදල්	31,544,558	18,744,692	-	-
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	29,963,240	29,963,240	-	-
බැංකු වල ඇති තැන්පතු	19,394,466	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	507,451	-	-	-
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	797,425	-	-	797,425
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	15,541,185	-	-	13,585,370
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	99,206,859	-	-	97,481,993
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	714,846,716	47,927,336	174,682,947	190,345,559
අඩු කළා: හානිකරණය	(22,947,509)			
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	12,080,988	-	-	4,001,763
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	110,956,202	-	-	69,559,002
එකතුව	**1,011,891,581**	**96,635,268**	**174,682,947**	**375,771,112**

සාධාරණ අගය					
චංචල දේපල රු. '000	නිශ්චල දේපල රු. '000	වෙනත් රු. '000	අතිරික්ත ඇප රු. '000	ශුද්ධ ඇප රු. '000	ශුද්ධ නිරාවරණය රු. '000
-	-	-	-	20,371,373	4,529,816
-	-	-	-	28,699,132	-
-	-	-	-	-	19,315,520
-	-	-	-	-	3,261,073
-	-	-	-	22,319,717	-
-	-	-	-	11,312,975	2,226,816
-	-	-	-	127,226,070	1,882,543
57,976,312	132,462,987	33,584,099	(108,333,627)	542,539,828	212,845,318
					(30,053,180)
-	-	-	-	1,660,970	8,664,244
-	-	-	-	112,107,661	44,792,100
57,976,312	**132,462,987**	**33,584,099**	**(108,333,627)**	**866,237,726**	**267,464,250**

සාධාරණ අගය					
චංචල දේපල රු. '000	නිශ්චල දේපල රු. '000	වෙනත් රු. '000	අතිරික්ත ඇප රු. '000	ශුද්ධ ඇප රු. '000	ශුද්ධ නිරාවරණය රු. '000
-	-	-	-	18,744,692	12,799,866
-	-	-	-	29,963,240	-
-	-	-	-	-	19,394,466
-	-	-	-	-	507,451
-	-	-	-	797,425	-
-	-	-	-	13,585,370	1,955,815
-	-	-	-	97,481,993	1,724,866
45,177,807	108,098,718	28,984,694	(91,046,157)	504,170,904	210,675,812
					(22,947,509)
-	-	-	-	4,001,763	8,079,225
-	-	-	-	69,559,002	41,397,200
45,177,807	**108,098,718**	**28,984,694**	**(91,046,157)**	**738,304,389**	**273,587,192**

58 අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

58.2 ණය අවදානම (සම්බන්ධයි)

58.2.2 මූල්‍ය වත්කම් බාණ්ඩය අනුව ණය ගුණාත්මකභාවය

ණය ලකුණු කිරීම අකෘතියක් හා ආයතනික ණය ලබාගන්නන් ශ්‍රේණිගතකරන ක්‍රියාවලියක් ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමණාකරණ අංශය විසින් නිර්මාණය කර ඇත. ණය ලබාගන්නන් ශ්‍රේණිගතකරන ක්‍රියාවලිය යටතේ ණය ගුණාත්මකභාවය අනුව සියලු ක්‍රමවත් ආයතනික ණය බාණ්ඩ නවයකට බෙදනු ලැබේ. පාරිභෝගික ණය අයදුම් ඇගයීම් පාලනය සඳහා බැංකුව විසින් ණය ලකුණු කිරීමේ ආකෘතියක් නිර්මාණය කර ඇත.

අක්‍රමවත් ණය බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ අනුව වර්ගීකරණය කෙරේ. සෑම වාර්තා කරන දිනයකදීම විෂයබද්ධ සාක්ෂි ඇගයීමක් සිදුකර මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් බාණ්ඩයක් හානිකරණයක් සිදුවී ඇත්දැයි පරීක්ෂා කෙරේ. අලාභයක් ඇතිවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි ඇති විට මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් බාණ්ඩයක් හානිකරණයක් සිදු වී ඇත.

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍යමය වත්කම්හි හානිකරණ අලාභයන් ඒවායේ ධාරණ අගයේත්, සුචල පොළී අනුපාතිකයත් ඇසුරෙන් වට්ටම් කරන ලද ප්‍රක්ෂේපිත අනාගත මුදල් ප්‍රවාහයන්හි අගයේත් අතර වෙනස ලෙස සැලකේ. හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශය යටතේ වාර්ථාකරන අතර ණය හා අත්තිකාරම් සඳහා හානිකරණය ලෙසද පෙන්නුම් කෙරේ. ණය සහ අත්තිකාරම් හානිකරණ අලාභය පිළිබඳ සවිස්තර සටහන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 යටතේ දක්වා ඇත.

ඇතැම් ණය සහ අත්තිකාරම්ද, මූල්‍ය ආයෝජනයන්ද නැවත අයකරගත නොහැකි යැයි නිශ්චය කරගත් විට බැංකුව විසින් ඒවා කපා හරිනු ලැබේ.

බැංකුවේ අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයන්ට හා මූල්‍ය වත්කම් වලට ආවේණික අවදානම් පදනම්කර ගෙන, ණය අවදානමකට විවෘත වූ සියලු මූල්‍ය වත්කම් වල ණය ගුණත්වය පහත වගුව මඟින් නිරූපණය කරයි. ශ්‍රී ලංකා රජයට ලබාදුන් අත්තිකාරම් හා අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් AAA, AA හෝ A සහිත ආයතනික ණය ගැනුම්කරුවන්ට ලබාදුන් ණය හා අත්තිකාරම් ඉහළ ශ්‍රේණියට අන්තර්ගත වේ. සම්මත ශ්‍රේණිය අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් BBB, BB හෝ B සහිත ආයතනික ණය ගැණුම්කරුවන් අයත්වේ. ආශ්‍රිත සම්මත ශ්‍රේණිය අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම් CCC, CC හෝ C සහිත ආයතනික ණය ගැනුම්කරුවන්ගෙන් සමන්විත වේ.

ආශ්‍රිත සම්මත ශ්‍රේණියේ 90% පමණ භාණ්ඩාගාර ඇපකර යටතේ රජය සතු ව්‍යාවසකයන්ට ලබා දුන් ණය ඇතුලත් වේ. ණය ශ්‍රේණිගත කිරීම් නොමැති ණය සඳහා විවෘත වීම් වලට සිල්ලර අත්තිකාරම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකත්ව ණය සහ මධ්‍ය වෙළඳපල ණය අයත් වේ.

මූල්‍ය වත්කම් බාණ්ඩය අනුව ණය ගුණාත්මකභාවය	2013 දෙසැම්බර් 31 දිනට						
	හානිකරණය වීමක් හෝ කල් පසුවීමක් සිදුනොවූ				කල්පසුවීමක් සිදු වූ නමුත් කේවල හානිකරණයක් සිදුනොවූ	කේවල හානිකරණය වූ	එකතුව
	ඉහල ශ්‍රේණිය	සම්මත ශ්‍රේණිය	ආශ්‍රිත සම්මත ශ්‍රේණිය	බාණ්ඩ නොබෙදූ / ශ්‍රේණියක් නොමැති			
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් හා කෙටි කාලීන අරමුදල්	24,901,189	-	-	-	-	-	24,901,189
මහ බැංකු සමඟ ශේෂයන්	28,699,132	-	-	-	-	-	28,699,132
බැංකුවල ඇති තැන්පතු	14,357,560	-	-	4,957,960	-	-	19,315,520
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	3,261,073	-	-	-	-	-	3,261,073
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	22,319,717	-	-	-	-	-	22,319,717
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	11,312,975	-	-	2,226,816	-	-	13,539,791
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	127,226,070	-	-	1,882,543	-	-	129,108,613
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	140,091,047	35,210,823	147,334,945	298,375,117	119,440,120	14,933,094	755,385,146
අඩු කළා: හානිකරණය	-	-	-	-	-	-	(30,053,180)
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	1,660,970	-	-	7,201,794	-	1,462,450	10,325,214
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	156,899,761	-		-	-	-	156,899,761
එකතුව	**530,729,494**	**35,210,823**	**147,334,945**	**314,644,230**	**119,440,120**	**16,395,544**	**1,133,701,976**

කල්පසුවීමක් සිදු වූ නමුත් කේවල හානිකරණය සිදුනොවූ ණය වල ආයු විශ්ලේෂණය	කල්පසුවීමක් සිදු වූ නමුත් කේවල හානිකරණය සිදුනොවූ					
	දින 30 ට අඩු	දින 31 සිට 60 දක්වා	දින 61 සිට 90 දක්වා	දින 91 සිට 180 දක්වා	දින 181 සහ ඊට වැඩි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	61,467,451	22,062,143	5,933,429	5,296,425*	24,680,672*	119,440,120

*රත්‍රං වලින් සුරැකුම් කරන ලද උකස් අත්තිකාරම් රු. මිලියන 11,860.4 මෙහි අන්තර්ගත වේ.

සටහන : කල්පසු වීමක් සිදු වූ නමුත් කේවල හානිකරණය සිදු නොවූ ණය වල ආයු විශ්ලේෂණයට එක් දිනක හෝ ඊට වැඩි දින ගණනක් හිඟ මුදල් සහිත පහසුකම් අන්තර්ගත වේ.

58 අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

58.2 ණය අවදානම (සම්බන්ධයි)

58.2.2 **මූල්‍ය වත්කම් බාණ්ඩය අනුව ණය ගුණාත්මකභාවය (සම්බන්ධයි)**

මූල්‍ය වත්කම් බාණ්ඩය අනුව ණය ගුණාත්මකභාවය	2012 දෙසැම්බර් 31 දිනට						
	හානිකරණය වීමක් හෝ කල් පසුවීමක් සිදුනොවූ				කල්පසුවීමක් සිදු වූ නමුත් කේවල හානිකරණයක් සිදුනොවූ	කේවල හානිකරණය වූ	එකතුව
	ඉහල ශ්‍රේණිය	සම්මත ශ්‍රේණිය	ආශ්‍රිත සම්මත ශ්‍රේණිය	බාණ්ඩ නොබෙදූ / ශ්‍රේණියක් නොමැති			
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් හා කෙටි කාලීන අරමුදල්	31,544,558	-	-	-	-	-	31,544,558
මහ බැංකු සමඟ ශේෂයන්	29,963,240	-	-	-	-	-	29,963,240
බැංකු වල ඇති තැන්පතු	19,394,466	-	-	-	-	-	19,394,466
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	507,451	-	-	-	-	-	507,451
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	797,425	-	-	-	-	-	797,425
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	13,585,370	-	-	1,955,815	-	-	15,541,185
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	97,481,993	-	-	1,724,866	-	-	99,206,859
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	121,065,508	42,159,685	146,521,673	290,177,695	102,585,987	12,336,168	714,846,716
අඩු කළා: හානිකරණය	-	-	-	-	-	-	(22,947,509)
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	4,001,763	-	-	6,616,775	-	1,462,450	12,080,988
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	110,956,202	-		-	-	-	110,956,202
එකතුව	**429,297,976**	**42,159,685**	**146,521,673**	**300,475,151**	**102,585,987**	**13,798,618**	**1,011,891,581**

කල්පසුවීමක් සිදු වූ නමුත් කේවල හානිකරණය සිදුනොවූ ණය වල ආයු විශ්ලේෂණය	කල්පසුවීමක් සිදු වූ නමුත් කේවල හානිකරණය සිදුනොවූ					
	දින 30 අඩු	දින 31 සිට 60 දක්වා	දින 61 සිට 90 දක්වා	දින 91 සිට 180 දක්වා	දින 181 සහ ඊට වැඩි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	64,171,351	19,445,778	5,004,524	2,853,123	11,111,211	102,585,987

සටහන : කල්පසු වීමක් සිදු වූ නමුත් කේවල හානිකරණය සිදු නොවූ ණය වල ආයු විශ්ලේෂණයට එක් දිනක හෝ ඊට වැඩි දින ගණනක් හිඟ මුදල් සහිත පහසුකම් අන්තර්ගත වේ.

58.2.3 අවදානම් සංකේන්ද්‍රණය පිළිබඳ විශ්ලේෂණය

තනි පුද්ගලයෙකුට, කණ්ඩායමකට, කර්මාන්ත ක්ෂේත්‍රයන්ට හා භූගෝලීය කලාපයන්ට සංකේන්ද්‍රණය වීමේ අවදානම ණය කළඹ මට්ටමේදී ණය අවදානම යටතට ඇතුලත් වේ.

රටවල් අනුව නිරාවරණය

එක්සත් රාජධානියෙහි පවත්වාගෙන යන පරිපාලිතය සහ ඉන්දියාවෙහි හා මාලදිවයිනෙහි පවත්වාගෙන යන ශාඛාවන් 2 බැංකුව විසින් ශ්‍රී ලංකාවට පරිභාහිරව පවත්වාගෙන යන නිරාවරණය වීම් වලට ප්‍රධාන ලෙස හේතු වී ඇත. ඉන්දියාවේ හා මාලදිවයිනෙහි ශාඛාවන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලත් පූර්ව - නිමග්නිත සීමාවන් (ණය ප්‍රමාණ සීමාවන් සහ රටවල් සඳහා වන සීමාවන්) ඇසුරෙන් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර ඉහළ බල අධිකාරී මට්ටම් කොළඹ ප්‍රධාන කාර්යාලය සතුව පවතින ලෙස විමධ්‍යගත බල අධිකාරීන් ඔස්සේ ණය කළමනාකරණය කරනු ලැබේ.

එක්සත් රාජධානියෙහි මූල්‍ය සේවා අධිකාරියේ නියාමනය යටතේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන බැංකුවට සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිතය සතු සියලු වත්කම් එක්සත් රාජධානිය කෙරෙහි දක්වන නිරාවණයවීමට අන්තර්ගත වන අතර එහි ණය තීරණයන් පිළිබඳ පාලනයන් කොළඹ ප්‍රධාන කාර්යාලය සතුව පවතිනුයේ අදාල පරිපාලිතයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම බැංකුව විසින් සිදු කරනු ලැබීම හේතුවෙනි. එහි සේවක මණ්ඩලයෙහි ප්‍රධානත්වය ගෙන කටයුතු කරන ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරීවරයා පත් කරනු ලබන්නේ ද ලංකා බැංකුව විසිනි. එක්සත් රාජධානියේ මෙහෙයුම් වල අවදානම් නිරාවරණයන් පිළිබඳ මට්ටම් එම පරිපාලිතයන් හි අවදානම් කළමනාකරණ රාමුවෙහි ස්ථාපනය කර ඇත.

මීට අමතරව අනෙකුත් රටවලට දක්වන නිරාවරණය වීම් සඳහා එම රටවල නියෝජිත බැංකු වල පවත්වාගෙන යන ගිණුම් ශේෂයන් ඇතුලත් වන අතර එහි අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කොට ඇති අදාල බැංකු සීමා හා රටවලට පනවා ඇති සීමා මත පදනම්ව සිදු කෙරේ.

2013 වර්ෂයේදී අනෙක් රටවලින් ණය ගැනීම් වලට සිංගප්පුරු කොටස් වෙළෙඳ පොළෙහි ලැයිස්තුගත කල ඇ.ඩො. මිලියන 500 බැගින් වූ පරිනත ණය සටහන් දෙකක් ඇතුලත් වේ. (2012 දී ඇ.ඩො. මිලියන 500 වටිනා පරිනත ණය සටහනක් පැවතුණි.)

58 අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

58.2 ණය අවදානම (සම්බන්ධයි)

58.2.3 අවදානම් සංකේන්ද්‍රණය පිළිබඳ විශ්ලේෂණය (සම්බන්ධයි)

රටවල් අනුව නිරාවරණය

2013 දෙසැම්බර් 31	ශ්‍රී ලංකාව රු. '000	එක්සත් රාජධානිය රු. '000	මාලදිවයින් ජනරජය රු. '000	ඉන්දියාව රු. '000	ඇමරිකා එක්සත් ජනපදය රු. '000	වෙනත් රු. '000	එකතුව රු. '000
වත්කම්							
මුදල් හා කෙටි කාලීන අරමුදල්	20,296,769	335,096	217,736	60,898	2,344,337	1,646,353	24,901,189
මහ බැංකු සමඟ ශේෂයන්	24,513,439	-	3,930,655	255,038	-	-	28,699,132
බැංකු වල ඇති තැන්පතු	4,993,602	9,402,682	-	1,908,421	-	3,010,815	19,315,520
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	3,261,073	-	-	-	-	-	3,261,073
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	22,319,717	-	-	-	-	-	22,319,717
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	13,539,791	-	-	-	-	-	13,539,791
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු	124,051,825	-	5,056,788	-	-	-	129,108,613
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	715,797,622	-	6,566,096	2,968,248	-	-	725,331,966
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	9,335,877	-		989,337	-	-	10,325,214
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	156,899,761	-	-	-	-	-	156,899,761
මුළු වත්කම්	**1,095,009,476**	**9,737,778**	**15,771,275**	**6,181,942**	**2,344,337**	**4,657,168**	**1,133,701,976**
වගකීම්							
බැංකු වලට ගෙවිය යුතු	877,499	-	-	-	288,928	-	1,166,427
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	274,948	-	-	-	-	-	274,948
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	827,053,693	-	12,527,691	2,488,616	-	-	842,070,000
වෙනත් ණය ගැනීම්	46,429,962	2,183,495	-	-	-	186,756,812	235,370,269
නිකුත් කළ ණය සුරැකුම්පත්	20,968,357	-	-	-	-	-	20,968,357
යටත් කාලීන ණය	24,357,595	-	-	-	-	-	24,357,595
මුළු වගකීම්	**919,962,054**	**2,183,495**	**12,527,691**	**2,488,616**	**288,928**	**186,756,812**	**1,124,207,596**

2012 දෙසැම්බර් 31	ශ්‍රී ලංකාව රු. '000	එක්සත් රාජධානිය රු. '000	මාලදිවයින් ජනරජය රු. '000	ඉන්දියාව රු. '000	ඇමරිකා එක්සත් ජනපදය රු. '000	වෙනත් රු. '000	එකතුව රු. '000
වත්කම්							
මුදල් හා කෙටි කාලීන අරමුදල්	18,502,510	455,403	281,272	126,850	9,531,145	2,647,378	31,544,558
මහ බැංකු සමඟ ශේෂයන්	26,790,379	-	2,874,866	297,995	-	-	29,963,240
බැංකු වල ඇති තැන්පතු	891,288	8,741,771	-	2,889,609	-	6,871,798	19,394,466
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	164,681	104,286	-	109,268	-	129,216	507,451
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	797,425	-	-	-	-	-	797,425
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	15,541,185	-	-	-	-	-	15,541,185
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු	96,100,510	-	3,106,349	-	-	-	99,206,859
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	683,046,207	-	6,808,000	2,045,000	-	-	691,899,207
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	10,908,323	-	-	1,172,665	-	-	12,080,988
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	110,956,202	-	-	-	-	-	110,956,202
මුළු වත්කම්	**963,698,710**	**9,301,460**	**13,070,487**	**6,641,387**	**9,531,145**	**9,648,392**	**1,011,891,581**
වගකීම්							
බැංකු වලට ගෙවිය යුතු	9,702,675	-	-	80,808	-	344,500	10,127,983
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	50,326	1,868	-	21,415	-	705	74,314
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	679,399,373	-	11,423,240	2,618,029	-	-	693,440,642
වෙනත් ණය ගැනීම්	62,497,995	10,672,804	-	-	19,172,235	141,452,481	233,795,515
නිකුත් කළ ණය සුරැකුම්පත්	23,296,349	-	-	-	-	-	23,296,349
යටත් කාලීන ණය	23,818,024	-	-	-	-	-	23,818,024
මුළු වගකීම්	**798,764,742**	**10,674,672**	**11,423,240**	**2,720,252**	**19,172,235**	**141,797,686**	**984,552,827**

58 අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

58.2 ණය අවදානම (සම්බන්ධයි)

58.2.3 අවදානම් සංකේන්ද්‍රණය පිළිබඳ විශ්ලේෂණය (සම්බන්ධයි)

අංශ අනුව නිරාවරණය වීම

2013 දෙසැම්බර් 31	කෘෂිකාර්මික සහ ධීවර	බැංකු මූල්‍ය හා රක්ෂණ	හෝටල්, ප්‍රවාහන සහ සේවා	නිවාස, ඉදිකිරීම් සහ යටිතල පහසුකම්
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් හා කෙටි කාලීන අරමුදල්	-	6,513,731	-	-
මහ බැංකු සමඟ ඇති ශේෂ	-	-	-	-
බැංකු වල ඇති තැන්පතු	-	19,315,520	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	3,261,073	-	-
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	-	-
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	346,904	82,269	363,868	177,661
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු	-	1,777,202	-	-
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	115,795,394	6,814,722	23,323,850	97,347,861
අඩු කළා: හානිකරණය	-	-		-
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	-	7,023,942	-	-
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	-	-	-	-
	116,142,298	**44,788,459**	**23,687,718**	**97,525,522**

2013 දෙසැම්බර් 31	කෘෂිකාර්මික සහ ධීවර	බැංකු මූල්‍ය හා රක්ෂණ	හෝටල්, ප්‍රවාහන සහ සේවා	නිවාස, ඉදිකිරීම් සහ යටිතල පහසුකම්
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් හා කෙටි කාලීන අරමුදල්	-	12,799,866	-	-
මහ බැංකු සමඟ ඇති ශේෂ	-	-	-	-
බැංකු වල ඇති තැන්පතු	-	19,394,466	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	507,451	-	-
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	-	-
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	312,759	84,459	403,630	113,479
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු	-	1,724,866	-	-
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	120,643,851	12,109,156	18,345,833	73,377,337
අඩු කළා: හානිකරණය	-	-	-	-
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	-	6,438,745	-	-
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	-	-	-	-
	120,956,610	**53,059,009**	**18,749,463**	**73,490,816**

*මෙහි රජය සතු ව්‍යාපාරයන් සඳහා අනාවරණය ඇතුළත් නොවේ.

නිෂ්පාදන	වාණිජ වෙළඳාම	ස්වාධීන සහ සෘජු රාජ්‍ය	ප්‍රවාහන සහ සේවා සම්පාදනය	වෙනත් වාණිජ සේවා	පරිභෝජනය සහ වෙනත්	එකතුව
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
-	-	-	-	-	18,387,458	24,901,189
-	-	28,699,132	-	-	-	28,699,132
-	-	-	-	-	-	19,315,520
-	-	-	-	-	-	3,261,073
-	-	22,319,717	-	-	-	22,319,717
575,636	567,972	11,312,975	106,672	5,834	-	13,539,791
-	105,341	127,226,070	-	-	-	129,108,613
51,467,301	231,904,246	74,561,982*	26,116,228	12,707,933	115,345,629	755,385,146
-	-	-	-	-	-	(30,053,180)
-	-	1,660,970	-	1,640,302	-	10,325,214
-	-	156,899,761	`	-	-	156,899,761
52,042,937	**232,577,559**	**422,680,607**	**26,222,900**	**14,354,069**	**133,733,087**	**1,133,701,976**

නිෂ්පාදන	වාණිජ වෙළඳාම	ස්වාධීන සහ සෘජු රාජ්‍ය	ප්‍රවාහන සහ සේවා සම්පාදනය	වෙනත් වාණිජ සේවා	පරිභෝජනය සහ වෙනත්	එකතුව
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
-	-	-	-	-	18,744,692	31,544,558
-	-	29,963,240	-	-	-	29,963,240
-	-	-	-	-	-	19,394,466
-	-	-	-	-	-	507,451
-	-	797,425	-	-	-	797,425
572,328	384,575	13,585,370	82,428	2,157	-	15,541,185
-	-	97,481,993	-	-	-	99,206,859
70,826,872	196,730,686	80,265,490*	16,518,860	11,610,150	114,418,481	714,846,716
-	-	-	-	-	-	(22,947,509)
-	-	4,001,763	-	1,640,480	-	12,080,988
-	-	110,956,202	-	-	-	110,956,202
71,399,200	**197,115,261**	**337,051,483**	**16,601,288**	**13,252,787**	**133,163,173**	**1,011,891,581**

58 අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

58.2 ණය අවදානම (සම්බන්ධය)

58.2.4 බැඳීම් සහ ඇපකරයන්

ගණුදෙනු කරුවන්ගේ අවශ්‍යතාවයන් මුදුන්පත් කරලීම වෙනුවෙන් බැංකුව අවලංගු කල නොහැකි විවිධ බැඳීම් වලට හා අසම්භාව්‍යයන්ට ඇතුලත් වේ. එවැනි බැඳීම් මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශයෙහි අන්තර්ගත නොවුවද යම්තාක් දුරට හෝ ණය අවදානමක් දරණ බැවින් බැංකුවේ මුළු අවදානමෙහි කොටසක් ලෙස සැලකිය යුතුය.

බැඳීම් හා ඇපකරයන් වෙනුවෙන් වන බැංකුවෙහි උපරිම ණය අවදානම් නිරාවරණය වීම් පිළිබඳව පහත වගුවෙහි දක්වා ඇත.

	බැංකුව	
දෙසැම්බර් 31 දිනට	2013 රු. '000	2012 රු. '000
ප්‍රතිග්‍රහණ සහ ලේඛණගත ණය	163,754,104	145,792,017
රැස් කිරීම සඳහා පවතින බිල්පත්	3,947,225	3,624,194
ඉදිරි විනිමය ගිවිසුම්	127,685,402	81,604,962
ඇපකර	69,275,083	84,232,029
	364,661,814	315,253,202

58.3 ද්‍රවශීලතා අවදානම් සහ අරමුදල් කළමනාකරණය

වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව ද්‍රවශීලතා හා වෙළෙඳපල අවදානම් තත්ත්වයන් පිළිබඳව තීරණ ගන්නා වූ ප්‍රධානතම කළමනාකරණ කමිටුව වන අතර එය බැංකුවෙහි අරමුදල් සැලැස්ම මාසිකව විමර්ශනය කරමින් ද්‍රවශීල පීඩන තත්ත්වයකට හේතුවන යම් හෝ සැලකිය යුතු විචලතාවක් ඇතිවන්නේ නම් ඒ පිළිබඳ ප්‍රතිකර්ම යෝජනා ඉදිරිපත් කරනු ලබයි.

වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ තීරණ ගැනීමේ කටයුතු සඳහා භාණ්ඩාගාර අංශය මඟින් සෑම මසකටම අදාල වත්කම් හා වගකීම් පරිනතියේ පරතරයන් පිළිබඳ විශ්ලේෂණයක් සිදු කෙරේ. බැංකුවේ වත්කම් හා වගකිම් ඒවායේ පරිනත කාලය අනුව කලින් තීරණය කර ඇති කාල රාමුවලට අදාල කරනු ලැබේ. වත්කම් හා වගකිම් පරිනතියේ නොගැලපීම බැංකුවේ ද්‍රවශීල අවදානම් අවම කිරීමේ සීමාවන්ට සාපේක්ෂව නිරීක්ෂණය කෙරේ.

2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය වගකිම් වල ගිවිසුම්ගත වට්ටම් නොකල පරිනතිය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

2013 දෙසැම්බර් 31	ඉල්ලුමේදී රු. '000	මාස 3 ට අඩු රු. '000	මාස 3- 12 දක්වා රු. '000	වසර 1 - 5 දක්වා රු. '000	වසර 5 ට වැඩි රු. '000	එකතුව රු. '000
බැංකු වලට ගෙවිය යුතු	550,115	616,312	-		-	1,166,427
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	274,948	-	-	-	274,948
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	236,585,484	326,874,514	255,745,428	52,285,006	28,359	871,518,791
වෙනත් ණය ගැනීම්		36,369,823	41,589,663	157,074,075	711,378	235,744,939
නිකුත් කළ ණය සුරැකුම්පත්	-	-	2,686,344	23,799,957	-	26,486,301
යටත් කාලීන ණය	-	-	3,150,100	28,797,934	6,212,936	38,160,970
	237,135,599	**364,135,597**	**303,171,535**	**261,956,972**	**6,952,673**	**1,173,352,376**

2012 දෙසැම්බර් 31	ඉල්ලුමේදී රු. '000	මාස 3 ට අඩු රු. '000	මාස 3- 12 දක්වා රු. '000	වසර 1 - 5 දක්වා රු. '000	වසර 5 ට වැඩි රු. '000	එකතුව රු. '000
බැංකු වලට ගෙවිය යුතු	-	10,279,583	-	-	-	10,279,583
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	74,314	-	-	-	74,314
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	313,592,135	169,971,612	208,692,049	20,513,632	403,706	713,173,134
වෙනත් ණය ගැනීම්	-	82,110,269	77,903,381	110,591,620	1,287,014	271,892,284
නිකුත් කළ ණය සුරැකුම්පත්	-	-	5,305,644	27,201,701	-	32,507,345
යටත් කාලීන ණය	-	51,569	10,487,164	22,881,340	-	33,420,073
	313,592,135	**262,487,347**	**302,388,238**	**181,188,293**	**1,690,720**	**1,061,346,733**

ඉහත වගුවෙහි දැක්වෙනුයේ වට්ටම් නොකරන ලද මුල් මුදල හා පොළී මුදල් ශේෂයන් වන බැවින් වගුවෙහි ශේෂයන් හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ශේෂයන් අතර සෘජු සබඳතාවක් නොමැත.

58.4 වෙළඳපල අවදානම

පොළී අනුපාතයන්, විදේශ විනිමය හුවමාරු අනුපාතයන් සහ කොටස් මිල ආදී වෙළෙඳපල විචල්‍යයන්ගේ සිදුවන උච්චාවචනයන් හේතුවෙන් මූල්‍ය උපකරණයන් හි අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වෙනස්වීම් කෙරෙහි දක්වන අවදානම හෝ සාධාරණ අගය වෙනස්වීම් කෙරෙහි දක්වන අවදානම වෙළඳපල අවදානම ලෙස සලකනු ලබයි. වෙළඳාම් කරන හෝ නොකරන කළඹ වශයෙන් බැංකුව වෙළඳපල අවදානම අනාවරණය වීම් වර්ග කර වෙන වෙනම කළමනාකරණය කරනු ලබයි.

විදේශ විනිමය හුවමාරු සහ කොටස් වෙළදාම් කළඹයන් හි වෙළෙඳපල අවදානම කළමනාකරණ සහ අධීක්ෂණය කරනු ලබන්නේ අවදානම් විචල්‍යයන්හි අන්තර් බැඳීම් පෙන්නුම් කරන ලබන "අවදානමේදී අගය" (Value at Risk – VaR) ක්‍රමවේදය අනුව වේ. පදනම් අගය මත මිල වෙනස්වීම (Price Value of Basis Point – PVBP) සහ කාල විශ්ලේෂණය (Duration Analysis) ඇසුරෙන් වෙළඳ කළඹට බලපාන පොළී අවදානම සඳහා වෙළඳපල අවදානම කළමනාකරණය සහ අධීක්ෂණය සිදු කරයි. ආතති පරීක්ෂාවන් මඟින් වෙළඳාම් නොකරන තත්වයන් කළමනාකරණය සහ අධීක්ෂණය සිදු කෙරේ.

58.4.1 අවදානමේදී අගය (VaR)

පසුගිය වසර 3කට අදාල අතීත දත්තයන් ඇසුරෙන් විචලතා - සහවිචලතා ආශ්‍රිත අවදානමේදී අගය (Variance - Covariance VaR) ක්‍රමවේදය භාවිතා කර බැංකුව විසින් වෙළඳ කළඹෙහි වෙළඳපල අගයෙහි සිදුවිය හැකි විචලනයන් ගණනය කෙරේ.

දිනය මුළුල්ලේම තත්වයන්හි වෙනස්වීම් සිදුවුවද, අවදානමේදී අගය (VaR) ආකෘතිය නියෝජනය කරනුයේ සෑම ව්‍යාපාරික දිනයක් අවසානයෙදීම කළඹෙහි අවදානම් මට්ටම වන අතර 99% විශ්වාස මට්ටමකින් යුත් අලාභයන් ගිණුම්ගත නොකෙරේ. ප්‍රායෝගිකව සත්‍ය වෙළඳ ප්‍රතිඵල සහ අවදානමේදී අගය (VaR) අතර විචලනයන් නිරීක්ෂණය කල හැක. ආතතියට පත් වෙළඳපළ තත්ත්වයන් යටතේදී ලාභය හෝ පාඩුව මත අර්ථවත් ඇඟවීම් මෙම ගණනය මඟින් නොසපයයි.

58.4.2 අවදානමේදී අගය (VaR) සඳහා උපකල්පනයන්

බැංකුව විසින් ගණනය කරනු ලබන අවදානමේදී අගය එක් දිනයක් සඳහා පවතින වෙළඳපල අවදානම් තත්ත්වයන් නොවෙනස්ව පවතින අවස්ථාවක විය හැකි අලාභය 99% විශ්වාස මට්ටම නොයික්මවන බවට තක්සේරුවකි. 99% විශ්වාස මට්ටම යන්නෙන් අදහස් කරන්නේ දිනක කාලයක් තුළ සාමාන්‍ය වෙළඳපල තත්ත්වයන් යටතෙදී අවදානමේදී අගයට (VaR) වඩා අලාභයන් වැඩිවීම සිදුවිය හැක්කේ අනුයාත දින සියයකට එක් දිනක් බවයි.

අවදානමේදී අගය (VaR) බැංකුවෙහි වෙළඳපල අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි සංකලිත කොටසක් වන බැවින් ස්කන්ධ සහ විදේශ විනිමය හුවමාරු වෙළඳ මෙහෙයුම් සහ නිරාවරණයන් සඳහා අවදානමේදී අගය සීමාවන් ස්ථාපනය කර ඇති අතර දිනපතා එම සීමාවන්ට එරෙහිව අධීක්ෂණය කිරීම සිදුකෙරේ.

58.4.3 වෙළඳපල අවදානම - වෙළඳ

මුදල් ඒකක අවදානම

බැංකුව විසින් විදේශ මුදල් සාමාන්‍ය විවෘත තත්වයක් පවත්වාගෙන යන බැවින් විදේශ වෙළඳ ගණුදෙනු ඔස්සේ සිදුවන ලාභ හෝ අලාභ වෙනුවෙන් සැලකිය යුතු සංවේදී තත්වයක් දක්වනු නොලැබේ.

ස්කන්ධ අවදානම

ස්කන්ධ දර්ශකයන්හි හා ස්කන්ධයෙහි මිල උච්චාවචනය හේතු කොටගෙන ස්කන්ධයෙහි සාධාරණ අගයෙහි අඩුවීම ස්කන්ධ මිල අවදානම ලෙස හැඳින්වේ.

ස්කන්ධ අවදානමේ දී අගය	2013 රු. '000	2012 රු. '000
උපරිම	167,768	210,304
අවම	119,750	122,083
සාමාන්‍ය	138,910	158,438
දෙසැම්බර් 31 දිනට	121,513	129,979

පොළී අනුපාත අවදානම

පදනම් අගය මත මිල වෙනස්වීම සතියකට වරක් ගණනය කිරීම මඟින් බැංකුවෙහි වෙළඳ කළඹෙහි අඩංගු භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත පොළී අනුපාතිකයන්හි විචලනයේ බලපෑම අධීක්ෂණය කරනු ලැබේ. 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රතිඵල විස්තර පහත වගුවේ දැක්වේ.

පදනම් ඒකකයන්හි වැඩිවීම	ලාභ හා අලාභයන්ට සංවේදීතාවය රු. '000
25	-19,950
50	-39,739

පොළී අනුපාතයන්හි පදනම් ඒකකයන්හි වැඩි වීම 25 ක් සහ 50 ක් වනවිට, වෙළදාම් වන බැඳුම්කර කළඹෙහි වටිනාකම අඩු වීම අනුපිළිවෙළින් රු. මිලියන 19.9 සහ රු. මිලියන 39.7 විය.

58 අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

58.4 වෙළඳපල අවදානම (සම්බන්ධයි)

58.4.4 වෙළඳපොළ අවදානම - වෙළඳ නොවන

මුදල් ඒකක අවදානම

විදේශීය විනිමය අනුපාත විචලනය හේතුවෙන් මූල්‍ය උපකරණවල වටිනාකම වෙනස් වීමේ අවදානම මුදල් ඒකක අවදානම වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුදල් ඒකක ශේෂයන් සඳහා සීමාවන් ස්ථාපනය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නියෝගයන්ට හා බැංකුවේ ප්‍රතිපත්තීන්ට අනුකූලව ශේෂයන් අධීක්ෂණය දිනපතා සිදුකරනු ලැබේ. අවදානමේදී අගය ඇසුරෙන් වෙළඳ නොවන මුදල් ඒකක අවදානම බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර එය 2013 දෙසැම්බර් 31 දිනට රු. 1,089,590 ක් විය (2012 දෙසැම්බර් 31 දී රු. 529,010).

ස්කන්ධ අවදානම

විකිණීම සඳහා තබා ඇති ස්කන්ධ හිමිකම් හේතුවෙන් වෙළඳාම සඳහා නොවන ස්කන්ධ වල අවදානම උද්ගත වේ. ස්කන්ධ මිල මට්ටම්හි 10% ක අඩුවීමක් මගින් 2013 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 474 ක ඍණාත්මක බලපෑමක් විල්ලවිය හැකිය (2012 දෙසැම්බර් 31: රු. මිලියන 475).

පොළී අනුපාත අවදානම

පොළී අනුපාතයන්හි වෙනස් වීම අනාගත මුදල් ප්‍රවාහයන්ට හෝ මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකමට බලපෑ හැකි සම්භාවිතාව මත පොළී අනුපාත අවදානම පැන නගී.

වත්කම් හා වගකීම් කළමනාකරණ අංශය විසින් වෙළඳ නොවන මූල්‍ය වත්කම් හා වගකීම් සඳහා පොළී අනුපාත අවදානම අධීක්ෂණ සඳහා වත්කම් හා වගකීම් අනුපාත සංවේදීතා විශ්ලේෂණයක් මාස්පතා සිදු කෙරේ. අවාසිදායක තත්වයන් හඳුනා ගැනීමට ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් ආතති පරීක්ෂාව සිදු කෙරේ.

58.5 මෙහෙයුම් අවදානම

අප්‍රමාණවත් හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි වල, පුද්ගලයින්ගේ හෝ පද්ධති වල ප්‍රතිඵලයක් ලෙස හෝ බාහිර සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙස අලාභ ඇතිවීමේ අවදානම ලෙස මෙහෙයුම් අවදානම නිර්වචනය කෙරේ. මෙයට නෛතික අවදානම ඇතුළත් වන නමුත් උපාය මාර්ගික හා කීර්තිනාම අවදානම ඇතුලත් නොවේ.

සැලකිය යුතු මෙහෙයුම් අවදානමක්, බැංකුවේ ව්‍යාපාර කටයුතුවල නිරන්තරව පවතින අතර එය ඕනෑම ව්‍යාපාරයකට පොදු ලක්ෂණයකි. කාර්යක්ෂම කළමනාකරණ මෙහෙයුම් ක්‍රියාවලි පණ ගැන්වීම ඔස්සේ, මෙහෙයුම් අවදානමට ඇති අනාවරණය අවම කර ගැනීමට බැංකුව උත්සාහ කරනු ලැබේ.

මූලික දර්ශක ප්‍රවේශය (Basic Indicator Approach) ඇසුරෙන්, මෙහෙයුම් අවදානම උදෙසා ප්‍රාග්ධනය වෙන් කිරීම බැංකුව විසින් සිදුකරන නමුත්, ප්‍රායෝගිකව සත්‍ය මෙහෙයුම් අලාභය උක්ත සඳහන් ප්‍රාග්ධන වෙන් කිරීමට සාපේක්ෂව ඉතා පහල මට්ටමක පවතින බව ගම්‍ය වේ.

	2013 රු. '000	2012 රු. '000	2011 රු. '000
මෙහෙයුම් අවදානම් සඳහා ප්‍රාග්ධන අය කිරීම්	6,719,688	5,618,104	4,245,548
සත්‍ය මෙහෙයුම් අලාභ	16,773	65,689	5,651

59.6 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයෙහි මූලික අරමුණ වනුයේ නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුරූපව ප්‍රාග්ධන මට්ටම පවත්වාගෙන යාමයි. බැංකුවෙහි අවදානම් අභිරුචිය සහ උපක්‍රමික අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අවශ්‍ය තරම් ප්‍රාග්ධනය වෙන් කර ඇති බව බැංකුව තහවුරු කරයි.

58.6.1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය බැංකුවෙහි ප්‍රාග්ධනය හා අනුරූපව ණය අවදානම් බරිත වත්කම්, බැංකුකරණ ව්‍යාපාරයෙහි වෙළඳපොළ අංශ සහ මෙහෙයුම් අතර සම්බන්ධතාවය අනුපාතිකයක් ලෙස පෙන්නුම් කරයි. බලාපොරොත්තු නොවන අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වාගෙන යාමට බැංකුවෙහි මූල්‍ය ස්ථාවරත්වය හා ශක්තිය පෙන්නුම් කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය භාවිතා කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) නිර්වචනය කිරීම සහ නියාමනය කිරීම තුළින් තහවුරු කරනුයේ, බැංකුව විසින් ණය පැහැර හැරීමේ අවදානම ඉහළ යන ආයෝජන දරා සිටීම හෝ සහභාගී වීමෙන් වැළකී සිටීමත්, මෙහෙයුම් අවදානම දරා සිටීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමත්, එයින් බැංකු පද්ධතියේ විශ්වසනීයත්වය පවත්වා ගැනීමත්ය.

ජාත්‍යන්තර පිළිගත් ප්‍රාග්ධන මැනීමේ හා ප්‍රාග්ධන ප්‍රමිතියක් වන බාසල් II ආකෘතිය බැංකුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) ගණනය කිරීමට පදනම් කර ගනී. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරන අංශය විසින් වියහැකි නරකම තත්ත්වය සඳහා දැඩිව ආතතියකට පත්කර ක්‍රියාකාරිව හා අඛණ්ඩව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව අධීක්ෂණය කෙරේ. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීම් ක්‍රියාවලිය (ICAAP) යටතේ කීර්තිනාම අවදානම, උපාය මාර්ග අවදානම, අනුකූල වීම් අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ බැංකු කටයුතු සඳහා ඇති වත්කම් මත පොළී අවදානම වැනි සියලුම අවදානම් සලකා බැලේ.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය 2013

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) හෝ මුළු ප්‍රාග්ධන අනුපාතය (TCR) මඟින් බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය මනිනු ලබන අතර එය එහි ප්‍රාග්ධනය වත්කම් වල ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබයි. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය යනු බැංකු පද්ධතියේ ස්ථායිතාවය හා අබාණ්ඩතාවය පිළිබිඹු කරනු ලබන මූල්‍ය මිණුම් දණ්ඩයි.

අන්තර්ජාතික ප්‍රමිතියට අනුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය නිර්දේශය කොට ඇත්තේ බුන්වත් වීමට පෙර අලාභයන් අන්තර්ග්‍රහණය කර ගැනීමට බැංකුවට ඇති හැකියාව සහතික කිරීම සඳහායි. පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම හා මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය හා කාර්යක්ෂමතාව ඉහල දැමීම අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවයක් පවත්වා ගැනීම මඟින් සිදුවේ.

බාසල් සම්මුතියේ විකාශය

ජාත්‍යන්තර නිරාකරණය කිරීමේ බැංකුවේ බැංකු අධීක්ෂණය පිළිබඳ 'බාසල් කමිටුව' යනු ප්‍රධාන කාර්මික රටවල (G10) මහ බැංකු හා මූල්‍ය අධීක්ෂණ අධිකාරිවල නියෝජනයකි. ජාත්‍යන්තර සම්මතයන් පිහිටුවීම මඟින් මෙම කමිටුව බැංකු පිළිබඳ ඵලදායී අධීක්ෂණයන්ට අනුග්‍රහය දක්වයි. ප්‍රධාන වශයෙන් එහි අවධානය යොමුව ඇත්තේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත වෙතයි.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පිළිබඳ මූලධර්මයන් ගැන ඉදිරිපත් කරන ප්‍රකාශනය බාසල් සම්මුතිය ලෙස හඳුන්වයි.


ප්‍රාග්ධනය හා බරිත වත්කම් ගණනය කිරීම පිළිබඳ නිර්දේශයන් සහ අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයන් පිළිබඳව එහි ඇතුලත් වේ. විකල්පයන් හඳුන්වාදීමේ අරමුණ වන්නේ බැංකුවේ ක්‍රියාකාරිත්වයට හා එහි අවදානම ගණනය කිරීමේ හැකියාවට වඩාත් ගැළපෙන පරිදි එක් එක් බැංකුවට හා එහි අධීක්ෂණයන්ට අවශ්‍ය ක්‍රමය තෝරා ගැනීමට අවස්ථා සැලසීමයි.

බාසල් II නමින් හඳුන්වනු ලබන වර්තමාන ප්‍රාග්ධන මැනීම සහ ප්‍රාග්ධන ප්‍රමිතයන් හි ජාත්‍යන්තර එකමුතුව කුළුණු තුනක් මත නිර්මාණය වූ සැලැස්මකි.

ණය අවදානම ගණනය කිරීම

ණය අවදානම ගණනය කිරීමේදී බැංකු ශේෂපත්‍රයෙහි දක්වා ඇති වත්කම් අගයන් සඳහා ගැලපුම් කිරීම අවශ්‍ය වේ.

විවිධ වත්කම් සඳහා විවිධ අවදානම් පැතිකඩ ඇති බැවින්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයේ දී මූලිකව අවදානම් අඩු වත්කම් සඳහා



අඩු බර තැබීමක් සිදු කරනු ලබයි. ඒ අනුව බැංකුවක වත්කම් අවදානම් සහගත බව අනුව පුළුල් ආකාරයට බර තබනු ලබයි.

ඇපකර, ණයවර ලිපි වැනි ශේෂ පත්‍රයෙන් බැහැර අයිතමයන් වලද ණය අවදානමක් ඇති අතර ඒවා ණය සමතුලිත අගයන්ට පරිවර්තනය කර අවදානම් මට්ටම අනුව බර තැබීම කරනු ලබයි. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය ගණනය කිරීම රටකින් රටකට වෙනස් වුවත් බාසල් සම්මුතිය අදාලවන රටවල සාමාන්‍ය ගණනය කිරීම බොහෝ දුරට සමාන වේ.

ප්‍රාග්ධන ගණනය

ආකාර දෙකකට ප්‍රාග්ධන ගණනය කිරීම සිදු කරනු ලබයි. ස්ථර I ප්‍රාග්ධනය, ව්‍යාපාර කටයුතු නවත්වන්නේ නැතිව අලාභය අවශෝෂණය කිරීමේ හැකියාව ඇති (උදා: සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය) සහ ස්ථර II ප්‍රාග්ධනය, ව්‍යාපාරය අවසන් කිරීමේදී අලාභය අවශෝෂණය කිරීමේ හැකියාව ඇති (උදා: යටත් වූ කාලීන ණය) ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශයන්ට අනුව සියළුම වාණිජ බැංකු තනි හා ඒකාබද්ධ පදනමකින් යුතුව ගණනය කිරීම අවශ්‍ය වේ.

භාවිත වන අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත

- ස්ථර I ප්‍රාග්ධනය මුළු අවදානම් බරිත වත්කම් වල ප්‍රතිශතයක් ලෙස ගත්කල 5% ට නොඅඩු විය යුතුය.
- මුළු ප්‍රාග්ධනය (ස්ථර I + ස්ථර II) මුළු අවදානම් බරිත වත්කම් වල ප්‍රතිශතයක් ලෙස ගත්කල 10% ට නොඅඩු විය යුතුය.

ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නොමැතිව බැංකුව විසින් සිය ව්‍යාපාර කටයුතු පුළුල් නොකරන බවට ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයෙන් සහතික වේ.

බාසල් III

බාසල් II යටතේ ගොඩනංවන නියාමන ප්‍රාග්ධන ව්‍යූහය ශක්තිමත් කිරීම මඟින් බාසල් කමිටුව බැංකු ක්ෂේත්‍රයේ ප්‍රත්‍යස්ථිතිය ඉහළ නංවනු ලබයි.

- වැඩි දියුණු කරන ලද අවම ප්‍රාග්ධන හා ද්‍රවශීල අවශ්‍යතා
- ආයතනික වශයෙන් අවදානම් කළමනාකරණය හා ප්‍රාග්ධන සැළසුම් කිරීම සඳහා වැඩි දියුණු කරන ලද සුපරීක්ෂණාත්මක සමාලෝචන ක්‍රියාවලිය
- වැඩි දියුණු කරන ලද අවදානම් හෙලිදරව් කිරීම සහ වෙළෙඳපොල විනය

නව රෙගුලාසි මඟින් ප්‍රාග්ධන පදනමේ තත්ත්වය, ස්ථිරතාවය සහ විනිවිද භාවය වැඩි කරන අතර ප්‍රාග්ධන ව්‍යුහයේ අවදානම් ආවරණය ශක්තිමත් කෙරේ. බාසල් III හි යෝජිත ප්‍රධාන අයිතමයන් පහත දැක්වේ.

නියාමන අයිතමය	යෝජනාව
වැඩි අවම ස්ථර I ප්‍රාග්ධනය	ස්ථර I ප්‍රාග්ධනය 2% කින් වැඩි කිරීම
නව ප්‍රාග්ධන සංරක්ෂණ ආරෝධකය	ප්‍රාග්ධන සංරක්ෂණ ආරෝධකය 2.5% මට්ටමේ රඳවා ගැනීම
ප්‍රතිචක්‍රීය ප්‍රාග්ධන ආරෝධකය	ප්‍රතිචක්‍රීය ආරෝධකය පොදු ස්කන්ධයෙන් 0%ත් 2.5% ත් අතර පවත්වා ගැනීම
තෝලන අනුපාතය	අවදානම පාදක නොවූ තෝලන අනුපාතය 3%
ද්‍රවශීලතා සම්මතය	මසක් සඳහා ප්‍රමාණවත් ව උසස් තත්වයෙන් යුතු ද්‍රවශීල වත්කම් පවත්වා ගැනීම සහතික කරන ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR)

නව බාසල් III රෙගුලාසි සියළුම බැංකු වලට බලපාන නමුත් එහි බලපෑම බැංකුවේ ප්‍රමාණය හා ස්වභාවය අනුව වෙනස් වේ.

ප්‍රාග්ධනයේ ප්‍රමාණය සහ තත්ත්වය වැඩි කිරීමට සිදුවීම හා ද්‍රවශීලතා සහ තෝලන අනුපාත ගණනය කිරීමට සිදුවීම තුලින් බහුතර බැංකු ප්‍රමාණයක් බලපෑමට ලක්වේ.

මෙම ප්‍රතිසංස්කරණ වල අරමුණ මූල්‍ය හා ආර්ථික ආතතියන්ගෙන් ඇතිවන කම්පන අවශෝෂණය කිරීමට බැංකු ක්ෂේත්‍රයට ඇති හැකියාව වැඩි කිරීම මඟින් අවදානම මූල්‍ය ක්ෂේත්‍රයේ සිට මුර්ත ආර්ථිකයට ගලායාම අඩු කිරීම සහ අවදානම් කළමනාකරණය හා යහපාලනය වැඩි කිරීමයි.

	බැංකුව		සමූහය	
	2013 රු. මිලියන	2012 රු. මිලියන	2013 රු. මිලියන	2012 රු. මිලියන
ස්ථර I : මූලික ප්‍රාග්ධනය				
ගෙවා නිමි සාමාන්‍ය කොටස්	5,000	5,000	5,000	5,000
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	3,538	3,286	3,538	3,286
ප්‍රසිද්ධ කරන ලද රඳවා ගත් ලාභ	31,419	27,639	33.261	29,318
පොදු හා අනෙකුත් සංචිත	8,619	6,402	9,701	7,282
පාලනයට යටත් නොවන හිමිකම (ඉහල ප්‍රාග්ධන සංයුතිය සමඟ ඒකමතික වන)	-	-	1,296	1,417
අඩු කිරීම්				
ඒකාබද්ධ නොවූ බැංකු සහ මූල්‍ය පරිපාලිත වල ආයෝජන වලින් 50%	(2,469)	(2,469)	-	-
අනෙකුත් අඩු කිරීම්	(809)	(636)	(809)	(636)
සුදුසුකම් ලබන මුළු මූලික ප්‍රාග්ධනය (ස්ථර I ප්‍රාග්ධනය)	**45,298**	**39,222**	**51,987**	**45,667**
ස්ථර II : අතිරේක ප්‍රාග්ධනය				
ප්‍රත්‍යාගණන සංචිතය (ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කර ඇති පරිදි)	2,373	2,306	2,373	2,306
පොදු ප්‍රතිපාදනයන්	2,694	2,564	2,694	2,564
අනුමත කළ යටත් කාලීන ණය	17,800	12,988	17,800	12,988
අඩු කිරීම්	(2,777)	(2,729)	(308)	(260)
සුදුසුකම් ලබන මුළු අතිරේක ප්‍රාග්ධනය (ස්ථර II ප්‍රාග්ධනය)	**20,090**	**15,129**	**22,559**	**17,598**
මුළු ප්‍රාග්ධන පදනම	**65,388**	**54,351**	**74,546**	**63,265**

අවදානම් වෙනුවෙන් බරිත වත්කම් ගණනය කිරීම

		බැංකුව				සමූහය			
		2013		2012		2013		2012	
	අවදානම් මත බර තැබූ සාධකය	ශේෂ පත්‍රයේ වත්කම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර වත්කම් වල ණය සමතුලිතය	අවදානම් මත බර තැබූ වත්කම්	ශේෂ පත්‍රයේ වත්කම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර වත්කම් වල ණය සමතුලිතය	අවදානම් මත බර තැබූ වත්කම්	ශේෂ පත්‍රයේ වත්කම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර වත්කම් වල ණය සමතුලිතය	අවදානම් මත බර තැබූ වත්කම්	ශේෂ පත්‍රයේ වත්කම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර වත්කම් වල ණය සමතුලිතය	අවදානම් මත බර තැබූ වත්කම්
		රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වත්කම්									
ශ්‍රී ලංකා රජයෙන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලැබිය යුතු	0	441,851	-	353,621	-	442,742	-	356,297	-
විදේශීය රාජ්‍ය වලින් හා ඒවායේ මහ බැංකුවලින් ලැබිය යුතු	0-150	10,232	9,610	7,244	6,631	10,232	9,610	7,244	6,631
රාජ්‍ය අංශයේ ආයතනවලින් ලැබිය යුතු (PSE)	20-150	66,296	66,296	59,753	59,753	66,296	66,296	59,753	59,753
බැංකුවලින් ලැබිය යුතු	20-150	35,554	20,910	63,464	36,061	37,396	22,752	63,464	36,061
මූල්‍ය ආයතනවලින් ලැබිය යුතු	20-150	4,123	3,181	5,090	3,392	4,123	3,181	5,090	3,392
ආයතනික පහසුකම්	20-150	125,984	123,104	116,160	111,827	150,112	147,233	140,220	135,887
සුළු පරිමාණ පහසුකම්	75-100	155,881	133,290	120,622	101,311	155,881	133,290	120,622	101,311
නේවාසික දේපල මත සුරක්ෂිත වත්කම්	50-100	35,457	23,220	36,116	25,571	35,457	23,220	36,116	25,571
අක්‍රීය වත්කම් (NPA)	50-150	20,662	29,828	11,658	16,640	20,662	29,828	11,658	16,640
මුදල් අයිතමයන්	0-20	42,295	4,389	23,300	911	42,576	4,389	23,711	911
මුදල්, රන් සහ රාජ්‍ය සුරැකුම් මත වූ ඇප මත අනාවරණයන්	0	300,699	-	304,851	-	300,699	-	304,851	-
දේපල, පිරියත හා උපකරණ	100	12,089	12,089	10,819	10,819	20,909	20,909	18,013	18,013
අනෙකුත් වත්කම්	100	39,786	39,786	38,751	38,751	40,944	40,944	40,307	40,307
මුළු අනාවරණයන්		**1,290,909**	**465,703**	**1,151,449**	**411,667**	**1,328,029**	**501,652**	**1,187,347**	**444,477**

		බැංකුව				සමූහය			
		2013		2012		2013		2012	
ශේෂ පත්‍රයෙන් බැහැර අනාවරණයන්	ණය පරිවර්තන සාධකය %	වත්කම්	ණය සමතුලිතය	වත්කම්	ණය සමතුලිතය	වත්කම්	ණය සමතුලිතය	වත්කම්	ණය සමතුලිතය රු. මිලියන
සෘජු ණය ආදේශන	100	30,310	30,310	49,424	49,424	30,310	30,310	49,424	49,424
ගනුදෙනු සම්බන්ධිත අසම්භාව්‍යයන්	50	30,389	15,195	26,449	13,224	30,389	15,195	26,449	13,224
කොටිකාලීන ස්වයං ද්‍රවශීලතා වෙළඳ සම්බන්ධිත අසම්භාව්‍යයන්	20	178,554	35,711	152,203	30,441	178,554	35,711	152,203	30,441
මුල් පරිණත කාලය එක් අවුරුද්දක් දක්වා වන හෝ ඕනෑම අවස්ථාවකදී කොන්දේසි රහිතව අවලංගු කළ හැකි වෙනත් බැඳීම්	0	79,300		31,873		79,300		31,873	
මුල් පරිණත කාලය එක් අවුරුද්දක් දක්වා වන සහ එක් අවුරුද්දකට වැඩි පරිණත කාලයක් සහිත දායකත්වයන්	20-50	38,029	17,522	25,145	12,251	38,029	17,522	25,145	12,251
විදේශීය මුදල් හිවිසුම්	2-5	127,685	2,554	80,938	1,619	127,685	2,554	80,938	1,619
ශේෂ පත්‍රයෙන් බැහැර මුළු අනාවරණයන්		**484,267**	**101,292**	**366,032**	**106,959**	**484,267**	**101,292**	**366,032**	**106,959**

වෙළෙඳපොළ අවදානම - සම්මත මිනුම්කරණ ප්‍රවේශය

	බැංකුව		සමූහය	
	2013 රු. මිලියන	2012 රු. මිලියන	2013 රු. මිලියන	2012 රු. මිලියන
ප්‍රාග්ධන වැය				
පොළී අනුපාත අවදානම	141	289	141	289
ස්කන්ධය	422	372	422	372
විනිමය ගනුදෙනු හා රන්	21	16	21	16
වෙළෙඳපොළ අවදානම සඳහා ප්‍රාග්ධන වැය	584	677	584	677
වෙළෙඳපොළ අවදානම සඳහා අවදානම් බරිත වත්කම්	5,838	6,773	5,838	6,773

මෙහෙයුම් අවදානම - මූලික දර්ශක ප්‍රවේශය

	බැංකුව		සමූහය	
	2013 රු. මිලියන	2012 රු. මිලියන	2013 රු. මිලියන	2012 රු. මිලියන
මෙහෙයුම් අවදානම් සඳහා ප්‍රාග්ධන වැය				
අබණ්ඩ වසර 3 ක මුළු දළ ආදායම	134,422	112,362	145,577	121,242
සාමාන්‍ය දළ ආදායම	44,807	37,454	48,526	40,414
මෙහෙයුම් අවදානම් සඳහා මුළු ප්‍රාග්ධන වැය - 15%	6,721	5,618	7,279	6,062
මෙහෙයුම් අවදානම් සඳහා මුළු අවදානම් බරිත වත්කම්	67,211	56,181	72,789	60,621

මූලික දර්ශක ප්‍රවේශය වෙනුවට සම්මත ප්‍රවේශය ප්‍රතිස්ථාපනය වේ. සම්මත ප්‍රවේශය යටතේ බැංකු ක්‍රියාකාරකම්, ව්‍යාපාර කොටස් 8 කට බෙදා දක්වනු ලැබේ. ඒ ආයතනික මූල්‍ය, වෙළෙඳ හා විකුණුම්, ශාඛා බැංකුකරණය, වාණිජ බැංකුකරණය, ගෙවීම් හා පියවීම්, නියෝජිත සේවා, වත්කම් කළමනාකරණ හා තැරැව්කාර සේවා වේ. එක් එක් ව්‍යාපාර කොටස සඳහා වන ප්‍රාග්ධන අයකිරීම ගණනය කරනුයේ දළ ආදායම එම ව්‍යාපාර කොටස සඳහා අදාල වන සාධකයෙන් (බීටා අගය 12% සිට 18% දක්වා වන) ගුණ කිරීමෙනි.

	බැංකුව		සමූහය	
	2013 රු. මිලියන	2012 රු. මිලියන	2013 රු. මිලියන	2012 රු. මිලියන
අනුපාත ගණනය				
අවදානම් වෙනුවෙන් බරිත මුළු වත්කම්	465,703	411,667	501,652	444,477
ණය අවදානම සඳහා මුළු අවදානම්	5,838	6,773	5,838	6,773
මෙහෙයුම් අවදානම සඳහා මුළු අවදානම් බරිත වත්කම්	67,211	56,181	72,789	60,621
උප එකතුව	**538,752**	**474,621**	**580,279**	**511,871**
අවම ප්‍රාග්ධන අයකිරීම්				
ණය අවදානම	46,570	41,167	50,165	44,448
වෙළෙඳපොළ අවදානම	584	677	584	677
මෙහෙයුම් අවදානම	6,721	5,618	7,279	6,062
සුදුසුකම් ලබන මුළු මූලික ප්‍රාග්ධනය	45,298	39,222	51,987	45,667
සුදුසුකම් ලබන මුළු අතිරේක ප්‍රාග්ධනය (ස්ථර II ප්‍රාග්ධනය)	20,090	15,129	22,559	17,598
මුළු ප්‍රාග්ධන පදනම	**65,388**	**54,351**	**74,546**	**63,265**
මූලික ප්‍රාග්ධන අනුපාතය	**8.4%**	**8.3%**	**8.9%**	**8.9%**
මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	**12.1%**	**11.5%**	**12.9%**	**12.4%**

ආයෝජකයින් සඳහා තොරතුරු

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතාවයන්

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය හා බැඳුනු ලැයිස්තුගත රීති හා අනුකූල වීම් පහත පරිදි සාරාංශ කළ හැකිය.

රීති අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේදය	ඉදිරිපත් කළ දිනය
7.4 අ (i)	කාර්තුමය පදනම මත සකස් කළ අතුරු මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයවිසින් අනුමත කර, කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, පළමු කාර්තු 3 සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාල කාර්තු නිම වී දින 45 ක් තුළදී ද අවසන් කාර්තුව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාල කාර්තුව අවසන් වූ දින සිට මාස 2 ක් තුළද ඉදිරිපත් කළ යුතුය.	2013 මාර්තු 31 දිනෙන් අවසන් පළමු කාර්තුව 2013 ජුනි 30 දිනෙන් අවසන් දෙවන කාර්තුව 2013 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් තෙවන කාර්තුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් හතරවන කාර්තුව	15/5/2013 15/8/2013 14/11/2013 28/02/2014

රීති අංකය	අවශ්‍යතාවය	අනුකූලතාවය
7.4 ආ (i)	ශ්‍රී.ල.ගි.ප්‍ර. 34 ට අනුකූලවීම සහ බැංකුව හා සමූහය වෙන් වෙන්ව හෙළිදරව් කිරීම	අනුකූලතාවය දක්වන ලදී
7.4 ආ (ii)	ලැයිස්තුගත රීති වලට අනුව අතිරේක සටහන් සහ අනුපාත හෙළිදරව් කිරීම	අනුකූලතාවය දක්වන ලදී
7.4 ආ (iii)	අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කිරීම	අනුකූලතාවය දක්වන ලදී
7.4 ආ (iv)	මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇති ද යන්න සඳහන් කිරීම	අනුකූලතාවය දක්වන ලදී
7.5 අ	අදාළ මූල්‍ය වර්ෂය අවසන් වන දින සිට මාස 5 ක් තුළ වාර්ෂික වාර්තාව කොළඹ කොටස් හුවමාරුවට ඉදිරිපත් කල යුතුය	2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දින ඉදිරිපත් කර ඇත. 2013 වසර සඳහා වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර ඉදිරිපත් කෙරෙනු ඇත.

රීති අංකය	අනාවරණ අවශ්‍යතාවය	පරිශීලනය/අර්ථකතනය	පිටු අංකය
7.6 (i)	අදාල මූල්‍ය වර්ෂය තුළ ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂක මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව	212
7.6 (ii)	අදාල මූල්‍ය වර්ෂය තුළදී ආයතනයෙහි සහ එහි පරිපාලිතයන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ එම ක්‍රියාකාරකම්හි ස්වභාවයේ සිදුවූ වෙනස්කම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳ ලංකා බැංකු අධ්‍යක්ෂක මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ආයෝජකයින් සඳහා තොරතුරු	212 232 402
7.6 (iii)	ජන්ද හිමි හා අහිමි කොටස් හිමිකාරිත්වය මත, ඉහළම ප්‍රමුඛත්වය ලැබූ ප්‍රථම කොටස් හිමියන් විසිදෙනාගේ නම්, හිමිකම් කියනු ලබන කොටස් ප්‍රමාණය සහ අදාල හිමිකාරීත්වය ප්‍රතිශතයක් ලෙස	ශ්‍රී ලංකා රජය ලංකා බැංකුවෙහි එකම කොටස් හිමියා වේ.	
7.6 (iv)	පොදු හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	අදාළ නොවේ	
7.6 (v)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී එක් එක් අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ කොටස් හිමිකම පිළිබඳ විස්තරයක්	අදාළ නොවේ	

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතාවයන් (සම්බන්ධයි)

රීති අංකය	අනාවරණ අවශ්‍යතාවය	පරීක්ෂලනය/අර්ථකතනය	පිටු අංකය
7.6 (vi)	ආයතනය මුහුණ දිය හැකියැයි හඳුනාගත් ප්‍රමාණාත්මක අවදානම් සාධකයන් පිළිබඳ කරුණු	අවදානම් කළමනාකරණය	198
7.6 (vii)	ආයතනයෙහි සේවක සහ ක්ෂේත්‍ර සබඳතාවයන්ට අදාල ප්‍රමාණාත්මක ගැටළු පිළිබඳ තොරතුරු	සළකා බලනු ලබන වර්ෂය තුළදී ප්‍රමාණාත්මක ගැටළු කිසිවක් පැන නොනැඟිණි.	
7.6(viii)	ආයතනය සතු ඉඩම් සහ ආයෝජන දේපලවල ප්‍රමාණ, පිහිටීම, තක්සේරු වටිනාකම සහ ඒවායේ ඇති ගොඩනැගිලි සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 32	298
7.6 (ix)	ආයතනයෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් නියෝජනය වන කොටස් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 46	321
7.6 (x)	එක් එක් වර්ගයේ ස්කන්ධ සුරැකුම් හිමිකරුවන් ගණන සහ එම හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස දක්වන ලද ව්‍යාප්ති සටහන	ආයෝජකයින් සඳහා තොරතුරු	380
7.6 (xi)	අනුපාතයන් සහ වෙළඳපොළ මිළ පිළිබඳ තොරතුරු 1. කොටසක ලාභාංශය, කොටසක ශුද්ධ වත්කම්, සංසන්දනීය රාජ්‍ය සුරැකුම්පත්වල පොළී අනුපාතිකය, ණය/ප්‍රාග්ධන අනුපාතිකය, පොළී ආවරණය සහ ද්‍රවශීල වත්කම් අනුපාතය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 18 ආයෝජකයින් සඳහා තොරතුරු	257 379
	2. ලැයිස්තුගත ණයකර වලට අදාල වෙළඳපොළ තොරතුරු	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 45 ආයෝජකයින් සඳහා තොරතුරු	320 383
	3. ණය ශ්‍රේණිගත කිරීමෙහි සිදුවූ වෙනස්වීම්	සම්මාන	14
7.6 (xii)	ආයතනයේ හෝ එහි පරිපාලිතයන්ගේ ස්ථාවර වත්කම් වල සහ ඉඩම් වල වෙළෙඳපොළ වටිනාකම, පොත් අගයත් අතර සැලකිය යුතු වෙනස්වීම්	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 32	298
7.6 (xiii)	ආයතනයේ වර්ෂය තුළදී ප්‍රසිද්ධ නිකුතුවකින්, හිමිකම් නිකුතුවකින් හෝ පුද්ගලික නිකුතුවකින් අරමුදල් සම්පාදනය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 41 සහ 45	308 317
7.6 (xiv)	සේවකයින් සතු කොටස් හිමිකාරත්වය හෝ කොටස් යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු	අදාළ නොවේ	
7.6 (xv)	7 වන කොටසෙහි 7.10.3, 7.10.5 (සී) සහ 7.10.6 (සී) යන රීතීන් වලට අදාළව ආයතනික යහපාලනය පිළිබඳ අනාවරණයන්	ආයතනික යහපාලනය සම්බන්ධයෙන් 2007 අංක 11 දරණ බැංකු පණතේ විධි විධාන වලට අනුකූලව බැංකුව කටයුතු කරන බැවින් 7.10 විධානය යටතේ නිදහස් කර ඇත.	
7.6 (xvi)	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වලට දක්වා ඇති ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම් වලින් 5% යන දෙකෙන් අඩු අගය ඉක්මවන සම්බන්ධිත පාර්ශවයන් හා සිදුකළ ගනුදෙනු	ආයෝජකයින් සඳහා තොරතුරු	388

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලතාවයන්

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවට අදාළ වන අතුරු මූල්‍ය ප්‍රකාශ වලට අදාළ විධිවිධාන වලට අනුකූල වීම් පහත පරිදි සාරාශ කළ හැකිය.

